



පළමු පරිච්ඡේදය

ජීවත් වූ පිරිමි ළමයා

සිංහල EBOOKS

සිංහල නවකතා 1000කට අධික ප්‍රමාණයක් නොමිලේ
Ebook ආකාරයෙන් කියවන්න...
දැන්ම www.sinhalaebooks.com වෙත පිවිසෙන්න..

ප්‍රයිවට් ඩ්‍රයිව්හී නොම්බර හතර නිවසේ පදිංචි ඩර්ස්ලි යුවල අතිශයින්ම සාමන්‍ය බව කිවහැකිය. ඔබට ස්තූතියි. අසාමාන්‍ය හෝ අද්භූත යමකට සම්භන්ධ වෙන අවසාන පිරිස ඔවුන් වියහැක, මන්ද ඔවුන් එවැනි විකාර වලට කවදාවත් කැමති වූයේ නැත.

ඩර්ස්ලි මහතා ග්‍රනින්ග්ස් නම් වූ විදින යන්ත්‍ර හදන සමාගමක අධ්‍යක්ෂකවරයෙක් විය. ඔහු යන්තම් බෙල්ල පෙනෙන තරම් ඉතා විශාල තරබාරු මිනිසෙකු වූ අතර විශාල උඩු රැවුලකට හිමිකම් කීවේය. ඩර්ස්ලි මහත්මිය කෙට්ටු කහ හිසකෙස් ඇති සාමාන්‍ය ප්‍රමාණය මෙන් දෙගුණයක් දිග ගෙලක් හිමි කාන්තාවක් වූ අතර ඇගේ ඒ බෙල්ල බොහෝ වෙලාවක් වත්තේ වැටවල් උඩින් එබෙමින් අසල්වැසියන්ගේ ඕපදූප සෙවීමේදී මහත් පිටිවහලක් විය. ඩර්ස්ලිලාට ඩඩ්ලි නම් වූ පුතෙක් සිටි අතර ඔවුන්ගේ මතයට අනුව ඔහු තරම් හොඳ ළමයෙක් කොහේවත් සිටියේ නැත.

ඩර්සිලාට තමන්ට අවශ්‍ය සියලු දේ තිබිණි. නමුත් ඔවුන් සතුව රහසක්ද තිබිණි. ඔවුන්ගේ ලොකුම බය වූයේ කවුරුහරි එය හොයාගනීවි යන්නයි.  පොටර්ලා ගැන කවුරුන්හෝ දැන්ගත්තොත් එය ඔවුන්ට දරාගත නොහැකි

Downloaded from sinhalaebooks.com

වනු ඇතැයි ඔවුන් විශ්වාස කළහ. පොටර් මහත්මිය ඩර්ස්ලි මහත්මියගේ සොයුරිය වුවත් ඔවුන් අවුරුදු කීපයකටම මුණගැසී නොතිබිණ. ඇත්තටම ඩර්ස්ලි මහත්මිය තමන්ට සොයුරියක් නැතැයි සැලකුවාය.  මන්ද ඇගේ සොයුරියත් ඇගේ කිසි කමකට නැති සැමියාත් සම්පූර්ණයෙන්ම ඔවුන්ට වඩා වෙනස් කාණ්ඩයක් විය. පොටර්ලා මේ පාරකට ආවොත් මිනිස්සු මොනා නොකියයිදැයි සිතද්දී ඔවුන් වෙවුලයි. පොටර්ලාට කුඩා පුතෙක් සිටින බව ඩර්ස්ලිලා දැන සිටියත් ඔවුන් කිසි දින දරුවා දැක නොතිබිණි. පොටර්ලා ඈත් කර තැබීමට එම කොලුවාද හොඳ හේතුවක් විය. ඩඩ්ලි එවැනි දරුවෙක් සමග මිශ්‍ර වෙනවාට ඔවුන් කොහෙත්ම කැමති වූයේ නැත.

අපේ කථාව ආරම්භවන්නේ එක් අළුපාට කම්මැලි අඟහරුවාදා උදෑසනක ඩර්ස්ලි යුවල අවදිවීමත් සමගයි. නගරය පුරා ඉක්මනින්ම අමුතු සහ අද්භූත දේ සිදුවනු ඇති බවට වළාකුළු පිරි අහසේ කිසිම ළකුණක් නොවීය. සිංදුවක් මුමුණමින් ඩර්ස්ලි මහතා තම කම්මැලි පාට ටයිපටිය ගෙන වැඩට යාමට සැරසුණේය. කෑගසමින් දඟලන ඩඩ්ලිව උස් පුටුවට එබීමට පොරකන ගමන් ඩර්ස්ලි මහත්මිය ඔපාදූප දෙඩුවාය.

විශාල දුඹුරුපැහැ බකමූණෙක් ජනේලය අසලින් පියඹා යනු දෙදෙනාම දුටුවේ නැත.

අටහමාර වෙද්දී ඩර්ස්ලි මහතා තම බෑගය අතින්ගෙන ඩර්ස්ලි මහත්මියගේ කම්මුල  සිඹ ඩඩ්ලිටත් සමුගැනීමේ හාද්දක් දීමට උත්සාහ කළත් එය වැළකී ගියේය. මන්ද ඩඩ්ලි දැන් තරහින් පුපුරමින් තම සීරියල් බිත්තියට විසි කරමින් සිටියේය. ඔහු නිවසින් පිටවද්දී ඩර්ස්ලි මහත්මිය "චුත්තක් කන්නකෝ," කියනු ඔහුට ඇසිණි. ඔහු තම රථයට නැග නොම්මර හතර නිවසට මායිම්වූ පාරට පැමිණියේය.

වෙනසක පළමු සංඥාව ඔහු දුටුවේ පාර කෙළවරේය.  සිතියමක් කියවන පූසෙක්. තප්පරයකට ඩර්ස්ලි මහතාට තමා දුටු දේ තේරුනේ නැත. ඉන්පසු ඔහු නැවත බැලීමට හිස පිටුපසට හැරෙව්වේය. ප්‍රයිවට් ඩ්‍රයිව්හී කෙළවරේම මහත පූසෙක් සිටගෙන සිටි නමුත් පෙනෙනමානයක සිතියමක් නොවීය.   ඔහු සිතමින් සිටියේ කුමක් ගැනද ? එය ආලෝකය නිසා වූ රැවටිල්ලක් විය හැක. ඩර්ස්ලි මහතා ඇස් පිල්ලන් ගසා පූසා දෙස බලාසිටියේය. ඌද ඔහු දෙස බලාසිටියේය. ඩර්ස්ලි මහතා වංගුවෙන් හරවා පාර ඉහළට යද්දී ඔහු තම පැති කණ්නාඩියෙන් පූසා දෙස බලාසිටියේය. ඌ දැන් ප්‍රයිවට් ඩ්‍රයිව් නම ලියන ලද සංඥා පුවරුව කියවයි. නෑ, ඒ දෙස බළා සිටී; පූසන් සිතියම් හෝ සංඥාපුවරු කියවන්නේ නැත. ඩර්ස්ලි මහතා තම හිස සොළවා පූසා ගැන වූ අදහස තම සිතෙන් පළවා හැරියේය. ඔහු නගරය දෙසට රිය පදවද්දී එදින ගැනීමට නියමිත විශාල විදින යන්ත්‍ර ඇණවුමක් ගැන හැරෙන්නට වෙන කිසිවක් ඔහුගේ සිතේ නොවීය.

නමුත් නගරය කෙළවරට ලඟාවෙත්ම වෙනත් දෙයක් ඔහුගේ සිතින් විදින යන්ත්‍ර පන්නා දැම්මේය. ඔහු සුපුරුදු වාහන තදබදයේ රැඳෙද්දී, අමුතු ඇඳුම් ඇඳි මිනිසුන් විශාල පිරිසක් සිටිනු ඔහු ඇස ගැටිණි. ඒ දිගු කබා ඇඳි මිනිසුන් පිරිසකි. විකාර අඳුම් ඇඳි පිරිස ඩර්ස්ලි මහතාට රිස්සුවේ නැත. එම තරුණ පිරිස සැරසී සිටි අයුරු! මෙය අලුත් මෝඩ විලාසිතාවක් යැයි ඔහු උපකල්පනය කළේය. ඔහු තම ඇඟිලි වලින් සුක්කානමට තට්ටු කරමින් සිටින අතරේ තමන් අසලම රැස් වී සිටි එම අමුතු මිනිසුන් පිරිසක් වෙත ඔහුගේ ඇස් රැඳිනි. ඔවුන් එකතු වී උද්ධාමයෙන් මුමුණමින් සිටියෝය.  ඉන් දෙදෙනෙක් කිසිසේත්ම තරුණ නොවූ බව දැක ඔහු කෝපයට පත්විය. එක් මිනිසෙක් ඔහුටත් වඩා වයස විය යුතු අතර එමරල්ඩ් කොළ පැහැ දිගු කබායක් ඇඳ සිටීම ඔහුගේ තරහට හේතු විය. නමුත් ඉන්පසු ඔහුගේ සිතට ආවේ මෙය බොහෝවිට මොකක් හෝ මෝඩ ව්‍යාපාරයක් විය යුතු බවයි. මේ මිනිසුන් අනිවාර්යයෙන් මොකක් හරි දෙයක් වෙනුවෙන් සල්ලි එකතු කරනවා විය යුතුය.  ඔව්, ඒක එහෙම වෙන්න ඇති. වාහන ඉදිරියට ඇදුනෙන් විනාඩි කිහිපයකට පසු ඩර්ස්ලි මහතා ග්‍රනින්ග්ස් රථගාල වෙත පැමිණියේ විදින යන්ත්‍ර වලින් නැවතත් සිත පුරවා ගනිමිනි.

Downloaded from sinhalaebooks.com

ඩර්ස්ලි මහතා නවවෙනි මහලේ වූ තම කාර්යාලයේ හැම විටම හිඳගන්නේ ජනේලයට පිටුපස හරවමිනි. එසේ නොවුනා නම් ඒ උදෑසන ඔහුට විඳින යන්ත්‍ර ගැන සිත යෙදවීම ඉතා අපහසු වනු ඇත. මහ දවල් හිරු එළියේ එහේ මෙහේ පියාඹන බකමූණන් ඔහු නොදුටුවත්, පහල මාර්ගයේ ගමන් ගනිමින් සිටි මිනිසුන් උන්ව දැක තම හිස් වලට ඉහලින් එකාට පසු තව එකෙක් ලෙස පියාඹන බකමූණන් දෙස කට ඇරගෙන බලා සිටින්නටත් අත දිගු කරමින් අන් අයට උන්ව පෙන්වන්නටත් විය. ඔවුන් බොහෝ දෙනෙක් රාත්‍රියේදීවත් බකමූණෙක් දැක තිබුනේ නැත. ඒ කෙසේ වෙතත් ඩර්ස්ලි මහතාට නම් බොහොම සාමාන්‍ය බකමූණගෙන් තොර උදෑසනක් ලැබී තිබිණි. ඔහු වෙනස් පුද්ගලයන් පස් දෙනෙකුට කෑ ගසුවේය.. ඔහු ඉතා වැදගත් දුරකථන ඇමතුම් කීපයක් ගෙන තව ටිකක් කෑගසුවේය. දිවා ආහාර විවේකය වෙන තෙක් ඔහු ඉතා හොඳ මානසිකත්වයක සිටියේය. ඉන්පසු ඔහු සිතුවේ මදක් කකුල් දිගහැර පාර එහා පැත්තට ඇවිද ගොස් බේකරියෙන්  තමන්ට බනිස් ගෙඩියක් මිලදී ගත යුතු බවයි.

බේකරිය අසල වූ දිගු කබා ඇඳි පිරිසක් පසු කරන තෙක් ඔහුට ඔවුන් ගැන අමතක වී තිබිණි. ඔවුන් පසුවෙද්දී ඔහු තරහින් ඒ දෙස බැලුවේය.  හේතුව දැන නොසිටියත් ඔවුන් ඔහුව අපහසුවට පත් කරයි. මේ පිරිස උද්ධාමයෙන් මුමුණයි. එකම මුදල් එකතු කිරීමේ පෙට්ටියක්වත් පෙනෙන්නට වූයේ නැත. විශාල ඩෝනට් එකක් මල්ලක ඔබමින් ඔවුන් පසුකරද්දී ඔවුන් කියූ වචන කිහිපයක් ඔහුගේ කණ වැටිණි.

"පොටර්ලා, ඒක හරි, ඔව් එහෙම තමයි මට ආරංචි, එයාලාගේ පුතා, හැරී"

ඩර්ස්ලි මහතා එතැනම ගල්ගැසුණේය. ඔහු භීතියෙන් උතුරා ගියේය. තමන්ට යමක් කීමට ඇතිවාක් මෙන් ඔහු කොඳුරන්නන් දෙසට හැරුනේය. නමුත් නැවත ඒ ගැන සිතා බැලුවේය.

ඔහු පාර හරහා ආපසු බළමින් තම කාර්යාලය වෙත ගමන ඉක්මන් කළේය. තමන්ට බාධා නොකරන ලෙස ලේකම්ට වහා කියූ ඔහු, දුරකථනය අතට ගත්තේ තම සිත වෙනස් වෙන විට සම්පූර්ණයෙන්ම වාගේ ගෙදර නොම්මරය ඔබා තිබිණි. ඔහු රිසිවරය ආපසු තබා තම උඩු රැවුල ඇද ගනිමින් කල්පනා කළේය.  නෑ, ඔහු මෝඩයෙක් විය. පොටර් යනු දුර්ලභ නමක් නොවේ.  හැරී නමින් පුතෙකු සිටින පොටර් නම ඇති මිනිසුන් බොහෝ ඇති බව ඔහුට විශ්වාසය. ඒ ගැන තව දුරටත් සිතීමේදී, තම ඥාති පුතාගේ නම හැරී ද කියා ඔහුට විශ්වාසයක් නොවීය. ඔහු කොළුවාව කවදාවත් දැක තිබුනේ නැත. ඔහුගේ නම හාවි හෝ හැරල්ඩ් වන්නට හැක. ඩර්ස්ලි මහත්මිය කණගාටු කරවීමට උවමනා නැත. ඇගේ සොයුරිය ගැන යමක් කියන හැම විටම ඕ කණගාටු වන්නීය. ඔහු ඇයට දොස් කීවේ නැත. ඔහුට එවැනි සොයුරියක් හිටියා නම්.... නමුත් මේ මොහොතේ, අර දිගු කබා ඇඳි මිනිසුන්...

එදින සවස විඳින යන්ත්‍ර ගැන සිතයෙදවීම ඉතා අපහසු බව ඔහුට තේරුනි. හවස පහට ඔහු ගොඩනැගිල්ලෙන් පිටවෙද්දීත් ඔහු ඒ ගැනම සිතමින් කණගාටු වෙමින් එළියට ආවේ, කෙලින්ම පැමිණ එළියේ දොරකඩ සිටි අයෙකුගේ ඇඟේ හැපුණේය.

Downloaded from sinhalaebooks.com

"සමාවෙන්න" ඉතා කුඩා ඒ මිනිසා හැප්පීම නිසා ඇද වැටෙන්නටම යත්දී ඔහු කීවේය. ඒ මිනිසා දම් පැහැ දිගු කබායක් ඇඳසිටින බව වැටහෙන්නට ඔහුට තප්පර කීපයක් ගතවිය. බිම ඇදවැටෙන්නට ගියඑක ගැන ඔහු මදක්වත් කළබල වූ බවක් පෙනෙන්නට නොවීය. පිළිතුරු ලෙස ඔහුගේ මුහුණේ විශාල හිනාවක් ඇඳුනේය. ලඟින් යන එන්නන් බලාසිටින ආකාරයේ මී හඬකින් ඔහු කතා කළේය. "දුක්වෙන්න එපා, මගේ දයාබර මහත්මයා, අද මාව කිසිදේකට කණගාටු කරන්න බෑ! සතුටු වෙන්න, අන්තිමේ දී නම නොකියන කෙනා යන්න ගිහිල්ලා! ඔයා වගේ මගල් ලාත් මේක සමරන්න ඕනේ, මේ සතුටු, සතුටුම දවස!"

ඉන්පසු හේ පාර මැදම ඩර්ස්ලි මහතාව බදා වැලඳ ගෙන ඉවතට ඇවිද ගියේය.

ඩර්ස්ලි මහතා එතැනම ගල් වී සිටියේය. සම්පූර්ණයෙන්ම නාඳුනන මිනිසෙකු විසින් ඔහුව වැලඳගන්නා ලදී. තේරුම කුමක් උවත් ඒ මිනිසා තමාට මගල් කියා ඇමතූ බවත් ඔහු සිතුවේය. ඔහු වෙවුලුවේය. ඔහු වහා තම රථය වෙත පැමිණ නිවස බලා පිටත් විය. තමන් නොයෙක් දේවල් මවා ගනිමින් සිටින බවක් ඔහුට සිතුනත් මින්පෙර කිසිම දිනක එසේ සිදු නොවීය. මන්ද ඔහු කිසිදින මවාපෑම් වලට අනුබල දුන්නේ නැත.

ඔහු නොම්මර හතර නිවස පිහිටි පාරට වාහනය හරවත්ම ඔහු මුළින්ම දුටුවේ ( එය දැකීමෙන් ඔහුගේ සිත පැහැදුනේ නැත) උදෑසන දුටු මහත පූසායි. ඌ දැන් ඔහුගේ ගෙවත්තේ බැම්ම උඩ ඉඳගෙන සිටී. ඒ එකම පූසා බව ඔහුට විශ්වාසයක් විය; උගේ ඇස් වටා එකම සළකුණ විය.

"ෂූ!" ඩර්ස්ලි මහතා මහ හඬින් කීවේය. පූසා සෙළවුනේ නැත. ඌ ඔහු වෙත තද බැල්මක් හෙළීය. ඒ පූසෙක් සාමාන්‍යයෙන් හැසිරෙන විදියද? ඩර්ස්ලි මහතා කල්පනා කලේය. සාමාන්‍ය තත්වයට පත්වීමට උත්සාහ කරමින් ඔහු ගෙට ඇතුල් විය. තම බිරිඳට කිසිවක් නොකිවයුතු දැයි ඔහු තවමත් කල්පනා කරමින් සිටියේය.

ඩර්ස්ලි මහත්මිය ඉතා හොඳ සහ සාමාන්‍ය දවසක් ගත කළාය. රාත්‍රී ආහාර ගන්නා අතරේ ඈ අල්ලපු ගෙදර මහත්මියට තම දියණිය සමග ඇති ප්‍රශ්ණ ගැනත් ඩඩ්ලි අලුත් වචනයක් ("බෑ!")ඉගෙන ගත් අයුරුත් කීවාය. ඩර්ස්ලි මහතා සාමන්‍ය ලෙස හැසිරීමට උත්සාහ කළේය. ඩඩ්ලිව ඇඳට දැමූ පසු ඔහු හවස ප්‍රවෘත්ති වල අවසන් කොටස බැලීමට සාළයට ගියේය.

"අවසන් වශයෙන්, රටපුරා කුරුළු නරඹන්නන් කියා සිටියේ අද දින රටේම බකමූණන් අසාමාන්‍ය ලෙස හැසිරුණු බවයි. බකමූණන් සාමාන්‍යයෙන් රාත්‍රියේ දඩයම් කරන කිසිදිනෙක දිවාකාළයේ දැක නොතිබුනු කොට්ඨාශයක් වුවත්, අද ඉරනැගීමත් සමග හැම අතටම පියෑඹූ බකමූණන් සියගණනක් දක්නට ලැබී තිබිණි. ප්‍රවීණයින් මේ බකමූණන්ගේ හදිසියේ වෙනස් වූ නිදාගැනීමේ රටාව ගැන පැහැදිළි කිරීමට අපොහොසත් වී තිබේ." ප්‍රවෘත්ති කියන්නාගේ මුහුණේ විශාල හිනාවක් ඇඳිනි. "බොහෝ අද්භූතයි, දැන් යොමුවෙමු ජිම් මැක්ගෆින් සමගින් කාළගුණ වාර්ථාව වෙත. අද රාත්‍රියේ තව බකමූණු වැස්සක් තියෙයිද ජිම්?"

"හොඳයි, ටෙඩ්," කාළගුණය කියවන්නා කීවේය. "ඒ ගැන නම් මම දන්නේ නෑ, නමුත් අද දවසේ අසාමාන්‍ය ලෙස හැසිරිලා තියෙන්නේ බකමූණෝ විතරක් නෙවෙයි. කෙන්ට්, යෝක්ශයර් සා ඩන්ඩී පළාත්වල අය මට අමතලා කිව්වේ මම ඊයේ පොරොන්දු වුන වැස්ස වෙනුවට ඔවුන්ට ඉහළට විදෙන වල්ගාතරු වැස්සක් දකින්න

Downloaded from sinhalaebooks.com

ලැබුනා කියලා. සමහර විට මිනිස්සු කලින්ම බොන්ෆයර් රාත්‍රිය සමරනවා වෙන්න පුළුවන්. ඇත්තටම ඒකට තව සතියක් තියනවා. මිත්‍රවරුනි! ඒත් මට අද තෙත රාත්‍රියක් ඔබලාට පොරොන්දුවෙන්න පුළුවන්."

ඩර්ස්ලි මහතා තම ඇඳිපුටුවේ ගල්ගැසිණි. බ්‍රිතාන්‍ය පුරා අහසට විදෙන වල්ගාතරු? දහවල් එළියේ බකමූණෝ පියාඹනවා? දිග කබා ඇඳගෙන හැම තැනම හිටපු අද්භූත මිනිස්සු? එක මිමිණුමක්, පොටර්ලා ගැන එක මිමිණුමක්..

ඩර්ස්ලි මහත්මිය තේ කෝප්ප දෙකක් රැගෙන සාළයට පැමිණියාය. ඒක හොඳ නෑ. ඔහු ඇයට යමක් කිව යුතුය. ඔහු අපහසුවෙන් මෙන් උගුර පෑදුවේය. "අර් - පෙටූනියා, පැටියෝ ලඟදි ඔයාගේ නංගි එහෙම කතාකලේ නෑ නේද?"

ඔහු බලාපොරොත්තු වූ ආකාරයටම ඩර්ස්ලි මහත්මිය පුදුමයට සහ කේන්තියට පත් වූවාය. මොනා උනත්, ඔවුන් සාමාන්‍යයෙන් සිටියේ ඇයට සොයුරියක් නැති ලෙසිනි.

"නෑ," ඈ තියුණු ලෙස කීවාය. "ඇයි?"

"මේ ප්‍රවෘත්ති වල තිබ්බ විහිලු දේවල්," ඩර්ස්ලි මහතා ගොත ගැසුවේය. "බකමූණෝ... වල්ගා තරු... අනික අද නගරේ විහිලු පෙනුම තියන මිනිස්සු ගොඩක් හිටියා..."

"ඉතිං?" ඩර්ස්ලි මහත්මිය ක්ෂණිකව ඇසුවාය.

"මේකයි, මං නිකං හිතුවේ ... සමහරවිට... ඒවා මේ... ඔයා දන්නවානේ... එයාගේ කට්ටියගේ වැඩක් වෙන්න පුළුවන්."

ඩර්ස්ලි මහත්මිය තොල් තද කරගෙන තේ පානය කළාය. තමන්ට "පොටර්" නම ඇසුන බව කියනවාද නැද්ද යැයි ඔහු නැවත සිතුවේය. එය කිව යුතු නැති බව ඔහු සිතුවේය. ඒ වෙනුවට ඔහු බොහෝ සාමාන්‍ය ලෙස කතා කළේය. "එයාලගේ පුතා -- අපේ ඩඩ්ලිගේ වයස මම හිතන්නේ. නේද?"

"ඔව් මම හිතන්නේ ," ඩර්ස්ලි මහත්මිය ගොරෝසු ලෙස කීවාය.

"මොකද්ද ඒ ළමයගේ නම කිව්වේ? හොවාර්ඩ්, නේද?"

Downloaded from sinhalaebooks.com

"හැරී, විකාර. හැමතැනම තියන නමක් අනේ."

"ඔහ්, හරි," තම හදවත බයෙන් ගැහෙද්දී ඩර්ස්ලි මහතා කීවේය. "ඔව්,ඒක නම් ඇත්ත."

ඔවුන් ඉහළ නිදන කාමරයට යද්දී ඔහු ඒ ගැන තව කිසිවක් නොකීවෙය. ඩර්ස්ලි මහත්මිය නානකාමරයේ ඉන්නා අතර ඩර්ස්ලි මහතා ජනේලයෙන් එබී පහළ ගෙවත්ත දෙස බැලුවේය. පූසා තවමත් එතන සිටී. ඌ කුමක් හෝ බළාපොරොත්තුවෙන් සිටින්නාක් මෙන් ප්‍රයිවට් ඩ්‍රයිව් පාර පහළ පැත්ත බලාගෙන සිටී.

ඔහු දේවල් හිතින් මවාගන්නවාද? මේ සියල්ලට පොටර්ලා සමග සම්භන්ධයක් තිබේද? එසේ වුනි නම්...... ඔවුන් එවැනි ජෝඩුවකට සම්භන්ධකම් කියන් බව එළියට ආරංචි වුවහොත්... ඇත්තටම එවැනි දෙයක් දරාගතහැකි බවක් ඔහුට සිතුනේ නැත.

ඩර්ස්ලිලා නිදන්නට ගියහ. ඩර්ස්ලි මහත්මිය වහා නින්දට වැටුනත් ඩර්ස්ලි මහතා සියල්ල සිත තුල කරකවමින් අවදිව සිටියේය. නින්දට වැටීමට පෙර ඔහුගේ අවසන් සැනසිලිදායක සිතිවිල්ල වූයේ පොටර්ලා එයට සම්භන්ධ වූවත් ඔවුන්ට තමන් සහ ඩර්ස්ලි මහත්මිය වෙත එන්නට හේතුවක් නැති බවයි. ඔහු සහ පෙටූනියා තමන් සහ තම වර්ගයා ගැන සිතන ආකාරය පොටර්ලා හොඳින් දැන සිටියහ. සිදුවන කිසිදෙයක් සමග ඔහු සහ පෙටූනියා මිශ්‍ර වෙන විදිහක් ඔහුට පෙනුනේ නැත. ඔහු ඇනුමක් ඇර අනෙක් පසට හැරුනේය. එය ඔවුන්ට බල නොපානු ඇත.

ඔහු කොතරම් නම් වැරදිද..

ඩර්ස්ලි මහතා අපහසු නින්දකට වැටුනත් එලියෙන් ඇති බැම්මේ සිටි පූසාට නිදිමත බවක් පෙනෙන්නට නොතිබිණ. ඌ පිළිමයක් සේ තවමත් වාඩි වී සිටි අතර, උගේ ඇස් ප්‍රයිවට් ඩ්‍රයිව්හි කෙළවර වෙත යොමුවී තිබුණි. යාබද පාරේ කෙළවරින් මෝටර් රථයක දොරක් මහ හඬින් වැසෙද්දී කළබල නොවූ ඌ බකමූණන් දෙදෙනෙකු අහසෙන් මතු වෙත්ම කළබල විය. ඇත්ත වශයෙන්ම, ඌ තම ඉරියව්ව වෙනස් කරන විට මධ්‍යම රාත්‍රිය පමණ වී තිබුණි.

වීදිය කෙළවර පූසා බලා සිටි පැත්තෙන් පිරිමියෙක් දර්ශනය විය. ඔහු නිහඬවම දර්ශනය වූ අතර හදිසියේ පොළොවෙන් මතු වුනාක් මෙන් පෙනුණි. බළලාගේ වලිගය කෙලින් වූ අතර උගේ ඇස් දිලිසෙන්නට විය.

මේ මිනිසා මින්පෙර කවදාවත් ප්‍රයිවට් ඩ්‍රයිව්හි දක්නට නොලැබුණි. බඳපටිය තෙක්ම දිගු හිසකෙස් සහ රැවුල රිදී පාට වූ ඔහු උස, සිහින් හා මහලු මිනිසෙක් විය. ඔහු දිගු සළු පැළඳ, අඩි උස ගාංචු සහිත බූට්ස් සහ බිම ඇතිල්ලෙන දම් පැහැති ලෝගුවක් පැළඳ සිටියේය. ඔහුගේ දීප්තිමත් නිල් ඇස් පහත් අඩසඳ හැඩයේ ඇස් කණ්ණාඩිය පිටුපස සැඟවී තිබුණි.. ඔහුගේ නාසය දිගු වූ අතර එය අවම වශයෙන් දෙවරක්වත් කැඩී තිබුණි. මෙම මිනිසාගේ නම ඇල්බස් ඩම්බල්ඩෝර් ය.

Downloaded from sinhalaebooks.com

ඇල්බස් ඩම්බල්ඩෝර් ඔහුගේ නමේ සිට බූට් දක්වාම සියල්ල පිළිනොගන්නා පෙදෙසකට ඇතුල් වූ බව දැනගෙන සිටියේ නැත. ඔහු සිය ලෝගුව තුළ වෙහෙස වී, යමක් සොයමින් සිටියේය. එහෙත්, හදිසියේ ඔහු දෙස කවුරුන් හෝ බලා සිටි බව ඔහුට දැනුන බව පෙනේ, ඔහු හදිසියේම බළලා දෙස බැලුවේය, ඌ පාරේ අනෙක් කෙළවර සිට ඔහු දෙස බලා සිටියේය. යම් හේතුවක් නිසා බළලා දැකීමෙන් ඔහු අපහසුතාවයට පත් විය. "මම දැනගෙන ඉන්න තිබුනා" කියා ඔහු සිනා සෙමින් තෙපලුවේය.

ඔහුගේ ඇතුල් සාක්කුවෙහි ඔහු සොයන දේ ඔහුට හමු විය. එය රිදී සිගරට් දල්වනයක් විය. ඔහු එය විවෘත කර ඉහලට ඔසවා ක්ලික් කළේය. ළඟම වීදි ලාම්පුව පොප් හඩින් නිවී ගිය අතර ඔහු එය නැවතත් ක්ලික් කළේය - ඊලඟ ලාම්පුව අන්ධකාරයේ ඇලී ගියේය. දොළොස් වතාවක් ඔහු එය ක්ලික් කළ අතර මුළු වීදියෙහි ඉතිරිව තිබූ එකම එළිය වූයේ දුර පිහිටි කුඩා ආලෝක ලප දෙකක් පමණි. ඒ ඔහු දෙස බළා සිටින බළලාගේ දෑස් විය. කවුරුන් හෝ තමන්ගේ කවුළුවෙන් පිටත බැලුවත්, ඩර්ස්ලි මහත්මියගේ තියුණු ඇස් වලින් බැලුවත්, පදික වේදිකාවේ සිදුවූ කිසිවක් දැකීමට ඔවුන්ට නොහැකිය. ඩම්බල්ඩෝර් ඔහුගේ ආම්පන්නය ලෝගු සාක්කුව තුළට ඔබමින් අංක හතර දෙසට ගමන් කළේය. බළලා අසල වාඩිවූ ඔහු ඌ දිහා බැලුවේ නැත, නමුත් මොහොතකට පසු ඔහු ඌට කතා කළේය.

"ඔබව මෙතැන දැකීම අපූරුයි, ප්‍රොෆෙසර් මැක්ගොනගල්"

ඔහු පුල්ලියාට සිනහසීමට හැරුන නමුත් එහි ඌ නොමැති විය. ඒ වෙනුවට ඔහු බළලාගේ ඇස්වල වටේ තිබුණු සලකුණුවලම හැඩැති හතරැස් හැඩයෙන් යුත් කණනාඩි පැළඳි තරමක් දුර්වල පෙනුමක් ඇති ස්ත්‍රියක් සමඟ සිනාසෙමින් සිටියේය. ඇය ද දිගු ලෝගුවක් හැද සිටියාය, ඒ මරකත (emerald) පැහැ එකකි. ඇගේ කළු හිසකෙස් තදින් බෝලයක් සේ බෙල්ලට කර බැද තිබිණි..

"ඔයා මාව හදුනාගත්තේ කොහොමද?" ඇය ඇසීය.

"මගේ ආදරණීය මහාචාර්යවරිය, මම කවදාවත් ඔය තරම් ගල්වී සිටින බළලෙක් දැකලා නැහැ."

"දවසක්ම ගඩොල් බිත්තියක් උඩ ඉදගෙන හිටියොත් නම්, ඔයත් ගල් වෙයි" ප්‍රොෆෙසර් මැක්ගොනගල් පැවසුවාය.

"මුළු දවසම?? ඔයා සැමරිය යුතුව තිබුනානේ. මට මෙහේ අතරමග උත්සව, සාද දූසිමක් වත් පහුකරන්න වුනා"

මහාචාර්ය මැක්ගොනගල් කෝපාවිෂ්ට විය.

Downloaded from sinhalaebooks.com

"ඔව් ඔව්, හැමෝම සමරනවා, හරි" යනුවෙන් ඇය පැවසුවාය.

"ඔයාට හිතෙන්නේ නැද්ද ඒගොල්ලෝ ටිකක් පරෙස්සම් වෙන්න ඕනේ කියලා - ඒත් නැහැ - මගල්ලා පවා මොනා හරි වෙලා තියෙනවා කියලා තේරුම් අරන් තියෙන්නේ. ඒගොල්ලන්ගේ ප්‍රවෘත්ති වල ඒක තිබුනා." ඇය ඩර්ස්ලි ගේ අඳුරු විසිත්ත කාමරයේ කවුළුව දෙස ඇගේ හිස හරවා බැලුවාය.

"මම අහගෙන හිටියා.. බකමූණු රංචු ... අහසට විදෙන වල්ගා තරු... හොඳයි, ඒගොල්ලො සම්පූර්ණයෙන්ම මෝඩ නෑ, එයාලා කෙන්ට් වලදී පැහැදිලිවම අහසට විදෙන තාරකා දැකලා - මම ඔට්ටු අල්ලනවා ඒ ඩෙඩලස් ඩිග්ල් කියලා. එයාට කොහොමත් හැඟීමක් නැහැ. "

"ඔයාට දොස් කියන්න බෑ." ඩම්බල්ඩෝ පරිස්සමට පැවසුවේය. "අපිට එකොළොස් අවුරුද්දකට පස්සේ සමරන්න වටිනා දෙයක් ලැබුනේ."

"මම දන්නවා," මහාචාර්ය මැක්ගොනගල් අමනාපයෙන් කියා සිටියේය.

"ඒත් ඒක අපේ බෙල්ල ගහලා යන හේතුවක් කරගන්න ඕනේ නෑනේ. මේ මිනිස්සු දිගින් දිගටම නොසැලකිලිමත් වෙනවා, දවල්ට එළියේ දී වීදිවල ඇවිදිනවා මගල් ඇඳුම් අඳින්න වත් උනන්දුවක් නෑ, කටකතා පැතිරෙනවානේ."

ඇය ඩම්ල්ඩෝර් දෙස තියුණු බැල්මකින් බැලුවාය, ඇය ඔහු යමක් පවසතැයි බලාපොරොත්තු උනත්, ඔහු උනන්දු නොවූ බැවින්, ඇය කතා කළාය.

"ඇත්තටම අන්තිමේ නම නොකියන කෙනා අතුරුදහන් වෙච්ච දවසේම මගල්ලා අපි ගැන ඔක්කොම දැනගනී,... මම හිතන්නේ... ඇත්තටම එයා යන්නම ගිහින්ද.. ආ ඩම්බල්ඩෝර්."

"එහෙම තමයි පෙනන්නේ" කියා ඩම්බල්ඩෝර් පැවසීය. "අපිට ස්තුතිවන්ත වෙන්න ගොඩක් දේ තියනවා. ලෙමන් බිංදුවක් ඕනෙද”

"මොකක්ද?"

"ලෙමන් බිංදු, ඒවා මගල්ලාගේ රස ලොසින්ජරයක්. මම ගොඩක් කැමතියි."

Downloaded from sinhalaebooks.com

"එපා, ස්තූතියි," මහාචාර්ය මැක්ගොනගල් නොසැලකිලිමත් ලෙස කියා, ලෙමන් බිංදු කන්න මේ සුදුසු මොහොතක් දැයි සිතුවාය "මම දන්නවා, නම නොකියන කෙනා ගියත් "

"මගේ ආදරණීය ප්‍රොෆෙසර්, ඔයා වගේ බුද්ධිමත් කෙනෙකුට එයාගේ නමින් කතා කරන්න බැරිද? ඇත්තට මේ "නම නොකියන කෙනා" කියන එක විකාරයක් - අවුරුදු 11 ක් තිස්සේ මම එයාගේ  නියම නමින් වොල්ඩමොට් කියලා කතා කරන්න කියලා  ජනතාවගෙන් ඉල්ලා සිටියා."

මහාචාර්ය මැක්ගොනගල් හැකිලුනාය, නමුත් ඩම්බල්ඩෝ නොසැලකිලිමත් ලෙස ලෙමන් බිංදු දෙකක් ඉවතට ගනිමින් සිටියේය. ඩම්ල්ඩෝගේ වෙනසක් නොතිබුණි.

"නම නොකියන කෙනා කියලා දිගටම කිව්වොත් නම්, හැමදේම අපහසුයි. වොල්ඩමෝට්ගේ නම කියන්න භය වෙන්න හේතුවක් මම කවදාවත් දැකලා නැහැ."

"මම දන්නවා ඔයා එහෙම කතා කළේ නෑ,  ඔයා වෙනස් හැමෝම දන්නවා . නම නොකි......... හරි, වොල්ඩමොට් බය ඔයාට විතරයි කියලා." ඈ සන්සුන්ව ඔහුව අගය කරමින් කීවාය

"ඔයා මාව අන්දනවා" ඩම්බල්ඩෝ සන්සුන්ව පැවසීය. "වොල්ඩමෝට්ට තිබ්බ බලය මට කවදාවත් තිබුණේ නැහැ."

"ඔයා ඒවා භාවිතා නොකර ඉන්න තරම් ...- හොඳයි- උතුම් වූ නිසා පමණයි."

"හොඳ වෙලාවට මෙතන අඳුරු.. මගේ අළුත් ඇඳුමට මැඩම් පොම්ෆ්‍රි ආසයි කිව්ව දවසට පස්සේ අදයි මාව ලැජ්ජාවෙන් රතු වුනේ"

මහාචාර්ය මැක්ගොනගල් ක්ෂනිකව ඩම්බලඩෝ දෙස තියුණු පෙනුමකින් බැලූ අතර, ඈ මෙසේ පැවසී ය: "පැතිරෙන කටකතා එක්ක බැලුවම බකමූණෝ මහ දෙයක් නෙවේ, හැම දෙනාම කියන්නේ මොකක් ද? එයා අතුරුදහන් වෙලා තියෙන්නේ කොහොමද? අන්තිමේදී එයාව නැවැත්තුවේ මොකක්ද?"

මහාචාර්ය මැක්ගොනගල් සාකච්චා කිරීමට වඩාත් උවමනාවෙන් සිටියේ ඒගැන බව පෙනෙන්නට තිබුනේය, ඇය දිවා රෑ සීතල, දෘඪ තාප්පය මත රැඳී සිටීයේ ඇත්ත වශයෙන්ම ඒ ගැන දනගැනීමටයි. බළලෙක් ලෙස හෝ කාන්තාවක් ලෙස කවදාවත් නොබැලූ තරමේ පසාරු වෙන බැල්මක් ඇගේ මුහුණේ විය. "සියලු දෙනා" පවසන සෑම දෙයක්ම පැහැදිලිව පෙනෙන්නට තිබුනත්, ඩම්බල්ඩෝර් එය සත්‍යය යැයි පවසන තෙක් ඇය ඒවා විශ්වාස නොකරයි. කෙසේ වෙතත්, ඩම්බල්ඩෝ පිළිතුරක් නොදී තවත් ලෙමන් බිංදුවක් තෝරා ගත්තේය.

Downloaded from sinhalaebooks.com

"එයාලා කියන්නේ," ඇය නැගී සිටියාය, "ඊයේ රෑ වොල්ඩර්මෝට්, ගොඩ්‍රික්ස් හොලෝ වලට පොටර්ලා හොයාගෙන ගියාලු. ලිලියි ජේම්ස් පොටර් ඒගොල්ලෝ - ඒගොල්ලෝ - එයාලා.. මැරිලලු. "

ඩම්බල්ඩෝ තම හිස නමා එය අනුමත කළේය. මහාචාර්ය මැක්ගෝනගල් ගැස්සුනාය.

"ලිලියි ජේම්සුයි... මට ඒක විශ්වාස කරන්න බැහැ ... මට ඒක විශ්වාස කරන්න ඕනේ නෑ.. ඔහ්, ඇල්බස්.."

ඩම්බල්ඩෝ ඇයගේ උරහිසට තට්ටුවක් දැමීය. "මම දන්නවා ... මම දන්නවා ..." ඔහු දැඩි ලෙස පැවසීය.

මහාචාර්ය මැක්ගොනගල්ගේ කටහඬ ඇඬීමකට ආසන්න විය. "ඒ හැම දේමත් නෙමෙයි, එයා පෝටර්ගේ පුතා හැරීව මරන්න හැදුවත් කියනවා, ඒත් එයාට ඒ පුංචි ළමයා මරන්න බැරිවුනාලු. හැරී පෝටර්ව මරා දාන්න හදනකොට, වොල්ඩමෝට්ගේ බලය මොනාහරි විදිහකින් බිඳීලා - ඒ නිසාලු එයා නැති වුනේ.

ඩම්බල්ඩෝ හිස වැනුවේය

"ඒක - ඒක ඇත්තද?"

"එයා කරපු හැම දෙයක්ම ... මරපු මිනිස්සු ගොඩ ... ඒත් පුංචි කොල්ලෙක්ව මරන්න එයාට බැරිඋනාද? ඒක පුදුමයි... එයාව නතර කරන්ට කරපු හැම දේම ... ඒත්... ඒත් දෙයියන්ගේ නාමයෙන් හැරී බේරුනේ කොහොමද? "

"අපට අනුමාන කරන්න පුළුවන්," ඩම්බල්ඩෝ පැවසීය. "අපිට කවදාවත් දැනගන්න බැහැ."

මහාචාර්ය මැක්ගොනගල් ලේස් ලේන්සුවක් ගෙන ඇගේ ඇස්, ඇස්කණ්ණාඩියට යටින් පිස දැමුවාය. ඩම්බල්ඩෝ සිය සාක්කුවෙන් රත්රන් ඔරලෝසුවක් ගෙන එය පරීක්ෂා කරන අතර නාසය ඉහලට ඇද්දේය. එය ඉතා පුදුම සහගත ඔරලෝසුවක් විය. එය අත් දොළොසක් විය. නමුත් නොම්මර තිබුනේ නැත. ඒ වෙනුවට, කුඩා ග්‍රහලෝකයන් මායිම වටා ගමන් කරමින් සිටිති. ඩම්බල්ඩෝට එය අර්ථවත් විය හැක. ඒ, ඔහු එය තම සාක්කුවේ දමමින්, “හැග්‍රිඩ් පරක්කුයි." යැයි පැවසූ හෙයිණි.

"ඔව්," මහාචාර්ය මැක්ගොනගල් පැවසීය. "මම හිතන්නෙ නෑ ඔයා මේ වෙලාවේ මෙහෙට ආවේ ඇයි කියලා මට කියයි කියලා?"

Downloaded from sinhalaebooks.com

" මම ආවේ හැරීව එයාගේ නැන්දාටයි මාමාටයි බාර දෙන්න. එයාට ඉතුරු එකම නෑදෑ පවුල එයාලා විතරයි."

"ඔයා ඇත්තටම එහෙම හිතුවේ නැහැ නේද- මෙතන ජීවත් වන මිනිස්සු ගැන එහෙම හිතන්න පුලුවන්ද?" මහාචාර්ය මැක්ගොනගල් සිටගෙන අංක හතර පෙන්වමින්.

"ඩම්බල්ඩෝ- ඔයාට බැහැ, මම දවසම ඒගොල්ලන් දිහා බලාගෙන හිටියා, අපිට වඩා වෙනස් පුංචි මිනිස්සු දෙන්නෙක්ව හොයාගන්න බැරිද. ඒගොල්ලන්ට පුතෙක් ඉන්නවා - මම දැක්කා එයා පල්ලෙහා පාරෙදි රසකැවිලි ඉල්ලලා එයාගේ අම්මාට කෑ ගගහා පයින් ගැහුවා ... හැරී පොටර් ඇවිත් මෙතන ඉන්න! "

ඩම්බල්ඩෝ දැඩිව කියා සිටියේ "ඒක එයාට හොඳම තැන. " එයාගේ හරි වයසට ආවම එයාගෙ නැන්දාටත් මාමාටත් එයාට හැම දෙයක්ම පැහැදිලි කරන්න පුළුවන්. මම එයාලට ලියුමක් ලියුවා.''

"ලියුමක්?" මහාචාර්ය මැක්ගොනගල් බිඳුනු කටහඬින් අසා නැවතත් බිත්තිය මත වාඩිවිය. "ඇත්තටම ඩම්බල්ඩෝ, ඔයාට ඒ ඔක්කොම මේ ලිවුමෙන් පැහැදිලි කරන්න පුළුවන්ද? මේ මිනිස්සු කවදාවත් එයාව තේරුම් ගන්නේ නැහැ. එයා ජනප්‍රිය වෙයි - ජනප්රවාදයක් වෙයි - අද හැරි පොටර්ගේ දිනය කියලා අනාගතේදි කියනවානම් මම පුදුම වෙන්නේ නැහැ - හැරී ගැන ලියවුණු පොත්වලන් අපේ ලෝකයේ ඉන්න හැම දරුවෙකුම එයාගේ නම දැනගනීවි! "

"අනිවාර්යයෙන්," අඩසඳ හැඩයෙ කණ්ණාඩියට ඉහළින් බැරෑරුම්ව බැලූ ඩම්බල්ඩෝ පැවසීය. "ඒක ඇති ඕනෑම කොල්ලෙක්ගේ හිත වෙනස් කරන්න, එයා ඇවිදින්න කතා කරන්න කළින්ම ප්‍රසිද්ධ වෙයි. තමන්ට මතකයට ගන්නවත් බැරි දේකට!" ''එයා ඒවා තේරුම් ගන්න පුළුවන් වයසට එනකන් හැමදෙයින්ම ඈත්වෙලා ඉන්න එක හොඳයි කියන එක ඔයාට පේන්නේ නැද්ද? "

මහාචාර්ය මැක්ගොනගල් යමක් කීමට කට ඇරියාය, නමුත් ඇගේ මනස වෙනස් කර ගත්තාය, පසුව: "ඔව් - ඔව්, ඔයා හරි, ඇත්තටම, ඒත් දරුවා මෙතැනට එන්නේ කොහොමද ඩම්බල්ඩෝ"? ඇය ඔහුගේ ලෝගුව දෙස උවමනාවෙන් බැලුවේ ලෝගුව තුළ හැරී සඟවාගෙන සිටී දැයි සිතමිනි.

"හැග්‍රිඩ් එයාව අරගෙන එයි."

"ඔයා හිතන්නේ ඒක බුද්ධිමත් අදහසක්ද? ඒ වගේ වැදගත් වැඩකට හැග්‍රිඩ්ව විශ්වාස කරන්න පුලුවන්ද."

''මගේ පණ වගේ මම හැග්‍රිඩ්ව විශ්වාස කරනවා'' ඩම්බලඩෝර් පැවසීය.

Downloaded from sinhalaebooks.com

මහාචාර්ය මැක්ගොනගල් නොසැලකිලිමත් ලෙස කියා සිටියාය. ‘‘එයාගේ හිත හොඳ නෑ කියලා මම කියන්නේ නෑ" ඒත් එයා නොසැලකිලිමත් කෙනෙක් නෙවෙයි කියන්න ඔයාට බෑ, එයා ලැස්ති වෙන්නේ.... ඒ මොකද්ද?

සිහින් දෙදරණ හඬක් ඔවුන් වටා නිශ්ශබ්දතාව බිඳ දැමීය. ඔවුන් එහි පහන් එලියක් බලාපොරොත්තුවෙන් පාර ඒ කෙළවර සිට මේ කෙළවරට උඩ බිම බලන අතරේ ශබ්දය තව තවත් වර්ධනය විය. ඔවුන් දෙදෙනා අහස දෙස බලද්දී එය මහා ගෝසාවක් බවට පත්ව තිබුණි.විශාල යතුරුපැදියක් වාතය කපා ගෙන අහසින් ඇද වැටුණු අතර ඔවුන් ඉදිරිපිට මාර්ගයේ නවත්වන ලදී.

යතුරුපැදිය දැවැන්ත වූවාට එය අසල සිටගත් මනුස්සයා තරමට ගැළපුනේ නැත. ඔහු සාමාන්‍ය මිනිසෙකුගේ උස මෙන් දෙගුණයකුත් පළල මෙන් පස්ගුණයක් වත් විය. ඔහු සැළකිය නොහැකි තරම් විශාල ලෙස පෙනුනේය. බොකුටු කළු හිසකෙස් සහ දිගු විශාල රැවුලෙන් ඔහුගේ මුහුණෙන් භාගයක්වත් සැඟවී තිබිණි. ඔහුගේ අත්ලක් කුණු බඳුනක පියනක් තරමේ විය. ඔහුගේ බූට්ස් දැමූ පාද ඩොල්ෆින් පැටවු දෙදෙනෙක් වගේ විය. ඔහුගේ අතිවිශාල මාංශ පේශි අතරේ ඔහු අතින් රෙදි පොදියක් තුරුල්කරගෙන සිටියේය.

‘‘හැග්‍රිඩ්..., "ඩම්බල්ඩෝර් පැවසීය." අන්තිමේදි ආවා... මේ බයිසිකලේ හොයා ගත්තේ කොහෙන්ද? "

"ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝ සර්, ඒක මම ඉල්ලාගත්තා." යෝධයා පැවසුවේ, යතුරු පැදියෙන් එසැණින් සුපරික්ෂාකාරී ලෙස බසිමින්ය. "තරුණ සිරියස් බ්ලැක් මට ඒක දුන්නා, .. බබා මගේ ලඟ, සර්."

"කිසිම ප්‍රශ්නයක් නැද්ද?"

"නැහැ, සර්-ගෙදර සම්පූර්ණයෙන්ම වගේ විනාශ වෙලා ගියත්, මගල්ලා නැගිට්න්න කළින් මම එයාව එලියට ගත්තා. අපි බ්‍රිස්ටෝල් වලට උඩින් එන අතරේ එයාට මගේ අත්දෙකේ නින්ද ගියා’’

ඩම්බල්ඩෝර් සහ මහාචාර්ය මැක්ගොනගල් රෙදි පොදිය වෙත නැඹුරු විය. ඇතුළත, යන්තම් පෙනෙන ලෙස, කුඩා දරුවෙක්, තදින් නිදාගෙන සිටියේය. ඔහුගේ නළලේ තදකළු හිසකෙස් වළට යටින් අකුණු කදම්බයක හැඩයේ කැපුමක් කුතුහලයෙන් බලනා ඇසට දැක ගත හැකි විය.

"එතනද?" මහාචාර්ය මැක්ගොනගල් ඇසීය

"ඔව්," ඩම්බල්ඩෝර් පැවසීය. "ඒ පැල්ලම හැමදාටම තියෙයි."

"ඔයාට ඒ ගැන යමක් කරන්න බැරිද, ඩම්බල්ඩෝ?"

Downloaded from sinhalaebooks.com

"මට පුළුවන් උනත්, මම එහෙම කරන්නනේ නැහැ."'' ඒක ප්‍රයෝජනවත් වෙන්න පුළුවන්'' "ලන්ඩන් උමං මාර්ගයේ පරිපූර්ණ සිතියමක පැල්ලමක් මගේ වම් දණහිසට උඩින් තියනවා"

"හොඳයි- එයාව මට දෙන්න හැග්‍රිඩ්. අපි මේ වැඩේ ඉවරයක් කරමු. "

ඩම්බල්ඩෝර් හැරීව තම දෑතට ගෙන ඩර්ස්ලි නිවස දෙසට හැරුනේය.

"මට ඔහුගෙන් සමුගන්න පුළුවන්ද සර්'' හැග්‍රිඩ් ඇසීය: ඔහු හැරී දෙසට ඔහුගේ විශාල හිස නවා බැලූ අතර, අනිවාර්යයෙන් රැවුල වැදී කසන්නට ඉඩඇති, හාදුවක් ඔහුට ලබා දුන්නේය. ඉන්පසු තුවාල ලැබූ බල්ලෙක් වගේ හඩන්නට විය.

"ශුෂ්.!" මහාචාර්ය මැක්ගොනගල් කෙඳිරීය, "ඔයා මගල් ලාව ඇහැරවයි.

"ස-ස- සමාවෙන්න", හැග්‍රිඩ් ඉකිබිඳිමින් , විශාල ලේන්සුවක් එලියට ගෙන එහි මුහුණ සඟවා ගත්තේය. "ඒත් මට දරාගන්න බෑ. ඒ ඒ  ලිලී - ජේම්ස් මැරිලා - අසරණ හැරී මගල් ලා එක්ක ජීවත් වෙන්න යනවා"

"ඔව්, ඔව්, ඒක ගොඩක් දුකයි. ඒත්, ඔය හිත හදාගන්න හැග්‍රිඩ්, නැත්තන් අපිව අහු වෙයි," මහාචාර්ය මැක්ගොනගල් ඔහුගේ බාහුවට තට්ටු කරමින් කෙඳිරීය, ඩම්බල්ඩෝර් උද්‍යානයේ පහත් බැමි අතරින් දොර දෙසට යන්නට විය. ඔහු පරිස්සමට හැරීව දොරකඩ තබා, තම ලෝගුවෙන් ලිපියක් රැගෙන හැරී ගේ බ්ලැන්කට් එකතුල රැඳවූ පසුව අනෙක් දෙදෙනා වෙත ආපසු පැමිණියේය. මිනිත්තුවක් ඔවුන් තිදෙනා කුඩා පොදිය දෙස බලා සිටියහ. හැග්‍රිඩ්ගේ උරහිස ගැස්සුණි. මහාචාර්ය මැක්ගොනගල් වේගයෙන් ඇසිපිය ගැසුවාය. ඩම්බල්ඩෝර්ගේ ඇස්වල සාමාන්‍යයෙන් දිදුලන ආලෝකය පෙනෙන්නට නොතිබුනි.

"හොඳයි," ඩම්බල්ඩෝර් අවසානයේ මෙසේ පැවසීය:  "අපි තවත් මෙතන ඉන්න එක සුදුසු නැහැ''. '' අපි ගිහින් උත්සවයට සහභාගී වෙමු''.

"ඔව්," "මම සිරියස්ට එයාගේ බයිසිකලේ ආපසු බාර දෙන්න ඕනේ" යනුවෙන් හැග්‍රිඩ් කීවේය:  "සුභ රාත්‍රියක් ප්‍රොෆෙසර් මක්ගොනගල්, ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝර්, සර්."

තම තෙත ඇස් පිසදාගෙන හැග්‍රිඩ් යතුරු පැදියට පැන, එන්ජිම පණගැන්වීය; ගර්ජනාවක් සමඟ එය රාත්‍රී අහසට නැඟී අඳුරේ නොපෙනී ගියේය.

Downloaded from sinhalaebooks.com

"මම හිතන්නේ ඉක්මනින් මම ඔයාව හමුවෙන්නම්, ප්‍රොෆෙසර් මැක්ගොනගල්.'' මහාචාර්ය මැක්ගොනගල් පිළිතුරු ලෙස ඇගේ නාසය ඉහළට ඇද්දාය.

ඩම්බල්ඩෝර් හැරී වීදියට බැස ගියේය. පාර කෙළවරේ නැවතුන හේ රිදීපැහැ ආලෝක රදවනය පිටතට ගෙන එක් වරක් ක්ලික් කළ අතර ආලෝක එළි දොළහක් වීදි ලාම්පු දොළහ වෙත වේගයෙන් ඇදී ගියේය. එවිට ප්‍රයිවට් ඩ්‍රයිව් පෙදෙස හදිසියේම තැඹිලි පැහැ වූවෙන් වීදියෙහි අනෙක් කෙළවරේ පූල්ලි බළලෙකු ගමන් කරනු පෙනෙන්නට විය. අංක හතරේ දොරකඩ බ්ලැන්කට් පොදිය දැකීමට ඔහුට හැකි විය.

"ජය වේවා, හැරී", ඔහු කෙදිරීය. ඔහු අනෙක් පසට හැරී ලෝගුවේ සරසරයත් සමග නොපෙනී ගියේය.

අඳුරු අහසට යට නිහඬ හා සුන්දර වූ ප්‍රයිවට් ඩ්‍රයිව් වනාහී පුදුමසහගත දේවල් බලාපොරොත්තු විහහැකි අන්තිම ස්ථානය විය. හැරිපොටර් හැඬීමකින් තොරව ඔහුගේ බ්ලැන්කට්ටුව ඇතුලත පෙරළුණි. තමා ජනප්‍රිය බව ඔහු දැන සිටියේ නැත.. තව පැය කීපයකින් නිදිමතින් කිරි බෝතල් එළියෙන් තැබීමට දොර අරින තම නැන්දාගේ කෑගැසීමත් සමග තමා අවදිවන බව හෝ ඊලඟ සති කිහිපය ඔහු ගත කරන්නේ ඔහුගේ ඥාති සොහොයුරු ඩඩ්ලිගේ විකාර සහ කෙනෙත්තීම් සමග බව දැන සිටියේ නැත.. එහෙත් මේ මොහොතේ රට පුරා රහසිගතව රැස්වූ කණ්ඩායමක් සිය වීදුරු ඔසවා "හැරි පෝටර්ට - ජීවත් වූ පිරිමි ළමයාට" ලෙස පවසමින් සවුදිය පිරූහ.

දෙවන පරිච්ඡේදය

අතුරුදන් වෙන වීදුරුව

හැරීව දොර පඩිය මතින් හමුවී දස වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණද, ප්‍රයිවට් ඩ්‍රයිව් කිසිසේත්ම වෙනස් වූයේ නැත. සූර්යයා එම පිරිසිදු ඉදිරිපස උද්‍යානයේ සිට ඩර්ස්ලි ගේ ඉදිරිපස දොරටුවේ අංක හතර පිත්තල තහඩුව තෙක්ම ආලෝකය පැතිරවීය

ඔවුන්ගේ විසිත්ත කාමරයට එලිය වැටී ඇති අතර, එය ඩර්ස්ලි මහතා විසින් බකමූණන් පිළිබඳ සවිස්තරාත්මක ප්‍රවෘත්ති වාර්තාව දුටු රාත්‍රියේ තිබුණු ආකාරයටම තිබේ. ඡායාරූප පමණක් කොතරම් කාලයක් ගත වී තිබුණේද යන්න ඇත්තෙන්ම පෙන්වා දුන්නේය. මීට වසර 10 කට පෙර විවිධ වර්ණ ඇඳුම් සහිත විශාල රෝස පැහැති බෝලයක් වැනි බබෙක්ගේ බොහෝ පින්තූර තිබුනේය. නමුත් ඩඩ්ලි ඩර්ස්ලි තවදුරටත් බිළිඳකු නොවූ අතර, දැන් ඡායාරූප ඔහුගේ පළමු බයිසිකලයෙන් ගමන් කරන විශාල පුංචි පිරිමි ළමයෙක් පෙන්නුම් කළේය. ඔහුගේ පියා සමඟ පරිගණක ක්‍රීඩා කිරීමක්, ඔහුගේ මව විසින් සිපගන්නා ඡායාරූපයක් ද විය. නිවසේ තවත් පිරිමි ළමයෙක් ජීවත් වන බවට කිසිදු සළකුණක් එහි නොවීය.

Downloaded from sinhalaebooks.com

එහෙත් හැරී පෝටර් තවමත් එහි නිදාගෙන සිටියේය. නමුත් දිගු වේලාවකට නොවේ. ඔහුගේ නැන්දා පෙටූනියා අවදිව සිටි අතර, ඇය දවසේ පළමු හඬ බවට පත්විය.

"නැඟිටිනවා,... මේ දැන්ම!"

හැරී අවදි වීමට සිතුවා පමණි. ඔහුගේ නැන්දා නැවතත් දොරට තට්ටු කළාය.

"නැගිටිනවා!" ඇය කෑගැසුවා. ඇය කුස්සියට යන හඬට ඔහු ඇහුම්කන් දුන්නේය. උඳුනේ ලිප උඩ උයන බඳුන් වල ශබ්දය ඔහුට ඇසුණේය. ඔහු නැවතත් පොරවණය තුළ ගුලි වූ අතර ඔහු දුටු සිහිනය සිහි කිරීමට උත්සාහ කළේය. එය හොඳ එකක් විය. එහි පියාසැරි යතුරු පැදියක් තිබුණා. ඔහු මීට පෙරත් සිහිනයෙන් එය දැක තිබුණි.

ඔහුගේ නැන්දා දොරෙන් එළියට ආවා.

"තවම  නැගිටලා නැද්ද?" ඇය ඇසුවාය.

"ගොඩක් දුරට," හැරී පැවසීය.

"හොඳයි, ඔයාට වැඩක් තියනවා, ඔයා බේකන් ටික බලන්න. කර වෙන්න බෑ. ඩඩ්ලිගේ උපන් දින උත්සවය මට සර්ව සම්පූර්ණ වෙන්න ඕනේ"

හැරී කෙඳිරිගෑවේ.

"මොකද්ද කීවේ?" ඔහුගේ නැන්දා දොරට තට්ටු කළාය.

"මොකුත් නෑ, මොකුත් නෑ ..."

ඩඩ්ලිගේ උපන් දිනය - ඔහුට අමතක කළ හැක්කේ කෙසේද? හැරී ඉක්මනින් ඇඳෙන් බැස ඇවිත් මේස් සොයන්නට පටන් ගත්තේය. ඔහුට ඇඳ යටින් මේස් හමු වූ අතර, ඉන් එකකින් මකුළුවෙක් ඇද දැමූ පසු එය ඇඳ ගත්තේය. තරප්පු පෙළ යට කබඩ් එක මකුළුවන්ගෙන් පිරී තිබුණු බැවින් ඔහු මකුළුවන්ට හුරු විය. ඔව්... හැරී නිදාගත්තේ එහියි.

Downloaded from sinhalaebooks.com

ඔහු ඇඳුමක් ඇඳගෙන විසිත්ත කාමරය හරහා කුස්සියට ගියේය. මේස සියල්ල ඩඩ්ලිගේ උපන් දින තෑගි වලින් සැඟවුණි. ඩඩ්ලිට අලුත් පරිගණකයක් ලැබී තිබුණි. දෙවන රූපවාහිනිය හා ධාවන පාපැදිය ගැනත් සඳහන් නොකර බැහැ. ඩඩ්ලිට ධාවන පාපැදියක් අවශ්‍ය වූයේ ඇයිදැයි හරියටම කිව නොහැක.. ඩඩ්ලි වෙහෙස වීමට මැලි විය. ඩඩ්ලිගේ ප්‍රියතම ක්‍රීඩාව හැරීට තඩිබෑමයි, නමුත් ඔහුට බොහෝ විට හැරීව අල්ලා ගැනීමට නොහැකි විය. හැරී ශක්තිමත් වූයේ නැත, නමුත් ඔහු ඉතා වේගවත් විය.

සමහර විට ඒ අඳුරු කබඩ් එකේ ජීවත් වීමේ ප්‍රතිපල විය හැක. හැරී සෑම විටම ඔහුගේ වයසට වඩා කුඩා හා කෑහැටු විය. ඔහු ඩඩ්ලිගේ පැරණි ඇඳුම් අඳින නිසා තවත් කුඩාවට පෙනෙන්නට විය. ඩඩ්ලිගේ ඇඳුම් ඔහුට වඩා හතර ගුණයක් විශාල විය. හැරීට කුඩා මුහුණක්, කෙට්ටු කකුල්, කළු හිසකෙස් සහ දීප්තිමත් හරිත ඇස් තිබිණි. සෑම විටම ඩඩ්ලි තදින් පහර දී ඇති නිසා කැඩී ගිය තැන්වල ස්කොච් ටේප් ගොඩක් ඔතන ලද වටකුරු කණ්නාඩියක් පැළඳීය. තම පෙනුම ගැන හැරි කැමති වූ එකම දෙය ඔහුගේ නළලේ වූ කැළලයි. එය අකුණු කදම්බයක් මෙන් හැඩැති විය. ඔහුට එය මතක ඇති තාක් කල් තිබිණි. ඔහුගේ නැන්දා පෙටූනියාගෙන් විමසූ පළමු ප්‍රශ්ණය වූයේ එය ආවේ කොහොමද යන්නයි.

"ඔයාගේ දෙමව්පියන් මැරුනේ වාහන  අනතුරකින්" කියා ඇය පැවසුවා. "ප්‍රශ්න අහන්න එපා"

ප්‍රශ්න අහන්න එපා - එය හැරීට ඩර්ස්ලි පවුල සමග නිහඬ ජීවිතයක් සඳහා ලැබුණු පළමු නියමය එය විය.

හැරී බේකන් අනෙක් පස හරවන විටම වර්නන් ඩර්ස්ලි මුළුතැන්ගෙය ඇතුළට ආවේය.

"ඔය කොන්ඩේ පීරගන්නවා!" උදෑසන සුභ පැතුම් වගේ ඔහුගේ මුවින් පිටවිය.

සතියකට පමණ වරක් වර්නන් මාමා ඔහුගේ පුවත්පතට ඉහළින් බලා හැරීගේ කොණ්ඩය කැපිය යුතු යැයි කෑගැසුවේය. හැරීගේ පන්තියේ අනෙකුත් පිරිමි ළමයින්ට වඩා වැඩි වාර ගණනක් හැරීගේ කොණ්ඩය කපන ලදී.

ඒ, නමුත් එය වෙනස් නැත, ඔහුගේ හිසකෙස් ඉක්මනින් වර්ධනය වී - පැතිරී යයි.

ඩඩ්ලි තම මව සමඟ කුස්සිය වෙත පැමිණෙන විට හැරී බිත්තර බදිමින් සිටියේය. ඩඩ්ලිගේ පෙනුම හරියටම වර්නන් වගේම විය. ඔහුට විශාල රෝස පැහැති මුහුණක්, කෙටි බෙල්ලක්, කුඩා, දියාරු නිල් පැහැති ඇස් සහ විශාල හිසට ඇලුනු තඹ පැහැ ඝන හිසකෙස් විය. ඩඩ්ලි පුංචි දේවදූතයෙක් වගේ  දැයි පෙටූනියා නිතරම කියයි. හැරී කියන්නේ ඔහු බොරු කොණ්ඩයක් දැමූ ඌරෙක් වගේ කියලා.

හැරී මේසය මත බිත්තර සහ බේකන් පිගන් අපහසුවෙන් තැබුවේ, එහි ඉඩක් නොතිබුණු නිසාය. මේ අතරතුර ඩඩ්ලි සිය තෑගි ගණන් කළේය. ඔහුගේ මුහුණ අඳුරු වී ගියේය.

Downloaded from sinhalaebooks.com

"තිස් හයයි," ඔහු තම අම්මා හා තාත්තා දෙස බළමින් කෑගැසුවේය. "ගිය අවුරුද්දට වඩා දෙකක් අඩුවෙන්...."

"වස්තුවේ, ඔයා මාජ් නැන්දගේ තෑග්ග ගණන් කරළා නෑ, බලන්න, ඒක මේ අම්මාගෙනුයි තාත්තාගෙනුයි ලැබුන මේ ලොකු තෑග්ග යට."

"හොඳයි, තිස් හතක් එතකොට," ඩඩ්ලි රතු පාට විය. ඩඩ්ලි තරහින් පුපුරන්නට ආසන්න බව දුටු හැරි, ඩඩ්ලි මේසය අනෙක් පස පෙරලයි දෝ සිතා, හැකි තරම් ඉක්මනින් තම බේකන් ටික ගිල දැමුවේය.

පෙටූනියා නැන්දාටත් එය අනිවාර්යයෙන් දකින්නට ලැබීමෙන්, ඇය ඉක්මණින් පැවසුවේ, "අපි අද එලියට ගියාම තවත් තෑගි වර්ග දෙකක් ගනිමු. ආ පැටියෝ... තව දෙකක්.."

ඩඩ්ලි මොහොතක් සිතුවා. එය හොඳ වැඩක් වගේ. අන්තිමේදී ඔහු සෙමින් කෙදිරි ගෑවේය, "එතකොට මට තෑගි තිස්.....තිස් ..."

"තිස් නමයක්, පැටියෝ," පෙටූනියා නැන්දා කීවාය.

"ඕ." ඩඩ්ලි දැඩි ලෙස අසුන්ගෙන, ආසන්නතම පාර්සලය උදුරා ගත්තේය. "හරි හරි."

වර්නන් හක හක ගෑවේය. "පුංචි කොල්ලා තාත්තා වගේම තමනගේ වටිනාකම දන්නවා. ඩඩ්ලි, නියමයි කොල්ලෝ! " ඔහු ඩඩ්ලිගේ හිස අතගෑවේය.

ඒ මොහොතේදී දුරකථනය නාදවිය. පෙටූනියා ඊට උත්තර දීමට ගිය අතර හැරි සහ වර්නන්, ඩඩ්ලි ඔතාතිබූ ධාවන බයිසිකලය, වීඩියෝ කැමරාවක්, දුරස්ථ පාලක ගුවන් යානයක්, නවීන පරිගණක ක්‍රීඩා දාසයක් සහ වීඩියෝ කැසට් රෙකෝඩරයක් එලියට ගනු බලා සිටියෝය. ඔහු රත්තරන් අත් ඔරලෝසුව සහිත පෙට්ටිය ඔතා තිබූ කඩදාසිය ඉරද්දී පෙටූනියා කෝපයට සහ කනස්සල්ලට පත්ව නැවත පැමිණියාය.

"නරක ආරංචියක්, වර්නන්," ඇය කීවාය. "ෆිග් මහත්මියගේ කකුල කැඩිලා. හැරීට එහේ යන්න බැහැ." ඇය හැරීගේ දිශාවට ඇගේ හිස හරවමින් කීවාය.

ඩඩ්ලිගේ කට ඇද විය විය. නමුත් හැරීගේ හදවත උඩ පැන්නේය. ඩඩ්ලිගේ උපන් දිනයේ සෑම වසරකම ඔහුගේ දෙමාපියන් ඔහුව සහ ඔහුගේ මිතුරාව දවසම, ත්‍රාසජනක උද්‍යාන, හැම්බර්ගර් අවන්හල් හෝ චිත්‍රපටි වෙත රැගෙන යයි. හැම අවුරුද්දේම හැරී, ෆිග් නම් වූ වීදී දෙකක් එහා ජීවත් වූ පිස්සු, වයසක කාන්තාවක් සමඟ තබා ගියේය. හැරී ඊට වෛර කළේය. ඒ මුළු නිවසම ගෝවාට ගඳ වූ අතර, ෆිග් මහත්මිය විසින් තමාට අයිතිව සිටි සෑම බළලෙක්ගේම ඡායාරූපය බැලීමට දිනපතා හැරීට බල කරයි.

Downloaded from sinhalaebooks.com

"දැන් මොකක්ද කරන්නේ?" පෙටූනියා හැරී දෙස බලමින් කියුවේ, හරියට හැරී මේක සැලසුම් කරපු දෙයක් දැයි බලන්න වගේ. ෆිග් මහත්මියගේ කකුල කැඩීම ගැන තමා කණගාටු විය යුතු බව හැරී දැන සිටියේය. එහෙත් ඔහු ටිබ්ල්ස්, ස්නෝවි, පව්ස් සහ ටෆ්ටි යන අය දෙස බැලීම තව මුළු අවුරුද්දක්ම පස්සට යන බව සිහිපත් කළ විට එය පහසු නොවීය.

"අපි මාජීට කතා කරමු" යයි වර්නන් යෝජනා කළේය.

"මෝඩ වෙන්න එපා, වර්නන්, එයා මේ ළමයාට වෛර කරනවා."

ඩර්සලිවරු බොහෝ විට හැරී ගැන නොසිතා හෝ ඔහු එතන නොමැති බව සලකමින්, එසේත් නැතිනම්, ඔහු සතෙකු සේ නොසලකා හරිමින් කතා කළහ.

"මොකක්ද එයාගේ නම, අර ඔයාගේ යාළුවා? ඉවෝන්?"

"මියන්මාරයේ නිවාඩුවක් ගත කරන්න ගිහින්"

"ඔයාලාට මාව මෙහේ දාලා යන්න පුළුවන්නේ." හැරී වටපිට බැලුවේය. (රූපවාහිනිය බැලීමට ඔහුට හැකි වනු ඇති අතර ඇතැම් විට ඩඩ්ලිගේ පරිගණකය භාවිතා කරන්නත් හැකි වනු ඇත).

පෙටූනියා නැන්දා, ඇය දෙහි කෑවා වගේ ඇඹුල් කරගත් මුහුණින් ඔහු දෙස බැලුවාය.

"ආපහු ඇවිත් ගෙදර විනාස කරලා තියනවා බලන්නද?" ඇයට කියවිණි.

"මම ගෙදර වනසන්නේ නැහැ" කියා හැරී පැවසුවේය. එහෙත් ඔවුන් එය ඇසුවේ නැත.

"මම හිතන්නේ අපි එයාව සත්තු වත්තට ගෙනියලා" කියා පෙටූනියා සෙමින් කිව්වාය, "...එයාව කාර් එකේ තියමු"

"ඒ කාර් එක අලුත්, එයාව එකේ තනියම තියන්න බෑ .."

Downloaded from sinhalaebooks.com

ඩඩ්ලි ශබ්ද නගා හඬන්නට පටන්ගත්තේය. ඇත්ත වශයෙන්ම, ඔහු සැබෑවටම අඬන්නේ නැත - ඔහු සැබවින්ම හඬා අවුරුදු ගණනාවක් ගත වී තිබුණද, ඔහු තම මුහුණ දික් කරගත්තේ නම්, ඔහුගේ අම්මා තමාට අවශ්‍ය ඕනෑම දෙයක් දෙන බව දැන සිටියේය.

"ඩඩ්ලි පැටියෝ, වස්තුවේ අඬන්න එපා, අම්මා ඔයාගේ විශේෂ දිනේ නරක් කරන්න ඉඩ දෙන්නේ නෑ!" ඇය ඇඳුම් අතරින් ඔහු වටා දෑත් යවා ඔහුව තුරුල් කර ගත්තාය.

“ එයා... එන්න ..ඕනේ නෑ ..මට!" ඩඩ්ලි දැවැන්ත මවාපෑම් අතරේ කෑගැසුවේය. "එයා හැම දෙයක්ම විනාස කරලා දායි" එයා අම්මාගේ අතේ හිඩැස් අතරින් හැරී දෙස රවා බලමින් කීවේය.

එතකොටම දොරේ බෙල් එක නාද විය. "අපොයි දෙයියනේ , එයාලා ඇවිත්!" දරුවාගේ හොඳම මිතුරා වන පියර්ස් පොල්කිස් තම මව සමඟ පැමිණ සිටියේය. පියර්ස් යනු මීයෙකු මෙන් මුහුණු සහිත පුංචි දරුවෙකි. ඩඩ්ලි අනෙක් ළමයින්ට පහර දෙද්දී ඔවුන්ගේ අත් පිටුපසට කර අල්ලාගෙන සිටින්නේ ඔහුයි. ඩඩ්ලි වහාම තම බොරු ඇඬිල්ල නැවැත්තුවේය.

පැය භාගයකට පසුව, ඔහුගේ වාසනාව ඇදහිය නොහැකි වූ හැරී, ඩියර්ලස් මෝටර් රථයේ පිටුපසින් වාඩි වී සිටියේ පියර්ස් සහ ඩඩ්ලි සමඟයි. ඔහුගේ නැන්දා සහ මාමාට ඔහුට කළ හැකි කිසිවක් ගැන සිතා ගැනීමට නොහැකි විය. නමුත් යන්නට පෙර මාමා හැරී වෙත ගියේය.

"මම තමුන්ට අනතුරු අඟවනවා" යි ඔහු කීවේ, ඔහුගේ විශාල දම් පැහැති මුහුණ හැරී ගේ අසලටම කරමිනි, "දැන් මම තමුන්ට අනතුරු අඟවනවා, කොළුවෝ- මොනා හරි විහිළු දෙයක් හරි, මොනාම හරි දෙයක් කරලා තිබ්බොත් - අර කබඩ් එකේ නත්තල් වෙනකන් ඉන්න වෙයි එලියට එන්නේ නැතුව.

"මම කිසිම දෙයක් කරන්න යන්නේ නැහැ" කියා හැරී පැවසුවේය "අවංකවම..”

නමුත් වර්නන් මාමා ඔහුව විශ්වාස කළේ නැත. කවුරුත් කවදාවත් ඔහුව විශ්වාස කලේ නැහැ.

ගැටලුව වූයේ, හැරී අවට අමුතු දේවල් බොහෝ විට සිදු වූ අතර ඔහු එය සිදු නොකරන බව ඩර්ස්ලින්ට කියා සිටියත් පළක් වූයේ නැත.

එක දවසක් පෙටූනියා හැරීව බාබර් වෙත ගෙන ගොස් වෙහෙසට පත් වී එන අතර ඔහුගේ හිස කෙස් වල වෙනසක් නොමැති බව දැක කෝපයට පත් වූ අතර, කුස්සියේ තිබූ කතුරක් ගෙන ඔහුගේ කෙස් කපා කෙතරම් කෙටි කළේද යත් ඔහුගේ හිස බූ ගෑවාක් මෙන් පෙනුණි, ඒ බිහිසුණු කැළල සැඟවීමට ඉදිරිපස කෙස් රොද කිහිපයක් පමණක් ඉතිරි කර තිබුණි. ඩඩ්ලි කෑ ගසමින් හිනා වූ අතර හෙට දවසේ පාසලේ දී ලැබෙන නින්දා අපහාස ගැන සිතූ හැරීට එදින රාත්‍රී නින්ද ගියේ නැත. දැනටමත් ඔහුගේ විශාල ඇඳුම් සහ පටි ඔතන ලද කණ්නාඩියට ළමයින් හිනැහී

Downloaded from sinhalaebooks.com

තිබිණ. කෙසේ වෙතත් ඊළඟ දවසේ උදෑසන  ඔහු දුටුවේ පෙටූනියා නැන්දා කපා දැමීමට පෙර තිබූ ආකාරයටම තම හිසකෙස් වැවී තිබෙන බවයි.. ඒ වෙනුවෙන් ඔහුට තම කබඩ් එකේ සතියක් ඉන්නට සිදුවුණි. එය එතරම් ඉක්මනින් වර්ධනය වී ඇති ආකාරය නොදන්නා බව කීවත් පළක් නොවුනි.

තවත් වතාවක්, පෙටූනියා නැන්දා ඩඩ්ලිගේ පැරණි (තැඹිලි පාට බෝල සහිත )දුඹුරු පැහැ ස්වීටරයක් හැරීට ඇන්දවීමට උත්සාහ දැරුවාය. - හිසෙන් පහලට ඇදීමට උත්සාහ කරන වාරයක් පාසා එය කුඩා විය. අවසානයේ එය අත් රූකඩයකට ඇන්දවිය හැකි තරම් කුඩා විය, එය නිසැකවම හැරීට ගැලපෙන්නේ නැත. පෙටූනියා නැන්දා තීරණය කලේ එය සෝදා පිරිසිදු කරද්දී යමක් සිදු වී ඇති බවය, ඔහුගේ අතිශය සහනය උදෙසා හැරීට දඬුවම් නොලැබුණි.

තව දවසක, හැරීව පාසැල් කුස්සියේ වහලය මතින් සොයාගැනීම නිසා මහත් භයානක තත්ත්වයකට පත්විය. ඩඩ්ලිගේ කල්ලිය ඔහුව හඹා ගොස් ඇති අතර අන් අයගේ මෙන්ම හැරීගේත් පුදුමයට  ඔහු එහි චිමිනිය මත හිඳගෙන සිටියේය. ඩර්ස්ලින්ට හැරි ගේ පාසල් ප්‍රධානියාගෙන් ගොඩනැගිලි මත නැගීම පිළිබඳ ඉතා කෝපයට පත් වූ ලිපියක් ලැබී තිබිණ. එහෙත් ඔහු උත්සාහ කළේ කුස්සියේ පිටත තිබූ විශාල කුණු බඳුන් පිටුපසට පැන ගැනීමට බවත් , සුළඟ මැද-පැනීමේදී ඔහු සුළඟට හසු වන්නට ඇති බව කියමින් හැරී වර්නන් මාමාට කබඩයතුල සිට කෑ ගැසුවේය.

නමුත් අද කිසිම දෙයක් වැරදි වෙන්නේ නැහැ. එහෙම වුනත් ඩඩ්ලි සහ පියර්ස් සමඟ පාසැලේ නොවන තැනක සිටීම,  කබඩ් එක තුළ හෝ ෆිග් ගේ ගෝවා ගඳ සුවිසල් විසිත්ත කාමරයේ සිටිනවාට වඩා වටින්නක් විය.

රිය පදවන අතරේ වර්නන් නොයේකුත් දේ ගැන  පෙටූනියාට පැමිණිලි කළේය. නොයේක් දේවල් ගැන මැසිවිලි කීමට ඔහු කැමතියි: තමා සමග වැඩ කරන අය, හැරී, සභාව, හැරී, බැංකුව සහ හැරී, ඔහුගේ ප්‍රියතම විෂයයන්ගෙන් කිහිපයක් පමණි. අද උදේ එය ‘‘යතුරු පැදි’’ විය.

"... සිංහයෝ වගේ ගොරෝසු සද්ද දාන, තරුණ භාවෝ," ඔහු තමා පසුකළ යතුරු පැදියක් පෙන්නා කීවේය.

‘‘මම මෝටර් සයිකලයක් ගැන හීනයක් දැක්කා" හදිසියේ සිහිපත් කරමින් හැරී පැවසුවේය.  "ඒක පියාඹන එකක් "

වර්නන් ඉදිරිපස තිබූ මෝටර් රථයේ තම කාරය හැප්පීමට ගොස් වහා නවතා ගති. ඔහු අසුනෙන් පිටුපස හැරී, හැරිට කෑගැසුවේය, ඔහුගේ මුහුණ උඩු රැවුලකින් යුත් දැවැන්ත බීට් අලයක් මෙන් රතු වී තිබිණ. "මෝටර් සයිකල් පියාඹන්නේ නෑ"

ඩඩ්ලි සහ පියර්ස් හිනාවෙන්නට විය.

Downloaded from sinhalaebooks.com

“මම දන්නවා ඒක, " හැරි කීවේය " ඒක හීනයක් විතරයි ".

නමුත් තමා කිසිවක් නොකීවයුතුව තිබූ බව ඔහු සිතුවේය. හැරීගේ ප්‍රශ්න ඇසීම හැර ඊට වඩා වැඩි යමක් ඩර්ස්ලී අකමැති වූයේ නම් ඒ සිදුවිය නොහැක්කක් ගැන ඔහු කතා කිරීමයි. එවා සිහින හෝ කාටූන් එකක තිබූ දෙයක් වුවද එයින් හැරී අන්තරාදායක අදහස් ගනිතැයි ඔවුන් සිතූහ.

එය ඉතාම උනුසුම් සෙනසුරාදාවක් වූ අතර සත්වෝද්‍යානය පවුල්වලින් පිරී ගියේය. ඩර්ස්ලි විසින් ඩඩ්ලි සහ පියර්ස්ට විශාල චොක්ලට් අයිස් ක්‍රීම් දෙකක් මිලදී ගත් අතර පසුව ඉක්මනින් හැරීවත් රැගෙන හැරෙන්නට යද්දී, වෑන් රථයේ සිනහවෙන් සිටි කාන්තාව ඉක්මණින් “ඔයාට මොනාද?” ඇසූවෙන් ඔහුට ඉතා මිල අඩු ලෙමන් අයිස් පොප් එකක් මිලදී ගත්තේය. එකත් නරක නැත, හැරී අයිස් පොප් ලෙවකමින් සිතුවේ, අසල කූඩුවේ හිස කසමින් සිටි ඩඩ්ලිගේ පෙනුම  ඇති ගෝරිල්ලා දෙස බළමිනි., එහෙත් උගේ හිසකෙස් ඩඩ්ලිගේ මෙන් කහ පාට නොවීය.

බොහෝ කලකට පසු හොඳ උදෑසනක් හැරීට තිබිණි. ඔහු ඩර්ස්ලි ලාට දුරින් ඇවිදීමට ප්‍රවේශම් විය. දිවාකාලය වෙද්දී සතුන් ගෙන් වෙහෙසෙන්නට පටන්නා ඩඩ්ලි සහ පියර්ස් ඔවුන්ගේ සුපුරුදු සෙල්ලම පටන් ගත්තොත් ඔවුන්ගෙන් පහර කෑමට හැරී කැමති නැත. ඔවුන් ආහාර අවන්හලක දහවල් ආහාරය ගත් අතර, ඩඩ්ලිගේ අයිස් ක්‍රීමය ඉහළටම පිරී නැති නිසා, වර්නන් මාමා තවත් එකක් මිල දී ගැනීමට ගියෙන් හැරීට මුලින්ම ආහාරගෙන අවසන්  කිරීමට හැකි විය.

හැරීට හැඟී තිබුනේ සියල්ල හොඳින් සිදු වන  බවය.

දිවා ආහාරයෙන් පසු සියල්ලෝ උරග නිවස බැලීමට ගියහ. එහි බිත්ති සන වීදුරු තහඩු වලින් සැදි අතර එය සිසිල් සහ අඳුරු විය. වීදුරු පිටුපසින්, සියලු වර්ගවල කටුස්සන් හා සර්පයන් ලී සහ ගල් අතරින් බඩගාමින් උන්හ. ඩඩ්ලි සහ පියර්ස්ට දැවැන්ත, විෂ සහිත නයි සහ, මිනිසකු-පොඩි කළ හැකි තරමේ පිඹුරන් දැකීමට අවශ්‍ය විය. ඩඩ්ලි ඉක්මනින්ම විශාලතම සර්පයා සොයාගත්තේය. ඌ වර්නන්ගේ මෝටර් රථයේ දෙවරක් සිරුර ඔතා කුණු කූඩයක් මෙන් එය තලා දැමිය හැකි ප්‍රමාණයේ විය. එහෙත් ඌ ඒ මොහොතේ සෙළවුනේ වත් නැත. ඇත්ත වශයෙන්ම, ඌ තදින් නිදා සිටියේය.

ඩඩ්ලි, ඔහුගේ නාසය වීදුරුවට තද කරගෙන ඉස්සී දුඹුරු පැහැ දරණය දෙස බලා සිටියේය.

"ඌව නැගිට්ටවන්න" ඔහු තම පියාට පැවසීය. වර්නන් වීදුරුවට තට්ටු කළ නමුත් සර්පයා සෙළවුනේවත් නැත.

"ආයෙත් ඒක කරන්න," ඩඩ්ලි අණ කළේය. වර්නන් මාමා ඔහුගේ ඇඟිලි නවා තදින් වීදුරුවට තට්ටු කළද, සර්පයා සිහිනෙන් මිදුනේ නැත.

Downloaded from sinhalaebooks.com

"මේකා හරිම කම්මැලියෙක්" යයි ඩඩ්ලි කෑගැසුවේය. පසුව ඔහු ඉවතට හැරී ගියේය.

හැරී ටැංකියට ඉදිරිපසින් සර්පයා දෙස බැලුවේය. ඔහු පුදුමයට පත්වූයේ ඌ පණපිටින් දැයි සිතමිනි. මෝඩ ජනයා දිනපතා දවස තිස්සේ වීදුරුවට ගසා බාධා කිරීම නිසා හෝ කම්මැලිකමින්ම ඌ මියගියහොත් හැරී පුදුම වන්නේ නැත. නිදන කාමරයක් වශයෙන් කබඩ් එකක් තිබුනාට වඩා මෙය නරකයි. තම කබඩ් එකේ දොරට තට්ටු කරන එකම කෙනා පෙටූනියා නැන්දා පමණි. අඩුම තරමින් ඔහුට ගෙදර ඉතිරි කොටසේ සිටීමටත් අවසර තිබේ.

හදිසියේම සර්පයා ගේ ඇස් දිදුලන්නට විය. සෙමින්, ඉතා සෙමින්, උගේ ඇස් හැරීගේ මට්ටමට ළඟා වන තුරු ඌ හිස එසවීය.

ඌ ඔහුට ඇසක් ගැසීය.

හැරී බලාගෙන සිටියේය. පසුව තමාදෙස කවුරු හෝ බලාගෙන ඉන්නවද කියා සිතා ඉක්මනින් වටපිට බැලුවේය. කවුරුත් නැහැ. ඔහු සර්පයා දෙස ආපසු හැරී ඇසක් ගැසුවේය.

සර්පයා වර්නන් සහ ඩඩ්ලිගේ පැත්ත බලා , පසුව සිවිලිමට ඇස් යොමු කළේය. ඌ හරියටම පැහැදිලිව අඟවන දේ හැරීට පෙනේ.

"මට හැම වෙලේම එහෙමවෙනවා."

"මම දන්නවා," සර්පයා ඔහුට ඇහුම්කන් දෙන බවට නිසැකවම නොසිතූ නමුත් හැරී මැදුරේ වීදුරුවෙන් මැසිවිලි නඟමින් සිටියේය. "ඇත්තෙන්ම ඒක ගොඩක් අපහසු ඇති."

සර්පයා තදින් හිස ඉහල පහල කළේය.

"ඔයා ආවේ කොහෙන්ද?" හැරී ඇසුවේය.

සර්පයාව වීදුරු අසල කුඩා සලකුණක් වැනි බෝඩ් එකක් දෙසට වළිගය වැනුවේය. හැරී එදෙස බැලූවේය.

බෝවා කොන්ස්ක්‍රිටර්, බ්‍රසීලය.

"එහේ හොඳද?"

Downloaded from sinhalaebooks.com

බෝවා කොන්ස්ක්‍රිටර්, නැවතත් වළිගය බෝඩ් එක දෙසට වැනූ අතර හැරි කියවීය. : මෙම ආදර්ශය සත්වෝද්‍යානය තුළ බෝ කරන ළදී. "ඕහ්, - ඉතිං ඔයා කවදාවත් බ්‍රසීලයට ගිහිං නැහැ?"

සර්පයා තම හිස සොළවන විට, හැරී පිටුපසින් ඇසුන කෑ ගැසිල්ලෙන් දෙදෙනාම ගැස්සිනි.

"ඩඩ්ලි! මිස්ට ඩර්ස්ලී! ඇවිල්ලා මේ බලන්නකෝ! බලන්න මූ කරන දේ!"

ඩඩ්ලි ඔහුට හැකි තරම් ඉක්මනින් ඔවුන් වෙතට ආවේය.

"අයින් වෙනවා," ඔහු කීවේ පුදුමයට පත් වෙමින් හැරිව විසිවෙන සේ ඉළයට දැඩි පහරක් ගසමිනි. හැරී කොන්ක්රීට් බිම මත පතිත විය. ඊළඟට සිදු වූයේ කුමක්ද? එවැන්නක් සිදුවූයේ කෙසේ දැයි කිසිවෙකු දුටුවේ නැත. එක් තත්පරයක, පියර්ස් සහ ඩඩ්ලි වීදුරු වලට ආසන්නවම නැඹුරු වී සිටි අතර, ඊළඟට, ඔවුහු නැවතත් භීතියෙන් පිරි කෑ ගැසුවෝය.

හැරී වාඩි විය; බෝවා කොන්ස්ක්‍රිටර් ගේ, ටැංකියේ ඉදිරිපස වීදුරුව අතුරුදහන් විය. මහා සර්පයා බිම දිගා වී වේගයෙන් ඉවතට ඇදී ආවේය. උරග නිවසේ සිටි ජනතාව කෑගසමින් පිටවීම සඳහා දුවන්නට විය.

සර්පයා වේගයෙන් තල්ලු වී එන අතරේ, හැරීට පහත් හඬින් ඇසුනේ, "බ්‍රසීලය, මෙන්න මම එන්වා.... ස්ස්ස්ස්ස්ස්තුතියි ඇමීගෝ."

උරගයාගේ පාලකයා කම්පාවට පත් විය.

"නමුත් වීදුරුව" ඔහු පැවසුවේ "වීදුරුව ගියේ කොතැනද" කියාය.

සත්වෝද්‍යානයේ අධ්‍යක්ෂකවරයා පැටූනියාට ප්‍රසන්න, මිහිරි තේ කෝප්පයක් සාදාගෙන පැමිණ නැවතත් සමාව ඉල්ලුවේය. පියර්ස් සහ ඩඩ්ලිට වෙවුළමින් සිටී. හැරී දුටු ආකාරයට සර්පයා දරුණු කිසිවක් නොකළ අතර බැසයන අතරේ ඔවුන්ගේ විළුඹට සෙල්ලම් පහරක් ගැසුවේය. සියල්ලන්ම වර්නන් ගේ මෝටර් රථයට ගොඩ වූ පසු ඩඩ්ලි ඔවුන්ට පැවසුවේ ඌ ඔහුගේ කකුලෙන් ඇද්ද බවය. පියර්ස් දිවුරමින් කීවේ, ඌ ඔහුව මිරිකා මරා දැමීමට තැත් කළ බවයි. එහෙත්, සියල්ලටම වඩා දරුණුතම කරුණ වූයේ පියර්ස් යථාතත්වයට ආ පසු පැවසූ දේයි. "හැරි ඌත් එක්ක කතා කළා, නේද හැරි?"

වර්නන් හැරීට කතා කිරීමට පෙර, පියර්ස් සුරක්ෂිතව ගෙදරින් එළියට යන තෙක් බලා සිටියේය. ඔහු කොතරම් කෝපයෙන් සිටියේද යත් ඔහුට කතා කළ නොහැකි විය. "පලයන් - කබඩ් - හිටපන් - කෑම නෑ" කියා පවසා පුටුවකට කඩා වැටුනේය.. පෙටූනියා ඔහුට විශාල බ්රැන්ඩි බඳුනක් ලබා දුන්නාය.

Downloaded from sinhalaebooks.com

හැරී ඔහුගේ අඳුරු කබඩ් එකේ වැතිරී සිටියේය. තමාට ඔරලෝසුවක් තිබුණා නම් යැයි ඔහුට සිතුනි. ඩර්ස්ලි න් තවමත් නිදා ගන්නට ගියාදැයි ඔහු දන්නේ නැත. ඔවුන් අවදියෙන් සිටියදී, ආහාර සොයා කුස්සියට රිංගීමේ අවදානම ගත නොහැකිය.

ඔහු අවුරුදු 10 ක් පමණ ඩර්ස්ලි සමඟ ජීවත් විය. ඉතා අපහසු අවුරුදු 10ක්, ඔහුගේ දෙමාපියන් මෝටර් රථ අනතුරෙන් මිය ගිය පසු ඔහු ඩර්ස්ලි භාරයට වැටුණි. ඔහුගේ දෙමව්පියන් මිය ගිය මෝටර් රථ අනතුර ඔහුට මතක් කළ නොහැකි විය. සමහර අවස්ථාවලදී, ඔහු තම කබඩ් එකේ දීර්ඝ පැය ගණනාවක් තුළ සිය මතකය අවුස්සන විට, ඔහුට අමුතු දර්ශනයක් මතකයට පැමිණියේය. කොළ පාට ආලෝකය හා තම නළල දැවෙන වේදනාවක්. මේ සියල්ලම, ඔහු සිතුවේ අනතුර සිදුවූ අවස්ථාවට අයත් බවකි, නමුත් කොළ ආලෝකය පැමිණියේ කොතනින් දැයි ඔහුට සිතාගත නොහැකි විය. ඔහුගේ දෙමව්පියන් ඔහුට මතක තබා ගත නොහැකි විය. ඔහුගේ නැන්දා සහ මාමා කවදාවත් ඔවුන් ගැන කතා කළේ නැත, ඇත්තෙන්ම ඔවුන්ගෙන් ප්‍රශ්න අසන්න ඔහුට තහනම් විය. මේ නිවසේ ඔවුන්ගේ ඡායාරූප කිසිවක් තිබුණේ ද නැත.

ඔහු කුඩා වියේදී තමන් නොහඳුනන නෑයෙක් පැමින තමාව රැගෙන යනු නැවත නැවතත් සිහින මැව්වේය, නමුත් එය කිසි විටෙක සිදුවූයේ නැත. ඩර්ස්ලි ඔහුගේ එකම පවුල විය. සමහර විට ඔහු සිතුවේ (හෝ සමහර විට අපේක්ෂා කළ පරිදි) පාරේ දකින අමුත්තන් ඔහුව දැන හඳුනා ගෙන සිටි බවය. ඔවුන් ඉතා අමුතු ආගන්තුකයන් විය. පෙටූනියා සහ ඩඩ්ලි සමඟ සාප්පු සවාරි යාමේදී එක් වරක් උස් දම්පැහැ තොප්පියක් පැළඳි කුඩා පුද්ගලයෙකු ඔහුට හිස නමා ආචාර කලේය. ඔහු තමාව හඳුනන්නේදැයි ඇසුවෙන් පෙටූනියා නැන්දා කිසිවක් මිලදී නොගෙන සාප්පුවෙන් පිටතට ඔහුවත් ඇදගෙන ගියාය. වරක් හරිත වර්ණයෙන් සැරසී සිටි මහත පෙනුම ඇති කාන්තාවක් බස් රථයකදී ඔහු සමඟ සතුටින් සිනා විය. ඉතා දිගු දම් පැහැති පැහැති කබායක් ඇඳි පුද්ගලයෙක් අනික් දවසේ සිනාසී අතට අත දී, පසුව වචනයෙන් තොරව පිටත්ව ගියේය. මේ සියලු දෙනා ගැන වූ අමුතුම දෙය වූයේ, හැරී නැවතත් ඔවුන් දෙස ඉතා හොඳින් බැලීමට උත්සාහ කරන විට ඔවුන් අතුරුදන් වීමයි.

පාසලේදීත් හැරීට කිසිවෙකු සිටියේ නැත. ඩඩ්ලිගේ කල්ලියේ සියල්ලෝම මේ විශාල හා පැරණි ඇඳුම් ඇඳි කැඩුණු කණ්නාඩියක් පැළඳි එම අමුතු හැරි පෝටර්ට වෛර කළ බව සියල්ලෝම දැන සිටියහ.

තුන්වන පරිච්ඡේදය

කාගෙන්වත් නොවන ලියුම්

බ්‍රසීලයේ සර්පයා බේරී යාම නිසා තම ජීවිතයේ දිගම දඬුවම ලැබුනේ හැරීටයි. නැවතත් ඔහුගේ කබඩ් එකෙන් එළියට ඒමට ඉඩ දෙන විට, ගිම්හාන නිවාඩුවත් ආරම්භ වී ඩඩ්ලි ඔහුගේ නව වීඩියෝ කැමරාව දැනටමත් කඩගෙන ඇති අතර ඔහුගේ දුරස්ථ පාලක ගුවන් යානය කඩා වැටී තිබුණ අතර, ඔහුගේ ධාවන යතුරු පැදිය පළමුවරට පදිද්දීම, ප්‍රයිවට් ඩ්‍රයිව් හරහා අත්වාරු වලින් ගමන් කළ වයසක ෆිග් මහත්මියව හප්පා වට්ටවා තිබිණි.

Downloaded from sinhalaebooks.com

හැරි සතුටු වුණේ පාසැල අවසන් වී තිබූ බැවිනි. එහෙත් ගෙදරදීත් ඔහු ඩඩ්ලිගේ කල්ලියෙන් බේරුණේ නැත. පියර්ස්, ඩෙනිස්, මැල්කම් සහ ගෝර්ඩන් යන සියල්ලම විශාල මෝඩයන් විය. එහෙත් ඩඩ්ලි ඔවුන්ගේ ලොකුම මෝඩයා හා නායකයා විය. ඩඩ්ලිගේ ප්‍රියතම ක්‍රීඩාවට සම්බන්ධ වීමට ඉතිරි අය ද සතුටින් සහභාගී වූහ. ඒ හැරී දඩයමයි.

හැරී නිවසින් බැහැරව හැකි තරම් වෙලාවක් ගත කරමින් සිටි නිසා නිවාඩු කාලය අවසන් වීම ගැන සිතා බැලීමට ඔහුට හැකි විය. සැප්තැම්බර් මාසයේදී ඔහු ද්විතියික පාසලට යන අතර, පළමු වතාවට ඔහු ඩඩ්ලි සමඟ පාසල් යන්නේ නැත. ඩඩ්ලිට වර්නන් ගේ පැරණි පෞද්ගලික පාසල වන ස්මෙල්ටින්ස් හි ඇතුළත් වීම් ලැබිනි. පියර්ස් පොකැරිස් ද එහි යයි. අනෙක් අතට හැරී , කුඩා පාසලක් වන ස්ටෝන්වෝල් වෙත යාමට නියමිතය. ඩඩ්ලි මෙය හරිම විනෝදජනකයි කියා සිතුවේය.

"එයාලා ස්ටෝන්වෝල් වල පළවෙනි දවසේ උදේට අළුත් ළමයින්ගේ ඔලුව වැසිකිළියට ඔබනවා," ඔහු හැරීට පැවසුවේය. "උඩ තට්ටුවට ඇවිත් පුරුදු වෙන්න ඕනැද?"

"එපා, ස්තුතියි," හැරී පැවසීය. "පවු වැසිකිළිය, ඔයාගේ ඔලුව තරම් ජරාවක් ඒකේ ගිහින් නැතිනිසා අසනීප වෙන්න පුළුවන්." කියා ඔහු දිව ගියේ, ඩඩ්ලි තමා පැවසූ දෙය නිගමනය කිරීමට පෙරයි.

ජූලි මාසයේ එක් දිනක නැන්දනිය ඩඩ්ලිගේ නිල ඇඳුම මිල දී ගැනීමට හැරීව ෆිග් මහත්මිය ලඟ රඳවා ලන්ඩනයට ගියාය. ෆිග් මහත්මිය එදින සාමාන්‍ය මෙන් නරක වූයේ නැත. ඇය බළලෙකු හරහා යද්දී පැටලී ඇගේ කකුල කැඩී ගිය අතර, ඇයට පෙර මෙන් උන්ව ප්‍රසන්න ලෙස පෙනී ගියේ නැත. ඈ හැරීට රූපවාහිනිය නැරඹීමට ඉඩදී ඔහුට අවුරුදු කීපයක් පරණ වූවක් මෙන් වූ චොකලට් කේක් ටිකක් ලබා දුන්නාය.

එම සනධ්‍යාවේ ඩඩ්ලි ඔහුගේ නව නිල ඇඳුමෙන් සැරසී පවුල වෙනුවෙන් විසිත්ත කාමරය වටා ඇවිද ගියේය. ස්මෙල්ටින්ස්හි පිරිමි ළමයින් පිටුපසින් දිග මෙරූන් කබා, තැඹිලි පැහැ බැගී කලිසම් ,සහ පැතලි පිදුරු හිස්වැසුම් පැළඳ සිටියහ. ගුරුවරුන් නොසිටි අතරතුර ඔවුන් එකිනෙකා වෙත පහර දීම සඳහා යොදා ගන්නා ස්මෙල්ටින් (ගෝලාකාර කෙළවරක් ඇති) කෝටුවක් ද ලඟ තබා ගන්නා ලදී. මෙය පසුකාලීන ජීවිතයට හොඳ පුහුණුවක් ලෙස සැලකන ලදී.

ඩඩ්ලි ඔහුගේ අළුත් කලිසම ඇද සිටිනු දැකීම වර්නන් මාමා තම ජීවිතයේ ඉතා උද්යෝගිමත් මොහොත බව ප්‍රකාශ කළේය. පෙටූනියා නැන්දා කඳුළු සළමින්, ඔහු මේ තරම් වැඩී ඇති බව ඇයට විශ්වාස කළ නොහැකි බව පැවසුවාය. හැරී කතා කරන්නට නොගියේය. ඔහුගේ ඉළ ඇට දෙකක් සිනාව තද කරගෙන සිටීම නිසා දැනටමත් කැඩී ඇතැයි ඔහු සිතුවේය.

උදේ ආහාරය සඳහා හැරී කුස්සියට යන විට මුලු කුස්සියම තද ගඳකින් පිරී තිබුණි. එය විශාල ලෝහ බේසමකින් පැමිණෙන බවක් පෙනී ගියේය. ඔහු ඒ දෙස බැලුවේය. අළු පැහැ අඳුරු වතුරේ කිළිටි පාපිසි පා වෙන්නාක් මෙන් එය දිස් විය.

Downloaded from sinhalaebooks.com

"මේ මොකක් ද?" ඔහු පෙටූනියාගෙන් ඇසුවේය. ප්‍රශ්න අසන සැමවිටම ඇය ඇගේ තොල් තදින් තද කළාය.

"ඔයාගේ අළුත් ඉස්කෝලේ නිල ඇඳුම" ඇය කීවාය.

හැරී නැවත බිම බැලුවේය.

"ඔහ්," ඔහු කීය. " ඒක ඒ තරම් හෝදන්න වෙයි කියලා මම හිතුවේ නෑ"

"මෝඩ වෙන්න එපා," කියූ පෙටූනියා. "මම ඩඩ්ලිගේ පරණ ඇඳුමක් අළු පාටින් ඩයි කරනවා. මම ඒකකරලා ඉවර වුනාම අනෙක් අයගේ ඇඳුම් වගේම පෙනෙයි."

හැරීට ඒ ගැන බරපතල සැකයක් ඇති වූ නමුත් ඔහු තර්ක නොකළ යුතු බව සිතුවේය. ඔහු මේසයට හිඳගෙන, ස්ටෝන්වෝල් උසස් පාසළේ දී ඔහුගේ පළමු දිනයේ පැරණි අලි සමක් වැනි ඇඳුමක් ඇඳගෙන යාමෙන් කුමක් වේද යන්න සිතා නොබැලීමට උත්සාහ කළේය.

ඩඩ්ලි සහ වර්නන් මාමා හැරීගේ නව නිල ඇඳුමෙන් හමන ගඳ නිසා නහය හකුළාගෙන කුස්සියට ආවෝය. වර්නන් පුරුදු ලෙස තම පුවත්පත විවෘත කරගත් අතර, ඩඩ්ලි දැන් සෑම තැනම ගෙන යන තම ස්මෙල්ටින් කෝටුවෙන් මේසයට තඩිබෑවේය.

තැපැල් පෙට්ටියේ ක්ලික් හඬ සමග දොර යටින් ලියුමක් විදින හඬ ඇසුණි.

"ඩඩ්ලි ලිවුම ගන්න," තම පුවත්පත  පිටුපසින් වර්නන් මාමා පැවසීය.

"හැරීට කියන්න."

"ලියුම ගන්න, හැරී."

"ඩඩ්ලිට කියන්නකෝ."

"ඩඩ්ලි, ඔයාගේ ස්මෙල්ටින් කෝටුවෙන් එයාට අනින්න. "

Downloaded from sinhalaebooks.com

හැරී ස්මෙල්ටින් කෝටුවෙන් බේරී ලියුම් ගැනීමට ගියේය. පොළව මත ලියුම් තුනක් රැඳී තිබුනේය: පෙනුමෙන් බිල් පතක් වැනි දුඹුරු පැහැ කඩදාසි ලියුම් කවරයක් , අයිල් ඔෆ් වයිට් හි නිවාඩු ගත කිරීමට ගිය වර්නන් මාමාගේ සොයුරිය මාජිගෙන් තැපැල් පතක් හා හැරීගේ නමට ලිපියක්.

හැරී එය අල්ලාගෙන, ඒ දෙස බලාසිටියේය, ඔහුගේ හදවත විශාල ඉලාස්ටික් පටියක් මෙන් නැටුවේය. ඔහුගේ ජීවිත කාලය පුරාම කිසිවෙක් ඔහු වෙත ලියුම් ලියා තිබුණේ නැත. කවුද? ඔහුට මිතුරන් නැත, වෙනත් ඥාතීන් නැත - ඔහු පුස්තකාලයට අයිති නැත, ඒ නිසා ඔහුගෙන් පොත් පත් නැවත ඉල්ලා සිටි පණිවිඩ පවා නොලැබිණ. එහෙත් මෙහිදී මෙය පැහැදිලිවම ලිපියක් විය:

හැරී පෝටර් මහතා

පඩි පෙළ යට කබඩ් එක

4, ප්‍රයිවට් ඩ්‍රයිව්

කුඩා වයිංග්

සරේ

පාච්මන්ට් කොළයකින් සෑදූ ලියුම් කවරය ඝන සහ විශාල විය. ලිපිනය එමරල්ඩ්-කොළ තීන්තවලින් ලියන ලදි. මුද්දරයක් තිබුණේ නැත.

ඔහු අතින් අල්ලා ගත් ලියුම් කවරය හරවා බැලුවේය. එහි සිංහයෙක්, රාජාලියෙක්, උගුඩුවෙක් සහ සර්පයෙක් විශාල H අකුරක් වටා සිටිනු දක්වන සංකේතයක් වැදී ඇති දම්පාට ඉටි සීල් එකක් තිබිණි.

"ඉක්මන් කරනවා කොළුවෝ!" කුස්සියෙන් වර්නන් මාමාගේ හඬ ඇසුණි "මොනවද කරන්නේ, ලියුම් වල බෝම්බ තියනවාද කියලා පරික්ෂා කරනවාද?" ඔහු තමාගේම විහිළුවට සිනාසුනේය.

හැරී නැවත කුස්සිය වෙත ගොස්, ලියුම දෙස බලමින්ම වර්නන් මහතාට බිල්පත හා තැපැල්පත දුන්නේය. ලියුම ගෙන අසුන් ගත්තේය. සෙමින් කහ ආවරණය විවෘත කිරීමට පටන් ගත්තේය.

වර්නන් බිල්පත දිග හැර බලා කෝපයට පත් විය. ඉන්පසු තැපැල්පත හරවා බැලීය.

"මාජි අසනීප වෙලා" කියා පෙටූනියාට දැනුම් දුන්නේය. "විහිලු තමයි" .

"තාත්තා!" ඩඩ්ලි හදිසියේම කීවේය. "තාත්තේ, හැරීටත් එකක් තියෙනවා!"

Downloaded from sinhalaebooks.com

හැරී ලියුම් කවරය තරම්ම ඝන කොළයක ලියැවුනු ලියුම දිග හරිමින් සිටි අතර, වර්නන් වහා එය උදුරා ගත්තේය.

"ඒක මගේ!" හැරී ආයෙත් එය උදුරා ගන්න තැත් කළේය.

"ඔයාට ලියන්නේ කවුද?" වර්නන් මාමා, එක් අතකින් විවෘත ලිපිය අල්ලාගෙන ඒ දෙස බැලීය. ඔහුගේ මුහුණ රතු පැහැයෙන් හරිත වර්ණයට හැරුනේ ට්‍රැෆික් ලයිට් වලට වඩා වේගයෙනි. ඒක එහෙම නතර වුණේ නැහැ. තත්පරක් ඇතුලත පරණ කැඳ  මෙන් අළු පැහැ සුදු පැහැයට හැරුනි.

"පෙ.. පෙ.. පෙටූනියා!" ඔහු කෑගැසුවේය.

ඩඩ්ලි ලිපිය ගැනීමට උත්සාහ කළද, වර්නන් මාමා එය ඉහළට කර ඔහු වළක්වන්නට විය. පෙටූනියා එය රැගෙන පළමු පෙළ කියෙව්වාය. මොහොතකට ඇය ක්ලාන්ත වෙන බවක් පෙනෙන්නට තිබුණි. දෙවනුව ඇය ඇගේ උගුරේ යමක් සිරවුනාක් මෙන් ගොත ගසන්නට විය.

"වර්නන්! අනේ දෙවියනේ - වර්නන්!"

ඔවුන්ට හැරී හා ඩඩ්ලි තවමත් කාමරයේ සිටින බව අමතක වී ඇති සේ මුහුණින් මුහුණ බලා සිටියෝය. ඩඩ්ලි තමාව නොසලකා හැරීම ගැන කැමති වූයේ නැත. තම ස්මෙල්ටින් කෝටුවෙන් ඔහුගේ පියාට තියුණු තට්ටුවක් දුන්නා.

"මට ඒක කියවන්න ඕනේ" කියා ඔහු ශබ්ද නඟා පැවසුවේය. " මට ඒක කියවන්නට ඕනේ" යි හැරි කීවේය

" ඒක මගේනේ "

" දෙන්නාම එලියට යන්න" වර්නන් අණ කරමින් ලියුම කවරය තුළට එබුවේය.

හැරී ගියේ නැත.

"මට මගේ ලියුම ඕනේ! "ඔහු කෑගැසුවේය.

"මට දෙන්න!" ඩඩ්ලි ඉලලීය

Downloaded from sinhalaebooks.com

"එලියට!" වර්නන් ගර්ජනා කළ අතර, ඔහු හැරී සහ ඩඩ්ලි යන දෙදෙනාම ඔවුන්ගේ කොළරය ළඟින් අල්ලා ශාලාව තුලට විසි කළේය. හැරී සහ ඩඩ්ලි කෝපාවිෂ්ට වී කුස්සියේ දොර පිටුපස යතුරු සිදුරෙන් ඇහුම්කන් දෙන්නේ කවුරුන්ද යන්න ගැන නිහඬ සටනක යෙදුනි; ඩඩ්ලි ඉන් දිනූ අතර, හැරී කණ මතින් එල්ලෙන කණ්නාඩිය අතින් ගෙන, දොර හා බිම අතර ඇති හිඩැසෙන් සවන්දීම සඳහා බිම දිගා විය.

"වර්නන්" පෙටූනියා තදින් හඬ නඟමින් මෙසේ පැවසුවාය. "ලිපිනය දිහා බලන්න - එයා නිදා ගන්නේ කොතනද කියලා ඒගොල්ලෝ දැන ගන්නේ කොහොමද? එයාලා ගෙදර දිහා බලාගෙන ඉන්නවා කියලා ඔයා හිතන්නේ නැද්ද?"

"බලාගෙන ඇති - ඔත්තු බලනවා ඇති - අපේ පස්සෙනුත් එනවා ඇති," වර්නන් සෙමින් දොඩවන්නට විය.

"අපි මොකද කරන්නේ, වර්නන්? අපි උත්තරයක් යවමුද? ඕනේ නෑ කියලා "

හැරීට වර්නන්ගේ දිළිසෙන සපත්තු කුස්සියේ එහා මෙහා යනු දැකගන්නට හැකි විය.

"නෑ," අවසානයේ ඔහු පැවසීය. "නැහැ, අපි ඒක නොසලකා හරිමු.. එයාලාට පිළිතුරු ලැබෙන්නේ නැත්නම් ... ඔව් ඒක තමයි හොඳම ... අපි මොකුත් නොකර ඉමු ..."

"ඒත්..."

"මම ඒ කෙනෙක් ගෙයි තියා ගන්නේ නෑ. පෙටූනියා අපි එයාව ගෙට ගත්තේ, ඔය භයානක විකාර වලින් ඇත් වෙනවා කියලා දිවුරලා නේද ."

එදින සවස් වරුවේ වැඩට ගොස් ආ පසු, වර්නන් මාමා මීට කලින් කවදාවත් නොකළ දෙයක් කළේය. ඔහු හැරී සොයා ඔහුගේ කබඩ් එක වෙත ගියේය.

"මගේ ලියුම කොහෙද?" වර්නන් දොරෙන් මිරිකෙමින් රිංගන විටම හැරී ඇසීය. "කවුද මට ලියන්නේ?"

"කවුරුවත් නෑ, ඒක වැරදිලා ඔයා නමට ආපු එකක්" කියා පැවසුවේය. "මම ඒක පිච්චුවා."

"ඒකේ වැරැද්දක් නෑ" යයි හැරි කෝපයෙන් පැවසුවේය. "ඒකේ මේ කබඩ් එකට කියලත් තිබ්බා"

Downloaded from sinhalaebooks.com

"කට වහනවා!" වර්නන් කෑගැසූ අතර මකුළුවන් යුවලක් සිවිලිමෙන් වැටිණ. ඔහු ගැඹුරු හුස්මක් ගෙන, පසුව ඔහුගේ මුහුණ සිනහවක් බවට පත් කර ගත්තේය, එය ඉතා වේදනාකාරී පෙනුමකි.

"ඔව් - ඔව්, හැරී - මේ කබඩ් එක ගැන.. ඔයාගේ නැන්දයි මමයි සිතුවෙ ... ඔයා ඇත්තටම ටිකක් ලොකුයිනේ දැන් ... අපි හිතුවා ඔයා ඩඩ්ලිගේ අනිත් කාමරයට පදිංචියට ගියොත් හොඳයි කියලා.

"ඇයි?" හැරී ඇසීය.

"ප්‍රශ්න අහන්න එපා!" මාමා සැර කළේය "මේ දේවල් උඩට අරන් යන්න, දැන්ම."

ඩර්ස්ලි නිවසේ නිදන කාමර හතරක් තිබුණි. විශාලම කාමරය වර්නන් මාමා සහ පෙටූනියා නැන්දා සඳහා වූ අතර තව එකක් අමුත්තන් සඳහා විය (සාමාන්‍යයෙන් අංකල් වර්නන්ගේ සොහොයුරිය වන මාජ්), ඩඩ්ලි නිදා ගැනීමට එක් කාමරයක් භාවිතා කළ අතර සිය සෙල්ලම් බඩු සහ කාමරයේ තබා ගැනීමට ඉඩ මදි සියල්ල අනෙක් කාමරයේ විය.හැරී එක් චාරිකාවකින් තම සන්තකයේ තිබූ සියල්ල කබඩ් එකේ සිට උඩුමහල් කාමරයට ගෙන ආවේය. ඔහු ඇඳ මත අසුන් ගත්තේය. මෙතන හැම දෙයක්ම කැඩී තිබිණි. කැඩී මාසයක් පැරණි වීඩියෝ කැමරාවක්.... කුඩා යුද ටැංකිය කැඩුනේ ඩඩ්ලි කලින් අසල්වැසියාගේ බල්ලාව හැප්පීමට යන විටය. කෙළවරේ ඩඩ්ලිගේ පළමු රූපවාහිනී කට්ටලය වූ අතර, ඔහුගේ ප්‍රියතම වැඩසටහන අවලංගු වූ දිනෙක ඔහු ඊට පයින් ගසා කැඩුවේය. එක් කෙළවරක විශාල කුරුළු කූඩුවක් තිබේ. ඩඩ්ලි විසින් එහි සිටි ගිරවා වායු රයිෆලයක් සඳහා මාරු කරන ලද අතර බිත්තියේ ගසා ඇති ඒ මත ඩඩ්ලි වාඩිවීම නිසා ඇඹරී ඉහළට නැවී තිබිණි. අනෙක් රාක්ක පොත් රාශියකින් පිරී තිබිණි. කිසිවිටක ස්පර්ශ නොකළ දෙයක් සේ පෙනෙන කාමරයේ තිබූ එකම දේ පොත් විය.

පහළ සිට ඩඩ්ලි අම්මාට කෑගසන හඬ ඇසුණි. "මට ඒ කාමරේ ඕනේ ... එයාට ඒක ඕනේ නෑ... එයාට එළියට එන්න කියන්න... "

හැරි උඩු බැලිව ඇඳේ වැතිරී සිටියේය. ඊයේ නම් ඔහු මේ කාමරය ලබා ගැනීමට ඕනෑම දෙයක් දීමට තිබිණි. අද ඒ වෙනුවට ඔහු ඒ ලිපිය සමඟ කබඩ් එකට ඇතුලට වී සිටීමට වඩාත් කැමති විය.

උදේ කෑම මේසයේදී හැමෝම නිහඬව සිටියහ. ඩඩ්ලි කම්පාවට පත්ව සිටියේය. ඔහු කෑ ගසමින්, තම පියාට ස්මෙල්ටින් කෝටුවෙන් පහර දුන්නේය. ඔහු හරිතාගාර වහලය හරහා ඔහුගේ ඉබ්බා විසි කළේය. එහෙත් ඔහුට ඔහුගේ කාමරය ආපසු නොලැබුණි. හැරී ඊයේ මෙම වේලාව ගැන කල්පනා කරමින් සිටියේ, ශාලාව තුළ ඔහු ලිපිය විවෘත කළ යුතුව තිබූ බව සිතුවේය. වර්නන් හා පෙටූනියා අඳුරු මුහුණින් එකිනෙකා දෙස බලමින් සිටියහ.

Downloaded from sinhalaebooks.com

තැපැල්කරු පැමිණි විට, හැරීට ඉතා හොඳින් සැළකීමට උත්සාහ කළ වර්නන් ලියුම් ගැනීමට ඩඩ්ලිව යැව්වේය . ඔහු බිත්තිවල ඇති දේවලට ස්මෙල්ටින් කෝටුවෙන් තඩිබාමින් ශාලාව හරහා යනු ඇසිණි . ඉන් පසු ඔහු, "තවත් එකාක්!" යැයි හඬ නැගීය. "H. පොටර් මහතා, කුඩාම නිදන කාමරය, 4 ප්‍රයිවට් ඩ්‍රයිව්.."

වෙඩි වැදුනාක් මෙන් ගැස්සුන වර්නන් මාමා තම ආසනයෙන් ඉවතට පැන ශාලාව දෙසට දිව ගිය අතර හැරී පසුපසින් දිවුවේය. වර්නන් මාමාට ඩඩ්ලිගෙන් ලිපිය උදුරා ගැනීම සඳහා ඔහුව බිමට ඇද දැමීමට සිදු වූ අතර හැරී තම බෙල්ල ග්‍රහණය කර තිබීම නිසා අපහසුතාවට පත් විය. වෙහෙසට පත් වූ සටනේදී සෑම දෙනාටම ස්මෙල්ටින් ස්ටික් එකෙන් පහර වැදුනු අතර, වර්නර් සටන නිමා කරමින් ලිපිය අතින් ගෙන සිටගත්තේය.

"යනවා තමුන්ගේ කබ්ඩ් එකට - මම කිව්වේ කාමරේට" යනුවෙන් හැරීට පැවසීය. "ඩඩ්ලි ඔයත්- ඉක්මන් කරන්න."

හැරී ඇවිත් ඔහුගේ නව කාමරය වටා ගමන් කළේය. ඔහු කවුරු උනත් තමා කබඩ් එකෙන් පිටවී කාමරයට ගිය බව දැනගත් අතර, ඔහුට සිය පළමු ලිපිය නොලැබුන බවද දනී. ඇත්තෙන්ම ඔහු නැවත උත්සාහ කරයිද? මේ වතාවේත් ඔහු සමත් නොවූ බව ඔහු දැනටමත් දන්නවා ඇති. හැරීට අළුත් සැලසුමක් තිබේ.

අළුත් වැඩියා කරන ලද එළාම් ඔරලෝසුව උදේ හයට නාද විය. හැරී වහා එය නිවා දැමුවේය. ඩර්ස්ලි ලා අවදිකළ යුතු නැත. ඔහු ලයිට් නොදමාම හෙමීට ශාලාව වෙත පියමැන්නේය. ශාලාව හරහා නිහඬව ගමන් කරද්දී ඔහුගේ හදවත මහ හඬින් ගැහුනේය.

හැරී අදහස් කළේ ප්‍රයිවට් ඩ්‍රයිව් වෙත හැරෙන තැනදී තැපැල් කරුගෙන් අංක 4 ට ඇති ලියුම් ලබාගැනීමටයි. ශාලාව හරහා පියමනිද්දී ඔහුගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය.

හැරී එලියට එන්න ඔන්න මෙන්න තබා දොරකඩ පාපිස්ස මත වූ විශාල එබෙනසුලු යම් දෙයක ගැටුනේය. යම් ජීවී දෙයක්...

ක්ෂණයකින් ඉහළ මහලේ විදුලි බල්බ දැල්වුණි. හැරී භීතියට පත්කරමින් ඔහු දුටුවේ විශාල එබෙනසුලු දෙය වර්නන් මාමාගේ මුහුණ බවයි.වර්නන් මාමා දොරකඩ නිදන බෑගයක් තුළ නිදා සිටියේය. ඔහු නිසැකවම හැරී සැළසුම් කළ දේ අනුමාන කළේය. පැය භාගයක බැනුම් වලින් පසු ඔහු තේ කෝප්පයක් සෑදීමට හැරීට අණ කළේය. හැරී තේ සාදාගෙන එනවිට ලියුම් පැමිණ තිබිණි. කොළපාටින් ලිපිනය ලියූ ලියුම් තුනක් වර්නන් මාමාගේ උකුළ මත තිබිණි.

"මට ඕනේ..." හැරී පටන් ගනිද්දීම ඔහු ඉදිරියේ වර්නන් ලිපි ටික තීරු වලට ඉරා දැමුවේය. එදින රැකියාවට නොගොස් ගෙදර නතර වූ ඔහු දොරේ ඇති ලියුම් ඇතුළට දමන සිදුර ඇණ ගසා වසා දැමුවේය.

" බලන්න පෙටූනියා.. ලියුම් දාන්න විදිහක් නැත්තන් එයාලා ලියුම් එවන එක නතර කරයි."

" මට විශ්වාස නෑ වර්නන් ඕක වැඩ කරයි කියලා"

Downloaded from sinhalaebooks.com

"ඕහ් එයාලාගේ හිත් වැඩ කරන්නේ ඔයාගේ මගේ වගේ නෙවෙයි පෙටූනියා වෙනස්ම විදිහකට" ඔහු පෙටූනියා දැන් ගෙනත් දුන් පළතුරු කේක් කෑල්ලෙන් ඇණයට ගැසීමට සැරසුණි.

පසුදින සිකුරාදා හැරී නමට දොලහකට නොඅඩු ලියුම් මිටියක් ලැබී තිබුණි. දොරේ ලියුම් ඇතුල්කරන සිදුර අවහිර කර තිබුන නිසා ඒවා දොරයටින් සහ දෙපසින් ඇතුලට තල්ලු කර තිබිණි. කිහිපයක් පහළ නිදන කාමරයේ කුඩා කවුලුවකින්ද ඇතුළට දමා තිබිණි.

වර්නන් මාමා එදිනද වැඩට නොයා ගෙදර නැවතුනේය. ඔහු මිටියක් හා ඇණ තොගයක් රැගෙන ඉදිරිපස හා පිටුපස දොරවල සියලු හිඩැස් ලී පටි ගසා වසා දැම්මේ කිසිවෙකුටත් එලියටවත් යෑමට නොහැකි ලෙසයි. වැඩ කරන අතරතුරේ ඔහු "tiptoes through tulips" ගීතය මිමිනූ අතර කුඩා ශබ්දයකට පවා උඩ විසි වුනේය.

සෙනසුරාදා, සියල්ල තවත් නරක අතට හැරුණි. හැරී නමට වූ ලිපි 24 ක් සොයාගත් අතර, ඔවුන්ගේ කිරි වෙළෙන්දා අවුල්සහගත වී පෙටූනියාට විසිත්ත කාමරයේ කවුළුව වෙත භාර දුන් බිත්තර දුසිම් දෙකේ ඇතුළත ඒවා නවා සැඟවී තිබිණි. වර්නන් මාමා කෝපයට පත්ව තැපැල් කාර්යාලයට දුරකථන ඇමතුමක් ගෙන පැමිණිලි කළ අතර පැමිණිල්ලක් කිරීමට සුදුසු අයෙක් දිනපොතේ නොම්මර අතර සෙවීමට උත්සාහ දැරුවේය. පෙටූනියා ඇයගේ ආහාර සැකසුම් යන්ත්‍රයෙහි දමා ලිපි ඉරා දැමුවාය.

"මේ තරම් දරුණු විදිහට ඔයාට කතා කරන්න උත්සාහ කරන්නේ කවුද" ඩඩ්ලි පුදුම වී හැරීගෙන් ඇසුවේය.

ඉරිදා උදෑසන වර්නන් මහන්සි ගතියෙන් හා ඊටත් වඩා අසනීප ගතියකින් උදේකෑමට වාඩිවිය. නමුත් ඔහු සතුටින් සිටියේය.

"ඉරිදාට ලියුම් නෑ" ඔහු තම පත්තරයේ මාමලේඩ් ජෑම් අතුල්ලන ගමන් සතුටින් අනෙත් අයට දැනුම් දුන්නේය. " විකාර ලියුම් අද නෑ...."

එක්වරම ගිනිඋදුනෙන් යමක් ශූෂ් හඬින් වේගයෙන් පැමින වර්නන්ගේ හිස පිටුපස වැදිනි. ඒත් සමගම තිහක් හෝ හතලිහක් පමණ ලියුම් තොගයක් ගිනිඋදුනෙන් පිටතට බුලට් මෙන් විදුනු අතර ඩර්ස්ලි ලා බිමට නැවුනත් හැරී උඩ පනිමින් ලියුමක් අල්ලා ගැනීමට උත්සාහ කළේය.

"එලියට..එලියට" වර්නන් කෑ ගැසුවේය.

වර්නන් හැරීගේ බඳ වටින් අල්ලා උස්සාගෙන විත් ඔහුව ශාලාව තුළට විසි කළේය. පෙටූනියා සහ ඩඩ්ලි ඔවුන්ගේ මුහුණු අත්වලින් වසාගෙන එළියට දිවගිය පසු වර්නන් දොර වසාදැමුවේය. බිත්තිවලට සහ බිමට තල්ලු වෙමින් කුස්සිය තුළට විදෙන ලිපිවල හඬ ඔවුන්ට තව දුරටත් ඇසුණි.

Downloaded from sinhalaebooks.com

" ඒක හරි," ශාන්තලෙස කතා කිරීමට උත්සාහ කරමින් වෙර්නන් මාමා කියා සිටියේ, ඒ අවස්ථාවේදීම ඔහුගේ උඩු රැවුලෙන් අදිමිනි. "විනාඩි පහක් ඇතුලත පිටත් වෙන්න සූදානම්වෙලා මෙතනට එන්න. අපි යන්න යන්නේ. ඇඳුම් ටිකක් ගන්න. තර්ක කරන්න බෑ "

උඩු රැවුලෙන් අඩක් අතුරුදහන් වී තිබූ ඔහු එතා දරුණු විදියට පෙනුනත් කවුරුවත් ඔහු සමග තර්ක කිරීමට නොගියෝය.. මිනිත්තු දහයකට පසුව ඔවුන් සූදානම් වී ගැළවූ දොරවල් හරහා ගොස් මෝටර් රථයට ගොඩවූයේ අධිවේගී මාර්ගය දෙසට වේගයෙන් ගමන් කරමින් සිටියහ. ඩඩ්ලි පසුපස ආසනයේ ඉකිගසමින් සිටියේය. තම රූපවාහිනිය, වීඩියෝ ක්‍රීඩා සහ පරිගණක ක්‍රීඩා බෑගයේ දමාගෙන යාමට තැත් කිරීමේදී ඔහුගේ පියා ඔහුගේ ඔළුවට පහර දී තිබේ.

ඔවුන් ගමන් කලෝය. තවදුරටත් ගමන් කලෝය. පෙටූනියා පවා යන්නේ කොහේද කියා අසන්නට නොගියාය. සෑම විටම වර්නන් මාමා එක්වරම වාහනය හරවමින් දිගින් දිගටම විරුද්ධ දිශාවලට ගමන් කරයි. "උන්ව හලන්න ඕනේ.. හලන්න ඕනේ" ඔහු ඉවතට හැරී එසේ ගමන් කරන හැම විටම මිමිණුවේය.

දවස පුරාම කෑම කන්නවත් බොන්නවත් ඔවුන් නතර වූයේ නැත. රාත්‍රියේදී ඩඩ්ලි අඬන්නට විය. ඔහුට කවදාවත් එච්චර නරක දවසක් තිබුණේ නැත. ඔහුට තදින් බඩගිනි වූ අතර, බැලීමට ප්‍රියකරන රූපවාහිනී වැඩසටහන් පහක් ඔහුට මගහැරී තිබිණි. ඔහුගේ පරිගණකයේ පිටසක්වලයෙක් පුපුරවන්නේ නැතිව එතරම් දිගු කාලයක් ගතකර තිබුනේ නැත.

වර්නන් අන්තිමේදී විශාල නගරයක වෙරළබඩ දියාරු පෙනුමක් සහිත හෝටලයක් ඉදිරිපිට නතර විය. ඩඩ්ලි සහ හැරී දෙදෙනාට ද්විත්ව ඇඳන් දෙකක් සහ තෙත් බිමක් සහිත කාමරයක් ලැබුණි. ඩඩ්ලි ගොරවමින් නිදා ගත් නමුත් හැරී අවදියෙන් ජනේලය ලග වාඩි වී පාරේයන කාර් සහ අනෙකුත් වාහන වල එළි දිහා බලාගෙන සිටියේය.

ඔවුන් ඊළඟ දවසේ උදේ ආහාරය සඳහා කෝන්ෆ්ලේක්ස් හා සීතල වූ තම්බන තක්කාලි සමග ටෝස්ට් ආහාරයට ගත්හ. හෝටලයේ අයිතිකරු ඔවුන්ගේ මේසයට පැමිණෙන විට ඔවුන් නිහඬව ආහාර නිම කරමින් සිටියෝය.

"මට සමාවෙන්න, ඒත් ඔයාලාගෙන් කෙනෙක්ද H. පෝටර් මහතා? මට ඉස්සරහා කවුළුවට මේවා සීයක් විතර ලැබිලා තියනවා"

ඇය කොළ පැහැ තීන්තෙන් ලියූ ලිපිනය කියවීමට හැකි වන ලෙස ලිපිය දිගු කළාය.

එච්. පෝටර් මහතා

කාමර 17

ගුවන් තොටුපොළ හෝටලය

Downloaded from sinhalaebooks.com

කොකුවර්ට්

හැරී විසින් එම ලිපිය අල්ලාගත් නමුත් වර්නන් ඔහුගේ අතට ගසා කාන්තාව පුදුමයෙන් බළාසිටියදීම එය උදුරා ගත්තේය.

"මම ඒවා ගන්නම්" යයි කී වර්නන ඉක්මනින් නැඟිට ඇය පසුපසින් කෑම කාමරයෙන් ඉවත ගියේය.

"ගෙදර යනඑක හොඳයි නේද? " පෙටූනියා නැන්දා යන්තම් පැය ගණනාවකට පසුව ආ වර්නන් මාමාට කියා සිටියාය, නමුත් මාමා ඇය කියන්නක් අසන බව පෙනෙන්නට නොතිබුණි, ඔහු සොයන දේ ගැන කිසිවෙක් දැන සිටියේ නැත. ඔහු වනාන්තරයක් මැදට වාහනය පැදවූයේ, එලියට ගොස් හොඳින් වටපිට බැලුවේය. හිස තදින් ගස්සා මෝටර් රථය වෙත ආපසු ගොස්, නැවතත් ගමන් ඇරඹුවේය., නැවතත් එලෙසම හානලද වගා භූමියක් මැදත්, පාලමක මැද සහ තට්ටු කීපයක රථගාලක උඩම තට්ටුවේ නවතන ලදී.

"තාත්තාට පිස්සු හැදිලා, එහෙම නේද?" ඩඩ්ලි පෙටූනියා නැන්දාගෙන් ඇසුවේ වර්නන් මාමා වෙරළ තීරයේ වාහනය නවතා මෝටර් රථය තුළ ඔවුන් සියල්ලම අගුලු දමා අතුරුදහන් වූ අතරේය.

වහින්න පටන්ගත් අතර මෝටර් රථයේ වහලය මත විශාල ජළ කඳක් පතිත වන්නට විය. ඩඩ්ලි හැඩීමට ඉතා ආසන්නව සිටියේය.

"අද සඳුදා" යි ඔහු තම මවට කීවේය. "අද රාත්‍රියේ මහා හම්බර්ටෝ තරගය තියනවා. මට රූපවාහිනියක් තියන තැනක ඉන්න ඕනේ."

සඳුදා. හැරීට දෙයක් මතක් විය. අද සඳුදා නම් - හරියටම දවස දැන ගැනීම සම්භන්ධව ඩඩ්ලිව විශ්වාස කළහැක්කේ රූපවාහිනි වැඩසටහන් නිසා ඔහුට හොඳින් දවස් මතක තිබීම හේතුවෙනි. හෙට, අහහරුවාදා, හැරීගේ එකොළොස්වෙනි උපන් දිනය විය. ඇත්ත වශයෙන්ම, ඔහුගේ උපන් දිනය කිසි විටෙකත් විනෝදජනක වූයේ නැත - පසුගිය වසරේ ඩර්ස්ලින් ඔහුට කබා එල්ලනයක් සහ වර්නන් මාමාගේ පැරණි මේස් යුගලක් තෑගි කළෝය. නමුත් සෑම දිනකම ඔබට එකොළොස් වැනි උපන්දිනය ලබන්නේ නැත.

වෙර්නන් සිනාසෙමින් ආපසු ආවේය. ඔහු දිගු, සිහින් පැකේජයක් රැගෙන ආ අතර, එය කුමක්දැයි පෙටූනියා ඇසුවත් ඇයට පිළිතුරු දුන්නේ නැත.

"මම නියම තැනක් සොයාගත්තා! "ඔහු කීවේය.." එන්න! හැමෝම එළියට එන්න! "

Downloaded from sinhalaebooks.com

මෝටර් රථයෙන් පිටත ඉතා සීතල විය. වර්නන් අත දිගුකර මුහුදේ ඈත පිහිටි විශාල පර්වතයක් වැන්නක් පෙන්නුවේය. පර්වත මුදුනේ පිහිටා තිබුනේ ඔබට සිතා ගත හැකි ඉතාමත්ම කාලකණ්ණි පෙනුමැති කුඩා පැල්පතකි. එක් කරුණක් නම්, එහි අනිවාර්යයෙන්ම රූපවාහිනියක් නම් නැත.

"අද රාත්‍රියේ කුණාටු ඇතිවෙනවාලු!" වර්නන් මාමා සතුටින් දෑත් එකට ඇතිල්ලුවේය. "මේ මහත්තයා එයාගේ බෝට්ටුව අපිට දෙන්න   කාරුණිකව එකඟ වුණා"

දත්නැති කටින් විරූපී හිනාවක් පළකරමින් ආ මහලු මිනිසා ඔවුන් වෙත පහළින් තිබූ යකඩ-අළු පැහැ ජලයේ පාවෙමින් තිබූ පැරණි බෝට්ටුවක් පෙන්නුවේය.

"මම අපට කෑම ටිකක් හොයාගත්තා."

බෝට්ටුව ඇතුළත සීතලෙන් ගල්වෙන තරම් විය. අයිස් මෙන් සීතල ජල වාෂ්ප සහ වැහි බිංදු ඔවුන්ගේ ගෙල දිගේ බේරුණ අතර සීතල සුළග ඔවුන්ගේ මුහුණුවලට පහර දෙමින් ඇද වැටුණි. පැය ගනනක් මෙන් දැණුන ගමනකින් පසු ඔවුන් ගල් පර්වතයට ළං වූහ. වර්නන් මාමා ලිස්සමින් සහ රූටමින් කන්ද නගිමින් ඔවුන්ව කඩාවැටුණු නිවස වෙත ගමන් කරවීය.

අභ්‍යන්තරය බිහිසුණු විය; මුහුදු පැලෑටි ගඳ තදින් දැනුන අතර,  ලී බිත්තිවල හිඩස් හරහා සීතල සුළඟ ගලා ගියේය. ගිනිඋදුන හිස් සහ කිළිටි විය. එහි කාමර දෙකක් තිබුණි.

වර්නන් මාමාගේ කෑම සළාකය චිප්ස් පැකට්ටුවක් හා කෙසෙල් ගෙඩි හතරක් විය. ඔහු ගින්නක් ඇවිලීමය උත්සාහ කළ නමුත් හිස් චිප් බෑගය උෂ්ණත්වයෙන් දුම් ගසා  දියවීගියේය.

"අර ලියුම් කිහිපයකින් ඒක කරන්න තිබ්බා?" ඔහු සතුටු විය.

ඔහු ඉතා සතුටින් සිටියේය. නිසැකවම ඔහු කල්පනා කළේ මුහුදේ ඈති ගල්කුළට කුණාටුවක් මැද කවුරුත් ලියුම් භාරදීමට පැමිණීම සිදුවිය නොහැක්කක් බවයි. හැරී ඊට පෞද්ගලිකව එකඟ වූ නමුත්, ඒ සිතුවිල්ලට ඔහු කිසිසේත්ම කැමති වූයේ නැත.

රාත්‍රිය වූ  විට පොරොන්දු වූ කුණාටුව ඔවුන් වටා කඩා වැටුණි. මුහුදු ජලබිංදු පැල්පතේ බිත්ති වලට පහර දුන් අතර අධික සුළඟ නිසා එහි අපිරිසිදු කවුළු දෙදරුම් දුන්නේය. දෙවන කාමරයෙන් පුස් බ්ලැන්කට් කිහිපයක් සොයා ගත් පෙටූනියා නැන්දා විසින් වේයන් කෑ සෝෆාව මත ඩඩ්ලි සඳහා ඇඳක් සාදන ලදී. ඇය හා වර්නන් මාමා අනෙක් කාමරයේ ඇති දිරාගිය ඇඳට ගියෝය. හැරීට සිදු වූයේ පොළවේ මෘදු තැනක් සොයා ගෙන ඉතාම තුනී ඉතාම වැරහැළි වූ බ්ලැන්කට්ටුවේ ගුළි වීමටයි.

Downloaded from sinhalaebooks.com

රාත්‍රියේදී කුණාටුව තවත් දරුණු විය. හැරීට නිදාගත නොහැකිය. ඔහු සීතලට ගැහුණේය. කුඩා පහසුවක් ලබා ගැනීමට උත්සාහ කරමින් ඔහු එහා මෙහා පෙරලුන අතරේ ඔහුගේ බඩ කුසගින්නෙන් හඩ තැළීය. මධ්‍යම රාත්‍රිය ආසන්නයේ ආරම්භ වූ ගිගුරුම් හඩින් ඩඩ්ලිගේ ගෙරවිල්ලේ හඩ යටපත් විය. සෝෆා එකෙන් පහළට එල්ලේන ඩඩ්ලිගේ මහත අතේ බැදි ඔරලෝසුවේ දිදුළන මුහුනතේ වේලාව දැන්වූයේ තව විනාඩි දහයකින් හැරීට වයස අවුරුදු එකොළහක් වන බවය. ඔහු දිගාවී තප්පරෙන් තප්පරය තම උපන් දිනය ලගා වන දෙස බලා සිටියේය., ඩර්ස්ලින්ට එය මතක තිබේද??, ලිපි ලියන්නා දැන් කොහේ ඇත්ද?

විනාඩි පහක් ගතවීමට තිබේ. හැරීට පිටිපස්සේ යමක් බිදෙනු ඇසුණි. වහළය කඩාවැටේ යැයි ඔහු අපේක්ෂා කළේය, එසේ වුවහොත් ඔහුට එය මදක් උණුසුම් විය හැකිය. මිනිත්තු හතරක් තිබේ. සමහර විට ප්‍රයිවට් ඩ්‍රයිව් හි නිවස මේ වන විට ලියුම් වලින් පිරී ඇති, ආපසු ගිය විට කෙසේ හෝ ලියුමක් සොරකම් කිරීමට හැකි වනු ඇත.

තව විනාඩි තුනයි. ඒ ගල් පර්වතයට පහරදෙන්නේ මුහුදද? හා (මිනිත්තු දෙකයි) එම විකාර පුපුරන ශබ්දය කුමක්ද? මේ පර්වතය මුහුදේ ගිලී යනවාද?

තව එක මිනිත්තුවක් තිබේ, ඉන්පසු ඔහුට වයස එකොළහක්.. තත්පර තිහයි... විසිඑකයි ... දහය ... නවය ... සමහරවිට ඩඩ්ලිව අවදි කළොත්.. ඔහුව අන්දමන්ද කරන්න.. තුනයි... දෙකයි... එක යි...

බූම්..

මුළු පැල්පතම දෙදරුවේය. හැරී ක්ෂණයකින් කෙළින් විය. කවුරුහරි ඇතුළට ඒමට දොරට තට්ටු කරමින් එළියේ සිටී.

තුන්වන පරිච්ඡේදය

යතුරු භාරකරු

බූම්....

ඔවුන් නැවතත් තට්ටු කරයි. ඩඩ්ලි වහා අවදි විය. "බෝම්බේ කොහේද?" ඔහු මෝඩයෙක් මෙන් ඇසීය.

ඔවුන් පිටුපස දොර ඇරුන අතර, වර්නන් මාමා කාමරයට කඩා වැදුණි. ඔහු රයිෆලයක් අල්ලාගෙන සිටියේය. ඔහු රැගෙන ආ දිගු, තුනී ඇසුරුමේ තිබූ දේ එය විය යුතුයි.

Downloaded from sinhalaebooks.com

"කවුද ඉන්නෙ ඔතන?" ඔහු කෑගැසුවේය. "මම අනතුරු අඟවනවා - මට සන්නද්ධ වෙලා ඉන්නේ!"

මද නිහඬතාවයක් විය. ඉන්පසු --

දඩාං!

යම් බලවේගක් මගින් දොර ගැළවී විසිවී ගොස් බිම පතිත විය.

දැවැන්ත මිනිසෙකු දොරටුවේ සිටගෙන සිටියේය. ඔහුගේ මුහුණ සම්පූර්ණයෙන්ම පාහේ ඝන හිසකෙස් වලින් හා නොකපන ලද ගැටගැසුනු රැවුලකින් සැඟවී තිබිණි. එහෙත්, ඔහුගේ ඇස් හිසකෙස් යට කළු කුරුමිණියන් මෙන් දිස් විය.

මෙම යෝධයා ඔහුගේ හිස පහත් කර දොර රාමුව තුළින් ඇතුළට මිරිකී ආවේය. ඔහු නැමී, දොර අතට ගත්තේ, එය රාමුව තුළට නැවත එබුවේය. පිටත කුණාටුවට ටිකක් අඩු විය. ඔහු සියල්ලන් දෙස බැලූවේය.

"අපිට තේ කෝප්පයක් හදන්න බැරිද, ඔයාට පුළුවන්ද? ඒක නම් පහසු ගමනක් නෙවෙයි."

ඔහු ඩඩ්ලි බියෙන් ගල්වී සිටු සෝෆාව වෙත ගමන් කළේය.

" ටිකක් එහාට වෙන්න. හොද තැනක්," ආගන්තුකයා කීවේය.

ඩඩ්ලි අඬමින්, වර්නන් මාමා පිටුපස සැඟවී සිටි අම්මා ලගට දිව ගියේය.

"ආ මේ ඉන්නේ 'හැරී!' යෝධයා කීවේය.

හැරි දරුණු, සුදුමැලි මුහුණ දෙස බැලූ අතර, කුරුමිණි ඇස්වල සිනහවක් දිළිසෙන බව දුටුවේය.

"මම ඔයාව අන්තිමට දකිනකොට ඔයා පොඩි බබෙක්," යෝධයා පැවසීය. "ඔයා තාත්තා වගේ, ඒත් ඇස් අම්මාගේ වගේමයි"

Downloaded from sinhalaebooks.com

වර්නන් මාමා විහිලු හැඬුම් ශබ්දයක් කළේය.

" මම කියන්නේ වහාම මෙතනින් එලියට ගියොත් හොදයි. "ඔබ කඩාගෙන ඇතුලට ආවේ"යි කී ය.

"අහ්හ්, කට වහගන්න, ඩර්ස්ලි, මහ ලොකු කැඳයා," යෝධයා කීවේය; ඔහු සෝෆාව පිටුපසින් ඊට උඩින් අත දමා, වර්නන්ගේ අතේ තිබූ තුවක්කුව ගෙන, එය රබර්වලින් සාදා ඇතිවාක් මෙන් පහසුවෙන් ගැට ගසා කාමරයේ කෙළවරට විසි කළේය.

වර්නන් මාමාගෙන් උගුලට අසුවූ මීයෙක් මෙන් තවත් විහිළු ශබ්දයක් පිටවිය.

"කොහොම උනත්.. - හැරී, "යෝධයා, ඩර්ස්ලිට පිටුපස හැරී, "ඔයාට ප්‍රීතිමත් උපන්දිනයක්. මගේ ලග ඔයාට පොඩි දෙයක් තියනවා - සමහර විට මම ඒක උඩ වාඩිවුණාද.., ඒත් ඒක රසට තියෙයි. "

තම කළු පැහැති කබායේ සාක්කුවෙන් ඔහු තරමක් කඩිමුඩියේ මදක් තැළුනු පෙට්ටියක් ඇද ගත්තේය. හැරී වෙවුළන ඇඟිලි වලින් එය විවෘත කළේය. ඇතුළත කොළපාට අයිසිං වළින් සුභ උපන්දිනයක් හැරී ලෙස ලියූ විශාල ඇලෙන සුළු චොකලට් කේක් එකක් විය.

හැරී යෝධයා දෙස බැලීය. ඔහු ස්තුති කිරීමට අදහස් කළ නමුත්, ඔහුගේ කටට වචන ආවේ නැත, ඔහු ඒ වෙනුවට, "ඔයා කවුද?" ඇසීය.

යෝධයා සිනාසුණේය.

"ඇත්තටම මම මාව හඳුන්වලා දුන්නේ නැනේ." මම රුබියස් හැග්රිඩ්, හොග්වර්ට්ස් වල යතුරු සහ ක්‍රීඩා පිටි භාරකරු. "

ඔහු දැවැන්ත හස්තයක් දිගුකර හැරිගේ අත මුළුමනින්ම තදින් අල්ලා ගත්තේය.

"එහෙනම් අර තේ එක ගැන මොකද?" ඔහු තම දැත් ඔසවා කීවේය. "මම නම් ගොඩක් ශක්තිමත් කෙනෙක්ට බෑ කියන්නේ නෑ. තේරුනාද ."

Downloaded from sinhalaebooks.com

ඔහුගේ දෑස් හිස් ගිනිඋදුනට සහ හිස් විස්ස් මල්ල දෙසට යොමුවිය. ඔහු ගෙරෙව්වේය; ඉන්පසු ඔහු ගිනිඋදුන වෙත නැමුණේය. ඔහු කළ දේ කාටවත් පෙනුනේ නැත, නමුත් ඔහු නැවත කෙළින් වන විට, එහි ගින්දර විය. එහි මුළු අඳුරු කුහරයම බැබළෙන ආලෝකය පිරී ගියේය. එවිට උණුසුම් ජල බේසමක ස්නානය කරන්නාක් මෙන් හැරීට උණුසුම් සුවයක් දැනුනේය.

යෝධයා නැවත හිඳගත්තේය. ඔහුගේ බරින් සෝෆාව ඉරී ගියේය. ඔහුගේ තම සාක්කු වලින් නොයෙකුත් දේ එළියට ගත්තේය. කොපර් කේතලයක්, එබෙන සුළු සොසේජස් පැකට්ටුවක්, තේ පෝච්චියක්, කෝප්ප කිහිපයක්, සහ තේ හැදීම ආරම්භ කිරීමට පෙර මදක් පානය කළ කහපාට දියරයක් ඇති බෝතලයක් එහි විය. ඉක්මනින්ම කාමරය සෝසේජස් බැදෙන සිහින් හඬින් හා සුවඳින් පිරී තිබිණි. යෝධයා වැඩ කරමින් සිටියදී කිසිවෙක් කිසිවක් කීවේ නැත. නමුත් ඔහු මුල්ම, ඉස්ම සහිත, තරමක් බදින ලද සොසේජස් හය බිමට බාන විට ඩඩ්ලි ටිකක් කළබල විය. වර්නන් මාමා දැඩිව කියා සිටියේ, "එයා ඔයාට දෙන කිසිම දෙයක් අල්ලන්න එපා ඩඩ්ලි" කියාය.

යෝධයා අඳුරු ලෙස සිනා විය.

"ඔයාගේ ලොකු පුඩිමක් වගේ පුතාට තව තෙල් ඕනේ නෑ, ඩර්ස්ලි, කරදර වෙන්න එපා. "

ඔහු සොසේජස් පිගාන හැරීට දුන්නේය, ඉතා කුසගින්නේ සිටි හැරීට එතරම් කිසිවක් රසවත් නොවූ නමුත්, ඔහුට තවමත් යෝධයා වෙතින් ඔහුගේ ඇස් ඉවත් කර ගැනීමට නොහැකි විය. අවසාන වශයෙන් කිසිවක් පැහැදිලි කිරීමට කාටවත් උවමනාවක් නොතිබූ බැවින්, "මට සමාවෙන්න, ඒත් ඔබ කවුද කියලා තාමත් මම දන්නේ නෑ"

යෝධයා තේ පානය කළ අතර ඔහුගේ අත පිටුපසින් ඔහුගේ මුඛය පිස දැමීය.

"මට හැග්‍රිඩ් කියන්න." මම කිව්වා වගේ, මම හොග්වාර්ට්ස් වල ක්‍රීඩාපිටි පාලකයා - හොග්වාර්ට්ස් ගැන හැමදේම දන්නවානේ."

"අර්ර් - නැහැ," හැරී පැවසීය.

යෝධයා පුදුමයෙන් ගල් ගැසුණේය.

"සමාවෙන්න," ඉක්මනින්ම හැරී කීවේය.

Downloaded from sinhalaebooks.com

"සමාවෙන්න?" හැග්‍රිඩ් කෑ ගැසුවේය, ඔහු ඩර්ස්ලි දෙස බලා සිටියේය, වර්නන් සෙවණැලි වැටී ඇති අඳුර තුළට පසුබැස්සේය. "කණගාටු වෙන්න ඕනේ එයාලා, මම දන්නවා අපි ඔයාට ලියුම් ලියන්නෙ නෑ කියලා. ඒත් මම කවදාවත් හිතුවේ නැහැ හොග්වාර්ට්ස් කියන්නේ මොකද්ද කියලා ඔයා දන්නේ නැතිවෙයි කියලා. ඒත්, ඔයාගේ දෙමව්පියන් ඒවා ඔක්කොම ඉගෙනගත්තේ කොහෙන්ද කියලා ඔයා හිතුවේ නැද්ද?"

"ඒවා ඔක්කොම කිව්වේ?" හැරී ඇහුවේය.

"ඔක්කොම මොකක්?" හැග්රිඩ් ගිගිරීය. "එක තත්පරයක් ඉන්න!"

ඔහු වහා හිටගත්තේය. ඔහු කෝපයෙන් පිරී ගියේ ඉන් මුළු ගෙදරම පිරී ගියේය. ඩර්ස්ලිස් බිත්තිය දෙසටම තද වී සිටියෝය.

"තමුන් මට කියන්නේ" ඔහු ඩර්ස්ලි දෙසට පැන්නේය. "මේ.... මේ ළමයා - මේ ළමයා! එයා කිසිදෙයක්... මොනවත්ම දන්නේ නැද්ද?"

මේක ටිකක් දුරදිග යන බව හැරී සිතුවේය. ඔහු පාසැලට ගිය පසු ඔහුගේ ලකුණු නරක නැත.

"මම සමහර දේවල් දන්නවා" ඔහු කීවේය. "මට පුළුවන්, ඔයා දන්නවානේ, ගණිතය වගේ දේවල් කරන්න." හැග්‍රිඩ් අත වැනුවේය, "මම අදහස් කලේ අපේ ලෝකය ගැන, ඔයාගේ ලෝකය, මගේ ලෝකය, ඔයාගේ දෙමාපියන්ගේ ලෝකය."

"මොන ලෝකයද?"

හැග්රීඩ් පුපුරන්නට විය.

"ඩර්සිලි!" ඔහු සර්ජනා කළේය.

ඉතාම සුදුමැලි වී සිටි වර්නන් මාමා යමක් කුටු කුටු ගෑවේ "මම්බලිබ්ල්මල්" වගේ ශබ්දයක් ඇසිණි.. ආපසුහැරී හැරී දෙස බැලූ හැග්රිඩ්,

"ඒත් ඔයා ඔයාගේ අම්මා තාත්තා ගැන දැනගන්න ඕනේ" යයි පැවසීය. "මම කියන්නේ, එයාලා ප්‍රසිද්ධයි. ඔයා ප්‍රසිද්ධයි."

Downloaded from sinhalaebooks.com

"මොකක්ද මගේ - අම්මා තාත්තා ප්‍රසිද්ධයි? එයාලා කෝ"

"ඔයා දන්නෙ නෑ ... ඔයා දන්නෙ නෑ ..." හැග්රිඩ් සිය හිසකෙස් අතරින් ඇඟිලි යැව්වේය, බර සිතුවිල්ලක් සහිතව හැරී දෙස බලා සිටියේය.

"ඔයා කවුද කියලා ඔයා දන්නවාද?" ඔහු අවසානයේ පැවසීය.

වර්නන් හදිසියේම ඔහුගේ හඬ හමු වූවාක් මෙන් හඬතැලීය.

"නවත්තන්න!" ඔහු අණ කළේය. "ඔහොම ඉන්න සර්, මම ඔබට තහනම් කරනවා කොළුවාට මොකුත් කියන්න "යි කී ය.

වර්නන් ඩර්ස්ලිට වඩා නිර්භීත මිනිසෙකු වුවද හැග්‍රිඩ් හෙලූ කෝපාවිෂ්ට පෙනුමට යට වනු ඒකාන්තයි. හැග්රිඩ් කතා කරන විට, ඔහුගේ සෑම අංගයක්ම කෝපයෙන් වෙවුළන්නට විය.

"තමුන් කවදාවත් එයාට කිව්වේ නෑ?" "කවදාවත්ම කිව්වේ නෑ ඩම්බල්ඩෝර් එයාට ලියපු ලිවුමේ ලියලා තිබුනේ මොකක්ද කියලා?" "මම එතන හිටියා" "ඩම්බල්ඩෝර් ඒක එයා ලඟ තියනවා මම බළාගෙන හිටියා ඩර්ස්ලි! මේ අවුරුදු ගානම තමුන් ඒක එයාගෙන් හැංගුවා"

"මගෙන් හැංගුවේ මොනාද?" හැරී ඇසීය.

"නවත්වන්න, මම ඔයාට තහනම් කරනවා" වර්නන් මාමා භීතියෙන් කෑගැහුවේය.

පෙටූනියා නැන්දා ත්‍රාසජනක අවතාරයක් දුටුවාක්මෙන් භීතියෙන් ගල් ගැසුනාය.

"අහ්හ්, උඹලා දෙන්නාම ගිහිල්ලා ඔය ඔලු දෙක තම්බාගනිල්ලා" යයි හැග්රිඩ් පැවසීය. "හැරී - ඔයා මායාකාරයෙක්."

කුටිය තුළ නිහඬ විය. මුහුදු හා සුළං හමන හඬ පමණක් ඇසිණි.

Downloaded from sinhalaebooks.com

"මම - මොකක්ද?" හැරි ගැස්සුනේය.

"මායාකාරයෙක්, ඇත්තටම" කියා හැග්‍රිඩ් පැවසුවේ, සෝෆාව මත ඉඳගත්තේය, එය ශබ්ද කර තව ටිකක් පහළට ගිලා බැස්සේය. "මම කියන්නේ, ඔයාව ටිකක් පුහුණු කරලා ගත්තම ඔයාගේ අම්මයි තාත්තයි එක්ක බැලුවාම, වෙන මොනවා වෙන්නද ඔයා? "මම හිතන්නේ ඔයාගේ ලියුම කියවන එක හොඳයි."

හැරී අවසානයේ කහ පාට වූ ලියුම් කවරය ගැනීමට අත දිගු කළේය. එහි හරිත තීන්තෙන් ලිපිනය ලියා තිබිණි. එච්. පෝටර්, ගෙබිම, පර්වතය මත පැල්පත, මුහුද.. ඔහු එම ලිපිය ඉවතට ගෙන මෙසේ කියෙව්වේය:

මායාකාරියන්ගේ සහ මායාකරුවන්ගේ හොග්වර්ට්ස පාසල

ප්‍රධානී: ඇල්බස් ඩම්බල්ඩෝර්

(මර්ලින් කමිටුව, පළමු පංතිය, විශිෂ්ඨ මායාකාර, වොල්ලොක් ප්‍රධානී, ශ්‍රේෂ්ඨ මග්වැම්ප්, ජාත්‍යන්තර මායාකරුවන්ගේ මාණ්ඩලය)

දයාබර පෝටර් මහතා වෙත,

හොග්වාර්ට්ස් මායාකාරියන්ගේ හා මායාකරුවන්ගේ පාසලට ඔබ පිළිගනු ලැබ ඇති බව අපි ඔබට දැන්වීමට කැමැත්තෙමු. අවශ්‍ය සියලු පොත් සහ උපකරණ ලැයිස්තුවක් ඇතුලත් කර ඇත..

වාරය ආරම්භ වන්නේ සැප්තැම්බර් 1 වනදා වේ.

මිනෙර්වා මැක්ගොනගල්

නියෝජ්‍ය ප්‍රධානී

හැරීගේ හිසතුළ ප්‍රශ්න වැලක් පුපුරා ගිය අතර පළමුව ඔහුගෙන් විමසිය යුත්තේ කුමක්දැයි තීරණය කළ නොහැකි විය. මිනිත්තු කිහිපයකට පසු ඔහු "මොකද්ද එයාලා, මගේ බකමූණා එනකන් බලා ඉන්නවා කියන එකේ තේරුම" යනුවෙන් ඇසීය.

" අනේ දෙයියනේ, මට දැනුයි මතක් උනේ" කියා හැග්රීඩ් කීවේය. අශ්ව කරත්තයක් තල්ලු කිරීමට ප්‍රමාණවත් බලයකින් තම නළලට අත්ලෙන් ගැසූ ඔහු, තම උඩ කබායේ ඇතුළත සාක්කුවකින් බකමූණෙක් එළියට ඇද

Downloaded from sinhalaebooks.com

ගත්තේය. එය සැබෑ, සජීවී, මදක් අවුල් වූ බකමූණෙකි - තව දිගු පිහාටු පෑනක් සහ පාච්මන්ට් කඩදාසියක් ද විය. ඔහුගේ දත් අතර දිව තබාගෙන යමක් එහි ලිව්වේ හැරීට එය උඩු යටිකුරුව කියවීමට හැකි විය.

ආදරණීය මහාචාර්ය ඩම්බල්ඩෝර්,

හැරීගේ ලිපිය භාරදුනිමි.

හෙට එයාගේ බඩු මිලට ගන්න යනවා.

කාලගුණය ඉතාම නරකයි. ඔබ හොඳින් කියා සිතමි.

හැග්‍රිඩ්

හැග්‍රිඩ් කඩදාසිය නවා රෝල් කර, එය බකමූණාට දුන්නේය, ඌ එය හොටේ රඳවා ගත් අතර, හැග්‍රිඩ් කුණාටුව තුලට ඌ වීසි කළේය. ඔහු ආපසු පැමිණ, එය දුරකථනය ඔස්සේ කතා කිරීම තරම් සාමාන්‍ය දෙයක් මෙන් ආපසු සෝෆාවේ වාඩි විය.

හැරී තමා කට විවෘත කරගෙන සිටිබව සිහිවී ඉක්මනින් එය වසා ගත්තේය.

"මම මොනාද කියමින් හිටියේ?" හැග්රිඩ් පැවසුවේය, නමුත් ඒ මොහොතේ බිත්තිය අසළට වී සිටි වර්නන් ගිනිඋදුනේ ආලෝකයට මුහුණලා ඉදිරියට පැමිණියේ දැඩි කෝපයට පත්ව සිටියේය.

"ඔහු යන්නේ නැහැ," ඔහු පැවසීය.

හැග්රීඩ් තරහෙන් පිපිරෙන්නට විය.

"තමුන් වගේ මහ ලොකු මගල් කෙනෙක් එයාව නවත්තනවා දකින්න මම කැමතියි" ඔහු කීවේය.

"මොකෙක්ද?" හැරී උනන්දුවෙන් ඇසීය.

"මගල්" කියා හැග්රීඩ් පැවසුවේය. "අපි මැජික් දන්නේ නැති අය හඳුන්වන්නේ එහෙමයි. ඔයාගේ නරකට ඔයාට පවුලක් වගේ ඉන්න උනේ මම දැකපු අතිශයින්ම මගල් පවුල එක්ක. "

Downloaded from sinhalaebooks.com

"අපි එයාව ගන්නකොට ඔය ජරාවල් නවත්වන්න, අපි දිවුරුවා." වර්නන් මාමා කීවේය, "එයාගෙන් ඔය දේවල් ඈත් කරන්න, මායාවල් ඇත්තටම!"

"ඔයා දැනගෙන හිටියා?" හැරී කීවේය. "ඔයා දන්නවා මම - මායාකාරයෙක් කියලා?"

"දන්නවා!" පෙටූනියා නැන්දා ඉදිරිපත් විය. "ඇත්තටම අපි දැනගෙන හිටියා! කොහොමද අමතක කරන්නේ, මගේ මැරුනු නංගි? එයාටත් ඔය වගේම ලියුමක් ලැබුනා. ඔය ඉස්කෝලෙටම අතුරුදහන් උනා- එයා හැම නිවාඩුවකම ගෙදර ආවා. ගෙඹි පිළිම, තේ කෝප්ප බවට හරවපු මීයන්ගෙන් සාක්කු පුරවගෙන, ඇය කරපු දේවල් මම විතරයි දැක්කේ- අද්භූත විකාරකාරියක්. ඒත් මගේ අම්මටයි තාත්තාටයි, අපෝ.... ලිලී මේක, ලිලී අරක, පවුලේ මායාකාරියක් ඉන්නඑක ගැන එයාලා හරි ආඩම්බර වුනා"

වසර ගනණාවක් තිස්සේ එය කීමට සූදානම් වූවෙකු මෙන් වේගයෙන් කියා ඇය ගැඹුරු හුස්මක් ඇද නැවත ආරම්භ කළාය..

"එයාට ඉස්කෝලේදී පෝටර් හම්බුනා. පස්සේ දෙන්නා කසාද බැදලා ඔයාව හම්බුනා... ඇත්තටම ඔයත් ඒ වගේම අද්භූත විකාර... මේ මේ... අසාමානය ළමයෙක් කියලා මම දැනගෙන හිටියා.. අන්තිමට ලිලී ගිහින් කොහේහරි පුපුරලා මැරුනම ඔයාව වැටුනේ අපි ලගට".

හැරී සුදුමැලි වී ගියේය. ඔහු යතා තත්වයට ආ වහාම කෑ ගැසුවේය. "පිපිරුවා? ඒත් එයාලා වාහන  අනතුරකින් මැරුනා කියලා ඔයා මට කිව්වේ "

"වාහන අනතුරකින්!" හැග්‍රිඩ් ගෙරෙව්වේය. ඔහු කෝපයෙන් උඩ පැන්නේ, ඩර්ස්ලින් ආපසු ඔවුන් සිටි මුල්ලටම විසි විය.  "වාහන අනතුරක් ලිලීවයි ජේම්ස් පෝටර්වයි දෙන්නා මරලා දැම්මේ කොහොමද? මේක අපරාධයක්! වංචාවක්! හැරී පොටර් ගැන අපේ ලෝකේ  හැම දරුවෙකුම දැනගෙන ඉන්නකොට එයා තමන්ගේ කතාව දන්නේ නෑ! "

"ඇයි මොකද උනේ?" හැරී වහාම විමසුවා.

කෝපය හැග්‍රිඩ් ගේ මුහුණෙන් ගිලිහී ගියේය. ඔහු හදිසියේම කලබල විය.

"මම මේක කියන්න කවදාවත් බලාපොරොත්තු වුණේ නැහැ" කියා ඔහු පැවසුවේය. "ඩම්බල්ඩෝර් මට කියනකොට ඔයාව ගන්න කරදර වෙයි කියලා, මම මෙහෙම දෙයක් හිතුවේ නෑ, අහ්, හැරී, මේක කියන්න හොඳම කෙනා මමද කියලා මම  දන්නේ නෑ - ඒත් ඔයාට මොකුත්ම නොදැන හොග්වාර්ට්ස් යන්න බෑ. "

Downloaded from sinhalaebooks.com

ඔහු ඩර්ස්ලි දෙස අප්‍රසන්න බැල්මක් හෙලීය.

"හොඳයි, මම ඔයාට කියන්න පුළුවන් තරම්ම තේරුම් ගන්නවානම් හොඳයි - හිතට ගන්න, මට හැම දේම කියන්න බැහැ", ඒක... ඒක ලොකු අභිරහසක්... "

තත්පර කීපයක් ගිනි මැලය දෙස බලා සිටි අතර පසුව ඔහු මෙසේ කීවේ ය: " ඒක පටන් ගන්නේ මම හිතන්නේ... එක පුද්ගලයෙකුගෙන් එයාට කියන්නේ- ඒක විශිෂ්ඨයි. ඒත් එයාගේ නම ඔයා දන්නේ නෑ. ඒත් අපේ ලෝකේ හැමෝම දන්නවා ".

"කවුද?"

"මේකයි මට එයාගේ නම කියන්න බෑ . කවුරුත් ඒක කියන්නේ නෑ"

"ඇයි නැත්තේ?"

"අනේ දෙවියනේ... හැරී, මිනිස්සු තවමත් බයයි." "ආහ්, මේක අමාරුයි, බලන්න හැරී, එක මායාකාරයෙක් එයා නරකයි ... නරකයි, ඔයාට හිතන්න පුළුවන් උපරිම තරම් නරකයි ... ජරාම ... නරකම කෙනෙක්.. එයාගේ නම.."

හැග්රිඩ් කෙළ ගිල්ලේය, නමුත් කිසිදු වචනයක් පිට නොවිය.

"ඔයාට ඒක ලියන්න පුළුවන්ද?" හැරී යෝජනා කලේය.

"බැහැ. අකුරු කියන්න බෑ." හරි ඒ වොල්ඩමෝට්. "හැග්‍රිඩ් වෙව්ලීය. "මං ලවා ආයෙත් ඒ නම කියවන්න එපා.. කොහොම වෙතත්, මීට අවුරුදු විස්සකට විතර කලින් මේ මායාකාරයා, ගෝළයෝ හොයන්න පටන් ගත්තා... හම්බුනත් එක්ක. සමහරු බයට,.. තව සමහරු එයාගේ බලයට ටිකක් ආසා උනා. එයාලා හරිම දක්ෂයි, හැරී .. ඒවා හරිම අඳුරු කාලවල් හැරී .. විශ්වාස කරන්නේ කවුද කියලා හිතාගන්න බෑ, අඳුනන්නේ නැති මායාකරුවන්ට හරි මායාකාරියන්ට සුහදශීලී වෙන්න බෑ .. නරක දේ සිද්ද වුනේ .. එයා බලය පැතිරුවා. සමහරු එයාට විරුද්ධව නැගී හිටියා - ඔහු 'එයාලව මරලා දැම්මා' - එක ආරක්ශිත තැනක් විදිහට හොග්වාර්ට්ස් තිබ්බේ. නම නොකියන කෙනා ඩම්බල්ඩෝර්ට විතරයි බය වුනේ. ඉතිං එයා ඉස්කෝලේ අල්ලාගන්න එන්න නිර්භීත උනේ නෑ. ඒ කාළෙදිවත්.. කොහොම වුනත්

"එතකොට, ඔයාගේ අම්මා තාත්තා මම දැනගෙන හිටපු හොඳම මායාකාරයන් සහ මායාකාරියන්ගෙන් දෙන්නෙක්, හොග්වාර්ට්ස් වල ප්‍රධාන ශිෂ්‍ය නායකයා සහ නායිකාව එයාලාගේ කාලේ! පුදුමේ කියන්නේ මුල්

Downloaded from sinhalaebooks.com

කාලේ නම නොකියන කෙනා එයාලාව තමන්ගේ පැත්තට ගන්න උත්සාහ කලේ නෑ. ගොඩක් වෙලාවට අඳුරු පැත්තට දෙයක් කරන්න බැරි තරම් එයාලා ඩම්බල්ඩෝර්ට ගොඩක් සමීප වෙලා හිටපු නිසා වෙන්න ඇති.

"සමහරවිට එයා හිතුවේ එයාලට ඒත්තු ගන්වන්න පුළුවන් කියලා වෙන්න ඇති... සමහරවිට එයා තමන්ගෙන් ඈත්වෙලා ඉන්න කියලා අනතුරු අඟවන්න හිතන්න ඇති.කවුරුත් දන්නේ, ඔයා ජීවත් වුන ගමට හැලොවීන් දවසක මීට අවුරුදු 10 කට විතර කළින් එයා ආවා . ඔයාට එතකොට වයස අවුරුද්දයි. එයා ඔයාගේ ගෙදරට ඇවිත් ..එයා - එයා '' -

හැග්‍රිඩ් හදිසියේම ඉතා අපිරිසිඳු, තිත් වැටුනු ලේන්සුවක් එළියට ඇද හොරනෑවක් වැනි ශබ්දයකින් ඔහුගේ නාසය සීරුවේය.

"සමාවෙන්න," ඔහු කීය. "ඒත් ඒක ගොඩක් දුකයි - ඔයාගේ අම්මයි තාත්තාවයි අපි දැනගෙන හිටියා, එයාලා වගේ හොඳ මිනිස්සු සොයාගන්න බෑ - කොහොමහරි ..."

"නම නොකියන කෙනා එයාලාව මැරුවා - එතකොට, මේක තමයි නියම අභිරහස - එයා ඔයාවත් මරන්න උත්සාහ කළා" - "මම හිතන්නේ එක්කෝ හැමදේම ඉවර කරන්න, නැත්තන් ඒ වෙනකොට මරන එක එයාට පුරුද්දට ගිහින්. ඒත්, එයාට ඒක කරන්න බැරි වුනා. ඔයාට ඔය සලකුණ නළලට ආවේ කොහොමද දන්නවාද? ඒක සාමාන්‍ය කැපීමක් නෙවෙයි. ඒ බලවත්, නපුරු ශාපය ස්පර්ශ වෙනකොට ආපු එකක්. එයා ඔයාගේ අම්මා තාත්තා ගෙදර හැමදේම විනාශ කරා - ඒත් ඒක ඔයාට වැඩ කළේ නෑ 'ඒ නිසා තමයි ඔයා ප්‍රසිද්ධ, හැරි .. එයා මරන්න තීරණය කරපු කවුරුවත් ඉතුරු කළේ නෑ. හැමෝම මරා දැම්මා ඔයාව ඇරෙන්න. ඒ කාළේ හිටපු දක්ශ මායාකාරයෝ මායාකාරියෝ ගොඩක්ව එයා මැරුවා. මැක්කයිනෝස්, බෝන්ස්, ප්‍රිවෙට්ස් - ඔයා බබෙක් විතරයි ඒත් "ඔයා ජීවත් වුණා"

හරිම වේදනාකාරී දෙයක් හැරීගේ මනස තුළ සිදුවෙමින් තිබේ. හැග්‍රිඩ්ගේ කතාව අවසන් වෙද්දී, ඔහුට කොළ එළිය සහිත අද්විතීය පිපිරුම නැවත වරක් මතකයට ආ අතර, ඔහු මීට පෙර සිහිපත් කරද්දීට වඩා පැහැදිලිව පෙණින. ඔහුගේ ජීවිතයේ පළමු වතාවට: උස්, සීතල, කුරිරු හිනා හඬක් ද මතක් විය.

හැග්‍රිඩ් කණගාටුවෙන් හැරී දෙස බලා සිටියේ ය.

"ඩම්බල්ඩෝර් නියෝග කළාම විනාශ වුනු ගෙදරින් ඔයාව අරන් ආවේ මම. මේගොල්ලෝ ලඟට බාර දෙන්න"

Downloaded from sinhalaebooks.com

"පරණ කතා වල බර පටවන්න එයාට," වර්නන් පැවසුවේ ය. හැරී උඩ ගියේය; ඩර්ස්ලි එහි සිටි බව ඔහුට අමතක වී තිබුනි. නිර්භීත වර්නන් නිසැකවම ධෛර්යසම්පන්න වී තිබේ. ඔහු හැග්‍රිඩ් දෙස බලා සිටිද්දී ඔහුගේ අත් මිට මෙළවුණේය.

"දැන්, මම කියන දේ අහන්න, ළමයා" යැයි ඔහු කෑගසමින්, "මම පිළිගන්නවා ඔයා අමුතු කෙනෙක්, බොහෝ විට හොඳ පාරක් ගහලා හදන්න බැරි දෙයක් නෑ- එතකොට මේ ඔයාගේ දෙමාපියන් ගැනත් එහෙමයි. එයාලා මහ විකාරකාරයෝ, ඒක ගැන කතා දෙකක් නෑ. මගේ අදහස එයාලා නැති එක මේ ලෝකෙට වඩා හොඳයි - මොනාද එයාලට ලැබුණේ, මේ මායාකාරි වර්ග එක්ක එකතු වෙලා - මම හැමවෙලේම බලාපොරොත්තු උනේ ඕක, ජරා අවසානයක් - - "

නමුත් ඒ මොහොතේදී හැග්‍රිඩ් සෝෆාවෙන් පිටතට නැගිට ගොස් ඔහුගේ කබාය ඇතුළතින් රෝස පැහැති කුඩයක් ඇදගත්තේය. කඩුවක් මෙන් එය ඉදිරියට දිගු කොට, "මම තමුන්ට අනතුරු අඟවනවා, ඩර්ස්ලි - අන්තිම වතාවට - තවත් එක  වචනයක් හරි කිව්වොත් ..."

රැවුල සහිත යෝධයෙකු විසින් කුඩයක් දිගුකොට කළ තර්ජනයක දී, මාමණ්ඩිගේ නිර්භීතකම නැවත වරක් අසාර්ථක විය; ඔහු බිත්තිය වෙතට පසු බැස නිහඬ විය.

"එහෙම හොඳයි" කියා හැග්රිඩ් පවසමින් නැවත සෝෆාවේ ඉඳගත්තෙන් එය මේ වතාවේ බිමටම සමතලා විය..

කෙසේවෙතත්, හැරීට තවත් ප්‍රශ්න ගණනාවක් ඇත.

"නමුත් වෝල් - සමාවෙන්න - මම කියන්නේ, නම නොකියන කෙනා ට මොකද වුනේ?"

"හොඳ ප්රශ්නයක්, හැරී, එයා අතුරුදහන් වුනා. ඔයාව මරන්න උත්සාහ කරපු රාත්‍රියේම අතුරුදහන්.. ඔයා තව තවත් ජනප්‍රිය උනේ ඒකයි.. ඒක තමයි ලොකුම අභිරහස, බලන්න ... එයා තව තවත් බලවත් වේගෙන එනකොට - එයා අතුරුදන් වුනේ ඇයි ?

සමහරු කියනවා එයා මැරිලලු.. , මම නම් හිතන්නේ... කවුද දන්නේ එයාගේ ඇතුලේ මැරෙන්න තරම් මනුස්සයෙක් හිටියද කියලා. සමහරු කියනවා එයා තාම ඉන්නවලු, එයාගේ වෙලාව එනකන්, ඒත්, මම ඒක විශ්වාස කරන්නේ නැහැ. එයාගේ පැත්තේ හිටපු මිනිස්සු ආපහු අපේ පැත්තට ආවා. සමහරු ඉක්මනට වෙනස් වුනා. ආපහු එයා එනවා නම් මම හිතන්නේ නෑ එයාලට එහෙම කරන්න පුළුවන් කියලා.

Downloaded from sinhalaebooks.com

"අපෙන් වැඩි දෙනෙක් විස්වාස කරන්නේ එයා කොහේ හරි කොතැනක හරි එයාගේ බලය අහිමි වෙලා ජීවත් වෙනවා කියලා, එයා ඉස්සරහට එන්න බැරි තරම් දූර්වලයි, මොකද එදා ඔයා නිසා ඔයාගේ මොනාහරි හේතුවකට එයාව විනාස වුනා හැරී.. එදා රෑ එයා ගණන් ගත්තේ නැති. මොකක් හරි දෙයක් සිද්ධ වුනා, මම දන්නේ නෑ ඒ මොකක්ද කියලා. කවුරුවත්ම දන්නේ නැහැ - ඒත් ඔයාගේ මොකක්හරි එයාට විරුද්ධ වුනා.., හරිද. "

හැග්‍රිඩ් හැරී දෙස බැලුවේ උණුසුම් හා ගෞරවනීය හැඟීමක් සමඟය. හැරී සතුටින් හා ආඩම්බර හැඟීමකින් ඉන්නවා වෙනුවට, ඉතා භයානක අත්වැරැද්දක් වී ඇති බවට විශ්වාසයකින් සිටියේය. මායාකාරයෙක්? ඔහු? එය කෙසේ විය හැකිද? ඔහුගේ ජීවිතය ඩඩ්ලිගේ කරදර මැද ගෙවිණි. පෙටූනියා නැන්දාගේ සහ වර්නන් මාමාගේ තාඩන පීඩන වලින්ම පිරී ගියේය. ඔහු සැබැවින්ම මායාකාරයෙක් නම්, ඔවුන් ඔහුව කබඩ් එකේ අගුලු දමා හිර කිරීමට උත්සාහ කළ හැම විටම ඔවුන් තලගොයන් බවට පත් නොවූයේ මන්ද? ඔහු වරක් ලෝකයේ ශ්‍රේෂ්ඨම මායාකාරයා පරාජය කළේ නම්, ඩඩ්ලිට සෑම විටම පාපන්දුවකට මෙන් ඔහුට පහර දීමට හැකි වූයේ කෙසේද?

"හැග්‍රිඩ්" යැයි ඔහු සෙමින් කීවේය. "මම හිතන්නේ ඔයාට වැරැද්දක් වෙන්න ඇති. මම හිතන්නේ නෑ මම මායාකාරයෙක් කියලා."

ඔහු පුදුමයට හැග්‍රිඩ් සිනා සෙන්නට විය.

" මායාකාරයෙක් නෙවෙයි....?? බය වුණාම, නැත්නම් තරහ ගියාම මොනවත්ම කරලා නෑ?"

හැරී ගින්න දෙස බැලීය. ඔහු ඒ ගැන සිතා බැලීය ... ඔහුගේ නැන්දා සහ මාමා සමඟ කෝපාවිෂ්ට වූ සෑම විටම අමුතු දේවල් සිදු විය, හැරී , ඔහු කෝපයට පත්වූ විට ඩඩ්ලිගේ කල්ලිය විසින් លුහුබැඳ එන විට කෙසේ හෝ ක්‍රමයකින් එයින් වෙනතක ගියේය. කොණ්ඩය කොටටම කපා පාසලට යැවීමට තැත් කළ විට ඔහුට එය එක රැයකින් නැවත වර්ධනය කර ගැනීමට හැකි විය. අන්තිම වතාවට ඩඩ්ලි ඔහුට පහර දුන් විට... ඔහු පළිගත්තේ නැත්ද, ඔහු නොසිතාම ...? සත්තුවත්තේදී සර්පයා ඔහුවෙත නිදහස් කිරීමෙන් පළිගත්තේය..

හැරී හැග්‍රිඩ් දෙස සිනා මුහුණින් බලන විට, හැග්‍රිඩ් ඔහු දෙස ප්‍රසන්නව බලා සිටියේය.

"දැක්කද?" හැග්‍රිඩ් පැවසීය. "හැරී පොටර්, මායාකාරයෙක් නොවෙයි - බලන් ඉන්නකෝ , ඔයා හොග්වාර්ට්ස් වල හරියට ප්‍රසිද්ධ වෙයි."

ඒත් වර්නන් මාමා සටනකින් තොරව පරාද වීමට කැමති වූයේ නැත.

"මම ඔයාට කිව්වා නේද එයා යන්නේ නෑ කියලා?" ඔහු පිම්බේය. "එයා ස්ටෝන්වේල් උසස් පාසලට යනවා, ඒකට එයා මට ගරු කරයි. මම ඔය ලියුම් ඔක්කොම කියෙව්වා.. එයාට ඔය කුණු කසළ අවශ්‍යා නෑ - මන්තර පොතුයි මායා යෂ්ටියි --"

Downloaded from sinhalaebooks.com

"එයා යන්න කැමති නම්, ඔයා වගේ තඩි මගල් කෙනෙක්ට එයාව නවත්වන්න බෑ" කියා හැග්රිඩ් ගෙරෙව්වේය. "ලිලී ගෙයි ජේම්ස් පෝටර්ගෙයි පුතා හොග්වාර්ට්ස් යන එක නවත්වන්න! පිස්සුද. එයා උපන් දා ඉඳලම එයාගේ නම ප්‍රසිද්ධයි. එයා ලෝකයේ මායා වලට තියන හොඳම ශ්‍රේෂ්ඨතම පාසලට යන්නේ. අවුරුදු හතක් එයා තමන් ගැන දැනගනීවි. වෙනසකටත් එක්ක එයා තමාගේම වර්ගයේ ළමයි එක්ක ඉගෙනගනීවි, හොග්වාර්ට්ස් වල හිටපු හොඳම නායකයා වෙච්ච ඇල්බස් ඩම්බල්...'

"මම වියදම් කරන්නේ නෑ අබලන් වෙච්ච නාකි මෝඩයෙකුට එයාට මායා ක්‍රම උගන්වන්න!" වර්නන් මාමා කෑගැසුවේය.

එහෙත්, අවසානයේ ඔහු දුරදිග ගොස් තිබේ. හැග්‍රිඩ් ඔහුගේ කුඩයත් දිගුකරගෙන, ඔහුගේ හිස වටා කරකවමින් කෑ ගැසුවේය, "කවදාවත්," ඔහු ගිගුරුවේය, "ඇල්බස්-ඩම්බල්ඩෝර්ට- අපහාස- කරන්න- එපා!"

ඔහු කරකවමින් සිටි කුඩය පහත් කර ඩඩ්ලි දෙසට දිගු කළේය - දම් පැහැ ආලෝකයක් විහිදිනි, රතිඤ්ඤා පුපුරන්නාක් වැනි ශබ්දයක් ඇති විය. ඊළඟ තත්පරයේ ඩඩ්ලි උඩපනිමින් වේදනාවෙන් නටමින් සිටි අතර ඔහුගේ දෑත් තම මහත පස්සට තද කරගෙන සිටියේය. ඔහු පිටුපස හරවා පෙන්වන විට, කැරකුන ඌරු වලිගයක් ඔහුගේ කලිසමේ පිටුපස සිදුරකින් එළියට පැන තිබුණි.

වර්නන් මාමා කෑගහන්නට විය. ඔහු පෙටූනියා නැන්දා සහ ඩඩ්ලි අනෙක් කාමරයට තල්ලු කර, පිටුපස හැරී හැග්‍රිඩ් දෙස අවසන් දවාලන බැල්මක් හෙලා කාමරය තුළට ගොස් දොර වසා ගත්තේය.

හැග්‍රිඩ් තම කුඩය දෙස බලා ඔහුගේ රැවුල කැසුවේය.

"මම කේන්ති ගන්නේ නැතිව ඉන්න තිබ්බේ," ඔහු දුක්වුණි "ඒත් ඒක වැඩ කරේ නෑ. මම හැදුවේ එයාව ඌරෙක් කරන්න, ඒත් අඩුවක් නෑ. එයා කොහොමත් ඌරෙක් වගේනේ. "

ඔහු ඔහුගේ පඳුරුවැනි ඇහිබැම යටින් හැරී දිහා බැලුවේය.

"ඔයා මේ ගැන හොග්වාර්ට්ස් වල ඉන්න කාටවත් කියන්නේ නැත්තන් මම ඔයාට ණයගැතියි." "මම - ආහ් - මට මායාවල් කරන්න තහනම්, හරියටම කිව්වොත්", මට ටිකක් කරන්න ඉඩ දීලා තියෙන්නේ, ඔයාව හොයාගන්නයි ලියුම් භාර දෙන්නයි විතරයි" - මට මේ වැඩේ භාරදෙන්න ලොකුම හේතුවක් ඒක."

"ඇයි ඔයාට මැජික් කරන්න තහනම්?" හැරී ඇසුවේය.

Downloaded from sinhalaebooks.com

"ඔහ්, මේකයි - මම හොග්වර්ට්ස් වල ඉන්නකොට මාව නෙරපළා දැම්මා, ඇත්තම කියනවානම්, මගේ තුන්වෙනි අවුරුද්දේ දී එයාලා මගේ යශ්ටිය කැඩුවා, ඒත් ඩම්බල්ඩෝර් මට ඉන්න ඉඩ දුන්නා. ඩම්බල්ඩෝර් හොඳ මනුස්සයෙක් ".

"ඇයි ඔයාව නෙරපුවේ?"

"ආහ් අපට හොඳටම පරක්කුයි. හෙට දවසේ අපට ගොඩක් වැඩ තියෙනවා" යයි හැග්‍රිඩ් ශබ්දනගා කීවේය. "හෙට නගරයට යන්න ඕනේ, ඔක්කොම පොත් එහෙම ගන්න ඕනේ."

ඔහු ඔහුගේ ඝන කළු පැහැති කෝට් එක ඉවත් කොට හැරි වෙත විසි කළේය.

"ඔයාට ඕක ඇතුලේ ඉන්න පුළුවන්," ඔහු පැවසීය. "ටිකක් හෙළවුනාට ගනන් ගන්න එපා," මම හිතන්නේ ඒකේ සාක්කුවක පොඩි මීයෝ වගයක් ඉන්නවා."

පස්වෙනි පරිච්ඡේදය

ඩයගන් ඇලී

හැරී පසුදා උදේම අවදි විය. ඉරළුළිය වැටී ඇති බව කිවහැකි උනත් ඔහු ඇස් තදින් පියා ගෙන සිටියේය.

"ඒක හීනයක්", ඔහු තමාට තදින් කියාගත්තේය. "මම හීනෙන් දැක්කා හැග්‍රිඩ් කියලා යෝදයෙක් ඇවිත් මට කිව්වා මම මායාකාරයෙක්, මම මායා ඉස්කෝලේකට යනවා කියලා. මම ඇස් ඇරියොත් ගෙදර මගේ කබඩ් එකේ ඇහැරෙයි."

එක් වරම හයියෙන් තට්ටුකරන ශබ්දයක් ඇසිණි.

පෙටූනිය නැන්දා දොරට ගහන සද්දේ, හැරී සිතුවේය. ඔහුට දුක සිතිණි. ඒත් ඔහු තවමත් ඇස් ඇරියේ නැත. ඒ හීනය බොහෝ සුන්දර හීනයක් විය.

ටක්. ටක්. ටක්

"හරි හරි" හැරී කෙදිරුවේය, "මම නැගිටිනවා."

Downloaded from sinhalaebooks.com

ඔහු සිටගනිද්දී හැග්‍රිඩ්ගේ බරැති කබාය බිමට වැටුණි. පැල්පත හිරු එළියෙන් පිරී තිබුනු අතර කුණාටුව අවසන් වී තිබිණි. කඩා වැටුණු සෝෆාව මත හැග්‍රිඩ් නිදා සිටියේය. බකමූණෙක් තම නියපොතු වලින් ජනේලයට තට්ටු කරමින් සිටියේය, ඌ තම හොටෙන් පුවත්පතක් රදවාගෙන සිටියේය.

හැරී වහා සිටගත්තේ සතුටින් පිරුණේය. තම සිරුර තුල බැලූමක් පිම්බෙන්නාක් මෙන් ඔහුට දැනුනි. ඔහු වහා ජනේලය වෙත ගොස් එය විවෘත කළේය. බකමූණා වහා ඇතුළට පියඹා ගොස් නිදා සිටි හැග්‍රිඩ් මත පත්තරය අත හැරියත් ඔහු අවදි වූයේ නැත. බකමූණා ඉන්පසු බිම වසා ඔහුගේ කබායට කෙටීමට පටන් ගත්තේය.

"එහෙම කරන්න එපා."

හැරී බකමූණාව එළවීමට උත්සාහ කළත් ඌ උගේ හොට එකට ගසා හැරීවෙත ශබ්ද කර නැවතත් කබායට පහර දීමට පටන් ගත්තේය.

"හැග්‍රිඩ්!" හැරී ශබ්ද නගා කතා කළේය. "මෙන්න බකමූණෙක්"

"ඌට ගෙවන්න," හැග්‍රිඩ් සෝෆාවේ අනෙක්පස හැරුණේය.

"මොකක්?"

"ඌට පත්තරේ ගෙනාවට ගෙවන්න ඕනේ,' . සාක්කුවල බලන්න." හැග්‍රිඩ්ගේ කබාය සාක්කු වලින්ම තැනුවක් මෙන් විය - යතුරු කැරළි කීපයක්, ගොලුබෙලි රාක්ක, නූල් බෝල, පෙපර්මින්ට් කුරුම්ණියන්, තේ පැකට්... අන්තිමේ, හැරී අමුතු විදිහේ කාසි තොගයක් එළියට ඇද ගත්තේය.

"එයාට ක්නට්ස් පහක් දෙන්න," හැග්‍රිඩ් නිදිමතේ කීය.

"ක්නට්ස්?"

"පොඩි තඹ පාට ඒවා."

හැරී කුඩා තඹ පැහැ කාසි පහක් ගණන් කළේය, බකමූණා කකුල දිගු කළේය. එහි බැද තිබූ කුඩා පසුම්බියට හැරී කාසි පහ දැම්මේය. ඌ ඉන්පසු විවෘතව තිබූ ජනේලයෙන් පියඹා ගියේය.

Downloaded from sinhalaebooks.com

හැග්‍රිඩ් මහ හයියෙන් ඈනුමක් ඇරියේය, අවදි වී අත පය දිග හැරියේය.

"හොදයි හැරී, අද ගොඩක් දේවල් කරන්න තියනවා, ලන්ඩන් වලට ගිහින් ඔයාට ඉස්කෝලෙට ඕනේ ඔක්කොම දේවල් ගන්න ඕනේ."

හැරී මායා කාසි ඒ මේ අත හරවමින් ඒවා දෙස බළමින් සිටියේය. එක්වරම ඔහුගේ සිතට ආ අදහසක් ඔහු තුල පිරී තිබූ සතුට නැති කරන්නට විය .

"අම් - හැග්‍රිඩ්?"

"මම්?" , හැග්‍රිඩ් තම විශාල බූට්ස් අදිමින් ඇසීය

"මගේ ලග සල්ලි නැහැ - ඔයාට මතකනේ ඊයේ රෑ වර්නන් මාමා කියපු දේ... එයා මට මැජික් ඉගෙන ගන්න වියදම් කරන්නේ නෑ."

"ඒ ගැන දුක් වෙන්න එපා," හැග්‍රිඩ් කීය, ඔහු සිටගෙන තම හිස කැරකුවේය. "ඔයා හිතන්නේ ඔයාගේ දෙමාපියෝ ඔයාට මොනවත් ඉතුරු කළේ නෑ කියලද?"

"ඒත් එයාලගේ ගෙදර විනාශ වුනා නම් - - "

"එයාලා තමන්ගේ රත්තරන් ගෙදර තියාගත්තේ නෑ, කොල්ලෝ! නෑ, අපේ පළවෙනි නැවතුම ග්‍රින්ගොට්ස්. මායාකරුවන්ගේ බැංකුව. සොසේජස් එකක් කන්න, ඒවා හොදටම සීතල වෙලා නෑ- තව ඔයාගේ බර්ත්ඩේ කේක් කැල්ලක් දුන්නොත් මම එපා කියන්නෙත් නෑ."

"මායාකාරයින්ට බැංකුත් තියනවාද?"

"එකයි තියෙන්නේ. ඒකේ නම ග්‍රින්ගොට්ස්. කුරුමිට්ටෝ තමයි ඒකේ වැඩ කරන්නේ."

හැරීගේ අතේ තිබුනු සොසේජස් කැල්ල අතහැරුනේය.

"කුරුමිට්ටෝ?"

Downloaded from sinhalaebooks.com

"ඔව් - ඒක මංකොල්ල කන්න හිතන්න නම් පිස්සෙක්ම වෙන්න ඕනේ, මම ඔයාට එකක් කියන්නම්. කුරුමිට්ටෝ එක්ක නම් පැටලෙන්න එපා හැරී. ග්‍රින්ගොට්ස් කියන්නේ ඕනෙම දෙයක් තියන්න පුළුවන් ආරක්ෂිතම තැන - සමහර විට හොග්වාර්ට්ස් ඇරුනම එතන තමයි. ඒ කොහොම උනත් මම ඩම්බල්ඩෝර් වෙනුවෙන් ග්‍රින්ගොට්ස් යන්න ඕනේ. හොග්වාර්ට්ස් වල වැඩකට." හැග්‍රිඩ් ආඩම්බර වෙමින් කීය. "එයා සාමාන්‍යයෙන් ගොඩක් වැදගත් වැඩ දෙන්නේ මට තමයි. ඔයාව ගන්න එක, ග්‍රින්ගොට්ස් වලින් දෙයක් ගන්න එක- එයා දන්නවා මාව විශ්වාස කරන්න පුළුවන් කියලා."

"ඔක්කොම ගත්තද'? හරි එහෙනම්, යමු."

හැරී හැග්‍රිඩ් පිටුපසින් පැල්පතෙන් එලියේ පර්වතය වෙත ගියේය. අහස බොහෝ පැහැදිලි වූ අතර මුහුද හිරුරැසින් බැබලුනේය. වර්නන් මාමා කුළියට ගත් බෝට්ටුව තවමත් එහි තිබූ අතර එහි අඩියේ වතුර පිරී තිබිණ .

"ඔයා කොහොමද මෙහෙට ආවේ?" තව බෝට්ටුවක් සොයා වටපිට බළමින් හැරී ඇසීය. "පියාඹලා," හැග්‍රිඩ් කීය.

"පියාඹලා?"

"ඔව් - ඒත් අපි මේකේ යමු. දැන් ඔයාව ගත්ත නිසා මට මැජික් කරන්න තහනම්."

දෙදෙනාම බෝට්ටුවේ වාඩි විය, හැරී තවමත් හැග්‍රිඩ් දෙස බලාගෙන ඔහු පියාඹන අයුරු මවාගැනීමට උත්සාහ කළේය.

"මෙහෙම පහුරු ගාන එකනම් හරි ලැජ්ජාවක් වගේ," හැරී දෙස හොරැහින් බළමින් හැග්‍රිඩ් කීය. "මට ටිකක් - ටිකක් වේගේ වැඩි කරන්න පුළුවන්. ඔයාට හොග්වාර්ට්ස් වලදි ඒ ගැන මොකුත් නොකියා ඉන්න පුළුවන්ද?"

"ඇත්තටම මම කියන්නේ නෑ ," තව මායාවක් බැලීමේ නොයිවසිල්ලෙන් හැරී කීවේය. හැග්‍රිඩ් නැවතත් ඔහුගේ රෝසපාට කුඩය එළියට ගෙන, දෙපාරක් ඉන් බෝට්ටු බඳට තට්ටු කළෙන්, ඔවුන් වේගයෙන් ගොඩබිම දෙසට ඇදීයන්නට විය.

"ඇයි ග්‍රින්ගොට්ස් කොල්ලකන්න නම් පිස්සෙක් වෙන්න ඕනේ කිව්වේ?" හැරී ඇසීය.

"බන්ධන සහ මායාවන්," පත්තරය දිගහරින ගමන් හැග්‍රිඩ් කීය. "එයාලා කියනවා එහේ අධි ආරක්ෂිත සේප්පු රකින්න මකරෙක් ඉන්නවාලු. අනික ආපහු එන්න පාර හොයාගන්නත් ඕනේ - දන්නවාද ග්‍රින්ගොට්ස් ලන්ඩන්

Downloaded from sinhalaebooks.com

වලට යටින් හැතප්ම සියගානක් දුරට තියනවා. පොළොවට ගොඩාක් ඇතුලින් විහිදිලා තියෙන්නේ. මොනාහරි දෙයක් හොරකම් කළත් ආපහු පාර හොයාගෙන එන්න කළින් බඩගින්නේම මැරෙයි."

හැග්‍රිඩ් "දිනපතා දිවැසිය" පත්තරය කියවන අතරේ හැරී ඒ ගැන තවත් කල්පනා කළේය. වර්නන් මාමාගෙන් හැරී ඉගෙන ගත් දෙයක් වූයේ කල්පනා කරන අය තනියම සිටීමට කැමති බවයි. ඒත් හැරීට එය ඉතා අපහසු විය. මේ තරම් ප්‍රශ්න තොගයක් ඔහුගේ සිතේ කවදාවත් නොතිබිණි.

"මැජික් අමාත්‍යාංශය හැමදාම මොකක් හරි අවුල් කරනවා," පිටුවක් පෙරලන අතරේ හැග්‍රිඩ් කෙඳිරීය.

"මැජික් වලටත් අමාත්‍යාංශයක් තියනවාද?" තමන්ව නවතාගත නොහැකිව හැරී ඇසීය.

"අපොයි ඔව්," හැග්‍රිඩ් කීවේය. "එයාලාට ඇත්තටම ඕනේ උනා ඩම්බල්ඩෝර්ව ඒකේ ඇමති කරන්න, ඒත් එයා කවදාවත් හොග්වාර්ට්ස් දාලා යන්නේ නෑ, ඉතින් වයසක කොනෝලියස් ෆජ්ට ඒ රස්සාව හම්බුනා. ඉතිං එයා හැමදාම ඩම්බල්ඩෝර්ගෙන් උපදෙස් ඉල්ලලා බකමූණෝ එවනවා."

"ඒත් මැජික් අමාත්‍යාංශයක් මොනාද කරන්නේ?"

"ඇත්තටම එයාලාගේ ප්‍රධානම වැඩේ මේ ලෝකේ මායාකාරයෝ මායාකාරියෝ ඉන්නවා කියන එක මගල් ලාගෙන් හංගන එක."

"ඇයි?"

"ඇයි? අපොයි, හැරී, හැමෝටම එයාලාගේ ප්‍රශ්නවලට මායාවලින් උත්තර ඕනේ වෙයි. නෑ නෑ, අපි වෙනම ඉන්න එක තමයි හොඳම."

ඒ මොහොතේදීම බෝට්ටුව වරායට පැමිණ බැම්මේ සෙමින් වැදුනේය. හැග්‍රිඩ් තම පුවත්පත හකුළාගත්තේය. දෙදෙනාම ගල් ඇතිරූ අඩිපාර දිගේ පැමිණ මහපාරට සේන්දු වූහ.

ඔවුන් දෙදෙනා පාර දිගේ නැවතුම්පලට එන අතරේ මග යන සියලුදෙනා නැවතී හැග්‍රිඩ් දෙස බලා ඉන්නට විය. හැරී සිතුවේ ඒ ගැන කාටවත් වරදක් කිව නොහැකි බවයි. ඔහු අනෙක් ඕනෑම කෙනෙකුට වඩා දෙගුණයක් උස වූවා පමණක් නොව, නැවතුම්පල මීටර් වැනි සම්පූර්නයෙන්ම සාමාන්‍ය දේවල් පෙන්නමින් සද්දෙන් කියෙව්වේය. "අරක දැක්කද හැරී? මගල් ලා හීනමවන දේවල්. හෙහ්"

Downloaded from sinhalaebooks.com

"හැග්‍රිඩ්," එකටම යාමට සෙමින් දුවමින් හතිදමන අතරේ හැරී කතා කළේය, "ඔයා කිව්වද ග්‍රින්ගොට්ස් වල මකරු ඉන්නවා කියලා?"

"ඔව්, එහෙම තමයි එයාලා කියන්නේ" හැග්‍රිඩ් පැවසීය "ශෙහ්, මම කැමති මකරෙකුට."

"ඔයා කැමති එකෙකුට?"

"මම ළමයෙක් කාලේ ඉඳලාම මට එකෙක් ඕනේ උනා - ඔන්න අපි ආවා."

ඔවුන් නැවතුම්පළට පැමින තිබිණි. ලන්ඩන් වලට තව විනාඩි පහකින් දුම්රියක් යාමට නියමිතය. හැග්‍රිඩ් කියන විදිහට ඔහුට "මගල් සල්ලි" ගැන තේරෙන්නේ නැති නිසා ඔහු ටිකට් ගැනීමට නෝට්ටු ටික හැරීට දුන්නේය.

කෝච්චියේදී මිනිසුන් පෙරටත් වඩා ඔහු දෙස බලාසිටින්නට විය. හැග්‍රිඩ් ආසන දෙකක් අල්ලාගෙන වාඩි වී කැනරි - කහ පැහැ සර්කස් ටෙන්ට් රෙද්දක් වැන්නක් ගොතන්නට පටන් ගත්තේය.

"තාම ඔයාගේ ලියුම තියනවද හැරී?" ඔහු ගොතන අතරේ ඇසුවේය. හැරී පාච්මන්ට් ලියුම් කවරය තම සාක්කුවෙන් එළියට ගත්තේය.

"හොදයි," හැග්‍රිඩ් කීය. "ඔතන ඔයාට ඕනේ කරන හැමදේකම ලැයිස්තුවක් ඇති."

හැරී කළින් රාත්‍රියේ නොදුටු දෙවැනි කොළයක් දිග හැරියේය:

මායාකරුවන්ගේ සහ මායාකාරියන්ගේ හොග්වාර්ට්ස් පාසල

නිළ ඇඳුම්

පළමු අවුරුද්දේ සිසුන්ට අවශ්‍ය දෑ

1. තනිපැහැ වැඩ කබා කට්ටල තුනක් (කළු)

2. දහවල් ඇඳීමට තනිපැහැ උල් තොප්පියක් (කළු)

Downloaded from sinhalaebooks.com

3. ආරක්ෂිත අත්වැසුම් කට්ටලයක් (මකරවැස්ම හෝ ඊට සමාන)

4. එක් හිම කබායක් (කළු, රිදී නිමාවෙන් යුත්)

සියළුම සිසුන්ගේ ඇඳුම්වල නමගසා තිබිය යුතු බව කරුණාවෙන් සළකන්න.

පාඨමාලා පොත්

1.) සියළුම සිසුන්ට පහත ලැයිස්තුවේ ඇති පොත් වලින් එක බැගින් තිබිය යුතුය:

2.) සම්මත මන්තර පොත (එක වසර) - මිරැන්ඩා ගොශාව්ක්

3.) මායා ඉතිහාසය - බැතිල්ඩා බැග්ශොට්

4.) මායාමය සිද්ධාන්ත - ඇඩල්බර්ට් වැෆ්ලින්ග්

5.) රූපාන්තරණය සඳහා ආරම්භකයන්ට උපදෙස් - එමෙරික් ස්විච්

6.) මායා බෙහෙත් පැළෑටි සහ පුස් වර්ග දහසක් - ෆයිල්ලිඩා ස්පෝර්

7.) මායා කෙටුම්පත් සහ ඖෂධ සංයෝජන - ආර්සේනියස් ජිග්ගර්

8.) උත්කෘශ්ඨ මෘගයින් සහ ඔවුන් සොයන්නේ කොහේද - නිවෙට් ස්කැමැන්ඩර්

9.) අඳුරු බළවේග: ස්වඅරක්ශක උපදෙස් -ක්වෙන්ටින් ට්‍රිම්බල්

අනෙකුත් උපකරණ

යශ්ටිය, කල්දේරම (වානේ, සම්මත ප්‍රමානය 2) කට්ටලයක්

වීදුරු හෝ පුළිඟු කුප්පි

දුරදක්නා කට්ටලයක්

පිත්තල තරාදි

සිසුන්ට බකමූණෙක් හෝ පූසෙක් හෝ ගෙයිගෙම්බෙක් රැගෙන ආ හැක.

පළමු වසර සිසුන්ට පියාඹන කොසු තහනම් බව දෙමාපියන්ට දැනුම් දෙන්නෙමු.

Downloaded from sinhalaebooks.com

"අපිට මේ ඔක්කොම ලන්ඩන් වලින් ගන්න පුළුවන්ද?" හැරී මහත් පුදුමයට පත්විය.

"ඔයා යන්න ඕනෙ කොහෙටද කියලා දන්නවානම් පුළුවන්," හැග්‍රිඩ් කීවේය.

හැරී මින්පෙර කවදාවත් ලන්ඩන් ගොස් තිබුනේ නැත. හැග්‍රිඩ් යන්නේ කොහෙද යන්න දන්නා බව පෙනුනත්, ඔහු අනිවාර්යයෙන් සාමාන්‍යය පරිදි එහි යාමට පුරුදු වී සිටියේ නැත. ඔහු පොළොව යට ටිකට් දෙන තැනදී හිරවුන අතර, කෝච්චිය ඉතා සෙමින් යනබව සහ එහි ආසන ඉතා කුඩා බව කියමින් ශබ්ද නගා මැසිවිලි කියන්නට විය.

"අනේ මන්දා මේ මගල්ලා කොහොම මැජික් නැතුව මේවා කරගන්නවාද කියලා," ඔවුන් කඩ සාප්පු වලින් පිරුනු පාරක් වෙත කැඩුනු විදුලි සෝපානයකින් ඉහළට යන අතරේ ඔහු කීය.

හැග්‍රිඩ් ඉතා විශාල වූයෙන් ඔහු පහසුවෙන් මිනිසුන් එහාට මෙහාට කළේය; හැරීට කරන්නට තිබුනේ ඔහුගේ ළඟින්ම ඔහුට පිටුපසින් ගමන් කිරීම පමණි. ඔවුන් පොත් කඩ සහ සංගීත සාප්පු පසු කළෝය, තව හැම්බර්ගර් කඩ සහ සිනමාහල් පසුකළෝය. ඒත් ඒ කිසිම තැනක් මායා යෂ්ටි විකුනන බවක් පෙනෙන්නට තිබුනේ නැත. මෙය සම්පූර්නයෙන්ම සාමාන්‍ය මිනිසුන්ගෙන් පිරිගිය සාමාන්‍ය මාවතක් විය. ඇත්තටම මෙහි සැතපුම් ගනනක් පොළොව යට රත්තරන් කඳු ගොඩගසා ඇත්ද? ඇත්තටම මන්තර පොත් සහ මායා කොසු විකුණන සාප්පු තිබේද? මේ සියල්ල ඩර්ස්ලිලා විසින් අටවපු මහා විහිලුවක් විය හැකිද? ඩර්ස්ලිලාට කිසිම සංවේදි හැඟීමක් නැතිබව හැරී දැන සිටියේ නැත්නම්, එසේද සිතන්නට ඉඩ ත්බිණි; ඒ කොහොම උනත් , හැග්‍රිඩ් මේ වෙනතෙක් කියූ සියල්ල විශ්වාස කළ නොහැකි උනත්, හැරීට ඔහු විශ්වාස කරනවා හැර වෙන මගක් නොවීය.

"මේක තමයි තැන," හැග්‍රිඩ් එක් තැනක නැවතී කීවේය, "කාන්දුවන කල්දේරම. ඒක ගොඩක් ප්‍රසිද්ධ තැනක්."

එය ඉතා කුඩා අපිරිසිදු තැබෑරුමක් විය. හැග්‍රිඩ් ඇඟිල්ල දිගුකර පෙන්වූයේ නැත්නම් හැරී එය දකින්නේ නැත, හැරී එය එහි තිබෙනු දැක්කේම නැත. වේගයෙන් ඇවිදින මිනිසුන් ඒ දිහා බැලුවේවත් නැත. එක්පසෙක ඇති විශාල පොත් කඩයෙන් අනික් පස ඇති සංගීත තැටි කඩයට ඔවුන්ගේ ඇස් ලිස්සා ගියේ ඒ අතර පිහිටි "කාන්දුවන කල්දේරම" කොහොමටවත් නොපෙනෙන ලෙසය. කොහොම උනත්, හැරීට සුවිශේෂ ලෙස දැනුනේ එය පෙනෙන්නේ හැරීට සහ හැග්‍රිඩ්ට පමණක් බවයි. ඔහු ඒ ගැන යමක් කීමට පෙර හැග්‍රිඩ් ඔහුව ඇතුළට රැගෙන ආවේය.

ප්‍රසිද්ධ තැනක් වුවත්, එය ඉතා අඳුරු සහ අපිළිවෙල විය. ඉතා කුඩා වීදුරුවල ශෙරී බොමින් මහලු කාන්තාවන් කිහිපදෙනෙක් මුල්ලක සිටිති. ඉන් එක් අයෙක් දිගු පයිප්පයක් උරමින් සිටී. උස් තෝපියක් පැළඳි කුඩා මිනිසෙක් මදක් තට්ටය ඇති දත් වැටුනු වොල්නට් ගෙඩියක පෙනුම ඇති තැබෑරුම්කරු සමග කතා කරමින් සිටී. සිහින් හඩින් වූ කතාබහ ඔවුන් ඇතුල් වීමත් සමග නතර විය. සියල්ලෝම හැග්‍රිඩ් හඳුනන බව පෙනෙන්නට විය; ඔවුන් ඔහුට අතවනන්නටත් ඔහු සමග සිනාසීමටත් විය, තැබෑරුම්කරු වීදුරුවක් අතට ගත්තේ , "වෙනදා ඒවාමද, හැග්‍රිඩ්?" යැයි ඇසීය.

Downloaded from sinhalaebooks.com

"බෑ, ටොම්, මම මේ හොග්වාර්ට්ස් වල වැඩක ඉන්න ගමන්," කියමින් හැග්‍රිඩ් හැරීගේ උරහිසට ඔහුගේ අති විශාල අතින් තට්ටු කලෙන් හැරී දණහිස් වලින් නැමුනේය.

"අනේ දෙයියනේ," තැබෑරුම්කරු ඉතාහොඳින් හැරී දෙස බළමින් කීය, "මේ ඉන්නේ - එක වෙන්න පුළුවන්ද --?"

"කාන්දුවන කල්දේරම" හදිසියේම නිහඬ සහ නිශ්චල විය

"දෙයියොම බලාගන්න," තැබෑරුම්කරු කෙඳිරුවේය, "හැරී පෝටර්... මොනතරම් ගෞරවයක්ද."

ඔහු වහා එළියට පැමිණ, හැරී වෙත දිව ආවේ කඳුළු පිරි දෙනෙතින් යුතුව ඔහුගේ අත අල්ලාගත්තේය.

"සාදරයෙන් පිළිගන්නවා, පොටර් මහත්මයා, ඔබව සාදරයෙන් පිළිගන්නවා"

කුමක් කිවයුතුදැයි හැරී දැන සිටියේ නැත. සැවොම ඔහුදෙස බලා සිටියි. දිගු පයිප්පය උරන මහලු කාන්තාව පයිප්පය නිවී ඇති බව නොදැනම තවමත් එය උරයි.. හැග්‍රිඩ් සිනාසෙමින් සිටියේය.

ඊලග මොහොතේ හැම පැත්තෙන්ම පුටු එහෙ මෙහෙ අදිනු ඇසිණි, හැරී කාන්දුවන කල්දේරමේ සියලුදෙනා සමග අතට අත දෙනු දක්නට ලැබිණි.

"ඩොරිස් ක්‍රොක්ෆෝඩ්, පොටර් මහත්මයා හිතාගන්න බෑ අන්තිමේදි අපි මුණගැහුනා කියලා."

"හරි ආඩම්බරයි, පොටර් මහත්මයා, මට නම් හරිම ආඩම්බරයි."

"හැමවෙලේම ඕනේ උනේ ඔබතුමාට අතට අත දෙන්න - මට විශ්වාස කරන්නත් බෑ."

"හරි සතුටුයි, මිස්ටර් පොටර්, ඔයාට කියන්න බැරි තරම්, මගේ නම් ඩිග්ගල්, ඩෙඩලස් ඩිග්ගල්."

"මම ඔයාව දැකලා තියනවා!" ඩෙඩලස් ඩිග්ගල්ස්ගේ උස් තොප්පිය ඔහුගේ වැඩි උදයෝගය නිසාම බිම වැටෙද්දී හැරී කීය. "ඔයා දවසක් මට කඩේකදි ඔලුව නවලා ආචාර කළා."

Downloaded from sinhalaebooks.com

"එයාට මතකයි!" වටපිටේ සියල්ලන් දෙසම බළමින් ඩෙඩලස් ඩිග්ගල්ස් කෑගැසුවේය. "ඔයාලට ඇහුනද? එයාට මාව මතකයි!" හැරී නැවත නැවතත් ඔවුන්ට අතට අත දුන්නේය -ඩොරිස් ක්‍රොක්ෆෝඩ් නැවත නැවතත් ආවාය.

සුදුමැලි තරුණයෙක් සෙනග අතරින් ඉදිරියට ආවේය, ඔහු කොතරම් කළබල වී සිටියාද කියතොත් ඔහුගේ එක් ඇසක් නැටුවේය

"ප්‍රොෆෙසර් කුරල්" හැග්‍රිඩ් කීය. "හැරී ප්‍රොෆෙසර් කුරල් හොග්වාර්ට්ස් වල ඔයාගේ එක ගුරුවරයෙක් වෙනවා."

"පො-පො-පොටර්," හැරීගේ අත අල්ලගන්න අතරේ ප්‍රොෆෙසර් කරල් ගොත ගැසුවේය, "ඔ-ඔයාව ද-දකින්න කොච්චර ස-සතුටුද කියලා කි-කියාගන්න බෑ."

"ඔයා මොනවගේ මායාවල්ද උගන්වන්නේ ප්‍රොෆෙසර් කුරල්?"

"අ-අඳුරු මා-මායවන්ට එරෙහි ආ-ආත්මාරක්ශාවන්," ඒ ගැන සිතන්නටවත් අකමැති බව පෙන්නමින් ඔහු මිමිනුවේය. "ඔයාටත් ඒක ඕනේ නැත්තේ නෑ, නේ, පො-පො-පොටර්?" ඔහු අපහසුතාවයෙන් මෙන් සිනාසුනේය. "මම හිතන්නේ, ඔයාට ඕනේ පොත් ඔ-ඔක්කොම හම්බවෙයි. මට වැම්පයර්ලා ගැන පොතක් ගන්න තියනවා, ම-මටම." ඒ අදහස ගැන ඔහු බය වූවාක් මෙන් පෙණිනි.

නමුත් ප්‍රොෆෙසර් කුරල්ට හැරීව දීමට අනිත් පිරිස කැමති වූයේ නැත. සියළුදෙනාගෙන් ගැළවීමට තවත් විනාඩි දහයක් පමණ ගත විය. අවසානයේ සියළු ගෝසාවල් මැඩ හැග්‍රිඩ්ගේ කටහඩ ඇසෙන්නට විය..

"දැන් අපි යන්න ඕනේ - ගොඩක් දේවල් ගන්න තියනවා. ඉක්මන් කරන්න, හැරී."

ඩොරිස් ක්‍රොක්ෆෝඩ් අවසන් වතාවටත් හැරීට අත දුන්නාය, හැග්‍රිඩ් හැරී සමග තැබෑරුමෙන් ඉවත ඉන් පිටත තිබූ කුඩා, බිත්ති වලින් වටවූ පිළිකන්නකට ආවේය. එහි විශාල කසල බඳුනක් සහ තණකොළ ටිකක් හැරෙන්නට කිසිවක් නොවීය.

හැග්‍රිඩ් හැරී වෙත පුළුල් හිනාවක් පෑවේය.

"ඔයාට මම කිව්වානේ, නේද?? මම කිව්වේ ඔයා ප්‍රසිද්ධයි කියලා . ප්‍රොෆෙසර් කුරල් පවා ගැස්සුනා ඔයාව දැකලා, හැබැයි ඉතිං එයා කොයිවෙලෙත් ගැස්සෙනවා'."

Downloaded from sinhalaebooks.com

"එයා හැමවෙලේම ඒ තරම් නොසන්සුන්ද?"

"අපොයි ඔව්. අසරණයා. මාර මොළයක්. එයා පොත්වලින් ඉගෙනගන්න කාළේ හොඳට හිටියා. පස්සේ අවුරුද්දක් නිවාඩු අරන් ගියා අත්දැකීම් ගන්න ඕනේ කියලා. සමහරු කියනවා එයාට අඳුරු වනාන්තරේදී වැම්පයර්ස්ලා මුණගැහෙන්න ඇති කියලා, එහෙම නැත්තන් වයසක ගෑනියෙක්ගෙන් කරදර වෙන්න ඇතිලු. කොහොම උනත් ඊට පස්සේ එයා කවදාවත් හිටපු විදිහට වෙනස් උනේ නෑ. ළමයින්ට බයවෙනවා, තමන්ගෙම විශයටත් දැන් බයයි. හ්ම්, කෝ මගේ කුඩේ?"

වැම්පයර්? වයසක ගෑනු? හැරීගේ ඔලුව විකාර වන්නට විය. ඒ අතරේ හැග්‍රිඩ් කුණු බාල්දියට ඉහළින් බිත්තියේ ගඩොල් ගණින්නට විය.

"තුනක් උඩට... දෙකක් හරහට" මිමිණීය. "හරි, පස්සට වෙන්න හැරී."

ඔහු කුඩයේ කෙළවරින් තුන් පාරක් තට්ටු කළේය.

ඔහු තට්ටු කළ ගඩොල් කැරකෙන්නට සහ ඇත්වෙන්නට විය. මැදින් කුඩා විවරයක් මතු වන්නට විය. එය ටිකෙන් ටික පළල් විය - එක් තත්පරයකට පසු ඔවුන් මුහුණ දී සිටියේ හැග්‍රිඩ්ට පවා යා හැකි ප්‍රමාණයේ ආරුක්කු හැඩැති පිවිසුමකටය. ඉන් යා යුතුව තිබුනේ කළබලකාරී දගර ගැසී නොපෙනී යනතෙක් ඈතට දිවෙන මාවතකටයි.

"ඔයාව ඩයගන් ඇලී වෙත සාදරයෙන් පිළිගන්නවා," හැග්‍රිඩ් කීවේය.

හැරීගේ පුදුමයෙන් පිරුනු මුහුණ දැක හැග්‍රිඩ් පුළුල් සිනාවක් පෑවේය. ඔවුන් ආරුක්කු පිවිසුම හරහා ඊට ඇතුල් වූවෝය. හැරී වහා උරහිසට උඩින් පිටුපස බැලුවෙන් තමා පසුකළ ආරුක්කුව නැවත බිත්තිය බවට පත්වෙනු දුටුවේය.

ළගම පිහිටි කඩයේ එළියෙන් තිබූ කල්දේරම් මතට වැටී හිරුඑළිය බැබළුනේය. සියළුම ප්‍රමාණයන්ගේ කල්දේරම් - තඹ, පිත්තල, වානේ, රිදී - ඉබේ හැදිගාන - හැකිළිය හැකි, ඒවාට ඉහළින් වූ පුවරුවක ලියා තිබිණි.

"ඔව්, ඔයාට එකක් ඕනේ වෙනවා," , "ඒත්, ඊට කළින් ඔයාගේ සල්ලි ගන්න ඕනේ."

තමන්ට තව ඇස් අටක්වත් තිබ්බානම් යැයි හැරීට සිතිණි. ඔවුන් ඉදිරියට ඇවිදගෙන යන අතරේ හැරී සෑම පැත්තකටම හිස කරකවමින් සෑම දෙයක් දෙසම එකවර බැලීමට උත්සාහ කළේය : කඩ සාප්පු, ඒවායේ පිටත තබා තිබූ දේවල්, බඩු මිළදී ගන්නා මිනිසුන්. එක් කුටියක් ළග සිටි තරබාරු කාන්තාවක් හිස සොළවමින් කෑ ගැසුවාය "මකර අක්මා, අවුන්සයක් සිකල් දාහතයිලු, උන්ට පිස්සු ...."

Downloaded from sinhalaebooks.com

පහත් සුමට හූ හඬක් ආ අඳුරු කඩයක "ඊලොප්ස් බකමූණු හල

කිරි පැහැ,

උච්ච තීව්‍ර හඬ,

බාන් වර්ගය,

දුඹුරු සහ හිම සුදු" යයි පුවරුවක් ගසා තිබුනේය. පියාඹන කොසු කඩයක වීදුරු ජනේලයට නහය තදකරගෙන ඇතුල බලන හැරීගේ වයසේම මෙන් වූ පිරිමි ළමයින් කිහිපදෙනක් විය. "මේ බලන්න," ඉන් එක්කෙනෙක් කියනවා හැරීට ඇසුණි, "අළුත්ම නිම්බස් දෙදාහ එක - දැනට තියන වේගවත්ම එක - " එහි කබා විකුණන කඩ, දුරදක්න විකුණන කඩ සහ හැරී කවමදාවත් නොදුටු රිදී උපකරණ විකුණන කඩ විය. සමහර ජනේල අසල වවුල් ප්ලීහාවන් පිරවූ බැරල්, ආඳන්ගේ ඇස් පිරවූ බැරල්, සෙළවෙන මන්තර පොත් කුළුණු, පිහාටු පෑන්, පාච්මන්ට් රෝල්, සංයෝජන බෝතල්, චන්ද්‍ර ගෝල ගොඩ ගසා තිබිණ.

"ග්‍රින්ගොට්ස්," හැග්‍රිඩ් කීවේය.

ඔවුන් අනෙකුත් කඩ සාප්පු වලට වඩා විශාල හිම සුදු පැහැ ගොඩනැගිල්ලක් වෙත පැමිණ සිටියෝය. එහි දීප්තිමත් තඹ දොර අසල රතු සහ රන් පැහැ නිළ ඇඳුමක් ඇද සිටියේ...

"ඔව්, ඒ කුරුමිට්ටෙක්" සුදු ගල් ඇල්ලූ පාර දිගේ ඔහුවෙත යන අතරේ හැග්‍රිඩ් රහසින් කීවේය. කුරුමිට්ටා හැරීට වඩා කොට අයෙක් විය. ඔහුට තලෙළු, බුද්ධිමත් පෙනුමැති මුහුණක්, උල් යටි රැවුලක් සහ හැරී දුටු ආකාරයට ඉතා දිගු ඇඟිලි සහ පතුල් තිබිණි. ඔවුන් එතනින් ඇතුල්වත්ම හේ හිසනමා ආචාර කළේය. ඔවුන් දැන් මුහුණලා සිටියේ තවත් දොරකටයි, මෙවර එය කවියක් කැටයම් කළ රිදී දොරක් විය.

<<<<<

ඇතුල්වන්න, අමුත්තාණෙනි, නමුත් අවධානය යොමු කරන්න

ලෝභකමේ පාපය වෙනුවෙන් කුමක්ද බලා සිටින්නේ

ගන්නා අය වෙනුවෙන්, නමුදු එය හම්බ නොකළ,

තමන්ගේ වාරයේදී කරුණාවෙන් ගෙවිය යුතු වේ.

ඉදින් ඔබ අපේ පොළොවට යටින් සෙවුවහොත්

කවමදාවත් ඔබේ නොවූ වස්තුවක්

චෞරය, නුඹට අනතුරු හැඟවී තිබේ. ප්‍රවේශම්වන්න

එහි වස්තුවට වඩා දේවල් හමු වේවි.

Downloaded from sinhalaebooks.com

>>>>>

"මම කිව්වා වගේ, ඔයා පිස්සෙක් වෙන්න ඕනේ මේකෙන් හොරකම් කරන්න නම්," හැග්‍රිඩ් කීවේය.

ඔවුන් රිදී දොරින් ඇතුල් වී විශාල මාබල් ශාලාවට ඇතුල් වෙද්දී කුරුමිට්ටන් දෙදෙනෙක් ඔවුන්ට හිස නමා ආචාර කළහ. දිගු කවුන්ටර පිටුපස වූ උස් බංකු වල තවත් කුරුමිට්ටන් සියයක් පමණ හිඳගෙන විශාල ගිණුම් පොත් කුරුටුගාමින්, පිත්තල තරාදිවල කාසි කිරමින් ඇස් කාච හරහා මැණික් පරීක්ෂා කරමින් සිටියහ. ශාලාවෙන් පිටතට ගණන් කළ නොහැකි තරම් දොරවල් තිබිණ, තවත් කුරුමිට්ටන් පිරිසක් එවායින් ඇතුළට සහ පිටතට මිනිසුන් කැඳවාගෙන ගියහ. හැග්‍රිඩ් සහ හැරී කවුන්ටරය වෙත පියනැගුහ.

"සුභ උදෑසනක් වේවා," හැග්‍රිඩ් නිදහසේ සිටි කුරුමිට්ටෙකුට කීවේය. "අපි ආවේ හැරී පෝටර් මහතාගේ සේප්පුවෙන් සල්ලි ටිකක් එළියට ගන්න."

"ඔබ ලග එයාගේ යතුර තියනවාද, සර්?"

"ඒක මේ කොහේහරි තිබ්බා," කියූ හැග්‍රිඩ් තම සාක්කු කවුන්ටරය මතට හිස් කරන්නට පටන් ගත්තේය, බලු බිස්කට් අහුරක් ඔහුගේ ගිණුම් පොත මත හැළිණි. කුරුමිට්ටා ඔහුගේ නහය හැකිළුවේය. හැරී තමාගේ දකුණු පැත්තේ සිටි කුරුමිට්ටෙක් දිළිසෙන අගුරු ගොඩක් මෙන් වූ රූබී තොගයක් කිරන දෙස බලා සිටියේය.

"හම්බුනා," හැග්‍රිඩ් අන්තිමේදී ඉතා කුඩා රන් පැහැ යතුරක් සොයා ගත්තේය.

කුරුමිට්ටා එය හොඳින් පරීක්ෂා කළේය.

"ඒක හරි එකක් වගේ."

" මගේ ලග ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝර්ගෙන් ලියුමකුත් තියනවා," ඉතා වැදගත් දෙයක් ලෙස සළකමින් තම පපුවත් ඉදිරියට දමමින් හැග්‍රිඩ් කීවේය. "ඒක මේ ඔයා දන්නවානේ හත්සිය දහතුන සේප්පුවේ තියන එක ගැන"

කුරුමිට්ටා ලියුම ඉතා ප්‍රවේසමින් කියෙව්වේය.

"බොහොම හොඳයි," එය ආපසු හැග්‍රිඩ්ට දෙන ගමන් ඔහු කීය, "මම ඔය දෙන්නා පල්ලෙහා සේප්පු දෙකටම ගෙනියන්න කෙනෙක් දෙන්නම්. ග්‍රිප්හුක්!"

Downloaded from sinhalaebooks.com

ග්‍රිප්හුක් තවත් එක් කුරුමිට්ටෙක් විය. හැග්‍රිඩ් බලු බිස්කට් සියල්ල නැවත සාක්කුවට ඔබාගත් පසු ඔහු හැරී සමග ග්‍රිප්හුක් පසුපස ශාලාවෙන් එළියට යන දොරක් වෙත ගියෝය.

"මොකක්ද හත්සිය දහතුන සේප්පුවේ තියන අරක කිව්වේ" හැරී ඇසීය.

"ඔයාට ඒක කියන්න බෑ," හැග්‍රිඩ් අභිරහස් ලෙස පැවසීය. "ලොකු රහසක්. ඒක හොග්වාර්ට්ස් වැඩක්. ඩම්බල්ඩෝර් මාව විශ්වාස කරනවා. මගේ රස්සවට වඩා ඔයාට ඒක කියන එක නම් වටින්නේ නෑ."

ග්‍රිප්හුක් ඔවුන්ට දොර ඇර එය අල්ලාගෙන සිටියේය. තවත් මාබල් ඇල්ලූ පාරක් බලාපොරොත්තු වූ හැරී පුදුමයට පත්විය. ඔවුන් සිටියේ ගිනි පන්දම් වලින් ආලෝකමත් වූ පටු ගල් කොරිඩෝවකයි.. එහි පහළට තද බෑවුමක් වූ අතර පාරෙහි කුඩා දුම්රිය පාරක් විය. ග්‍රිප්හුක් තදින් සිවුරුහම බෑ අතර කුඩා කරත්තයක් ඔවුන් වෙත පිම්මේ ආවේය. ඔවුන් ඊට ගොඩ වූ පසු - හැග්‍රිඩ්ට නම් එය ඉතා අපහසු විය - ඔවුන් පිටත් වූහ.

මුලින්ම ඔවුන් වංගිරියක් තුල මාවත් වල කැරකෙමින් ගමන් කළහ. හැරී වමට, දකුණට, මැද පාර, වමට, දකුණට ලෙස එය මතකයේ තබාගැනීමට උත්සාහ කළත් එය කළහැක්කක් නොවීය. සෙළවෙන කරත්තය තමන් යන පාර දැන සිටියාක් මෙනි. මන්ද යත් ග්‍රිප්හුක් එය පැදෙව්වේ නැත.

තමන් වටා සීතල සුළඟ වේගයෙන් ඇදී යද්දී හැරීගේ ඇස් ඇදුම්කන්නට විය. නමුත් ඔහු ඒවා හොඳින් විවෘතව තබාගෙන සිටියේය. එක්වරක් ඔහු සිතන ආකාරයට ඔහු එක් කොරිඩෝවක් කෙළවර ගින්නක් දුටු අතර ඒ මකරෙක්දැයි බැලීමට නැවත හැරී බැලීය. නමුත් ඔහු පමාවූවා වැඩි විය, ඔවුන් තවත් ගැඹුරට ඉතා විශාලවට ඉහලින් සහ පහලින් වැඩුණු හිරිටැඹ සහ එල්ලෙන හුණුකේතු වැඩුණු අභයන්තර වැවක් පසුකර පහළට ගියෝය.

"මම කවදාවත් දැනගෙන හිටියේ නෑ," කරත්තයේ සෝෂාව අතරින් හැරී හැග්‍රිඩ් ඇමතීය, "මොකද්ද හිරිටැඹ වලයි එල්ලෙන හුණුකේතු වලයි වෙනස?"

"ම්ම් හිරිටැඹ එල්ලෙන්නේ නැති එක?," "අනික දැන්නම් මගෙන් ප්‍රශ්න අහන්න එපා. මම හිතන්නේ මාව අසනීප වෙන්න යන්නේ."

ඔහු කොළ පැහැ වී සිටියේය, අවසානයේ කොරිඩෝ බිත්තියේ වූ කුඩා දොරක් අසල කරත්තය නතර වූ පසු එළියට ආ හැග්‍රිඩ් තම දණහිස් වෙව්ලීම නවතින තෙක් බිත්තියට හේත්තු වී සිටියේය.

ග්‍රිප්හුක් දොරගුළු ඇරියේය. විශාල කොළපැහැ දුමාරයක් පහළට කඩා වැටුනි. එය පැහැදිලි වෙත්ම හැරී ගැස්සුනේය. එහි රත්තරන් කාසි කඳු ගසා තිබුණි. රිදී කාසි කුළුනු තිබිණ. කුඩා තඹ කාසි ගොඩවල් ගසා තිබිණ..

Downloaded from sinhalaebooks.com

"ඔක්කොම ඔයාගේ," හැග්‍රිඩ් සිනාසුනේය.

සියල්ල හැරීගේ - එය ඇදහිය නොහැකි තරමේ විය.. ඩර්ස්ලි ලා මේ ගැන දැන්සිටියා වන්නට කිසිම ඉඩක් නැත. ඔවුන් දැන සිටියා නම් ඇසිපියගසන නිමේෂයට එය හැරීගෙන් උදුරාගනු ඇත. හැරීව ලග තබාගැනීමට ඔවුන්ට මහත් වියදමක් යනබව කියමින් ඔවුන් නිතර මැසිවිලි නැගූහ. ඒ හැම මොහොතකම ලන්ඩන් වල ඉතා ගැඹුරේ වැළලී ඔහුට අයත් කුඩා වස්තුවක් තිබී ඇත.

එයින් ටිකක් බෑගයකට පුරවාගැනීමට හැරීට හැග්‍රිඩ් උදවු විය.

"රත්තරන් ඒවා ගැලිඔන්ස්," ඔහු පැහැදිලි කළේය. "රිදී සිකල් දාහතක් ගැලිඔන්ස් එකයි, ක්නට්ස් විසිනවයක් සිකල් එකයි. හරි ලේසියි. හරි ඒ ඇති මාස ගානකට. ඉතිරි හරිය අපි සේප්පුවේම තියමු" ඔහු ග්‍රිප්හුක් වෙත හැරුනේය. " දැන් හත්සිය දහතුන සේප්පුව. අනේ අපිට ටිකක් හෙමින් යන්න බැරිද?"

"එක වේගයක් විතරයි තියෙන්නේ"

ඔවුන් වේගය වැඩි කරමින් තව තවත් ගැඹුරට ගමන් කරන්නට වූහ.. ඔවුන් කොන් වලින් හරවමින් ගමන් කරද්දී අවට වාතය තව තවත් ශීතල විය. ඔවුන් හඬ නගමින් සෙළවෙමින් පොළෝ යට දිය කඳුරක් උඩින් ගමන් කළ අතර හැරී පැත්තකට නැවී එහි අඳුරු පතුලේ කුමක් ඇද්දැයි බලන්නට වූයෙන් හැග්‍රිඩ් ගොරවා ඔහුගේ බෙල්ල මුලින් අල්ලා හැරීව නැවත කෙළින් කළේය.

හත්සිය දහතුන සේප්පුවට යතුරු සිදුරක් තිබුනේ නැත.

"පස්සට වෙන්න," වැදගත් දෙයක් මෙන් ග්‍රිප්හුක් කීය. ඔහු සියුම්ව තම දිගු ඇඟිල්ලකින් එයට තට්ටු කළපසු එය පහසුවෙන් දියවී වැක්කෙරුනි.

"ග්‍රින්ගොට්ස් කුරුමිට්ටෙක් හැර වෙන කෙනෙක් ඒක කරානම් දොරහරහා එයාව ඇතුලට ඇදලා අරන් ඇතුලේ හිර වෙනවා," ග්‍රිප්හුක් කීවේය.

"ඇතුලේ කවුරුහරි හිරවෙලා ඉන්නවාද කියලා ඔයාලා කොච්චර කාලෙකට සැරයක්ද පරීක්ශා කරන්නේ?" හැරී ඇසීය.

"අවුරුදු දහයකට සැරයක් වගේ," ඔහු රුදුරු සිනාවක් පාමින් කීය.

Downloaded from sinhalaebooks.com

මෙම අධිආරක්ෂිත සේප්පුවේ යම්කිසි ඉතාවටිනා දෙයක් තිබිය යුතුයැයි හැරීට විශ්වාසයක් තිබේ. ඔහු ඉතා නොයිවසිල්ලෙන් ඉදිරියට නැවී ඒ තුළ බැලුවේ එහි වටිනා ආභරණ වත් තිබේදැයි බැලීමටයි. නමුත් එය හිස් යැයි ඔහු මුළින් සිතුවේය. පසුව පොළොව මත දුඹුරු කඩදාසියක ඔතන ලද අපිරිසිදු කුඩා පාර්සලයක් දක්නට ලැබිණි. හැග්‍රිඩ් එය අහුලාගෙන තම කබායේ පතුලටම ඔබාගත්තේය. හැරීට එය කුමක්දැයි දැනගැනීමට ආශාවක් තිබුනත් ඒ ගැන අසා වැඩක් නැතිබව දැන සිටියේය.

"ඉක්මන් කරන්න, ආපහු මේ අපායේ කරත්තෙට නගින්න. ආපහු යද්දී මට කතාකරන්න එපා. මම මගේ කට වහගෙන හිටියොත් හොඳයි.," හැග්‍රිඩ් කීවේය.

එක් බිහිසුණු කරත්ත ගමනකින් පසු ඔවුන් ග්‍රින්ගොට්ස් වළට පිටතින් ඉරඑළිය යට ඇසිපිල්ලම් ගැසූහ... තමාලඟ මල්ලක් පුරවා සල්ලි ඇති බැවින් මුලින්ම කොහාට දුවන්නේදැයි හැරීට සිතාගත නොහැකි විය. තමා ළඟ වියදම් කිරීමට ගැල්ලිඔන්ස් කීයක් තිබේදැයි දැනගැනීමට ඔහුට උවමනා නොවීය. ඔහු දැනසිටියේ ජීවිතේ කවමදාවත් නොතිබූතරමේ මුදලක්, ඩඩ්ලි ලඟවත් කවමදාවත් නොතිබූ තරමේ මුදලක් තමා අල්ලාගෙන සිටින බව පමණි.

"ඔයාගේ නිලඇඳුම් ගන්නත් ඕනේ," මැඩම් මල්කින්ගේ සියළුම අවස්තා සඳහා කබා කඩය දෙසට හිස සොලවමින් හැග්‍රිඩ් කීවේය. "මේ අහන්න, හැරී, මම වුට්ටක් කාන්දුවෙන කල්දේරමට ගිහින් මොනාහරි පණ එන දෙයක් බීලා ආවොත් ඔයා වැරදියට හිතන්නේ නෑ නේද? මට ග්‍රින්ගොට්ස් කරත්ත පෙන්නන්න බෑ" ඔහුට තවමත් මදක් අසනීප පෙනුමක් තිබුනෙන්, හැරී චකිතයෙන් යුතුව මැඩම් මල්කින්ගේ කඩයට තනිවම ඇතුල් විය.

මැඩම් මල්කින් සිනාවෙන් පිරුනු, අඳුරු දම් පැහැ ඇඳුම් ඇඳි කුඩු මායාකාරියකි.

"හොග්වාර්ට්ස්, හරිනේ?" හැරී කතාකිරීමට සැරසෙත්ම ඈ පැවසුවාය. "මෙතන ඔක්කොම තියනවා, තව පොඩි මහත්තයෙක් ඇතුලේ ඇඳලා බලනවා, ඇත්තටම. "

සාප්පුවේ පිටුපසට වෙන්නට, දිගු සුදුමැලි මුහුණක් ඇති පිරිමි ළමයෙක් බංකුවක් මත හිටගෙන සිටි අතර දෙවන මායාකාරියක් ඔහුගේ දිගු කළු කබායට කටුගසමින් සිටියාය. මැඩම් මල්කින් හැරීව ඔහුගේ අනෙක්පසින් වූ බංකුවේ සිටුවා දිග කබායක් අන්දවා නිවැරදි උසට එනසේ කටු ගසන්නට පටන් ගත්තාය.

"හෙලෝ," පිරිමි ළමයා කීවේය, " ඔයත් හොග්වාර්ට්ස්ද?"

"ඔව්," හැරී කීවේය.

Downloaded from sinhalaebooks.com

"මගේ තාත්තා එහා කඩෙන් මගේ පොත් ගන්නවා, අම්මා මායා යෂ්ටි බලන්න ගියා". ඔහු කීවේය. ඔහුට සෙමින් කතාකරන කම්මැලි කටහඬක් විය. "ඊටපස්සේ මම එයාලව ඇදගෙන යනවා තරඟ වලට පදින කොසු බලන්න. පළවෙනි අවුරුද්දේ ළමයින්ට තමන්ගේම කොස්සක් තියෙන්න බැරි ඇයි කියලා මට හිතාගන්න බෑ. මම හිතාගෙන ඉන්නේ කොහොමහරි තාත්තාට කරදර කරලා එකක් අරන්, කොහොමහරි ඒක හොරෙන් ඇතුලට අරන් යන්න."

හැරීට තදින්ම ඩඩ්ලිව මතකයට ආවේය..

"ඔයාට ඔයාගෙම කොස්සක් තියනවද?" ඔහු දිගටම කතාකරන්නට විය.

"නෑ," හැරී කීවේය.

"කුඩිච් සෙල්ලම් කරන්නෙම නැද්ද?"

"නෑ," කුඩිච් කියන්නේ මොන මගුලක්දැයි සිතමින් හැරී කීවේය.

"මම නම් කරනවා - තාත්තා කියන්නේ මාව නිවාසේ කණ්ඩායමට තෝරගත්තේ නැත්තන් ඒක අපරාධයක් කියලා, මම කියන්නෙත් එහෙමයි. මොන නිවාසෙට යයිද කියලා ඔයා තාම දන්නේ නැද්ද?"

"නෑ," හැම විනාඩියේම මෝඩයෙක් සේ හැඟෙද්දී හැරී පිළිතුරු දුන්නේය.

"ඇත්තටම, ඉතිං කවුරුත් එහෙට යනකන් ඒක දන්නේ නෑනේ, නේද, ඒත් මම දන්නවා මම ස්ලිදරින් වලට යන්නේ, අපේ මුළු පවුලම ඒකේ - හිතන්න හෆල්පෆ් එකට වැටුනොත්, මම හිතන්නේ මම නම් අයින් වෙනවා, නේද?" "ම්ම්ම්," තමාටත් යම් සිත්ගන්නා සුළු දෙයක් කීමට තිබුනානම් යැයි හැරී සිතුවේය.

"මම කියන්නේ, අර මනුස්සයා දිහා බලන්න!" හදිසියේම ඔහු ඉදිරිපස දොර දෙස ගෙල දිගුකර පෙන්වමින් කීවේය. විශාල අයිස් ක්‍රීම් දෙකක් අල්ලාගෙන ඇතුලට ආ නොහැකි බව පෙන්නමින් හැරී වෙත පුළුල් හිනාවක් පාමින් හැග්‍රිඩ් එහි සිටගෙන සිටියේය..

"ඒ හැග්‍රිඩ්," පිරිමි ළමයා නොදැන සිටි යමක් දැන සිටීම ගැන සතුටු වෙමින් හැරී කීවේය. "එයා හොග්වාර්ට්ස් වල වැඩ කරන්නේ."

Downloaded from sinhalaebooks.com

"ඔහ්," පිරිමි ළමයා කීවේය, "මම එයාගැන අහලා තියනවා. එයා වැඩකාරයෙක් වගේ කෙනෙක්, නේද?"

"එයා පිට්ටනි භාරකරු" හැම තප්පරයකම ඔහු ගැන අකමැත්තක් වර්ධනය වෙද්දී හැරී කීවේය.

"ඔව්, හරියටම හරි. මම අහලා තියෙන්නේ එයා නිකන් මිලේච්ඡයෙක් වගේලු - ඉස්කෝලේ වත්තේ පැලක ජීවත්වෙන්නේ, හිටපු ගමන් මත් වෙලා මැජික් කරන්න හදනවාලු, අන්තිමට තමන්ගේ ඇඳත් ගිනිතියලාලු ඉවර වෙන්නේ.

"මම හිතන්නේ එයා විශිෂ්ඨයි," හැරී තරහින් කීය.

"එහෙමද?" සමච්චල් හිනාවක් සහිතව පිරිමි ළමයා  කීවේය. "ඇයි එයා ඔයත් එක්ක ඉන්නේ? ඔයාගේ දෙමාපියෝ කෝ?"

"එයාලා මැරිලා," හැරී කෙටියෙන්ම කීවේය. ඔහුත් සමග ඒ ගැන කතාකිරීමට හැරී කැමති වූයේ නැත.

"ආහ්, කණගාටුයි," කිසිම කණගාටුවක් නොපෙන්වමින් ඔහු කීවේය. "ඒත් එයාලා අපේ වර්ගයේ, එහෙමනේ?"

"එයාලා මායාකාරයෝ, ඔයාට දැනගන්න ඕනේ උනේ ඒකනේ."

"මම ඇත්තටම හිතන්නේ නෑ එයාලා අනිත් අයව ඇතුල් කරගන්න ඕනේ කියලා. ඔයා මොකද හිතන්නේ? එයාලා අපි වගේ නෙවෙයිනේ, එයාලා ලොකු වෙන්නේ අපේ විදිහට නෙවෙයිනේ. හිතන්න,, සමහරු හොග්වාර්ට්ස් ගැන අහලාවත් නෑ ලියුම ලැබෙනකන්. මම හිතන්නේ එයාලා පරණ මායාකාර පවුල් අතරේ විතරක් ඒවා තියාගන්න ඕනේ. ඒක නෙවෙයි, ඔයාගේ වාසගම මොකද්ද?"

නමුත් හැරී උත්තර දීමට පෙර මැඩම් මල්කින් කතා කළාය. "ඔයාගේ ඉවරයි, පැටියෝ," පිරිමි ළමයාගේ කතාව අසා සිටීමට හේතුවක් නොමැති වීම ගැන මදකටවත් දුක් නොවෙමින් හැරී බංකුවෙන් බිමට පැන්නේය. .

"එහෙනම්, මම හිතන්නේ මම ඔයාව හොග්වාර්ට්ස් වලදි හම්බුවෙයි" ඔහු කීය.

හැග්‍රිඩ් ගෙනා අයිස් ක්‍රීම් කන අතරේ හැරී වඩා නිහඬව සිටියේය. (කැපූ කජු යෙදූ චොකලට් සහ රාස්ප්බෙරි).

Downloaded from sinhalaebooks.com

"මොකෝ?" හැග්‍රිඩ් ඇසුවේය.

"මොකුත් නෑ," හැරී බොරු කීවේය. ඔවුන් කඩදාසි සහ පිහාටු පෑන් ගැනීමට නැවතුනහ. ලියන විටදී පාට වෙනස් වෙන තීන්ත බෝතලයක් සොයාගත් හැරී මදක් සතුටු විය. "හැග්‍රිඩ් කුඩිච් කියන්නේ මොකද්ද" ඔවුන් කඩයෙන් එළියට ආ පසු හැරී ඇසුවේය.

"අයියෝ හැරී, මට හැමවෙලේම අමතක වෙනවා ඔයා දන්නේ පොඩ්ඩයි කියලා - කුඩිච් ගැන දන්නෙත් නෑ!"

"මගේ හිත තවත් නරක් කරන්න එපා," හැරී හැග්‍රිඩ්ට මැඩම් මල්කින්ගේ කඩයේ සිටි සුදුමැලි පිරිමි ළමයා ගැන සියල්ල කීවේය.

"අනික එයා කිව්වා මගල් පවුල් වල අයට ඇතුල් වෙන්න දෙන්න නරකයි කියලා."

"ඔයා මගල් පවුලක නෙවෙයි. එයා දන්නවානම් ඔයා කවුද කියලා.. - එයාගේ දෙමාපියෝ මායාකාරයෝ නම් එයා හැදුනේ ඔයාගේ නම දැනගෙන වෙන්න ඕනේ. ඔයා දැක්කානේ කාන්දුවෙන කල්දේරමේ හිටපු හැමෝම කොහොමද හිටියේ කියලා ඔයාව දැක්කාම.. මොනාඋනත්, එයා මොනාද ඒ ගැන දන්නේ, මම දැකපු සමහර හොදම අය මගල් පරම්පරාවකින් තේරුනු එකම කෙනා, බලන්න ඔයාගේ අම්මා! බලන්නකෝ එයාගේ අක්කා විදිහට හම්බවෙලා තිබ්බ කෙනා!"

"ඉතිං කුඩිච් කියන්නේ මොකද්ද?"

"ඒක අපේ ක්‍රීඩාව. මායාවරුන්ගේ ක්‍රීඩාව. ඒක හරියට - හරියට මගල්ලාගේ පාපන්දු ක්‍රීඩාව වගේ - හැමෝම කැමති කුඩිච් වලට - පියාඹන කොසුවල ඉඳලා අහසේ තමයි සෙල්ලම් කරන්නේ. ඒකේ බෝල හතරක් තියනවා - ටිකක් ඒකේ නීති රීතිනම් විස්තර කරන්න මට අමාරුයි."

"එතකොට ස්ලිදරින් සහ හෆල්පෆ් කියන්නේ මොනාද?"

"ඉස්කෝලේ නිවාස. හතරක් තියනවා. හැමෝම කියනවා හෆල්පෆ්ලා ගොඩක්ම මෝඩ අය කියලා, ඒවුනත් - - "

"ඔට්ටුයි මාව හෆල්පෆ් එකට වැටෙයි" මුහුණ අඳුරු කරගෙන හැරී කීවේය.

Downloaded from sinhalaebooks.com

"හෆල්පෆ් ගොඩක් හොඳයි ස්ලිදරින් වෙනවාට වඩා," හැග්‍රිඩ් තදින් කීවේය. "ස්ලිදරින් වල හිටපු මායාකාරයන්ගෙන් හරි මායාකාරියන්ගෙන් එක්කෙනෙක්වත් නරක් නොවී හිටියේ නෑ. නම නොකියන කෙනාත් එක්කෙනෙක්"

"වොල්-, සමාවෙන්න - නම නොකියන කෙනා හොග්වාර්ට්ස් වල හිටියා?"

"අවුරුදු ගණනාවකට කලින්,"

ඔවුන් හැරීගේ පොත් ගත් සමෘද්ධිය සහ අභාග්‍යය පොත් සාප්පුවේ රාක්කවල, පදික මංතීරු ගල් තරමේ විශාල පොත් හම්වලින් ඔතා සිවිලිම තෙක් ගොඩගසා තිබිණි. තව සිල්ක් වලින් එතූ මුද්දරයක් තරමේ පොත්, අමුතු දුර්ලභ සංකේත පිරුණු පොත් සහ කිසිවක්ම නොතිබුනු පොත් කිහිපයක් විය. කිසිම දෙයක් කවදාවත් කියවන්නේ නැති ඩඩ්ලි උවද මෙවැනි පොතක් ලබාගැනීමට ඉතා ආසාකරනු ඇත.. හැග්‍රිඩ්ට හැරීව ප්‍රොෆෙසර් වින්ඩික්ටස් විරිඩියන්ගේ ශාපයන් සහ ප්‍රතිශාපයන් ( ඔබේ මිතුරන් වශීකරගන්න. නවතම වර්ගයේ පළිගැනීම් වලින් සතුරන් පැටලිලිසහගත කරන්න: කොන්ඩය වැටීම, ජෙලි කකුල්, දිව ගැටගැසීම තවත් තවත් දෑ) නම් වූ පොතෙන් ගලවා ගැනීමට ඔහුව ඇදගෙන මෙන් යන්නට සිදුවිය.

" මම ඩඩ්ලිට ශාපයක් කරන්නේ කොහොමද කියලා හොයාගන්න හැදුවේ"

"ඒක හොඳ අදහසක් නෙවෙයි කියලා මම කියන්නේ නෑ, ඒත් ගොඩක් විශේෂ අවස්ථාවකදී අරුනාම ඔයාට මගල් ලෝකෙදි මන්තර පාවිච්චි කරන්න බෑ.," හැග්‍රිඩ් කීවේය "අනික කොහොමත්, ඔයාට කිසිම ශාපයක් වැඩකරවන්න තාම බෑ, ."ඔයා ගොඩාක් ඉගෙනගන්න ඕනේ ඒ මට්ටමට එන්න"

හැග්‍රිඩ් හැරීට තනි රත්තරන් කල්දේරමක් ගැනීමටත් ඉඩ දුන්නේ නැත. (" ඔයාගේ ලැයිස්තුවේ තියෙන්නේ වානේ කියලා") ඒත් ඔවුන් සංයෝජක අමුද්‍රව්‍ය කිරන්නට හුරුබුහුටි තරාදි කට්ටලයකුත් හැකිලිය හැකි පිත්තල දුරදක්නයකුත් ගත්තෝය. ඉන්පසු ඔවුන් ආයුර්වේදයට ගියහ. එය නරක්වූ බිත්තර සහ කුණුවූ ගෝවා මිශ්‍ර ඉතා භයානක ගඳකින් යුක්ත පුදුමාකාර තැනක් විය. සෙවෙල දේවල් පිරවූ බැරල් පොළොවේ සිටුවා තිබිණි.; බෙහෙත් පත්‍ර පිරවූ ජෝගු, වියළි මුල්, තදපැහැ කුඩු වර්ග බිත්තිවල එල්ලා තිබිණි. පිහාටු මිටි, උල්දත් එල්ලූ නූල් සහ වකුටු වූ නියපොතු සිවිලිමේ එල්ලා තිබිණ. හැග්‍රිඩ් කවුන්ටරය පිටුපස සිටි මිනිසාගෙන් හැරී සඳහා සුළු සංයෝජක කිහිපයකට අවශ්‍ය ද්‍රව්‍ය ගැන අසන අතරේ හැරී එකක් ගැලිඔන්ස් විසිඑකක් මිළ වූ රිදී කඟවේනා අං සහ හැන්දක් ක්නට්ස් පහක් වූ ඉතාම කුඩා කළු කුරුමිනි ඇස් පරික්ශා කළේය.

ආයුර්වේදයෙන් එළියට ගොස් හැග්‍රිඩ් නැවතත් හැරීගේ ලැයිස්තුව බැලුවේය.

"ඔයාගේ යශ්ඨිය විතරයි ඉතුරු -අර්.. ම්ම්.. මම තාම ඔයාට උපන්දින තෑග්ගක් ගත්තෙත් නෑ"

Downloaded from sinhalaebooks.com

හැරීට තමන් රතුවෙනු දැනිණ.

"ඔයා ගන්න ඕනේ නෑ - - "

"මම දන්නවා මම ගන්න ඕනේ නෑ කියලා. මම කියන්නද, මම ඔයාට සතෙක් ගන්නම්. ගෙම්බෙක් නම් නෙවෙයි, ගොඩක් කල් ඉඳලා ගෙම්බෝ පරණ මෝස්තරයක්.. ඔයාට හැමෝම හිනාවෙයි. මම පූසන්ටත් කැමති නෑ, මට උන් හින්දා කිඹුහුම් යනවා. මම ඔයාට බකමූණෙක් ගන්නම්. ඔක්කොම ළමයි කැමති බකමූණන්ට. එයාලා ගොඩක් ප්‍රයෝජනයි ඔයාගේ ලියුම් එහෙම ඔක්කොම  දේවල් අරන් යන්න... ."

විනාඩි විස්සකට පසු ඔවුන් ඊලොප්ස් බකමූණු හළෙන් පිටවූහ. එය කුඩා ශබ්දයන්ගෙන්,  සෙලවීම් වලින් සහ මැණික් මෙන් දිළිසෙන ඇස් වලින් පිරි අඳුරු කඩයක් විය. හැරී දැන් විශාල කූඩුවක් සහිතව ගමන් කළේය. එහි තම පෙඳ අස්සේ හිස හංගාගෙන ඉක්මනින් නින්දට වැටුණු හිම සුදු පැහැ අළංකාර බකමූණෙක් විය. ප්‍රොෆෙසර් කුවරල් මෙන් ගොතගසමින් තම ස්තූතිය මිමිණීම හැරීට නවතාගත නොහැකි විය.

"ඒක ගණන්ගන්න එපා," හැග්‍රිඩ් උගුරෙන් මෙන් කීවේය. "ඩර්ස්ලිලාගෙන් ඔයාට තෑගි ගොඩක් හම්බවෙන්න ඇති කියලා මම හිතන්නේ නෑ. ඔලිවැන්ඩර් විතරයි තව ඉතුරු. යශ්ඨි ගන්න තියන එකම තැන ඔලිවැන්ඩර්, ඔයාට හොඳම යශ්ඨිය හම්බවෙන්න ඕනේ."

මායා යශ්ඨියක්.. හැරී ඇත්තටම ආසාවෙන් බලාසිටියේ ඒ ගැනයි..

අවසාන සාප්පුව පටු සහ දුර්වල එකක් විය. රන් පැහැ අකුරින් දොරට උඩින්  'ඔලිවැන්ඩර්ස්: ක්‍රි පූ 382  සිට අනර්ඝ යශ්ඨි සාදන්නෝ' ලෙස ලියා තිබිණි. දූවිලි වැදුණු ජනේලය මත වූ දම් පැහැ කොට්ටයක් මත එක් යශ්ඨියක් තබා තිබිණ..

ඔවුන් ඇතුල්වත්ම සාප්පුව ඇතුලේම කොහේහරි තැනක සීනුවක් වැදිණි.. හැග්‍රිඩ් හිඳගත් උස් හීනි පුටුව හැරුණුකොට එය ඉතාකුඩා හිස් ස්ථානයක් විය. නීති ඉතා තද පුස්තකාළයකට ඇතුල්වූවාක් මෙන් අමුතු හැඟීමක් හැරීට දැනෙන්නට විය. හැරී තමාට ඒ මොහොතේ අළුතින් පැණ නැගි ප්‍රශ්ණ රාශියක් ගිලගෙන ඒ වෙනුවට සිවිලිම තෙක් පිළිවෙලට ගොඩගසා තිබූ දහස්ගානක් හීනි දිගැටි පෙට්ටි දෙස බලන්නට විය. ඔහුගේ ගෙළ පිටුපස ඇඳුම්කන්නට විය. එහි තිබූ දූවිල්ල සහ නිශ්ශබ්දතාවය යම් රහස් මායවක් සමග සම්භන්ධ වී ඇතුවාක් මෙනි.

"සුභ සන්ධ්‍යාවක්," සියුම් කටහඬක් ඇසුණි. හැරී උඩගියේය. හැග්‍රිඩ් පවා උඩයන්නට ඇත, මන්දයත් එහි සද්දෙන් හපන හඬක් තිබූ අතර එය නැවතී, ඔහු වහා පුටුවෙන් නැගිට්ටේය.

වයසක මනුස්සයෙක් ඔවුන් ඉදිරිපිට සිටගෙන සිටියේය, සාප්පුවේ අඳුර හරහා ඔහුගේ පළල්, සුදුමැලි ඇස් චන්ද්‍රයන් මෙන් දිළිසුනේය.

Downloaded from sinhalaebooks.com

"හෙලෝ්," හැරී අපහසුවෙන් මෙන් කීවේය.

"ආ, ඔව්," "ඔව්, ඔව්. මම හිතුවා මට ඔයාව ඉක්මනටම දකින්න ලැබෙයි කියලා. හැරී පෝටර්." ඔහු කීවේය. "ඔයාට තියෙන්නේ ඔයාගේ අම්මාගේ ඇස්. නිකන් හරියට ඊයේ වගේ ඔයාගේ අම්මා මෙතන හිටියේ, එයාගේ පළවෙනි යෂ්ටිය ගන්න ඇවිත්. අඟල් දහයයි කාලක් දිග වේගවත්, විලෝ ලීයෙන් හදපු, බන්ධන වැඩ වලට නියම යෂ්ටියක්.

ඔලිවැන්ඩර් මහතා හැරීට තවත් ලං විය. ඇස්පිල්ලම් ගසන්නට තිබුනානම් යැයි හැරී සිතුවේය.. ඒ රිදීමය ඇස් වල අද්භූත බවක් විය.

"අනික් අතට ඔයාගේ තාත්තා, උදව් වුනේ මැහෝගනී යෂ්ටියකට. අඟල් එකොළහයි. පොඩ්ඩක් නැවිච්ච එකක්. පොඩ්ඩක් වැඩිපුර බලය තියන අන්තර්ධාන වෙන්න හොඳම එකක්. හොඳයි, මම කියන්නේ ඔයාගේ තාත්තා ඒකට උදවු කරා. ඇත්තටම යෂ්ටිය තමයි මායාකාරයාව තෝරගන්නේ."

ඔලිවැන්ඩර් මහතා හැරීගේ නහයට නහය වදින තරම් තවත් ලං විය.. හැරීට එම මීදුම මෙන් වූ ඇස් තුළ තමාව දැකිය හැක.

"ආ ඒක මෙතනද..."

ඔලිවැන්ඩර් මහතා තම දිගැටි සුදු ඇඟිල්ලකින් හැරීගේ නළලේ වූ අකුණු සළකුණ ඇල්ලීය.

"මට හරිම කණගාටුයි කියන්න ඒක කරපු යෂ්ටිය වික්කේත් මම" ඔහු සෙමෙන් කීවේය. අඟල් දහතුනාමාරක් දිගයි. ආහ්. බලවත් යෂ්ටියක්, හරිම බළවත්, හැබැයි වැරදි අතක... හ්ම්ම් මම දැනගෙන හිටියානම් ඒ යෂ්ටිය මේ ලෝකෙට මොනාද කරන්න යන්නේ කියලා....

ඔහු තම ඔලුව වැනුවේය ඉන්පසු හැරීට සැනසීමක් දෙමින් හැග්‍රිඩ්ව දුටුවේය.

"රුබියස්! රුබියස් හැග්‍රිඩ්! ඔයාව ආපහු දකින්න ලැබුන එක කොච්චර හොඳද.... ඕක්, අඟල් දාසයයි, පොඩ්ඩක් නැවිලා තිබ්බා එහෙම නේද??"

"ඔව් සර් එහෙම තමයි තිබ්බේ ඒක,"

Downloaded from sinhalaebooks.com

"හොඳ යෂ්ටියක් ඒක. ඒත් මම හිතන්නේ ඔයාව නෙරපනකොට එයාලා ඒක දෙකට කැඩුවා" ඔලිවැන්ඩර් හදිසියේ පහළ වූ මතකයකින් කීවේය.

"අර්- ඔව්, එයාලා එහෙම කළා, ඔව්," අනෙක් කකුලට බර මාරුකරමින් හැග්‍රිඩ් කීවේය. "ඒත් මගේ ළඟ තාම කෑලි තියනවා," ඔහු උද්‍යෝගයෙන් කීවේය.

"ඒත් ඔයා ඒවා පාවිච්චි කරන්නේ නැනේ?" ඔලිවැන්ඩර් තියුණු ලෙස ඇසීය.

"අනේ නෑ සර්," හැග්‍රිඩ් වහා කීවේය. ඔහු තම රෝස පැහැ කුඩය තදින් අල්ලගනු හැරී දුටුවේය.

"හ්ම්ම්ම්," ඔලිවැන්ඩර් හැග්‍රිඩ් වෙත විනිවිද යන බැල්මක් හෙලීය. "හොඳයි දැන් -- පොටර් මහත්මයා. කෝ බලන්න" ඔහු රිදීයෙන් සළකුණු කර ඇති දිග මනින පටියක් තම සාක්කුවෙන් එළියට ගත්තේය. "කෝකද ඔයාගේ යෂ්ටි අත?"

"අර් - මම දකුණත්" හැරී කීය.

"කෝ ඔයාගේ අත දිග අරින්න. අන්න හරි." ඔහු හැරීගේ උරහිසේ සිට ඇඟිලි වලට මැන්නේය, ඉන්පසු මැණික් කටුවේ සිට වැළමිටට, උරහිසේ සිට බිමට, දණහිසේ සිට කිහිල්ලට සහ හිස වටා ද මැන්නේය. මනින අතරේ ඔහු කතා කළේය. , "හැම ඔලිවැන්ඩර් යෂ්ටියක් අභ්‍යන්තරේම තියෙන්නේ බලවත් මායා අමුද්‍රවයක්, පොටර් මහත්තයෝ. අපි පාවිච්චි කරනවා කඟවේනාගේ කෙස්, ෆීනික්ස් කුරුල්ලාගේ පෙඳ පිහාටු, තව මකර හදවතේ නහර එහෙම. කඟවේනෝ, මකරු එහෙම නැත්තන් ෆීනික්ස් කුරුල්ලෝ දෙන්නෙක් එකවගේ වෙන්නේ නෑ වගේ ඔලිවැන්ඩර් යෂ්ටි දෙකක් එකවගේ වෙන්නේත් නෑ. ආහ් අනික තමයි ඔයාට කවදාවත් වෙන මායකාරයෙක්ගේ යෂ්ටියකින් ඒ තරම් හොඳ ප්‍රතිඵලයක් ගන්න බෑ."

හැරීට හදිසියේම දැනුනේ තමන්ගේ තම නාස් සිදුරු අතර මනින පටිය ස්වයංක්‍රීයව මනිමින් සිටින බවයි. ඔලිවැන්ඩර් මහතා රාක්ක අතර රිංගමින් පෙට්ටි පහළට ගනිමින් සිටියේය.

"ඒක හරියයි," ඔහු කියත්ම, මනින පටිය පොළොවේ දුරකට පැන රැලි ගැසුණි. "හරි එහෙනම් පොටර් මහත්තයා, මේක බලන්න. දෙමට ලී සහ මකර හදවතේ නහරයක්. අඟල් නවයයි. හොඳයි පහසුයි. ඒක නිකන් පොඩ්ඩක් වනන්න."

හැරී යෂ්ටිය රැගෙන (මෝඩයෙක් සේ දැනෙද්දී) එය ටිකක් වටේට වැනුවේය. නමුත් ඔලිවැන්ඩර් මහතා වහාම එය උදුරා ගත්තේය.

Downloaded from sinhalaebooks.com

"මේපල් ලීය සහ ෆීනික්ස් පිහාටුව. අඟල් හතයි. ටිකක් ගැස්සෙනවා. බලන්න - - "

හැරී උත්සාහ කළේය - නමුත් ඔහු යෂ්ටිය ඔසවද්දීම ඔලිවැන්ඩර් එයත් ආපසු උදුරා ගත්තේය.

"නෑ, නෑ - මෙන්න, කළුවර ලීයයි කඟවේනා කෙස්ගහයි, අඟල් අටහමාරයි, ගැස්සෙනවා, බළමු බළමු. ඒක උත්සාහ කරලා බළමු."

හැරී නැවත නැවතත් උත්සාහ කර බැළුවේය. ඔලිවැන්ඩර් මහතා කුමක් බළාපොරොත්තු වන්නේදැයි ඔහුට කිසිම අදහසක් නොවීය. උත්සාහ කරන ලද යෂ්ටි මිටිය උස් පුටුව මත උඩට උඩට ගොඩ ගැසෙන්නට විය. නමුත් රාක්ක වලින් එලියට අදින ගණන වැඩිවෙත්ම ඔලිවැන්ඩර් මහතාගේ සතුටද වැඩි විය.

"පාරිභෝගිකයා ලේසි නෑ, නේහ්? දුක් වෙන්න එපා, අපිට හොඳටම ගැලපෙන එක මේ කොතනින් හරි හම්බවෙයි. මම හිතන්නේ, දැන් - ඔව්, මොකද බැරි - අසාමාන්‍ය එකතුවක් -- හෝලි ලීය ෆීනික්ස් පිහාටුව, අඟල් එකොළහයි, හොඳයි පහසුයි."

හැරී යෂ්ටිය අතට ගත්තේය. ඔහුට තම ඇඟිලි වල හදිසි රත්වීමක් දැනුණි. ඔහු යෂ්ටිය තම හිසට උඩින් ඔසවා, දූහුවිලි සුළං අතරින් වේගයෙන් පහළට ගෙන එත්ම රතු සහ රන් පැහැ වාෂ්ප වැනි පුළිඟු ධාරාවක් එහි කෙළවරින් එළියට මල්වෙඩිල්ක් මෙන් විදී ගොස් බිත්තියේ රතු පැහැ නටන ළප ඇතිකළේය. හැග්‍රිඩ් සතුටින් කෑගසා අත්පුඩි ගැසූ අතර ඔලිවැන්ඩර් හැඩුවේය. "ආහ්, විශිෂ්ඨයි! ඔව්, ඇත්තවශයෙන්ම, ඔහ්, නියමයි. හොඳයි, හොඳයි... මොනතරම් කුතුහලයක්ද... මේක නම් හරිම කුතුහලයක්... "

ඔහු හැරීගේ යෂ්ටිය නැවතත් පෙට්ටියට දමා දුඹුරු පැහැ කඩදාසියක ඔතන ගමනුත් මිමිණුවේය. "කුතුහළයක්... කුතුහළයක්.."

"සමාවෙන්න," හැරී කීවේය, "ඒත් මොකද්ද කුතුහළය?"

ඔලිවැන්ඩර් මහතා හැරී වෙත තම සුදුමැලි බැල්ම හෙළීය.

"මම මෙච්චර කාලෙකට විකුණපු හැම යෂ්ටියක්ම මට මතකයි පොටර් මහත්තයෝ, හැම යෂ්ටියක්ම. ඔයාගේ යෂ්ටියේ තියන පිහාටුව අයිති ෆීනික්ස් කුරුල්ලා තව එක පෙඳ පිහාටුවක් දුන්නා - තව එකම එකක්. ඇත්තටම ඒක හරිම කුතුහළයක් ඔයාට මේ යෂ්ටියම නියම වෙලා තියන එක. මොකද ඒකේ සහෝදර යෂ්ටිය, ඇයි ඒකේ සහෝදරයා ඔයාට ඔය සළකුණ දුන්නේ කියන එක."

හැරී කෙළ ගිල්ලේය.

Downloaded from sinhalaebooks.com

"ඔව්, අහල් දහතුනාමාරක්. චික්. ඇත්තටම පුදුමයි මේ දේවල් කොහොමද වෙන්නේ කියලා. යශ්ශීය මායාකාරයාව තෝරාගන්නවා, මතකනේ.... මම හිතන්නේ පොටර් මහත්තයෝ අපි ඔයාගෙන් විශිෂ්ඨ දේවල් බලාපොරොත්තු වෙන්න ඕනේ.. අන්තිමේදී, නම නොකිවයුතු තැනැත්තා විශිෂ්ඨ දේවල් කරා. ඔව් භයානක, ඒත් විශිෂ්ඨ දේවල්."

හැරීට දාඩිය දැම්මේය. ඔහු ඔලිවැන්ඩර් මහතාට එතරම් කැමති නැති බවක් ඔහුට හැඟිණි. ඔහු තම යශ්ශීය වෙනුවෙන් රන් ගැලිඔන්ස් හතක් ගෙවූපසු ඔලිවැන්ඩර් මහතා තම සාප්පුවේ සිට ඔවුන්ට හිසනමා අචාර කළේය.

හැරී සහ හැග්‍රිඩ් ඩයගන් ඇලී වෙතින් නික්මෙද්දී හිරු බසිමින් තිබිණි.. බිත්තිය හරහාත් දැන් හිස්ව ඇති කාන්දුවෙන කල්දේරම හරහාත් ඔවුන් ආපසු ආවෝය. ඔවුන් ආපසු එන අතරේ හැරී කතා කළේම නැත; හැරීගේ විකාර හැඩ වල පාර්සල් සහ උකුළේ තබාගෙන සිටි කූඩුවේ නිදන හිම සුදු පැහැ බකමූනා දෙස පුදුමයෙන් බලන මිනිසුන් ඔහුට පෙනුනේම නැත. තවත් විදුලි සෝපානයකින් ඉහලට, පැඩින්ග්ටන් දුම්රිය ස්ථානය ආ බව හැරීට තේරුම් ගියේ හැග්‍රිඩ් උරහිසට තට්ටු කළ පසුවයි.

"ඔයාගේ කෝච්චිය යන්න කලින් මොනාහරි කන්න වෙලාව තියනවා," ඔහු කීය.

ඔහු හැරීට හැම්බර්ගර් එකක් ගෙන ආවෙන් ඔවුන් ප්ලාස්ටික් පුටුවල හිඳගෙන කන්නට පටන් ගත්හ.. හැරී නොනවත්වා වටපිට බලන්නට විය. කෙසේනමුත් හැමදේම අමුතු විදිහට පෙනෙන්නට විය.

"ඔයා හොඳින්ද හැරී? ඔයා හරිම නිහඬයිනේ," හැග්‍රිඩ් කීවේය

හැරීට එය විස්තර කළ නොහැකිතරම් ය. ඔහුට තම ජීවිතයේ හොඳම උපන්දිනය ලැබිණි. නමුත් ඔහු තම හැම්බර්ගර් එක හපන අතරේ වචන සොයමින් කල්පනා කළේය.

"හැමෝම හිතනවා මම විශේෂයි කියලා," ඔහු අවසානයේ කීවේය. "කාන්දුවෙන කල්දේරමේ හිටපු අර මිනිස්සු ඔක්කොම, ප්‍රොෆෙසර් කුරල් එතකොට ඔලිවැන්ඩර් මහත්තයා,.... ඒත් මම මායාවන් ගැන කිසිම දෙයක් දන්නේ නෑ... එයාලා කොහොමද විශිෂ්ඨ දේවල් බලාපොරොත්තු වෙන්නේ? මම ප්‍රසිද්ධයි ඒත් මම ප්‍රසිද්ධ මොකටද කියලා මට මතකවත් නෑ. මම දන්නෙත් නෑ වොල් - සොරි- මම කිව්වේ මගේ දෙමාපියෝ මැරුණු රෑ මොකද උනේ කියලා."

හැග්‍රිඩ් හැරී වෙතට නැවුනේය. ඔහුගේ අවුල්වුනු රැවුල සහ ඇහිබැම පිටුපසින් ඔහු කරුණාවන්ත හිනාවක් පෑවේය.

Downloaded from sinhalaebooks.com

"ඔයා දුක්වෙන්න එපා හැරී. ඔයා ඉක්මනට  ඉගෙන ගනියි. හොග්වාර්ට්ස්  වල හැමෝම මුල ඉඳලා පටන් ගන්නේ. ඔයාට අවුලක් වෙන්නේ නෑ. මම දන්නවා ඒක අමාරුයි. ඔයාව ඇත්කරලානේ හිටියේ, ඒක හැමවෙලේම අමාරුයි තමයි. ඒත් ඔයාට හොග්වාර්ට්ස් වල හොඳ කාළයක් තියෙයි. මට තිබ්බා, තාමත් එහෙම තමයි."

හැග්‍රිඩ් නැවත ඩර්ස්ලිලාගේ ගෙදරට යන කෝච්චියට හැරීව නැංවූයේය, ඉන්පසු ඔහුට ලියුම්කවරයක් දුන්නේය.

"ඔයාගේ හොග්වර්ට්ස් යන ටිකට් එක, " ඔහු කීවේය. "සැප්තැම්බර් පළවෙනිදා - කින්ග්ස් ක්‍රොස් වල -- ටිකට් එකේ ඔක්කොම තියනවා. ඩර්ස්ලිලා එක්ක මොනාහරි ප්‍රශ්නයක් උනොත් ඔයාගේ බකමූණා අතේ ලියුමක් එවන්න. ඌ දන්නවා ඇති මාව හොයාගන්න. එහෙනම් හැරී, පස්සේ හම්බවෙමු."

කෝච්චිය අද්දන්නට විය. හැරීට හැග්‍රිඩ් නොපෙනී යන තුරු බලා  සිටින්නට උවමනා විය; ඔහු තම ආසනයෙන් නැගිට නහය ජනෙල් වීදුරුවට තද කර බැලුවේය. නමුත් ඔහු ඇසිපිය ගසන පමාවට ඔහු නොපෙනී ගියේය.

හයවෙනි පරිච්ඡේදය

නවයයි තුන්කාළ වේදිකාවෙන් ඇරඹූ ගමන

ඩර්ස්ලිලාත් සමඟ වූ හැරීගේ අවසාන මාසය විනෝදමත් වූයේ නැත. ඇත්ත නම්, ඩඩ්ලි හැරීට කොපමණ හයවූයේද කිවතොත් ඔහු හැරී සමග එක කාමරයක සිටියේම නැත.පෙටූනියා නැන්දායි වර්නන් මාමායි හැරීව කබ්ඩ් එකේ හිරකළේවත්, කිසිම දේකට බල කළේවත්, ඔහුට කෑගසුවේවත් නැත. කොටින්ම ඔවුන් හැරී සමග කතා කළේවත් නැත. අඩක් හයවී අඩක්  කෝපයෙන් සිටි ඔවුන් හැරී ඉඳගෙන සිටින විට එය හිස් පුටුවක් මෙන් සලකා හැසිරෙන්නට විය. මෙය බොහෝ පැතිවලින් වූ දියුණුවක් වූවත් කීප දිනකට පසු එය වදයක් බවට පත් විය.

හැරී තම අළුත් සගයා වූ බකමූණා සමග කාමරයේ සිටියේය. ඔහු තම මායා ඉතිහාසය පොතෙන් හමුවූ නමක් වූ හෙඩ්විග් යන්නෙන් ඇට කථාකිරීමට සිතුවේය. ඔහුගේ පාසල් පොත් ඉතා සිත් ඇදගන්නා සුලු විය. ඔහු මහ රෑ වෙනකන් ඇඳේ වැතිරී ඒවා කියෙවන අතර හෙඩ්විග් සතුටින් කෑගසමින් ජනේලයෙන් එළියට ඇතුළට පියෑඹුවාය. පෙටූනියා නැන්දා තවදුරටත් එම කාමරය පිරිසිදු කිරීමට නොපැමිනීම වාසනාවක් වූයේ හෙඩ්විග් නොකඩවා මැරිණු මීයන් රැගෙන ආ නිසයි. සෑම රාත්‍රියකම හැරී නිදා ගැනීමට පෙර බිත්තියේ දින සටහන් කර ඇති කුඩා කොළ කෑල්ල ලකුණු කරමින් සප්තැම්බර් පළවෙනිදාතෙක් දින ගැන්නේය..

අගෝස්තු මාසයේ අන්තිම දිනයේ හැරී සිතුවේ තමන් පෙටූනියා නැන්දාට සහ වර්නන් මාමාට ඊලඟ දවසේ කිංග්ස් ක්‍රොස් දුම්රිය පළට යෑම ගැන දැන්විය යුතු බවයි. ඔහු පහළ සාලයට යද්දී ඔවුන් රූපවාහිනියේ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් බළමින් සිටියෝය. තමන් එතන සිටින් බව හැඟවීමට හැරී උගුර පාදද්දී ඩඩ්ලි හූ තියමින් කාමරයෙන් ඉවතට දිව්වේය.

Downloaded from sinhalaebooks.com

"අර්- වර්නන් මාමේ?"

වර්නන් මාමා ඇහුම්කන් දෙන බව පෙන්වීමට ශබ්දයක් කළේය.

"අර් - මම හෙට කිංග්ස් ක්‍රොස් වල ඉන්න ඕනේ - හොග්වාර්ට්ස් යන්න."

වර්නන් මාමා නැවත් ශබ්දයක් කළේය.

"ඔයාට පුළුවන් වෙයිද මාව ගිහින් දාන්න?"

නැවත ශබ්දයක්. එයින් ඔව් යන්න හැඟවෙතැයි හැරී අනුමාන කළේය.

"ස්තූතියි."

ඔහු ආපසු උඩතට්ටුවට යාමට සැරසෙත්ම වර්නන් කතා කළේය.

"මායා ඉස්කෝලෙකට කෝච්චියේ යන එක හරි විහිළු ක්‍රමයක්නේ. මායා පාපිසි ඔක්කොම හිල් වෙලාද ආ?".

හැරී කිසිත් නොකීවේය.

"කොහේද ඔය ඉස්කෝලේ තියෙන්නේ, ඇත්තටම?"

"මම දන්නේ නෑ," පළමු වතාවට ඒ ගැන සිතමින් හැරී කීවේය. ඔහු හැග්‍රිඩ් දුන් ප්‍රවේශපත්‍රය සාක්කුවෙන් එළියට ඇදගත්තේය.

"මම එකොළහට නවයයි තුන්කාල වේදිකාවෙන් කෝච්චියට නගින්න ඕනේ" ඔහු කියෙව්වේය.

මාමා සහ නැන්දා මුහුණින් මුහුණ බැලුවෝය.

Downloaded from sinhalaebooks.com

"කී වෙනි වේදිකාවද?"

"නවයයි තුන්කාල."

"විකාර කියවන්න එපා," වර්නන් මාමා කීවේය "නවයයි තුන්කාල කියලා වේදිකාවක් නෑ."

"මගේ ටිකට් එකේ එහෙම තියෙන්නේ."

"විකාර," වර්නන් මාමා කියුවේය, "පිස්සුවෙන් උඩුබුරනවා, එයාලා ගොඩක් අය එහෙමයි. ඔයා ඔහොම ඉඳලා බලන්නකෝ.. හරි, අපි ඔයාව කින්ග්ස් ක්‍රොස් වලට ගෙනියන්නම්. අපි කොහොමත් හෙට ලන්ඩන් යනවා. එහෙම නැත්තන් මම ඔය ගැන පොඩ්ඩක්වත් වද වෙන්නේ නෑ."

"ඔයාලා ඇයි ලන්ඩන් යන්නේ?" හැමදේම සුහදව තබාගැනීමේ අදහසින් හැරී ඇසුවේය.

"ඩඩ්ලිව ඉස්පිරිතාලේ ගෙනියනවා," වර්නන් මාමා තරහින් කීවේය. "එයා ස්මෙල්ටින්ග්ස් යන්න කලින් අර ජරා නැට්ට අයින් කරන්න ඕනේ."

හැරී පසුදා උදේ පහට අවදි වූයේ නැවත පාසල් යාමට ලොකු උද්‍යෝගයකින් සහ නැවත නින්දට යාමට බයකින් යුක්තවයි. ඔහු අවදිවී තම කලිසම ඇඳගත්තේය. දුම්රිය ස්ථානයට මායාකරුවන්ගේ කබාය ඇඳගෙන යාමට ඔහුට උවමනා නොවීය. ඔහුට දුම්රියේදී ඇඳුම් මාරු කළ හැක - ඔහු තම හොග්වාර්ට්ස් ලැයිස්තුව නැවතත් බලා සියල්ල තමාට තිබෙන බව සහතික කරගත්තේය. හෙඩ්විග් පරිස්සමින් කූඩුවේ වසා දමා ඇත. කාමරය අස් කළ පසු ඔහු ඩර්සිලිලා අවදිවනතෙක් සිටියේය. පැයදෙකකට පසු හැරීගේ විශාල බරැති යකඩ පෙට්ටිය ඩස්ලිලාගේ කාරයට පටවන ලදී. පෙටූනියා නැන්දා ඩඩ්ලිට හැරී ලඟ වාඩිවීමට කථා කළ පසු ඔවුන් නික්මුනෝය.

ඔවුන් දහයාමාර වෙත්දී කින්ග්ස් ක්‍රොස් වෙතට සේන්දු වූහ. වර්නන් මාමා හැරීගේ යකඩ පෙට්ටිය කරත්තයකට පටවා දුම්රිය ස්ථානය ඇතුලට තල්ලුකර දුන්නේය. වර්නන් මාමා පදික වේදිකා අසල සමච්චල් සිනාවකින් යුතුව නතර වෙන තෙක් හැරී මෙම අමුතු කරුණාව ගැන පුදුම වෙමින් සිටියේය.

"හොදයි, ඔන්න ඔයා ආවා කොල්ලෝ, නවය වේදිකාවයි දහය වේදිකාවයි තියනවා. ඔයාගේ වේදිකාව මේ අතරමැද කොහේහරි තියෙන්න ඕනේ. ඒත් තාම එයාලා ඒක හදලා නෑ වගේ නේද?"

ඇත්තටම ඔහු නිවැරදි විය. වේදිකාවට ඉහලින් විශාල ප්ලාස්ටික් පුවරුවක නොම්මර නවය ද එහා පැත්තේ වේදිකාවට ඉහලින් ප්ලාස්ටික් පුවරුවේ නොම්මර දහයද ගසා තිබිණි. අතර මැද කිසිවක්ම නොවීය.

Downloaded from sinhalaebooks.com

"එහෙනම් ඔයාට හොඳ කාර්තුවක් ලැබේවා ," වඩා සමච්චල් හිනාවකින් කීවේය. ඉන්පසු ඔහු එතනින් යන්නට ගියේය. හැරී එදෙස බැලුවිට ඔවුන්ගේ වාහනය ඉවතට යනු පෙනිණි. තුන් දෙනාම මහහඬින් සිනාසෙමින් සිටියහ. හැරීගේ තොලකට වේලුණි. ඔහු කුමක් කළයුතුද? බොහෝදෙනා ඔහු දෙස අමුතු විදිහට බලන්නට වූයේ හෙඩ්විග් නිසාවෙනි. ඔහු කාගෙන් හෝ ඇසිය යුතුය.

ඔහු ලඟින් ගිය නියාමකයෙක්ට කතා කළේ නවයයි තුන්කාල වේදිකාව ගැන නොකියමිනි. නියාමකයා හොග්වාර්ට්ස් ගැන කවමදාකවත් අසා තිබුනේ නැත. එය පිහිටියේ රටේ මොන පැත්තේද කියාවත් කීමට හැරී දැන් නොසිටියෙන් හැරී හිතාමතා මෝඩයෙක් සේ හැසිරෙන්නේයැයි සිතා ඔහු අපහසුතාවයට පත් විය. නොයිවසිලිනත් වෙමින් ඔහු එකොළහට පිටත්වන දුම්රිය ගැන ඇසූ විට නියාමකයා පැවසුවේ එහෙම එකක් නැති බවයි. අවසානයේ කාළය නාස්ති කරන්නන් ගැන මුමුණමින් ඔහු ඉවතට ගියේය. හැරී කළබල නොවී සිටීමට තදින් උත්සාහ කළේය. පැමිණීමේ පුවරුවට ඉහළින් තිබූ විශාල ඔරලෝසුවට අනුව හොග්වාර්ට්ස් යන දුම්රියට නැගීමට ඔහුට තිබුනේ තව විනාඩි දහයක් පමණි. එසේ වුවත් එහි යා හැක්කේ කෙසේද? තමන්ට ඉතාම අමාරුවෙන් එසවිය හැකි යකඩ පෙට්ටියකුත් සාක්කුවල පිරුනු මායාකරුවන්ගේ සල්ලිත් විශාල බකමූණාත් සමග ඔහු දුම්රිය ස්ථානය මැද අතරමං විය.

ඩයගන් ඇලීවලට ඇතුල් වීමට වම් පැත්තේ තුවෙනි ගඩොලට තට්ටු කරන්නාක් මෙන් වූ යමක් හැරීට කියා දීමට හැග්‍රිඩ්ට අමතක වී ඇත. තම යශ්ඨිය එළියට ගෙන වේදිකා නවය සහ දහය අතර වූ ටිකට් පරීක්ෂකගේ කුටියට තට්ටු කළයුතු දැයි හැරී සිතුවේය.

ඒ මොහොතේම තමා පසුකර පිටුපසින් ගිය මිනිසුන් කණ්ඩායමක් කී වචන කීපයක් ඔහුට ඇසුණි.

" මගල්ලා ගෙන්ම පිරිලා, ඇත්තටම- - "

හැරී පිටුපස හැරුනේය. එසේ කිවූ මහත කාන්තාව ගිනි රතුකෙස් ඇති පිරිමි ළමයින් හතර දෙනෙක්ට කතා කරමින් සිටියාය. ඔවුන් සියල්ලෝම හැරීගේ මෙන් වූ යකඩ පෙට්ටියක් තල්ලු කරමින් සිටිඅතර ඔවුන්ට බකමූණෙක්ද විය.

හදවත වේගයෙන් ගැහෙද්දී හැරී ඔවුන් පිටුපසින් තම කරත්තය තල්ලු කළේය. ඔවුන් නවතින විට හැරීත් ඔවුන් කියන දේවල් ඇසෙන් දුරින් නැවතුනේය.

"දැන්, මොකද්ද වේදිකා අංකේ? පිරිමි ළමයින්ගේ මව ඇසුවාය.

"නවයයි තුන්කාල!" ඇගේ අත අල්ලාගෙන සිටි රතු කෙස් ඇති කුඩා ගැහැනු ළමයෙක් ඉදිරියට පැන කීවාය. "අම්මේ, මට යන්න බැරිද... "

Downloaded from sinhalaebooks.com

"ඔයාට තාම වයස මදි, ජිනී, දැන් කට වහගන්න. ඔක්කොම හරි, පර්සි, ඔයා මුලින්ම යන්න."

වැඩිමලා මෙන් පෙනුනු පිරිමි ළමයා වේදිකා නවය සහ දහය අතරට ගමන් කරන්නට විය. එය මග හැරේවියැයි බියෙන් ඇසිපිල්ලමක්වත් නොගසා හැරී බලා සිටියේය. නමුත් වේදිකා වෙන්කරන බිත්තිය අසලට ඔහු යත්ම විශාල පිටරැටියන් කණ්ඩායමක් ඔහු ඉදිරිපිටින් ගියෙන් අවසාන බෑගය එතනින් යත්දී ඔහු අතුරුදන් වී සිටියේය.

"ෆ්‍රෙඩ්, ඊලඟට ඔයා," මහත කාන්තාව කීවාය.

"මම ෆ්‍රෙඩ් නෙවෙයි, මම ජෝජ්," පිරිමි ළමයා කීවේය. "ඇත්තටම, ගෑනියේ ඔයා කියන්නේ තමුන් අපේ අම්මා කියලාද? මම ජෝජ් කියලා කියන්නවත් බැරිද?"

"සමාවෙන්න, ජෝජ් පැටියෝ."

"විහිළුවක් කලේ, මම ෆ්‍රෙඩ්," කියූ කොළුවා ගමන් ගත්තේය. ඔහුගේ නිවුන් සොයුරා ඔහු පිටුපසින් ඉක්මන් කලේ තප්පරයකට පසු ඔහු අතුරුදහන් විය. ඒත් ඔහු ඒක කළේ කොහොමද?

ඉන්පසු තුන්වෙන් සහෝදරයාත් බිත්තිය වෙත කඩිමුඩියේ ගමන් කළේ ඔහු එයට ලංවිය, ඉන්පසු හදිසියේම ඔහු එතන නොසිටියේය.

වෙන ක්‍රමයක් නොවීය.

"පොඩ්ඩක් අහන්න," හැරී මහත කාන්තාවට කතා කළේය.

"හෙලෝ, පැටියෝ," ඇය කීවාය. "හොග්වාර්ට්ස් යන පළවෙනි වතාවද? රොන් යන්නේත් අළුතෙන්."

ඇය තම පුතුන්ගෙන් අවසාන කුඩාම පිරිමි ළමයා පෙන්වා කීවාය. ඔහු උස, ලප වලින් පිරි කෙට්ටු මුහුණක්, දිගු අත් සහ කකුල් සහිත දිග නහයක් ඇති ළමයෙක් විය.

"ඔව්," හැරී කීවේය "කාරනේ මේකයි - මේකයි, මම දන්නේ නෑ කොහොමද - - "

"වේදිකාවට යන්නේ කොහොමද කියලා?" ඇය කරුණාවෙන් කීවාය, හැරී හිස සැලුවේය

Downloaded from sinhalaebooks.com

"දුක් වෙන්න එපා" ඇය කීවාය "ඔයාට කරන්න තියෙන්නේ අර වේදිකා නවයයි දහයයි අතර තියන බිත්තියට ඇවිදගෙන යන එක. ඔයා ඒකේ හැප්පෙයි කියලා හිතලා බය වෙන්නවත් නවතින්නවත් එපා, ඒක හරිම වැදගත්. ඔයාට බයයි වගේ නම් හොඳම දේ හෙමින් දුවගෙන යන එක. හරි දැන් යන්න, රොන්ට කලින් ඔයා යන්න."

"අර් - හා," හැරී කීවේය

ඔහු තම කරත්තය හරවාගෙන බිත්තිය දෙස බැලුවේය. එය ඉතා ඝනකම් බව පෙනේ.

ඔහු ඒ දෙසෙට ගමන් කරන්නට පටන් ගත්තේය. මිනිසුන් ඔහු පසුකර වේදිකා නවය සහ දහය වෙත ගමන් කරයි. හැරී තවත් වේගයෙන් ගමන් කළේය. ඔහු එම බිත්තියේ වැදී ලොකු අමාරුවක වැටෙන බව ඒකාන්තයි. ඔහු කරත්තයේ ඉදිරියට නැවෙමින් දුවන්නට පටන් ගත්තේය. බිත්තිය ලඟ ලඟ පැමිණේ. ඔහුට දැන් නැවතිය නොහැකිය. කරත්තය ඔහුගේ පාළනයෙන් තොරයි. ඔහු බිත්තියට අඩියක් දුරදී හැප්පෙන්නට සූදානමින් දෑස් වසා ගත්තේය.

ඔහු බිත්තියේ හැපුනෙ නැත. තමන් තවමත් දුවමින් සිටින බව තේරුණෙන් හැරී ඇස් ඇර බැලුවේය. තද රතුපැහැ වාශ්ප එන්ජිමක් මිනිසුන් පිරි දුම්රිය වේදිකාව අසල නවතා තිබේ. එහි හොග්වාර්ට්ස් අධිවේගය, එකොළහට ලෙස ලියා තිබිණි. හැරී පිටුපස හැරි බළන විය තමන් ආ බිත්තිය තිබූ තැන නවයයි තුන්කාල ලෙස ලියූ පැරණි යකඩ ආරුක්කුවක් දක්නට ලැබිණි. ඔහු එය සිදුකර තිබේ.

කතාකරමින් සිටි ජනකායගේ හිස් වලට ඉහලින් එන්ජිමේ වාශ්ප නොපෙනී යයි. හැමපාටින්ම වූ පූසන් ඔවුන්ගේ කකුල් අතරින් එහේ මෙහේ ඇතිල්ලෙමින් සිටී. බරැති යකඩ පෙට්ටි හීරෙන ශබ්දය සහ මිනිසුන්ගේ කියවිල්ල අස්සෙන් බකමූණන් එකිනෙකාට හූ හඬින් කතාකරන්නාක් මෙන් පෙනේ.

මුල්ම මැදිරි දැනටමත් සිසුන්ගෙන් පිරී ඇත. සමහරු ජනේලයෙන් එලියට එල්ලෙමින් තම පවුලේ අය සමග කතා කරමින් උන් අතර සමහරු ආසන වළට රන්ඩු වුහ.. හැරී හිස් ආසනයක් සොයමින් තම කරත්තය පහළට තල්ලු කළේය. ඔහු රවුම් මූණක් ඇති ළමයෙක් අසලින් යද්දී "ආච්චි, මගේ ගෙම්බා ආයෙත් නැති වෙලා"යි ඔහු කීවේය.

"අයියෝ, නෙවිල්," වයසක කාන්තාව කීවාය.

ගැටගැසුණු කොන්ඩයක් සහිත පිරිමි ළමයෙක් වටකරගත් කුඩා කණ්ඩායමක් ද විය..

"අපි දිහාත් බලන්නකෝ ලී, අනේ."

Downloaded from sinhalaebooks.com

පිරිමි ළමයා තම අතේ තබාගෙන සිටි පෙට්ටියක පියන ඇරියෙන් වටේට සිටි පිරිස වෙවුලා කෑගැසුවේ හරියට පෙට්ටියෙන් එලියට මොකෙක් හෝ සතෙක්ගේ දිග මයිල් පිරුණු කකුලක් පැන්නාක් මෙනි.

කෝච්චියේ අවසාන හරියේම ආසනයක් හමු වෙන තුරු හැරී සෙනග අතරින් ගියේය. ඔහු මුලින්ම හෙඩ්විග්ව ඇතුලෙන් තබා ඉන්පසු තම යකඩ පෙට්ටිය ඔසවා කෝච්චියේ දොරවෙත තල්ලු කරන්නට පටන් ගත්තේය. ඔහු එය පඩිපෙල උඩට ඔසවන්නට උත්සාහ කළත් ඔහුට හැකිවුනේ එක්පැත්තකින් පමණක් යන්තම් එසවීමට පමණි. එය දෙපාරක්ම වේදනා දෙමින් ඔහුගේ කකුල මත අතහැරිණි.

"උදව්වක් ඕනෙද?" රතු හිසකෙස් ඇති නිවුන් සොයුරන්ගෙන් එක් අයෙක් ඔහුගේ උදව්වට පැමිණ තිබේ.

"අනේ, ඔව්," හැරී හති දැම්මේය.

"ඒයි, ෆ්‍රෙඩ්! මෙහෙට ඇවිත් උදවු කරනවකෝ!"

නිවුන්නුන්ගේ උදව්වෙන් අවසානයේ යකඩ පෙට්ටිය දුම්රිය මැදිරියේ කෙළවරකට දමා ගන්නා ලදී.

"ස්තූතියි," තම දාඩියෙන් පෙඟුනු හිසකෙස් ඇස්වලින් ඉවත්කරමින් හැරී කීවේය.

"අර මොකද්ද?" නිවුන්නුන්ගෙන් එක් අයෙක් හදිසියේම හැරීගේ අකුණු සළකුණ පෙන්වමින් ඇසීය.

"අප්පට සිරි," අනෙකා කීවේය. "ඔයා..

"එයා තමයි..," මුල් කෙනා කීයා. "ඔයා නේද?" ඔහු හැරීගෙන් ඇසීය.

"මොකද්ද?" හැරී ඇසීය.

"හැරී පොටර්, "නිවුන් සොයුරන් එක්වරම කීහ..

"ඔහ්, එයාද" හැරී කීවේය. "මම කිව්වේ, ඔව් ඒ මම තමයි."

Downloaded from sinhalaebooks.com

ඔවුන් දෙදෙනා කට ඇරගෙන ඔහු දෙස බලා සිටින්නට විය. හැරීට තමන් රතු වෙනු දැනිණි. ඉන්පසු ඔහුගේ ගැලවීමට මෙන් ඇරුනු දොර දෙසින් කටහඬක් ඇසිණි.

"ෆ්‍රෙඩ්? ජෝජ්? ඔයාලා ඔතන ඉන්නවාද?"

"එනවා, අම්මේ."

හැරී දෙස අවසන් වතාවටත් බැලූ ඔවුන් කෝච්චියෙන් එළියට පැන්නෝය.

හැරී බාගෙට සැඟවී මෙන් ජනේලය ලඟ අසුනේ හිඳගෙන රතු කෙස් ඇති පවුල දෙස බලාගෙන ඔවුන් කියන දේවල් අසා සිටින්නට විය. ඔවුන්ගේ මව තම ලේන්සුව එළියට ගත්තාය.

"රොන්, ඔයාගේ නහයේ මොනාද ගෑවිලා."

කුඩාම පිරිමි ළමයා එතනින් ලිස්සායාමට උත්සාහ කළත් ඇය ඔහුව අල්ලාගෙන ඔහුගේ නහය තුඩ අතුල්ලන්නට විය.

"අම්මේ - අයින්කෝ" ඔහු ගැලවුනේය.

"ආහ්, චූටි රොනීගේ නහයේ මොනාඩ ගෑවිලාද?" නිවුන්නුන්ගෙන් එක් අයෙක් කීවේය.

"කට වහනවා," රොන් කීවේය.

"පර්සි කෝ?" ඔවුන්ගේ මව ඇසුවාය.

"එයා දැන් එයි."

වැඩිමල්ම පිරිමි ළමයා එනු පෙනිණි. ඔහු දැනටමත් තම කළු හොග්වාර්ට්ස් කබා ඇඳ සිටියේය. ඔහුගේ පපුවේ P අකුර ගැසූ රිදී ලාංඡනයක් හැරී දුටුවේය..

Downloaded from sinhalaebooks.com

"ගොඩක් වෙලා ඉන්න බෑ, අම්මේ," ඔහු කීවේය. "මම ඉන්නේ ඉස්සරහා. ශිෂ්‍ය නායකයින්ට විතරක් ඉස්සරහා මැදිරි දෙකක් තියනවා..."

"ඔහ්, ඔයා ශිෂ්‍ය නායකයෙක්ද, පර්සි? එක් නිවුන්නෙන්ක් පුදුමයක් මවා ගනිමින් කීවේය. "ඔයා මොනාහරි ඒ ගැන කියන්න ඇති, අපිට තේරුනේ නෑනේ"

"පොඩ්ඩක් ඉන්න, මම හිතන්නේ එයා ඒ ගැන මොනාහරි කිව්වා මට මතකයි." අනෙකා කීවේය. "එකපාරක් ද...."

"නැත්තන් දෙපාරක්  ද - "

"විනාඩියක් ද - "

"මුළු ගිම්හානෙම- - "

"ඔහ්, කටවහනවා" පර්සි ශිෂ්‍ය නායකයා කීවේය.

"මොනා උනත් පර්සිට කොහොමද අළුත් කබා හම්බුනේ?" එක් නිවුන්නෙක් කීය.

"ඒ එයා ශිෂ්‍ය නායකයෙක් හිංදා" ඔවුන්ගේ මව තදින් කීවාය. "හොඳයි, පැටියෝ, ඔයාට හොඳ කාර්තුවක් වේවා, ඔයා එහෙට ගියාම මට බකමූණෙක් එවන්න."

ඈ පර්සිගේ කම්මුල සිපගත් පසු ඔහු නික්මුණේය. ඉන්පසු ඈ නිවුන්නුන් දෙසට හැරුනාය.

"දැන් ඔය දෙන්නා - මේ අවුරුද්දේනම් හොඳට හැසිරෙන්න ඕනේ. මට එක බකමූණෙක් හරි ආවොත් ඔයාලා - ඔයාලා වැසිකිලියක් පුපුරවලා නැත්තන් - - "

"වැසිකිලියක් පුපුරවලා? අපි කවදාවත් වැසිකිලියක් පුපුරවලා නෑ."

"හොඳ අදහසක් නේ, ස්තුතියි, අම්මේ."

Downloaded from sinhalaebooks.com

"මේක විහිළුවක් නෙවෙයි. රොන් ගැනත් බලන්න."

"දුක් වෙන්න එපා, චූටි රොනිකින්ස් අපිත් එක්ක ආරක්ශිතව ඉඳී."

"කට වහනවා," රොන් නැවතත් කීවේය. ඔහු තම නිවුන් සොයුරන් තරමටම උස් වූ අතර ඔහුගේ මව ඇතිල්ලූ නහය තවමත් රෝස පාටින් පෙනිණි.

"මේ, අම්මේ, දන්නවද වැඩක්? කියන්න බලන්න අපට කාවද දැන් කෝච්චියේදි මුණගැහුනේ කියලා?"

හැරී වහාම පසුපසට වෙමින් තමා ඔවුන් දෙස බලනු දැකීම වැලැක්විය.

"ඔයා දන්නවද අර කළු කොන්ඩේ තිබ්බ පිරිමි ළමයා, අපි ලඟ දුම්රිය පළේදි හිටියේ? දන්නවද ඒ කවුද කියලා?"

"කවුද?"

"හැරී පොටර්!"

හැරීට කුඩා ගැහැණු ළමයාගේ කටහඬ ඇසිණි.

"අනේ, අම්මේ මම කෝච්චියට ගිහින් එයාව බලන්නම්කෝ  අම්මේ, අනේ..."

"ඔයා දැනටමත් එයාව දැක්කනේ ජිනී,  අනික අසරණ කොලුවා ඔයා සත්තු වත්තෙදි ඇස් ලොකු කරන් බලන දෙයක් වගේ නෙවෙයි. නේද ෆ්‍රෙඩ්?"

"ඔයා කොහොමද හරියටම දන්නේ?"

"අපි එයාගෙන් ඇහුවා. එයාගේ සළකුණත් දැක්කා. ඒක ඇත්තටම තියනවා - අකුණක් වගේ."

"අසරණ කොළු පැටියා - එයා තනියම හිටපු එක පුදුමයක් නෙවෙයි. මම ඒත් හිතුවා ඒ ගැන. එයා හරිම යටහත්ව ඇහුවේ වේදිකාවට යන්නේ කොහොමද කියලා"

Downloaded from sinhalaebooks.com

"ඒකට කමක් නෑ, ඔයා හිතන්නේ එයාට මතක ඇද්ද නම නොකියන තැනැත්තා මොන්වගේද කියලා?"

ඔවුන්ගේ මව හදිසියේම කේන්ති ගත්තාය.

"මම අණකරනවා ඔයාලට එහෙම නොකරන්න, ෆ්‍රෙඩ්. නෑ, ඒක හිතන්නවත් එපා. හරියට එයාට ඉස්කෝලේ යන පළවෙනි දවසේ ඒක මතක්කරන්න ඕනේ වගේ"

"හරි, කොන්ඩේ හදාගන්න."

නලා හඬක් නැගුනි.

"ඉක්මන් කරන්න!" ඔවුන්ගේ මව කීවෙන් තිදෙනාම දුම්රියට ගොඩ වූහ. ඔවුන් මවගේ සමුගැනීමේ හාද්දක් ගන්නට ජනේලයෙන් එළියට නැවුනු අතර ඔවුන්ගේ නංගී අඬන්නට පටන් ගත්තාය.

"එපා, ජිනී, අපි ඔයාට බකමූණෝ ගොඩාක් එවන්නම්."

"අපි ඔයාට හොග්වාර්ට්ස් වැසිකිළි ආසනයක් එවන්නම්."

"ජෝර්ජ්!"

"විහිලුවටනේ, අම්මේ."

දුම්රිය ධාවනය වන්නට විය. ඔවුන්ගේ මව අත වනන අතරේ ඔවුන්ගේ සොයුරිය අඩක් හිනා වෙමින්, අඩක් අඬමින් දුම්රිය සමග දිව ආවේ, වේගය වැඩිවත්ම නැවතී අත වැනුවාය.

දුම්රිය වංගුවක් ගනිද්දී ගැහැනු ළමයා සහ ඇගේ මව නොපෙනී යන තෙක්ම හැරී ඔවුන් දෙස බලා සිටියේය. ගෙවල් පහුවෙනු ජනේලයෙන් පෙනේ. හැරීට විශාල උද්‍යෝගයක් දැනුණි. තමන් යන්නේ කොහේදැයි ඔහු නොදැන් සිටියත් තමන් අතහැර යන දේට වඩා එය ඉතා හොඳ බව ඔහු දැන සිටියේය.

මැදිරියේ දොර විවෘත වී කුඩාම රතුකෙස් පිරිමි ළමයා ඇතුල් විය.

Downloaded from sinhalaebooks.com

"කවුරුහරි මෙතන ඉන්නවද?" හැරීට අනෙක්පසින් වූ ආසනය පෙන්වමින් ඔහු ඇසුවේය. "අනිත් හැමතැනම පිරිලා"

හැරී හිස වැනුවෙන් ඔහු එහි වාඩි විය. ඔහු හැරී දෙස බලාගෙන හිඳ වහාම ජනේලයෙන් ඉවත බලා තමා නොබැලූ බවක් හැඟවීය. ඔහුගේ නහය මත තවමත් කළු පැල්ලමක් ඇති බව හැරී දුටුවේය.

"මේ, රොන්."

නිවුන්නු නැවත පැමිණ තිබේ.

"අහන්න, අපි කෝච්චියේ මැද්දට යනවා - එහේ ලී ජෝඩන් ලඟ ලොකු දිවිමකුළුවෙක් ඉන්නවලු."

"හරි," රොන් මිමිණුවේය.

"හැරී," අනෙකා කීවේය, "අපි අපිව අඳුන්වලා දුන්නද? ෆ්‍රෙඩ් සහ ජෝර්ජ් වීස්ලි. එතකොට මේ රොන්, අපේ මල්ලි. එහෙනම් පස්සේ හමුවෙමු."

"බායි," හැරී සහ රොන් කීවෙන් නිවුන්නු තමන් පිටුපසින් මැදිරි දොර වසමින් මගහැර ගියහ.

"ඔයා ඇත්තටම හැරී පොටර් ද?" රොන් ඇසුවේය.

හැරී හිස වැනුවේය.

"ඔහ් - හරි, මම හිතුවේ ඒකත් ෆ්‍රෙඩ් ජෝර්ජ් දෙන්නගේ විහිළුවක් කියලා," රොන් කීවේය. "එතකොට ඇත්තටම ඔයාගේ තියනවද - දන්නවනේ.."

ඔහු හැරීගේ නළල පෙන්වීය.

හැරී තම නළලේ කෙස් ඇත් කර ඔහුට අකුණු සළකුණ පෙන්වීය. රොන් එදෙස බළා සිටියේය.

Downloaded from sinhalaebooks.com

"එතකොට එතනද නම නොකියන කෙනා..

"ඔව්," හැරී කීවේය, "ඒත් මට ඒක මතක නෑ."

"මොකුත්ම?" රොන් නොයිවසිල්ලෙන් කීවේය.

"ඇත්තටම- මට ලොකු කොළපාට එළියක් විතරක් මතකයි. වෙන මොකුත් මතක නෑ."

"වාව්," රොන් කීවේය. ඉන්පසු ඔහු ටිකක් වෙලා හැරී දෙසම බලා සිටියේය, ඉන්පසු හදිස්සියේ තමන් කරන් දේ ගැන සිහියට ආවෙන් වහාම ජනේලයෙන් පිටත බැළුවේය.

"ඔයාගේ පවුලේ හැමෝම මායාකාරයෝද?" හැරී ඇසුවේය. රොන් හැරීව ප්‍රියකළ තරමටම හැරී ද රොන් ප්‍රිය කළේය.

"අර් - ඔව්, මම හිතන්නේ," රොන් කීවේය. "මම හිතන්නේ අම්මගේ දුර නෑ සහෝදරයෙක් ඉන්නවා ගිණුම්කරුවෙක්. එයාගැන කවුරුත් කථාකරන්නේ නෑ."

"ඉතිං එහෙනම් ඔයා දැනටමත් ගොඩක් මායාවල් දන්නවා ඇතිනේ."

ඩයගන් ඇලී වල සිටි සුදුමැලි ළමයා කියූ ආකාරයටනම් වීස්ලි පවුල නිසැකවම ඒ පැරණි මායා පවුල් වලින් එකක් විය යුතුය.

"මට අහන්න ලැබුනේ ඔයා මගල්ලා එක්ක ජීවත්වෙන්න ගියා කියලා" . "එයාලා මොන වගේද?"

"අප්‍රසන්නයි -ඇත්තටම, හැමෝම එහෙම නෑ. මගේ නැන්දයි, මාමායි, මස්සිනයි එහෙමයි.. මටත් මායාකාර සහෝදරයෝ තුන්දෙනෙක් හිටියානම් කියලා හිතෙනවා"

"පහක්," රොන් කීවේය. කුමක් හෝ හේතුවකට ඔහු මුහුණ අඳුරු කරගෙන සිටී. "අපේ පවුලේ හොග්වාර්ට්ස් යන හයවෙනියා මම. ඔයා හිතයි මට ගොඩාක් දේවල් තියනවා කියලා. බිල් චාලි දෙන්නා දැනටමත් අයින් වෙලා. බිල් ප්‍රධාන ශිෂ්‍ය නායකයා වෙලා හිටියා. චාලි කුඩිච් නායකයා. දැන් පර්සිත් ශිෂ්‍ය නායකයෙක්. ෆ්‍රෙඩ් ජෝජ් දෙන්නා පිස්සු නටනවා තමයි, ඒත් එයාලාට හොඳ ළකුණු ලැබෙනවා. අනික හැමෝම හිතනවා එයාලා හරි විහිලුයි කියලා.

Downloaded from sinhalaebooks.com

හැමෝම මගෙනුත් බලාපොරොත්තු වෙනවා අනෙත් අය වගේ වැඩ කරයි කියලා. ඒත් මම එහෙම කළත් වැඩක් නෑ, මොකද එයාලා මුලින් ඒක කරලා තියනවානේ. සහෝදරයෝ පහක් එක්ක ඔයාට කිසිම අළුත් දෙයක් ලැබෙන්නෙත් නෑ. මට හම්බුනේ බිල්ගේ පරණ කබායි වාලිගේ පරණ යශ්ඨියයි, පර්සිගේ පරණ මීයායි..."

රොන් තම සාක්කුව ඇතුළට අත දමා නිදා සිටි තඩි අළු පාට මීයෙක් එළියට ගත්තේය.

"මෙයාගේ නම ස්කැබස්, කිසි වැඩකට නෑ, ඌ ලේසියෙන් නැගිටින්නේත් නෑ. පර්සි ශිෂ්‍ය නායකයෙක් උන නිසා තාත්තාගෙන් එයාට බකමූණෙක් ලැබුනා. ඒත් එයාලට වියද... මම කිව්වේ, ඉතිං මට ස්කැබස් ලැබුනා"

රොන්ගේ කන් රතු විය. ඔහු වැඩිපුර කියෙව්වාදැයි හිතන බවක් පෙනුණි. මන්ද ඔහු නැවතත් ජනේලයෙන් එළිය බලාගෙන සිටින්නට විය.

බකමූණක් වෙනුවෙන් වියදම් කරන්නට නොහැකි වීමේ කිසිම වරදක් හැරී දුටුවේ නැත. අනික් අතට මාසෙකට කළින් ලැබෙන්නට පෙර ඔහුගේ ජීවිතය පුරාවටම ඔහුට කිසිම මුදලක් නොලැබුණි. ඒ නිසා ඔහුත් ඩඩ්ලිගේ පරණ ඇඳුම් ඇන්ද හැටිත් කවමදාවත් හරිහමන් උපන්දින තෑග්ගක් නොලැබුන හැටිත් රොන්ට කීවේය. එයින් රොන් සතුටු විය.

"ඉතිං හැග්‍රිඩ් කියනකන් මම මායාකාරයෙක් වෙන එක ගැනවත්, මගේ දෙමාපියො ගැනවත් වොල්ඩර්මෝට් ගැනවත් දැනගෙන හිටියේ නෑ."

රොන් ගැස්සුණේය.

"ඇයි?" හැරී ඇසුවේය.

"ඔයා නම නොකියන කෙනාගේ නම කිව්වා!" පුදුමයෙන් සහ උද්ධාමයෙන් රොන් කීවේය. "මම හිතුවේ ඔයාත්, අනිත් මිනිස්සු වගේ.."

"මම එයාගේ නම කියන එකෙන් වීරයෙක් වෙන්න හදනවා නෙවෙයි" හැරී කීවේය. "මම කවදාවත් දැනගෙන හිටියේ නෑ ඒක කියන්නේ නෑ කියලා.. තේරුණාද? ඔට්ටුයි මට ගොඩාක් ඉගෙනගන්න තියනවා" තමන් පසුගිය කාළයේ කරදර උනු දෙයක් ගැන මුල්වරට දුක්මුසු හඬින් හැරී කීවේය, "ඔට්ටුයි මම තමයි පංතියේ දුර්වලම."

"ඔයා එහෙම වෙන එකක් නෑ. එහේ ගොඩාක් ඉන්නවා මගල් පවුල් වලින් ඇවිත් ඉක්මනට ඉගෙන ගන්න අය.."

Downloaded from sinhalaebooks.com

ඔවුන් කතාකරමින් ඉන්නා අතරේ දුම්රිය ලන්ඩන් වලින් පිටතට ධාවනය විය. දැන් ඔවුන් ගමන් කරමින් සිටියේ එළදෙනුන් සහ බැටලුවන් පිරි කුඹුරු පසු කරමිනි. ඔවුන් නිහඬව වේගයෙන් පසුවන කුඹුරු සහ පාරවල් දෙස බලා සිටියෝය.

දොළහමාරට පමණ බඳුන් ගැටෙන් ශබ්දයක් සමග සිනාහඬක් කොරිඩෝවෙන් ඇසිණි. "මොනාහරි කරත්තෙන් ගන්නවාද දරුවනේ? කම්මුල වළ ගැසුණු කාන්තාවක් මැදිරි දොර තල්ලුකර ඇසුවාය.

උදේ කෑම නොකෑ හැරී වහා නැගිට්ටත් කන් රතු කරගත් රොන් තමන් සැන්ඩ්විච් ගෙනා බව මිමිනුවේය. හැරී එළියේ කොරිඩෝවට ගියේය.

ඔහුට ඩර්ස්ලි ලා ලඟ සිටියදී පැණිරස කෑමට කිසිම මුදලක් නොතිබිණි. නමුත් දැන් සාක්කු රන් සහ රිදී කාසිවලින් පිරී ඇති නිසා ඔහුට මාර්ස් චොකලට් ගැනීමට උවමනා විය. නමුත් කාන්තාව ලඟ මාර්ස් තිබුනේ නැත. ඇ ලඟ තිබුනේ බෙටී බොට්ගේ සෑම රසයකම බොංචි, ඩෲබ්ලස්ගේ හොඳම බබල්ගම්, චොකලට් ගෙම්බන්, වට්ටක්කා පැටිස්, කල්දේරම් කේක්, යශ්ටී සීනිකූරු සහ හැරී ජීවිතේටම නොදුටු තවත් දේවල් කිහිපයකි. කිසිම දෙයක් මගහැරීමට උවමනා නොවූ නිසාත් සියල්ලෙන්ම ටිකක් කෑමේ ආසාව නිසාත් ඔහු සියල්ලම රිදී සිකල් එකොළහක් සහ තඹ ක්නට්ස් හතක් ගෙවා ගත්තේය.

හැරී සියල්ල මැදිරියට රැගෙන විත් හිස් අසුනක් මත හළනු රොන් බලාසිටියේය.

"ඔයාට බඩගිනියි නේද?"

"හාමත් වෙලා," විශාල වට්ටක්කා පැටිස් කෑල්ලක් කඩාගන්නා අතර හැරී කීවේය.

රොන් ගැට්ටි සහිත පාර්සලයක් එළියට ගෙන එය දිගහරින්නට විය. එහි සැන්විචස් හතරක් විය. ඉන් එකක් අතටගත් ඔහු "එයාට හැමවෙලේම අමතක වෙනවා මම අඹරපු හරක්මස් කන්න ආසා නෑ කියලා."

"එකක් මේකකට මාරු කරමුද? පැටිස් එකක් දිගුකරමින් හැරී ඇසීය " කෝ ඉතිං.."

"ඔයාට මේක එපා. ඒක හොඳටම වේලිලා." රොන් කීවේය. " එයාට වැඩිය වෙලාවක් නෑනේ" ඔහු වහා කීවේය. " දන්නවානේ අපි පස් දෙනෙක් එක්ක"

"එන්න ඉතිං, පැටිස් එකක් කන්න." තමන්ට කවදාවත් බෙදාගෙන කෑමට දෙයක් නොතිබුනු නිසාත්, බෙදාගැනීමට කිසිවෙක් නොසිටි නිසාත් හැරී මේ අවස්ථාව ගැන සතුටින් කීවේය.. රොන් සමග මෙසේ එකට

Downloaded from sinhalaebooks.com

ඉඳගෙන සිටීමත් ගමන් කරන අතරතුර කෑම ගැනීමත් ඔහුට සතුටක් විය. ඔවුන් දෙදෙනා එකතුව පැටිස්, කේක් සහ පැණිරස කෑම කන්නට වූහ. (සැන්ඩ්විච් පසෙක අමතක කර දමන ලදී)

"මේ මොනාද?" චොකලට් ගෙම්බන් පැක්ට්ටුවක් ඔසවා හැරී රොන්ගෙන් ඇසීය. "එයාලා ඇත්ත ගෙම්බෝ නෙවෙයිනේ? " එහි කිසිම පුදුමහිතෙන දෙයක් නැතැයි සිතමින් ඔහු ඇසීය.

"නෑ" රොන් කීවේය. "ඒත් කාඩ්එක මොකද්ද බලන්න. මට ඇග්‍රිපා නෑ"

"මොකද්ද?"

"ඔහ්, ඇත්තටම, ඔයා දන්නේ නැතිව ඇතිනේ. චොකලට් ගෙම්බන්ගේ එකතුකරන්න කාඩ් තියනවා. ප්‍රසිද්ධ මායාකාරයෝයි මායාකාරියොයි ඉන්න. මගේ ලඟ පන්සීයක් විතර තියනවා, ඒත් මට ඇග්‍රිපායි ටොලෙමියි නෑ.."

හැරී තම චොකලට් ගෙම්බාව ඔතාතිබූ කොළයෙන් ගළවා කාඩ් එක අතට ගත්තේය. එහි පිරිමි මූණක් විය. ඔහු අඩසඳ හැඩයේ කණ්නාඩි පැළඳ සිටි අතර දිග වක් නහයක් විය. දිග රිදීපැහැ රැවුල සහ කොන්ඩය කඩා හැළුනි. පිංතූරයට යටින් ඇල්බස් ඩම්බල්ඩෝර් ලෙස නම ගසා තිබිණි.

"එතකොට මෙයායි ඩම්බල්ඩෝර්!" හැරී කීවේය.

"ඔයා කවදාවත් ඩම්බල්ඩෝර් ගැන අහලා නෑ කියාලානම් මට කියන්න එපා." රොන් කීවේය. "මට ගෙම්බෙක් දෙන්න පුළුවන්ද? මට ඇග්‍රිපා ලැබෙන්න පුළුවන්. ස්තුතියි"

හැරී තම කාඩ්පත අනෙක්පස හරවා කියෙව්වේය.

ඇල්බස් ඩම්බල්ඩෝර්

හොග්වාර්ට්ස් හී වර්ථමාන විදුහල්පති

බොහෝ අය සමහ සළකා බලන විට නව යුගයේ සිටින හොඳම මායාකරුය. ඔහු වඩාත් ප්‍රසිද්ධ වන්නේ 1945 ග්‍රින්ඩෙල්වොල්ඩ් හී අඳුරු උතුමානන් පැරදවීම, මකර ලේ භාවිතාකරන ක්‍රම 12 සොයා ගැනීම සහ, ඔහුගේ මිතුරු නිකොලස් ෆ්ලේමල් සමග කරන ලද රසායනය සම්භන්ධ ක්‍රියාවන්ටය. ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝර් කුටි සංගීතය සහ බෝලින් ක්‍රීඩාව ප්‍රිය කරයි.

හැරී කාඩ්පත අනෙක් පස හරවන විට ඔහු ඉමහත් පුදුමයට පත් කරමින් ඩම්බල්ඩෝර්ගේ මුහුණ අතුරුදන් වී තිබිණි..

Downloaded from sinhalaebooks.com

"එයා ගිහින්!"

"මේකයි, එයාට හැමවෙලේම ඔතන ඉන්න පුළුවන් කියලා ඔයාට බලාපොරොත්තුවෙන්න බෑ" රොන් කීවේය.. "එයා ආපහු එයි. අයියෝ, මට ආපහු මෝගානා හම්බුනේ, මට එයාගේ කාඩ් හයක් වගේ තියනවා.. ඔයාට ඒක ඕනෙද? ඔයාටත් එකතුකරන්න පටන් ගත්තහැකි.

රොන්ගේ ඇස් විවරකිරීමට තිබෙන චොකලට් ගෙම්බන් ගොඩමත රැඳුනේය.

"ඔයා ගන්නකෝ," හැරී කීවේය. "ඒත්, දන්නවද මගල් ලෝකේනම් මිනිස්සු ෆොටෝවලම ඉන්නවා."

"එහෙමද? ඇ, එයාලා හෙලවෙන්නෙවත් නෑ?" රොන් පුදුමයට පත්විය. "හරි අමුතුයි!"

ඩම්බල්ඩෝර් නැවත කාඩ්පත්ට එනු හැරී දුටුවෙන් ඔහුට සිනාවක් පෑවේය. රොන් ප්‍රසිද්ධ මායාකරුවන් සහ මායාකාරියන් දෙස බලනවාට වඩා චොකලට් ගෙම්බන් කෑමට ප්‍රිය කළත්, හැරීටනම් කාඩ්පත්වල ඉන්නා පුද්ගලයින්ගෙන් ඇස ඉවතට ගන්නට බැරි විය. ඉතා ඉක්මනින් ඔහුට ඩම්බල්ඩෝර් සහ මෝගානා පමණක් නොව වුඩ්ක්‍රොෆ්ට් වල හෙන්ගිස්ට්, ඇල්බෙරික් ග්‍රනියින්, සර්ස්, පැරසෙල්සස් සහ මර්ලින් ද හමු විය. ඔහු අවසන් වශයෙන් නාසය කසමින් සිටි ඩෘයිඩෙස් ක්ලියොඩ්නා ගෙන් ඇස් ඉවතට ගත්තේ බර්ටි බොට් ගේ සියළු රස බොංචි මල්ලක් විවෘත කිරීමටයි.

"ඔයා ඔවා කද්දි නම් පරිස්සම් වෙන්න ඕනේ" රොන් හැරීට අනතුරු ඇඟවීය. "එයාලා සියළු රස කිව්වාම ඒ ඔක්කොම රසවල්ම තමයි. දන්නවද ඔයාට ඔක්කොම සාමාන්‍ය රසවල් හම්බවෙයි, චොකලට්, පෙපර්මින්ට්, මාමලේඩ් වගේ. හැබැයි තව තියනවා නිවිති, පීකුදු, බාබත් වගේ ඒවත්. ජෝජ් කියනවා එයාට එක සැරයක් හොටු රස එකක් හම්බුනාලු.."

රොන් කොළ පැහැ ඇටයක් අතට ගෙන එය හොඳින් පරීක්ෂා කර කොනක් හපා බැළුවේය.

"ඇඇඇක් - දැක්කද? මුංපැළ."

ඔවුන් සියළු රස බොංචි කමින් විනෝද වූහ. හැරීට කරකරන පාන් රස, පොල්, බේක්කළ බොංචි රස, ස්ට්‍රෝබෙරි, තුනපහ, තණකොළ, කෝපි, සාඩින් රස හමු වූ අතර රොන් ඇල්ලීමටවත් අකමැති වූ ගම්මිරිස් රස වූ අළුපැහැ එකකුත් හපා බැලීමට තරම් ඔහු නිර්භීත විය..

Downloaded from sinhalaebooks.com

ජනේලයෙන් පහුවෙමින් තිබූ පිටිසර පෙදෙස දැන් කැළෑවක් බවට පත් වී ඇත. පිළිවෙලට තිබූ කුඹුරු අතුරුදන් විය. දැන් එහි තිබුනේ ගස්, ඇඹෙරෙමින් ගලන ගංගා සහ අඳුරු කොළ පැහැ කඳු පමණි.

ඔවුන්ගේ මැදිරි දොරට තට්ටු කරන හඬක් සමග හැරී නවයයි තුන්කාළ වේදිකාවේදී පසුකළ රවුම් මුහුණැති පිරිමි ළමයා ඇතුල් විය. ඔහු හඬන්නට ආසන්නව සිටියේය.

"සමාවෙන්න," ඔහු කීවේය "ඔයාලා ගෙම්බෙක් එහෙම දැක්කද?"

ඔවුන් හිස සොළවා නැතිබව ඇඟවූ විට ඔහු තවත් දුකට පත්විය. "ඌ නැති වෙලා! එයා කොයිවෙලෙත් මගෙන් පැනලා යනවා!"

"ඌව හම්බවෙයි," හැරී කීවේය.

"ඔව්," ඔහු දුකින් කීවේය. "හොඳයි, ඔයාලා ඌව දැක්කොත්..."

ඔහු පිටවිය.

"මන්දන්නේ නෑ එයා එච්චර කරදර වෙන්නේ ඇයි කියලා," රොන් කීවේය. "මම ගෙම්බෙක්ව අරන් ආවානම් පුළුවන් ඉක්මනට ඌව නැතිකරගන්නවා.. ඒත් ඉතිං, මම ස්කැබස් ගෙනාවනේ, මට මොකුත් කියන්න බෑ ඒ ගැන."

තවමත් මීයා රොන්ගේ උකුළමත නිදාසිටියේය.

"ඌ මැරුනත් ඔයාට වෙනස තේරෙන එකක් නෑ," රොන් අප්පිරියාවෙන් කීවේය. "මම එයාව ලස්සනට පේන්න කහපාට කරන්න හැදුවා ඊයේ, ඒත් මන්තරේ වැඩ කළේ නෑ. මම ඔයාට පෙන්වන්නම්, බලන්න..."

ඔහු තම යකඩ පෙට්ටිය ඇද ඉන් කඩතොලු වූ යෂ්ටියක එළියට ගත්තේය. එය සමහර තැන්වළින් පුපුරා අග කෙළවරින් සුදුපැහැ යමක් දකින්නට තිබිණි.

"කඟවේනා කෙස්ගහ එළියට පනින්න ළඟයි. මොනාඋනත්...

Downloaded from sinhalaebooks.com

ඔහු තම යෂ්ඨිය ඔසවන විටම මැදිරි දොර නැවතත් ඇරිණි. ගෙම්බා නැතිකරගත් පිරිමි ළමයා නැවත පැමිණ තිබේ. මෙවර ඔහු සමග ගැහැණු ළමයෙක් ද විය. ඇය දැනටමත් තම නව හොග්වාර්ට්ස් කබා හැඳ සිටියාය.

"කවුරු හරි ගෙම්බෙක් දැක්කද? නෙවිල් එකෙක් නැතිකරගෙන..," ඇය කීවාය. ඇයට උද්දච්ච කටහඬක්, විශාල පිරුණු දුඹුරු කොන්ඩයක් සහ විශාල ඉදිරි දත් තිබිණ.

"අපි එයාට කළින් කිව්වා අපි දැක්කේ නෑ කියාලා," රොන් කීවත්, ඇය ඊට ඇහුම්කන් දුන්නේ නැත, ඇය ඔහුගේ අතේ ඇති යෂ්ඨිය දෙස බලා සිටියාය.

"ඕහ්, ඔයා මායාවක් කරනවාද? එහෙනම්, ඒක බළමු."

ඇය වාඩිවුනාය. රොන් අපහසුතාවයට පත් විය.

"අර් - හරි එහෙනම්"

ඔහු තම උගුර පෑදුවේය.

"හිරුඑළිය, ඩේසි, පරණ බටර්, මේ මෝඩ තඩි මීයාව කහපාටට හරවන්න."

ඔහු තම යෂ්ඨිය වැනුවේය. නමුත් කිසිවක් සිදු නොවීය.. ස්කැබස් තවමත් අළුපාටට මහතට නිදමින් සිටියේය.

"ඔයාට විශ්වාසද ඒක ඇත්ත මන්තරයක් කියලා?" ගෑණුළමයා කීවාය. "මොකද, ඒක එච්චර හොඳ නෑ නේද? මම උත්සාහ කරලා බැලුවා ලේසි මන්තර ටිකක්, නිකමට පුරුදු වෙන්න, මටනම් ඒවා ඔක්කොම වැඩ කරා. අපේ පවුලේ කිසිම කෙනෙක් මායාවල් දන්නෙම නෑ.. මට ලියුම ලැබිච්ච එකනම් ලොකුම පුදුමයක්., ඒත් මම ඒ ගැන ගොඩක් සතුටු උනා. ඇත්තටම මම කිව්වේ, මායාවන් ඉගෙන ගන්න තියන හොඳම ඉස්කෝලේ ඒකනේ, මම අපේ පංති පොත් ඔක්කොම හොඳට පාඩම් කරා. ඇත්තටම මම හිතුවේ ඒ ඇති වෙයි. මම හර්මයිනී ග්‍රැන්ජර්. ඔයාලා කවුද?"

ඇය ඒ සියල්ල ඉතා වේගයෙන් කීවාය.

හැරී රොන් දෙස බැලුවේය. ඔහුගේ සැනසිල්ලට රොන්ගේ පුදුම වූ මුහුණින් පෙනුනේ ඔහුත් පොත් තදින්ම පාඩම් නොකළ බවයි.

Downloaded from sinhalaebooks.com

"මම රොන් වීස්ලි," රොන් මිමිණුවේය.

"හැරී පොටර්" හැරී කීවේය.

"ඔයා, ඇත්ත්ටමද?" හර්මයිනී ඇසුවාය. "මම ඔයාගැන හැමදේම දන්නවා, ඇත්තටම මම අමතර පොත් ටිකක් ගත්තා නිකන් කියවන්න. ඔයා ඉන්නේ නවීන මායා ඉතිහාසය, අඳුරු කළාවේ නැගීම සහ බිඳවැටීම, විසිවෙනි සියවසේ මහා මායාමය අවස්ථා කියන පොත්වල.

"මේ මම?" හැරී කම්පනයට පත් විය.

"අනේ දෙයියනේ, ඔයා දැනන්හිටියේ නැද්ද, මම එහෙමනම් හොයාගන්න පුළුවන් හැමදේම හොයාගන්නවා." හර්මයිනී කීවාය. "ඔයාලා එක්කෙනෙක් හරි දන්නවාද ඔයාලා මොන නිවාසෙට වැටෙයිද කියලා? මම හැමෝගෙන්ම ඇහුවා. මට හිතෙන්නේ මම ග්‍රිෆින්ඩෝ එකට වැටෙයි. දැනට හොඳම එක ඒක වගේ. ඩම්බල්ඩෝර් උනත් ඒකේ ඉඳලා තියෙන්නේ. අනික මම හිතන්නේ රේවන්ක්ලෝ උනත් නරකම නෑ. මොනා උනත්, අපි නෙවිල්ගේ ගෙම්බාව හොයන්න යන්න ඕනේ. ඔයාලා ඇඳුම් මාරු කරානම් හොඳයි. දන්නවාද, මම හිතන්නේ අපි ඉක්මනටම එහේ ඉඳී."

ඉන්පසු ඇය නෙවිල් සමග පිටවී ගියාය.

"මම මොන නිවාසෙට වැටුනත්, එයා ඉන්න එක නම් එපා" රොන් කීවේය. ඔහු තම යශ්ඨිය යකඩ පෙට්ටියට විසි කළේය. "මෝඩ මන්තරේ - ජෝජ් ඒක මට දුන්නේ, එයා දන්නවා එහෙනම් ඒක විකාරයක් කියලා."

"ඔයාගේ අයියලා ඉන්නේ මොන නිවාසෙද?" හැරී ඇසුවේය.

"ග්‍රිෆින්ඩෝ," රොන් කීවේය. ඔහු නැවතත් කණගාටුවෙන බවක් පෙනෙන්නට විය. "අම්මයි තාත්තයිත් ඒකේ හිටියේ. දන්නේ නෑ මම ඒකට වැටුනේ නැත්තන් එයාලා මොනා කියයිද කියලා. රේවන්ක්ලෝ උනත් නරකම නෑ මම හිතන්නේ. ඒත් හිතන්න එයාලා මාව ස්ලිදරින් එකට දැම්මොත් එහෙම."

"ඒ නිවාසේ නේද වොල්, මම කිව්වේ මේ නම නොකියන කෙනා හිටියේ?"

"ඔව්," රොන් කීවේය. ඔහු කළකිරීමෙන් මෙන් ආසනයේ පිටුපසට වුනේය.

Downloaded from sinhalaebooks.com

"දන්නවද, මම හිතන්නේ ස්කැබස්ගේ රැවුලේ කෙළවර ටිකක් ලාපාටයි." රොන්ගේ හිත පාසල් නිවාස වලින් ගලවන අදහසින් හැරී කීවේය . "එතකොට ඔයාගේ ලොකු අයියලා අයින් වෙලා දැන් මොනාද කරන්නේ?"

මායාකාරයෙක් පාසල් අවසන් කළපසු කරන දේවල් ගැන උනන්දු වෙමින් හැරී ඇසුවේය.

"චාලි රොමේනියා වල මකරු අධ්‍යනය කරනවා, බිල් අප්‍රිකාවේ ග්‍රින්ගොට්ස්වල මොනාහරි කරනවා.," රොන් කීවේය. "ඔයාට ආරංචිද ග්‍රින්ගොට්ස් ගැන? ඒවා ඔක්කොම ඩේලි ප්‍රොෆෙට් එකේ තිබ්බා. ඒත් මම හිතන්නේ නෑ ඒක ඔයාට මගල්ලා ගෙන් ලැබෙයි කියලා. කවුදෝ අධිආරක්ශිත සේප්පුවක් කොල්ලකන්න හදලා"

හැරී මදක් බළා සිටියේය.

"ඇත්තට? ඉතිං එයාලට මොකද උනේ?"

"මොකුත්ම නෑ, ඒකයි ඒක එච්චරම ලොකු ප්‍රවෘත්තියක් වෙලා තියෙන්නේ. එයාලාව අල්ලගෙන නෑ. තාත්තානම් කියන්නේ එයා ග්‍රින්ගොට්ස් ඇතුළට ගිහින් එන්න තරම් බලගතු අඳුරු මායාකාරයෙක් වෙන්න ඇති කියලා. ඒත් එයාලා කියන්නේ මොකුත් අරන් නැතිලු, ඒකයි පුදුමේ.. ඇත්තටම මෙහෙම් දෙයක් උනාම හැමෝම බය වෙනවා නම නොකියන කෙනා ඒක පිටිපස්සේ ඉන්නවද කියලා."

හැරී එම ප්‍රවෘත්තිය තම හිත තුළ කරකවමින් සිතුවේය. ඔහුට නම නොකියන කෙනා ගැන සඳහන් කරන සෑම විටම හිතට බියක් දැනෙන්නට පටන්ගෙන තිබේ. ඔහු මේ සියල්ල මායා ලෝකයට ඇතුල්වීමේ කොටසක් ලෙස සැළකුවේය. නමුත් කිසිම කරදරයක් නැතිව වොල්ඩර්මෝට් යැයි කීම ඉතා පහසුය.

"මොකද්ද ඔයාගේ කුඩිච් කණ්ඩායම?" රොන් ඇසුවේය.

"අර් - මම එකක්වත් දන්නේ නෑ," හැරී කීවේය.

"මොකක්!"රොන් මෝඩයෙක් දෙස බලන්නාක්මෙන් බැලුවේය. "ඔහ්, ඔයා ඉන්නකෝ, ඒක තමයි ලෝකේ හොඳම ක්‍රීඩාව" ඉන්පසු ඔහු එහි බෝල හතර ගැන, ක්‍රීඩකයන් හත්දෙනාගේ ස්ථාන, ඔහු තම සොයුරන් සමග ගිය ප්‍රසිද්ධ තරඟ ගැන සහ ඔහුට සල්ලි තිබුනානම් ගන්නා ධාවන කොසු ගැන සහ හැම දේම විස්තර කරන්නට විය. ඔහු හැරීට ඉතා හොඳ විස්තරයක් කරමින් ඉන්නා විට නැවතත් මැදිරි දොර විවෘත විය. නමුත්, මෙවර පැමිණියේ ගෙම්බා නැතිකරගත් නෙවිල් වත් හර්මයිනී ග්‍රේන්ජර් වත් නොවීය.

Downloaded from sinhalaebooks.com

පිරිමි ළමයින් තිදෙනෙක් ඇතුල් විය. හැරී මැදසිටි කෙනා වහා හඳුනා ගත්තේය. ඒ මැඩම් මල්කින්ගේ කබා සාප්පුවේ සිටි සුදුමැලි පිරිමි ළමයා විය. ඔහු ඩයගන් ඇලී හිදී බැලුවාට වඩා ඉතා උනන්දුවෙන් හැරී දෙස බළා සිටියේය.

"ඒක ඇත්තද?" ඔහු කීවේය. "එයාලා කියනවා කෝච්චියේ කෙළවරේම මේ අන්තිම මැදිරියේ හැරී පොටර් ඉන්නවා කියලා. ඉතිං ඒ ඔයාද?"

"ඔව්," හැරී කීවේය. ඔහු අනිත් ළමයින් දෙදෙනා දෙස බළා සිටියේය. ඔවුන් මහත ඉතා නපුරු පෙනුමැති අය වූහ. සුදුමැලි පිරිමි ළමයාගේ දෙපසින් ඔවුන් සිටගෙන සිටියේ පුද්ගලික ආරක්ශකයන් මෙනි.

"ඔහ්, මේ ක්‍රේබ් මේ ගොයිල්" හැරී බළන දෙස තේරුණත් ගණන් නොගත් ඔහු කීවේය. "එතකොට මගේ නම් මැල්ෆෝයි, ඩ්‍රේකෝ මැල්ෆෝයි."

රොන් මදක් කැස්සේය. එහි මද තිගැස්මක් සැඟව තිබිණ. ඩ්‍රේකෝ මැල්ෆෝයි ඔහු දෙස බැළුවේය.

"මගේ නම විහිළුවක් කියලා හිතුවද, ඔයා? ඔයා කවුද කියලා නම් අහන්න ඕනේ නෑ. මගේ තාත්තා කිව්වා වීස්ලිලාට රතු කොන්ඩෙයි, මූණේලපයි, වියදම් කරන්න බැරි තරම් ළමයිනුයි ඉන්නවා කියලා."

ඔහු නැවත හැරී දෙසට හැරුණේය. "ඔයා ඉක්මනටම දැනගනී පොටර්, සමහර මායාකාර පවුල් අනිත් අයට වඩා ගොඩක් හොඳයි කියලා. ඔයා ගිහින් වැරදි විදිහේ අය එක්ක යාළුවෝ හදාගන්න ඕනේ නෑ. මට ඒකට උදව් කරන්න පුළුවන් ඔයාට."

ඔහු තම අත හැරීට දිගු කළේය. නමුත් හැරී එය ඇල්ලුවේ නැත.

"මම හිතන්නේ මට නොගැලපෙන වර්ගේ අය කවුද කියලා මට කියන්න පුළුවන්, ස්තූතියි," ඔහු සහැල්ලුවෙන් කීවේය.

ඩ්‍රේකෝ මැල්ෆෝයි රතු වූයේ නැත. නමුත් ඔහුගේ සුදුමැලි කම්මුල් රෝස පාට විය.

"මම ඔයා උනානම් මම පරිස්සම් වෙනවා පොටර්," ඔහු සෙමින් කීවේය. "ඔයා ටිකක් නිහතමානී නොවුනොත් ඔයත් යන්නේ ඔයාගේ දෙමාපියෝ ගිය පාරෙම තමයි. එයාලත් තමන්ට හොඳ මොනාද කියලා දැනගෙන හිටියේ නෑ. ඔයා මේ කිසි වැදගත්කමක් නැති වීස්ලිලායි අර හැග්‍රිඩ්වයි ආශ්‍රය කරොත් ඔයාත් ඒ වගේ වෙයි."

Downloaded from sinhalaebooks.com

රොන් සහ හැරී දෙදෙනාම සිට ගත්තෝය.

"ඒක ආයෙත් කියනවා බලන්න," රොන් කීවේය. ඔහුගේ මුහුණත් කොන්ඩය මෙන් රතු වී තිබිණි.

"ඔහ්, ඔයා අපිත් එක්ක ගහගන්නද හදන්නේ, ඈ?" මැල්ෆෝයි ඔච්චම් කළේය.

"ඔයා දැන් එළියට නොගියොත්" හැරී තමන්ට දැනුනාටත් වඩා ධෛර්යයෙන් කීවේය. මන්ද යත් ක්‍රේබ් සහ ගොයිල් ඔහුටත් රොන්ටත් වඩා බොහෝ විශාළ විය.

"ඒත් අපිට යන්න හිතෙන්නේ නෑනේ, නේද කොල්ලනේ? අපි අපේ කෑම ඔක්කොම කෑවා ඒත් ඔයාලට තව තියනවා වගේ"

ගොයිල් රොන් අසල තිබූ චොකලට් ගෙම්බන් ගැනීමට අත දිගු කළේය. රොන් ඉදිරියට නැවුනේය. නමුත් රොන් ගොයිල්ව ඇල්ලීමටත් පෙර ගොයිල් භයානක ලෙස කෑගැසුවේය.

ස්කැබස් ඔහුගේ ඇඟිල්ලේ එල්ලී සිටියේය. තියුණු උල් දත් ඔහුගේ ඇඟිලි පුරුක් අතරට කිඳාබැස තිබිණි. ගොයිල් හූ තියමින් ස්කැබස්ව රවුමට කරකවද්දී ක්‍රැබ් සහ මැල්ෆෝයි පසුපසට වුනෝය. අවසානයේ ස්කැබස් විසිවී ගොස් ජනේලයේ වැදුනෙන් තිදෙනාම වහා අතුරුදන් වූහ. සමහර විට එහි පැණිරස කෑම අතර තවත් මීයන් සිටිතැයි ඔවුන් හිතුවා වන්නට පිළිවනි. නැතහොත් ඔවුන්ට කවුරුන් හෝ එනවා ඇසෙන්නට ඇත, මන්ද තප්පරයකට පසු හර්මයිනී ග්‍රැන්ජර් ඇතුලට ආවාය.

"මොකද උනේ?" පැණිරස කෑම හැමතැනම විසිර තිබෙන අතර රොන් ස්කැබස්ව වලිගයෙන් ඔසවන දෙස බලා ඇය ඇසුවාය.

"මම හිතන්නේ එයා ඉවරයි" හැරී රොන්ට කීවේය. ඔහු ස්කැබස් දෙස ළංවී බැලුවේය. "නෑ - මම නම් ඒක විශ්වාස කරන්නේ නෑ - ඌ ආපහු නිදි "

ඇත්තටම සිදු වූයේ එයයි.

"ඔයාට කලින් මැල්ෆෝයිව මුණගැහිල තියනවද?"

හැරී ඩයගන් ඇලී වල ඔහු හමුවූ සිදුවීම විස්තර කළේය.

Downloaded from sinhalaebooks.com

"මම එයාගේ පවුල ගැන අහලා තියනවා" රොන් අඳුරුලෙස කීවේය. "එයාලා නම නොකියන කෙනා අතුරුදන් වුනාම අපේ පැත්තට ආපු මුල්ම පවුල්වලින් එකක්. එයාලා කියන්නේ එයාලව වශී කරාලු. මගේ තාත්තා ඒක විශ්වාස කරන්නේ නෑ. එයා කියන්නේ මැල්ෆෝයිගේ තාත්තාට අඳුරු පැත්තට යන්න හේතුවක් ඕනේ නෑ කියලා." ඔහු හර්මයිනී දෙසට හැරුනේය. "ඔයාට අපෙන් මොනාහරි උදව්වක් ඕනෙද?"

"ඔයාලා ඉක්මන් කරලා ඔයාලගේ කබා ඇඳගත්තොත් හොඳයි. මම දැන් ඉස්සරහට ගියා කොන්දොස්තරගෙන් අහන්න. එයා කියනවා අපි ගොඩක් ලඟයි කියලා. ඔයාලා රණ්ඩු කරේ නෑ නේද? නැත්තන් අපි එහෙට යන්නත් කළින් ඔයාලා අමාරුවේ වැටෙයි!"

"ස්කැබස් තමයි රණ්ඩු කළේ. අපි නෙවෙයි.," රොන් ඇයට ඔරවමින් කීවේය "ඔයාට පුළුවන්ද අපි ඇඳුම් මාරු කරනකන් මෙතනින් යන්න?"

"හරි හරි- මම මෙහෙට ආවේ එළියේ මිනිස්සු එහාට මෙහාට තරහෙට දුව දුව බබාලා වගේ හැසිරෙන නිසා විතරයි " හර්මයිනී කීවාය. "අනික ඔයාගේ නහය උඩ කුණු ගෑවිලා, ඉතිං ඒක ඔයා දැනගෙන හිටියද?"

ඇය පිටවත්ම රොන් ඇට රැව්වේය. හැරී ජනේලයෙන් එළිය බැලුවේය. කළුවර වෙමින් තිබේ. තද දම් පැහැ අහස යට කඳු සහ කැළෑ පෙනෙන්නට තිබේ. දුම්රිය මදක් වේගය අඩු කළ බවක් දැනේ.

ඔහු රොන් සමග තම ජැකට් ගලවා දිගු කළු කබා ඇඳගත්තෝය. රොන්ගේ එක මදක් කොට වී ඔහුගේ සපත්තු පෙනෙන්නට තිබේ.

දුම්රිය පුරා කටහඬක් රැව් දෙන්නට විය: " අපි විනාඩි පහක් තුළ හොග්වාර්ට්ස් වෙත ලඟා වීමට නියමිතයි. කරුණාකර ඔබගේ බඩු භාන්ඩ දුම්රිය තුළ තබා යන්න. ඒවා වෙනම පාසල වෙත ගෙන යනු ඇත."

නොසන්සුන්කමට හැරීගේ බඩ දැඟලුවේය. රොන් තම ලප වලට යටින් සුදුමැලි වී සිටිනු පෙනිණි. ඔවුන් තම සාක්කු අවසන් රසකැවිලි වලින් පුරවාගෙන කොරිඩෝව තුළ තෙරපෙන අය අතරට එක් වූහ.

දුම්රිය වේගය අඩුකරමින් ගොස් අවසානයේදී නැවතින. ජනයා දොර දෙසට තෙරපී ගොස් අවසානයේ ඉතා කුඩා අඳුරු වේදිකාවකට පා තැබුවෝය. රාත්‍රී සිසිල් සුළඟේ හැරී වෙව්ලන්නට විය. ඉන්පසු සිසුන්ගේ හිස්වලට ඉහළින් ලන්තෑරුමක් වැනෙමින් පැමිණියේය. ඒ සමග හැරීට පුරුදු කටහඬක් ඇසිණි. "පළවෙනි අවුරුද්දේ අය! පළවෙනි අවුරුද්දේ අය මෙහෙට එන්න! හැරී ඔයා හොඳින් නේද?"

හැග්‍රිඩ්ගේ කෙස් සහිත විශාල හිස මිනිස් හිස් ගංඟාව උඩින් මතු විය.

Downloaded from sinhalaebooks.com

"ඉක්මන් කරන්න, මගේ පස්සෙන් එන්න - තව පළවෙනි අවුරුද්දේ අය ඉන්නවද? හා බළාගෙන පරිස්සමින්! පළවෙනි අවුරුද්දේ අය මගේ පස්සෙන් එන්න!"

ලෙස්සමින් සහ තද වෙමින් ඔවුන් හැග්‍රිඩ් පසුපස පටු බෑවුම් පාරකට පැමිණියෝය. එය ඉතා අඳුරු වූවෙන් දෙපස විශාල ගස් ඇතැයි හැරි සිතුවේය. කිසිවෙක් වැඩි කතාවක් නොකලහ. නිතරම ගෙම්බාව නැතිකරගන්නා ළමයා, නෙවිල් එක්වරක් හෝ දෙවරක් නාසය ඉහල ඇද්දේය.

"ඔයාලාට තප්පරේකින් හොග්වාර්ට්ස් දකින්න ලැබෙයි.," හැග්‍රිඩ් උරහිසට උඩින් හැරී කීවේය. "මේ නැම්මෙන් පස්සේ."

මහත් "ඕඕහ්" හඬක් නැගිණි..

පටු පාර අවසන් වූයේ විශාල කළු වැවක් ලඟිනි. එයින් අනෙක් පැත්තේ උස් කන්දක් විය. එහි තරු පිරි අහසේ දිළිසෙන ජනේල, ආරක්ශක කොටු සහ උස් කුළුණු වලින් සමන්විත අති දැවැන්ත මාලිගයක් දක්නට ලැබිණ..

"එක බෝට්ටුවට හතරදෙනාට වැඩියෙන් බෑ" ඇණියේ නවතා තිබූ කුඩා බෝට්ටු සමූහයක් පෙන්නා හැග්‍රිඩ් කීවේය.. හැරී සහ රොන් නෙවිල් සහ හර්මයිනී පිටුපස තම බෝට්ටුව වෙත ගියෝය. "හැමෝම නැග්ගද?" තනි බෝට්ටුවකට නැගගත් හැග්‍රිඩ් කෑගැසුවේය. "හරි එහෙනම් - ඉදිරියට!"

ඒ සමග කුඩා බෝට්ටු සමූහය එක්වර ඇණියෙන් පිටත් විය. වීදුරුවක් මෙන් සුමට ජලතලයේ බෝට්ටු සෙමින් ඉදිරියට ඇදිණි. ඉදිරියේ ඇති දැවන්ත මාළිගය දෙස බළමින් සියල්ලෝම නිහඬව සිටිති. ඔවුන් ඊට ලංවත්ම එය ඉහළට ඉහළට උස්ව පෙනෙන්නට විය. අවසානයේ ඔවුන් එය පිහිටි කන්ද කෙළවරටම ආවෝය.

"ඔලු නවන්න!" මුල්ම බෝට්ටුව කන්ද පාමුළට යත්ම හැග්‍රිඩ් කෑ ගැසුවේය. ඔවුන් සියල්ලෝම හිස නැවූ පසු කන්ද මතින් වැවී ඇති අයිවී වැල් තට්ටුවකින් වැසී තිබූ කන්දේ විවරයක් තුළට බෝට්ටු ගමන් කරන්නට විය. තමන් මාළිගයට යටින් යන්නාක් මෙන් දැනෙන අඳුරු උමගක් තුළින් ඔවුන් ගමන් කොට පොළොව යට ගල් සහ වැලි වලින් සෑදි වරායක් වැනි තැනකට ගොඩ බැස්සහ.

"ඒයි, මේ ඔයා! මේ ඔයාගේ ගෙම්බාද?" ළමුන් බෝට්ටුවෙන් පිටවූ පසු ඒවා පරික්ශා කරමින් සිටි හැග්‍රිඩ් කීවේය.

"ට්‍රෙවර්!" නෙවිල් සතුටින් කෑගසමින් තම දෑත් දිගු කළේය.

Downloaded from sinhalaebooks.com

ඉන්පසු ඔවුන් හැග්‍රිඩ්ගේ ලන්තෑරුම පිටුපසින් කන්ද ඉහළට පාරක් දිගේ ගමන් කොට මාලිගාවේ සෙවනැල්ල යට වූ කිළිටු තණකොළ පිටියකට සේන්දු වූහ.

ඔවුන් ගල් පඩිපෙළක් දිගේ ගමන් කොට විශාල ඕක් දොරක් ඉදිරිපස රොක් වූහ.

"හැම්මොම ඉන්නවද මෙතන? මේ ඔයා, ඔයාගේ ගෙම්බා තාම ඉන්නවද?"

හැග්‍රිඩ් තම යෝධ අත මිට මොළවා මාළිගා දොරට තුන්වරක් තට්ටු කළේය.

හත්වෙනි පරිච්ඡේදය

තෝරන තොප්පිය

දොර එක්වරම පැද්දී විවෘත විය. මරකත කොළ පැහැ කබායක් ඇඳගත් කළු හිසකෙස් ඇති උස මායාකාරියක් එහි සිටගෙන සිටියාය. ඇයට දැඩි පෙනුමැති මුහුණක් තිබුනෙන් හැරීට පැමිණි මුල්ම අදහස වූයේ ඇය සමග නම් ලේසි නොවනු ඇති බවයි.

"ප්‍රොෆෙසර් මැක්ගොනගල් මේ පළවෙනි අවුරුද්දේ අය," හැග්‍රිඩ් කීවේය.

"ස්තුතියි හැග්‍රිඩ්, මම මෙයාලව මෙතන ඉඳලා අරන් යන්නම්."

ඇය දොර පළල්ව විවෘත කළාය.. ඇතුල්වීමේ ශාලාව ඩර්ස්ලිගෙ සම්පූර්ණ නිවස මෙන් පස්ගුණයක් පමණ විශාල විය. ගල් බිත්ති ග්‍රින්ගොට්ස් හී මෙන් පන්දම් වලින් ආලෝකමත් වී තිබිණි. සිවිළිම යා නොහැකි තරම් උසින් පිහිටි අතර ඔවුන්ට මුහුණ ලා පිහිටි මාබල් ඇතිරූ පඩිපෙළ ඉහළ මහල් කරා විහිදිණි.

ඔවුන් කොඩි සටහන් වූ ගල් පොළොව හරහා ප්‍රොෆෙසර් මැක්ගොනගල පසුපසින් යන්නට විය. දකුණු පසින් පිහිටි දොර දෙසින් සියගණනක් කට හඬවල් හැරීට ඇසෙන්නට විය. පාසලේ ඉතිරි සියල්ලෝම දැනටමත් එහි සිටිනවා විය යුතුය. නමුත් ප්‍රොෆෙසර් මැක්ගොනගල් ඔවුන්ව ශාලාවේ තිබූ කුඩා හිස් කුටියකට රැගෙන ගියාය. ඔවුන් ඊට ඇතුල් වී නිතරම කරන්නාක් මෙන් නැතිව සිටගෙන නොසන්සුන්ව එකිනෙකාට කිට්ටු වී සිටියහ.

"ඔයාලාව හොග්වාට්ස් වලට සාදරයෙන් පිළිගන්නවා" ප්‍රොෆෙසර් මැක්ගොනගල් පැවසුවාය. "වාරය ආරම්භවන උත්සවය තව ටිකකින් පටන් ගන්නවා. ඒත් ඔයාලා ප්‍රධාන ශාලාවේ ගිහින් ඉඳගන්න කලින් ඔයාලාව නිවාස වලට තෝරා ගන්නවා. තේරීමේ උත්සවය ඉතාම වැදගත්. මොකද ඔයාලා මෙහේ ඉන්නකන්, නිවාසේ කියන්නේ

Downloaded from sinhalaebooks.com

හොග්වාර්ට්ස් වල ඔයාගේ පවුල වගේ. ඔයාලට පවුලේ අනිත් අය එක්ක පංති තියෙයි. ඔයාලා නිදාගන්නේ නිවාසෙට වෙන් කරපු කොටසේ. ඔයාලගේ නිදහස් වෙලාව නිවාසේ පොදු කාමරේ ගත කරන්න පුළුවන්..

"නිවාස හතර තමයි ග්‍රිෆින්ඩෝර්, හෆල්පෆ් රේවන්ක්ලෝ සහ ස්ලිදරින්. හැම නිවාසෙටම වටිනා ඉතිහාසයක් තියනවා. ඒ වගේම හැම නිවාසෙන්ම විශිෂ්ඨ මායාකාරයෝ සහ මායාකාරියෝ හැදිලා තියනවා. ඔයාලා හොග්වාර්ට්ස් වල ඉන්නකොට ගන්න ජයග්‍රහණ වලින් නිවාසෙට ළකුණු ලැබෙනවා. ඒ වගේම මොනාහරි නීතියක් කැඩුවොත් නිවාසේ ළකුණු කැපෙනවා. අවුරුද්ද අවසානයේ වැඩිම ළකුණු ගත්ත නිවාසෙට නිවාස කුසළානය ප්‍රධානය කරනවා, ලොකු ගෞරවයක් ඒක. මම විශ්වාසකරනවා ඔයාලාට ලැබෙන නිවාසෙට ඔයාලා හැමෝම හොඳ සාමාජිකයෙක් වෙයි කියලා.

"තේරීමේ උත්සවය තව විනාඩි කීපයකින් පාසලේ අනෙක් අය ඉදිරියේ පවත්වනවා.. මම යෝජනා කරනවා ඔයාලා රැඳීසිටින අතරේ පුළුවන් තරම් හොඳට නුවණක්කාර වෙන්න කියලා."

ඇගේ ඇස් මොහොතකට වම්පැත්තේ කණ ළඟින් ඉස්සුනු නෙවිල්ගේ කබාය මතත්, රොන්ගේ නහය මතත් රැඳුණි. හැරී නොසන්සුන්ව තම හිසකෙස් තදකර ගැනීමට උත්සාහ කළේය.

"අපි ඔයාලා වෙනුවෙන් ලැස්ති උනාම මම ආපහු එන්නම්, කරුණාකරලා සද්ද නැතිව ඉන්න.."

ඇය කුටියෙන් ඉවත්ව ගිය පසු හැරී කෙළ ගිල්ලේය.

" හරියටම කොහොමද එයාලා අපිව නිවාස වලට බෙදන්නේ?" හැරී රොන්ගෙන් ඇසුවේය.

"මොකක් හරි පරීක්ශණයක් තියනවා, මම හිතන්නේ. ෆ්‍රෙඩ් කිව්වා ඒක ගොඩාක් රිදෙනවාලු, ඒත් මම හිතන්නේ එයා විහිළුවක් කරේ."

හැරීගේ හදවත වේදනා දුන්නේය. පරීක්ශණයක්? මුළු ඉස්කෝලෙම ඉස්සරහා? නමුත් ඔහු තවමත් කිසිම මන්තරයක් දැන සිටියේ නැත. දැන් කුමක් කළ යුතුද? මෙහි පැමිණි මොහොතේ ඔහු එවැනි දෙයක් බළාපොරොත්තු වූයේ නැත. ඔහු කම්පාවෙන් වට පිට බළන විට අනෙක් සියල්ලෝමත් බිය වී සිටිනු දුටුවේය. කවුරුත කතා කළේ නැත. නමුත් හර්මයිනී ග්‍රැන්ජර් පමනක් තමා පාඩම් කළ සියළුම මන්තර මුමුණමින් තමාට කුමක් අවශ්‍ය වේ දැයි සිතුවාය. හැරී ඇයට ඇහුම්කන් නොදීමට තදින්ම උත්සාහ කළේය. ඔහු කිසිම දිනෙක මෙතරම් අසීරුවට පත්වූයේ නැත. ඩර්ස්ලි නිවසේ සිරින විට ඔහු කෙසේ හෝ පංතියේ ගුරුතුමාගේ බොරු කොණ්ඩය නිල පාටට හැරවූ බව කියැවෙන් වාර්ථාවක් ගෙදර ගෙන යාමට සිදු වූ අවස්ථාවේ වත් ඔහු මෙසේ කළබල නොවීය. ඔහු දොර දෙසම බළා සිටියේය. දැන් දැන් ප්‍රොෆෙසර් මැක්ගොනගල් පැමිණ ඔහුව තම විනාශය කරා කැඳවාගෙන යනු ඇත.

Downloaded from sinhalaebooks.com

ඉන්පසු යමක් සිදු වූයේ ඔහු අඩියක් පමණ උඩ පැන්නේය. ඔහු පිටුප සිටි කීපදෙනෙක් කෑගැසූහ.

"මොන මගුලක්ද --?"

ඔහු ගැස්සුනේය. ඔහු වටේ සිටි අයත් ගස්සුනි. එක්වරම පිටුපස බිත්තියෙන් අවතාර විස්සක් පමණ ඇතුළට ඇදී ආහ. සුදෝ සුදු යන්තම් විනිවිද පෙනෙන ඔවුන් යන්තමින්වත් නවක සිසුන් දෙස යන්තමින්වත් නොබලමින් එකිනෙකා සමගින් කතා කරමින් කාමරය පුරා පාවෙන්නට විය. ඔවුන් වාද කරන බවක් පෙනෙන්නට තිබිණි. මහත කුඩා පැවිද්දෙක් මෙන් පෙනුන අයෙක් කතා කෙළේය. "සමාවදීලා අමතක කරන්න, මම කියන්නේ අපි එයාට දෙවෙනි අවස්ථාවක් දෙන්න ඕනේ කියලා. "

" ෆ්‍රියර් මගේ යාළුවේ, අපි පීව්ස්ට ලැබෙන්න ඕනේ ඔක්කොම අවස්තාවන් දුන්නේ නැද්ද? එයා අපි ඔක්කෝටම නරක නමක් දුන්නේ, අනික ඔයා දන්නවානේ එයා ඇත්තටම භූතයෙක්වත් නෙවෙයි කියලා. මම කියන්නේ, ඔයාලා සේරම මෙතන මොකද කරන්නේ?"බෙල්ල වටා රැළි කළ රවුමක් වැන්නක් සහ තද ඇඳුමක් ඇඳ සිටි අවතාරයක් හදිසියේ සිසුන්ව දැක්කේය.

කිසිවෙක් උත්තර දුන්නේ නැත.

"අළුත් ළමයි!" සියළු දෙනාම සමග සිනාසෙමින් මහත පැවිද්දා කීවේය. "තේරීමේ උත්සවයට ලෑස්තිවෙලා ඉන්නේ නේද?"

කිහිප දෙනෙක් කිසිත් නොකියමින් හිස් සැලූහ.

"ඔයාවා හෆල්පෆ් වල දකින්න බලාපොරොත්තු වෙනවා!" පැවිද්දා කීවේය. "ඔයා දන්නවද, ඒක මගේ පරණ නිවාසේ."

"ආ දැන් අයින් වෙන්න," තියුණු කටහඬක් ඇසිණි. "තේරීමේ උත්සවය පටන් ගන්නයි යන්නේ."

ප්‍රොෆෙසර් මක්ගොනගල් ආපසු පැමිණ තිබේ. එකා බැගින් සියළුම අවතාරයන් අනෙක් පස වූ බිත්තිය හරහා නොපෙනී ගියෝය.

"දැන්, පේලියක් හැදෙන්න," "මගේ පස්සෙන් එන්න."

Downloaded from sinhalaebooks.com

අමුතු හැඟීම් සහිතව ගමන් කිරීම පටන්ගද්දී හැරී දුඹුරු කෙස් ඇති පිරිමි ළමයෙකුගේ පිටුපසින් පෝළිමට එක්වූයෙන් රොන් ද හැරීගේ පිටුපසින් කුටියෙන් එළියට ගමන් කරන්නට විය. ඔවුන් ශාලාව හරහා ගොස් පියන් දෙකේ දොරවල් දෙකක් පසුකොට ප්‍රධාන ශාලාවට ඇතුල් වූහ

හැරී කිසිම දිනක මෙවණි අමුතු සහ අනර්ඝ සිථනයක් ගැන සිතා තිබුනේවත් නැත. දිග අනෙක් ළමයින් ඉඳගෙන සිටි දිගු මේස හතරට ඉහළින් වාතය තුළ පාවෙන දහස් ගණනක් වූ ඉටිපන්දම් වලින් එය ආලෝකමත් කර තිබිණි.. එම මේස මත රන් පැහැයෙන් දිදුළන පිඟන් සහ කුසළාන තබා තිබිණි. ශාලාවේ ඉදිරිපස ගුරුවරුන් ඉඳගෙන සිටි තවත් දිගු මේසයක් විය. ප්‍රොෆෙසර් මැක්ගොනගල් පළමු වසරේ සිසුන්ව ඒ වෙත කැඳවාගෙන ගියෙන් ඔවුන් අනෙක් ළමයින්ට මුහුණලා ගුරුවරුන්ට ඉදිරිපසින් පේළියට සිටියෝය. සෙලවෙන ඉටිපන්දම් එළිය යට වූ සුදුමැලි ලන්තෑරුම් මෙන් දිස් වූ සියගණනක් මුහුණු ඔවුන් දෙස බළා සිටී. ළමුන් අතර එහා මෙහා යමින් අද්භූත රිදී පැහැයෙන් බබළමින් අවතාරයන් ද සිටී. ඔවුන්ගේ ඇස් මග හැරීමට සිතා හැරී උඩ බැලූවෙන් වෙල්වට් මෙන් කළු පැහ තරු පිරි සිවිලිම දුටුවේය.

"ඒකට මතුරලා තියෙන්නේ එළියේ අහස වගේම පේන්න. මම හොග්වාර්ට්ස් ඉතිහසය පොතේ ඒක කියෙව්වා." හර්මයිනී රහසින් මිමිනුවාය.

එහි සිවිලිමක් ඇති බවට විශ්වාස කිරීමත් අසීරුය. ප්‍රධාන ශාලාව නිකම්ම දෙව්ලොව වෙත විවෘත්තව තිබෙන්නාක් මෙන් පෙණින.

ඔවුන් ඉදිරිපිට ප්‍රොෆෙසර් මැක්ගොනගල් නිහඬවම කකුල් හතරේ බංකුවක් තැබූවෙන් හැරී වහාම බිම බලාගත්තේය. බංකුව මත ඇය උල් මායා තොප්පියක් තැබුවාය. ඒ මායා තොප්පිය ඉරී පොඩි වී අතිශයින්ම කිළුටු වී තිබුනේ පෙටූනියා නැන්දා වුවද නිවසේ තබා නොගනු ඇත.

සමහර විට ඔවුන්ට ඉන් හාවෙක් ඉවතට ගැනීමට සිදුවෙනු ඇත. හැරී බොහෝ සේ සිතා එය එසේ විය යුතුයැයි තීරණය කළේය. ශාළාවේ සිටින සියල්ලක්ම තොප්පිය දෙස බළා සිටින බව පෙනුනෙන් හැරී ද එදෙස බැලීය. තප්පර කිහිපයකට එහි සම්පූර්ණ නිහඬතාවයක් විය.. ඉන්පසු තොප්පිය ගැස්සුණේය. වාටිය අසල වූ ඉරුමක් කටක් මෙන් පළල්ව විවෘත විය. ඉන්පසු තොප්පිය ගායනාවක් පටන් ගත්තේය.

"ඔහ්, ඔබ සිතන්නේ නැතිව ඇති මම සුන්දරයි කියා,

නමුත් දකින දෙයින් තීන්දු දෙන්න එපා,

ඔබට පුළුවනි නම් සොයාගන්න මට වඩා දක්ෂ තොප්පියක්

මම මාවම කන්නම්

තියාගන්න් ඔබේ කළු බෝල්ස් තොප්පිය,

ඔබේ උස සිල්ක් තොප්පිය,

Downloaded from sinhalaebooks.com

මමයි හොග්වාර්ට්ස්හි තෝරන තොප්පිය

මට ඒ ඔක්කොම පැරදිය හැකියි.

ඔය ඔළුවේ කිසිත් හැංගිලා නැතේ

තෝරන තොප්පියට නොපෙනෙන

ඉතිං මාව දාගෙන බලන්න, මම කියන්නම්

ඔබ කොහෙටද අයිති කියා

ඔබ ග්‍රිෆින්ඩෝර් වළට අයිති විය හැක.

හදවතින්ම දහිරියමත් අය සිටිනා

ඔවුන්ගේ අභියෝගාත්මක බව, සංවේදීකම, උත්කෘශ්ඨ බව ග්‍රිෆින්ඩෝ උසස් කරයි.

ඔබ හෆල්පෆ් වලට අයත් විය හැක.

නොසෙල්වෙන පක්ශපාතී අය සිටිනා

හෆල්පෆ් අයගේ ඉවසීම ඇත්තයි. මහන්සිවීමට නොබියයි.

එහෙමත් නැත්තන් පැරණි බුද්ධිමත් රේවන්ක්ලෝ

ඔබ සූදානම් සිතක් ඇත්නම්

නිර්භීත සහ ඉගෙනගන්නා අය නිබඳවම ඔවුන්ගේ කරුණාවට ලක්වේවි.

ඒමත් නැත්නම් ස්ලිදරින් වල

ඔබ ඔබේ නියම මිතුරන් හදාගනී

ඒ කපටියෝ මොනාම හරි කර තමන්ගේ අවසානය තෙක් දිනාගනී.

ඉතින් මාව දාගන්න.! එපා බය වෙන්න!

පැකිලෙන්න එපා!

ඔබ මගේ අතේ සුරක්ශිතයි (මට අත් නැතත්)

මම හිතන තොප්පිය නිසා!"

Downloaded from sinhalaebooks.com

තොප්පිය තම ගායනාව ඉවර කරද්දීම ශාලාව අත්පොලසන් නදින් පිරී ගියේය. එය දිග මේස හතරටම හිස නවා ආචාර කොට නැවතත් නිහඬව නොසෙල්වී සිටියේය.

"ආ අපිට තියෙන්නේ තොප්පිය දාලා බලන්න නේ!" රොන් හැරීට කෙඳිරීය. "මම ෆ්‍රෙඩ්ව මරනවා. එයා මට කියෙව්වා ට්‍රෝල් කෙනෙක් එක්ක සටන් කරන්න වෙන එකක් ගැන."

හැරී දුර්වල ලෙස සිනාසුනේය. ඔව්, මන්තරයක් කරන්න සිදුවෙනවාට වඩා තොප්පිය දමා බැලීම බොහෝම හොඳයි. නමුත් ඔවුන් එය කවුරුත් බලා නොසිටින විට කළානම් යැයි හැරී සිතුවේය. තොප්පිය ඉල්ලන දේවල් ඕනෑවට වැඩි බව පෙනේ. හැරීට මේ මොහොතේ දහිරියක් හෝ හදිසි බුද්ධියක් හෝ ඒ කිසිවක් දැනුනේ නැත. තොප්පිය මදක් අසනීප මෙන් දැනෙන පුද්ගලයන් දමන නිවාසයක් ගැන සඳහන් කලානම් එය ඔහු අයිති නිවාසය වනු ඇත.

ප්‍රොෆෙසර් මැක්ගොනගල් දැන් රෝල් කළ දිග කඩදාසියක් අතැතිව ඉදිරියට ආවාය.

"මම නම කතාකරන කොට ඇවිත් තොප්පිය දාගෙන බංකුවේ ඉඳගන්න ඕනේ නිවාසේ තෝරගන්න," ඇය කීවාය. "ඇබොට්, හනා!"

රෝස පාට මූණක් සහ කහ පාට කොන්ඩ දෙකක් බැඳි ගැහැණු ළමයෙක් පෝළිමෙන් එළියට ගොස් තොප්පිය දමා ගත්තාය. තොප්පිය ඇගේ ඇස් වැහෙන තරමටම පහළට වැටිනි. මද නිහැඩියාවකට පසු--

"හෆල්පෆ්!" තොප්පිය කෑගැසුවේය.

හනා ගොස් දකුණු පස මේසයේ ඉඳගද්දී එහි සිටි සිසුන් ඔල්වරසන් දෙමින් අත්පොළසන් නැගුහ. මහත පැවිදි අවතාරය ඇයට අත වනනු හැරී දුටුවේය.

"බොනස්, සූසන්!"

"හෆල්පෆ්!" තොප්පිය නැවත කෑගැසුවේය. සූසන් හනා ලඟ ඉඳ ගැනීමට දිව ගියාය.

"බූට්, ටෙරී!"

"රේවන්ක්ලෝ!"

Downloaded from sinhalaebooks.com

වම් පැත්තෙන් දෙවෙනියට තිබූ මේසයේ සිසුන් මෙවර අත්පොළසන් දුන්හ. ටෙරී එහි යද්දී කීප දෙනෙක් නැගිට ඔහුට අතට අත දුන්හ.

" බ්‍රොකල්හස්ට්, මැන්ඩි" ද රේවන්ක්ලෝ වෙත ගියාය. "බ්‍රවුන්, ලැවැන්ඩර්" පළමු ග්‍රිෆින්ඩෝර් සිසුවිය වූ අතර වම් කෙළවරේ මේසය ඔල්වරසන් හඬින් ගිගුම් දුනි. රොන්ගේ නිවුන් සොයුරන් ඇයට ඉඟි කරනු හැරීට පෙනුනි.

"බල්ස්ට්‍රෝඩ්, මිලිසන්ට්" ස්ලිදරින් වලට තේරිණි. හැරීට ඔවුන් බොහෝ අප්‍රසන්න ලෙස පෙණින. ඒ හැරී ස්ලිදරින් ගැන අසා තිබූ දේවල් අනුව මවාගත් අයුරින් පෙනුනා වන්නට ද හැක. ඔහුට අනිවාර්යයෙන් දැන් නම් අසනීප ගතියක් දැනෙන්නට විය. ඔහුට පැරණි පාසලේදී කණ්ඩායම් සඳහා තෝරා ගත් අයුරු මතක් විය. ඔහු හැම විටම අවසන් තේරීම විය. ඒ ඔහු අනවශ්‍ය වූ නිසා නොව කිසිවෙක්වත් තමන් ඔහුට කැමති යැයි ඩඩ්ලිට හිතෙනවාට අකමැති වූ නිසාවෙනි.

"ෆින්ච්-ෆ්ලෙට්ච්ලි, ජස්ටින්!"

"හෆල්පෆ්!"

සමහර විටෙක තොප්පිය එක්වරම නිවාසයේ නම කියා කෑගසනු ද සමහර විටෙක තීරණය කිරීමට මදක් වෙලා ගනු ද හැරීට පෙණින. "ෆිනිගන්, සීමස්," හැරී අසල සිටි දුඹුරු කෙස් ඇති ළමයා ගොස් බංකුවේ වාඩි විය. ඔහුගේ නිවාසය ග්‍රිෆින්ඩෝ යැයි සඳහන් කරන තෙක් ඔහු සම්පූර්ණ විනාඩියක් පමණ එහි හිඳගෙන සිටියේය.

"ග්‍රේන්ජර්, හර්මයිනී!"

හර්මයිනී බංකුව වෙත දිවගොස් වහාම තොප්පිය තම හිසට තද කර ගත්තාය.

"ග්‍රිෆින්ඩෝ!" තොප්පිය කෑ ගැසුවේය. රොන් ගෙරෙව්වේය.

හැරීගේ සිතට භයානක සිතිවිල්ලක් ආවේ ඔහු බයවෙන සෑම විටකම සිදු වෙන අයුරිනි. ඔහුව කිසිම විදිහකින් තෝරා නොගත්තොත් කුමක් වේද? ඔහු තම ඇස් වලට උඩින් තොප්පිය දාගෙන අවුරුදු ගණනාවක් සිටියොත්, ඉන්පසු ප්‍රොෆෙසර් මැක්ගොනගල් පැමිණ තොප්පිය ඇද දමා කිසියම් වරදක් වී ඇති බැවින් දුම්රියෙන් ආපසු යන ලෙස කීවොත්?

Downloaded from sinhalaebooks.com

නිතරම ගෙම්බාව නැති කරගන්නා පිරිමි ළමයා නෙවිල් ලොන්ග්බොටම්ට කතා කළ පසු බංකුව වෙත යන අතරේ ඔහු ඇදගෙන වැටුණේය. තොප්පිය නෙවිල් ගැන තීරණය කිරීමට බොහෝ වෙලාවක් ගෙන අවසානයේ, "ග්‍රිෆින්ඩෝ," ලෙස කෑ ගැසූ පසු ඔහු තොප්පිය නොගලවා දිව ගොස් නැවත පැමිණ සිනා මැද එය "මැක්ඩොගල්, මොරාග්." වෙත භාර දුන්නේය.

තම නම කියවෙද්දී ඉදිරියට පැන්න මැල්ෆෝයි තම බලාපොරොත්තුව එක්වරම ඉටුකරගත්තේය. තොප්පිය "ස්ලිදරින්" යැයි කෑගසන විට එය ඔහුගේ හිසේ යන්තමට ගෑවුනා පමණි.

මැල්ෆෝයි ඉතා සතුටින් තම මිතුරන් වූ ක්‍රේබ් සහ ගෝයිල් වෙත ගියේය.

දැන් එහි බොහෝ පිරිසක් ඉතිරිව සිටියේ නැත. "මූන්" "නොට්" "පාකින්සන්" ද ඉන්පසු "පාටිල්" සහ "පාටිල්" නම් නිවුන් ගැහැණු ළමුන් ජෝඩුවක්ද ඉන්පසු "පර්ක්ස්, සැලී-ඈන්" සහ ඉන්පසු , අන්තිමේදී- "පොටර්, හැරී!"

හැරී ඉදිරියට යත්ම ශාලාව පුරාම ගින්දර පිඹිනවා මෙන් වූ මුමුණන හඬවලින් ශාලාව පිරී ගියේය.

"එයා කිව්වේ පොටර් කියලද?"

" හැරී පොටර්?"

තොප්පිය ඇස් මතින් වැටෙන්නට පෙර හැරී අවසන් වරට දුටුවේ ශාලාව පිරුණු ළමුන් ඔහුව හොඳින් දැක ගන්නට තෙරපෙන අයුරුයි. ඊලඟ තප්පරයේ ඔහු දුටුවේ තොප්පියේ කළු පැහැ ඇතුල් පැත්තයි. ඔහු රැඳී සිටියේය.

"හ්ම්ම්ම්," සියුම් කටහඬක් ඔහුගේ කණට ඇහිණි. "අමාරුයි. ගොඩක් අමාරුයි. ගොඩක් උත්සාහවන්තයි, මට පේන්නේ නරක හිතකුත් නෙවෙයි. මෙන්න දක්ෂකම, මගේ දෙයියනේ, ඔව් - තමන්ගැන ඔප්පු කරන්න තියන හොඳ උනන්දුවකුත් තියනවා. ඒක ගොඩක් හොඳයි.... ඉතිං කොහේටද ඔයාව මම දාන්නේ?"

හැරී බංකුවේ කෙළවර තදින් අල්ලාගෙන ස්ලිදරින් එපා, ස්ලිදරින් එපා, ස්ලිදරින් එපා යැයි සිතුවේය.

"ස්ලිදරින් එපා, ආ?" සියුම් කටහඬ කීවේය. "ඔයාට විශ්වාසද? ඔයා ගොඩක් හොඳ වෙයි, දනවද, ඒ ඔක්කොම ඔයාගේ මේ ඔලුවේ තියනවා, ඔයාට විශිෂ්ඨයෙක් වෙන්න ස්ලිදරින් උදවු වෙයි. ඒ ගැන කිසි සැකයක් නෑ - එපා? හරි, ඔයාට විශ්වාසයි නම් -- හොඳයි එහෙනම් ග්‍රිෆින්ඩෝ!"

Downloaded from sinhalaebooks.com

තොප්පිය අවසාන වචනය ශාලාවටම ඇහෙන්න කෑගසා කියනු හැරීට ඇසුණි. ඔහු තොප්පිය ගළවා වෙවුළමින් ග්‍රිෆින්ඩෝ මේසය වෙත ගියේය. ඔහුව ස්ලිදරින් වෙත නොදැමීම ගැන ඔහුට සැනසිල්ලක් දැණිනි. මෙතෙක් ආ විශාලම ඔල්වරසන් හඬ තමාට ලැබෙනු ඔහුට යන්තමට තේරිණ. වීස්ලි නිවුන් සොයුරන් " පොටර් අපේ, පොටර් අපේ" කියමින් කෑ ගසන අතරේ ශිෂ්‍ය නායක පර්සි වහා නැගිට සතුටෙන් ඔහුට අතට අත දුන්නේය. හැරී තමා කළින් දුටු රැළි රවුමක් බෙල්ලේ ඇඳගෙන සිටි අවතාරයට විරුද්ධ පැත්තෙන් හිඳගත්තේය. අවතාරය එක්වරම භයානක හඟීමක් දෙමින් ඔහුගේ බාහුවට තට්ටු කළෙන් තමාව හදිසියේ අයිස් වතුර බාල්දියක එබුවාක් මෙන් හැරීට දැණින.

ඔහුට දැන් ඉතා හොඳින් ප්‍රධාන මේසය දැකගත හැක. හැරීට කිට්ටුවෙන් මේසය අවසානයේ හැග්‍රිඩ් ඉඳගෙන සිටියේය. හැරී ඔහුදෙස බලනු දුටු ඔහු සිනාසී තම මහපට ඇඟිල්ල පෙන්වීය. හැරී පෙරලා සිනාසුනේය. ප්‍රධාන මේසයේ මැදට වෙන්නට විශාල රන් පුටුවක ඇල්බස් ඩම්බල්ඩෝ හිඳගෙන සිටියේය. හැරී දුම්රියේදී තම චොක්ලට් ගෙම්බන්ගෙන් ලද කාඩ්පතේ සිටි ඔහු එක්වරම අඳුනා ගත්තේය. මුළු ශාලාවේම අවතාර මෙන් රිදී පාටින් දීප්තිමත්ව දිළිසුණු එකම දේ ඔහුගේ කොණ්ඩය විය.  කාන්දුවන කල්දේරමේදී හමුවුන කළබලකාරී තරුණයා ප්‍රොෆෙසර් කුරල්වත් හැරී අඳුනා ගත්තේය. ඔහුගේ විශාල දම්පාට තලප්පාව නිසා ඔහුව විශේෂයෙන් කැපී පෙණිනි.

දැන් එහි තේරීමට ඉතිරි වූයේ ළමුන් තිදෙනෙක් පමණි. "තෝමස්, ඩීන්," රොන්ටත් වඩා උස කළු පිරිමි ළමයෙක් ග්‍රිෆින්ඩෝ මේසය වෙත විත් හැරීට එකතු විය. "ටර්පින්, ලීසා," රේවන්ක්ලෝ වූ අතර ඉන්පසු රොන්ගේ අවස්ථාව විය. ඔහු සුදුමැලි කොළපාට වී සිටියේය.. හැරී මේසයට යටින් තම ඇඟිලි  කතිරයක් කරගෙන තප්පරයකට පසු තොප්පිය "ග්‍රිෆින්ඩෝ!" ලෙස කෑගැසුවේය.

රොන් පැමිණ හැරී ළඟින්වූ පුටුවට කඩා වැටෙද්දී හැරී අන් අය සමග ශබ්ද නගා අත්පුඩි ගැසුවේය.

"බොහොම හොඳයි, රොන්, විශිෂ්ටයි," පර්සි වීස්ලි හැරී හරහා ඉදිරියට නැවී කියන අතරේ  "සබිනි, බ්ලෙයිස්," ස්ලිදරින් බවට පත් විය. ප්‍රොෆෙ ්සර් මැක්ගොනගල් කඩදාසිය රෝල් කරගෙන තේරීමේ තොප්පිය ඉවත රැගෙන ගියාය.

හැරී තම හිස් රන් පිඟාන දෙස බැලුවේය. ඔහුට මහත් බඩගින්නක් දැනුනි. වට්ටක්කා පැටිස් කෑවේ අවුරුදු ගණනාවකට කළින් මෙන් දැණින.

ඇලබස් ඩම්බල්ඩෝ නැගී සිටියේය. ඔහු සිසුන් දෙස හොඳින් බැලුවේය. ඔහු දෑත් දෙපසට දිගු කළේ ඔවුන් දකිනවාට වඩා කිසිම සතුටක් ඔහුට නැත්තාක් මෙනි.

"සාදරයෙන් පිළිගන්නවා," ඔහු කීවේය. "හොග්වාර්ට්ස් වල නව අවුරුද්දකට ඔබව සාදරයෙන් පිළිගන්නවා. අපි අපේ උත්සවය පටන් ගන්න කළින් මම වචන කීපයක් කතා කරන්න කැමතියි.  මෙන්න ඒවා: අමනයා! තෙල් හම! කුඩා උපාංගය! ඇඹරීම!

Downloaded from sinhalaebooks.com

"ස්තූතියි!"

ඔහු නැවත වාඩි උනේය. සියල්ලෝම ඔල්වරසන් දෙමින් අත්පුඩි ගැසුවෝය. සිනාවිය යුතුද නැද්ද කියා හැරී දැනසිටියේ නැත.

"එයාට - පොඩ්ඩක පිස්සු වගේද?" ඔහු අවිනිශ්චිතව පර්සිගෙන් ඇසුවේය.

"පිස්සුද?" පර්සි කීවේය. "එයා උගතෙක්! ලෝකේ ඉන්න හොඳම මායාකාරයා! ඒත් ඔව් පොඩ්ඩක් විතර පිස්සු. හැරි අර්තාපල් ඕනෙද?"

හැරීගේ කට ඇරුණේය. ඔහු ඉදිරියේ තිබූ පිඟන් වල කෑම ගොඩගසා තිබිණි. ඔහු තමන් කෑමට ආසා කරන කෑම ජාති මෙතරම් ප්‍රමාණයක් එක මේසයක් මත තිබෙනු කිසි දින දැක  නොතිබිණි: රෝස්කළ හරක් මස්, රෝස් කළ කුකුල් මස්, ඌරුමස්, බැටළු මස්, සොසේජස්, බේකන් සහ බැදපු මස් කුට්ටි, තම්බපු අර්තාපල්, රෝස්කළ අර්තාපල්, බැදපු අල තීරු, යෝකෂයර් පුඩිං,කඩල, කැරට්, හොදි, තක්කාලි සෝස්, සහ කුමක හෝ අමුතු හේතුවකට පෙපර්මින්ට් ලොසින්ජර ද විය.

ඩර්ස්ලිවරු කිසිදින ඇත්තටම හැරීව බඩගින්නේ තැබුවේ නැත. නමුත් ඔහු ආසා කළ තරම් කන්නට ඔහුට කිසිදින අවසර ලැබුනේ නැත. හැරී වඩාත් ආසා කළ සියල්ල ඩඩ්ලි හැමවිටම අරගත්තේය. ඉන් ඔහු අසනීප උවද එහි වෙනසක් නොවීය. පෙපර්මින්ට් හැරුනු කොට අන් සියල්ලෙන්ම ටිකටික ගෙන හැරී තම පිඟානේ ගොඩගසා ගෙන කන්නට පටන් ගත්තේය. සියල්ල ඉතා රසවත් විය.

"ඒක ඇත්තටම රස පාටයි," හැරී බැදපු මස් කුට්ටියක් කපන දෙස බලමින් බෙල්ල වටා රැලි රවුමක් දාගෙන සිටි අවතාරය දුකින් කීවේය.

"ඔයාට බැරිද --?"

"මම අවුරුදු හාරසීයකින් විතර කාලා නෑ," අවතාරය කීවේය. "ඇත්තටම මට කන්න ඕනේ නෑ, ඒත් ඉතිං බලාගෙන ඉන්න අමාරුයිනේ. මම හිතන්නේ මම මාව අඳුන්වලා දුන්නේ නෑ? සර් නිකොලස් ඩි මිම්සි-පෝපින්ග්ටන් ඔබේ සේවයට. ග්‍රිෆින්ඩෝ කුළුණේ පදිංචි අවතාරය."

"මම දන්නවා ඔයා කවුද කියලා!" රොන් එක්වරම කීවේය. "මගේ අයියා ඔයා ගැන කිව්වා -- ඔයා යන්තමින් ඔලුව නැති නික්!"

Downloaded from sinhalaebooks.com

"මම කැමති ඔයා මට කතා කරනවානම් සර් නිකලස් ඩි මිම්සි- - " අවතාරය කියවමින් සිටින විට දුඹුරු කෙස් පිරිමි ළමයා සීමස් ෆිනිගන් බාධාකළේය.

"යන්තම් ඔලුව නැති? ඔයා කොහොමද යන්තම් ඔලුව නැති වෙන්නේ?"

සර් නිකොලස් තම කුඩා කතාබහ තමාට අවශ්‍ය විදිහට සිදු නොවීම ගැන බොහෝ අසතුටු විය.

"මේ විදිහට," ඔහු නොරිස්සුමෙන් කීවේය. ඔහු තම වම් කනෙන් අල්ල ඇද්දේය. ඔහුගේ සම්පූර්ණ ඔලුවම බෙලෙන් ගැලවී උරහිස මතට වැටුණි. කවුරුන් හෝ ඔහුගේ හිස ගසා දැමීමට තැත් කර තිබේ. නමුත් එය නිවැරදිව සිදුකර නැත. සියල්ලන්ගේම පුදුම වූ මුහුණු දෙස සතුටින් බැලූ යන්තමින් ඔලුව නැති නික් නැවත තම හිස බෙල්ල මතට ගත්තේ. කැස්සකින් පසු ඔහු නැවත කථාකලේය. ඉතින් අළුත් ග්‍රිෆින්ඩෝ වරුනි මම හිතනවා ඔයාලා අපිට මේ සැරේ නිවාස කුසලානය දිනාගන්න උදවු කරයි කියලා. ග්‍රිෆින්ඩෝ දිනන්නේ නැතිව මෙච්චර කාළයක් කවදාවත් ඉඳලා නෑ. ස්ලිදරින් දැන් අවුරුදු හයක් එක දිගට කුසලානේ ගත්තා. ලේගලන බාරොන් දැන් දරාගන්න බැරිතරම් වෙලා. එයා තමයි ස්ලිදරින් අවතාරය."

හැරී ස්ලිදරින් මේසය දෙස බලනවිට භයානක අවතාරයක් එහි ඉඳගෙන සිටිනු දුටුවේය. ඔහුට හිස් ඇස් දෙකක්, වැහැරුනු මුහුණක් සහ රිදී ලේ පැල්ලම් වැදී කිලිටි වුනු කබායක් ඇඳ සිටියේය. ඔහු මැල්ෆෝයි ලඟම සිටියෙන් තමන්ට ඉඳගන්නට වූ තැන ගැන අසතුටින් සිටි මැල්ෆෝයි දෙස හැරී සතුටින් බැළුවේය.

"කොහොමද එයා ලේ වලින් වැහුනේ?" සීමස් මහත් උනන්දුවකින් ඇසුවේය.

"මම කවදාවත් ඇහුවේ නෑ'," යන්තම් හිස නැති නික් කීවේය.

සියලු දෙනාම තමන්ට පුළුවන් තරම් කෑ පසු ඉතිරි කෑම පිඟන් වලින් බොඳ වී ගොස් පිඟන් නැවත කළින් තිබ්බාක් මෙන් පිරිසිදුව බබළන්නට විය. මොහොතකට පසු අතුරුපස මැවුනේය. ඔබට සිතන්නට පුළුවන් හැම රසයේම අයිස්ක්‍රීම් කුට්ටි, ඇපල් පයි, පැණි ටාට්, චොකලට් ඉක්ලෙයාස් සහ ජෑම් ඩෝනට්, පළතුරු සහ අයිස්ක්‍රීම් ගැටෝ, ස්ට්‍රෝබෙරි, ජෙලි, බත් පුඩිං - "

හැරී පැණි ටාට් එකක් කන අතරේ සිදු වූ කතාබහ තම පවුල් ගැන විය.

"මම අර්ධ සහ අර්ධ," සීමස් කීවේය.. "මගේ තාත්තා මගල් කෙනෙක්. එයාලා කසාද බඳිනකන් අම්මා කියලා නෑ එයා මායාකාරියක් කියලා. එයා බයවෙලා, පුදුම වෙලා.."

අන් අය සිනාසුනෝය.

Downloaded from sinhalaebooks.com

"ඔයා ගැන කියන්නකෝ නෙවිල්?" රොන් කීවේය.

"මගේ ආච්චි මාව හදාගත්තේ, එයා මායාකාරියක්," නෙවිල් කීවේය. "ඒත් මුළු පවුලම අවුරුදු ගානක් යනකන් හිතලා තියෙන්නේ මම හොඳටම මගල් කියලා. ඒත් මගේ ඇල්ගී ලොකු මාමා හැමවෙලේම උත්සාහ කරා මාව අවුස්සලා මගෙන් මායාවක් එළියට ගන්න. එයා දවසක් මාවා කලු පීනන තටාකෙට තල්ලු කලා උඩ ඉඳලා, මම ගිලෙන්නම ගියා. ඒත් මට අවුරුදු අටක් වෙනකන් මොනවත්ම උනේ නෑ. ඇල්ගී ලොකු මාමා දවසක් රෑ කෑමට ඇවිත් මාව කකුල් වලින් අල්ලන් උඩතට්ටුවේ ජනේලෙන් එළියට එල්ලගෙන හිටියා. එනිඩ් ලොකු නැන්දා එයාට කිසස් (අයිසින් සහ බිත්තර වලින් හදන රසකැවිල්ලක්) එකක් දීලා මාමා හදිස්සියේ මාව අතඇරියා. ඒ උනාට මම පල්ලෙහා මිදූලට වැටිලා එතනින් පාරට බවුන්ස් උනා. එයාලා හැමෝම සතුටු උනා. ආච්චි සතුටට ඇඬුවා. ඔයාලා දකින්න තිබ්බේ එයාලගේ මූනු මම මෙහේ එනකොට. එයාලා හිතුවේ මගේ මායාකරකම මෙහේ එන්න තරම් මදි කියලා. ඇල්ගී ලොකු මාමා ගොඩාක් සතුටු උනා. එයා තමයි මට මගේ ගෙම්බාව ගෙනත් දුන්නේ."

හැරීගේ අනික් පසින් සිටි පර්සි වීස්ලි සහ හර්මයිනී පාඩම් වැඩ ගැන් කතාකරමින් සිටියහ්. ("මම හිතනවා එයාලා ඉක්මනටම පටන් ගනී කියලා. ඉගෙන ගන්න ගොඩාක් දේවල් තියනවා. මම විශේෂයෙන් ආසා රූපාන්තරණයට, දන්නවානේ මොනාහරි දෙයක් වෙන මොනාහරි දෙයක් බවට හැරවීම., ඇත්තටම ඒක ගොඩාක් අමාරු වෙන්න ඕනෙ - "; "ඔයාලා පොඩි ඒවාගෙන් පටන් ගනී. ගිනිකූරු ඉඳිකටු බවට හැරවීම වගේ දේවල").

නිදිමත සහ රස්නයක් දැනෙන්නට පටන් ගත්තෙන් හැරී ඉහල තිබූ ප්‍රධාන මේසය දෙස නැවත බැළුවේය. හැග්‍රිඩ් ඔහුගේ කුසලානයෙන් හොඳහැටි බොමින් සිටියේය. ප්‍රොෆෙසර් මැක්ගොනගල් ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝ සමග කතා කරමින් සිටියාය.. අසාමාන්‍ය තලප්පාව සහිත ප්‍රොෆෙස කුරල් හොඳින් තෙල් ගෑ කළු හිසකෙස්, වක් නාසයක් සහ කහමැලි හමක් සහිත ගුරුවරයෙක් සමග කතා කරමින් සිටියේය.

එය හදිසියේම සිදුවිය. වක් නාසය ඇති ගුරුවරයා හදිසියේම කුරල්ගේ තලප්පාවට එපිටින් කෙළින්ම හැරීගේ ඇස් දෙස බැලුවෙය. හැරීගේ නළලේ වූ සළකුණින් තද උනුසුම් වේදනාවක් විහිදිනි.

"ආවු!" හැරී තම ඔලුවට අත ගසා ගත්තේය.

"මොකද උනේ?" පර්සි ඇසුවේය.

"මො - මොකුත් නෑ."

වේදනාව ආපු වේගයෙන්ම අතුරුදන් විය. නමුත් හැරීට අමතක කරන්නට අපහසු වූයේ එම ගුරුවරයාගේ බැල්ම නිසා ඇති වූ හැඟීමයි. ඔහු හැරීට කිසිසේත්ම කැමති නැති බවක් දැනිණි..

Downloaded from sinhalaebooks.com

"කවුද ප්‍රොෆෙසර් කුරල් එක්ක කතාකරන කෙනා?" ඔහු පර්සිගෙන් ඇසුවේය.

"ඔහ්. ඔයා දැනටමත් කුරල්ව දන්නවානේද? පුදුමයක් නෑ එයාව නොසන්සුන් විදිහට පේන එක, ඒ ප්‍රොෆෙසර් ස්නේප්. එයා උගන්වන්නේ සංයෝජන, ඒත් එයා ඒකට කැමති නෑ- හැමෝම දන්නවා එයා කුරල්ගේ රස්සාව ගන්න බලාගෙන ඉන්නේ කියලා. ස්නේප් අඳුරු බලවේග ගැන ගොඩාක් දේවල් දන්නවා"

හැරී ස්නේප් දෙස බලාගෙන සිටියත් ඔහු නැවත හැරී දෙස බැලුවේම නැත.

අවසානයේ අතුරුපස ද අතුරුදන් වූ පසු ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝ නැවත නැඟී සිටියේය. ශාලාව නිහඬ විය.

"අහ්ම් - අපි දැන් කාලා බීලා ඉන්න නිසා පොඩි වචන ටිකක් විතරක් කතා කරන්නම්. මට තියනවා වාරෙ පටන්ගන්න නිවේදන ටිකක් දෙන්න.

"පළමු වසරේ සිසුන් දැනගන්න ඕනේ පිට්ටනිය ලඟ තියන කැළෑව සියලුම සිසුන්ට තහනම් බව. තව අපේ පරණ සිසුන් ටික දෙනෙකුටත් ඒක දැනගත්තොත් හොඳ වෙයි."

ඩම්බල්ඩෝගේ දිළිසෙන ඇස් වීස්ලි නිවුන්නු සිටින පැත්තට හැරුණි.

" තව අපේ භාරකරු ෆ්ලිච් මහත්තයා දැනුම් දීලා තියනවා ඔයාලා හැමෝටම මතක්කරන්න කියලා පංති අතරතුරේ කොරිඩෝ වල මන්තර කරන්න එපා කියලා.

"වාරයේ දෙවෙනි සතියේදී කුඩිච් වලට තේරීම් පැවැත්වෙනවා. කවුරුහරි තමන්ගේ නිවාසේ කණ්ඩායම වෙනුවෙන් තරඟ කරන්න කැමති නම් මැඩම් හූච්ට කතා කරන්න.

"අවසාන වශයෙන්, මම ඔයාලාට කියන්න ඕනේ මේ අවුරුද්දේ, තුන්වෙනි තට්ටුවේ දකුණු පැත්තේ කොරිඩෝ වේදනාවෙන් මැරෙන්නෙ කැමති නැති හැමෝටම තහනම් කියලා."

හැරී සිනාසුනේය. නමුත් ඔහු එසේ කළ සුලු පිරිසෙන් අයෙක් විය.

"එයා ඇත්තටම නෙවෙයි නේ කියන්නේ?" ඔහු පර්සිට කෙඳිරුවේය.

Downloaded from sinhalaebooks.com

"වෙන්න ඇති," පර්සි කීවේය. "ඒක අමුතුයි. මොකද එයා සාමාන්‍යයෙන් කොහේට හරි නොයා ඉන්න හේතුවක් කියනවා - කැලෑව භයානක සත්තුන්ගෙන් පිරිලා, හැමෝම ඒක දන්නවා. මම හිතන්නේ එයා අඩු තරමින් අපේ ශිෂ්‍ය නායකයින්ට හරි කියයි."

"එහෙනම් දැන් අපි නිදාගන්න යන්න කලින් අපේ පාසල් ගීය ගායනා කරමු.!" ඩම්බල්ඩෝ කීවේය. අනෙකුත් ගුරුවරුන් සිනාවක් මවාගෙන මෙන් සිටිනු හැරීට පෙණිින.

ඩම්බල්ඩෝ තම යෂ්ඨිය ගැසුවේ හරියට එහි කෙළවර ගලවා දැමීමට මෙනි. දිගු රන් පැහැ රිබන් පටියක් ඉන් ඉවතට පියඹා විත් මේස වළට ඉහලින් සර්පයෙක් මෙන් දඟර ගැසී වචන බවට පත් විය.

"හැමෝම තමන් කැමති තාලය තෝරා ගන්න," ඩම්බල්ඩෝ කීවේය "ඔන්න එහෙනම් පටන්ගමු!"

"හොග්වාට්ස්, හොග්වාර්ට්ස්, හොගි වාට් හොග්වාට්ස්,

කරුණාකර අපිට මොනාහරි උගන්වන්න,

අපි වයසට ගියත් තට්ටය පෑදුනත්

නැත්නම් ශක්තිමත් දණහිස් ඇති තරුණයෙක් වුවත්,

අපේ ඔළු පිරෙන්න ඕනේ

ආකර්ශනීය දේවල් වලින්,

මෙහි හිස් සහ හුළං පිරී ඇති නිසා,

මැරුණු මැස්සන් සහ පුළුන් කෑලිත්

ඉතිං අපිට උගන්වන්න දැනගන්න වටින දේවල්,

අපිට අමතක උන දේවල් ආපසු ගේන්න,

ඔබේ උපරිමය කරන්න, අපි කරන්නම් ඉතිරි ටික

අපේ මොළේ කර වෙනකන් ඉගෙනගන්නම්.

සියලුදෙනා නොයේකුත් වෙලාවන්හී ගීතය අවසන් කළහ. අවසානයේ ඉතා සෙමින් මළබෙර හඬින් (funaral march) ගයමින් ඉතිරි වූයේ වීස්ලි නිවුන්නු පමණයි. අවසන් පේළි කිහිපය ඩම්බල්ඩෝ තම යෂ්ඨියෙන් මෙහෙයවීමෙන් ඔවුන් ගායනය අවසන් කළපසු මහ හඬින් අත්පොළසන් දුන් අය අතර ඔහුද විය.

Downloaded from sinhalaebooks.com

"අහ්, සංගීතය," තම ඇස් පිසදමමින් ඔහු කීවේය. "අපි හැමෝම මායාවට වඩා කැමති දේ. එහෙනම් දැන්, නිදාගන්න වෙලාව. හැමෝම යන්න. සමාප්තයි!"

ග්‍රිෆින්ඩෝගී පළමු වසර සිසුන් පර්සි පසුපසින් කියවමින් සිටින සෙනග අතරින් ප්‍රධාන ශාලාවෙන් එළියට ගොස් ගල් පඩිපෙළින් ඉහළට ගමන් ගත්තෝය. හැරීගේ කකුල් නවතත් පණ නැති වූයේ කුස ආහාරවලින් පිරී ඇති නිසාත් මහන්සිය නිසාත් ය.. ඔවුන් ගමන් ගත් කොරිඩෝ වල බිත්තිවල ගසා තිබූ පිංතූර වල සිටි පුද්ගලයන් රහසෙන් කියවමින් ඔවුන් දෙසට ඇඟිල්ල දිගු කරනු පෙනුනත්, පර්සි ඔවුන්ව දෙවතාවක්ම තල්ලුකරන ද්වාර පිටුපස සැඟවුන පාරවල් වලින් සහ එල්ලෙන කළාල තුලින් ගෙන ගියත් පුදුමයට පත් නොවෙන තරම් හැරී නිදිමතේ සිටියේය. ඇනුම් අරිමින් සහ කකුල් අද්දමින් ඔවුන් තවත් පඩිපෙලවල් නැංගෝය. හදිස්සියේ නතර වූ විට තව කොපමණ ඔවුන්ට යැමට සිදුවේදැයි හැරී පුදුම විය.

හැරමිටි මිටියක් ඔවුන්ට ඉහළින් අහසේ පාවෙමින් තිබිණි. පර්සි ඒ දෙසට අඩියක් තබද්දීම ඒවා ඔහු දෙසට විසි වන්නට විය.

"පීව්ස්," පර්සි පළමු අවුරුද්දේ සිසුන්ට රහසින් කීවේය. "ගෙවල භූතයෙක්" "පීව්ස් - පේන්න එන්න"

ඉතා ගෝශාකාරී, බලූමකින් එලියට හුලං අරින්නාක් මෙන් වූ නපුරු හඩක් උත්තර දුන්නේය.

"ඔයාට ඕනේ මම ලේ පෙරෙන බාරොන් ලඟට යවන්නද?"

පොප් ශබ්දයක් ඇසුණි. නපුරු කළු ඇස් සහ පළල් කටක් සහිත කුඩා මිනිසෙක් මැවුනි. ඔහු කකුල් හරස් කර නවාගෙන අහසේ පාවෙමින් හැරමිටි හසුරවමින් සිටියේය.

"ඌඌඌහ්!" යක්ශ හිනාවක් සමග ඔහු කීවේය. "චූටි එකවසර අය! කොච්චර විනෝදද!"

ඔහු හදිසියේම ඔවුන් වෙත ඇදී ආවෙන් සියල්ලෝම නැවුනහ.

"යනවා යන්න පීව්ස්, නැත්තන් බාරොන් මේ ගැන දැනගනී. මම ඇත්තටම කියන්නේ!" පර්සි කෑගසුවේය.

පීව්ස් ඔහුට දිව දිගුකොට හැරමිටි නෙවිල්ගේ හිසමත අතහැර අතුරුදන් විය. ඔහු තම ඇඳුම සද්ද කරමින් ඈතට යනු ඔවුන්ට ඇසිණි.

Downloaded from sinhalaebooks.com

"ඔයාලාට පීව්ස්ගෙන් පරිස්සම් වෙන්න වෙනවා," ඔවුන් නැවත ගමන ඇරඹද්දී ඔහුකීවේය. "ලේ ගලන බාරොන්ට විතරයි එයාව පාළනය කරන්න පුළුවන්. එයා අපි ශිෂ්‍ය නායකයෝ කියන දේවත් අහන්නේ නෑ. ඔන්න අපි ආවා."

කොරිඩෝව කෙළවරේම රෝසපැහැ සිල්ක් ඇඳුමක් ඇඳසිටින තරබාරු කාන්තාවකගේ රූපය සහිත පිංතූරයක් ගසා තිබිණ.

"මුරපදය?" ඇය කීවාය. "කැපුට් ඩ්‍රැකොනිස්," පර්සි කීවේය. පිංතූරය පැද්දී ඉදිරියට විත් පැත්තට හැරුනෙන් බිත්තියේ විශාල රවුම් ගුලක් පෙනෙන්නට විය. සියල්ලෝම ඒතුලින් මිරිකෙමින් ගමන් කළහ. නෙවිල්ට තල්ලුවක් දීමටත් සිදු විය. සියල්ලෝම සැප පහසු පුළුන් ඇදිපුටු පිරුණු රවුම් හැඩයේ ග්‍රිෆින්ඩෝ පොදු කාමරයට පැමිණියහ.

පර්සි ගැහැණු ළමයින් එක් දොරකින් ඔවුන්ගේ කාමර වෙතත් පිරිමි ළමයින් වෙනත් දොරකින් ඔවුන්ගේ කාමර වෙතත් යොමු කළේය. අනිවාර්යයෙන් කුළුනක් වූ රවුමට දිවෙන පඩි පෙළකින් ඉහලට නැග ගොස් අවසානයේ ඔවුන්ට තම ඇඳන් හමු විය. බිත්තියේ පෝස්ටර් හතරක් පහක් සහ තද රතු වෙල්වට් දොරරෙදි එහි දමා තිබිණ. ඔවුන්ගේ යකඩ පෙට්ටි ඒ වන විටත් එහි ගෙනවිත් තිබිණි. කතාකිරීමට වත් බැරි තරම් මහන්සියෙන් සිටි ඔවුන් වහාම තම නිදන් ඇඳුම් වලට බැස ඇඳට වැටුනි.

" නියම කෑම නේද?" රොන් හැරීට තිර රෙදි අතරින් මිමිණිය. "යනවා යන්න. ස්කැබස්! ඌ මගේ ඇඳරෙද්ද හපනවා."

හැරී පැණි ටාට් කැවාදැයි රොන්ගෙන් ඇසීමට සිතුවත් ඔහුට වහා නින්ද ගියේය.

සමහර විට හැරී කෑවා වැඩි වෙන්නට ඇත. මන්ද ඔහුට වඩා අමුතු හීනයක් පෙණින. ඔහු ප්‍රොෆෙසර් කුරල්ගේ තලප්පාව දාගෙන සිටියේය. එය නොනවත්වා හැරී ස්ලිදරින් වලට වහාම මාරු විය යුතු යැයි කීවේය. මන්ද එය ඔහුගේ ඉරණම යැයි එය කීවේය. තමන්ට ස්ලිදරින් හී ඉදීමට අවශ්‍ය නැති බව හැරී කීවේය. තලප්පාවේ බර වැඩිවෙන්නට විය. ඔහු එය ගැලවීමය උත්සාහ කරද්දී එය වේදනා දෙමින් ඔහුගේ හිසට තද විය. ඔහු එයත් සමග දඟලද්දී මැල්ෆෝයි සිනාසෙමින් බලාසිටියේය. ඉන්පසු ඔහු උල් නාසය ඇති ගුරුවරයා වූ ස්නේප් බවට පත් විය. ඔහු මහා සීතල උස් හඬකින් සිනාසුනේය. හදිසියේම එහි කොළපැහැ ආලෝකයක් විහිදී ගියේය. හැරී දාඩිය දමමින් සහ වෙවුලමින් අවදි විය.

ඔහු අනික් පසට පෙරලී නැවත නිදා ගත්තේය. අනෙක් දවසේ ඔහු අවදි වද්දී ඔහුට සිහිනය මදක්වත් මතකයේ තිබුනේ නැත.

## අටවෙනි පරිච්ඡේදය

## සංයෝජන ගුරුතුමා

Downloaded from sinhalaebooks.com

"අර බලන්න."

"කොහෙද?"

"අර රතු කොන්ඩේ තියන උස ළමයට එහා පැත්තේ."

"කණ්නාඩි දාලා ඉන්නේ?"

"ඔයා එයාගේ මූණ දැක්කද"

"ඔයා දැක්කද එයාගේ කැළල?"

ඊලඟ දවසේ කාමරේ සිට එළියට ගිය තැන් සිට මිමිනුම් ඔහු පසුපස ආවේය. පංති කාමර වළට එලියෙන් ළමුන් ඔහු බැලීමට ඇඟිලි තුඩින් ඉස්සෙමින් පෝලිම් ගැසී සිටි අතර ඔහි පසු කරමින් ගිය සමහරු නැවත් හැරී ඇවිත් ඔහු දෙස බැලූහ. හැරී තම පංතියට යන පාර සොයමින් ඔවුන් එසේ නොකළානම් හොඳයැයි සිතුවේය.

හොග්වර්ට්ස් හී පඩිපෙළවල් එකසිය හතලිස් දෙකක් තිබේ. පළල්, කැරකෙන, පටු, අබලන්, සිකුරාදාට වෙනත් දිශාවක්ට යොමු කෙරෙන ඒවා, අතරමගදී සමහර පඩි අතුරුදන් වී එහා පැත්තට පනින්නට සිදුවෙන ඒවා, ආදී ලෙස නානාප්‍රකාර පඩිපෙළවල් එහි විය. එහි තිබූ සමහර දොරවල් ඇරුනේ ඉතා කරුණාවෙන් ඇසුවොත් පමණි. සමහර ඒවා හරියටම අදාල තැන කිතිකැව්වොත් ඇරෙන ඒවාත්, ඇත්තටම දොරවල් නොවන නමුත් දොරවල් ලෙස පෙනෙන බිත්තිත් එහි විය. යම්කිසි දෙයක් තිබූ තැනක් මතක තබා ගැනීමත් ඉතා අපහසු වූයේ සියල්ල නිතරම එහේ මෙහේ තල්ලු වෙන නිසායි. බිත්තිවල ගසා ඇති පිංතූර වල සිටින අයත් නිතර අනෙක් අය බැලීමට යන අතර යුධ සන්නාහ වලට ඇවිදිය හැකි බව හැරී තදින්ම විශ්වාස කළේය.

අවතාර උදවු කෙළේත් නැත. අරින්නට උත්සාහ කරන දොරක් හරහා අවතාරයක් රිංගා ඒමෙන් හැමවිටම ඔහු ගැස්සුනේය. යන්තමින් ඔලුව නැති නික් හැමවිටම අළුත් ග්‍රිෆින්ඩෝලාට නිවැරදි දිශාව පෙන්වීමට හැමවිටම කැමති විය. නමුත් පංතියට පරක්කු වේලාවක පීව්ස් නම් ගෙවල භූතයා හමු වීම අගුලු දෙකේ දොරක් හමු වීම හෝ රවටන පඩිපෙළක් හමුවීම මෙන් විය. ඔහු ඔබේ හිසමත කසළ බඳුන් හෙලාවි, ඔබේ කකුල් යටින් පාපිසි අදීවි, ඔබට චෝක් කැලි වලින් පහර දේවි, එසේ නැත්නම් අදිසිව ඔබ පසුපසින් හොරෙන් පැමිණ නහයෙන් ඇද "ඔයාගේ නහය අහුවුනා!" කියාවි.

Downloaded from sinhalaebooks.com

සමහර විට පීව්ස් ටත් වඩා නරක් විය හැකි කෙනා ආගස් ෆ්ලිච් හමුවිය හැක. හැරී සහ රොන් පළමු දවසේම වැරදි දිශාවට ගොස් ඔහුට හසු විය. ෆ්ලිච් ට ඔවුන් හමු වූයේ ඔවුන් තුන්වන තට්ටුවේ තහනම් කොරිඩෝවට යන දොර ඇරීමට උත්සාහ කරමින් සිටිද්දීය. ඔවුන් අතරමන් වූ බවක් ඔහු විශ්වාස කළේම නැත. ඔහු විශ්වාස කළේම ඔවුන් හිතාමතාම ඊට කඩාපනින්නට සැරසුන බවයි. එතනින් යමින් සිටි ප්‍රොෆෙසර් කුරල් ඇවිත් ඔවුන්ව බේරා ගන්නා විට ඔහු දෙදෙනාම පහල අඳුරු කාමර වල සිරකරන බවට තර්ජනය කරමින් සිටියේය.

ෆ්ලිච්ට නොරිස් මහත්මිය නම් වූ කැහැටු, මඩ පාට, හම එල්ලෙන ෆ්ලිච් ගේ මෙන් ලාම්පු මෙන් ඇස් ඇති බළලෙක් විය. ඇය තනිව කොරිඩෝ බලාගත්තාය. ඇය ඉදිරියේ එක නීතියක් කඩන්න, කකුලේ එක ඇඟිල්ලක් ඉරෙන් එළියට තැබන්න, ඇය වහා ෆ්ලිච් ට දන්වනු ලැබේ. තප්පර දෙකකින් හති දමමින් ෆ්ලිච් එතැනට ඒවි. පාසලේ රහස් දොරටු ගැන් ෆ්ලිච් කාටත් වඩා හොඳින් දැන සිටියේය. (සමහර විට වීස්ලි නිවුන්නු හැරුනු කොට) ඕනෑම අවතාරයක් මෙන් හදිසියේ පෙනීසිටීමට ඔහුට හැකි විය. පාසලේ සියළුම සිසුන් ඔහුට වෛර කළහ. නොරිස් මහත්මියට හොඳ පයින් පාරක් ගැසීම බොහෝ දෙනෙකුගේ ලොකු ආශාවක් විය.

ඊලඟට ඔබ කොහොමහරි පංතිය සොයා ගත්පසු, පංතියත් එසේම විය. හැරී ඉක්මනින්ම සොයා ගත්තේ යශ්ඨිය වනා විකාර වචන කීපයක් කියනවාට වඩා බොහෝ දේ මායාවල තිබෙන බවයි.

සෑම බදාදාම මධ්‍යම රාත්‍රියේ ඔවුන්ට දුරදක්නයෙන් රෑ අහස බලා  නොයේකුත් තාරකාවල නම් සහ ඒවායේ ගමන් කිරීම්  අධ්‍යයනය කිරීමට සිදුවිය. සතියට තුන් වතාවක් මාළිගය පිටුපස හරිතාගාරයට ගොස් මෝඩ පෙනුමැති ප්‍රොෆෙසර් ස්ප්‍රෞට් නම් මායාකාරියගෙන්  ශාකවිද්‍යාව ඉගෙන ගැනීමට සිදු විය. එහිදී ඔවුන් සියළුම අමුතු ගස් සහ පුස් වර්ග බලාගන්නා හැරිත් එවායේ භාවිතය ගැනත් ඉගෙන ගත්තෝය.

ලේසියෙන්ම වඩාත් කම්මැලිම පංතිය වූයේ මායා ඉතිහාසයයි. එය අවතාරයක් විසින් උගවන එකම පංතිය විය. ප්‍රොෆෙසර් බින්ස් ඉතා මහලු අයෙක් විය.

ඔහු එක දවසක් ගුරු කාමරය ඉදිරිපස ගිණිඋඳුන අසල නිදාගෙන පසුදා උදෑසන ඉගැන්වීමට යෑමට අවදි වූයේ තම සිරුර අතහැරයි. ඔවුන් නම් සහ දින සටහන් කරගන්නා අතරේ බින්ස් විටෙන් විට  මුමුණන්නට වූයේ, එමෙරික් නම් යක්ශයා සහ යූරික් නම් අමුතුබෝලය පටලවමිනි.

ප්‍රොෆෙසර් ෆ්ලිට්වික් නම් වූ වශීකර්ම ගුරුතුමා ඉතා කුඩා මන්තරකරුවෙක් වූයෙන් ඔහුට තම මේසයට ඉහලින් බැලීමට පොත් ගොඩක් උඩ නැගීමට සිදුවිය. පළමු පංතිය ආරම්භයේ ඔහු හඳුන්වා දීමේ වටයක් ආරම්භ කළෙන්, හැරීගේ නම පැමිනි විට ඔහු උද්‍යෝගයෙන් ශබ්දයක් කොට නොපෙනී ගියේය .

ඊලඟට ප්‍රොෆෙසර් මැක්ගොනගල් ද අමුතුය. හැරී සිතුවා සේම ඇය සෙල්ලම් කළ හැකි ගුරුවරියක් නොවූවාය. තදගති ඇති බුද්ධිමත් කාන්තාවක් වූ ඈ පළමු පංතිය පටන්ගත් මොහොතේම එය අවස්ථාව කරගෙන ඔවුන්ට නිවේදනයක් නිකුත් කළාය.

Downloaded from sinhalaebooks.com

"රූපාන්තරණය කියන්නේ ඔයාලා හොග්වාර්ට්ස් වලදී ඉගෙනගන්න අමාරුම සහ භයානකම මායාවක්," ඇය කීවාය. "කවුරු හරි මෙතන මගේ පංතියේ විකාර කළොත්, එයාට යන්න පුළුවන් ආය එන්න බෑ. ඔයාලාට අනතුරු අඟවලා තියෙන්නේ."

ඉන්පසු ඇය තම මේසය ඌරෙක් බවට පත්කොට නැවත මේසය බවට පත් කළාය. ඔවුන් සියල්ලෝම වඩා උනන්දු වූ අතර පංති ආරම්භ කිරීමට නොයිවසිලිමත් විය. නමුත් ඔවුන්ට ගෘහ උපකරණ සතුන් බවට පරිවර්තනය කිරීම බොහෝ කාළයකට කළනොහැකි බව වහා තේරුම් ගත්තෝය. බරපතල සටහන් තොගයක් ලියාගත්තාට පසු ඔවුන්ට ගිණිකූරක් ලැබුනේ එය ඉඳිකටුවක් බවට පත් කිරීමට උත්සාහ දැරීමට සිදුවිය. පාඩම් අවසානයේ හර්මයිනී ග්‍රේන්ජර් පමණක් තම ගිනිකූරට යම්වෙනසක් කිරීමට සමත් විය. ප්‍රොෆෙසර් මැක්ගොනගල් එය රිදී සහ උල් වූයේ කෙසේද යන්න පෙන්වා දුන් පසු හර්මයිනී වෙත දුලබ සිනාවක් පෑවාය.

සැවොම මග බලාගෙන සිටි පාඩම වූයේ අඳුරු කළාවන්ට එරෙහි ආරක්ශාවයි. නමුත් කුරල්ගේ පාඩම් මද විහිළුවක් බවට පත්විය.  ඔහුගේ පංතිකාමරය තදින්ම සුදුළුනු ගඳ හැමුවෙන් සැවොම කීවේ ඔහු රොමේනියාවේදී හමුවූ වැම්පයර්වරයෙක් නැවත් පැමිණ ඔහුව අල්ලාගනීවියැයි බියෙන් ඔහු එළවීමට සුදුළුනු තබන බවයි. ඔහු පැවසුවේ ඔහුගේ තලප්පාව අප්‍රිකානු කුමාරයෙක් වදකාර සොම්බි කෙනෙක් එළවා දැමීමට ස්තූතියෙක් ලෙස ලැබුන බවයි. නමුත් කිසිවෙක්වත් එය විශ්වාස කිරීමට පෙළඹුනේ නැත. නමුත් එක්දෙයක්, සීමස් ෆිනිගන් දැනගැනීමට ආසාවෙන් සොම්බිවරයා සමග සටන් කළේ කෙසේදැයි ඇසූ කළ කුරල් රෝස පාටට හැරී කාළගුණය ගැන කතාකිරීමට පටන් ගත්තේය. තවත් දෙයක් වූයේ ඔවුන්ට ඔහුගේ තලප්පාවෙන් අමුතු සන්ධයක් දැනීමයි. වීස්ලි නිවුන්නු කියා සිටියේ ඔහු කොහේ ගියත් ආරක්ශා වෙන ලෙස එය සුදුළුනු පුරවා සාදන ලද්දක් බවයි.

තමන් අනෙක් සිසුන්ට වඩා සැතපුම් ගණනාවක් පිටුපසින් නොසිටින බව දැන ගැන්ම හැරීට සහනයක් විය. මගල් පවුල් වලින් පැමිණි බොහෝ සිසුන් සිටි අතර හැර මෙන්ම මොවුන් තමා මායාකරුවෙක් හෝ මායාකාරියක් බව කිසිත් නොදැන් සිටියහ. එහි ඉගෙනීමට බොහෝ දේ තිබුනෙන් රොන් වැන්නන්ට පවා එය පහසු නොවීය.

සිකුරාදා හැරීට සහ රොන්ට විශේෂ දිනයක් විය. ඔවුන්ට පළමු වතාවට එක්වරක්වත් අතරමං නොවී පහළ ප්‍රධාන ශාලාවට එන්නට පාර සොයා ගත හැකි විය.

"අද මොනාද අපිට තියෙන්නේ?" හැරී තම කැඳ එකට සීනි දමමින් ඇසුවේය.

"ස්ලිදරින්ලා එක්ක සංයෝජක පාඩම් දෙකක්," රොන් කීවේය. "ස්ලිදරින් නිවාසේ මූලිකයා ස්නේප්. හැමෝම කියන්නේ එයා ඒගොල්ලන්ට විශේෂයක් කරනවලු. අපිට පුළුවන් ඒක ඇත්තද කියලා බලන්න."

"මැක්ගොනගලුත් අපිට විශේෂයක් කරානම් කියලා හිතෙනවා, " හැරී කීවේය. ප්‍රොෆෙසර් මැක්ගොනගල් ග්‍රිෆින්ඩෝ නිවාසයේ පාලිකාව ය. නමුත් එය කලින් දිනයේ ගෙදරවැඩ තොගයක්ම නොදී සිටීමට හේතුවක් නොවීය.

Downloaded from sinhalaebooks.com

එවිටම ලියුම් ආවේය. හැරී දැන් එයට පුරුදු වී සිටියත් පළවෙනි දවසේ ප්‍රධාන ශාලාවට බකමූණන් සියයක් පමණ හදිසියේ පියඹා විත් තම හිමිකරු දකින තුරු මේස වලට ඉහලින් රවුමට පියඹමින් සිට ලියුම් සහ පාර්සල් ඔවුන්ගේ උකුල වෙත අතහරිනු දැක හැරී පුදුමයෙන් ගැස්සුනේය.

මෙතෙක් කල් හෙඩ්විග් හැරීට කිසිවක් ගෙනාවේ නැත. ඇය සමහර විටෙක පියඹා විත් ඔහුගේ කණ සපා ටෝස්ට් පාන් කෑල්ලක් ද කා අනෙකුත් බකමූණන් සමග බකමූනු නිවාසයේ නිදා ගැනීමට ගියාය. නමුත් මේ උදෑසන ඇය පහළට පැමිණ මාර්මලේඩ් සහ සීනී බඳුන අතරින් හැරීගේ පිඟාන්ට සටහනක් වැට්ටුවාය. හැරී වහා එය ඉරා විවෘත කළේය. කිළිටු කොලයක කුරුටු ගෑ ලියුමකි.

දයාබර හැරී,

ඔයාට සිකුරාදා හවස නිවාඩු බව මම දන්නවා. ඉතිං ඔයා කැමතිද තුනට විතර ඇවිත් මගෙත් එක්ක තේ කෝප්පයක් බොන්න?

මට ඔයාගේ පළවෙනි සතිය ගෙවුන හැටි හැමදේම අහන්න ඕනේ. හෙඩ්විග් අතේ උත්තරයක් එවන්න.

හැග්‍රිඩ්.

හැරී රොන්ගේ පිහාටු පෑන ඉල්ලාගෙන 'ඔව් මම කැමතියි, පසුව හමුවෙමු' ලෙස ලියුමේ පිටුපස කුරුටු ගා හෙඩ්විග්ව ආපසු යැව්වේය.

හැරී හැග්‍රිඩ් සමග තේ බීමට යාම වාසනාවක් විය. මන්ද යත් සංයෝජන පාඩම මෙතෙක් ඔහුට සිදුවූ නරකම දේ බවට පත් විය.

වාරය අරඹන උත්සවයේදී හැරීට සිතුනේ ප්‍රොෆෙසර් ස්නේප් ඔහුට අකමති බවයි. පළමු සංයෝජන පාඩම අවසන් වෙද්දී තමන් වැරදි බව ඔහුට තේරුනි. ස්නේප් ඔහුට අකමැති නැත. ඔහු හැරීට වෛර කරයි.

සංයෝජන පාඩම පැවැත්වුනේ පහල එක් අඳුරු කුටියකයි. මෙහි ප්‍රධාන මාලිගයට වඩා බොහෝ සීතල වූ අතර බිත්ති පුරා ඇති බෝතල් තුල පාවෙන අච්චාරු දැමූ සතුන් නැතුව උවද අද්භූත විය.

ෆ්ලිට්වික් මෙන්ම ස්නේප් ද පංතිය පටන් ගත්තේ හඳුන්වා දීමේ වටයකින් පසුවයි. ෆ්ලිට්වික් මෙන්ම ඔහුත් හැරීගේ නම කියත්ම නැවතිනි.

Downloaded from sinhalaebooks.com

"ආහ්, ඔව්" ඔහු මෘදුව කීවේය, "හැරී පොටර්. අපේ අළුත් - තරුව."

ඩ්‍රේකෝ මැල්ෆෝයි සහ ඔහුගේ මිතුරන් වූ ක්‍රේබ් සහ ගොයිල් අතින් මුව වසාගෙන අවඥාවෙන් සිනාසුනහ. ස්නේප් සියලුම නම් ඇසූ පසු පංතිය දෙස බැලුවේය. ඔහුගේ ඇස් හැග්‍රිඩ්ගේ මෙන් කළු පැහැ උවත් එහි හැග්‍රිඩ්ගේ උනුසුම මදක්වත් තිබුනේ නැත. ඒවා හිස් සහ සීතල පෙණුමැති වූයෙන් අඳුරු බිම්ගෙවල් මතක් කරවන සුළු විය.

"තමුන්ලා මෙතන ඉන්නේ සියුම් විද්‍යාවක් වගේම සංයෝජන සෑදීමේ නිවැරදිම කළාව ඉගෙනගන්න.," ඔහු ආරම්භ කළේය. ඔහු කතාකලේ රහසින් කියන්නාක් මෙනි. නමුත් ඔවුන් සියලුම වචන අල්ලා ගත්තෝය. ප්‍රොෆෙසර් මැක්ගොනගල්ට මෙන්ම ස්නේප්ට ද පංතිය නිහඬව තබා ගැනීමට විශේෂ දෙයක් කිරීමට උවමනා නොවීය. "මෙතන මෝඩ යශ්ඨි වැනීම් වෙන්නේ නැති නිසා ඔයාලා ගොඩක් දෙනෙක් මේක මායාවක් කියලා විශ්වාස කරන එකක් නෑ. මම කොහොමත් බලාපොරොත්තු වෙන්නේ නෑ තමුන්ලා තේරුම් ගනී කියලා හෙමීට තැම්බෙන කල්දේරමක තියන ලස්සන ගැන. ඒකේ පැතිරෙන සුවඳ, මිනිස් නහර දිගේ හොර රහසින් ගලමින් මනස වශීකරන, සංවේදනයන් අත්පත් කරගන්නා එහි සියුම් බලය ...මට තමුන්ලාට උගන්වන්න පුළුවන් කීර්තිය බෝතලේකට දාන හැටි, මහිමය පෙරාගන්න හැටි, මරණය නවත්වන හැටි පවා - ඒ තමුන්ලා මට නිතරම උගන්වන්න සිද්දවෙන අඥානයෝ රැලක් වගේ නොවුනොත් විතරයි."

එම කතාවෙන් පසු පංතිය තවත් නිහඬ විය. හැරී සහ රොන් එකිනෙකා වෙත ඇස්බැම් ඔසවමින් බැලුම් හුවමාරු කරගත්තෝය. හර්මයිනී ග්‍රැන්ජර් තම ආසනයේ කෙළවරේම හිඳගෙන තමන් අඥානයෙක් නොවන බව ඔප්පු කර පෙන්වීමට නොයිවසිල්ලෙන් සිටියාය.

"පොටර්!" හදිසියේම ස්නේප් කීවේය. "මම ඇස්ෆොඩෙල් මුල් කුඩු වලට වෝම්වුඩ් නික්ශේපනයක් දැම්මොත් මොනාද ලැබෙන්නේ?"

කුඩුකරපු මොන මුල් නික්ශේපනය කරපු මොනාටද? හැරී තමන් මෙන්ම ගල් වී සිටි රොන් දෙස බැලුවේය. හර්මයිනීගේ අත අහසට දිගු වී තිබිණි.

"මම දන්නේ නෑ, සර්," හැරී කීවේය.

ස්නේප්ගේ තොල් අපහාසයෙන් පෙරලුනේය.

"ටුට්, ටුට් - අනිවාර්යයෙන් ප්‍රසිද්ධිය හැමදෙයක්ම නෙවෙයි නේද."

ඔහු හර්මයිනිගේ අත නොසලකා හැරියේය.

Downloaded from sinhalaebooks.com

"අපි ආයෙත් උත්සාහ කරමු. පොටර්, මම තමුන්ට බෙසෝර් එකක් හොයන්න කිව්වොත් කොහේද හොයන්නේ?"

හර්මයිනී තම අසුනෙන් නැගිටින්නේ නැතිව අත එසවිය හැකි උපරිමයට එසවූවාය. නමුත් හැරී බෙසෝර් යනු කුමක්දැයි අංශුමාත්‍රයක් වත් දැන සිටියේ නැත. ඔහු සිනාවෙන් ගැස්සෙන මැල්ෆෝයි, ක්‍රේබ් සහ ගොයිල් දෙස නොබලා සිටීමට උත්සාහ කළේය.

"මම දන්නේ නෑ, සර්." "එන්න කලින් පොතක් ඇරලා බලන්න වත් හිතුවේ නැත්තේද ආ, පොටර්?" හැරී ඔහුගේ සීතල ඇස් දෙසම බලා සිටීමට උත්සාහ කළේය. හැරී ඩර්ස්ලි නිවසේදී තම පොත් බැලුවේය. නමුත් ස්නේප්ට උවමනා මායා ඖෂධ දහසක් සහ පුස් වර්ග පොතේ සියල්ල මතක තබා ගැනීමද?

ස්නේප් තවමත් හර්මයිනීගේ එසවුනු අත මගහරිමින් සිටියේය.

"මන්ක්ශුඩ් වලයි වුල්ෆ්ස්බේන් වලයි වෙනස මොකද්ද පොටර්?"

මෙහිදී, හර්මයිනී නැගිට්ටාය, ඇගේ අත ඉහලට කුටියේ සිවිලිම දෙසට ඇදී තිබිණි.

"මම දන්නේ නෑ ," හැරී සෙමින් කීවේය. "මම හිතන්නේ හර්මයිනී දන්නවා වගේ, ඇයි එයාගෙන් අහන්නේ නැත්තේ?"

කිහිප දෙනෙක් සිනාසුනහ. හැරී සීමස් දෙස බලන විට සීමස් ඇසක් ගැසුවේය. ස්නේප් ඒ ගැන සතුටු වූයේ නැත.

"ඉඳගන්නවා," ඔහු හර්මයිනීට කීවේය. "දැනගන්නවා පොටර්, ඇස්ෆොඩෙල් සහ වෝම්වුඩ් වලින් හදනවා බොහොම බලවත් නිද්‍රා සංයෝජනයක්, ඒක හඳුන්වන්නේ ජීවයේ මරණය නම් නිද්‍රා පානය කියලා. බෙසෝර් එකක් කියන්නේ එලුවාගේ ආමාශයෙන් ගන්න ගලක්, ඒක තමුන් ලාව ගොඩක් වස වර්ග වලින් බේර ගනී. එතකොට මන්ක්ස්හුඩ් සහ වුල්ෆ්බේන්, ඒ දෙකම එකම පැලය, තව ඇකොනයිට් කියලත් කියනවා. හොඳයි. ඇයි ඔයාලා ඒ ඔක්කොම ලියාගන්නේ නැත්තේ?"

හදිසියේ පෑන් සහ කරදාසි වල හඬින් කුටිය පිරී ගියේය. සියලු හඬවලට ඉහලින් ස්නේප් කතා කළේය. "ග්‍රිෆින්ඩෝ වලින් එක ලකුණක් අඩු කරනවා. තමුන්ගේ දූර්වලතාවය වෙනුවෙන් පොටර්."

සංයෝජන පාඩම දිගටම කෙරෙද්දී ග්‍රිෆින්ඩෝ වලට හොඳක් නම් වූයේ නැත

ස්නේප් ඔවුන්ව යුගල ලෙස වෙන් කර පිළිස්සුම් සුව කිරීමට ගන්නා ලේසි සංයෝජනයක් සෑදීමට පැවරුවේය. ඔහු තම කබාය බිම අද්දවමින් ඔවුන් අතර ඇවිදිමින් සිසුන් වියළි නෙට්ල් කිරන සැටි සහ සර්ප දළ කුඩු කරන

Downloaded from sinhalaebooks.com

අයුරු පරික්ශා කරන ගමන් ඔහු ප්‍රිය කළාක් මෙන් පෙනෙන මැල්ෆෝයි ඇර සියලුම සිසුන් පාහේ විවේචනය කළේය. කුටිය කොළ පැහැ ඇසිඞ් දුමකින් පිරී සර්පයෙක් පිඹින්නාක් මෙන් ශබ්දයක් එනවිට ස්නේප් සිසුන්ට මැල්ෆෝයි සර්වසම්පූර්ණ ලෙස අං ගොලුබෙල්ලන් දිය කර ඇති අයුරු බලන ලෙස කියමින් සිටියේය. නෙවිල් විසින් සීමස්ගේ කල්දේරම ඇඹරුනු බුබුලක් බවට දියකර තිබූ අතර ඔවුන් සෑදූ සංයෝජනය සෙමින් පිටට ගලමින් ගල් පොළොවට වැටී සිසුන්ගේ සපත්තු වල සිදුරු ඇති කළේය. තප්පර ගානක් ඇතුළත මුළු පංතියම බංකු උඩ නැගගත් අතර කල්දේරම කඩා වැටුනෙන් නෙවිල් එහි වූ සංයෝජනයෙන් නැහැවී ගියේ ඔහුගේ දෑත් දෙපා වල විශාල රතු දිය බිබිළි නැග ආවෙන් වේදනාවෙන් විලාප දුන්නේය.

"මෝඩ කොල්ලා!" ස්නේප් බිම වැගිරුණු සංයෝජනය තම යශ්ඨිය එක් වරක් වනා සුද්ද කරමින් ගිගිරුවේය. "මම හිතන්නේ තමුන් කල්දේරම ගින්දරෙන් එළියට නොගෙන ඒකට ඉත්තෑ කූරු දැම්මා නේ?"

නාසය මත වූ දිය බිබිලි පුපුරන්නට වූයෙන් නෙවිල් ඉකිබින්දේය.

"එයාව ඉස්පිරිතාල කාමරේට ගෙනියන්න," ස්නේප් සීමස්ට කීවේය. ඉන්පසු ඔහු නෙවිල් ලඟ වැඩ කරමින් සිටි හැරී සහ රොන් දෙසට හැරුනේය.

"තමුන්- පොටර් -ඇයි තමුන් කීවේ නැත්තේ ඉත්තෑ කූරු දාන්න එපා කියලා? එයාට වැරදුනාම තමුන් හොඳයි වගේ පෙනෙයි කියලා හිතුවද ආ? තමුන් නිසා ග්‍රිෆින්ඩෝ වලට තව ලකුණක් අඩු වෙනවා."

මෙය ඉතා අසාධාරණ වූයෙන් හැරී වාද කිරීමට කට ඇරියත් කල්දේරමට පිටුපසින් රොන් ඔහුට ඇන්නෙන් ඔහු නිහඬ විය.

"ඒ ගැන වැඩිය හිතන්න එපා" ඔහු මිමිනුවේය, "මම අහලා තියනවා ස්නේප්ට ගොඩක් නපුරු වෙන්න පුළුවන් කියලා."

පැයකට පසු ඔවුන් කුටියෙන් පිටවන පඩිපෙළ නගිත්දී හැරී ගේ සිත රිදෙමින් මුළු ආත්මයම දුර්වල වී තිබිණි. තම පළමු සතිය තුලදීම ඉහු විසින් ග්‍රිෆින්ඩෝ නිවාසයට ළකුණු දෙකක් අහිමි කර තිබේ. ස්නේප් ඔහුට මෙතරම්ම වෛර කරන්නේ ඇයි? "ගනන් ගන්න එපා," රොන් කීවේය, "ස්නේප් හැම වෙලේම ෆ්‍රෙඞ්ගෙනුයි ජෝජ්ගෙනුයි ළකුණු කපනවා. මට ඔයත් එක්ක හැග්‍රිඞ්ව මුණගැහෙන්න එන්න පුලුවන්ද?"

තුනට පහක් තබා ඔවුන් මාලිගයෙන් පිටවී පිට්ටනිය හරහා ඇවිද ගියෝය. හැග්‍රිඞ් ජීවත් වූයේ තහනම් කැලෑව අසල වූ කුඩා ලී නිවසකය. එහි ඉදිරිපස දොර ලඟ එලියෙන් දුන්නක් සහ දඩයම් බූට්ස් යුගලක් විය.

ඔවුන් දොරට තට්ටු කරත්දී වියරු පහුරු ගෑමක් සහ දෙදරන හඬින් බුරනු ඇසුණි. ඉන්පසු හැග්‍රිඞ්ගේ කටහඬ ඇසිණි. "පස්සට, ෆැන්ග් -- පස්සට."

Downloaded from sinhalaebooks.com

හැග්‍රිඩ් දොර අරිද්දී ඔහුගේ විශාල කෙස් පිරි මුහුණ දොරින් එළියට පෙණුනි.

"පොඩ්ඩක් ඉන්න," ඔහු කීවේය. "පස්සට, ෆැන්ග්."

ඔහු ඔවුන්ව ඇතුලට ගත්තේ අති විශාල කලු බෝහවුන්ඩ් වර්ගයේ බල්ලෙකුගේ කොලරයෙන් අපහසුවෙන් අල්ලාගෙන ඌව පාලනය කරමිනි.

ඇතුලේ තිබුනේ එක් කාමරයක් පමණි. වහලයේ සේරුන් සහ සොසේජස් එල්ලා තිබිණ. විවෘත ගිනි උඳුන මත ඊයම් කේතලයක් රත් වෙමින් තිබේ. කෙළවරේම තිබූ අති විශාල ඇඳමත පැච්වර්ක් මෝස්තර දැමූ ඝන රෙද්දක් විය.

"ගෙදර වගේ ඉන්න," රොන්ගේ ඇඟට පැන ඔහුගේ කණ ලෙවකෑමට පටන් ගත් බල්ලාට යන්නට හරිමින් හැග්‍රිඩ් කීවේය. හැග්‍රිඩ් මෙන්ම ෆැන්ග්ද පැහැදිලිවම පේන තරම් රෞද්‍ර නොවීය.

"මෙයා රොන්," උතුරණ වතුර විශාල තේ පෝච්චියකට දමා රොක් කේක් පීරිසියකට තබන හැග්‍රිඩ්ට හැරී කීවේය.

"තව වීස්ලි කෙනෙක් නේ?" රොන්ගේ ලප දෙසට නෙත් යවමින් හැග්‍රිඩ් කීවේය. "මගේ ජීවිතෙන් බාගයක්ම මම ගෙව්වේ ඔයාගේ නිවුන් අයියලා දෙන්නව කැලෑවෙන් ඈතට එළවන්න"

රොක් කේක් දත් කැඩෙන තරම් හයිය වියළි මිදි යෙදූ හැඩයක් නැති ගෙඩි මෙන් විය. නමුත් තම පළමු පාඩම් ගැන සියලු විස්තර කියන අතරේ ඔවුන් කේක් රස විඳින බව හැග්‍රිඩ්ට හැඟවීය. ෆැන්ග් හැරීගේ දණහිස මත හිස තබාගෙන සිටියෙන් හැරීගේ කබාය ගලන කෙළවලින් තෙමුනේය.

හැග්‍රිඩ් ෆිල්ච්ට "අර නාකියා" කියනු අසා ඔවුන් සතුටු වුනෝය.

"එතකොට අර පූසා, නොරිස් මහත්මිය,  මට වෙලාවක ඌව ෆැන්ග්ට අඳුන්වලා දෙන්න ආසයි. දන්නවද මම ඉස්කෝලෙට යන හැම වෙලේම ඌ මගේ පස්සෙන් හැම තැනම එනවා. ඌව මග අරින්නම බෑ. ෆිල්ච් ඌව දාලා තියෙන්නේ ඒ වැඩේට."

හැරී ස්නේප්ගේ පාඩම ගැන හැග්‍රිඩ්ට කීවේය. රොන් මෙන්ම හැග්‍රිඩ් ද කීවේ ඔහු ලේසියෙන් කිසිම සිසුවෙකුට කැමති නොවන කෙනෙක් නිසා ඒ ගැන වැඩිය නොසිතන ලෙසයි.

Downloaded from sinhalaebooks.com

"ඒත් එයා මට ගොඩක් වෛර කරනවා වගේ පේන්නේ."

"විකාර!" හැග්‍රිඩ් කීවේය. "ඒ මොකටද?"

ඒත් හැරීට සිතුනේ එය කියද්දී හැග්‍රිඩ් හැරීගේ ඇස් මග හැරිය බවයි.

"කොහොමද ඔයාගේ චාලි අයියාට?" හැග්‍රිඩ් රොන්ගෙන් ඇසුවේය. "මම එයාට හරි කැමති -- සත්තුත් එක්ක හරි එකතුයි."

හැරීට සිතුනේ හැග්‍රිඩ් හිතා මතාම මාතෘකාව වෙනස් කළ බවයි. රොන් හැග්‍රිඩ්ට චාලිගේ මකරුන් සමග සිදුකරන රාජකාරි ගැන විස්තර කරද්දී, හැරී මේසය මත තිබූ කඩදාසියක් අතට ගත්තේය. එය ඩේලි ප්‍රොෆෙට් පුවත්පතෙන් කපාගත් කොටසකි.

ග්‍රින්ගොට්ස් කඩාපැනීමේ නව තතු

ජූලි 31 වෙනිදා සිදු වූ ග්‍රින්ගොට්ස් වෙත කඩාපැනීම ගැන දිගටම පරීක්ෂණ පැවැත්වේ. බොහෝ දෙනාගේ මතය මෙය නොදන්නා අඳුරු මායාකරුවෙකුගේ හෝ මායාකාරියකගේ ක්‍රියාවක් බවයි.

ග්‍රින්ගොට්ස් කුරුමිට්ටන් එහි කිසිවක් සොරකම් කොට නොමැති බව අද සහතික කරන ලදී. පරික්ශා කරන ලද සේප්පුව එදින හිස් කරන ලද්දක් බව සැළවේ.

"ඒත් අපි ඒකේ තිබ්බේ මොකද්ද කියලා ඔයාලට කියන්නේ නෑ, ඒ නිසා තමන්ට හොඳක් වෙන දෙයක් බලාගෙන මේකට අත නොදා ඉන්නවානම් හොඳයි" ග්‍රින්ගොට්ස් හි මාධ්‍ය ප්‍රකාශක කුරුමිට්ටා අද හවස ප්‍රකාශ කළේය.

රොන් දුම්රියේදී ග්‍රින්ගොට්ස් හී මංකොල්ල කෑමකට උත්සාහ කිරීමක් සිදු වූ බව කියූ අයුරු හැරීට මතක් විය. නමුත් රොන් දිනයක් කිව්වේ නැත.

"හැග්‍රිඩ්!" හැරී කීවේය, "අර ග්‍රින්ගොට්ස් කඩාවැදීම වෙලා තියෙන්නේ මගේ උපන් දිනේ දවසේ. සමහර විට අපි ඒක ඇතුලේ ඉන්නකොට උනා වෙන්නත් පුළුවන්!"

මෙවර නම් කිසිම සැකයක් නැතිව හැග්‍රිඩ් තම දෑස් මගහැරිය බව හැරීට පෙණිනි. ඔහු විරිත්තා තව කේක් කෑල්ලක් හැරීට දිගු කළේය. හැරී එම කතාව නැවත කියෙව්වේය. පරික්ශාවට ලක්වී තිබූ සේප්පුව කලින් එදිනම හිස් කර

Downloaded from sinhalaebooks.com

තිබිනි. සේප්පු අංක හත්සිය දහතුන හැග්‍රිඩ් විසින් හිස්කරන ලදී. හිස්කිරීම යන්නෙන් අදහස් වන්නේ එහි තිබූ අපිරිසිදු කුඩා පාර්සලය රැගෙන යාම වේ නම් එසේ විය.. හොරු හෙව්වේ ඒක වෙන්න බැරිද?

හැරී සහ රොන් රෑ කෑමට ආපසු මාලිගයට එන විට ප්‍රතික්ශේප නොකිරීමට තරම් කාරුණික වූ කේක් වලින් ඔවුන්ගේ සාක්කු පිරී බරවී තිබිණ. හැරී සිතුවේ මෙතෙක් උගත් කිසිම පාඩමක් ඔහුට හැග්‍රිඩ් සමග තේ පානය තරම් සිතීමට දේවල් නොදුන් බවයි. හැග්‍රිඩ් නියම වේලාව බලා එම පාර්සලය ගත්තාද? ඒක දැන් ඇත්තේ කොහේද? හැග්‍රිඩ් හැරීට කීමට අකමැති යමක් ස්නේප් ගැන දන්නවාද?

## නවවෙනි පරිච්ඡේදය

## මධ්‍යම රාත්‍රී සටන

තමන් ඩඩ්ලිට වෛර කරනවාට වඩා වෛර කරන පිරිමි ළමයෙක් හමුවේ යැයි හැරී කිසිම දිනක සිතුවේ නැත. නමුත් ඒ ඩ්‍රේකෝ මැල්ෆෝයි මුණගැසීමට පෙරයි. තවමත් පළමු වසර ග්‍රිෆින්ඩෝ කණ්ඩායමට ස්ලිදරින් කණ්ඩායම සමග එකට ඉගෙනීමට සිදුවූයේ සංයෝජන පාඩම පමණක් නිසා ඔවුන්ට වැඩිය මැල්ෆෝයි සමග ගැටෙන්නට අවස්ථාවක් නොලැබුනි... එසේ නැත්නම් අඩු තරමේ ඔවුන් ග්‍රිෆින්ඩෝ පොදු කාමරයේ ගසා තිබූ සියල්ලෝම තරහින් කෑ ගැසූ සටහන දකින් තෙක් පමණි. පළමු වසරට පියාසර පාඩම් බ්‍රහස්පතින්දාට ඇරඹේ - ග්‍රිෆින්ඩෝ සහ ස්ලිදරින් කණ්ඩායම් එකට ඉගෙන ගනු ඇත.

"අනිවාර්යයෙන්," හැරී අඳුරු ලෙස කීවේය. "මට හැමවෙලේම ඕනේ උන දේ. මැල්ෆෝයි ඉස්සරහ කොස්සක් උඩ මාව මෝඩයෙක් කරගන්න එක"

ඔහු අනිත් සියල්ලටම වඩා පියෑඹීම ඉගෙන ගැනීමට මගබලාගෙන සිටියේය.

"ඔයා දන්නේ නෑනේ ඔයා මෝඩයෙක් වෙයිද කියලා," රොන් සාධාරණ ලෙස කීවේය. "මොනා උනත් මම දන්නවා මැල්ෆෝයි එයා ක්විඩිච් වලට කොච්චර දක්ශද කියලා කියවනවා කියලා. ඒත් ඔට්ටුයි ඒවා ඔක්කොම නිකන් කතා විතරයි."

ඇත්තටම මැල්ෆෝයි පියෑඹීම ගැන බොහෝ කතා කෙලේය. පළමු වසර සිසුන්ට නිවාස ක්විඩිච් කණ්ඩායමට එකතුවීමට බැරි වීඅ ගැන ඔහු මහ හඬින් පැමිණිලි කළ අතර දිගු ස්ව වර්ණනා අඩංගු කතා කීවේ ඒවා සැමවිටම පාහේ අවසන් වූයේ ඔහු අමාරුවෙන් හෙලිකොප්ටරයක නැගී මගල්ලාගෙන් සැඟවී ගත් බව කියමිනි. ඔහු එකම කෙනා පමණක් නොවීය. සීමස් ෆිනිගන් කියූ ආකාරයට ඔහු තම ළමා කාළයෙන් වැඩි කොටසක් කොස්සක නැගී ගම පුරා පියාඹමින් ගතකර ඇත. රොන් උනත් අසන් කෙනෙකුට තමන් චාලිගේ පරණ කොස්සේ නැගී යන විට කුඩා ගොවි ගුවන් යානයක හැප්පීමට ගිය අයුරු විස්තර කරයි. මායා පවුල් වලින් ආ සියල්ලෝම ක්විඩිච් ගැන නිතර කතා කරයි. රොන් දැනටමත් ඔවුන්ගේ කාමර සගයා වූ ඩීන් තෝමස් සමග පාපන්දු ගැන් ලොකු විවාදයක් කර

Downloaded from sinhalaebooks.com

තිබිණි. කිසිවෙකුට පියැඹීමට අවසර නැති තනි බෝලයේ සෙල්ලමේ ඇති විනෝදයක් රොන්ට සිතාගැනීමටවත් නොහැකිය. ඩීන්ගේ වෙස්ට් හැම් පාපන්දු කණ්ඩායමේ පෝස්ටරයේ ක්‍රීඩකයින්ට සෙළවීමට පෙලඹවීමට රොන් උත්සාහ කරන අයුරු හැරීට අසු වී තිබිණි.

නෙවිල් තම ජීවිතයේ කිසිදිනක පදින කොස්සක නැග නොතිබිණි. මන්ද ඔහුගේ ආච්චි අම්මා කිසිදින ඒ ලඟට වත් යාමට ඉඩ දී තිබුනේ නැත. පෞද්ගලිකව හැරීට දැනුනේ ඇයට ඊට ඉතා හොඳ හේතු තිබූ බවයි. මන්ද යත් කකුල් දෙකම බිම තිබියදීත් නෙවිල් අසාමාන්‍ය සංඛ්‍යාවක අනතුරු සිදුකරගෙන තිබිනි.

හර්මයිනී ග්‍රැන්ජර් නෙවිල් තරමටම පියැඹීම ගැන බිය වී සිටියාය. ඇය උත්සාහ කළත් මෙය පොතක් හොඳින් පාඩම් කර ඉගෙන ගත හැක්කක් නොවීය. බ්‍රහස්පතින්දා උදෑසන ආහාර ගන්නා වෙලේ ඇ යුගයන් පුරාවට ආ කුඩිච් නම් වූ පුස්තකාල පොතකින් සොයාගත් පියැඹීමේ රහස් ගැන කියවමින් ඔවුන් සියල්ලන්වම මෝඩයන් සේ කම්මැලි කරවීය. නෙවිල් ඇගේ සියලුම වචන පියාඹන කොස්ස මත රැඳී සිටීමට පසුවට උපකාරයක් වේ යැයි සිතා ඉතා හොඳින් ග්‍රහණය කරගනිමින් සිටියත් අනික් අය ලියුම් පැමිණීමෙන් හර්මයිනීගේ දේශණයට බාධාවීම ගැන් සතුටු වූවෝය.

හැග්‍රිඩ් ගේ සටහනට පසු හැරීට එකදු ලියුමක් වත් ආවේ නැත. අනිවාර්යයෙන් මැල්ෆෝයි එය වහා අඳුනාගෙන තිබිණි. මැල්ෆෝයිගේ රාජාලි බකමූණා ඔහුට නිතරම නිවසින් රසකැවිලි පාර්සල් රැගෙන ආවෙන් ඔහු ඒවා උදම් අනමින් ස්ලිදරින් මේසය මත දිග හැරියේය.

අටු බකමූණෙක් නෙවිල්ට තම ආච්චි අම්මාගෙන් කුඩා පාර්සලයක් රැගෙන ආවේය. ඔහු එය සතුටින් විවෘත කොට සුදු පැහැ දුමක් පිරී තිබූ විශාල වීදුරු බෝලයක් ඔවුන්ට පෙන්වූයේය.

"මේක මතක බෝලයක්!" ඔහු විස්තර කළේය. "ආච්චි අම්ම දන්නවා මට එක එක දේවල් අමතක වෙනවා කියලා - ඔයාට මොනාහරි කරන්න තියන දෙයක් අමතක වෙලා නම් මේක කියයි. බල්න්න, ඔයා මේක මෙහෙම තදින් මිරිකගෙන ඉන්නකොට ඒක රතු පාට උනොත් - ඔහ්..." ඔහුගේ මූණ දික් විය. මන්ද මතක බෝළය එක්වරම ලේ රතු පැහැ විය.

"ඔයාට මොනා හරි අමතක වෙලා..."

නෙවිල් අමතක වූ දෙය මතක් කිරීමට උත්සාහ ගනිමින් සිටින අතර ග්‍රිෆින්ඩෝ මේසය් අසලින් ගිය ඩ්‍රේකෝ මැල්ෆෝයි මතක බෝලය ඔහුගේ අතින් උදුරාගත්තේය.

හැරී සහ රොන් වහා නැගිට්ටෝය. මැල්ෆෝයි සමග රන්ඩු වීමට හේතුවක් ලැබීම නිසා ඔවුන් මදක් උඩ පැන්නෝය. නමුත් පාසලේ සිටින අනිකුත් සියලුම ගුරුවරුන්ට වඩා ඉක්මනින් කළබලයක් ඇසට හසු කරගන්නා ප්‍රොෆෙසර් මැක්ගොනගල් විදුලි වේගයෙන් එහි පැමිණියාය.

Downloaded from sinhalaebooks.com

"මොකද මෙතන වෙන්නේ?"

"මැල්ෆෝයි මගේ මතක බෝලේ ගත්තා, ප්‍රොෆෙසර්."

තරහින් පුපුරමින් මැල්ෆෝයි වහා මතක බෝලය මේසය මත අතහැරියේය.

"නිකන් බැලුවේ," කියූ ඔහු ක්‍රේබ් සහ ගොයිල් සමග එතනින් ලිස්සා ගියේය.

එදින සවස තුනහමාර වෙද්දී හැරී, රොන් සහ අනෙකුත් ග්‍රිෆින්ඩෝ පළමු වසර සිසුන් වහා ඉදිරි පඩිපෙළ බැස තම පළමු පියාසර පාඩමට ගියෝය. එය පැහැදිලි සහ සුළං සහිත දිනයක් වූ අතර පිට්ටනියේ කපන ලද තණකොල වලට විරුද්ධ පෙදෙසින් ඈතින් පෙනෙන ඇඳුරු ලෙස වැනෙන ගසින් පිරි තහනම් කැලෑව පැත්තට ගමන් කළ ඔවුන්ගේ පා වලට එහි වැවී තිබූ තණකොළ පොඩි වී ගියේය.

ස්ලිදරින් වරු දැනටමත් එහි පැමිණ තිබූ අතර පොළොව මත පිළිවෙලට පියාඹන කොසු විස්සක් තබා තිබිණ. ෆ්‍රෙඩ් සහ ජෝජ් වීස්ලි පාසලේ පියාඹන කොසු ගැන පැමිණිලි කරනු හැරී අසා තිබිණ. එවා ගොඩක් ඉහලට පදින විට වෙවුලන බවත්, මදක් වමට නැමෙමින් ගමන් කරන බවද ඔවුන්ගේ අදහසයි.

ඔවුන්ගේ පියාසර ගුරුවරිය වූ මැඩම් හූච් පැමිණියාය. ඇයට අළුපැහැ කෙටි කොණ්ඩයක් සහ රාජාලියෙකුගේ මෙන් කහ පැහැ ඇස් විය.

"හොඳයි, ඔයාලා මොකටද බලාගෙන ඉන්නේ?" ඇය කෑ ගැසුවාය. "හැමෝම කොස්සක් ලඟින් හිටගන්න. ඉක්මනට, ඉක්මනට."

හැරී බිම තිබූ තම කොස්ස දෙස බැලුවේය. එය පැරණි එකක් වූ අතර සමහර කූරු නොයේකුත් දිශාවලට හැරවී තිබිණි.

"තමන්ගේ දකුණු අත කොස්සට ඉහලින් අල්ලන්න," ඉදිරියෙන් සිටි මැඩම් හූච් කීවාය. "දැන් උඩට කියලා කියන්න!"'

"උඩට" සැවොම කෑ ගැසූහ.

හැරීගේ කොස්ස එක්වරම ඉහල හැරීගේ අතට පැන්නේය. නමුත් එසේ වූයේ කිහිප දෙනෙකුගේ පමණි. හර්මයිනී ග්‍රැන්ජර්ගේ කොස්ස පොළොව මත රෝල් වුනා පමණි. නෙවිල්ගේ කොස්ස සෙලවුනේ වත් නැත. සමහර විට

Downloaded from sinhalaebooks.com

අශ්වයන්ට මෙන් කොස්සටද තමුන් බයවී සිටිනවානම් දැනෙනවා වෙන්න පුළුවන් යැයි හැරී සිතුවේය. නෙවිල්ගේ කටහඬේ වූයේ ඔහුට තම කකුල් පොළොව මතම තබා ගැනීමට උවමනා බවකි.

මැඩම් හූච් ඊලඟට කොස්සෙන් ලෙස්සා නොවැටී ඒ මත හිඳගන්නා අයුරු පෙන්වා දෙන අතර පේලි අතර ඉහල පහළ යමින් ඔවුන්ගේ අල්ලා ගැනීම නිවැරදි කළාය. ඈ මැල්ෆෝයිට ඔහු අවුරුදු ගණනාවම එය වැරදියට කර ඇතිබව කියනු අසා හැරී සහ රොන් ප්‍රීති විය.

"දැන්, මම විසිල් එකක් ගහනකොට ඔයාලා පොළොවෙන් ඉහලට පනින්න ඕනේ... වේගෙන්," මැඩම් හූච් කීවාය. "තමන්ගේ කොස්ස කෙළින් තියාගෙන අඩි කීපයක් උඩට ගිහින්, ඉදිරිපසට නැවිලා කෙලින්ම බිමට එන්න ඕනේ.. මගේ විසිල් එකට. හරිද.. තුනායි.. දෙකායි..."

නමුත් බයෙන් උඩපනිමින් සිටි නෙවිල්, තනිවම පොළොවේ සිටීමට වේ යැයි බියවී මැඩම් හූච් විසිල් කිරීමටත් පෙර වේගයෙන් ඉහලට පැන්නේය.

"ළමයෝ, ආපහු එන්න!" ඇය කෑගසුවාය. නමුත් නෙවිල් බෝතලයකින් කිරල මූඩියක් විදින්නාක් මෙන් ඉහලටම වේගයෙන් යමින් සිටියේය. අඩි දොළහක්- අඩි විස්ක්. ඈතට යන පොළොව දෙස බයවුනු සුදුමැලි මුහුණින් ඔහු බලනු හැරීට පෙණිනි. ගැස්සී කොස්සේ පැත්තකින් ලෙස්සා ගිය ඔහු...

වැම් - තණබිස්සේ මුනින් තලා බිම පතිත වූ නෙවිල්ගෙන් බිඳෙන හඬක් ආවේය. ඔහුගේ කොස්ස තවත් ඉහලට ඉහලට ගමන් කොට කම්මැලි ලෙස තහනම් කැළය පැත්තට සෙමින් පාත් වී නොපෙනී ගියේය.

මැඩම් හූච් නෙවිල් වෙතට නැවුනි, ඇගේ මූණද ඔහුගේ මෙන්ම සුදුමැලි විය.

"මැණික්කටුව කැඩිලා," ඇය මුමුණනු හැරීට ඇසිණි. "එන්න ළමයෝ - ඒකට කමක් නෑ, දැන් නැගිටින්න.".

ඇය පංතියේ අනෙකුත් ළමයින් දෙසට හැරුණාය.

"මම මේ ළමයාව ඉස්පිරිතාල කාමරේට ගෙනියලා එනකන් කවුරුත් හෙළවෙන්නේ නෑ! කොසු ඔය තියන තැන් වලම තියෙන්න ඕනේ, එහෙම නැති උනොත් කුඩිච් කියන්නත් කලින් හොග්වාර්ට්ස් වලින් එළියට යන්න පුළුවන්. තේරුනානේ. යමු පැටියෝ."

නෙවිල් කඳුලු පිරි මුහුණින් කැඩුණු මැණික්කටුව අල්ලාගෙන නොන්ඩි ගසමින් ගිය අතර මැඩම් හූච් ඔහු වටා අත දමා ඔහුව වාරු කරගෙන ගියාය.

Downloaded from sinhalaebooks.com

ඔවුන් ඇස් මායිමෙන් ඉවත් වූ වහා මැල්ෆෝයි සිනාවෙන් පුපුරන්නට විය.

"ඔයා එයාගේ මූණ දැක්කද, තඩි බෝලේ?"

අනෙක් ස්ලිදරින්වරු ද ඔහුට එක් විය.

"කටවහනවා, මැල්ෆෝයි," පාර්වතී පටෙල් ඉදිරියට පැන්නාය.

"ඕහ්, ලොන්ග්බොටම් වෙනුවෙන් ඉදිරිපත් වෙනවාද?" පැන්සන් පාකින්සන් නම් වූ දරුණු පෙනුමැති ස්ලිදරින් කෙල්ල කීවාය.. "මම කවදාවත් හිතුවේ නෑනේ ඔයා තඩි අඬන බබාලාට කැමති වෙයි කියලා පර්වතී."

"බලන්න!" ඉදිරියට පැමිණ තණකොළ අතරින් යමක් අහුලා ගනිමින් මැල්ෆෝයි කීවේය. "මේ අර ලොන්ග්බොටම්ට ආච්චි එවපු මෝඩ බෝලේ."

ඔහු එහලට ඔසවද්දී මතක බෝලය හිරු එළියට දිලිසිණි.

"ඒක මෙහෙ දෙන්න, මැල්ෆෝයි," හැරී සෙමින් කීවේය. සැවොම කතා නවතා එ දෙස බැලුවෝය.

මැල්ෆෝයි ජරා ලෙස හිනාවුනේය.

"මම හිතන්නේ මම ඒක ලොන්ග්බොටම් ට හොයාගන්න කොහේහරි තියන්නම් - කොහේද -- ගහක් උඩ?"

"මෙහෙ දෙනවා ඒක!" හැරී කෑ ගැසුවත් මැල්ෆෝයි තම කොස්සට නැග ඉහලට ගියේය. ඔහු බොරුවක් කියා නැත. ඔහුට ඉතා හොඳින් පියාසර කළ හැක. ඉහළම ඕක් අතු වලටත් ඉහලින් ගමන් කරමින් ඔහු කතා කළේය. "ඇවිත් ඒක අරගන්නවා, පොටර්!"

හැරී තම කොස්ස අතට ගත්තේය.

"එපා!" හර්මයිනී ග්‍රැන්ජර් කෑගැසුවාය. "මැඩම් හූච් කිව්වේ අපිට හෙලවෙන්නවත් එපා කියලා. -- ඔයාලා අපි ඔක්කොම අමාරුවේ දාන්න යන්නේ."

Downloaded from sinhalaebooks.com

හැරී ඇයව නොසලකා හැරියේය. ඔහුගේ කණ් පෙති වල ලේ පිරෙන්නට විය. ඔහු කොස්සට නැග පොළොවට තදින් පයින් ගසා ඉහල නැංගේය. ඉහලට යත්ම ඔහුගේ කෙස් අතරින් සුළඟ වේගයෙන් ගමන් කළ අතර ඔහුගේ කබාය ගැළවී ගියේය. හදිසියේම උගන්වන්නේ නැතිව කළහැකි යමක් හමු වීමේ සතුටින් ඔහු පිනාගියේය. එය ඉතා පහසු සහ පුදුමාකාර දෙයක් විය. ඔහු තවත් ටිකක් කොස්ස ඉහලට ඇද තවත් ඉහලට ගියේය. කෑ ගැසීම් සහ ගැහැණු ළමයින්ගේ ගැස්සීම් අතර රොන් ඔහුව අගයමින් ඔල්වරසන් දෙන හඬද පහළින් ඇසිණි.

හැරී අතරමගදී වහා කොස්ස මැල්ෆෝයි දෙසට හරවා ඔහුට මුහුණ දුන්නේය. මැල්ෆෝයි ගල්වී මෙන් සිටිනවා පෙණින.

"දෙනවා ඒක මෙහෙට," හැරී කීවේය. "නැත්තන් තමුන්ව මම ඔය කොස්සෙන් ඇදලා දානවා!" "ආ, ඇත්තද?" කණගාටු වෙන බව පෙණුනත් නිර්භීත වීමට උත්සාහ කරමින් මැල්ෆෝයි කීවේය.

හැරී කෙසේ හෝ කළයුත්ත දැන සිටියේය. ඔහු ඉදිරිපසට නැවී කොස්ස අත්දෙකෙන්ම තදින් අල්ලාගත්තෙන්, එය විදුලි වේගයෙන් මැල්ෆෝයි වෙත ඇදී ගියේය. මැල්ෆෝයි වෙලාවට මදක් අයින් විය. හැරී මුහුණට මුහුණ හැරී කොස්ස කෙළින් තබා ගත්තේය. පහළ කීප දෙනෙක් අත්පුඩි ගැසූහ.

"තමුන්ගේ බෙල්ල බේරගන්න මෙතන ක්‍රේබ් ගොයිල් දෙන්නා නෑ මැල්ෆෝයි," හැරී කීවේය.

මැල්ෆෝයිටත් එම අදහසම සිතට දැනුන බවක් පෙනෙන්නට විය.

"පුළුවන්නම් අල්ලගන්නවා එහෙනම්!" කෑගසා කියූ මැල්ෆෝයි, වීදුරු බෝලය ඉහළ අහසට විසී කොට පොළොව දෙසට ආපසු ගියේය.

හැරී එය මන්දගාමීව මෙන් දුටුවේ, බෝලය ඉහලට ගොස් ආපසු වැටෙන්නට පටන් ගත්තේය. ඔහු ඉදිරියට නැවී කොසු මිට පහත් කළෙන් ඊලඟ තප්පරයේදී වහ වහා වේගය අති ප්‍රභල ලෙස වැඩි කරගත්තේය. බෝළය හඹා යත්ම හැරීගේ කණ්වල සුළඟ විසිල් ශබ්දයක් මෙන් බලා සිටින්නන්ගේ කෑගැසීම් හඬ හා මිශ්‍රව ඇසෙන්නට විය ඔහු අත දිගහැර පොළොවට අඩියක තබා එය අල්ලා ගත්තේ වහා තම කොස්ස ඇද කෙලින් කරගත්තේය. හැරී මතක බෝළය අතින් ගෙන සෙමින් තණබිස්ස මතට පා තැබුවේය.

"හැරී පොටර්!"

පියෑඹුව වේගයට වඩා වේගයෙන් ඔහුගේ හදවත කිඳාබැස්සේය. ප්‍රොෆෙසර් මැක්ගොනගල් ඔහු වෙත දුව එමින් සිටී. ඔහු ඔහු පැටලෙන කකුල් වලින් හිටගත්තේය.

Downloaded from sinhalaebooks.com

"මම හොග්වාට්ස් හිටපු මුලු කාලෙටම - කවදාවත් නෑ "

ප්‍රොෆෙසර් මැක්ගොනගල් පුදුමයෙන් කතාකරගත නොහැකිව පෙනී සිටියාය. ඇගේ කණ්නාඩි කුට්ටම කේන්තියෙන් දිලිසිණි. , "-- මොන හයියක්ද තමුන්ට - බෙල්ල කැඩිලා ගියානම් එහෙම- - "

"ඒක එයාගේ වැරද්ද නෙවෙයි ප්‍රොෆෙසර් - "

"කටවහනවා පටිල්"

"ඒත් මැල්ෆෝයි - - "

"ඔය ඇති, වීස්ලි. පොටර් මගේ පස්සෙන් එනවා. දැන්ම."

හැරී පිටත් වෙද්දී මැල්ෆෝයි, ක්‍රේබ් සහ ගොයිල්ගේ ජයග්‍රාහී මුහුණු දුටුවේය. ප්‍රොෆෙසර් මැක්ගොනගල් පසුපසින් ගොස් මාලිගය දෙසට හැරෙත්ම ඔහුගේ ඇඟ පණනැතිවාක් මෙන් විය. ඔහුව නෙරපන්නයි යන්නේ, ඔහුට එය දැණිනි. ඔහුට නිදහසට කාරනා කීමට අවශ්‍ය උවත් ඔහුගේ කටහඬට කුමක් හෝ වී තිබිණ. ප්‍රොෆෙසර් මැක්ගොනගල් ඔහු දෙස නොබලාම ඉදිරියට ඇදුනාය. ඔහු සෙමින් දුවමින් ඈ පසුපස ගියේය. ඔහුට සති දෙකක්වත් ඉන්නට ලැබුනේ නැත. විනාඩි දහයකින් ඔහුට තම බෑග් සූදානම් කිරීමට සිදු වනු ඇත. ඔහු දොරකඩ සිටිනු දැක ඩර්ස්ලිවරු මොනා කියාවිද?

ඔවුන් ඉදිරි පඩිපෙළ නැග, ඇතුලේ ඇති ගල් පඩිපෙළෙන් ඉහලට ගමන් කළෝය. ප්‍රොෆෙසර් මැක්ගොනගල් තවමත් ඔහුට වචනයක්වත් කීවේ නැත. ඇය වහා දොරවල් අරිමින් කොරිඩෝ දිගේ යද්දී හැරී අභාග්‍ය සම්පන්න ලෙස ඈ පිටුපස ඇදුනේය. සමහර විට ඈ ඔහුව ඩම්බල්ඩෝ වෙත ගෙනයනවා විය හැක.  හැරී හැග්‍රිඩ් ගැන සිතුවේය, ඔහු නෙරපුවත් ක්‍රීඩා භාරකරු ලෙස රැඳෙන්නට අවසර ලැබුණි. සමහර විට ඔහුට හැග්‍රිඩ්ගේ සහකරු ලෙස ඉන්නට පුළුවන් වේවි. ඒ ගැන සිතද්දී ඔහුගේ බඩ දැඟලුවේ, තමුන් හැග්‍රිඩ්ගේ බෑග් කරතියන් පිට්ටනි වටේ යනවිට  රොන් සහ අනෙක් අය මායාකරුවන් වෙන සැටි බලාසිටින්නට සිදුවෙනු සිහිවීමෙනි.

ප්‍රොෆෙසර් මැක්ගොනගල් එක් පංතිකාමරයක් ඉදිරිපස නැවතුනාය. ඇය දොර ඇර හිස ඇතුලට දැම්මාය.

"මට සමාවෙන්න, ප්‍රොෆෙසර් ෆ්ලිට්වික්, මට ටිකකට වුඩ්ව ගන්න පුළුවන්ද ?"

"වුඩ්? (දර) හැරී සිතුවේය, වුඩ් කිව්වේ, ඇය ඔහුට කෝටුවක් පාවිච්චි කරන්න යනවාද?

Downloaded from sinhalaebooks.com

නමුත් වුඩ් යනු පිරිමි ළමයෙක් බවට පත්විය. පිරිපුන් සිරුරැත් පස්වන වසරේ සිසුවෙකු ව්‍යාකූල පෙනුමෙන් ෆ්ලිට්වික් ගේ පංතියෙන් එළියට ආවේය.

"දෙන්නම එන්න මගේ පස්සෙන්," ප්‍රොෆෙසර් මැක්ගොනගල් කීවෙන්, දෙදෙනාම ඈ පිටුපසින් කොරිඩෝ දිගේ ගමන් කළහ. වුඩ් කුතුහළයෙන් හැරී දෙස බළමින් සිටියේය.

"මෙතනට."

කළුලැල්ලේ නපුරු වචන ලියමින් සිටි පීව්ස් හැරුනු කොට කිසිවෙක් නැති හිස් පංති කාමරයක් ප්‍රොෆෙසර් මැක්ගොනගල් ඔවුන්ට පෙන්වූවාය.

"පීව්ස්, එළියට!" ඇය කෑගැසුවාය. පීව්ස් මහ සද්දෙට හුණු කූරු ටික කසල බඳුනට විසිකොට ශාප කරමින් ඉවත්ව ගියේය. ඔහු ගියපසු දොර වසා දැමූ ප්‍රොෆෙසර් මැක්ගොනගල් සිසුන් දෙදෙනාට මුහුණ දුන්නාය.

"පොටර්, මේ ඉන්නේ ඔලිවර් වුඩ්. වුඩ් - මට ඔයාට සොයන්නෙක් හම්බුනා."

වුඩ්ගේ මුහුනේ වූ ප්‍රෙහෙලිකාවක් මෙන් වූ පෙනුම ප්‍රීතියක් බවට හැරිණි.

"ඔය ඇත්තටමද, ප්‍රොෆෙසර්?"

"අනිවාර්යයෙන්," ප්‍රොෆෙසෙර් මැක්ගොනගල් ක්ෂණිකව කීවාය. "මේ ළමයා ස්වභාවිකවම සොයන්නෙක්. මම කවදාවත් ඒ වගේ දෙයක් දැකලා නෑ. ඒ ඔයා කොස්සක් පැද්ද පළවෙනි වතාවද පොටර්?"

හැරී නිහඬව හිස සැලුවේය. සිදුවන දේ ගැන යන්තම්වත් ඔහුට තේරුනේ නැත. නමුත් ඔහුව නෙරපන්නේ නැති බවක් පෙනෙන්නට විය. ඉන් ඔහුගේ කකුල් වලට නැවත පණ ලැබුණි.

"එයා අරක අතින් අල්ලගත්තේ මීටර් පනහක් පහළට කිමිදිලා," ප්‍රොෆෙසර් මැක්ගොනගල් වුඩ්ට කීවාය. "සීරීමක්වත් කරගත්තේ නෑ. චාලි වීස්ලි නම් ඒක කරන්නේ නෑ."

වුඩ් ඔහුගේ සියලුම සිහින සැබෑ වී ඇතිවාක් මෙන් බැලුවේය.

Downloaded from sinhalaebooks.com

"පොටර්, කවදාහරි කුඩිච් තරඟයක් දැකලා තියනවද?" ඔහු උද්‍යෝගයෙන් ඇසුවේය.

"වුඩ් තමයි ග්‍රිෆින්ඩෝ කණ්ඩායමේ නායකයා," ප්‍රොෆෙසර් මැක්ගොනගල් විස්තර කළාය.

"එයා හැදිලා තියෙන්නෙම සොයන්නෙක් වෙන්න," හැරී ගේ වටේ යමින් ඔහු දෙස බළමින් වුඩ් කීවේය. "සැහැල්ලු - වේගවත් - අපිට එයාට හොඳ කොස්සක් අරන් දෙන්න වෙයි ප්‍රොෆෙසර් - මම කියන්නේ නිම්බස් දෙදාහා හරි ක්ලීන්ස්වීප් හත හොඳයි."

මම ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝට කතාකරලා බලන්න ඕනේ පළමු වසර ළමයින්ගේ නීති පොඩ්ඩක් නවාගන්න පුළුවන්ද කියලා. දෙයියෝ තමයි දන්නේ අපිට මේ අවුරුද්දේ ගිය අවුරුද්දට වඩා හොඳ කණ්ඩායමක් ඕනේ. අන්තිම තරඟේදි අපිව ස්ලිදරින් කණ්ඩායමෙන් තැලිලම ගියනිසා, මට සති ගානක් සෙවරස් ස්නේප් ගේ මූණ බලන්න බැරිව හිටියේ."

ප්‍රොෆෙසර් මැක්ගොනගල් ඇගේ කණ්නාඩියට ඉහලින් දැඩි පරික්ෂාවෙන් හැරී දෙස බැලුවාය.

"පොටර්, මට ඇහෙන්ට ඕනේ ඔයා හොඳට මහන්සිවෙලා පුහුණු වෙනවා කියලා. එහෙම නැත්තන් මගේ හිත වෙනස් කරගෙන දඬුවම් කරන එක ගැන හිතන්න වෙනවා."

ඉන්පසු හදිසියේම ඇ සිනාසුනාය.

"ඔයාගේ තාත්තා හිටියානම් ආඩම්බර වෙයි," ඇය කීවාය. "එයා හරි දක්ශ කුඩිච් ක්‍රීඩකයෙක්."

"ඔයා විහිලු කරනවා."

ඒ රාත්‍රී කෑම වේලාවයි. හැරී රොන්ට ප්‍රොෆෙසර් මැක්ගොනගල් සමග ක්‍රීඩාපිටියෙන් පිටත් වූ පසු සිදු වූ සියල්ල කියා ඉවර උනා පමණි. රොන් මස් කැල්ලක් හා කිඩ්නිපයි කෑල්ලක් කටට ලංකළේය. ඉන්පසු හදිසියේ එය අමතක විය.

"සොයන්නෙක්?" ඔහු කීවේය. "ඒත් පළමු වසර අය කවමදාකවත් - ඔයා අවුරුදු සීයකටවත් නිවාසෙට සෙල්ලම් කරපු පොඩිම ක්‍රීඩකයා වෙන්න ඇති" කියූ රොන් කිඩ්නිපයි කටේ පුරවා ගත්තේය. හැරීට සවස සිදුවූ උද්‍යෝගීමත් සිදුවීම නිසා මහත් වූ බඩගින්නක් ඇතිවී තිබිණ. . "වුඩ් මට කිව්වා"

රොන් බොහෝ සේ පුදුම වී, සතුටින් හැරී දෙස බලාගෙන ඉඳගෙන සිටියේය.

Downloaded from sinhalaebooks.com

"මම ලබන සතියේ පුහුණුවීම් පටන්ගන්නවා," හැරී කීවේය. "කාටවත් කියන්න විතරක් එපා, වුඩ්ට ඕනේ ඒක රහසක් විදිහට තියාගන්න."

ෆ්‍රෙඩ් සහ ජෝජ් ප්‍රධාන ශාලාවට පැමිණියේ, හැරීව දැක වහා ඔහු වෙත ආවෝය.

"නියමයි," ජෝජ් රහසින් මෙන් කීවේය. "වුඩ් අපිට කිව්වා. අපිත් කණ්ඩායමේ ඉන්නවා - අපි පහරදෙන්නෝ."

"ඔයාට මම කියන්නේ, මේ පාර ක්විඩිච් කුසලානේ අපි අනිවාර්යයෙන් දිනනවා" ෆ්‍රෙඩ් කීවේය. "චාලි ගියාට පස්සේ අපි දිනුවේම නෑ, ඒත් මේ පාර කණ්ඩායම නියම එකක වෙයි. ඔයා හොඳ ඇති හැරී, එයා අපිට කිව්වේ උඩ පැන පැන."

"එහෙනම්, අපි යන්න ඕනේ, ලී ජෝඩාන් කියනවා එයාට ඉස්කෝලෙන් එළියටයන රහස් පාරක් හම්බුනාලු."

"ඔට්ටුයි ඔය කියන්නේ ග්‍රෙගරි ද ස්මාර්ම් පිළිමේ පිටිපස්සේ තියන එක, ඒක අපි හොයාගත්තේ අපේ පළවෙනි සතියෙදි. පස්සේ හමුවෙමු."

ෆ්‍රෙඩ් ජොජ් දෙදෙනා යනවිටම එතනට පැමිණියේ එපාම කරපු කෙනෙකි: ක්‍රේබ් සහ ගොයිල් පිරිවරාගත් මැල්ෆෝයි.

"අන්තිම කෑම කනවද, පොටර්? කීයටද ඔහේගේ මගල් ලෝකෙට කෝච්චිය ගන්නේ?"

"ඔහේ දැන් බිමට බැහැලා පුංචි යාලුවෝ ටික වටකරගත්තම හරි වීරයා වෙලා නේ," හැරී සන්සුන්ව කීවේය. ක්‍රේබ් සහ ගොයිල් ගේ කිසිම දෙයක් පුංචි උනේ නැතත් ඉහළ මේසය ගුරුවරුන්ගෙන් පිරී තිබියදී, ඔවුන් එක්කෙනෙකුටවත් තම කරගැට කඩනවා හෝ දත්මිටි කනවා හැර කරන්න දෙයක් නොතිබිණි.

"මමම ඔහේව ගෙනියන්නම් ඕනෙම වෙලාවක," මැල්ෆෝයි කීවේය " අද රෑ, ඔහෙට ඕනෙනම්. ද්විත්ව මායාකාර සටනක්. යශ්ඨි විතරයි - කාටවත් කියන්න බෑ. මොකද්ද ප්‍රශ්නේ? මම හිතන්නේ, මීට කලින් ද්විත්ව මායාකාර සටනක් ගැන කවදාවත් අහලා නෑනේ?"

"අනිවාර්යයෙන් එයා අහලා තියනවා" රොන් වටේ කරකැවෙමින් කීවේය "මම එයාගේ දෙවෙනියා, ඔහේගේ කවුද?"

Downloaded from sinhalaebooks.com

මැල්ෆෝයි ක්‍රේබ් සහ ගොයිල් දෙස පරික්ශාවෙන් බැලීය.

"ක්‍රේබ්," ඔහු කීවේය. "රෑ දොලහට හරි? අපි ඔහේලව හම්බවෙන්න එනවා කුසලාන කාමරේට; ඒක හැමවෙලේම ඇරලා තියෙන්නේ."

මැල්ෆෝයි ගියපසු රොන් සහ හැරී මුහුණෙන් මුහුණ බැලූහ. "මොකද්ද ද්විත්ව මායාකාර සටනක් කියන්නේ?" හැරී ඇසුවේය. "එතකොට ඔයා මගේ දෙවෙනියා කිව්වේ මොකද්ද?"

"මේකයි, දෙවෙනියෙක් ඉන්නේ ඔයා මැරුනොත් ඒ තැන ගන්න," තම සීතල වූ පුඩිම කමින් රොන් සාමාන්‍ය ලෙස කීවේය. හැරීගේ මුහුණේ වූ පෙනුම දැක ඔහු වහා කතා කළේය, "ඒත් මිනිස්සු මැරෙන්නේ ඇත්ත සටන් වලදි විතරයි. දන්නවානේ, ඇත්තම මායාකාරයෝ ඉන්න. ඔයාටයි මැල්ෆෝයිටයි කරන්න පුලුවන් එකිනෙකාට එළි විද ගන්න විතරයි නේ. ඔය දෙන්නාගෙන් එක්කෙනක්වත් තුවාල කරගන්න තරම් මන්තර දන්නේ නෑනේ . මම හිතන්නේ ඌට ඕනේ උනේ ඔයා බෑ කියයි කියලා කියන එක."

"මම යශ්ඨිය වනනකොට මොකුත් උනේ නැත්තන් මොකද වෙන්නේ?"

"ඒක පැත්තකට විසිකරලා හොම්බට එකක් අනින්න," රොන් යෝජනා කළේය "සමාවෙන්න මට."

දෙදෙනාම උඩ බැලූවිට හර්මයිනී ග්‍රැන්ජර් එහි විය.

"මෙතන මනුස්සයෙක්ට නිදහසේ කන්නවත් බැරිද?" රොන් කීවේය.

හර්මයිනී ඔහුව නොසලකා හැර හැරීට කතා කළේය.

"මට ඔයයි මැල්ෆෝයි දෙන්නා කතා කරපු දේවල් අහගෙන ඉන්නේ නැතිව ඉන්න බැරි උනා - "

"ඔට්ටුයි ඔයාට පුළුවන්," රොන් මිමිනුවේය.

"ඔයාලා රෑ තිස්සේ ඉස්කෝලේ පුරා හොරෙන් ඇවිදින්න යන්න එපා. හිතන්න ඔයාලා අහුවුනොත් ග්‍රිෆින්ඩෝ වලින් කොච්චර ලකුණු කැපෙයිද? ඔයාලා ඒකමයි කරන්නේ. කොච්චර ආත්මාර්ථකාමීද ඔයාලා"

Downloaded from sinhalaebooks.com

"ඒක ඔයාගේ වැඩක් නෙවෙයි," හැරී කීවේය.

"ගුඩ් බායි," රොන් කීවේය.

හොඳ දවසක අවසානය යැයි කිව නොහැකි එම රාත්‍රියේ හැරී අවදිව ඩීන් සහ සීමස් නින්දට වැටෙන් අයුරු අසා සිටියේය. (නෙවිල් තවමත් ඉස්පිරිතාල කාමරයෙන් පැමිණ සිටියේ නැත). රොන් මුලු හැන්දෑවම ඔහුට උපදෙස් දෙමින් ගත කළේය. "ඌ ඔයාට ශාප කරන්න උත්සාහ කරොත්, ඔයා ඒක මග හරින එක හොඳයි. මොකද මට ඒවා නවත්තන හැටි මතක නෑ." මෙහිදී ඔවුන්ව ෆ්ලිච්ට හෝ නොරිස් මහත්මියට හසු වීමට බොහෝ දුරට ඉඩ තිබේ. හැරීට දැනුනේ අද පාසලේ තවත් නීතියක් කැඩීමට තමන්ගේ වාසනාව උරගා බැලිය යුතු බවයි. අනිත් අතට මැල්ෆෝයිගේ  සමච්චල් හිනාව සහිත මුහුණ අඳුර මැදින් මැවී පෙනෙන්නට විය. මෙය මැල්ෆෝයිව මුහුණට මුහුණ පරාජය කළ හැකි ලොකු අවස්ථාවක් නිසා මගහැරිය නොහැක.

"එකොලහමාරයි," අවසානයේ රොන් කෙඳුරුවේය. "අපි ගියොත් හොඳයි."

ඔවුන් රාත්‍රී කබා ඇඳ යෂ්ඨි අතින් ගෙන කුළුණු කාමරයෙන් එළියට රහසින් විත් දඟර පඩිපෙළ බැස පහළට විත් ග්‍රිෆින්ඩෝ පොදු කාමරයට ආහ. ගිනිඋදුනේ තවමත් අඟුරු කීපයක් දිළිසෙමින් සියලුම අත්පුටු කලු සෙවනැලි බවට පත්කොට තිබිණි. පිටුපස ඔවුන් අසලම වූ පුටුවකින් කටහඬක් ඇසෙන විට ඔවුන් බිත්තියේ වූ පිංතූරයේ සිදුර අසලටම පැමිණ තිබිණි. "මට හිතාගන්න බෑ හැරී ඔයා මේක කරන්න හදනවා කියලා."

එළියක් පත්තු විය. එහි වූයේ රෝස පැහැ රාත්‍රී කබායක් හැඳි හර්මයිනී ග්‍රැන්ජර් කණගාටුවෙන් බලා සිටියාය.

"ඔහේ!" රොන් කේන්තියෙන් කීවේය. "ආපහු ඇඳට යනවා!"

"මම බොහෝදුරට ඔයාගේ අයියට කිව්වා," හර්මයිනී වහා කීවාය, "පර්සිට - එයා ශිෂ්‍ය නායකයෙක්නේ, එයා මේක නවත්වයි."

කෙනෙක්ට මේ තරම් බාධාකරන්න පුළුවන් බව හැරීට විශ්වාස කළ නොහැකි විය.

"එන්න යමු," ඔහු රොන්ට කීවේය. ඔහු මහත කාන්තාවගේ පිංතූරය තල්ලු කොට එහි වූ සිදුර හරහා උඩට නැංගේය.

Downloaded from sinhalaebooks.com

හර්මයිනී එපමණ ලේසියෙන් අතහැරීමට සූදානම් වූයේ නැත. ඇය රොන් පිටුපසින් තරහා ගිය පාත්තයෙක් මෙන් පිඹිමින් පිංතූරයේ සිදුරට නැග්ගාය.

"ඔයාලා ග්‍රිෆින්ඩෝ ගැන හිතන්නේ නැද්ද, ඔයාලා තමන් ගැන විතරද හිතන්නේ, මට ඕනේ නෑ ස්ලිදරින් නිවාස කුසලානේ දිනනවා බලන්න, මම මාරුකරන මන්තර දැනගෙන හිටියට ප්‍රොෆෙසර් මැක්ගොනගල්ගෙන් ගත්ත ලකුණු ඔක්කොම ඔයාලා නැති කරලා දායි."

"යනවා යන්න." "හරි, ඒත් මම ඔයාලාට අනතුරු ඇඟෙව්වා, ඔයාලා හෙට ගෙදර යන්න කෝච්චියට නැග්ගම මතක් වෙයි මම කියපුවා... ඔයාලා හරිම - - "

නමුත් ඔවුන්ට අහු උනේ නැත්නම් මොකද වෙන්නේ. හර්මයිනී ආපසු ඇතුලට යෑමට මහත කාන්තාවගේ පිංතූරය දෙසට හැරුනත් ඈ මුහුණ දුන්නේ හිස් පිංතූරයකටයි. මහත කාන්තාව රාත්‍රී සංචාරයකට ගොස් සිටියෙන් හර්මයිනී කුළුනෙන් පිට සිර විය.

"මම දැන් මොකද්ද කරන්නේ ?" ඇය වෙවුලමින් ඇසුවාය.

"ඒක ඔයාගේ ප්‍රශ්ණයක්," රොන් කීවේය. "අපි යන්න ඕනේ, අපිට පරක්කු වෙනවා."

ඔවුන් කොරිඩෝවේ කෙළවරට යන්නට පෙර හර්මයිනී ඔවුන් හා එකතු විය.

"මමත් ඔයාලා එක්ක එනවා," ඇය කීවාය.

"නෑ ඔයා එන්නේ නෑ."

"ඔයා හිතන්නේ මම මෙතන හිටගෙන ඉඳලා ෆ්ලිච්ට අහුවෙයි කියලද? එයා අපි තුන්දෙනාවම අල්ලගත්තොත් මම ඇත්ත කියනවා, මම ඔයාලව නවත්වන්න හැදුවා කියලා, ඔයාලට පුළුවන් මට උදවු කරන්න."

"ඔහේට නම් පිස්සු - - " රොන් ශබ්ද නගා කීවේය.

"කටවහනවා, දෙන්නම!" හැරී තියුණුලෙස කීවේය. මට මොකද්ද ඇහුනා."

එය යම්කිසි ඉවකරන්නාක් මෙන් වූ ශබ්දයකි.

Downloaded from sinhalaebooks.com

"නොරිස් මහත්මිය?" රොන් කරුවලේ බළමින් වේගයෙන් හුස්ම හෙළමින් කීවේය.

ඒ නොරිස් මහත්මිය නොව නෙවිල් ය. ඔහු පොළොවේ ගුලි ගැසී තද නින්දට වැටී සිටියේය. ඔවුන් රහසේම ළඟට එද්දී ඔහු වහා අවදි වූයේය.

"දෙයියන්ට ස්තූතියි ඔයාලාට මාව හම්බුනා! මම පැය ගානක් එළියේ හිටියා, මට අලුත් මුරපදය මතක නෑ ඇඳට යන්න."

"හෙමින් කතාකරන්න නෙවිල්. මුරපදය තමයි ඌරු හොම්බ, ඒත් දැන් ඒකෙන් වැඩක් නෑ. මහත කාන්තාව කොහෙද ගිහින්."

"ඔයාගේ අත කොහොමද?" හැරී ඇසුවේය.

"හොඳයි," අත පෙන්වමින් නෙවිල් කීවේය. "මැඩම් පොම්ෆ්‍රේ ඒක විනාඩියෙන් වගේ හැදුවා."

"හොඳයි - එහෙනම්, බලන්න නෙවිල්, අපි තැනකට යන්න ඕනේ, පස්සේ හමුවෙමු - "

"මාව දාලා යන්න එපා!" නෙවිල් වහා නැගිට කීවේය. "මට මෙතන තනියම ඉන්න ඕනේ නෑ. ලේ ගලන බාරොන් දෙපාරක්ම පහුකරන් ගියා."

රොන් තම අත් ඔරලෝසුව දෙස බලා තරහින් හර්මයිනී සහ නෙවිල් දෙස බැලුවේය.

"ඔය දෙන්නගෙන් එක්කෙනෙක් නිසා හරි අපිව අහු උනොත්, මම අර බොගීස් කුරල්ගේ ශාපේ ඉගෙනගෙන ඔය දෙන්නටම ඒක පාවිච්චි කරනකන් නිකං ඉන්නෙ නෑ.

හර්මයිනී කට ඇරියාය, සමහර විට බොගීස්ගේ ශාපය හරියටම කරන අයුරු රොන්ට කීමට විය හැක. නමුත් හැරී පිඹ ඇයට නිහඬ වීමට කියා ඔවුන්ව ඉදිරියට යොමු කළේය.

ඔවුන් පටිගසා තිබූ උස් ජනේල වලින් වැටෙන සඳ එළියෙන් කොරිඩෝ දිගේ ගමන් කළහ. හැම වංගුවකදීම නොරිස් මහත්මිය හෝ ෆ්ලිච් හමු වේ යැයි හැරී සිතුවද ඔවුන් වාසනාවන්ත විය. ඔවුන් වහා ඔඅඩිපෙළක් නැග තුන්වන මහලට ගොස් ඇඟිලි තුඩින් කුසලාන කාමරය දෙසට ගියෝය.

Downloaded from sinhalaebooks.com

මැල්ෆෝයි සහ ක්‍රේබ් තවමත් පැමිණ සිටියේ නැත. පුළිඟු කුසලාන සඳ එළිය වැටී දිලිසිණි. කෝප්ප, පළිහ, පිඟන්, සහ පිළිම රන් සහ රිදී පැහැයෙන් අඳුරේ දිලිසුණි. ඔවුන් බිත්තියට පිට දී දෙපස තිබූ දොරවල් දෙස බලා සිටියෝය. මැල්ෆෝයි එක්වරම කඩා වැදී සටන පටන්ගනීවිදැයි සැක කළ හැරී තම යෂ්ටිය එළියට ගත්තේය. විනාඩියෙන් විනාඩිය ගෙවිණි..

"ඌ පරක්කුයි. සමහර විට අහුවෙන්න ඇති," රොන් කෙඳිරුවේය.

ඉන්පසු අල්ලපු කාමරයේ ඇති වූ ශබ්දයට සියල්ලෝම උඩ විසිවිණි. කවුරුන්හෝ කතා කරනු ඇසී හැරී තම යෂ්ටිය එසවූවේය. ඒ මැල්ෆෝයි නොවීය.

"හැමතැනම ඉවකරලා බලන්න, මගේ වස්තුවේ, උන් කොනක හැංගිලා ඉන්න පුළුවන්."

ඒ නොරිස් මහත්මියට කතාකරන ෆ්ලිච්ගේ හඬයි. සියල්ලෝම භීරාන්ත වූයේ හැරී තමන් පසුපස පුළුවන් ඉක්මනට එන ලෙස ඉඟිකරමින් අනිත් අයට අත වැනීය. ඔවුන් නිහඬවම ෆ්ලිච්ගේ කටහඬට විරුද්ධ දිශාවේ වූ දොර වෙත ගමන් කලහ. නෙවිල්ගේ කබායේ කෙළවර කාමරයෙන් ඉවත්වගද්දීම ෆ්ලිච් කාමරයට ඇතුල් විය.

"උන් මෙතන කොහේ හරි ඉන්නවා," ඔහු මුමුණනු ඔවුන්ට ඇසිණි, "හැංගිලා වෙන්න ඕනේ."

"මේ පැත්තට!" හැරී අභිරූපනයෙන් කීවේ ඒ පැත්තට හැරී ගල්වූවාක් මෙන් විය. ඔවුන් වෙව්ලමින් සන්නාහ පළක පිරි දිගු චිත්‍රාගාරයක් හරහා ගමන් කළෝය. ෆ්ලිච් ලඟම එන ශබ්දය ඔවුන්ට ඇසිණි. නෙවිල් වහා බයවී ශබ්දයක් කොට දිවයන්නට පටන් ගත්තෙන් කකුල පැටලී රොන්ගේ ඇඟේ හැපී, දෙදෙනාම සන්නාහ පළකයක් මතට ඇද වැටිනි.

එය බිම ඇදවැටී ඇතිවූ ශබ්දය මුළු මාලිගයම අවදි කිරීමට තරම් ප්‍රමාණවත් විය.

"දුවන්න!" හැරී කෑගැසුවෙන්, හතර දෙනාම වහා චිත්‍රාගරයෙන් එළියට දිව ගියෝය. ෆ්ලිච් පසුපසින් එනවාදැයි බැලීමට නොසිතූ ඔවුන් වහා දොරෙන් එළියට පැන කොරිඩෝවක් දිගේ දිව ගොස් තව කොරිඩෝවකට වැටුනෙන් හැරී පිටුපස යන්නේ කොහිදැයි ඉන්නෙව් කොහිදැයි නොසිතමින් දිව ගියහ. ඔවුන් කළාලයක් ඉරාගෙන් ඒ හරහා ගොස් රහස් මාර්ගයකට වැටී ඒ තුළින් ගොස් කුසලාන කාමරයට සැතපුම් ගණනක් ඈතින් වූ තම වශී පංතිය අසලට වැටිණි.

"මම හිතන්නේ අපිට එයාව මගහැරුනා," තම නළල පිස දමමින් සීතල බිත්තියකට පිටදී හති දමමින් හැරී කීවේය. නෙවිල් දෙකට නැවී කහිමින් වහ වහා හුස්ම ඇද්දේය.

Downloaded from sinhalaebooks.com

"මම - කිව්වා - ඔයාලට ," හර්මයිනී හුස්මත් සමග ගැහෙමින් තටමමින් කීවාය, "මම - කිව්වා ."

"අපි ග්‍රිෆින්ඩෝ කුළුනට යන්න ඕනේ" රොන් කීවේය, "පුළුවන් තරම් ඉක්මනට."

"මැල්ෆෝයි ඔයාලව රැවැට්ටුවා," හර්මයිනී හැරීට කීවාය. "ඔයාට ඒක තේරුනා නේ? එයාට එන්න ඕනේ උනේ නෑ - ෆ්ලිච් දැනගෙන හිටියානේ කවුරුහරි කුසලාන කාමරේට එනවා කියලා, මැල්ෆෝයි එයාට කියන්න ඇති."

ඈ බොහෝවිට නිවැරදි වියහැකි බව හැරී සිතුවේය. නමුත් එය ඈට කීමට ඔහුට උවමනා නොවීය.

"යමු."

එය එතරම්ම පහසු වූයේ නැත. ඔවුන් අඩි දොළහක් වත් යන්නට පෙර පංති කාමරයක අගුලත් ඇරගෙන යමක් එළියට ඔවුන් ඉදිරියට විසි විය.

ඒ පීව්ස් විය. ඔහු ඔවුන්ව දැක සතුටින් ශබ්ද කළේය.

"කරුණාකරලා කටවහනවා පීව්ස් - ඔයා අපිව එළියට දම්මවන්න හදන්නේ."

පීව්ස් කෙකරගෑවේය.

"චූටි පළමු වසරේ අය මහ රෑ ඇවිදින්න යනවද? ටුට්, ටුට්, ටුට්, නරකයි, නරකයි, ඔයාලා අහුවෙයි."

"ඔයා අපිව අල්ලලා දුන්නේ නැත්තන් එහෙම වෙන්නේ නෑ. අනේ පීව්ස්."

"ෆ්ලිච්ට කියන්න ඕනේ. මම කියන්නම ඕනේ," පීව්ස් ශාන්තව කීවේය. නමුත් ඔහුගේ ඇස් දුෂ්ඨකමින් දිළිසුනේය. "දන්නවද ඒක, ඔයාලාගෙම හොඳට ඒක කරන්නේ."

"අහකට යනවා," රොන් ඉදිරියට පැන්නේය. පීව්ස් සමග හැප්පීම නම් ලොකුම වරදක් විය.

Downloaded from sinhalaebooks.com

"ළමයි කාමරෙන් එළියේ!" පීව්ස් කෑගසා දැනුම් දුන්නේය. "ළමයි කාමරෙන් පිටවෙලා මෙන්න වශී කොරිඩෝවේ ඉන්නවා"

පීව්ස්ට යටින් නැවී ඔවුන් පණ කඩාගෙන කොරිඩෝවේ කෙළවරම වූ දොර වෙත දිව ගියත් එය අගුලු දමා තිබිණ.

"ඉවරයි!" ඔවුන් දොර තල්ලු කිරීමට උත්සාහ කරද්දී රොන් කෙඳිරි ගෑවේය, "අපි ඉවරයි! මේක තමයි අවසානේ!" පීව්ස්ගේ කෑ ගැසීම අසා ෆ්ලිච් ඔහුගේ උපරිම වේගයෙන් දිව එන අඩිහඬ ඇහෙන්නට විය.

"ඔහ්, අයින් වෙන්න," හර්මයිනී තදින් කීවාය. ඈ හැරීගේ යශ්ඨිය උදුරාගෙන ඉන් අගුලට තට්ටු කර කෙඳිරුවාය. 'ඇලොහොමෝරා!"

අගුල ක්ලික් ශබ්දයෙන් ඇරී දොර විවෘත විය. ඔවුන් ඇතුලට රිංගා වහා දොර වසා දොරට කණ් තියාගෙන අසා සිටියහ.

"කොයි පැත්තටද උන් ගියේ පීව්ස්?" ෆ්ලිච් කියනු ඇසුණි. "ඉක්මනට කියනවා."

"කියන්න'කරුණාකරලා'කියලා."'

"මාත් එක්ක විකාර කරන්න එපා පීවස්, දැන්ම කියනවා කොහේද උන් ගියේ?"

"කරුණාකරලා කිව්වේ නැත්තන් මොකුත් නෑ," පීව්ස් ඔහුගේ විකාර සිංදුකියන ස්වරූපයෙන් තාලයට කීවේය.

"හරි එහෙනම් - කරුණාකරලා."

"මොකුත් නෑ! හා හා! කිව්වනේ කරුණාකරලා කියලා කිව්වොත් මොකුත් නෑ කියන්නම් කියලා! හා හා! හාආආආආ!" පීව්ස්ගේ හඬ ඈතට යන හඬත් ෆ්ලිච් කෝපයෙන් ශාප කරන හඬත් ඔවුන්ට ඇසුණි.

"එයා හිතන්නේ මේ දොර වහලා කියලා," හැරී රහසින් කීවේය. "මම හිතන්නේ අපිට මොකුත් වෙන්නේ නෑ -- අහකට වෙනවාකෝ නෙවිල්!" පසුගිය විනාඩිය තිස්සේම නෙවිල් හැරීගේ රාත්‍රී කබායේ අතින් අදිමින් සිටියේය. "මොකද?"

Downloaded from sinhalaebooks.com

හැරී පිටුපස හැරුනේය - ඉතා පැහැදිලිව පෙනෙන්නට තිබුනේ කුමක්ද. මොහොතකට ඔහුට සිතුනේ ඔහු නපුරු සිහිනයක් දකින බවයි - මෙතෙක් සිදුවූ සියල්ලටම වඩා මෙය භයානක විය.

ඔහු කලින් සිතූ ආකාරයට ඔවුන් සිටියේ කමරයක නොව කොරිඩෝවකයි. තුන්වෙනි තට්ටුවේ තහනම් කොරිඩෝවේයි. එහි තහන්ම් වූයේ කුමක්ද යන්න ඔවුන්ට දැන් වැටහේ.

ඔවුන් කෙළින්ම බලා සිටියේ යක්ශ බල්ලෙකුගේ ඇස් දෙසයි. සිවිලිමේ සිට පොළොව තෙක් මුලු ප්‍රදේශයම පිරී තිබුනේ බල්ලාගෙනි. ඌට ඔලු තුනක් සහ වටේම බලන තරහින් පුපුරන ඇස් යුගල තුනක්, ඉව කරන නාස තුනක් විය.

ඔවුන් දෙසට සෙමින් එන කෙළ පෙරෙන කටවල් තුනේ වූ කහ පැහැ උල් දත් වලින් දිගට සෙවෙල ලිස්සන කෙළ ලණු එල්ලුනේය.

ඌ නොසෙල්වී හිටගෙන සිටියේය. ඇස් හයම ඔවුන් දෙස බලා සිටී. ඔවුන් තවමත් ජීවත්ව සිටීමට එකම හේතුව ඔවුන්ගේ හදිසි කඩාපැනීම නිසා ඌ පුදුම වී සිටීම බව හැරීට තේරුනේය. ඌ වහා ඉන් මිදෙන බවට උගේ කටින් පිටවූ අකුණු මෙන් වූ ගෙරවිලි සාක්ශි දැරීය.

හැරී අගුල සොයා දොර අතපත ගෑවේය. මරණය සහ ෆ්ලිච් අතරින් ඔහු ෆ්ලිච් තෝරාගනු ඇත.

ඔවුන් එළියට ආවෙන් - හැරී තදින් දොර වැසුවේය. ඉන්පසු ඔවුන් පියාඹන්නාක් මෙන් කොරිඩෝවෙන් එළියට දුවන්නට විය. ෆ්ලිච් ඔවුන්ව වෙන කොහේහරි සොයමින් ඉක්මනින් පිටත්වන්නට ඇති. මන්ද ඔවුන් ඔහුව කොහේවත් දැක්කේවත් ඒ ගැන තැකීමක් කළේවත් නැත. ඔවුන්ට අවශ්‍යා වූ එකම දෙය අර රාක්ශයාගෙන් පුලුවන් තරම් ඈත්වීම පමණයි. ඔවුන් හත්වෙනි තට්ටුවේ වූ මහත කාන්තාවගේ පිංතූරය අසලට එන තෙක් දිවීම නැවත්තුවෙ නැත.

"කොයි ලෝකෙද ඔයාලා ඔක්කොම ගියේ?" ඔවුන්ගේ උරහිස්වලින් කඩා හැරෙන රාත්‍රී කබා සහ රතුවී දාඩිය ගලන මුහුණු දෙස බලමින් ඈ ඇසුවාය.

"ඒකට කමක් නෑ - ඌරු හොම්බ, ඌරු හොම්බ," හැරී හති දමමින් කියත්ම පිංතූරය ඉදිරියට හැරී විවෘත විය. ඔවුන් ඒ තුලින් පොඩිවී රිංගා විත් පොදුකාමරයේ වූ අත්පුටු මතට කඩා වැටුනි.

මොහොතක් යනතෙක් කිසිවෙක් කතා නොකළහ. නෙවිල්නම් කිසිදින කතා නොකරනු ඇති බවක් පෙනෙන්නට තිබිණි.

Downloaded from sinhalaebooks.com

"එයලා මොනාකරනවා කියලද හිතන්නේ, ඒවගේ දෙයක් ඉස්කෝලේක කූඩු කරගෙන ඉඳලා?" අවසානයේ රොන් කීවේය. "මොකෙක් හරි බල්ලෙක්ට ව්‍යායාම ඕනේනම්, ඒ මූට."

හර්මයිනීගේ හුස්ම සහ කෝපය දෙකම දැන් සාමාන්‍ය අතට හැරී ඇත. "ඔයාලා එක්කෙනෙක්වත් තමන්ගේ ඇස් පාවිච්චි කරන්නේ නෑ නේද?" ඈ කියා දැම්මාය. "දැක්කේ නැද්ද ඌ මොකක් උඩද හිටගෙන හිටියේ කියලා."

"පොළොවේ?" හැරී යෝජනා කළේය. "මම උගේ කකුල් දිහා බැලුවේ නෑ. මට වෙලාවක් තිබ්බේ උගේ ඔලු දිහා බලන්න විතරයි."

"නෑ, පොළොවේ නෙවෙයි. ඌ හිටගෙන හිටියේ බිම් දොරක් උඩ. අනිවාර්යයෙන් ඌ මොනාහරි ආරක්ශා කරනවා."

ඇය නැගිට ඔවුන් දෙස බලා සිටියාය.

මට හිතෙන්නේ ඔයාලාට තමන් ගැන සතුටු ඇති. අපි ඔක්කොම මැරෙන්න ඉඩ තිබ්බා. නැත්තන් තවත් භයානක විදිහට නෙරපන්න ඉඩ තිබ්බා. දැන්, ඔයාලා මොකුත් හිතන්නේ නැත්තන් මම නිදියන්න යනවා."

රොන් ඇයට උත්තර දීමට කට ඇරියේය.

"නෑ අපි මොකුත් හිතන්නේ නෑ" ඔහු කීවේය. "ඔයා හිතන්නේ අපි එයාව අපිත් එක්ක ඇදගෙන ගියා කියලා නේ."

නමුත් ආපසු ඇඳට යන අතරේ හර්මයිනී විසින් හැරීට හිතන්නට වෙනත් දෙයක් දී තිබිණි. බල්ලා මොනාහරි ආරක්ශා කරනවා.... ඒත් හැග්‍රිඩ් මොකද්ද කිව්වේ? මොනාහරි හංගන්න ලෝකේ තියන ආරක්ශාකාරීම තැන ග්‍රින්ගොට්ස්.... සමහරවිට හොග්වාර්ට්ස් ඇරුනම...

පෙනෙන්නට තිබුනේ සේප්පු අංක හත්සිය දහතුනෙන් ආ කිළිටි පාර්සලයට වූ දේ හැරී තේරුම් ගත් බවයි.

## දහවෙනි පරිච්ඡේදය

## හැලෝවීන්

Downloaded from sinhalaebooks.com

පසුදිනයේ හැරී සහ රොන් තවමත් හොග්වාර්ට්ස් හී සිටිනු දැක මැල්ෆෝයිට ඇස් අදහාගත් නොහැකි විය. මහන්සි ගතියක් පෙන්නුම් කරත් ඔවුන් සම්පූර්ණ සතුටින් සිටියෝය. ඇත්තටම රොන් සහ හැරී සිතුවේ කළින් දින සිදුවූ ඔලුතුනේ බල්ලා හමුවීම විශිෂ්ඨ ක්‍රියාදාමයක් වූ බවයි. ඔවුන් තව එකකට කැමැත්තෙන් සිටියහ. ඒ අතර හැරී ග්‍රින්ගොට්ස් වලින් හොග්වාර්ට්ස් වලට ආ පාර්සලය ගැන විස්තර වලින් රොන්ගේ කණ පුරවා දැම්මේය. මේ තරම් තද ආරක්ශාවක් අවශ්‍ය දේ කුමක්දැයි ඔවුන් බොහෝ වේලා සිතුහ. "එක්කෝ ඒක ගොඩාක් වටිනවා, නැත්තන් ගොඩාක් භයානකයි," රොන් කීවේය. "නැත්තන් ඒ දෙකම," හැරී කීවේය.

නමුත් ඔවුන් ස්තිරවම දැන සිටියේ මේ අභිරහස් භාන්ඩය අඟල් දෙකක පමණ දිග ප්‍රමාණයේ කුඩා එකක් බව පමණක් නිසා එය කුමක්දැයි අනුමාන කිරීමට වැඩි අවස්තාවක් තිබුනේ නැත.

නෙවිල් හෝ හර්මයිනී බල්ලාට යටින් වූ දොරෙන් ඇතුලේ ඇත්තේ කුමක්දැයි යන්න ගැන කිසිදු උනන්දුවක් දැක්වූයේ නැත. නෙවිල් සිතූ එකම දෙය වූයේ නැවත කිසිම දිනෙක බල්ලා ඉන්න පැත්තටවත් නොයා සිටීම පමණයි.

හර්මයිනී දැන් හැරී සහ රොන් සමග කතාකිරීම ප්‍රතික්ශේප කරමින් උන්නාය. නමුත් ඈ සියල්ල දත් පාලිකාව මෙන් හැසිරුණු නිසා ඔවුන් එය දුටුවේ වාසියක් ලෙස පමණි. ඔවුන්ට දැන් අවශ්‍ය එකම දේ මැල්ෆෝයි සමග නැවත පැටලීම පමණි. ඔවුන්ගේ මහත් සංතෝශයට  හේතු වෙමින් ඒ  සඳහා දෙයක් සතියකින් තැපෑලෙන් ආවේය.

පුරුදු පරිදි බකමූණන් ප්‍රධාන ශාලාවට පිරෙද්දී, හැමෝගේම අවධානය ගියේ විශාල ගෝසාකාරී බකමූණන් හය දෙනෙක් විසින් ඔසවාගෙන ආ දිග හීනී පාර්සලය වෙතයි. අනිත් අය තරමටම හැරීටද අවශ්‍ය වූයේ මේ විශාල පාර්සලයේ වූයේ කුමක්ද යන්න දැනගැනීමටයි. බකමූණන් පහළට පැමිණ පිඟානේ තිබූ බේකන් ද බිම වට්ටවමින් තමන් ඉදිරිපිට පාර්සලය අතහරින විට හැරී පුදුමයට පත් විය.  තවත් බකමූණෙක් පැමිණ ලියුමක් ඒ මත අතහරින විට අනිත්උන් එතනින් මදක් ඉවත් වූවා පමණි.

හැරී මුලින්ම කවරය ඉරා ලියුම විවෘත කළේය. එය වාසනාවක් වූයේ එහි ලියා තිබූ දේ වැදගත් වූයෙනි.

පාර්සලය මේසය මත විවෘත නොකරන්න.

එහි තිබෙන්නේ ඔබේ නව නිම්බස් දෙදාහයි. නමුත් ඔබට කොස්සක් ලැබුණු බව සියල්ලන්ම දැනගැනීම හෝ ඔවුන් සියල්ලන්ටම කොස්සක් අවශ්‍ය වීම හෝ සිදුවිය යුතු නැත. ඔබේ පළමු පුහුණු සැසිය සඳහා අද හතට ඔලිවර් වුඩ් ඔබව කුඩිච් පිටියේදී හමුවේවි.

- ප්‍රොෆෙසර් මැක්ගොනගල්

හැරී ලියුම කියවීමට රොන්ට දෙද්දී තම සතුටු සිනාව සඟවා ගැනීමේ අපහසුවෙන් පෙලුණි.

Downloaded from sinhalaebooks.com

"නිම්බස් දෙදාහක්!" රොන් උද්දාමයෙන් කීවේය. "මම කවදාවත් ඒකක් අල්ලලාවත් නෑ."

"පළමු පංතිය පටන් ගැනීමට පෙර තනිවම කොස්ස බැලීමේ ආසාවෙන් ඔවුන් වහා ශාලාවෙන් පිට වූහ. නමුත් පිටවීමේ ශාලාවෙන් ඉහලට නගින පඩිපෙළ අසලදී ක්‍රේබ් සහ ගොයිල් ඔවුන්ගේ මග අවුරා සිටගත් අතර මැල්ෆෝයි පාර්සලය හැරීගෙන් උදුරාගෙන එය අතගා බැලීය.

"ඒක කොස්සක්," කියූ ඔහු ඉරිසියාව සහ අප්පිරියාව මුසු මුහුණෙන් එය හැරී වෙත ආපසු විසි කළේය. "මේ පාර ඕකට නම් ඔහේව අහුවෙනවා පොටර්, පළමු වසර අයට ඒවා තහනම්."

රොන්ට එය ඉවසා සිටිය නොහැකි විය.

"ඒක මේ පරණ කොස්සක් නෙවෙයි," ඔහු කීවේය, "ඒක නිම්බස් දෙදාහ එකක්. මොකද්ද ඔහේට ගෙදර තියනවා කිව්වේ මැල්ෆෝයි, කොමෙට් දෙසිය හැට නේ?" රොන් හැරී දෙසට හිනාවක් පාකළේය "කොමෙට් දිළිසෙනවා තමයි, ඒත් ඉතිං නිම්බස් ලඟටවත් එන්න බෑ."

"ඔහේ මොනවද ඒ ගැන දන්නේ වීස්ලි, ඔහේට ඒකේ මිටෙන් භාගයක්වත් ගන්න බෑ," මැල්ෆෝයි වහා පිළිතුරු දුන්නේය. "මම හිතන්නේ ඔහේටයි ඔහේගේ අයියලාටයි සතෙන් සතේ එකතු කරන්න වෙයි ඒකට.."

රොන් පිළිතුරු දීමට පෙර ප්‍රොෆෙසර් ෆ්ලිට්වික් එතනින් යන්නට ආවේය.

"මම හිතන්නේ, ඔයාලා වාද කරනවා නෙවෙයිනේ කොල්ලනේ?" ඔහු කීවේය.

"පොටර්ට කොස්සක් එවලා ප්‍රොෆෙසර්," මැල්ෆෝයි වහා කීවේය.

" ඔව්, ඔව්, ඒක හරි," හැරී දෙස හොඳින් බලමින් ප්‍රොෆෙසර් ෆ්ලිට්වික් කීවේය. "ප්‍රොෆෙසර් මැක්ගොනගල් මට විශේෂ අවස්ථාව ගැන හැමදේම කිව්වා පොටර්, එතකොට ඒකේ වර්ගේ මොකද්ද?"

"නිම්බස් දෙදාහ සර්," මැල්ෆෝයිගේ මුහුණේ ඇති වූ භය දැක සිනා නොවීමට උත්සාහ කරමින් හැරී කීවේය. "ඇත්තටම මේ මැල්ෆෝයිට ස්තුති කරන්න ඕනේ, එයා නිසයි මේක ලැබුනේ,"

Downloaded from sinhalaebooks.com

හැරී සහ රොන් මැල්ෆෝයිගේ කේන්තිය සහ ව්‍යාකූලත්වය දැක සිනාවෙන් පුපුරමින් ඉහළ මහල වෙත ගියහ. "ඇත්තටම , ඒක ඇත්ත," ගල් පඩිපෙළ ඉහළටම නැංග පසු හැරී කීවේය. "එයා නෙවිල්ගේ මතක බෝලේ හොරකම් කළේ නැත්තන් මම කණ්ඩායමේ නැතිවෙයි..."

"එහෙනම් මට හිතෙන්නේ ඔයා හිතාගෙන ඉන්නේ ඒක නීති කැඩුවට හම්බවුන තෑග්ගක් කියලා?" පිටුපසින් ඇසුණේ කේන්ති ගිය කටහඬකි.. හර්මයිනී ඔවුන් පිටුපසින් පඩි නගිමින් සිටියාය. ඇ පාර්සලය දෙස එය අනුමත නොකරන බැල්මක් හෙලුවාය.

"මම හිතුවේ ඔයා අපිත් එක්ක කතා නොකර ඉන්න යන්නේ කියලා?" හැරී කීවේය.

"ඔව්, දැන් ඒක නවත්තන්න එපා," රොන් කීවේය, "ඔයා අපිට ලොකු හොඳක් කරන්නේ."

හර්මයිනී නහය උඩට හරවාගෙන එතනින් ඉවත ගියාය.

එදින හැරීට තම පාඩම් වලට හිත යෙදවීම ඉතා අපහසු විය. එය හැමවිටම කාමරෙ ඇඳයට ඇති තම අළුත් පියාඹන කොස්ස වෙත හෝ අද රාත්‍රියේ පුහුණුවීම් වල යෙදෙන ක්විඩිච් පිටිය වෙත දිව යයි. ඔහු කන්නේ මොනවාදැයි නොබලාම රාත්‍රී ආහාරය ක්ෂණිකව ගිල දමා අවසානයේ නිම්බස් දෙදාහ ඇසුරුම් ගලවා බැලීමට රොන් සමග නිදන කාමරය වෙත හැකි ඉක්මනින් ගියහ.

"වාව්," කොස්ස හැරීගේ ඇඳමතට පෙරළෙද්දීම රොන් සුසුම් හෙළමින් කීවේය.

විවිධ කොසු ගැන කිසිවක් දැන නොසිටි හැරීට පවා එය ඉතා පුදුමාකාර ලෙස පෙනිණි.. සිනිඳු දිළිසෙන එයට මැහෝගනී මිටක්ද ඍජු පිළිවෙල දිගු කෙඳි සහිත වල්ගයක් ද ඉහළ කෙළවරේ රන් පැහැයෙන් නිම්බස් දෙදාහ ලෙස ලියූ අකුරුද විය.

වේලාව හත ලංවද්දී හැරී මාලිගයෙන් පිටව , ක්විඩිච් පිටිය වෙත ගමන් කළේය. ඔහු මීට පෙර ක්‍රීඩාංගණය ඇතුළට ගොස් තිබුනේ නැත. ක්‍රීඩාපිටිය වටා වූ රූඳවුම් මත ආසන සියගණනක් තිබුනේ නරඹන්නන්ට සිදුවන සියල්ල පැහැදිලිව පේන උසකිනි. පිටිය දෙකෙළවර රන්පැහැ කණු තුනක් ද ඒවායේ කෙළවරට සම්බන්ධ විශාල වළලු තුනක්ද විය. එය හැරීට මතක් කර දුන්නේ මගල් ළමයින් සෙල්ලම් කරන සබන් බෝල පුම්බන කූරුයි. නමුත් මේවා අඩි පනහක් උස් විය.

වුඩ් එනතෙක් පියඹා නොසිටීමේ අපහසුව නිසාම හැරී තම කොස්සට නැග පොළොවෙන් ඉහලට ගියේය. කුමන හැඟීමක්ද - ඔහු කුළුණු වළලු තුළින් වේගයෙන් පියඹමින් පිටියේ ඉහළ පහල වේගයෙන් ගියේය. කුඩා ස්පර්ශයකින් පවා නිම්බස් දෙදාහ ඔහුට අවශ්‍ය පැත්තට හැරී ගමන් කළේය.

Downloaded from sinhalaebooks.com

"ඒයි, පොටර්, පල්ලෙහාට එන්න!'

ඔලිවර් වුඩ් පැමිණ සිටියේය. ඔහු විශාල ලී පෙට්ටියක් කිහිලි ගහගෙන සිටී. හැරී ඔහු ලඟට බැස්සේය.

"නියමයිනේ," ඔහු කීවේය. ඔහුගේ ඇස් දිළිසිණි. "මට පේනව මැක්ගොනගල් මොකද්ද අදහස් කරේ කියලා. ඔයා ඇත්තටම උපන් හපනෙක්... මම අද හවස උගන්නන්නේ නීති ටික, ඊටපස්සේ සතියට තුන් පාරක් ඔයාට කණ්ඩායම් පුහුණුවීම් වලට එන්න ඕනේ."

ඔහු පෙට්ටිය ඇරියේය. එහි වෙනස් ප්‍රමාණයන්ගේ බෝල හතරක් විය.

"හරි," "දැන් බලන්න, කුඩිච් සෙල්ලම් කරන්න අමාරු උනාට තේරුම්ගන්න ලේසි. හැම කණ්ඩායමකම ක්‍රීඩකයෝ හත ගානේ ඉන්නවා. ඒකෙන් තුන්දෙනෙක්ට එලවන්නෝ කියලා කියනවා."

"එලවන්නෝ තුනයි," හැරී එය තමන්ටම කියාගත්තේය. වුඩ් පාපන්දුවක් තරමේ රතු බෝලයක් අතට ගත්තේය.

"මේ බෝලෙට කියන්නේ ක්වෆල් කියලා," වුඩ් කීවේය. "එළවන්නෝ මේ බෝලේ එකිනෙකාට විසිකරගන්න ගමන් මේක අර වලල්ලක් ඇතුලෙන් දාලා දිනුමක් ගන්න උත්සාහ කරනවා. ක්වෆල් එක වළල්ලක් ඇතුලෙන් යන හැම සැරේම ලකුණු දහයක් ලැබෙනවා. තේරුනාද?"

"එළවන්නෝ ක්වෆල් එක වලල්ල අස්සෙන් දාලා ලකුණු ගන්නවා." හැරී කීවේය. "ඒකියන්නේ වළලු හයක් එක්ක කොසු උඩ බාස්කට්බෝල් ගහනවා වගේ. නේද?"

"මොනාද බාස්කට්බෝල් කියන්නේ?" වුඩ් කුතුහළයෙන් ඇසුවේය. "ආ ඒක, අමතක කරන්න" හැරී වහා කීවේය.

"එතකොට, හැම කණ්ඩායමකම තව ක්‍රීඩකයෙක් ඉන්නවා රකින්නා කියලා. මම ග්‍රිෆින්ඩෝ රකින්නා. මම අපේ වලලු වටේ පියාඹන ගමන් අනෙක් අය ලකුණු ගන්න එකෙන් වළක්වන්න ඕනේ."

"එළවන්නෝ තුනයි එක රකින්නයි," සියල්ල මතකයේ තබාගනිමින් හැරී කීවෙය. "එතකොට එයාලා සෙල්ලම් කරන්නේ ක්වෆල් එකෙන්.හරි. ඒක තේරුනා. එතකොට මේවා මොකටද?" ඔහු පෙට්ටියේ ඉතිරිව තිබූ අනෙක් පන්දු පෙන්වා ඇසුවේය.

Downloaded from sinhalaebooks.com

"මම දැන් පෙන්වන්නම් ඔයාට" වුඩ් කීවේය. "මේක ගන්න."

ඔහු හැරීට කුඩා පිත්තක් දුන්නේය. එය කුඩා බේස්බෝල් පිත්තක් මෙන් විය.

"මම ඔයාට පෙන්වන්න යන්නේ බ්ලජර්ස් මොකද කරන්නේ කියල," "මේවා තමයි බ්ලජර්ස්."

ඔහු හැරීට තද කලු, රතු ක්වෆල් එකට වඩා මදක් කුඩා එක සමාන පන්දු දෙකක් පෙන්නුවේය. ඒවා පෙට්ටියට අල්ලාගෙන සිටින පටිවලින් මිදී පැනයාමට දඟලන බවක් හැරී දුටුවේය.

"පස්සට වෙන්න" වුඩ් හැරීට අනතුරු ඇඟවීය. ඔහු බිමට නැවී එක් බ්ලජර් පන්දුවක් නිදහස් කළේය.

එක්වරම, කලුබෝළය අහසට නැග හැරීගේ මුහුණ වෙත ආපසු ඇදී ආවේය. හැරී එය ආපසු පැමිණ තම නාසය කඩනු වැලැක්වීමට වහා අතේ තිබූ පිත්තෙන් ගැසුවෙන් එය දහර දමමින් එවතට ඇදී ගියේය. . එය ඔවුන්ගේ හිස් වටා කරකැවී වුඩ් දෙසට කඩාගෙන ආවෙන් වුඩ් ඒ මතට පැන එය බිමට තද කරගන්නට සමත් විය.

"දැක්කද?" පන්දුව සමග පොරකමින් කෙසේ හෝ එය ලී පෙට්ටියට දමා ආරක්ශිතව පටිවලින් ගැට ගැසූ වුඩ් හති දමමින් කීවේය. බ්ලජර්ස් පිට්ටනිය වටේම වේගෙන් යන ගමන් ක්‍රීඩකයන්ව කොසුවලින් වට්ටන්න උත්සාහ කරනවා. ඒකයි හැම කණ්ඩායමේම පහරදෙන්නෝ දෙන්නෙක් ඉන්නේ - අපේ ඉන්නේ වීස්ලි නිවුන්නු - එයාලාගේ රාජකාරිය තමයි බ්ලජර් එකෙන් තමන්ගේ කණ්ඩායමේ ක්‍රීඩකයෝ බේරගෙන බෝලේ අනික් කණ්ඩායම පැත්තට යවන එක. ඉතිං -- මම හිතන්නේ ඔයාට ඒ ඔක්කොම තේරුනානේ?"

"එළවන්නෝ තුදෙනා ක්වෆල් එකෙන් ළකුණු ගන්න උත්සාහ කරනවා, රකින්නා වළලු කණු ආරක්ශාකරනවා, පහර දෙන්නෝ බ්ලජර්ස් තමන්ගේ කණ්ඩායමෙන් ඈත් කරලා තියනවා," හැරී කියාගෙන ගියේය.

"හොඳයිනේ," වුඩ් කීවේය.

"අර්- බ්ලජර්ස් කවදාහරි කාවහරි මරලා තියනවද?" හැරී නිසල බවක් අඟවමින් ඇසුවේය.

"හොග්වාර්ට්ස් වල නම් කවදාවත් වෙලා නෑ, අපේ අය හක්ක කඩාගත්ත වෙලාවල් දෙක තුනක් තියනවා. ඊට වඩා දරුණු ඒවා වෙලා නෑ. ඊලඟට, කණ්ඩායමේ අන්තිම සාමාජිකයා තමයි සොයන්නා. ඒ කියන්නේ ඔයා. එතකොට ඔයා ක්වෆල් එක ගැනවත් බ්ලජර්ස් ගැනවත් හිතන්න එපා. ඒවා වැදිලා මගේ ඔලුව පැලුනොත් ඇරෙන්න හරිද"

Downloaded from sinhalaebooks.com

"බය වෙන්න එපා, බ්ලජර්ස් වලට වීස්ලිලා එක්ක හැරෙන්නවත් බෑ. මම කියන්නේ ඒ දෙන්නා නම් මිනිස් බ්ලජර්ස් ජෝඩුවක් වගේ."

වුඩ් ලී පෙට්ටිය වෙත ගොස් අන්තිම හතරවෙනි බෝළය අතට ගත්තේය. ක්වෆල් සහ බ්ලජර්ස් සමග සසඳන විට එය ඉතා කුඩා, විශාල වොල්නට් එකක් තරමේ පන්දුවක් විය. එය දිළිසෙන රන් පැහැ වූ අතර තටුගහන කුඩා රිදී පිහාටු දෙකක් විය.

"මේක," වුඩ් කීවේය, "මේ රන්පැහැ ස්නිච්, මේක තමයි මේවාගෙන් වැදගත්ම බෝලේ. මේක අල්ලගන්න හරිම අමාරුයි. මොකද මේක හරිම වේගවත් ඒවගේම ලේසියෙන් පේන්නේ නෑ. සොයන්නාගේ වැඩේ ඒක අල්ලගන්න එක. ඔයාට සිද්ධවෙනවා එළවන්නෝ, පහරදෙන්නෝ, බ්ලජර්ස් ක්වෆල් ඔක්කොම අතරින් එහේ මෙහේ ගිහින් අනිත් කණ්ඩායමේ සොයන්නාට කළින් ඒක අල්ලගන්න. මොකද ස්නිච් එක අල්ල ගන්න සොයන්නාගේ කණ්ඩායමට අමතර ළකුණු එකසිය පණහක් ලැබෙනවා. ඒ කියන්නේ බොහෝවිට ඒ කණ්ඩායම හැමවෙලෙම දිනනවා. ඒකයි සොයන්නන්ව ගොඩක් ඉවත් කරන්න වෙන්නේ. කුඩිච් තරඟයක් ඉවර වෙන්නේ ස්නිච් එක අල්ලගත්තම විතරයි. ඉතිං තරඟයක් අවුරුදු ගානක් යන්නත් පුළුවන් -- මම හිතන්නේ වාර්ථාව තියෙන්නේ මාස තුනක්, එයාලාට සිද්ධ උනා අතිරේක අය ගෙන්නන්න. එතකොට ක්‍රීඩකයන්ට නිදාගන්න දෙන්න පුළුවන්නේ. ඉතිං, ඒක එහෙමයි උනේ - මොනාහරි ප්‍රශ්ණ තියනවද?"

හැරී තම හිස වැනුවේය. ඔහුට ඉතා හොඳින් තමා කළයුත්ත තේරුණි. ප්‍රශ්ණයක් වන්නේ එය කිරීමට යාමේදීයි.

"අපි දැනට ස්නිච් එකෙන් පුහුණු වෙන්නේ නෑ," එය පරිස්සමින් ලී පෙට්ටියේ දමා වසමින් වුඩ් කීවේය. "ගොඩක් කළුවර වැඩී. ඒක අපේ අතින් නැතිවෙන්න ඉඩ තියනවා. අපි මේවා ටිකකින් පුරුදුවෙමු."

ඔහු සාමාන්‍ය ගොල්ෆ් පන්දු බෑගයක් තම සාක්කුවෙන් එළියට ගත්තේය. විනාඩි කීපයකට පසු හැරීත් සමග ඉහල අහසට නැංග වුඩ් හැරීට අල්ලා ගැනීමට තමන්ට පුළුවන් උපරිම වේගයෙන් හැම පැත්තටම ගොල්ෆ් පන්දු විසි කරන්නට පටන් ගත්තේය.

හැරී එක බෝලයක්වත් මගහැරියේ නැත. වුඩ් හැරී ගැන බොහෝ තෘප්තිමත්ව සිටියේය. පැය භාගයකට පමණ පසු තවදුරටත් පුහුණු විය නොහැකි තරම් අන්ධකාරය දැඩි විය.

"මේ අවුරුද්දේ කුඩිච් කුසලානේ අපේ නම ලියලා තියෙයි" ආපසු එන ගමනේදී වුඩ් සතුටින් කීවේය. "ඔයා චාලි වීස්ලිටත් වඩා හොඳ උනත් මම පුදුම වෙන්නේ නෑ, එයා මකරු පස්සේ පන්නන්න ගියේ නැත්තන් එයාට එංගලන්ත කණ්ඩායමට සෙල්ලම් කරන්න තිබ්බා."

සතියට තුන්වතාවක් කුඩිච් පුහුණුවීම් සහ ගෙදර වැඩ සමග ඉතා කාර්යබහුල වූ හැරීට තමන් හොග්වාර්ට්ස් වලට පැමිණ මාස දෙකක් යනවා දැනුනේම නැත. ප්‍රයිවට් ඩ්‍රයිව් වලට වඩා මාළිගය ඔහුට ගෙදර මෙන් දැනෙන්නට

Downloaded from sinhalaebooks.com

පටන්ගෙන තිබිණි. මූලික දැනුම ලබාගෙන අවසන් වී තිබුනෙන් ඔහුගේ පාඩම්ද බොහෝ සිත්ගන්නා සුලු ඒවා බවට පත්වෙමින් තිබිණි.

හැලෝවීන් දිනයේ උදයේ ඔවුන් අවදිවූයේ කොරිඩෝ දිගේ ඇදී ආ රසවත් වට්ටක්කා කේක් සුවඳිනි. ඊටත් වඩා හොඳම දේ වූයේ, වශී පංතියේදී ප්‍රොෆෙසර් ෆ්ලිට්වික් ඔවුන් නොයෙක් දේවල් පා කිරීමට සූදානම් බව ඔහු සිතන බව ප්‍රකාශ කිරීමයි. ඔහු නෙවිල්ගේ ගෙම්බාව පංතිය පුරා පා කළ දවසේ සිටම සියල්ලෝම එය ඉගෙන ගැනීමට පුල පුලා බලා සිටියෝය. ප්‍රොෆෙසර් ෆ්ලිට්වික් පුහුණු වීම සඳහා පංතිය යුගල ලෙස බෙදුවේය. හැරීගේ සහයකයා වූයේ සීමස් ෆිනිගන් ය. (එය සැනසීමක් වූයේ නෙවිල් ඔහුදෙසම බලමින් ඔහුගේ අවධානය ගන්නට උත්සාහ කළ නිසයි). රොන්ට හර්මයිනී ග්‍රැන්ජර් සමග වැඩ කරන්නට සිදු විය. ඒ ගැන වැඩි කේන්තියෙන් සිටියේ රොන්ද හර්මයිනීද කිව නොහැකි තරම් ය. හැරීගේ කොස්ස පැමිණි දිනයේ සිට ඇ ඔවුන් සමග කථා නොකළාය.

"දැන්, අපි පුරුදු උන අර ලස්සන මැණික්කටුව කරකන විදිහ අමතක කරන්න එපා.!" ප්‍රොෆෙසර් ෆ්ලිට්වික් පුරුදු ලෙස තම පොත් ගොඩට උඩින් ඉස්සෙමින් කීවේය. "ඉක්මනට වේගෙන්, මතකනේ, ඉක්මනට වේගෙන්. නියම විදිහට මන්තරේ කියන එකත් හරිම වැදගත්- කවමදාවත් අමතක කරන්න එපා ස් වෙනුවට ෆ් කියපු බෲෆියෝ මායාකාරයාව, එයා බිම වැටිලා හිටියාලු පපුවේ මීහරකෙකුත් එක්ක."

එය ඉතා අපහසු විය. හැරී සහ සීමස් වේගයෙන් ඉක්මනින් යෂ්ඨිය වැනුවත් ඔවුන් අහස දෙසට යැවීමට නියමිත පිහාටුව මේසය මතින් සෙළවුනේවත් නැත. සීමස් තම ඉවසීමේ සීමාව පැන පිහාටුවට යෂ්ඨියෙන් ඇන්නෙන් එය ගිණිගත්තේය. හැරීට තම තොප්පියෙන් එය ඉවතට තල්ලු කරන්නට සිදුවිය.

එහාපැත්තේ මේසයේ සිටි රොන්ටත් වැඩි වාසනාවක් තිබුනේ නැත.

"වින්ගාඩියම් ලැවියෝසා!" තම දිගු අත හුළංමෝලක් මෙන් වනමින් ඔහු කෑ ගැසුවේය.

"ඔයා ඒක කියන්නේ වැරදියට," හර්මයිනී වහා කියනු හැරීට ඇසිණි. "ඒක කියන්නේ වින්ග්-ගා-ඩියම් ලෙවි-ඕ-සා, කියලා 'ගා' කියන එක ලස්සනට දිගට කියන්න ඕනේ."

"ඉතිං ඔයා ඔච්චර දක්ශ නම්, ඇයි කරලා පෙන්වන්නේ නැත්තේ" රොන් තරහින් කීවේය.

හර්මයිනී තම ඇඳුමේ අත් ඉහළට නවා ගත්තාය. තම යෂ්ඨිය ගසා සෙමින් මැතිරුවාය. "වින්ගාඩියම් ලෙවිඕසා!"

පිහාටුව ඉහලට ගොස් ඔවුන්ගේ හිස්වලට අඩි හතරක් පමණ ඉහළින් පාවිය.

Downloaded from sinhalaebooks.com

"ඔහ්, නියමයිනේ!" ප්‍රොෆෙසර් ෆ්ලිට්වික් අත්පුඩි ගසමින් කෑගැසුවේය. "හැමෝම මෙහේ බලන්න, ග්‍රැන්ජර් ඒක කරලා!"

පංතිය අවසන් වෙද්දී රොන් සිටියේ ඉතාම නරක තත්වයකය. "පුදුමයක් නෙවෙයි කවුරුවත් එයාට කැමති නැති එක," ඔවුන් සෙනග පිරි කොරිඩෝව දෙසට තල්ලු වෙද්දී රොන් කීවේය. "එයානම් ඇත්තටම නපුරු හීනයක්. "

කවුරුන් හෝ හැරීව පහුකරගෙන යනගමන් තදින් ඔහුගේ ඇඟේ හැප්පුනේය. ඒ හර්මයිනී විය. හැරී යන්තම් ඇගේ මුහුණ දැක්කෙන්, ඇය හඬන බව දුටුවේය.

"මම හිතන්නේ එයාට ඒක ඇහුනා."

"ඉතිං" රොන් කීවේය. නමුත් ඔහු මදක් අපහසුතාවයට ලක් වූ බවක් පෙණින. "එයාට තේරෙන්න ඇති තමන්ට යාලුවෝ නෑ කියලා."

හර්මයිනී ඊලඟ පංතියට ආවේ නැති අතර මුළු හැන්දෑවම පේන්නට නොසිටියාය. හැලෝවීන් උත්සවය සඳහා ප්‍රධාන ශාලාව වෙත පහළ බසින අතර, හර්මයිනී ගැහැණු ළමයින්ගේ නාන කාමරයේ අඬමින් ඉන්න බවත් තනිවම ඉන්නට අවශ්‍ය බව කී බවත් පාර්වතී තම මිතුරිය ලැවැන්ඩර්ට කියනු ඔවුන්ට ඇසිණි. රොන් ඒ මොහොතේ ලැජ්ජාවට පත් වූ බව පෙනුනත් මොහොතකට පසු ඔවුන් හැලෝවීන් සැරසිළි වලින් පිරි ප්‍රධාන ශාලාවට ඇතුල්වද්දී හර්මයිනී ඔවුන්ගේ සිත්වලින් ඉවත් විය.

පණ ඇති වවුලන් දහසක් බිත්තිවල සහ සිවිලිමේ එල්ලී තටු ගසමින් සිටි අතර තවත් දහසක් මේස වළට ඉහලින් වූ වට්ටක්කා ඉටිපන්දම් සොළවමින් පහත් කළු වළාකුළු අතරින් පියෑඹූහ. එක්වරම වාර ආරම්භ උත්සවයේ තිබුනාක්මෙන් රන්පැහැ පිඟන් එහි මැවුනි.

ප්‍රොෆෙසර් කුරල් ප්‍රධාන ශාලාවට දිව එද්දී හැරී බේක්කරන ලද අර්තාපල් අලයක් කමින් සිටියේය. ඔහුගේ මුහුණ භීතියෙන් පිරී තිබූ අතර තලප්පාව පැත්තට ඇලවී තිබිණි. ඔහු ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝ වෙත දිව යද්දී සැවොම ඔහු දෙස බලා සිටියෝය. ඔහු මේසයේ හැපී ගැස්සුණේය. "බිම්ගෙවල් වල ට්‍රෝල් කෙනෙක්- ඔබතුමා දැනගන්න ඕනේ කියලා හිතුවේ."

ඉන්පසු ඔහු සිහිනැතිවී මැරුනාක් මෙන් පොළොව මත ඇද වැටුණේය.

එක්වරම ශාලාව කෑගැසීම් වලින් පිරිණි. ශාලාව නිශ්ශබ්ද කිරීමට ඩම්බල්ඩෝට තම යශ්ඨිය කෙළවරින් දම්පැහැ රතිඤ්ඤා කීපයක්ම පිපිරවීමට සිදු විය.

"ශිෂ්‍ය නායකයෝ," ඔහු වේගයෙන් කීවේය. "ඉක්මනට තමන්ගේ නිවාසේ අයව ආපහු කාමරවලට යවන්න!"

Downloaded from sinhalaebooks.com

පර්සි කාර්‍යබහුල විය.

"මගේ පස්සෙන් එන්න! හැමෝම ඉක්මනට එන්න, පළමු වසරේ අය ට්‍රෝල්ට බයවෙන්න ඕනේ නෑ මම කියන විදිහට කරොත්. මගේ පිටිපස්සෙන් ලඟින්ම ඉන්න, දැන්හරි. ඉඩ දෙන්න පොඩි අය එනවා! සමාවෙන්න, මම ශිෂ්‍ය නායකයෙක්!"

"කොහොමද ට්‍රෝල් කෙනෙක් ඇතුලට ආවේ?" පඩිපෙළ නගින අතරේ හැරී ඇසුවේය.

"මගෙන් නම් අහන්න එපා, හරිනම් උන් ගොඩක් මෝඩ ජාතියක් වෙන්න ඕනේ," රොන් කීවේය. "සමහර විට හැලෝවීන් විහිලුවක් කරන්න හිතලා පීව්ස් ඌව ඇතුලට ගත්තා වෙන්න පුළුවන්."

ඔවුන් නොයේකුත් අතට වේගයෙන් යන නොයේකුත් පිරිස් පසු කළෝය. ඔවුන් ව්‍යාකූලව සිටි හෆල්පෆ් පිරිසක් මැද්දෙන් රිංගද්දී හැරී එක්වරම රොන්ගේ අතින් අල්ලා ගත්තේය.

"මට නිකමට මතක් උනේ - හර්මයිනී."

"ඉතිං එයාට මොකද?"

"එයා දන්නේ නෑ ට්‍රෝල් ගැන."

රොන් තම තොල හපාගත්තේය.

"ඔහ්, ඒක හරි" රොන් කෙඳිරුවේය. "ඒත් පර්සි අපිව දකින්න නම් බෑ."

ඔවුන් නැවී අනික් පැත්තට යන හෆල්පෆ් කණ්ඩායමට එකතු විය. හිස්ව තිබූ පැති කොරිඩෝවකට පැනගත් දෙදෙනා ගැහැණු නානකාමර පැත්තට වේගෙන් ගියෝය. කෙළවරෙන් හැරෙන විටම ඔවුන්ට තමන් පිටුපසින් වේගෙන් එන අඩිහඬක් ඇසිණි.

"පර්සි" හැරීව විශාල ගල් රාජාලි ප්‍රතිමාවක් පිටුපට අදිමින් රොන් කෙඳිරීය.

Downloaded from sinhalaebooks.com

ප්‍රතිමාව වටෙන් හොරෙන් එබිකම් කරද්දී ඔවුන් දුටුවේ පර්සි නොව ස්නේප්ය. ඔහු කොරිඩෝව පසුකොට ඇස්මානයෙන් නොපෙනී ගියේය.

"එයා මොනාද කරන්නේ?" හැරී රහසින් කීවේය. "ඇයි එයා අනික් ගුරුවරු එක්ක පල්ලෙහා බිම්ගෙවල් වලට නොගියේ?"

"බලමු."

පුළුවන් වේගෙන් ඔවුන් ස්නේප්ගේ මැකීයන අඩිහඬ පිටුපස අනෙක් කොරිඩෝවට රහසින් ගමන් කළහ.

"එයා යන්නේ තුන්වෙන් තට්ටුව පැත්තට," හැරී කීවද රොන් ඔහුගේ අතින් අල්ලා ගත්තේය.

"ඔයාට ගඳක් දැනෙනවද?"

හැරී ඉවකර බැලූවෙන් අප්‍රසන්න දුර්සන්ධයක් නාස් සිදුරු වලට රිංගා ගත්තේය. එය පරණ මේස් ගඳ සහ කිසිදින සුද්ධ නොකල පොදු වැසිකිළියක ගඳ මිශ්‍ර වූ දුහඳකි.

ඉන්පසු ඔවුන්ට එය ඇසිණි.

යන්තම් ගොරවන හඬක් සමග සෙමින් ඉදිරියට ඇදෙන යෝධ යටි පතුලක්. රොන් අත දිගුකර පෙන්වීය. කොරිඩෝව කෙළවරේ වම්පැත්තට වෙන්නට ඉතා විශාල දෙයක් ඔවුන් ඉන්නා පැත්තට එමින් සිටී. ඔවුන් සෙවණැලි අතටර ගුලිවී එය සඳඑළිය වැටුනු තැනක් වෙත එන අයුරු බලා සිටියෝය.

එය ඉතා භයානක් දර්ශනයක් විය. අඩි දොළහක් උස උගේ හම අඳුරු අළු පැහැ වූ අතර තැනිතලාවක පිහිටි කඳු මෙන් විශාල ගෙඩි එල්ලෙන සිරුරත් ඉහලින් පොල් ගෙඩියක් තරමේ කුඩා හිසත් ඔවුන්ට දිස්විය. ඌට ගස් කඳන් මෙන් වූ කොට මහත කකුල් තිබූ අතර පැතලි උල් හැඩයේ පතුල් විය. උගෙන් එන ගඳ ඉතා තදබල විය. ඌ ලී පිත්තක් අල්ලාගෙන එය බිමදිගේ ඇදගෙන ආවේය. මන්ද උගේ අත් ඉතා දිගු විය.

ට්‍රෝල් යාබද දොර ලඟ නැවතී ඇතුලට එබී බැලුවේය. ඌ තම කන් සොළවා කුඩා සිත හදාගත්තේය. ඉන්පසු සෙමින් කාමරය වෙත ඇදුනේය.

"අගුලේ යතුරු තියනවා," හැරී මිමිනුවේය. "අපිට ඌව ඇතුලේ දාල අගුලු දැම්මහැකි."

Downloaded from sinhalaebooks.com

"හොඳ අදහස," රොන් බයෙන් කීවේය.

ඔවුන් තොල කට වියලී ගොස් ට්‍රෝල් ආපසු දොර වෙත නොඒවා යැයි පතමින් විවෘත දොර වෙත සෙමින් ගමන් කළහ. ඇතුලට නැවී යතුරු ගෙන දොර වසා අගුලු දැමීමට හැරී සමත් විය.

"හරි!"

තම ජයග්‍රහණයෙන් උද්ධාම වෙමින් ඔවුන් කොරිඩෝව දිගේ ආපසු දිව ගියත් කෙළවරට ලඟාවෙද්දී ඇසුණු දෙයින් ඔවුන්ගේ හදවත් නැවතිනි. -මහ හඬින් කන් පුපුරන්නට කරන කෑගැසීමක්- එය ආවේ ඔවුන් විසින් මොහොතකට පෙර අගුළු දමන ලද කාමරයෙනි.

"ඔහ්, අයියෝ," ලේගලන බාරොන් තරම් සුදුමැලිව රොන් කීවේය.

"ඒක ගැණු ළමයින්ගේ නානකාමරේ!" හැරී වෙවුලුවේය.

"හර්මයිනී!" දෙදෙනාටම එකවර කියවිනි.

එය ඔවුන් කිරීමට අකමැතිම දෙය උවත් වෙන කළහැකි දෙයක් නොවීය. ආපසු හැරී දොරවෙත දිවගිය දෙදෙනා බියෙන් ගැහෙද්දී දොරේ යතුර කරකැව්වෝය. හැරී දොර තල්ලු කර විවෘත කළ පසු දෙදෙනාම ඇතුළට දිව ගියහ.

ඔවුන්ට විරුද්ධ පැත්තේ හර්මයිනී ග්‍රැන්ජර් බිත්තියට තදවෙමින් ගුලිවී සිටියේ ඇ ක්ලාන්ත වීමට යන බවක් පෙනෙන්නට තිබිණි. ට්‍රෝල් ඇ වෙත යමින් සිටියේ බිත්තිවලට සවිකර තිබූ සින්ක් අතින් ගලවා විසිකරමිනි.

"ඌව කළබල කරන්න" හැරී වහා රොන්ට කීවේය. ටැප් එකක් ගළවා ගත් හැරී හැකි උපරිම වේගයෙන් එය බිත්තියේ ගැසුවේය.

හර්මයිනීට අඩි කීපයක් තබා ට්‍රෝල් නවතුනේය.. ඌ අනෙක් පස හැරී මෝඩ විදිහට ඇසිපිය ගසා ශබ්දය ආවේ කොහෙන්දැයි බැලුවේය. උගේ පුංචි දරුණු ඇස් වලට හැරී අසුවිය. ඌ මදක් නැවතී සිට පිත්ත ඔසවාගෙන ඔහු දෙසට එන්නට පටන් ගත්තේය.

Downloaded from sinhalaebooks.com

"ඕයි, මැට්ටා!" රොන් කුටියේ අනෙක්පස සිට කෑගසා ඌට යකඩ පයිප්පයකින් දමා ගැසුවේය. උරහිසට පයිප්පයක් වැදෙනු ඌට දැනුනේවත් නැත. නමුත් කෑගැසිල්ල ඇසුණු ඌ නැවතී රොන් දෙසට හරුණේය. ඉන් හැරීට උගේ පිටුපසට පැනගන්නට ඇවස්ථාවක් ලැබිණි.

"ඉක්මනට දුවන්න, දුවන්න!" හැරී හර්මයිනීව දොර දෙසට අදිමින් කෑගැසුවේය. නමුත් ඇට සෙළවීමට නොහැකිව, තවමත් භයෙන් ගල්වී බිත්තියට තද වී කට ඇරගෙන බලාසිටියාය.

කෑගැසීම් සහ හඬේ දෙදරීම නිසා ට්‍රෝල් අන්දුන් කුන්දුන් වී සිටියේය. ඌ සර්ජනා කොට ලඟම සිටි රොන් සිටි පැත්තට යන්නට පටන් ගත්තේ ඔහුට පැනගන්නට අවස්ථාවක් නැති කරමිනි.

හැරී ඉන්පසු නිර්භීත නමුත් මෝඩ වැඩක් කළේය. ඔහු වේගයෙන් දුව විත් ට්‍රෝල්ගේ ඇඟට පැන පිටුපසින් උගේ බෙල්ල වටා අත් යවා තද කරගත්තේය. හැරී එහි එල්ලී සිටිනු ට්‍රෝල්ට දැනුනේ නැත. ඒත් උගේ නහයට කෝට්ටක් ගැහුවොත් අනිවාර්යයෙන් දැනේවි. හැරී ඇඟට පනිද්දී ඔහුගේ අතේ තිබූ යශ්ඨිය කෙළින්ම උගේ නාස් සිදුරක් ඇතුලට ගියේය.

වේදනාවෙන් හූ තියමින් ඇඹරුනු ට්‍රෝල් තම පිත්ත එහේ මෙහේ වැනුවේය. හැරී තම ජීවිතය වෙනුවෙන් තදින් එල්ලී සිටියේය. කොයි තප්පරේ ට්‍රෝල් ඔහුව ඉරා දමයිද පිත්තෙන් ගසා අල්ලාගනීවිදැයි කිව නොහැකිය.

හර්මයිනී භීතියෙන් පොළොවේ ඉන්ද විය; රොන් තම යශ්ඨිය එළියට ගත්තේ කුමක් කරමිදැයි නොදැනය. ඔහු තම හිතට ආ පළමු මන්තරය කීවේය. "වෙන්ගාඩියම් ලෙවිඕසා!"

එක්වරම ට්‍රෝල්ගේ අතේ තිබූ පිත්ත උඩ ඉගිලිනි. ඉහලට ගිය එය සෙමින් ආපසු හැරී අසෝබන පිපිරුම් ශබ්දයක් සමගින් එහි අයිතිකරුගේ හිස්මත වැටුනේය. ට්‍රෝල් පිසුපසට වැනී මුනින්තලා ඇද වැටුනේය. ඌ වැටුණු ශබ්දයට කුටිය දෙදරුවේය.

හැරී නැගිට්ටේය. ඔහු වෙව්ලමින් තදින් හුස්ම අදිමින් උන්නේය. රොන් තවමත් තම යශ්ඨිය ඔසවාගෙන තමා කලේ කුමක්දැයි බලමින් සිටගෙන සිටී.

මුලින්ම කතා කලේ හර්මයිනී ය.

"ඌ - මැරිලද?"

"මම හිතන්නේ නෑ, මං හිතන්නේ ඌට කලන්තේ දාලා." හැරී කීවේය.

Downloaded from sinhalaebooks.com

ඔහු බිමට නැවී ට්‍රෝල්ගේ නාසයෙන් ඉවතට තම යෂ්ඨිය ඇද ගත්තේය. එය අළුපාට ඇටසහිත ගම්වැනි දේකින් වැසී තිබිණි.

"අර්ග් - ට්‍රෝල් හොටු."

ඔහු එය ට්‍රෝල්ගේ කලිසමේ පිස දැමුවේය.

හදිසි අඩි හඬවල් සමග දොරක් අරින ශබ්දයක් ඇසෙද්දී ඔවුන් උඩ බැලුවෝය. ඔවුන් කොතරම් යුද්ධයක් කළාද යන්න අදසක් ඔවුන්ට නොවුනත්, ඇත්තටම, පහල තට්ටුවේ සිටිකෙනෙකුට කැඩෙන බිඳෙන ශබ්දය සමග ට්‍රෝල්ගේ සර්ජනාව ඇසෙන්නට ඇති. මොහොතකට පසු ප්‍රොෆෙසර් මැක්ගොනගල් ද ඇ පසුපස ස්නේප් සහ කුරල්ද එහි ආවෝය. ට්‍රෝල් දෙසට හෙලූ එක් බැල්මකින් කුරල් බයෙන් කෑගසා වැසිකිලියක් මත ඉඳගෙන තම පපුව අත ගාන්නට පටන් ගත්තේය.

ස්නේප් ට්‍රෝල් වෙත නැවුනේය. ප්‍රොෆෙසර් මැක්ගොනගල් රොන් සහ හැරී දෙස බලාසිටී. ඇය මේ තරම් කේන්තියෙන් සිටිනවා හැරී කිසිදින දැක තිබුනේ නැත. ඇගේ තොල් සුදුමැලි වී තිබිණි. ග්‍රිෆින්ඩෝ වෙත ලකුණු පනහක් දිනාගැනීමේ බලාපොරොත්තුව හැරීගේ සිතින් දියවී ගියේය.

"මොකක් ද තමුන් හිතුවේ?" කටහඬේ සීතල ගැස්මක් සමග ප්‍රොෆෙසර් මැක්ගොනගල් ඇසුවාය. හැරී තවමත් තම යෂ්ඨිය ඔසවාගෙන බලා සිටින රොන් දෙස බැලුවේය. "තමුන්ලා වාසනාවන්තයි. තමුන්ලා මැරුනේ නෑ. මොකද තමුන්ලා තමන්ගේ කාමරවල නැත්තේ?"

ස්නේප් එක්වරම හැරී දෙස විනිවිද යන බැල්මක් හෙලුවේය. හැරී බිම බලාගත්තේය. රොන් තම යෂ්ඨිය පහත හෙලුවානම් යැයි ඔහු පැතුවේය.

ඉන්පසු අඳුරු සෙවණැලි අතරින් කටහඬක් ආවේය.

"අනේ ප්‍රොෆෙසර් මැක්ගොනගල් - එයාලා මාව හොයාගෙන ආවේ"

"ග්‍රේන්ජර්!"

අවසානයේ හර්මයිනී නැඟීසිටීමට සමත් වූවාය.

Downloaded from sinhalaebooks.com

මම ට්‍රෝල්ව හොයන්න ගියා - මොකද මම .. මම හිතුවේ මට ඌව තනියම පාලනය කරගන්න පුළුවන් කියලා - මම.. උන්ගැන හැමදේම කියවලා තියන නිසා...."

රොන්ට තම යශ්ටිය අතහැරුනේය. හර්මයිනී ගුරුවරයෙකුට පට්ටපල් බොරුවක් කියනවා? "එයාලට මාව හම්බුනේ නැත්තන් මෙලහට මම මැරිලා. හැරී එයාගේ යශ්ටිය උගේ නහයේ ගැහුවා, රොන් උගේම පිත්තෙන් ඌට ගැහුවා. එයාලට කාටවත් එක්ක එන්න වෙලාවක් තිබ්බේ නෑ. ඌ මාව ඉවරකරන්න හදනකොට එයාලා ආවේ."

හැරී සහ රොන් මේ කතාව ඔවුන්ට අළුත් දෙයක් නොවන බව හැඟවීමට උත්සාහ කරමින් සිටියෝය. .

"හොඳයි - ඒක එහෙමනම්..." තුන්දෙනාම දෙස බලමින් ප්‍රොෆෙසර් මැක්ගොනගල් කීවාය, "ග්‍රැන්ජර්, මෝඩ කෙල්ල, කඳුකර ට්‍රෝල් කෙනෙක්ව තනියම මෙල්ල කරන්න තමුන් කොහොමද හිතුවේ ?"

හර්මයිනී හිස පහතට දැමුවාය. හැරී ගොලුවිය. නීතිවලට පිටින් දෙයක් කරන අන්තිම කෙනා තමයි හර්මයිනී. නමුත් මෙතන ඈ ඒ වගක් අඟවමින් ඔවුන්ව බේරාගන්න උත්සාහ කරයි. ඒක හරියට ස්නේප් රසකැවිලි බෙදන්න පටන් ගත්තා වගෙයි.

"ග්‍රේන්ජර් මේකට ග්‍රිෆින්ඩෝ වලින් ලකුණු පහක් අඩු වෙනවා," ප්‍රොෆෙසර් මැක්ගොනගල් කීවාය. "මම තමුන් ගැන හොඳටම කළකිරුනා. තුවාල වෙලා නැත්තන් දුවන්නයි කිව්වේ ග්‍රිෆින්ඩෝ කුළුනට. ළමයි තමන්ගේ නිවාස වල උත්සවේ ඉවරකරන්න යන්නේ."

හර්මයිනී පිටවුනාය.

ප්‍රොෆෙසර් මැක්ගොනගල් රොන් සහ හැරී දෙසට හැරුනාය.

"හොඳයි, මම තාමත් කියන්නේ ඔයාලා වාසනාවන්ත උනා කියලා. ඒත් හැම පළමු වසර ළමයෙක්ටම බෑ හොඳට වැඩිච්ච කඳුකර ට්‍රෝල් කෙනෙක් එක්ක හැප්පෙන්න. ඔය දෙන්නම ග්‍රිෆින්ඩෝ වලට ලකුණු පහ ගානේ දිනනවා. ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝ ට මේ ගැන දැනුම් දෙනවා. ඔයාලට යන්න පුළුවන්."

ඔවුන් වහා කුටියෙන් එළියට ආවේ තට්ටු දෙකක් නගින තෙක් කතා නොකළහ. ට්‍රෝල්ගේ සඳින් ඈත් වී සිටීමට ලැබීම අනෙක් සියල්ලෙන් ඈත්වීමට වඩා සැනසිල්ලක් විය.

"අපිට ලකුණු දහයට වඩා හම්බවෙන්න ඕනේ," රොන් නෝක්කාඩු කීවේය.

Downloaded from sinhalaebooks.com

"පහයි, හර්මයිනීගෙන් කැපුන ලකුණු ඇරුනම."

"හොඳයිනේ, එයා අපිව කරදරේකින් අයින් කරා," රොන් පිළිගත්තේය. "ඒත් අමතක කරන්න එපා, අපි එයාව බේරගත්තා."

"අපි ඌව ඇතුලේ අගුලු දැම්මේ නැත්තන් බේරගන්න ඕනේ වෙන එකකුත් නෑ," හැරී ඔහුට මතක් කළේය.

ඔවුන් මහත කාන්තාවගේ පිංතූරය වෙත ළඟා වූහ.

"ඌරු හොම්බ," කියූ ඔවුහු ඇතුල් වූහ.

පොදු කාමරය ඝෝශාකාරීව සිසුන්ගෙන් පිරී පැවතින. සියළු දෙනාම එවන ලද කෑම කමින් සිටියහ. හර්මයිනී තනිවම දොර අසල ඉඳගෙන ඔවුන් එනතෙක් බලා සිටියාය. ලැජ්ජාවෙන් නිහඬව සිටි ඔවුන් කිසිවෙකු දෙසවත් නොබලමින් තිදෙනාම "ස්තූතියි" කියා වහා පිඟන් වෙත ගියෝය.

නමුත් ඒ මොහොතේ පටන් හර්මයිනී ග්‍රැන්ජර් ඔවුන්ගේ මිතුරිය වූවාය. එකිනෙකාට කැමැත්තක් ඇති නොවී එක්ව කළ නොහැකි සමහර දේවල් තිබේ. අඩි දොළහක් උස කඳුකර ට්‍රෝල් කෙනෙක් වැට්ටවීම එවැනි දෙයකි.

## එකොළොස් වෙනි පරිච්ඡේදය

## කුඩිච්

නොවැම්බර් මාසය එළඹෙත්ම කාළගුණය ඉතා සීත අතට හැරෙන්නට විය. පාසල අවට කඳු අළුපාට අයිස් වලින් වැසී ගිය අතර ගඟ සීතල වානේ තහඩුවක් මෙන් මිදී ගියේය. හැම උදෑසනකම පිට්ටනිය හිමෙන් වැසී ගියේය. ඉහළ මාලයේ ජනේල වලින් කුඩිච් පිටියේ සිට කොසු වල හිම ඉවත් කරන හැග්‍රිඩ්ව පෙණිනි. ඔහු දිග ඌරුමී හමින් මැසූ උඩ කබායක් ඇඳ, හා ලොම් අත්වැසුම් දමා බීවර සමින් මැසූ දැවැන්ත බූට්ස් පැළඳ සිටියේය.

කුඩිච් සෘතුව ආරම්භ විය. සති ගාණක පුහුණුවීම් වලින් පසු හැරී සෙනසුරාදාට ග්‍රිෆින්ඩෝ සහ ස්ලිදරින් අතර වූ තම මුල්ම තරඟයට මුහුණ දීමට නියමිතය. ග්‍රිෆින්ඩෝ දිනුවොත් ඔවුන් නිවාසාන්තර තරඟාවලියේ දෙවෙනි අදියරයට එනු ඇත.

Downloaded from sinhalaebooks.com

හැරී ක්‍රීඩාකරනු කිසිවෙකුත් නොදුටුවේ වුඩ් තම රහස් ආයුධය ලෙස හැරීව රහසේ තබා ගනීමට තීරණය කළ නිසයි. නමුත් හැරී සොයන්නා ලෙස තරඟ කරන පුවත කෙසේ හෝ පැතිරී ගියෙන් ඔවුන් හැරී අතිවිශිෂ්ටයි කීම හෝ, පිරිසකට මෙට්ටයක් අල්ලාගෙන ඔහුගේ යටින් දුවන්නට සිදු වේ යැයි කීම අතරින් වඩා නරක කුමක්දැයි හැරීට සිතාගත නොහැකි විය.

හර්මයිනී දැන් හැරීගේ මිතුරියක වීම ඔහුට වාසනාව ගෙනාවේය. ඇය නැතිව  තම ගෙදර වැඩ කරගන්නේ කොහොමදැයි හැරීට සිතාගත නොහැකි වූයේ වුඩ් අවසන් මොහොතේ ඔවුන්ට දෙන කුඩිච් පුහුණු වීම් නිසායි. ඈ කියවීමට ඉතා සිත්ගන්නා සුලු අවුරුදු ගණනාවක කුඩිච් විස්තර ඔහුට ලබා දුන්නාය.

කුඩිච් තරඟයකදී ඉවත් කිරීම් වලට හසුවිය හැකි ක්‍රම හත්සීයක් ඇතිබවත් ඒ සියල්ල 1473 වසරේ ලෝක කුසලාන තරඟයකදී සිදු වූ බවත්, සාමාන්‍යයෙන් සොයන්නා කුඩාම සහ වේගවත්ම ක්‍රීඩකයා වන අතර බරපතලම අනතුරු සිදුවන්නේ ඔවුන්ට බවත්, කුඩිච් තරඟයකදී ක්‍රීඩකයෙක් මියයාම ඉතා විරල වුවත් බොහෝ තරඟ මෙහෙය වන්නන් අතුරුදන්ව මාස ගණනකට පසු සහරා කාන්තාරයෙන් මතු වී ඇති බවත් හැරී උගත්තේය.

කඳුකර ට්‍රෝල්ගෙන් හැරී සහ රොන් තමාව බේරාගත් දින සිට හර්මයිනී ටිකක් නීති කැඩීම ගැන සැහැල්ලුවට සිතන්නට පටන්ගෙන තිබිණි. ඈ ඊට පොඩි සහයක්ද දුන්නාය. හැරීගේ කුඩිච් තරඟයට පෙර දින ඔවුන් විවේකයේදී මිදෙන තරම් සීතලේ පාසල් වත්තට ගියෝය. හර්මයිනී ජෑම් බෝතලයක දමා ගෙන යා හැකි දීප්තිමත් නිල්පැහැ ගින්දරක් ගෙනවිත් ඔවුන්ට ගිණිගොඩක් ගසා දුන්නාය. ඔවුන් ඊට පිටුපා සිටගෙන සිරුරු රත් කරගනිමින් සිටින අතරේ ස්නේප් වත්ත හරහා ගියේය. ඔහු නොන්ඩිගසන බව හැරී එක්වරම දුටුවේය. හැරී, රොන් සහ හර්මයිනී ලං වී ගින්දර නොපෙනෙන්නට වසා ගත්තේ එය තහනම් බව ඔවුන්ට විශ්වාස නිසායි. නමුත් අවාසනාවට ඔවුන්ගේ වරදකාරී බව පේන මුහුණු ස්නේප්ගේ ඇස ගැටිණි. ඔහු නොන්ඩි ගසමින් එතැනට පැමිණියේය. ගින්දර නොදුටුවත් ඔවුන්ව එළවීමට හේතුවක් සොයන බව ඔහුගේ මුහුණින් පළ විය.

"මොකද්ද පොටර් එතන තියෙන්නේ?"

හැරී ඔහුට 'වසර ගණනාක් පුරා ආ කුඩිච්" නම් පොත පෙන්වීය.

"පුස්තකාල පොත් තියෙන්නේ ඉස්කෝලෙන් එළියට ගේන්න නෙවෙයි," ස්නේප් කීවේය. "දෙනවා ඒක මට. ග්‍රිෆින්ඩෝ වලින් ලකුණු පහක් කපනවා."

"එයා ඒ දැන් ඒ නීතිය හැදුවේ," ස්නේප් නොපෙනී යත්ම හැරී තරහින් මිමිනුවේය. "එයාගේ කකුලට මොකද දන්නේ නෑ වෙලා තියෙන්නේ?"

"දන්නේ නෑ, ඒත් මම හිතන්නේ ඒක එයාට ගොඩක් රිදෙන්න ඕනේ," රොන් අප්‍රසන්නව කීවේය.

Downloaded from sinhalaebooks.com

එදින හවස ග්‍රිෆින්ඩෝර් පොදු කාමරය බොහෝ ඝෝෂාකාරී විය. හැරී, රොන් සහ හර්මයිනී එක්ව ජනේලයක් ලඟ හිඳගත්තෝය. හර්මයිනී හැරී සහ රොන්ගේ වශී පාඩමේ ගෙදර වැඩ පරික්ෂා කරමින් උන්නාය. ඈ කිසිදින ඔවුන්ට හොර කිරීමට ඉඩ නොදුන්නාය. ("කොහොමද ඉගෙන ගත්තේ?"), නමුත් ඇයට එය කියවීමට දීමෙන් ඔවුන් කෙසේ හෝ නිවැරදි පිළිතුරු ලබා ගත්හ.

හැරීගේ සිත නොසන්සුන් විය. ඔහුට හෙට දවසේ තරඟය ගැන ඇති බය නැති කරගන්නට 'වසර ගණනක් පුරා ආ කුඩිච්' පොත අවශ්‍ය විය. ස්නේප්ට මොකටද බය වෙන්නේ? ඔහු ස්නේප්ගෙන් එය ඉල්ලාගන්නට යනබව රොන්ට සහ හර්මයිනීට කීවේය.

"මම ඉල්ලනවට වඩා ඔයා ඉල්ලන එක හොඳයි," ඔවුන් එක්වර කීවත්, ස්නේප්ට අනිත් ගුරුවරු ඉදිරිපිට එය ප්‍රතික්ශේප කළ නොහැකි බව හැරීගේ අදහස විය.

ඔහු ගුරු කාමරටයට ගොස් තට්ටු කළේය. උත්තරයක් නොමැත. ඔහු නැවත තට්ටු කලේය. කිසිවෙක් නැත.

සමහර විට ස්නේප් පොත එහි තබා ගියාද? උත්සාහයක් දැරුවාට පාඩු නැත. ඔහු දොර තල්ලු කොට ඇතුලට එබී බැලුවේය. ඔහු දුටුවේ භයානක දර්ශනයකි.

ඇතුලේ ස්නේප් සහ ෆ්ලිච් තනිව සිටි අතර, ස්නේප් තම ඇඳුම් දණහිස තෙක් ඔසවාගෙන සිටී. ඔහුගේ එක් කකුළක් තැලී පොඩිවී ලේ ගලමින් තිබිණි. ෆ්ලිච් ඔහුට වෙලුම් පටි ලබා දුන්නේය.

"ජරාවක් ඌ," ස්නේප් කීවේය. "එකපාර ඔලු තුනම දිහා බලාගෙන ඉන්නේ කොහොමද?"

හැරී නිහඬවම දොර වැසීමට උත්සාහ කළේය. නමුත්--

"පොටර්!"

තම කකුල වසා ගැනීමට ඇඳුම පහත දමද්දී ඔහුගේ මූණ කෝපයෙන් ඇඹරුනේය. හැරීට කෙළ ගිලිනි.

"මම බැලුවේ මගේ පොත ආපහු ඉල්ලගන්න පුළුවන්ද කියලා."

"එළියට යනවා! එළියට!"

Downloaded from sinhalaebooks.com

ස්නේප් ග්‍රිෆින්ඩෝ වලින් තවත් ළකුණු කැපීමට පෙර හැරී පිටවුනේය. ඔහු උඩතට්ටුවට අධිවේගයෙන් දිව්වේය.

"ඔයාට ඒක හම්බුනාද?" හැරී තමන් වෙත එද්දී රොන් ඇසුවේය. "මොකද්ද ප්‍රශ්ණේ?"

ඉතා සෙමින් කොඳුරමින් තමා දුටු සියල්ල හැරී ඔවුන්ට කීවේය.

"දන්නවද ඒකේ තේරුම මොකද්ද කියලා?" ඔහු හති දමමින් අවසන් කළේය. "එයා හැලෝවීන් වලදී අර ඔලුතුනේ බල්ලාව පහු කරලා යන්න හදලා. අපි දැක්කේ එයා එතෙන්ට යද්දි - එයා හදන්නේ ඌ ආරක්ශාකරන දේ ගන්න. අනික මම මගේ කොස්ස ඔට්ටු තියනවා, එයා තමයි අර ට්‍රෝල්ව ඇතුලට ගත්තේ කියලා. එතකොට අනිත් අයව ඒ පැත්තට යවන්න පුළුවන්නේ."

හර්මයිනීගේ ඇස් විශාල විය.

"නෑ - එයා එහෙම කරන්නේ නෑ" ඇය කීවාය. "මම දන්නවා එයා එච්චර හොඳ නෑ කියලා, ඒත් එයා ඩම්බල්ඩෝ ආරක්ශා කරන දෙයක් හොරකම් කරන්න එයා උත්සාහ කරන එකක් නෑ."

"ඇත්තටම හර්මයිනී, ඔයා හිතන්නේ ඔක්කොම ගුරුවරු ශාන්තුවරු කියලද," රොන් කීවේය.. "මම හැරී එක්ක. මම නම් ස්නේප්ට කිසි බුරුලක් දෙන්නේ නෑ. ඒත් එයා මොකක් පස්සෙද පන්නන්නේ? අර බල්ලා මොකද්ද රකින්නේ?"

එම ප්‍රශ්ණයම තම හිසේ රැව් දෙද්දී හැරී නිදාගන්නට ගියේය. නෙවිල් මහ හඬින් ගොරවමින් සිටියත් හැරීට නිදාගත නොහැකිය. ඔහු තම හිත නිදහස් කර ගැනීමට උත්සාහ කළේය. ඔහුට නිදා ගැනීමට උවමනා විය. ඔහු නිදාගත් යුතුයි. තව පැය කීපයකින් ඔහුගේ පළමු කුඩිච් තරඟය පැවැත් වේ. නමුත් තම කකුළ හැරී දකිද්දී ස්නේප්ගේ මුහුණේ ඇති වූ හැඟීම අමතක කිරීම ලේසි නැත.

පසුදින උදෑසන දීප්තිමත් සහ සීතල එකක් විය. ප්‍රධාන ශාලාව බැදපු සොසේජස් වල ප්‍රණීත සුවඳින් සහ හොඳ කුඩිච් තරඟයක් බලාපොරොත්තු වූ සියලු දෙනාගේ ප්‍රීතිමත් කතාබස් හඬින් පිරී පැවතිනි.

"ඔයා මොනාහරි ටිකක් කන්න ඕනේ."

"මට මොකුත් එපා."

Downloaded from sinhalaebooks.com

"පොඩි පාන් කෑල්ලක්," හර්මයිනී බල කරාය.

"මට බඩගිනි නෑ."

හැරීට කණගාටුවක් දැනුණි. තව පැයකින් ඔහු පිටියට යනු ඇත.

"හැරී, ඔයාට ශක්තිය ඕනේ," සීමස් ෆිනිගන් කීවේය. "සොයන්නෝ තමයි හැමවෙලේම අනිත් පිලෙන් කන්නේ."

"ස්තුතියි, සීමස්," සීමස් තම සොසේජස් මත කෙචප් ගොඩගහන හැටි බළමින් හැරී කීවේය.

එකොළහ වන විට මුළු පාසලම ක්‍රීඩා පිටිය වටා වූ උස් ආසන වල සිටියෝය. බොහෝ සිසුන් ළඟ දුරදක්ණ විය. ආසන ඉහල තිබුනත් සමහර වෙලාවට සිදුවන දෙය හොඳින් බලාගැනීම අපහසුය.

රොන් සහ හර්මයිනී නෙවිල්, සීමස් සහ ඩීන් සමග උතුරු කොටසේ උඩම පේළියට වී සිටියහ. හැරීගේ ඉමහත් පුදුමයට ඔවුන් ස්කැබස් විනාශ කළ කොළයක විශාල බැනරයක් පිංතාරු කර තිබිණි. එහි වූයේ 'පොටර් ජනපති කරවමු' ලෙසයි. චිත්‍ර ඇඳීමට දක්ශ ඩීන් එහි පහලින් විශාල ග්‍රිෆින්ඩෝ සිංහයෙක් ඇඳ තිබිණි. හර්මයිනී කල කුඩා මන්තරයකින් චිත්‍රය නොයෙක් වර්ණ විහිදවීය.

ඒ අතරේ හැරී සහ කණ්ඩායමේ අනිත් අය ඔවුන්ගේ මෙරුන් පැහැ ක්‍රීඩා කබා අඳිමින් සිටියහ. (ස්ලිදරින් තරඟ වදින්නේ කොළ පාටිනි).

වුඩ් නිහඬ වීමට අහවමින් තම උගුර පෑදුවේය.

"හරි, කොල්ලනේ," ඔහු කීවේය.

"සහ කෙල්ල" එළවන්නෙක් වන ඇන්ජලිනා ජොන්සන් කීවාය.

"සහ කෙල්ල" වුඩ් එකඟ විය. "මේ තමයි ඒක"

"ලොකුම එක," ෆ්‍රෙඩ් වීස්ලි කීවේය.

Downloaded from sinhalaebooks.com

"අපි බලාපොරොත්තුවෙන් හිටපු එක," ජෝජ් කීවේය.

"අපිට ඔලිවර්ගේ කතාව කටපාඩම්" ෆ්රැඩ් හැරීට කීවේය. "අපි ගිය අවුරුද්දෙත් කණ්ඩායමේ හිටියා."

"කටවහනවා, ඔය දෙන්නා" වුඩ් කීවේය. "මේක අවුරුදු ගාණකින් ග්‍රිෆින්ඩෝ වලට තිබ්බ හොඳම කණ්ඩායම. අපි දිනන්න යන්නේ. මම ඒක දන්නවා."

"නැති වුනොත්නේ." කියන්නාක් මෙන් වූ බැල්මකින් ඔහු හැමෝම දෙස බැලුවේය.

"හරි. වෙලාව හරි. හැමෝටම, සුභ පැතුම්."

හැරී තම කකුල් ගැන විශ්වාසය තබමින් ෆ්‍රෙඩ් සහ ජෝජ් පිටුපසින් කාමරයෙන් ඉවතට, ජයඝෝෂා පිරි ක්‍රීඩාපිටිය වෙත ගියේය.

තරඟය මෙහෙයවන මැඩම් හූච් තම කොස්ස අතැතිව කණ්ඩායම් දෙක පිටියට පැමිණෙන තෙක් බලා සිටියාය.

"දැන්, මට ඕනේ කරන්නේ ලස්සන සාධාරණ තරඟයක්, හැමෝගෙන්ම," සැවොම ඈ වටා සිටගත් විට ඇය කතා කළාය. ඇය විශේෂයෙන් ස්ලිදරින් නායකයා වූ හය වසරේ මාකස් ෆ්ලින්ට් ට කතාකරන බවක් හැරීට පෙණිනි. හැරී සිතුවේ ෆ්ලින්ට් ට්‍රෝල් ලේ ඇත්තෙකු මෙන් පෙනෙන බවයි. ඇස් කොණින් ඔහු නොයෙක් පාට විහිදුවමින් ළෙල දෙන 'පොටර් ජනපති කමට' යනුවෙන් ලියූ සැමට ඉහලින් කැපී පෙනෙන බැනරය දුටුවේය. ඔහුගේ හදවත ගැස්සුනේය. ඔහුට දැඩි නිර්භීතකමක් දැණිනි.

"කරුණාකර, තමන්ගේ කොස්සට නගින්න."

හැරී තම නිම්බස් දෙදාහට නැංගේය.

මැඩම් හූච් තම රිදී නලාව මහ හඬින් පිම්බාය.

කොසු පහලොවක් ඉහල අහසට නැගුනි. "ග්‍රිෆින්ඩෝ හී ඇන්ජලිනා ජොන්සන් විසින් වහාම කුවෆල් පන්දුව ලබා ගන්නා ලදී. කොපමණ දක්ශ එළවන්නියක්ද.. ඒ විතරක් ද ඈ බොහෝම සිත්ගන්නා සුලුයි... "

Downloaded from sinhalaebooks.com

"ජෝඩන්!"

"සමාවෙන්න, ප්‍රොෆෙසර්."

වීස්ලි නිවුන්නුන්ගේ මිතුරා වූ ලී ජෝඩන් ප්‍රොෆෙසර් මැක්ගොනගල්ගේ අධීක්ශණයයටතේ තරඟ විස්තර විචාරය ආරම්භ කළේය.

"ඇය ඉතා හොඳින් එහි රැඳී සිටින බව පෙනේ, මේ මොහොතේ ඉතා හොඳින් පන්දුව ඇලීශියා ස්පිනෙට් වෙත යොමුකරා. ඇ ඔලිවර් වුඩ්ගේ හොඳ සොයා ගැනීමක්, පහුගිය වසරේ අතිරේක ක්‍රීඩිකාවක් ලෙස ඉදිරිපත් උනා. .. නැවතත් පන්දුව ජොන්සන්ට.. නෑ... ස්ලිදරින් විසින් මේ අවස්ථාවේදී ක්වෆල් පන්දුව ලබා ගත්තා. ස්ලිදරින් නායක මාකස් ෆ්ලින්ට් ක්වෆල් පන්දුව රැගෙන යනවා... ෆ්ලින්ට් රාජලියෙක් වගේ පියාඹලා යනවා මේ මොහොතේ - ඔහු මේ අවස්ථාවේදී හදන්නේ ලකුණක් - නෑ, අතිවිශිෂ්ඨ පිම්මක් සමගින් ග්‍රිෆින්ඩෝ රකින්නා වුඩ් විසින් එය වළක්වනු ලබනවා... පන්දුව ග්‍රිෆින්ඩෝ අත.. ඒ ග්‍රිෆින්ඩෝ එළවන්නා කේටි බෙල්... ඇ ෆ්ලින්ට් වටා ලස්සනට පියාඹලා.. පිටිය ඉහලට.. අයියෝ.. ඒක නම් රිදෙන්න ඇති.. ඔලුව පිටිපස්සේ බ්ලජර් පන්දුව වැදුනා. ස්ලිදරින් විසින් ක්වෆල් පන්දුව ලබාගන්නවා.. ඒ ඒඩ්‍රියන් පෝසි.. ඔහු ලකුණක් ලබාගැනීමට ගෝල් කණුව වෙත යනවා.. නමුත් ෆ්‍රෙඩ් හරි ජෝජ් හරි එවපු අනිත් බ්ලජර් එකෙන් ඔහුව වැලැක්වුනා.. කොයි එක්කෙනාද කියන්න බෑ.. ග්‍රිෆින්ඩෝ පහර දෙන්නා ලස්සනට ක්‍රීඩා කරන්වා.. කෙසේ වෙතත් නැවතත් පන්දුව ජොන්සන් ලඟ...ඉදිරිය පැහැදිලියි.. මෙන්න ඇය ඉදිරියට යනවා.. එයා නියමෙට පියාඹනවා.. වේගෙන් ආපු බ්ලජර් පන්දුව නැවී මග හරිනු ලබනවා මේ වෙලාවේදී... ගෝල් කණු ඉදිරියෙන්. ඇන්ජලිනා ඉක්මනට යනවා.. රකින්නා බ්ලෙච්ලේ එනවා.. මග ඇරුනා... ග්‍රිෆින්ඩෝ ලකුණු ලබාගන්නවා.. "

ස්ලිදරින් හූ කියන සහ බෙරිහන් දෙන අතරේ ග්‍රිෆින්ඩෝ ජය ගෝෂාවෙන් සීතල අහස පිරී ගියේය.

"ඔය උඩ ඉන්න අය, පොඩ්ඩක් ඉඩ දෙන්න."

"හැග්‍රිඩ්!"

රොන් සහ හර්මයිනී එකට තද වී හැග්‍රිඩ්ට ඔවුන් ලඟට ඒමට ඉඩ දුන්නෝය.

"මගේ කුටියේ ඉඳලා බලාගෙන හිටියේ" තම ගෙළවටා වූ විශාල දුරදක්ණයකට තට්ටු කරමින් ඔහු කීවේය., "ඒත් ඒක සෙනග ගොඩේ ඉන්නවා වගේ නෑ. තාම ස්නිච් එක පේන්න නෑ නේද ආ?"

"ම්හු," රොන් කීවේය. "හැරීට තාම වැඩිය මොකුත් කරන්න හම්බුනේ නෑ."

Downloaded from sinhalaebooks.com

"පොඩ්ඩක් පැත්තකට වෙලා ඉන්නවා වගේ. ඒකත් එක දෙයක්," තම දුරදක්නය ඔසවා ඉන් අහසේ තිතක් මෙන් පෙණුනු හැරී දෙස බලමින් හැග්‍රිඩ් කීවේය.

හැමෝටම ඉහළින් හැරී ස්නිච් පන්දුව ගැන සළකුණක් හොයමින්ම තරහය නරඹමින් සිටියේය. මෙය ඔහුගේත් වුඩ්ගේත් ක්‍රීඩා සැළසුම විය.

"ස්නිච් එක දකිනකන් ඔයා ඈත් වෙලා ඉන්න ," වුඩ් කියා තිබිණි. "එයාලට ඔයාට කළින්ම ගහන්න ඉඩ දෙන්න බෑ."

ඇන්ජලිනා ළකුණු ගත්විට සතුටට පත් වූ හැරී රවුමට රවුමට පියෑඹුවේය. ඔහු ස්නිච් පන්දුව සොයනු වස් ආපසු පැමිණියේය. වරක් ඔහු රන්පැහැ එළියක් දුටුවත් එය වීස්ලි සොයුරෙකුගේ ඔරලෝසුවකින් ආ එළියක් විය. එක්වරක් බ්ලජර් පන්දුව ඔහු වෙත එන්නට තීරණය කළෙන් කාළතුවක්කුවකින් වෙඩි තැබුවාක් මෙන් එය පිඹගෙන හැරී වෙත ආවේය. හැරී පහත් වී එය මග ඇරිය අතර ෆ්‍රෙඩ් වීස්ලි එය පසුපස පන්නාගෙන ආවේය.

"හැරී, හොඳින් නේද?" මාකස් ෆ්ලින්ට් වෙත බ්ලජර් පන්දුව යවමින් ඔහු ඇසුවේය.

"ස්ලිදරින් සූදානමින්," ලී ජෝඩාන් කීවේය. "එළවන්නා පෝසි බ්ලජර් පන්දු දෙකක් මගහරිමින් වීස්ලි වරු දෙදෙනෙක් මගහරිමින්, එළවන්නා බෙල් වත් මගහරිමින්.. වේගයෙන්.. පොඩ්ඩක් ඉන්න .. ඒ ස්නිච් එකද?"

ඒඩ්‍රියන් පෝසි විසින් තම වම් කණ අසලින් පියඹා ගිය ස්නිච් පන්දුව දෙස උරහිසට ඉහලින් බැලීමට ගොස් ක්වෆල් පන්දුව වට්ටාගත් විට ක්‍රීඩාගාරය පුරාවට කසුකුසුවක් පැතිර ගියේය.

හැරී එය දුටුවේය. විශාල උද්‍යෝගයක් සමගින් ඔහු රන් පැහැ එළිය පිටුපස පහළට කිමිදුනේය. ස්ලිදරින් සොයන්නා වූ ටෙරන්ස් හිග්ස් ද එය දැක තිබිණි. ඔවුන් එක ලඟින් ඒ පසුපස පන්නන්නට වූයෙන්, සියලුම එළවන්නෝ තමන් කළ යුත්ත අමතකව අහසේ රැඳී ඒ දෙස බලාගෙන ඉන්නට විය.

හැරී හිග්ස්ට වඩා වේගවත් විය. ඔහුට ඉහළට ඇදෙමින් පියාපත් ගසන කුඩා බෝළය දැකිය හැකි විය. ඔහු තම වේගය තවත් වැඩි කළේය.

ආහ්! පහල ග්‍රිෆින්ඩෝ පිරිස් වෙතින් එක්වරම කෑගැහිල්ලක් ආවේය. මාකස් ෆ්ලින්ට් හිතාමතාම හැරීගේ හරහට ආවේය. හැරීගේ කොස්ස ඉවතට පැන්නෙන් හැරී තම පණ බේරා ගැනීමට එය තදින් අල්ලා ගත්තේය.

"වැරදී!" ග්‍රිෆින්ඩෝ නිවාසය කෑගසන්නට විය.

Downloaded from sinhalaebooks.com

මැඩම් හුච් කෝපයෙන් ෆ්ලින්ට්ට බැන වැදී ග්‍රිෆින්ඩෝ වෙත නිදහස් ගෝලයක් ලබා දුන්නාය. නමුත් මේ සියල්ල අතරේ ස්නිච් පන්දුව නැවත අතුරුදන්ව තිබිණි.

පහළ ආසන වල සිටි ඩීන් තෝමස් කෑ ගසන්නට විය, "එයාව යවන්න, රතු කාඩ් එක!"

"ඔයා මොනා ගැනද කියන්නේ ඩීන්?" රොන් ඇසුවේය.

"රතු කාඩ් එක!" ඩීන් කුතුහළයෙන් කීවේය. "පාපන්දු වල නම් රතු කාඩ් එක දීලා එයාව තරගෙන් අයින් කරනවා!"

"ඒත් මේ පාපන්දු නෙවෙයිනේ ඩීන්," රොන් මතක් කළේය.

කෙසේ වෙතත් හැග්‍රිඩ් ඩීන්ගේ පැත්තට සිටියේය.

"එයාලට නීති වෙනස් කරන්න තියෙන්නේ. ෆ්ලින්ට් හැරීව උඩ ඉඳලා වට්ටන්න ගියේ."

ලී ජෝඩාන්ට පැත්තක් නොගෙන සිටීම ඉතා අපහසු විය.

"ඉතින් - ඒ සුපුරුදු සහ අප්‍රසන්න වංචාවෙන් පසු..."

"ජෝඩන්!" ප්‍රොෆෙසර් මැක්ගොනගල් කෑ ගැසුවාය.

"මම කිව්වේ, ඒ විවෘත සහ පිළිකුල් වරදින් පස්සේ..."

'ජෝඩන්, මම ඔයාට සැරයක් කිව්වා- - "

"හරි, ඒක හරි. ෆ්ලින්ට් ග්‍රිෆින්ඩෝ සොයන්නාව මරන්නම ගියා තමයි, ඒක කාට උනත් වෙන්න පුළුවන්, මට විශ්වාසයි ඒක එහෙම වෙන්න ඇති, ඉතිං ග්‍රිෆින්ඩෝ වෙත වාසි පහරක් ලැබුනා, ස්පිනර් ඒක ලබාගත්තා, ප්‍රශ්ණයක් නෑ, අපි තවදුරටත් තරඟයට යොමු වෙමු.. තවමත් ග්‍රිෆින්ඩෝ ස්ථානගත වෙලා ඉන්නවා."

Downloaded from sinhalaebooks.com

හැරී තම හිස ලඟින් භයානක ලෙස තවත් බ්ලජර් එකක් යත්ම හිස අහකට ගත් පසු එය සිදුවිය.. ඔහුගේ කොස්ස එක්වරම භයානක ලෙස ඇල විය. තප්පරයකට ඔහු සිතුවේ තමන් වැටෙන්නට යන බවකි. ඔහු තම අත් දෙකෙන් සහ දණහිස් වලින් කොස්ස තදින් අල්ලා ගත්තේය. මෙවැනි දෙයක් ඔහුට කවදාවත් දැනී තිබුණේ නැත.

නැවතත් එයම සිදු විය. කොස්ස ඔහුව ඉවතට විසි කරන්න හදනවාක් මෙන් විය. නමුත් නිම්බස් දෙදාහ එහෙම හදිසියේ තම පදවන්නා වට්ටන්නට සිතන්නේ නැත. හැරී ග්‍රිෆින්ඩෝ ගෝල් කණු පැත්තට හැරෙන්නට උත්සාහ කළේය.

ඔහු සිතුවේ වුඩ් ලවා විවේකයක් ඉල්ලා ගැනීමටයි. නමුත් කොස්ස සම්පූර්ණයෙන් තම පාළනයෙන් තොර බව ඔහුට වැටහුණි. ඔහුට එය හැරවීමට නොහැකිය. ඔහුට එය කිසිසේත් පාළනය කළ නොහැකිය. එය එහේ මෙහේ පැද්දෙමින් එක්වරම ගැස්සෙමින් අහස පුරා ගමන් කරන්නට වූයේ හැරීව ඉන් ඉවතට වීසි වන්නටම ගියේය.

ලී තවමත් විස්තර කථනය කරමින් සිටියේය.

"ස්ලිදරින් සුදානමින්.. ෆ්ලින්ට් ක්වෆල් පන්දුව සමගින්... ස්පිනට් වෙතට.. නැවත පන්දුව බෙල් වෙතට.. බ්ලජර් එකක් තදින් ඔහුගේ මුහුණේ වැදුනා.. ඒකට එයාගේ නහය කැඩුනානම් හොඳයි... විහිලුවක් කරේ ප්‍රොෆෙසර්... ස්ලිදරින් ළකුණු ලබා ගන්නවා... අයියෝ...

ස්ලිදරින් වෙතින් ඔල්වරසන් හඬ නැගෙන්නට විය. හැරීගේ කොස්ස අමුතු ලෙස හැසිරෙන අයුරු කිසිවෙක් නොදුටු බවක් පෙනේ. එය ඇඹරෙමින් ගැස්සෙමින් ඔහුව සෙමින් ඉහළට තරඟයෙන් ඉවතට ගෙන ගියේය.

"හැරී මොනා කරනවද මන්දා," හැග්‍රිඩ් තම දුරදක්ණයෙන් බලමින් මිමිනුවේය. "මම හොඳට දැනගෙන හිටියේ නැත්තන් කියන්න තිබ්බා එයාට එයාගේ කොස්ස පාළනය කරගන්න බෑ වගේ කියලා. ඒත් එහෙම වෙන්න බෑ..."

හදිසියේ සියලුම රැඳවුම් වල සිටි අය ඉහල සිටි හැරී දෙස අත් දිගු කර පෙන්වන්නට විය. ඔහුගේ කොස්ස ඔහුත් සමගම පෙරළෙන්නට පටන් ගත්තේය. ඔහු අමාරුවෙන් එහි රැඳී සිටී. ඉන්පසු මුළු සෙනගම ගැස්සුනෝය. හැරීගේ කොස්ස භයානක ලෙස පිම්මක්පැන්නෙන් හැරී එයින් ඉවතට විසි විය. දැන් ඔහු එක අතකින් පමණක් එහි එල්ලී සිටී.

" ෆ්ලින්ට් එයාව හරස් කරපු වෙලාවේ ඒකට මොකුත් උනාද?" සීමස් කෙඳිරුවේය.

"වෙන්න බෑ," හැග්‍රිඩ් වෙවුලන් කටහඬින් කීවේය.. "බලවත් අඳුරු මායාවකට ඇරෙන්න කිසි දේකට කොස්සකට මොකුත් කරන්න බෑ. නිම්බස් දෙහාහකට එහෙම කරන්න කිසිම ළමයෙක්ට බෑ."

Downloaded from sinhalaebooks.com

ඒ වචන පිට වෙනවාත් සමග හර්මයිනී හැග්‍රිඞ්ගේ දුරදක්ණය උදුරා ගත්තේය. නමුත් හැරී දෙස බළනවා වෙනුවට ඇ උවමනාවෙන් සෙනග දෙස බලන්නට පටන් ගත්තාය.

"ඔයා මොනාද කරන්නේ?" සුදුමැලි මුහුණෙන් යුතුව රොන් කෑ ගසුවේය.

"මම දැනගත්තා," හර්මයිනී ගැස්සුනාය, "ස්නේප් - බලන්න."

රොන් දුරදක්ණය ගත්තේය. ස්නේප් සිටියේ ඔවුන්ට විරුද්ධ පැත්තේ රඳවනයේ මැද හරියේය. ඔහු තම ඇස් හැරී වෙතම රඳවාගෙන නොනවත්වා මතුරමින් සිටී.

"එයා මොනාහරි කරනවා - කොස්සට මතුරනවා," හර්මයිනී කීවාය.

"අපි මොකද කරන්නේ?"

"ඒක මම කරන්නම්."

රොන් තව වචනයක් හෝ කීමට පෙර හර්මයිනී අතුරුදන් වූවාය. රොන් නැවතත් දුරදක්ණය හැරී දෙසට හැරවූයේය. ඔහුගේ කොස්ස වේගයෙන් වෙවුළයි. එහි බොහෝ වෙලා රැඳී සිටීම ඔහුට කළ නොහැක්කකි. . සියල්ලෝම නැගිට භීතියෙන් ඔහු දෙස බළා සිටින්නටවිය. වීස්ලි සොයුරන් ඉහලට පියඹා ඔහුව තම කොස්සක් මතට ගැනීමට උත්සාහ කළත් එය හරිගියේ නැත. ඔවුන් ඊට ළං වන සෑම විටම එය උඩ පනී. ඔවුන් පහළට පැමිණ ඔහුට පහළින් කරකැවෙන්නට පටන් ගත්තේ වැටුනොත් ඔහුව අල්ලාගන්න අදහසිනි.

මාකස් ෆ්ලින්ට් ක්වෆල් පන්දුව ගෙන කාටත් හොරෙන් පස් වතාවක් ළකුණු ගත්තේය.

"ඉක්මනට, හර්මයිනී," රොන් නොයිවසිල්ලෙන් තොල මැතිරුවේය.

හර්මයිනී ස්නේප් සිටි ආසනය වෙත යන්නට සෙනග අතර පොර කෑවාය. දැන් ඇය ඔහු පිටුපස පේළියේ ඔහු වෙත දුවමින් උන්නාය. ඇය ඉදිරිපස පේළියක උන් ප්‍රොෆෙසර් කුරල්ගේ හිසේ හැපෙද්දී සමාවෙන්න කීමටවත් නැවතුනේ නැත. ස්නේප් වෙත ආ ඇ බිමට නැවී තම යෂ්ටිය ගෙන හොඳින් තෝරාගත් වචන කීපයක් මැතිරුවාය. දීපතිමත් නිල්පැහැ ගිණි දල්ලක් ඇයගේ යෂ්ටියෙන් පිටවී ස්නේප්ගේ ඇඳුමේ කොනකට වැටිණි.

Downloaded from sinhalaebooks.com

තමන්ගේ ඇඳුම ගිණිගන්නා බව දැනෙන්නට ස්නේප්ට තප්පර තිහක්වත් ගතවිය. හදිසි කෑ ගැසීමක් විසින් තම වැඩේ හරියට සිදුවූ බව ඇයට දැන්වීය. තම සාක්කුවක වූ බෝතලයකට ආපසු ගින්දර දාගත් ඇ පේළි අතරින් රිංගා ආපසු ගියාය. සිදු වුයේ කුමක්දැයි ස්නේප් කිසිදින දැනගනු නොමැත.

හැරීට එය ප්‍රමාණවත් විය. ඉහළ අහසේ සිටි හැරීට එක්වරම ආපසු තම කොස්සට නැගගත හැකි විය.

"නෙවිල්, ඔයා බලන්න!" රොන් කීවේය. පසුගිය විනාඩි පහ තුළ දී නෙවිල් හැග්‍රිඩ්ගේ කබාය තුළ හඬමින් සිටියේය.

හැරී පිට්ටනිය දෙසට වේගයෙන් ආවත් පිරිස දුටුවේ ඔහු අසනීප ගතියක් පෙන්වමින් තම කට අතින් වසාගත් බවත් පමණි. ඔහු අත් කකුල් හතරෙන්ම පොළොව මත වැටී - කැස්සේය - ඉන්පසු යම්කිසි රන්පැහැ දෙයක් ඔහුගේ අතට වැටිණි.

"ස්නිච් එක මගේ ලඟ!" එය තම හිසට ඉහලින් වනමින් ඔහු කෑ ගැසුවේය. තරඟය සම්පූර්ණ ව්‍යාකූලත්වය මැද නිමා විය.

"එයා ඒක අල්ලගත්තේ නෑ, ඒක බාගෙට ගිල්ලා.," විනාඩි විස්සකට පසුත් ෆ්ලින්ට් අඳෝනා කියමින් සිටියත් ඉන් කිසි වෙනසක් වුයේ නැත. හැරී කිසිම නීතියක් කැඩුවේ නැත. ලී ජෝඩාන් සතුටින් අවසන් ළකුණු කීවේය. ග්‍රිෆින්ඩෝ කණ්ඩායම ළකුණු හැටට එකසිය හැත්තෑවක් ලෙස තරඟය ජයග්‍රහණය කළෝය. හැරීට මේ කිසිවක් ඇසුණේ නැත. ඔහු රොන් සහ හර්මයිනී සමග හැග්‍රිඩ්ගේ කුටියේ හොඳ තේ කෝප්පයක් බීමට සූදානම් වුනේය.

"ඒ ස්නේප්," රොන් විස්තර කරන්නට විය. "මමයි හර්මයිනියි දැක්කා එයා ඔයාගේ කොස්සට ශාප කරන හැටි.... මතුර මතුර,... ඔයාගෙන් ඇස් අහකට ගත්තෙම නෑ."

"විකාරද" රඳවනය මතදී තමා වටා කතා වුනු දේවලින් වචනයක් වත් ඇසුනේ නැති හැග්‍රිඩ් කීවේය. "ස්නේප් මොකටද එහෙම දෙයක් කරන්නේ?"

හැරී, රොන් සහ හර්මයිනී මොකක් කියන්නේදැයි සිතමින් එකිනෙකා දෙස බැලූහ. ඇත්තම කීමට හැරී තීරණය කළේය.

"මම එයා ගැන දෙයක් හොයාගත්තා" ඔහු හැග්‍රිඩ්ට කීවේය. එයා හැලෝවීන් දවසේ අර ඔලු තුනේ බල්ලාව පහු කරගෙන යන්න හැදුවා. ඌ එයාව හපලා. අපි හිතන්නේ ඌ ආරක්ෂා කරන මොනාහරි එයා හොරකම් කරන්න හැදුවේ."

Downloaded from sinhalaebooks.com

හැග්‍රිඩ් අතින් තේ පෝච්චිය අත හැරිනි.

"ඔයාලා කොහොමද ෆ්ලෆී ගැන දන්නේ?" ඔහු ඇසුවේය.

"ෆ්ලෆී?"

"ඔව්, ඌ මගේ.. ගිය අවුරුද්දේ තැබෑරුමේදි මුණ ගැහුන ග්‍රීක් මනුස්සයෙක්ගෙන ගත්තේ- මම ඌව ඩම්බල්ඩෝට දුන්නා. ඌ ආරක්ෂාකරනවා....

"ඔව්?" හැරී නොයිවසිල්ලෙන් ඇසීය.

"දැන්, තව මගෙන් මොකුත් අහන්න එපා," හැග්‍රිඩ් කළබලයෙන් කීවේය. "ඒක ලොකු රහසක්,.. ඔව්."

"ඒත් ස්නේප් හදන්නේ ඒක හොරකම් කරන්න."

"විකාර," හැග්‍රිඩ් නැවත කීවේය. "ස්නේප් හොග්වාර්ට්ස් ගුරුවරයෙක්. එයා ඒ වගේ දේවල් කරන්නේ නෑ."

"එහෙනම් එයා හැරීව මරන්න උත්සාහ කරේ ඇයි?" හර්මයිනී ඇසුවාය.

දහවල් සිදු වූ සිදුවීම ස්නේප් ගැන ඇගේ තිබූ අදහස සම්පූර්ණයෙන්ම වෙනස් කර තිබිණි.

"මම ශාපයක් දැක්කම අඳුනනවා. හැග්‍රිඩ්, මම ඒවා ඔක්කොම ගැන කියෙව්වා. ඔයා ඒ දිහා බලාගෙනම ඉන්න ඕනේ, ඉතිං ස්නේප් ඇස් පිල්ලම් ගැහුවේවත් නෑ, මම එයාව දැක්කා..!"

"මම ඔයාට කියන්නේ, ඔයා වැරදියි!" හැග්‍රිඩ් තරහෙන් කීවේය. "හැරීගේ කොස්ස එහෙම හැසිරුනේ ඇයි කියන්න මම දන්නේ නෑ. ඒත් ස්නේප් ළමයෙක්ව මරන්න හදන්නේ නෑ! දැන්, මම කියන දේ අහගන්න,.. තුන් දෙනාම... ඔයාලා තමන්ට අදාල නැති දේවල් වලට අත දාන්නේ. ඒක භයානකයි. ඔයාලා අර බල්ලව අමතක කරන්න ඕනේ. ඌ රකින්නේ මොනාද කියන එකත් අමතක කරන්න ඕනේ. . ඒක ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝගෙයි නිකලස් ෆ්ලැමල් ගෙයි.... "

"අහා!" හැරී කීවේය, "එතකොට ඒකට නිකලස් ෆ්ලැමල් කියලා කෙනෙක් සම්බන්ධයි. නේ?"

Downloaded from sinhalaebooks.com

හැග්‍රිඩ් තමන් ගැනම කේන්ති ගත්ත බවක් පෙණෙන්නට විය.

දොළොස් වෙනි පරිච්ඡේදය

වශාආ කණ්නාඩිය

නත්තල ලඟා වේ. දෙසැම්බර් මාසයේ මැද දිනෙක උදෑසන හොග්වාර්ට්ස් අඩි කීපයක් උසට හිමෙන් වැසී තිබිණි. ගඟ ගල් වී තිබිණි. කුරල්ගේ තලප්පාව වටා නටමින් ඔහු පිටුපසින් ගමන්කරීම සඳහා හිම බෝල කිහිපයක් මායාවට ලක් කළ වීස්ලි නිවුන්නුන් දඬුවමට ලක්කර තිබිණි. කුණාටුව හරහා ලිපි ගෙන ඒමට සටන් වැදුනු බකමූණන් කිහිප දෙනෙකුට ආපසු පියෑඹීමට පහසු වන තෙක් හැග්‍රිඩ් ප්‍රතිකාර කළේය.

නිවාඩුව ආරම්භ වන්තෙක් රැදී සිටීම සියලු දෙනාට අපහසු විය. ග්‍රිෆින්ඩෝ පොදු කාමරය සහ ප්‍රධාන ශාලාව ගින්නෙන් රත් වී තිබුණත්, සීතල කොරිඩෝ අයිස් මෙන් වී තිබිණ. පංති කාමරවල ජනේල තද සීත සුළඟින් දෙදරන්නට විය. ඒ හැමට වඩා අපහසු වූයේ පහළ බිම්ගෙයි පැවති ප්‍රොෆෙසර් ස්නේප්ගේ පංතියයි. එහිදී ඔවුන්ගේ ප්‍රාශ්වාස වාතය මී දුමක් සේ ඔවුන් ඉදිරිපිටින් ඉහල ගිය අතර සියල්ලෝම පුළුවන් උපරිමයට තම උණුසුම් කල්දේරමට ලං වී සිටියෝය.

"මට හරිම දුකයි" එක් සංයෝජන පංතියකදී ඩ්‍රැකෝ මැල්ෆෝයි කීවේය, "ගෙවල් වලට එයාලව එපා හින්දා නත්තලට හොග්වාර්ට්ස් වල නවතින්න වෙන අය ගැන... ."

ඔහු එය කීවේ හැරී දෙස බලාගෙනය. ක්‍රේබ් සහ ගොයිල් හක හක ගෑවේය. සිංහමාලු කශේරුකා කුඩු කිරමින් සිටි හැරී ඔවුන්ව නොසලකා හැරියේය. කුඩිච් තරඟාවලියෙන් පසු මැල්ෆෝයි හිටියාටත් වඩා තවත් අප්‍රසන්න වී සිටියේය. ස්ලිදරින් කණ්ඩායම පරාජය වීම පිළිකුල් කළ ඔහු ලබන අවුරුද්දේ හැරී වෙනුවට විශාල කටක් ඇති ගස් ගෙම්බෙක් සොයන්නාට දැම්මොත් හොඳයි යැයි කියමින් අන් අය සිනාගැස්සීමට උත්සාහ කළේය. කිසිවෙක් එය විහිලුවක් ලෙස නොසිතූ බව ඔහුට පෙණිනි. මන්ද සියල්ලෝම හැරී තම කොස්ස උඩ රැඳීසිටීමය සටන් කළ අයුරු දැක ඒ ගැන පුදුම වී සිටියෝය. ඒ ගැන කෝපයට සහ ඉරිසියාවට පත් මැල්ෆෝයි හැරීට හරිහමන් පවුලක් නැති එක ගැන ආපසු සමච්චල් කිරීමට පටන් ගත්තේය.

හැරී නත්තලට ප්‍රයිවට් ඩ්‍රයිව් නොයන එක ඇත්තය. සතියකට පෙර ප්‍රොෆෙසර් මැක්ගොනගල් පැමිණ නිවාඩුවට නතර වෙන සිසුන්ගේ නම් ලැයිස්තුවක් හදන විට හැරී දෙවරක් නොසිතා තම නම දුන්නේය. ඔහුට තමා ගැන කණගාටු සිතුනේ නැත. මෙය මෙතෙක් ඔහුට ලැබුනු හොඳම නත්තල වනු ඇත. වීස්ලි යුවල චාලිව බැලීමට රොමේනියාවට යන නිසා රොන් සහ ඔහුගේ සොහොයුරෝ ද නැවතුනෝය.

ඔවුන් සංයෝජන පංතිය ඉවර වී යද්දී කොරිඩෝව හරස් කරමින් විශාල පයිනස් ගසක් විය. එහි පහළින් විශාල පතුල් දෙකක් එළියට එල්ලී තිබූ අතර මහ සද්දෙන් හති දාන හඬ හැග්‍රිඩ් එහි පිටුපස සිටින බව බව කියා පෑවේය.

Downloaded from sinhalaebooks.com

"හායි, හැග්‍රිඩ්, උදව්වක් ඕනෙද?" අතු ඇතුලෙන් හිස දමමින් රොන් ඇසුවේය.

"නෑ, ඒක හරි, ස්තූතියි රොන්."

"පොඩ්ඩක් අහකට වෙන්න පුළුවන්ද?" ඔවුන්ට පිටුපසින් මැල්ෆෝයිගේ සීතල ගෙරවිල්ල ඇසිණි. "ඔයා සල්ලි කීයක් හරි හොයාගන්නද හදන්නේ වීස්ලි? මම හිතන්නේ හොග්වර්ට්ස් වලින් ගියාට පස්සේ ක්‍රීඩාභාරකරු වෙන්න හිතාගෙන ඇතිනේ - ඔයාගේ පවුල ඉන්න තැන එක්ක බැලුවම අර හැග්‍රිඩ්ගේ පැළ මාලිගාවක් වගේනේ."

රොන් මැල්ෆෝයි වෙතට පනිත්ම ස්නේප් පඩිපෙළ නැගගෙන ආවේය.

"වීස්ලී!"

රොන් මැල්ෆෝයිගේ කබාය අත හැරියේය.

"එයාව ඇවිස්සුවා, ප්‍රොෆෙසර් ස්නේප්," ගස පිටුපසින් තම කෙස් සහිත විශාල හිස දමමින් හැග්‍රිඩ් කීවේය. "මැල්ෆෝයි එයාගේ පවුලට අපහාස කරා."

"ඒ කොහොම උනත්, ගහගන්න එක හොග්වර්ට්ස් නීතී වලට විරුද්ධයි හැග්‍රිඩ්," ස්නේප් සියුම් ලෙස කීවේය. "ග්‍රිෆින්ඩෝ වලින් ලකුණු පහක් කපනවා වීස්ලි, සතුටු වෙනවා ඊට වඩා කපපු නැති එකට, අයින් වෙනවා, හැමෝම."

මැල්ෆෝයි, ක්‍රෙබ් සහ ගොයිල් ගහ තල්ලුකර එහි කූරු බිමහලමින් කොක් හඬලා සිනාසෙමින් එතැනින් ඉවත්ව ගියහ.

"මම එයාව අල්ලගන්නම්කෝ," දත්මිටි කමින් රොන් කීවේය., "මේ දවස් වලින් එකකදි, මම එයාව අල්ලගන්නම් - - "

"මට උන් දෙන්නවම පේන්න බෑ," හැරී කීවේය, "මැල්ෆොයිවයි ස්නේප්වයි."

"අයියෝ, ගණන් ගන්න එපා, නත්තලත් හොඳටම ලඟයි," හැග්‍රිඩ් කීවේය. "මම කියන්නම්, යං මාත් එක්ක ප්‍රධාන ශාලාව බලන්න. තැග්ගක් හම්බුනා වගේ තියෙයි."

Downloaded from sinhalaebooks.com

තිදෙනාම හැග්‍රිඞ් සහ ඔහුගේ ගහ පිටුපස ප්‍රධාන ශාලාව දෙසට ගියහ. එහි ප්‍රොෆෙසර් මැක්ගොනගල් සහ ප්‍රොෆෙසර් ෆ්ලිට්වික් නත්තල් සැරසිලි කරමින් සිටියහ.

"ආහ්, හැග්‍රිඞ්, අන්තිම ගහ - ඒක අර ඈත කෙළවරේම තියන්න පුළුවන්ද?"

ශාලාව විශේෂ සිරියක් ගෙන තිබිණි. හෝලි ඉති සහ මිසල්ටෝ බිත්ති පුරා එල්ලා තිබිණි. ශාලාව පුරා විශාල ගස් දොළහක් විය. සමහර ගස් අයිස් කැබලි වලින් දිළිසුන අතර සමහර ඒවා ඉටිපන්දම් සියගණනකින් එළිය වී තිබිණි.

"ඔයාලගේ නිවාඩුවට තව කොච්චර කල් තියනවද?" හැග්‍රිඞ් ඇසුවේය.

"එකයි" හර්මයිනී කීවාය. "ආ ඒ කියන්නේ හැරී රොන් අපිට දවල් කෑමට කලින් පැය භාගයක් තියනවා, අපි පුස්තකාලෙට යන්න ඕනේ."

"ආ ඔව්, ඔයා හරි," තම යශ්ඨිය කෙළවරින් රන්පැහැ බුබුලු මවා ඒවා අලුතින් ගෙනා ගසේ අතුවල එල්ලන ප්‍රොෆෙසර් ෆ්ලිට්වික් ගෙන් ඇස් ඉවතට ගනිමින් රොන් කීවේය.

" පුස්තකාලෙට?" ඔවුන් පසුපස ශාලාවෙන් ඉවතට එමින් හැග්‍රිඞ් කීවේය. "මේ නිවාඩුව ඔන්න මෙන්න තියලා? හරි උනන්දුයිනේ, නේද?"

"ඔහ්, අපි වැඩ කරන්නේ නෑ," හැරී උද්‍යෝගයෙන් කීවේය. "ඔයා නිකොලස් ෆ්ලැමල් ගැන කියපු දවසේ ඉඳලා අපි එයා කවුද කියලා හොයනවා."

"ඔයා මොකක් කරනවා?" හැග්‍රිඞ් ගැස්සුනේය. "මේ අහන්න - මම ඔයාලට කිව්වනේ - ඒක අතාරින්න. ඒ බල්ලා රකින දේ ගැන ඔයාලට වැඩක් නෑ."

"අපිට දැනගන්න ඕනේ නිකොලස් ෆ්ලැමල් කවුද කියලා විතරයි" හර්මයිනී කීවාය.

"ඔයා අපිට ඒක කියලා අපි කරදර වෙන එක නවත්තන්න හිතනවා නම් ඇරෙන්න" හැරී වහා කීවේය "අපි දැනටමත් පොත් සියගානක් බැලුවා. එයා ගැන කොහේවත් නෑ. අපිට පොඩි ඉඟියක් දෙන්න - මම දන්නවා මම කොහේ හරි එයාගේ නම කියෙව්වා."

Downloaded from sinhalaebooks.com

"මම මොකුත් කියන්නේ නෑ." හැග්‍රිඩ් කියුවේය.

"එහෙනම් අපිටම හොයාගන්න වෙනවා," රොන් කීවේය. ඉන්පසු ඔවුන් තරහින් පුපුරන හැග්‍රිඩ් වෙතින් ඉවත්ව පුස්තකාලය වෙත ඉක්මනින් ගමන් කළහ.

හැග්‍රිඩ්ගේ කටින් ෆ්ලැමල්ගේ නම පිටවූ දවසේ සිට ඔවුන් ඔහුව පොත් පුරා සොයමින් සිටියහ. මන්ද ස්නේප් සොරකම් කරන්නට යන දේ කුමක්දැයි සොයාගත හැකි වෙන ක්‍රමයක් ඔවුන්ට නොවීය. ඔවුන්ට තිබූ ගැටලුව වූයේ නිකොලස් ෆ්ලැමල් පොතකට යාමට කලේ කුමක්දැයි නොදන්නා නිසා පටන්ගන්නේ කොහෙන්දැයි නොදැන සිටීමයි. ඔහු විසිවෙනි සියවසේ ශ්‍රේෂ්ඨමායාකරුවෝ පොතේ වත් අපේ කාළයේ ප්‍රකට මායා නාම පොතේවත් හමු වූයේ නැත. වැදගත් නවීන මායා සොයාගැනීම පොතෙන් සහ මායාවේ මෑත කාලීන දියුණුවීම් පිළිබඳ අධ්‍යයනයක් පොතෙන් ද අතුරුදන්ව සිටියේය. ඊලඟට ඇත්තවශයෙන්ම පුස්තකාලෙයේ විශාලත්වය; පොත් දහදාහේ කොටස්; රාක්ක දාහස් ගාණක්; පටු තීරු සිය ගාණක්..

රොන් තෝරාගත් තීරුවක රාක්ක වල වූ පොත් තැනින් තැනින් අදිමින් ඉන්නා අතරේ හමයිනී තමන් බැලීමට තීරණය කළ විෂයන් සහ මාතෘකා ලැයිස්තුවක් ඇදගත්තාය. හැරී තහනම් කළාපය වෙත එබෙමින් සිටියේය. කීප දිනක සිටම ෆ්ලැමල් එහි කොහේ හෝ පොතක සිටීදැයි ඔහු සිතමින් උන්නේය.  අවාසනාවට, තහනම් පොතක් ලබා ගැනීමට ඔබට ගුරුවරයෙක්ගේ අත්සන සහිත විශේෂ සටහනක් අවශ්‍ය වේ. එවැන්නක් තමන්ට කවදාවත් නොලැබෙන බව ඔහු දැන සිටියේය. ඒවායේ වූයේ හොග්වර්ට්ස් වල කවදාවත් උගන්වන්නේ නැති අඳුරු මායාවන් ය. ඒවා කියවන්නේ උසස් සහ ප්‍රභල අඳුරු මායාවන්ට එරෙහි ආරක්ශාව ගැන හදාරන වැඩිහිටිම සිසුන් පමණි.

"මොනාද ළමයෝ ඔයා හොයන්නේ?"

"මොකුත් නෑ," හැරී කීවේය.

පුස්තකාලාධිපතිනිය මැඩම් පින්ස් ඔහුට පිහාටු දූවිලි පිසිනයකින් තට්ටු කළාය.

"එහෙනම් මෙතනින් ගියොත් හොඳයි. යන්න යන්න – එළියට!"

තමන් ඉක්මනින් සිතා කතාවක් ගොතා නොගැනීම ගැන දුක්වෙමින් හැරී පුස්තකාලයෙන් එළියට ගියේය. ඔහු, රොන් සහ හර්මයිනී ෆ්ලැමල් ගැන මැඩම් පින්ස් ගෙන් නොඇසීමට දැනටමත් තීරණය කර තිබිණි. ඇයට ඒ ගැන කිව හැකි බව ඔවුන්ට විශ්වාස උනත් ස්නේප්ට තමන් කරන දේවල් ගැන තොරතුරක් යාමට ඉඩ තැබිය නොහැක.

අනිත් දෙදෙනාට මොනාහරි ලැබුනාදැයි බැලීමට හැරී එළියේ කොරිඩෝවේ රැඳුනේය. නමුත් ඔහුට වැඩි විශ්වාසයක් තිබුණේ නැත.  ඔවුන් සති දෙකක් තිස්සේ බළමින් සිටියහ. පංති අතරතුර ඔවුන්ට වැඩි කාළයක්

Downloaded from sinhalaebooks.com

නොලැබුන නිසා එය පුදුමයක්ද නොවීය. ඔවුන්ට අවශ්‍ය වූයේ මැඩම් පින්ස් බෙල්ල ලඟ හුස්ම ගන්නේ නැතිව නිදහසේ දිගටම සොයා බැලීමකි.

විනාඩි පහකට පසු රොන් සහ හර්මයිනී තම හිස් වනමින් ඔහුට එකතු විය. ඔවුන් දවල් කෑමට ගියෝය.

"මම නැති අතරේ ඔයාලා දිගටම බලනවා නේද?" හර්මයිනී ඇසුවාය. "ඔයාලට මොනාහරි හම්බුනොත් මට බකමූණෙක් එවන්න."

"ඔයාට පුළුවන්නේ ඔයාගේ දෙමාපියන්ගෙන් අහන්න එයාලා ෆ්ලැමල් ගැන දන්නවද කියලා," රොන් කීවේය. "එයාලාගෙන් අහන එක පරිස්සම්."

"හොඳටම පරිස්සම්,.... එයාලා දෙන්නම දත් දොස්තරලා ," හර්මයිනී කීවාය.

නිවාඩුව ආරම්භ වීමත් සමග හැරීට සහ රොන්ට ෆ්ලැමල් ගැන බොහෝ සිතන්නට හොඳ කාළයක් ලැබී තිබිණි. ඔවුන්ගේ නිදන කාමරයේ වූයේ ඔවුන් දෙදෙනා පමණක් වූ අතර පොදු කාමරයද සාමාන්‍ය දිනවලට වඩා බොහෝ දුරට හිස්ව පැවතුනෙන් ගිනි උඳුන අසලම වූ හොඳ අත් පුටුවක් ලබා ගැනීමට දෙදෙනාටම හැකි විය. පැය ගණන් වාඩි වී ගැරුප්පුව ගැසීමට හැකි ඕනෑම දෙයක්, (පාන්, ස්පංචි, මාශ්මෙලෝස්) කමින් දෙදෙනා මැල්ෆෝයිව නෙරපීමට ලක් කිරීමට සැළසුම් හදමින් සිටියෝය. ඒවා ක්‍රියාත්මක කළ නොහැකි තත්වයේ ඒවා වුනත් ඒවා ගැන සාකච්ඡා කිරීමද විනෝදජනක විය.

රොන් හැරීට මායා චෙස් ඉගැන්වීමටද පටන් ගත්තේය. එහි ඉත්තන් පණ ඇති ඒවා වීමට අමතරව එය සම්පූර්ණයෙන්ම මගල් චෙස් මෙන් විය. ඒ නිසාම ඒවා යුද්ධයක වූ ඇත්තම යුධ සෙබලුන් මෙන් පෙණිනි. රොන්ගේ චෙස් ඉත්තන් ඉතා පරණ සහ කඩතොලු වූ ඒවාය.  ඔහුට අයත් හැම දේම මෙන් ඒකත් මුලින්  ඔහුගේ පවුලේ කාටහරි අයත්ව තිබූ එකකි. මෙහිදී ඒ ඔහුගේ සීයායි. කෙසේ උවත් පැරණි චෙස් මිනිසුන් පැකිළනේ නැත. රොන් ඔවුන්ව ඉතා හොඳින් දැන සිටියේ ඔවුන් ලවා තමන්ට අවශ්‍ය දේ කරගැනීමට කිසිම කරදරයක් නොවීය.

සීමස් ෆිනිගන් දුන් චෙස් මිනිසුන් ගෙන් හැරී ක්‍රීඩා කළේය. ඔවුන් හැරීව විශ්වාස කළේම නැත. ඔහු තවමත් දක්ෂ ක්‍රීඩකයෙක් නොවූ නිසාම ඔවුන් නිතරම නොයෙකුත් අවවාද දෙමින් ඔහුට කෑ ගැසුවෝය. එය පැටලිලි සහගත විය.  "මාව එහෙට යවන්න එපා, ඔයාට පේන්නේ නැද්ද එයාගේ නයිට්වරයාව? එයාව යවන්න, එයාව නැති උනාට අපිට පාඩු නෑ."

නත්තල් රෑ හැරී නින්දට ගියේ පසුදින ලැබෙන කෑම සහ විනෝදය ගැන සිතමිනි. නමුත් තෑගි ගැන නම් ඔහු බලාපොරොත්තු උනේම නැත. කොහොම උනත් පසුදා ඔහු උදේම අවදි වූ විට පළමුවෙන්ම ඔහු දුටුවේ ඇඳ පාමුල තිබූ කුඩා පාර්සල් පොදියකි.

Downloaded from sinhalaebooks.com

"සුභ නත්තලක්," හැරී නැගිට තම පිට කබාය අඳිද්දී රොන් නිදිමතේ කීවේය.

"ඔයාටත්," හැරී කීවේය. "මේ බලන්නකෝ? මට තෑගි හම්බවෙලා!"

"ඔයා මොනාද බලාපොරොත්තු උනේ, රාබුද?" රොන් තමන්ගේ පොදිය වෙත යමින් ඇසුවේය. එය හැරීගේ එකට වඩා ගොඩක් ලොකු එකක් විය.

හැරී උඩම තිබූ පාර්සලය අතට ගත්තේය. එය දුඹුරු පාට ඝනකම් කඩදාසියක ඔතා හැරීගේ නම කුරුටු ගෑ ගැග්‍රිඩ්ගෙන් ආ එකකි. එහි ඇතුළත ගොරෝසු ලෙස ලීයෙන් කැපූ බටනළාවක් විය. එය අනිවාර්යයෙන් හැග්‍රිඩ් විසින්ම කපන ලද්දක් විය යුතුය. හැරී එය පිම්බෙන් ඉන් මදක් බකමූණෙක්ගේ වැනි හඬක් නිකුත් විය.

දෙවැනි ඉතා කුඩා පාර්සලය සටහනක් සහිත එකකි.

ඔබේ පණිවිඩය ලැබුනා. මෙහි ඔබගේ නත්තල් තෑග්ග තිබේ. වර්නන් මාමාගෙන් සහ පෙටූනියා නැන්දාගෙන්. සටහනට පැන්ස පනහේ කාසියක් තබා අලවා තිබිනි.

"ඒක හරි හිතවත් විදිහට ලියලානේ," හැරී කීවේය.

රොන් පැන්ස පනහ ගැන බොහෝ උනන්දු විය.

"අමුතුයි!" ඔහු කීවේය. , 'අමුතු හැඩයක්, මේ සල්ලිද?"

"ඔයා ඒක ගන්න," රොන් ඒ ගැන සතුටු වූ ආකාරය දෙස බලා සිනාසෙමින් හැරී කීවේය. "හැග්‍රිඩ්, මගේ නැන්දායි මාමායි ... එතකොට මේක එව්වේ කවුද?"

"මම දන්නවා අරක කාගෙන්ද කියලා" රෝස පාටට හැරෙමින් අපිළිවෙල පාර්සලයකට ඇඟිල්ල දිගු කරමින් රොන් කීවේය. "මගේ අම්මා. මම අම්මට කිව්වා ඔයාට තෑගි එන්නේ නෑ කියලා හිතාගෙන ඉන්නවා කියලා - අයියෝ," ඔහු කෑගැසුවේය, "එයා ඔයාටත් වීස්ලි ජර්සියක් හදලා."

හැරී පාර්සලය ඉරා විවෘත කළෙන් එහි ඝනකම් අතින් ගොතපු එමරල්ඩ් කොළ පැහැ ජර්සියක් සහ විශාල ගෙදර හදපු ෆජ් කේක් පෙට්ටියක් හමුවිය.

Downloaded from sinhalaebooks.com

"හැම අවුරුද්දෙම එයා අපිට ජර්සියක් ගොතනවා" තම පාර්සලය දිගහරිමින් රොන් කීවේය.  "මගේ එක හැමදාම මෙරුන් පාට."

"අනේ එයා කොච්චර හොඳද," හැරී ඉතා රසවත් වූ ෆජ් කේක් කෑල්ලක් රස බළමින් කීවේය.

ඔහුගේ ඊලඟ පාර්සලයේද රස කැවිලි විය. ඒ හර්මයිනී ගෙන් ආ විශාල චොකලට් ගෙම්බන් පෙට්ටියකි.

ඉන්පසු ඉතිරි වූයේ එක් පාර්සලයක් පමණි. හැරී එය ගෙන අතගා බැලුවේය. එය ඉතා සැහැල්ලු විය. ඔහු එය දිග හැරියේය.

දියාරු රිදීමය අළු පැහැ යමක් ලිස්සා පොළොවට වැටිණි. එය පොළොව මත රැළි ගැසී තිබෙන අයුරු දුටු රොන් ගැස්සුනේය.

"මම ඕවා ගැන අහලා තියනවා," ඔහු හර්මයිනීගෙන් ලැබුනු සියලු රස බොංචි පෙට්ටිය අතහරිමින් රහසින් කීවේය. "ඒක මම හිතන දේ නම් - ඒවා ගොඩාක් දුර්ලභයි, ගොඩාක් වටිනවත් එක්ක."

"මොකද්ද ඒක?"

හැරී රිදීපාටින් දිළිසෙන රෙද්ද අහුලාගත්තේය. එය ඉතාමත් අමුතු ලෙස අතට දැනිනි. හරියට වතුරෙන් ගොතපු රෙද්දක් වගෙයි.

"ඒ අදිසි ලෝගුවක්," රොන් විශ්වාසයෙන් කීවේය. "මට විශ්වාසයි ඒ ගැන - ඇඳලා බලන්න."

හැරී එය තම උරහිස් වලින් පන්නද්දීම රොන් හූ තිබ්බේය.

"ඔව් ඒකක් තමා! පල්ලේහා බලන්න!"

හැරී තම කකුල් දෙස බැලූ නමුත් ඒවා තිබුනේ නැත. ඔහු වහා කණ්නාඩිය බැලුවේය. ඔහුගේ ප්‍රතිභිම්බය ලෙස පාවෙන හිස පමණක් දක්නට ලැබිණි. ඔහුගේ සිරුර සම්පූර්ණයෙන්ම අදිසි වී තිබිණි. ඔහු ලෝගුව හිස මතට ඇද්දෙන් ඔහුගේ ප්‍රතිභිම්බය සම්පූර්ණයෙන්ම අතුරුදන් විය.

"අන්න ලියුමක්!" රොන් එක්වරම කීවේය. "ඒකේ තිබිලා ලියුමක් වැටුනා!"

Downloaded from sinhalaebooks.com

ඔහු ලෝගුව ගලවා ලියුම අතට ගත්තේය. එය ඔහු කිසිදින දැක නොතිබූ පටු, වැල් අකුරින් ලියා තිබිණි. 'ඔබේ පියා මියයාමට පෙර මෙය මගේ භාරයේ තබන ලදී. එය ඔබට භාරදීමට මේ සුදුසු කාළයයි. එය හොඳින් පාවිච්චි කරන්න.

ඔබට සුභ නත්තලක් වේවා'

එහි අත්සනක් නොවීය. හැරී ලියුම දෙස බලා සිටියේය. රොන් ලෝගුව අගය කරමින් සිටියේය.

"මම මේකක් වෙනුවෙන් ඕනේ දෙයක් කරනවා," ඔහු කීවේය. "ඕනේම දෙයක්... මොකද්ද ප්‍රශ්ණේ?"

"මොකුත් නෑ" හැරී කීවේය. ඔහුට අමුත්තක් දැණිනි. ලෝගුව එව්වේ කවුද? ඇත්තටම ඒක ඔහුගේ තාත්තාට අයිති වෙලා තිබ්බ එකක්ද?

ඔහු කිසිවක් කීමට හෝ සිතීමට පෙර එක්වරම කාමරයේ දොර ඇරී ෆ්‍රෙඩ් සහ ජෝජ් වීස්ලි ඇතුලට පැන්නෝය. හැරී වහා ලෝගුව නොපෙනෙන තැනකට එබුවේය. ඔහු ඒ ගැන තවත් අය දැනගන්නවාට කැමති වූයේ නැත.

"සුභ නත්තලක්!"

"ඒයි, මේ බලන්න - හැරීටත් වීස්ලි ජර්සියක් හම්බවෙලා!"

ෆ්‍රෙඩ් සහ ජෝජ් දෙදෙනා නිල් පැහැ ජර්සි ඇඳ සිටියෝය. එකක කහපාටින් ලොකු F අකුරකුත් අනිකේ G අකුරකුත් විය.

"හැරීගේ එක අපේ ඒවාට වඩා හොඳයි වගේ" ෆ්‍රෙඩ් හැරීගේ ජර්සිය අතට ගෙන කීවේය. "අනිවාර්යයෙන් ඔයා පවුලේ කෙනෙක් නෙවෙයිනම් එයා ඒකට ගොඩක් මහන්සි වෙනවා."

"ඇයි රොන් ඔයාලා ඒවා ඇඳගත්තේ නැත්තේ?" ජෝජ් ඇසුවේය. "ඉක්මන් කරන්න, ඇඳගන්න, ඒවා ලස්සනයි රස්නෙයි."

"මට මෙරූන් පාට පෙන්නන්න බෑ," එය හිස මතින් දමමින් රොන් කෙඳිරි ගෑවේය.

Downloaded from sinhalaebooks.com

"ඔයාගේ එකේ ලියුමක් තිබ්බෙ නැද්ද," ජෝජ් සැලකිලිමත් වෙමින් ඇසුවේය. "මම හිතන්නේ එයා හිතන්නේ ඔයාට ඔයාගේ නම අමතක වෙන්නේ නෑ කියලා. ඒත් අපි මෝඩ නෑ. අපි දන්නවා අපිට කියන්නේ ෆ්‍රෙඩ් සහ ජෝර්ජ් කියලා."

"මොකක්ද මේ සද්දේ" පර්සි වීස්ලි දරදඬු මුහුනින් යුතුව දොරෙන් ඇතුළට එබුනේය. ඔහු තම පාර්සල් දිගහරිමින් සිටි බව පෙනුනේ ඔහුත් තම අතින් පොඩි වූ ජර්සියක් එල්ලාගෙන ආ නිසයි. ෆ්‍රෙඩ් එය උදුරා ගත්තේය.

"P කියන්නේ ප්‍රිෆෙක්ට්! ඒක ඇඳගන්න පර්සි, ඉක්මන් කරන්න, අපි ඔක්කොම අපේ ඒවා ඇඳලා ඉන්නේ, හැරීටත් එකක් ලැබිලා."

"මට - ඕනේ - නෑ " නිවුන්නු ඔහුගේ කණ්නාඩි කුට්ටම වට්ටමින් ජර්සිය ඔහුගේ හිස මතින් බැස්සවීමට උත්සාහ කරද්දී ඔහු වහා කීවේය.

"එහෙනම් ඔයා අද ශිෂ්‍ය නායකයොත් එක්ක ඉඳගන්නෙත් නෑ," ජෝජ් කීවේය.

"නත්තල් තියෙන්නේ පවුල වෙනුවෙන්."

ඔවුන් පර්සිගේ අත් දෙපසට තදවනසේ ජර්සිය බස්සවා ඔහුව කාමරයෙන් එලියට ඇදගෙන ගියහ.

හැරී පොටර් සහ මායා පාශාණය - 53 කොටස

හැරිගේ මුළු ජීවිතේටම එවැනි නත්තල් රෑ කෑමක් ලැබී තිබුනේ නැත. රෝස් කළ මහත කළුකුමන් සීයක්, තම්බපු සහ රෝස් කළ අර්තාපල්, සොසේජස් දීසි, බටර් යෙදූ බෝංචි බඳුන්, හොඳ උකු සහ රසවත් ක්‍රැන්බෙරි සෝස් දැමූ රිදී බෝට්ටු - සහ මේසය අසල අඩියෙන් අඩියට වූ මායාවරුන්ගේ බොන් බොන් ගොඩවල් වලින් සාදය රසවත් සහ විනෝදමත් වී තිබිණි. මේ අනර්ඝ තෑගි ඩර්ස්ලිවරු හැමවිටම මිලදී ගත් ඇතුලට ඔවුන්ගේ කුඩා ප්ලාස්ටික් සෙල්ලම්බඩු සහ ඔවුන්ගේ දුහුල් කඩදාසි තොප්පි රිංගවා එන දුර්වල මගල් බොන් බොන් මෙන් නොවීය. හැරී ෆ්‍රෙඩ් සමග එක් වී මායාවරුන්ගේ බොන් බොන් එකක් දෙපසට ඇද්දේය. එය නිකම්ම පිපිරුනේ නැත. එය කාළතුවක්කු හඬක් මෙන් මහ හඬින් පිපිරී ඔවුන් සියල්ලන්ම නිල් පැහැ දුමාරයකින් වැසී ගියේය. ඒ අතරේ ඇතුළතින් පණ ඇති සුදු මීයන් කීපදෙනෙක් සහ රියර් අද්මිරාල් තොප්පියක් එළියට විසිවිය. ඉහළ තිබූ ප්‍රධාන මේසයේ උන් ඩම්බල්ඩෝ තම උල් මායා තොප්පිය වෙනුවට මලින් ගැවසීගත් රවුම් තොප්පියක් පැළඳ ප්‍රොෆෙසර් ෆ්ලිට්වික් විසින් කියවූ විහිලුවකට සතුටින් සිනාසෙමින් සිටියේය.

කළුකුම් මස් වලට පසු උණු උණු නත්තල් පුඩිම් පැමිණියේය. තම පුඩිම් කෑල්ලේ තිබූ රිදී සිකල් එකක් හැපී පර්සිගේ දත් යන්තම් නොකැඩී බේරිණි. හැග්‍රිඩ් වයින් බොන ප්‍රමාණය වැඩි වෙත්ම ටිකෙන් ටික රතු වෙනු හැරී දුටුවේය. අන්තිමේ ඔහු ප්‍රොෆෙසර් මැක්ගොනගල්ගේ කම්මුල සිපගත්තේ, හැරීගේ පුදුමයට ඇ සිනා සී මුහුණ රතු කරගත්තාය, ඇගේ තොප්පිය පසෙකට ඇළ විය.

Downloaded from sinhalaebooks.com

අවසානයේ හැරී මේසයෙන් නැගිට යනවිට බොන් බොන් වලට අමතරව බොහෝ දේ වලින් අත් බරවී තිබිණි. එහි පුපුරන්නේ නැති ලූමිනස් බැලුන් මිටියක්, තමන්ටම ඉන්නෙක් වවාගන්නා කට්ටලයක්, සහ ඔහුගේ අලුත්ම චෙස් කට්ටලය විය. සුදුපාට මීයන් අතුරුදන් වී සිටියෙන් උන් නොරිස් මහත්මියගේ නත්තල් කෑම බවට පත්වේ යැයි හැරීට හැඟිනි.

හැරී සහ වීස්ලි සොයුරන් මුළු හැන්දෑවම පිට්ටනියේ හිමබෝල ගසාගනිමින් සතුටින් ගත කළහ. ඉන්පසු සීතලේ තෙමීගෙන, හුස්ම අල්ලමින් ඔවුන් ග්‍රිෆින්ඩෝර් පොදු කාමරයේ ගිණි උඳුන වෙත ආවෝය. එහිදී හැරී තම චෙස් කුට්ටම විවෘත කළෙන් පළමුවරම රොන්ට විශිෂ්ඨ ලෙස පැරදුනේය. ඔහු සැක කලේ පර්සි තමන්ට එතරම් උදවු කිරීමට ඉදිරිපත් නොවුනානම් ඒ තරම් නරක විදිහට පැරදෙන්නේ නොමැති බවයි.

කලුකුම් සැන්ඩ්විච්, ක්‍රම්පෙට්, ට්‍රයිෆල් සහ ක්‍රිස්මස් කේක් වලින් සමන්විත ආහාර වේලකට පසු ඔවුන් ඕනෑවටත් වඩා බඩ පිරී නිදිමත වූයෙන් පර්සි තම ශිෂ්‍ය නායක බැජ් එක හොරකම් කල ෆ්‍රෙඩ් සහ ජෝජ් පසුපස ග්‍රිෆින්ඩෝර් කුළුණ පුරා පන්නනු බලනවා හැරෙන්නට වෙන යමක් කළ නොහැකි විය.

එය හැරී ලද හොඳම නත්තල් දිනය විය. නමුත් දවස පුරාම යමක් ඔහුගේ මනසේ හොල්මන් කළේය. ඔහු තම ඇඳට ගිය පසු ඒ ගැන සිතීමට නිදහස තිබිණ. අදිසි ලෝගුව සහ එය එව්වේ කවුද.

රොන්, කේක් සහ කලුකුම් මසින් කුස පිරී කරදර කරන්නට කිසිම අද්භූත සිතිවිල්ලක් නොමැති වූයේ තම පෝස්ටර් හතරේ කර්ටන් එක පහත දැමූ විගස නින්දට වැටුනේය. හැරී ඇඳේ පැත්තකින් පහළට නැවී යට තිබූ ලෝගුව එළියට ගත්තේය.

ඔහුගේ තාත්තාගේ.... මෙය ඔහුගේ තාත්තාට අයිතිව තිබූ එකකි. ඔහු තම අත දිගේ ලෝගුව ලිස්සා යාමට ඉඩ හැරියේය. සිල්ක් වලටත් වඩා සිනිඳුයි, සුළඟටත් වඩා සැහැල්ලුයි. එය හොඳින් පාවිච්චි කරන්න. ලියුමේ තිබුනේ එහෙමයි.

ඔහුට එය ඇඳ බැලීමට අවශ්‍ය විය. ඔහු සෙමින් ඇඳෙන් බැස ලෝගුව තමා වටා ඔතාගත්තේය. තම කකුල් දෙස බිම බැලූවිට සෙවණලි සහ සඳ එළිය පමණක් දක්නට ලැබිණි. එය විකාර විදිහේ හැඟීමක් ඇති කළේය..

එය හොඳින් පාවිච්චි කරන්න.

එක්වරම තමා හොඳින්ම අවදි වූවාක් වැනි හැඟීමක් හැරීට දැනිණි. මේ ලෝගුව තුල තමාට මුළු හොග්වර්ට්ස් පාසලම විවෘත වී තිබේ. අඳුර තුළ නිහඬව සිටගෙන සිටි හැරීගේ සිත උද්‍යෝගයෙන් පිරී ගියේය. ලෝගුව තුල ඔහුට ඕනෑම තැනක ගිය හැකි, ඕනෙම තැනකට, ෆ්ලිච් කවදාවත් දැනගන්නේ නෑ.

Downloaded from sinhalaebooks.com

රොන් නින්දෙන් ගෙරෙව්වේය. හැරී ඔහුව අවදි කළ යුතුද? යමක් ඔහුව ඉන් වැළැක්විය -- ඔහුගේ තාත්තාගේ ලෝගුව - ඔහුට දැනුනේ මේ වතාවේදී - මුල් වරට - ඔහුට එය තනිව පාවිච්චි කිරීමට අවශ්‍ය විය.

ඔහු රහසින් කාමරයෙන් එළියටත් පඩිපෙළ පහලටත් පොදු කාමරය හරහාත් ගොස් පිංතූරය පිටුපස ගුලට රිංගුවේය.

"කවුද ඔතන?" මහත කාන්තාව ඇසුවාය. හැරී කිසිවක් කීවේ නැත. ඔහු වහ වහා කොරිඩෝව පහළට ඇවිද ගියේය.

කොහේටද ඔහු යා යුත්තේ? ඔහු නැවතුනේය, ඔහුගේ හදවත වේගෙන් ගැහෙයි, ඔහු මදක් සිතුවේය. ඉන්පසු ඔහුට අදහසක් ආවේය. පුස්තකාළයේ තහනම් කොටස. ඔහුට කැමති තරම් වෙලා කියවිය හැකිය. ෆ්ලැමල් යනු කවුදැයි සොයාගන්නා තෙක් කියවිය හැකිය. තම ඇඟ වටා අදිසි ලෝගුව තදින් ඔතාගනිමින් ඔහු ගමන ආරම්භ කළේය.

පුස්තකාළය ඝන අඳුරින් පිරී අද්භූත භයානක බවකින් පිරී තිබිණි. හැරී පොත් රාක්ක අතරින් යන අතරේ ලාම්පුවක් පත්තු කරගත්තේය. ලාම්පුව පෙනුනේ වාතය තුළ පාවෙන්නාක් මෙනි. එය තම අතින් අල්ලාගෙන ඉන්න බව හැරීට දැනුනත් එය පෙනුනේ භයානක ලෙසයි.

තහනම් කොටස තිබුනේ පුස්තකාළයේ පිටුපස කොටසේයි. එය පුස්තකාළයේ ඉතිරි කොටසින් වෙන් කළ ලණුව උඩින් පරිස්සමින් පනිමින් ඔහු මාතෘකා කියවීමට තම ලාම්පුව එසවූයේය.

ඒවායින් වැඩි යමක් කියවුනේ නැත. ඒවායේ පොතු ගැලවෙන බොඳවුනු රන්පැහැ අකුරු වලින් කියවුනේ හැරීට නොතේරෙන භාෂාවකි. සමහර ඒවාට මතෘකාවක් තිබුනේම නැත. එක පොතක කළු පැහැ පැල්ලමක් තිබුනේ එය ලේ මෙන් භයානක පෙනුමක් දුන්නේය. හැරීගේ බෙල්ල පිටුපස කෙස් ඉලිප්පුනේය. සමහර විට ඔහු එය මවා ගත්තා විය හැක, එහෙම නැතිවෙන්නත් පුළුවන්, නමුත් පොත්වලින් සිහිනැතිවෙන තරමේ කෙඳිරිල්ලක් ආවේ හරියට ඒවා මෙහි නොසිටිය යුතු අයෙක් සිටින බව දැනගත්තාක් මෙනි.

ඔහු කොහෙන් හෝ පටන්ගත යුතුය. ලාම්පුව පරිස්සමින් බිම තැබූ ඔහු පහළම රාක්කයේ සිත්ගන්නා සුලු පොතක් සෙව්වේය. විශාල කළු සහ රිදී පැහැ පොතක් ඔහුගේ ඇස ගැටුනි. එහි බර නිසාම ඔහු අමාරුවෙන් එය එළියට ඇද්දේය. එය තම දණහිස මත සමබර කරමින් විවෘත කළේය.

ඇඟට කිඳාබහින, ලේ සලිත වන කෑගැසිල්ලක් විසින් නිශ්ශබ්දතාවය බින්දේය. - පොත හූ තියන්නට පටන්ගෙන තිබේ! හැරී වහා පොත වැසුවේය නමුත් වේදනාවෙන් කරන කෑගැසිල්ල නැවතුනේ නැත. එය ශබ්දය වැඩි වෙමින් නොකැඩෙන කන් අඩි පුපුරන තරමේ ස්වරයකට ආවේය. හැරී පස්සට විසි වූයෙන් ලාම්පුවේ හැප්පුනෙන් එය වහා නිවී ගියේය. බයෙන් සලිත වූ ඔහුට එළියේ කොරිඩෝව දිගේ එන අඩි හඬක් ඇසිණි. ලතෝනි දෙන පොත රාක්කය තුළට එබූ ඔහු ඒ පැත්තට දිව්වේය. ඔහු දොර ලඟදී ෆ්ලිච්ව පසු කළේය. ෆ්ලිච්ගේ පළල් සුදුමැලි ඇස් ඔහු

Downloaded from sinhalaebooks.com

දෙසම බැලුවේය. ඔහු දිගුකළ අත යටින් රිංගු හැරී කොරිඩෝව දිගේ ගමන් කළේය. පොතේ අදෝනාව තවමත් ඔහුගේ කන් තුළ රැව් දුන්නේය.

ඔහු එක්වරම උස් සන්නාහ ඇඳුමක් අසල නතර විය. ඔහු පුස්තකාළයෙන් ඈතට යාමක් ගැන සිතුවා මිස යන්නේ කොහිදැයි සිතුවේ නැත. අඳුර නිසාම තමන් ඉන්නේ කොහිදැයි ඔහුට අඳුනාගත නොහකි විය. කුස්සිය ලඟ සන්නාහ ඇඳුමක් තිබිණි. ඔහු එය දැන සිටියත් ඔහු ඊට තට්ටු පහක් ඉහලින් සිටිනවා විය හැක.

" ප්‍රොෆෙසර්, කවුරු හරි රෑ තිස්සේ හැමතැනම ඇවිදිනවානම් හරි කවුරු හරි පුස්තකාළේ තහනම් කොටසට ගියොත් හරි කෙළින්ම ඔබතුමා ලඟට එන්න කියලානේ ඔබතුමා මට කිව්වේ."

හැරීට තම මූනේ ලේ හිඳෙනු දැනිනි. හැරී සිටින්නේ කොහේ උනත් ෆ්ලිච් එතනට එන්නට කෙටි පාරක් දැන සිටින්නට ඇත. මන්ද ඔහුගේ සිනිඳු වේගවත් කටහඬ ලංලංව ඇසෙන්නට විය. ඔහුගේ භීතිය වැඩි කරමින් ඊට පිළිතුරු දුන්නේ ස්නේප් ය.  "තහනම් කොටසේ? හොඳයි, එයාලා වැඩි ඈතක වෙන්න බෑ, අපි අල්ලගමු."

ඉදිරිපස කෙළවරෙන් ස්නේප් සහ ෆ්ලිච් මතු වත්ම හැරී සිටි තැනම මුල් ඇද මෙන් නොසෙල්වී සිටියේය. අනිවාර්යයෙන්  ඔවුන්ට හැරීව පෙනුනේ නැත. නමුත් එය ඉතා පටු කොරිඩෝවක් වූයෙන් ඔවුන් ලඟටම ආවොත් ඇඟේ හැපීමට ඉඩ තිබේ. ලෝගුවට ඔහුව අතුරුදන් කළ නොහැක.

ඔහු පුළුවන් තරම් නිහඬව පස්සෙන් පස්සට ගියේය. ඔහුගේ වම් පසින් දොරක් යන්තමට විවෘත වී තිබිනි. එය ඔහුගේ එකම බලාපොරොත්තුව වූයෙන් ඔහු හුස්ම තද කරගෙන දොර නොසෙල්වෙන සේ හෙමීට ඇතුළට මිරිකී රිංගාගත්තේය. ඔහුගේ සැනසිල්ලට ඔවුන් කිසිවක් දකින්නට පෙර ඔහුට දොරෙන් ඇතුල් වන්නට හැකි විය. ඔවුන් හැරීව පසු කරගෙන කෙළින්ම ඇවිද ගියහ. හැරී බිත්තියට හේත්තු වී තදින් හුස්ම ගනිමින් ඔවුන්ගේ අඩි හඬ මැකී යනු අසා සිටියේය. ඔහු බේරුනේ නූලෙනි. ඔහු හැංගුන කාමරය කුමක්දැයි දැකීමට තවත් තප්පර ගණනක් ගත විය.

එය අමුතු පංති කාමරයක් මෙන් විය. අමුතු හැඩයේ පුටු සහ මේස බිත්තිය අසල ගොඩ ගසා තිබිණි. එහි පිරී ඉතිරෙන පාවිච්චි කළ කඩදාසි කූඩයක්ද විය. නමුත් එහි නොතිබිය යුත්තක් මෙන් පෙනෙන යමක් ඔහු දෙසට හරවා බිත්තියට හේත්තු කර තිබිණි. එය ඇත්කිරීමට අවශ්‍ය නිසා කවුරුන් හෝ  එහි තැබුවාක් මෙන් පෙනෙන යමක් විය.

එය මහානර්ඝ කණ්නාඩියක් විය. එය සිවිළිම තරම්ම උස් වූ අතර මෝස්තර ඇමූ රන් රාමුවකින් වට වී කුරුළු කකුල් දෙකක් මත සිටුවා තිබිණි. එහි ඉහල වාක්‍යක් කොටා තිබිණි. යිව ශාආතේව දහබේඔ වනොණ හුමූ බේඔනේ න්වන් පෙමම... ස්නේප්ගේ සහ ෆ්ලිච්ගේ ශබ්දය මැකී ගියෙන් හැරීගේ බය  සෙමින් හිතෙන් දිය වී ගියේය. හැරී තමා දෙස බැලීමට කණ්නාඩිය වෙත ලං විය. නමුත් කිසිම ප්‍රතිබිම්බයක් නොවීය. ඔහු ඒ ඉදිරිපිට හිට ගත්තේය.

Downloaded from sinhalaebooks.com

ඔහු කෑ ගැසීම වළක්වා ගැනීමට අතින් කට වසා ගත්තේය. ඔහු වහා හැරුනේය. පොත කෑ ගසද්දී බය දැනුන වෙලේටත් වඩා වේගයෙන් ඔහුගේ හදවත් ගැහෙන්නට පටන් ගත්තේය. මන්ද ඔහු කණ්නාඩියෙන් දුටුවේ ඔහු පමණක් නොව, ලොකු සෙනගක් ඔහු පිටුපස සිටගෙන සිටී.

නමුත් කාමරය හිස් ය. වේගයෙන් හුස්ම ගනිමින් ඔහු අපසු සෙමින් කණ්නාඩිය වෙත හැරුනේය.

මෙන්න ඔහුගේ සුදුමැලි බය වූ ප්‍රතිභිම්බය සහ ඊට පිටුපසින් මිනිසුන් දහදෙනෙක් වත් විය. හැරී තම උරහිසට උඩින් පිටුපස බැලුවත් එහි කිසිවෙක් නොවීය. ඔවුනුත් අදිසි වී සිටීද? එහෙමත් නැත්තන් ඔහු අදිසි මිනිසුන් පිරි කාමරයක ඉන්නවා වත්ද. මේ කණනාඩිය අදිසි වුවත් නැතත් ඔවුන්ගේ ප්‍රතිබිම්භය  පෙන්වනවා විය හැක.

ඔහු නැවත කණ්නාඩිය දෙස බැලුවේය. ඔහුට පිටුපසින් සිටගෙන සිටි කාන්තාව ඔහු සමග සිනාසී අත වැනුවාය. ඔහු පිටුපසට අත දිගුකළත් වාතය පමණක් අතට දැණුනි. ඇය ඇත්තටම එහි සිටී නම් ඔහුට ඇව ඇල්ලිය හැකිය. ඔවුන්ගේ ප්‍රතිබිම්භ ඔහුට ඉතා ලඟින් තිබුනත් ඔහුට ඔවුන්ව අතට අසු වුනේ නැත. ඇය සහ අනිත් අය සිටියේ කණ්නාඩියේ පමණි.

ඇය ඉතා සුන්දර කාන්තාවක් වූවාය. ඇට තද රතු කෙස් ද ඇගේ ඇස්... ඇගේ ඇස් මගේ වගේමයි, වීදුරුවට ඉතා ලංව බලා හැරී සිතුවේය.  දීප්තිමත් කොළ පැහැ - හරියටම එකම හැඩය, නමුත් ඉන්පසු ඔහු දුටුවේ ඈ අඩන බවයි. ඈ සිනාසෙමින් සිටියත් ඒත් සමගම අඩයි. ඈ ලඟම සිටි උස, කෙට්ටු, කළු හිසකේ ඇති මිනිසා තම අත ඇගේ උරහිස වටා දැම්මේය. ඔහු කණ්නාඩි පැළඳ සිටි අතට ඔහුගේ හිසකෙස් බොහෝ අවුල් වී තිබිණ. හැරීගේ මෙන් පිටුපස කෙස් ඉහළට එසවී තිබිණි.

හැරී කණ්නාඩියට පුළුවන් තරම් ළං වූයේ ඔහුගේ නාසය තම ප්‍රතිබිම්භයේ ගැවෙන නොගැවෙන තරම් විය.

"අම්මේ?" ඔහු කෙඳිරුවේය.  "තාත්තේ?"

ඔවුන් සිනාසෙමින් හැරී දෙස බැලුහ. හැරී සෙමින් අනෙක් මිනිසුන් දෙසත් බැලූවෙන් තමන්ගේ මෙන් කොළ පැහැ ඇස් ඇති අය දුටුවේය, තමන්ගේ මෙන් නාස් දුටුවේය.,  හැරීගේ මෙන් ගෙඩි ගැසුනු දණහිස් ඇති කුඩා මිනිසෙකුද විය. ජීවිතේ පළමු වතාවට හැරී තම පවුල දෙස බලාගෙන සිටී.

පොටර්වරු ඔහුත් සමග සිනාසෙමින් අත් වැනූ අතර හැරී ආසාවෙන් ඔවුන් දෙස බලා සිටියේය. ඔහුගේ අත් වීදුරුවට තද වූයේ ඇතුලට පැන ඔවින් වෙත යාමට උත්සාහ කරන්නාක් මෙනි. ඔහු ඇතුලාන්තයෙන් දැවුනේය. අඩක් සතුටින්, අඩක් මහා දුකකින් ඔහුගේ සිත පිරී තිබිණි.

ඔහු කොපමණ වෙලා එහි සිටගෙන සිටියාදැයි ඔහු නොදත්තේය. එහි වූ ප්‍රතිබිම්භය බොඳ වූයේ නැත. එහි අහල පහල වූ ශබ්දයක් විසින් ඔහුගේ දැහැන බිඳ දැම්මේය. ඔහුට මෙහි රැඳී සිටිය නොහැක. ඔහු ආපසු ඇඳට යාමට පාර

Downloaded from sinhalaebooks.com

සොයාගත යුතුය. ඔහු තම මවගේ මුහුනෙන් ඇස් ඉවතට ගත්තේ, "මම ආපහු එන්නම්" යැයි කොඳුරා වහා කාමරයෙන් එළියට ගියේය.

"ඔයාට තිබ්බා මාව ඇහැරවන්න," රොන් නෝක්කාඩු කීවේය.

"ඔයාට අද රෑට එන්න පුළුවන්, මම ආපහු යනවා, මට ඔයාටත් කණ්නාඩිය පෙන්වන්න ඕනේ."

"මමත් ආසයි ඔයාගේ අම්මයි තාත්තයි බලන්න," රොන් ආසාවෙන් කීවේය.

"මටත් ඕනේ ඔයාගේ පවුලේ ඔක්කොමලාව බලන්න. ඔක්කොම වීස්ලිලාව, ඔයාට පුළුවන් වෙයි මට ඔයාගේ අනිත් අයියලාවයි හැමෝමව පෙන්වන්න."

"ඔයාට එයාලව ඕනේ වෙලාවක් බලන්න පුළුවන්," රොන් කීවේය. "මේ පාර සමර් වලට අපේ ගෙදර එන්න. ඒක නෙවෙයි, සමහර විට ඒකෙන් පේන්නේ මැරුණු මිනිස්සු විතරක් වෙන්න පුළුවන්. ෆ්ලැමල් ගැන හොයාගන්න බැරි උන එක අපරාදේ, මේ බේකන් හරි මොනාහරි කන්න. ඇයි ඔයා මොකුත් කන්නේ නැත්තේ?"

හැරීට කන්නත් බැරිය. ඔහු තමන්ගේ දෙමාපියන් දුටුවේය, අද රෑටත් ආපසු දකිනු ඇත. ඔහුට ෆ්ලැමල් ගැන අමතක විය. තවදුරටත් එය වැදගත් නොවීය. ඔලු තුනේ බල්ලා රකින්නේ මොනාද කියලා කාටද වැදගත්? ඒක ස්නේප් හොරකම් කරත් මොකද, ඇත්තටම?

"ඔයා හොඳින්ද?" රොන් ඇසුවේය. "ඔයා අමුතුයි"

හැරී බය වූයේ නැවත කණ්නාඩිය තිබූ කාමරය හොයාගන්නට බැරි වෙයි යන සිතුවිල්ලටයි. රොන්වත් ලෝගුව ඇතුලට ගත්තම අද රෑට තවත් හෙමින් ගමන් කරන්නට සිදුවෙයි.

ඔවුන් පුස්තකාළයේ සිට හැරී ගමන් කළ මග අනුව කළුවර පටු කොරිඩෝ දිගේ සොයන්නට උත්සාහ කරමින් පැයක් පමණ ගත කළහ.

"මාව සීතලේ ගල් වෙනවා," රොන් කීවේය. "ඒක අමතක කරලා ආපහු යමු."

"බෑ" හැරී තරහින් කීවේය. "මම දන්නවා ඒක මේ කොහේහරි තියනවා."

Downloaded from sinhalaebooks.com

ඔවුන් විරුද්ධ පැත්තට යන උස මායාකරියකගේ අවතාරයක් පසු කළත් වෙන කිසිවෙක් දක්නට නොලැබිණි. රොන් තම යටිපතුල් සීතලට මැරිලා යැයි කියමින් අඳෝනා තියන්නට පටන් ගත් සැටියේ හැරී සන්නාහ ඇඳුම දුටුවේය.

"ඒක මෙතන- මේ මෙතන - ඔව්!"

ඔවුන් දොර තල්ලු කර ඇතුල් වූහ. හැරී ලෝගුව උරහිසෙන් පන්නා බිම අතහැර කණ්නාඩිය වෙත දිව්වේය.

ඔවුන් එහි සිටී. ඔහුගේ මව සහ පියා ඔහු ඉදිරිපිට බැබලෙමින් සිටී.

"මේ බලන්න?" හැරී කෙඳිරුවේය.

"මට මොකුත් පේන්නේ නෑ."

"බලන්න! එයාලා ඔක්කොම දිහා බලන්න ... එයාලා ගොඩක් ඉන්නවා...."

"මට පේන්නේ ඔයා විතරයි."

"හරියට බලන්න, කෝ මෙහේ එන්න, මම හිටපු තැන හිටගන්න."

හැරී අහකට උනේය. නමුත් රොන් ඉදිරියෙන් ඉන්නා විට ඔහුට ත්වදුරටත් තම පවුල පෙනුනේ නැත. එහි වූයේ පිජාමා ඇඳුම ඇඳි රොන් පමණි.

අනික් අතට රොන්, තම පිලිඹුව දෙස ගල් ගැසී බලා සිටී.

"මං දිහා බලන්න!" ඔහු කීවේය.

"ඔයාට පේනවද ඔයාගේ මුළු පවුලම ඔයා වටේ හිටගෙන ඉන්නවා?"

"නෑ - මම තනියම - ඒත් මම වෙනස් - මම ලොකුයි - අනික මම ප්‍රධාන ශිෂ්‍ය නායකයා!"

Downloaded from sinhalaebooks.com

"මොකක්?"

"මම - මම බිල්ට තිබුනා වගේ බැජ් එකක් ගහලා ඉන්නේ - මම නිවාස කුසලානේයි කුඩිච් කුසලානෙයි අල්ලගෙන ඉන්නේ  - කුඩිච් නායකයත් මම.

රොන් තම විශිෂ්ඨ දර්ශණයෙන් ඇස් ගලවා ගෙන උද්ධාමයෙන් හැරී දෙස බැලුවේය.

"ඔයා හිතනවද මේ කණ්නාඩිය අනාගතේ පෙන්වනවා කියලා?"

"එහෙම වෙන්නේ කොහොමද? මගේ පවුලේ ඔක්කොම මැරිලා - ඉන්න මම ආපහු බලන්න- - "

"ඔයාට ඊයේ මුළු රෑම තිබ්බේ, මට තව ටික වෙලාවක් ඉන්න දෙන්න."

"ඔයා කුඩිච් කුසලානේ අල්ලගෙන ඉන්නවා විතරනේ, ඒකේ මොනාද බලන්න තියෙන්නේ? මට මගේ දෙමවුපියෝ බලන්න ඕනේ."

"මාව තල්ලු කරන්න එපා - - "

එළියේ කොරිඩෝවෙන් එක්වරම ආ ශබ්දයක් විසින් ඔවුන්ගේ සාකච්ඡාව නවත්වන ලදී. ඔවුන් කොතරම් ස්ද්දෙන් කතාකරා දැයි දෙදෙනාම දැන සිටියේ නැත.

"ඉක්මන් කරන්න!"

දොර ලඟින් ඩොරිස් මහත්මියගේ ලූමිනස් පාට ඇස් මතු වෙද්දී රොන් ලෝගුව ඔවුන් වටා දමාගෙන ඉවර විය. රොන් සහ හැරී නිහඬව නොසෙල්වී සිටගෙන සිටියහ. දෙදෙනාම සිතුවේ එකම දෙයයි. - ලෝගුව පූසන්ටත් වැඩ කරනවාද? බොහෝ කාළයකට පසු ඌ හැරී කාමරයෙන් ඉවත් විය.

"මේක එච්චර හොඳ නෑ - ඌ ෆ්ලිච්ච හොයාගෙන ගියා වෙන්න පුළුවන්, ඔට්ටුයි ඌට අපිව ඇහුනා, ඉක්මනට යමු."

Downloaded from sinhalaebooks.com

රොන් හැරීව කාමරයෙන් ඉවතට ඇද්දේය.

ඊලඟ උදෑසන වන විට තවමත් හිම දියවී තිබුනේ නැත.

"හැරී චෙස් සෙල්ලම් කරමුද?" රොන් කීවේය.

"බෑ."

"අපි පල්ලෙහාට යමුකෝ හැග්‍රිඩ්ව බලන්න?"

"බෑ ... ඔයා යන්න..."

"මම දන්නවා ඔයා මොනා ගැනද හිතන්නේ කියලා හැරී. අර කණ්නාඩිය ගැනනේ. ආපහු අද රෑට යන්න එපා ."

"ඇයි ඒ?"

"මම දන්නේ නෑ, මට ඒක ගැන මහ නරක අදහසක් ආවේ. අනික දැනටමත් ඔයා කී පාරක් යන්තම් බේරුනාද. ෆ්ලිච්, ස්නේප් නොරිස් මහත්මිය හැම තැනම යනවා. ඉතිං එයාලා ඔයාව දකින්නේ නැතිව ඇවිල්ලා ඔයාගේ ඇඟේ හැප්පුනොත් මොකද වෙන්නේ? ඔයා ගිහින් මොකේක හරි හැප්පුනොත් මොකද වෙන්නේ?"

"ඔයා හරියට හර්මයිනී වගේනේ කතා කරන්නේ."

"මම විහිලු කරනවා නෙවෙයි හැරී, යන්න එපා."

නමුත් හැරීගේ සිතේ තිබුනේ එකම එක අදහසක් පමණි. ඒ ආපසු කණ්නාඩිය වෙත යන බවත් රොන්ට එය වැළක්විය නොහැකි බවත් පමණි.

එම තුන්වෙනි දිනයේ ඔහු පෙරදිනට වඩා ඉක්මනින් පාර හොයාගත්තේය. ඔහු කොපමණ වේගයෙන් ගියේද කිවහොත් ඔහු හඬ නගමින් ගමන් කළේය. නමුත් ඔහුට කිසිවෙක් මුණ ගැසුනේ නැත.

Downloaded from sinhalaebooks.com

එහිදී ඔහුට නැවතත් තමා සමග සිනාසෙන තම මව සහ පියා මුණ ගැසිනි. ඔහුගේ එක් සීයා කෙනෙක් සතුටින් හිස වැනුවේය. හැරී කණ්නාඩිය ඉදිරිපස බිම වාඩිවිය. ඔහුට මෙහි තම පවුල සමග සිටීම වළක්වන්නට කිසිවක් නොවීය. කිසිවක්ම නොවීය.

එකක් හැර --

"ඉතිං හැරී -ආපහු ආවද?"

හැරීට තම ඇතුලාන්තයම අයිස් වලට පත්වෙනවාක් මෙන් දැනුනි. ඔහු පිටුපස බැලුවේය. බිත්තිය අසල වූ බංකුවක ඉඳගෙන සිටියේ වෙන කිසිවෙකුත් නොව ඇල්බස් ඩම්බල්ඩෝ ය. හැරී ඔහු ලඟින්ම ඔහුව පහු කරගෙන ආවා විය හැක. කණ්නාඩිය ළඟට යෑමේ නොයිවසිල්ලෙන් ආ නිසා හැරී ඔහුව දැක්කේ නැත.

"මම  ඔයාව දැක්කේ නෑ සර්."

"තමන්ගේ ලඟම ඉන්න කෙනෙක් නොපෙනෙන එකත් අමුතුයි," ඩම්බල්ඩෝ කීවේය. හැරීගේ සැනසිල්ලට ඔහු සිනා සුනේය.

"ඉතිං," මේසයෙන් බැස විත් හැරී ලඟ බිම ඉඳගනිමින් ඔහු කීවේය.  "ඔයත්, මීට කලින් මේ වශාආ කණ්නාඩියේ සතුට ලබපු සිය ගාණක් වගේ." (mirrior of Erised. Erised යනු Desire යන්න අග සිට මුළට කියවීමෙන් ලැබෙන වචනයක් මිස ඊට තේරුමක් නැත. Desire යනු ආශාවයි.)

"මම ඒකේ නම ඒ විදිහයි කියලා දැනගෙන හිටියේ නෑ සර්."

"ඒත් මම හිතනවා ඒකෙන් වෙන්නේ මොකද්ද කියලා ඔයා මේ වෙනකොට දැනගෙන ඇති?"

"ඒක - මේ - ඒක මට මගේ පවුල පෙන්වනවා "

"එතකොට ඒක ඔයාගේ යාලුවා රොන්ට පෙන්වනවා එයා ශිෂ්‍ය නායකයා වෙලා ඉන්නවා."

"ඔයා කොහොමද දන්නේ --?"

Downloaded from sinhalaebooks.com

" මට අදිසි වෙන්න ලෝගුවක් ඕනේ වෙන්නේ නෑ," ඩම්බල්ඩෝ කරුණාවෙන් කීවේය. "දැන් ඔයාට හිතන්න පුළුවන්ද වශාආ කණ්නාඩිය අපි හැමෝටම පෙන්වන්නේ මොනාද කියලා?"

හැරී හිස වැනුවේය.

" මම පැහැදිලි කරන්නම්කෝ, මේ ලෝකේ සතුටින්ම  ඉන්න මනුස්සයාට පුළුවන් වශාආ කණ්නාඩිය සාමාන්‍ය කණ්නාඩියක් විදිහට පාවිච්චි කරන්න. ඒ කියන්නේ එයා ඒක දිහා බැලුවම එයා ඉන්න විදිහටම පෙනෙයි. දැන් මොනාහරි තේරුනාද?"

හැරී සිතුවේය. "ඒක පෙන්වන්නේ අපිට ඕනේ දේවල්.. අපිට ඕනේ ඕනෑම දෙයක්"

"ඔව් සහ නෑ," ඩම්බල්ඩෝ සෙමින් කීවේය. "ඒක අපිට පෙන්වන්නේ අපේ හිත පතුලෙම තියන, අපි ගොඩාක් ආශා කරන දෙයක්. ඊට අඩුවෙනුත් නෙවෙයි වැඩියෙනුත් නෙවෙයි. ඔයා ඔයාගේ පවුලේ අයව කවදාවත් දැනගෙන හිටියේ නෑ. බලන්න එයාලා ඔයා වටේට ඉන්නවා. රොනල්ඩ් වීස්ලි හැමදාම තමන්ගේ අයියලා නිසා අවතක්සේරුවට ලක් උනා. ඒ නිසා එයා ඒ හැමෝටම වඩා හොඳම කෙනා විදිහට තනියම හිටගෙන ඉන්නවා දැක්කා. මොනා උනත් මේ කණ්නාඩිය අපිට දැනුමක් දෙන්නෙත් නෑ ඇත්තක් දෙන්නෙත් නෑ. මිනිස්සු ඒක ඉස්සරහ නාස්තිවෙලා තියනවා. එයාලා දැකපු දේ ඇත්ත කියලා හිතලා වැඩ කරපු අය,  එහෙම නැත්තන් ඒකේ පෙන්වන දේ ඇත්තද එහෙම වෙන්න පුළුවන්ද කියලාවත් හිතන්නේ නැතිව පිස්සු හැදිච්ච අය  ඉන්නවා.

"හෙට අපි කණ්නාඩිය අලුත් තැනකට ගෙනියනවා හැරී, මම ඔයාගෙන් ඉල්ලනවා ඒක ආපහු හොයන්න යන්න එපා කියලා. ඔයාට කවදා හරි ඒක දකින්න ලැබුනොත්, ඔයා දැන් ලෑස්තියි කියලා හිතනවා මම. හීනවල අතරමං වෙලා ජීවත් වෙන්න අමතක කරන්න එපා. ඒක මතක තියාගන්න. දැන්, ඔයා අර අගේ ඇති ලෝගුව දාගෙන මෙතනින් පිටවෙලා ඇඳට යන්න ඕනේ.?"

හැරී නැගිට්ටේය.

"සර්-ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝ? මට ඔයාගෙන් දෙයක් අහන්න පුළුවන්ද?"

"අනිවාර්යයෙන් ඔයා දැන් කරෙත් ඒකනේ," ඩම්බල්ඩෝ සිනාසුනේය. "එහෙනම් ඔයාට පුළුවන් තව එක දෙයක් අහන්න."

"ඔයා කණ්නාඩිය දිහා බැලුවම මොනාද පේන්නේ?"

"මම? මට පේනවා මම වූල් වලින් ගොතපු ඝනකම් මේස් ජෝඩුවක් අල්ලගෙන ඉන්නවා."

Downloaded from sinhalaebooks.com

හැරී ඔහු දෙස බලාසිටියේය්.

"කෙනෙක්ට කොච්චර මේස් තිබ්බත් ඇති වෙන්නේ නෑ," ඩම්බල්ඩෝ කීවේය. "තව නත්තලක් ඇවිත් ගියා මට එක මේස් ජෝඩුවක්වත් ලැබුනේ නෑ. මිනිස්සු හිතන්නෙම මට පොත් දෙන්න."

හැරී ඇඳට ගියපසු ඔහුට සිතුනේ ඩම්බල්ඩෝ ඔහුට සම්පූර්ණ ඇත්ත කිවේවේ නැති බවයි. ඒත් ඉන්පසු ස්කැබස්ව ඔහුගේ කොට්ටයෙන් ඉවතට විසි කරමින් සිතුවේ එය අතිශය පෞද්ගලික ප්‍රශ්ණයක් බවයි.

## දහතුන් වෙනි පරිච්ඡේදය

## නිකලස් ෆ්ලැමල්

ඩම්බල්ඩෝ හැරීව නැවත් වශාඅා කණ්නාඩිය සොයා නොයන්නට කැමති කරගත් නිසා ඉතිරි නත්තල් නිවාඩුවේය අදිසි ලෝගුව ඔහුගේ යකඩ පෙට්ටිය පතුලේ තැන්පත් විය. කණ්නාඩියෙන් දුටු දේ ලේසියෙන් අමතක කළ හැකි යැයි හැරී සිතුවත් එය එසේ නොවීය. ඔහුට භයානක හීන පේන්නට පටන් ගත්තේය. නැවත නැවතත් ඔහු තම දෙමාපියන් කොළපැහැ ආලෝකය තුල නොපෙනී යනවා දුටුවේය. ඒ සමහ මහ හඬින් සිනාසෙන හඬත් ඇසෙන්නටත් විය.

"දැක්කද, ඩම්බල්ඩෝ හරි, ඒ කණ්නාඩිය ඔයාට පිස්සු හදවන්න ඉඩ තිබ්බා," හීන ගැන කියූ විට රොන් කීවේය.

වාරය ආරම්භ වීමට පෙර දින පැමිණි හර්මයිනී ඒ දේවල් වෙනත් ආකාරයකින් දුටුවාය. හැරී රෑ තුනක් ඉස්කෝලේ ඇතුලේ ඇවිද්දා කියූ විට ඇය භීතියෙන් වෙවුලුවාය. ("ෆ්ලිච් ඔයාව අල්ලගත්තානම් එහෙම!") ඔහු නිකොලස් ෆ්ලැමල් කවුද යන්න ගැන කිසිවක් සොයා ගත්තේ නැති බව අසා ඈ කළකිරුනා ය.

හැරීටත් තමා එය කොහේ හෝ කියවූ බවට විශ්වාසයක් තිබුනත් ඔවුන් පුස්තකාල පොත් වල ෆ්ලැමල් ගැන සෙවීමේ අදහස අතහැර දැමීමට ඔන්න මෙන්න කියා තිබිණි. වාරය ආරම්භ වූ පසු ඔවුන් විවේක කාළ වල විනාඩි දහය බැගින් පොත් සෝදිසි කිරීමේ යෙදුනෝය. හැරීට අනෙක් දෙදෙනාටත් වඩා අඩු කාළයක් ඒ වෙනුවෙන් තිබුනේ නැවත කුඩිච් පුහුණුවීම් ආරම්භ වී තිබූ නිසායි.

වුඩ් කවදාවත් නැති තරම් කණ්ඩායම පුහුණු වීම් වල යෙදවූයේය. නොනවත්වා වැටුනු වැස්සටවත් ඔහුගේ අභිප්‍රාය බිඳලිය නොහැකි විය. වුඩ්ට පිස්සු හැදීගෙන එනවා යැයි කියමින් වීස්ලි නිවුන්නු චෝදනා කළත් හැරී සිටියේ වුඩ්ගේ පැත්තේය. ඔවුන් ඊලඟ තරඟෙන් හෆල්පෆ් පරාජය කළොත් අවුරුදු හතකට පසු ප්‍රථම වරට ග්‍රිෆින්ඩෝ

Downloaded from sinhalaebooks.com

විසින් ස්ලිදරින් පරදවා නිවාස කුසලානය දිනනු ඇත. දිනීමේ උවමනාවටත් වඩා පුහුණුවීම් වලින් හෙම්බත් වී යන දාට ඔහුට නපුරු හීන පෙනීම අඩු වී තිබිණි.

ඉන්පසු, එක් විශේෂ තෙත සහ මඩ සහිත පුහුණු සැසියක් තුළදී වුඩ් කණ්ඩායමට නරක ආරංචියක් දුන්නේය. එක දිගට එකිනෙකා වෙත විහිලුවට කඩා වැදී තම කොස්සෙන් වැටෙන්නට යනවාක් මෙන් රඟපෑ වීස්ලි නිවුන්නු ගැන ඔහු මහත් තරහින් සිටියේය.

"විකාර කරන එක නවත්තනවද!" ඔහු කෑගැසුවේය. "ඔකෙන් තමයි අපි තරගේ පැරදෙන්නේ! ස්නේප් මේ පාර තරඟ විනිසුරු, එයා ග්‍රිෆින්ඩෝ වලින් ලකුණු කපන්න පුළුවන් කිසි දෙයක් අතහරින්නේ නෑ!"

ඒ වචනත් එක්ක ජෝජ් වීස්ලි ඇත්තටම තම කොස්සෙන් බිමට වැටුනේය.

"ස්නේප් විනිසුරු?" කටේ මඩ පුරවාගෙන ඔහු ඇසුවේය. "එයා කවද්ද කුයිඩිච් තරඟයක් විනිශ්චය කරේ? අපි ස්ලිදරින් පරද්දන්න යනවානම් එයා සාධාරණ වෙන්නේ නෑ."

කණ්ඩායමේ අනිත් අයත් නෝක්කාඩු කීමට ජෝජ් අසලට ගොඩ බැස්සෝය.

"ඒක මගේ වරද නෙවෙයිනේ," වුඩ් කීවේය. "අපි හොඳට මතක තියාගන්න ඕනේ හරි විදියට සෙල්ලම් කරන්න. එතකොට එයාට අපිව අල්ලගන්න හේතුවක් නැති වෙනවා.."

එය හොඳම දේ උනත් හැරීට කුයිඩිච් ක්‍රීඩා කරන විට ස්නේප් ලඟ පාත නොසිටිය යුතු වීමට තවත් හේතුවක් තිබිණි.

පුහුණුවීම් අවසානයේ කණ්ඩායමේ අනෙකුත් අය සමඟ කතාබහ් කිරීමට නවතුනත් හැරී වහා ග්‍රිෆින්ඩෝ පොදු කාමරයට ආවේ, රොන් සහ හර්මයිනී චෙස් සෙල්ලම් කරනු හමු විය. හර්මයිනී පැරදුනු එකම දේ චෙස් ක්‍රීඩාව පමණි. රොන් සහ හැරී එය ඉතා හොඳ දෙයක් ලෙස සැළකූහ.

"පොඩ්ඩකට මාත් එක්ක කතා කරන්න එපා," හැරී තමන් ලඟ ඉඳගත් විට රොන් කීවේය. "මට මේකට අවධාන -- " ඔහු හැරීගේ මුහුණ දුටුවේය. "මොකද ඔයාට වෙලා තියෙන්නේ? ඔයා බයවෙලා වගේ පේන්නේ."

අන් කිසිවෙකුට නොඇසෙන ලෙස රහසින් ඔහු ස්නේප්ගේ හදිසියේ ඇතිවූ කුයිඩිච් විනිශ්චය කිරීමේ ආසාව ගැන කීවේය.

"ඔයා සෙල්ලම් කරන්න එපා," හර්මයිනී එක්වරම කීවාය.

Downloaded from sinhalaebooks.com

"ඔයාට සනීප නෑ කියන්න" රොන් කීවේය.

"ඔයාගේ කකුල කැඩිලා වගේ රඟපාන්න," හර්මයිනී යෝජනා කළාය.

"ඇත්තටම ඔයාගේ කකුල කඩන්න," රොන් කීවේය.

"මට බෑ," හැරී කීවේය.. "අපිට අමතර සොයන්නෙක් නෑ. මම අයින් වුනොත්, ග්‍රිෆින්ඩෝ වලට සෙල්ලම් කරන්න වෙන්නෙම නෑ."

ඒ මොහොතේදී නෙවිල් පොදු කාමරයට පැමිණියේය. ඔහු කොහොම පිංතූරය පොටුපස ගුලෙන් රිංගා ආවාදැයි ඕනෑම කෙනෙකුට සිතට එන ප්‍රශ්ණය විය යුතුයි. මන්ද යත් ඔවුන් වහා අඳුනාගත් පරිදි ඔහුගේ කකුල් දෙක කකුල්-බඳින ශාපයෙන් අලවා තිබිණි. ඔහු ග්‍රිෆින්ඩෝ කුළුණට එනතෙක් හාවෙක් මෙන් පැන පැන එන්නට ඇත.

හර්මයිනී හැර අනිත් සියල්ලෝම සිනාසෙන්නට පටන් ගත්හ. ඇය නැගිට ගොස් ශාපය ඉවත් කරන මන්තරය මතිරුවාය. නෙවිල්ගේ කකුල් දෙපසට විසි වී ඔහු සිට ගත්තේය. "මොකද උනේ?" ඔහුට හැරී සහ රොන් අසල වාඩිවීමට සළස්වමින් හර්මයිනී ඇසුවාය.

"මැල්ෆෝයි," නෙවිල් වෙවුළමින් කීවේය. "මට එයාව පුස්තකාලෙන් එළියෙදි හම්බුනා. එයා කිව්වා ඒක පුරුදු වෙන්න කෙනෙක් හොය හොය හිටියේ කියලා."

"ප්‍රොෆෙසර් මැක්ගොනගල් ලඟට යන්න!" හර්මයිනී ඔහුව උනන්දු කළාය්. "එයා ගැන පැමිණිලි කරන්න!"

නෙවිල් හිස වැනුවේය.

"මට තවත් කරදර ඕනේ නෑ," ඔහු ගොත ගසමින් කීවේය.

"ඔයා එයාට විරුද්ධව නැගී සිටින්න ඕනේ නෙවිල්!" රොන් කීවේය. "ඌ හැමෝටම චන්ඩිකම් දානවා. එහෙම කියලා වැඳගෙන ඉන්න ඕනේ නැනේ. ඒකෙන් වෙන්නේ තව ඒවාට උදව් කරන එක."

"මම ග්‍රිෆින්ඩෝ වෙන්න තරම් එඩිතර නෑ කියලා කියන්න ඕනේ නෑ. මල්ෆෝයි දැනටමත් එහෙම කියලා තියෙන්නේ," නෙවිල් කීවේය.

Downloaded from sinhalaebooks.com

හැරි තම කබා සාක්කු අතගා චොකලට් ගෙම්බෙක් ඉවතට ගත්තේය. ඒ හර්මයිනී නත්තලට තෑගි දුන් පෙට්ටියේ වූ අවසාන චොකල්ට් ගෙම්බා විය. හඬන්නට ආසන්න ලෙස පෙණුන නෙවිල්ට ඔහු එය දුන්නේය.

"ඔයා මැල්ෆෝයිලා දොළහක් තරම් වටිනවා," හැරි කීවේය. "තෝරන තොප්පිය ඔයාව තේරුවේ ග්‍රිෆින්ඩෝ වලට, එහෙම නේද? එතකොට මැල්ෆෝයි කොහෙද ඉන්නේ? ගඳ ගහන ස්ලිදරින් වල."

ගෙම්බාව කොළයෙන් ඉවතට ගනිද්දී නෙවිල්ගේ තොල් දූර්වල සිනාවකින් ඇද විය.

"ස්තූතියි, හැරී ... මම හිතන්නේ මම ඇඳට යන්නම්... ඔයාට කාඩ් එක ඕනෙද, ඔයා ඒවා එකතු කරනවා නේද?"

නෙවිල් ඉවතට යද්දී හැරී ප්‍රසිද්ධ මායාකරුගේ රූපය සහිත කාඩ්පත දෙස බැලුවේය.

"ආයෙත් ඩම්බල්ඩෝ," ඔහු කීවේය, "එයා තමයි මට මුලින්ම - "

ඔහු ගැස්සුනේය. ඔහු කාඩ්පත දෙස ආපසු බැලුවේය. ඉන්පසු ඔහු රොන් සහ හර්මයිනී දෙස බැලුවේය.

"මට එයාව හම්බුනා!" ඔහු කෙඳිරුවේය. "මට ෆ්ලැමල් ව හම්බුනා! මම ඔයාලට කිව්වා මම ඒ නම මීට කළින් කොහේ හරි කියෙව්වා කියලා, මම ඒක කියෙව්වේ කෝච්චියේදි. මෙහේ එන්න - මේක අහගන්න:

'ඔහු වඩාත් ප්‍රසිද්ධ වන්නේ 1945 ග්‍රින්ඩෙල්වොල්ඩ් හි අඳුරු උතුමානන් පැරදවීම, මකර ලේ භාවිතාකරන ක්‍රම 12 සොයා ගැනීම සහ, ඔහුගේ මිතුරු නිකොලස් ෆ්ලේමල් සමග කරන ලද රසායනය සම්භන්ධ ක්‍රියාවන්ටය.!"

හර්මයිනී වහා නැගිට්ටාය. පළමු වතාවට ගෙදර වැඩ කර ළකුණු ගත් දවසට පසු ඈ මේතරම් උද්‍යෝගයක් කිසිදින පෙන්නුම් කළේ නැත.

"ඔහොම ඉන්න!" කියූ ඈ කාන්තා නිදන කාමර වෙත ඇති පඩිපෙළ දිගේ ඉහලට දිවගියාය. හැරි සහ රොන් අද්භූත බැල්මක් හුවමාරු කරගැනීමට පෙරම ඇය විශාල පොතක් ඇතැතිව පෙනී සිටියාය.

"මම මේකේ බලන්න කවදාවත් හිතුවේ නෑ!" ඇය මහත් උද්‍යෝගයෙන් කෙඳිරුවාය. "මම මේක සති ගානකට කලින් පුස්තකාලෙන් ගත්තේ පොඩ්ඩක් සැහැල්ලුවේ කියවන්න."

Downloaded from sinhalaebooks.com

"සැහැල්ලුවේ?" රොන් කීවේය. නමුත් හර්මයිනී තමා යමක් සොයන තෙක් ඔවුන්ට නිහඬ වීමට කියුවාය. ඈ වහ වහා පිටු අතර යමින් තමන්ටම මුමුනාගත්තාය.

අන්තිමේ ඇයට සෙයූ දෙය හමුවිය.

"මම ඒක දැනගෙන හිටියා! මම දැනගෙන හිටියා!"

"අපිට තාම කතාකරන්න තහනම්ද?" රොන් කේන්තියෙන් කීවේය. හර්මයිනී ඔහුව නොසළකා හැරියේය.

"නිකොලස් ෆ්ලැමල්," ඇය රහපාමින් කෙඳිරුවාය, "යනු දැනට හඳුනාගෙන ඇති ආකාරයට මායා පාශාණය සාදන එකම නිමැයුම් කරුවා වේ!"

ඇය බළාපොරොත්තු වූ තරමේ දෙයක් සිදු වූයේ නැත.

"මොකක් හදන ද" රොන් සහ හැරී ඇසුවෝය.

"අනේ ඇත්තටම, ඔය දෙන්නා කියවන්නෙම නැද්ද? බලන්න - ඒක කියවන්න, අතන."

ඇය පොත ඔවුන් වෙත තල්ලු කළාය. හැරී සහ රොන් එය කියවන්නට විය.

පුරාණ රසායනය පිළිබඳ හැදෑරීම යොදාගන්නේ මායා පාශාණය සෑදීමටයි. අතිප්‍රභල ශක්තීන් සමග පෞරාණික මූලද්‍රව්‍ය  යොදාගෙන එය සාදනු ලැබේ. මේ පාශාණයට ඕනෑම ලෝහයක් තනි රත්තරන් බවට හැරවීමේ බලයක් ඇත. ඊට අමතරව බොන තැනැත්තා අමරණීය වන අමෘතය එය විසින් නිපදවයි.

සියවස් ගණනාවක් පුරාවට මායා පාශාණය ගැන බොහෝ වාර්ථා තිබේ. නමුත් දැනට පවතින එකම මායා පාශාණය අයිතිව තිබෙන්නේ ඉහල සඳහන් කළ රසායන විද්‍යාඥ සහ ඔපෙරා ප්‍රිය කරන නිකලස් ෆ්ලැමල් හටය. ගිය වසරේ තම හයසිය හැටපස්වන උපන්දිනය සැමරූ ෆ්ලැමල් මහතා තම බිරිඳ පෙරෙනෙල්ලේ සමග ඩෙවෝන් හී සතුටුදායක ජීවිතයක් ගත කරයි. (දැන් වයස අවුරුදු හයසිය පනස් අටකි).

"දැක්කද?" රොන් සහ හැරී කියවා ඉවරවත්ම හර්මයිනී කීවාය. "බල්ලා රකින්නේ ෆ්ලැමල්ගේ මායා පාශාණය වෙන්න ඕනේ! ඔට්ටුයි එයා ඩම්බල්ඩෝගෙන් ඉල්ලන්න ඇති ඒක ආරක්ශිතව තියන්න කියලා, මොකද එයාලා යාළුවෝ. අනික එයා දන්නවා කවුරුහරි ඒක පස්සේ පන්නනවා කියලා, ඒකයි එයාට ඒක ග්‍රින්ගොට්ස් වලින් අයින් කරන්න ඕනේ උනේ!"

Downloaded from sinhalaebooks.com

"රත්තරන් හදන, අමරණීය කරන ගලක්!" හැරී කීවේය. "ස්නේප් ඒක පස්සේ පන්නන එක පුදුමයක් නෙවෙයි. ඕනේ කෙනෙක්ට ඒක ඕනේ වෙයි."

"පුදුමයක් නෙවෙයි අපිට ෆ්ලැමල්ව නූතන මායා ලොවේ වර්ධනය ගැන අධ්‍යයනයක් පොතේ හම්බවුනේ නැති එක," රොන් කීවේය. "එයා අනිවාර්යයෙන් නූතන වෙන්න නම් බෑ එයාගේ වයස හයසිය හැට පහක් නම්. නේද?"

ඊළඟ උදෑසන අඳුරු මායා කළාවට එරෙහිව පංතියේදී නරවෘකයන්ගේ (warewolf) සපාකෑම් වලට නොයෙකුත් ප්‍රතිකාර ක්‍රම සටහන් කරගන්නා අතරේ හැරී සහ රොන් තමන්ට මායා පාශාණයක් තිබුනොත් කරන දේවල් සාකච්ඡා කරමින් සිටියහ. රොන් තමන්ටම කියා කුඩිච් කණ්ඩායමක් මිලදී ගන්නා බව පැවසූ විට හැරීට ස්නේප් සහ ලඟ එන තරඟය ගැන සිහියට නැගිනි.

"මම සෙල්ලම් කරනවා," ඔහු රොන් සහ හර්මයිනීට කීවේය. "මම ගියේ නැත්තන් ස්ලිදරින්ලා හිතයි මම ස්නේප්ට බයේ ඉන්නවා කියලා. මම එයාලට පෙන්වන්නම්කෝ ..... අපි දිනුවොත් එයාලගේ මූනු වල හිනාව නැතිම වෙලායයි."

"අපි ඔයාව පිට්ටනියෙන් අහුලගන්නකන් විතරයි" හර්මයිනී කීවාය.

තරඟය ලං වත්ම රොන් සහ හර්මයිනීට කෙසේ කීවත් හැරී තව තවත් නොසන්සුන් විය. කණ්ඩායමේ අනිත් අයත් සන්සුන් වී සිටියේ නැත. නිවාසාන්තර තරඟාවලියේදී ස්ලිදරින් පසුකිරීමේ අදහස පුදුමාකාරය. අවුරුදු හතකට එය කවුරුවත් කර තිබුනේ නැත. නමුත් එවැනි පක්ෂපාතී විනිසුරුවරයෙක් සමග ඊට ඉඩ ලැබේවිද?

හැරීට තමා මවාගන්නවාදැයි සිතෙන තරමට ඔහු යන යන තැන ස්නේප්ව දක්නට ලැබිණි. වෙලාවකට ස්නේප් තමන්ව තනියම අල්ලා ගැනීමට තමන්ගේ පස්සෙන් එනවාදැයි  හැරීට සිතිනි. සංයෝජන් පාඩම සතියක් පාසා දෙන වදයක් බවට පත් විය. ස්නේප් හැරීට බොහෝ දරුණු ලෙස සැළකුවේය. ඔවුන් මායා පාශාණය ගැන සොයාගත් බව ස්නේප් දැනගත්තාවත්ද? එහෙම වෙන්නේ කොහොමදැයි හැරීට නොපෙනුනත් ඔහුට සමහර වෙලාවකට සිතුනේ ස්නේප්ට සිත් කියවිය හැකි බවයි.

පසුදින කබඩ් කාමරයට පිටතදී රොන් සහ හර්මයිනී හැරීට සුභ පතන විට ඔවුන් හැරීව ආයෙත් පණ පිටින් දකින්නට ලැබේ දැයි සිතුබව හැරී දැන සිටියේය. මෙය පහසු දෙයක් නොවීය. තම කුඩිච් කබාය ඇඳගෙන නිම්බස් දෙදාහ අතට ගත් හැරීට වුඩ්ගේ කුඩා කතාවේ වචන ඇසුනේ යන්තමිනි.

ඒ අතරේ රොන් සහ හර්මයිනී රඳවනයේ නෙවිල් අසල තැනක් සොයා ගත්තෝය. දෙදෙනාම දරුණු සහ දුක පෙනුමකින් සිටීමට හේතුව හෝ ඔවුන් තරඟය බැලීමට තම යෂ්ටී රැගෙන ඒමට හේතුව හෝ ඔහුට සිතාගත නොහැකි විය. හැරී දැන සිටියේ රොන් සහ හර්මයිනී රහසින් කකුල් බඳින ශාපය පුහුණු වූ බව පමණි. මැල්ෆෝයි එය නෙවිල්ට භාවිතා කළ අවස්ථාවේදී ඔවුන්ට ඒ අදහස ලැබී තිබූ අතර ස්නේප් හැරීට කරදර කිරීමට උත්සාහ කරන්නට සැරසෙන බවට සළකුණක් ආවොත් එය ඔහුට යෙදවීමට දෙදෙනාම සූදානමින් සිටියෝය.

Downloaded from sinhalaebooks.com

"දැන්, අමතක කරන්න එපා, ඒක ලොකොමොටර් මෝටිස්," රොන් තම කමිස අත දිගේ ඉහලට යශ්ඨිය රිංගවද්දී හර්මයිනී මිමිනුවාය.

"මම දන්නවා," රොන් වහා කීවේය. "එල්ලිගෙන එන්න එපා."

කබඩ් කාමරය තුළ වුඩ් හැරීව පසෙකට ගත්තේය.

"මට ඔයාව තද කරන්න ඕනේ නෑ පොටර්. ඒත් අපිට ඉක්මනට ස්නිච් එක අල්ලගන්න ඕනේ දවසක් තියනවානම්, ඒ අද තමයි. ස්නේප් හෆල්පෆ් වලට ඕනෙවට වඩා උදවු කරන්න කළින් තරගේ ඉවර කරන්න."

"මුළු ඉස්කෝලෙම එළියේ ඉන්නවා!" දොරෙන් එළිය බළමින් ෆ්‍රෙඩ් වීස්ලි කියුවේය. . "අනික - කිරි අප්පට බල්ලෝ පැනපි- ඩම්බල්ඩෝත් ඇවිත්!"

හැරීගේ හදවත කරණමක් ගැසුවේය.

"ඩම්බල්ඩෝ?" දොර දෙසට යමින් හැරී කීවේය. ෆ්‍රෙඩ් නිවැරදිය. ඒ රිදීමය රැවුල වරදින්නට විදිහක් නොමැත.

තමන්ගේ ආරක්ශාව ගැන සිතා හැරීට මහ හඬින් සිනාසිය හැකිය. සරලව කිවහොත් ඩම්බල්ඩෝ බලාසිටින අතරේ හැරීට හිරිහැරයක් කිරීමට තරම් ස්නේප් නිර්භීත වන්නේ නැත.

සමහර විට ඒ හෙතුව නිසාම කණ්ඩායම් දෙක පිටියට පිවිසෙද්දී ස්නේප් තරහින් සිටින වග පෙණිනි. එය රොන්ටත් පෙනීගියේය.

"ස්නේප් මෙච්චර නපුරු විදිහට ඉන්නවා මම කවදාවත් දැකලා නෑ," ඔහු හර්මයිනීට කීවේය. "බලන්න - එයාලා ගියා... ආවු!"

කිසිවෙක් රොන්ගේ හිස පිටුපසට ඇන්නේය. ඒ මැල්ෆෝයි විය.

"ඔහ්, සමාවෙන්න වීස්ලි, ඔයා එතන ඉන්නවා දැක්කේ නෑ."

Downloaded from sinhalaebooks.com

මැල්ෆෝයි ක්‍රේබ් සහ ගොයිල් වෙත පුළුල් සිනාවක් පෑවේය.

"මේ පාර පොටර් කොච්චර වෙලා එයාගේ කොස්සේ ඉඳීද දන්නේ නෑ නේ? කවුද එන්නේ ඔට්ටුවක් තියන්න? මොකද කියන්නේ වීස්ලි එනවද?"

රොන් උත්තර දුන්නේ නැත. ස්නේප් හෆල්පෆ් වෙත අමතර ළකුණක් ලබා දුන්නේ ජෝජ් වීස්ලි ඔහු වෙත බ්ලජර් පන්දුව එවූ නිසායි. හර්මයිනී තම උකුළ උඩ ඇඟිලි තදකරගෙන උකුස්සෙක් ලෙස අහස පුරා රවුමට කරකැවෙමින් ස්නිච් එක සොයන හැරී දෙසම ඇස් රඳවාගෙන සිටියාය.

"ඔයාලා දන්නවද ග්‍රිෆින්ඩෝ කණ්ඩායමට කට්ටිය තෝරන්නේ කොහොමද කියලා මම හිතන විදිහ?" විනාඩි කීපයකට පසු ස්නේප් කිසිම හේතුවක් නැතිව හෆල්පෆ් වෙත ළකුණක් දෙන විට මැල්ෆෝයි හඬනගා කීවේය. "ඒ එයාලාට දැක්කම පවු කියලා හිතෙන අය. බලන්න අර පොටර්, එයාට දෙමාපියෝ නෑ. එතකොට අර වීස්ලිලා, එයාලට සල්ලි නෑ - ඔයත් කණ්ඩායමේ ඉන්න තිබ්බේ ලොන්ග්බොටම්, ඔයාට මොලේ නෑනේ."

නෙවිල් තදින් රතු උනත් මැල්ෆෝයිට මුහුණ දීමට පිටුපස හැරුණේය.

"මම ඔයා වගේ දොළොස් දෙනෙක් තරම් වටිනවා මැල්ෆෝයි" ඔහු ගොතගැසුවේය.

මැල්ෆෝයි, ක්‍රේබ් සහ ගොයිල් හූ තියමින් සිනාසුණහ. නමුත් තරඟයෙන් ඇස් ඉවතට ගන්නට අකමැති වූ රොන් "ඔයා එයාට කියන්න නෙවිල්" කීවේය.

"ලොන්ග්බොටම්, මොළේ කියන්නේ රත්තරන් නම් ඔයා වීස්ලිලාටත් වඩා දුප්පත්. ඒකෙන් මොනාහරි තේරුනාද."

හැරී ගැන අවධානය යෙදවීමට වඩා රොන්ගේ හිතේ ඇති වූ තරහ බළවත් විය.

"මම තවපාරක් කියන්නේ නෑ මැල්ෆෝයි. තව එක වචනයක් හරි..."

"රොන්!" එක්වරම හර්මයිනී කීවාය. "හැරී- - "

"මොකද්ද? කොහෙද?"

Downloaded from sinhalaebooks.com

හැරී එක්වරම පහළට කිමිදෙමින් සිටියේය. සෙනග ගැස්සී ඔල්වරසන් දෙන්නට විය. හර්මයිනී තම ඇඟිලි වලින් කට වසාගෙන නැගිට්ටාය. හැරී පතරොමක් විදෙන්නාක් මෙන් පිට්ටනිය වෙත පැමිණෙමින් සිටියේය.

"ඔයාට වාසනාව උදාවෙලා, වීස්ලි. අනිවාර්යයෙන් පොටර් පිට්ටනියේ තිබ්බ කාසියක් දකින්න ඇති!" මැල්ෆෝයි කීවේය.

රොන් ඔහු වෙත පැන්නේය. වෙන්නේ මොකද්ද කියා මැල්ෆෝයිට තේරෙන්නටත් පෙර රොන් ඔහු මතට පැණ පොළොවට තබා පොරකන්නට විය. නෙවිල් පැකිළුනත් පසුව තම අසුනෙන් පිටුපසට පැන උදව්වට ගියේය.

"ඉක්මන් කරන්න, හැරී!" හැරී ස්නේප් දෙසට කෙළින්ම පියාඹන අයුරු දැක හොඳින් බලා ගැනීමට තම පුටුවට නගිමින් හර්මයිනී කෑ ගැසුවාය. තම අසුන යට මැල්ෆෝයි සහ රොන් එහෙට මෙහෙට රෝල් වෙනු ඈ දුටුවේ නැත. නෙවිල්, ක්‍රේබ් සහ ගොයිල්ගේ ගුටිබැට හුවමාරුවේ කරණම් සහ වේදනාවෙන් කළ කෑගැසීම් ඇසුනේත් නැත.

ඉහල අහසේ, කොස්ස මත හැරෙන විටම තමන්ගේ ඇඟට අඟලක් පමණ පරතරයකින් යම්කිසි තද රතු යමක් විදගෙන යනු ස්නේප්ට පෙණිනි. ඊලඟ තප්පරයේ හැරී කිමිදීම නවතා ජයග්‍රාහී ලෙස දෑත් එසවූයේය. ස්නිච් පන්දුව ඔහුගේ අතේ රැඳී තිබුනේය.

ආසන රැඳවුම් ඝෝෂාවෙන් ඉපිළිණි. එය වාර්තාවක් වන්නට පුළුවනි. එතරම් ඉක්මනින් ස්නිච් පන්දුවක් අල්ලගත් අවස්ථාවක් කිසිවෙකුටවත් මතකයේ තිබුනේ නැත.

"රොන්! රොන්! කොහෙද ඔයා? තරගේ ඉවරයි! හැරී දිනුවා! අපි දිනුවා! ග්‍රිෆින්ඩෝ ඉස්සරහට ආවා!" ඉදිරි පේළියේ සිටි පාර්වතී පාටිල්ව බදාගනිමින් තම පුටුව මත උඩ පැන පැන නටන ගමන් වෙවුළන කටහඬින් හර්මයිනී කීවාය.

හැරී අඩියක් ඉහල සිට තම කොස්සෙන් බිමට පැන්නේය. ඔහුට එය විශ්වාස කළ නොහැකිය. ඔහු ඒක කරා - තරඟය අවසන් විය; එය උපරිම විනාඩි පහක් පැවැත්වෙන්නට ඇති. ග්‍රිෆින්ඩෝ පිරිස පිටියට කඩා වදිද්දී සුදුමැලි මුහුණින් සහ තදකරගත් තොල් වලින් යුතුව ස්නේප් ඔහු අසලට බසිනු හැරී දුටුවේය. ඉන්පසු හැරීට තම උරහිස මත තබන අතක පහස දැනුනෙන් ඉහළ බලද්දී ඩම්බල්ඩෝගේ සිනාපිරි මුහුණ දක්නට ලැබිණි.

"බොහොම හොඳට කරා," ඩම්බල්ඩෝ හැරීට පමණක් ඇසෙන ලෙස සෙමින් කීවේය. "අර කණ්නාඩිය ගැන කල්පනා කර කර ඉන්නේ නැතිව හිටපු එක ගැන සතුටුයි. හොඳට මහන්සිවෙලා වැඩකරා... විශිෂ්ඨයි..."

ස්නේප් තරහින් පොළවට කෙළ ගැසුවේය.

Downloaded from sinhalaebooks.com

ටික වෙලාවකට පසු හැරී තම නිම්බස් දෙදාහ කොසු ගබඩාවේ තැබීමට තනිවම කබඩ් කාමරයෙන් පිට වුනේය. මේ තරම් සතුටක් දැනුනු දවසක් ඔහුට මතකයේ නැත. ඔහු ඇත්තටම ආඩම්බර විය හැකි යමක් කර තිබේ. ඔහු නිකම්ම නිකන් ප්‍රසිද්ධ නමක් පමණක් බව දැන් කාටවත් කිව නොහැකිය. හැන්දෑ සුළඟ කවදාවත් මේතරම් රස සුවඳකින් යුක්ත නොවීය. පහුගිය පැය ඇතුළත සිදුවූ දෑ මෙනෙහි කරමින් ඔහු තණකොළ මත ඇවිද්දේය. එය ප්‍රීතිමත් බොඳ වූ හැඟීමකි. ග්‍රිෆින්ඩෝවරු පැමිණ ඔහුව උරහිස් මතට ඔසවා ගත් හැටි, රොන් සහ හර්මයිනී ඈතින් සිට උඩ පැන්න හැටි, රොන් නහයෙන් ලේ පෙරාගෙන ජයගෝෂා කළ හැටි ඔහුට මැවී පෙණුන.

හැරී ගබඩාව වෙතට ආවේය. ඔහු ලී දොරට හේත්තු වී ඉර බැස යාමත් සමග රතු පැහැයෙන් දිළිසෙන ජනේල සහිත හොග්වාර්ට්ස් දෙස බැලුවේය. ග්‍රිෆින්ඩෝ දැන් ඉදිරියෙන්, ඔහු එය කළා, ඔහු ස්නේප්ට එය පෙන්නා දුන්නා.

ස්නේප් ගැන කතා කරද්දී...

මාලිගයේ ඉදිරිපස පඩිපෙළ සෙමින් බැස හිස වසාගත් අයෙක් එළියට ආවේය. පැහැදිළිවම කවුරුවත් දකිනවාට අකමැති අයෙක්, පුළුවන් උපරිම වේගයෙන් තහනම් කැළෑව දෙසට ඇවිද ගියේය. එය දකිද්දී හැරීගේ ජයග්‍රාහී සිතුවිලි සිතෙන් මැකී ගියේය. එම පුද්ගලයාගේ පරිස්සම සහිත ඇවිදීමේ විලාශය හැරී අඳුනාගත්තේය. ස්නේප්, අනිත් සියල්ලෝම රාත්‍රී ආහාර ගන්නා අතරේ හොරෙන් කැළේට රිංගන බව පෙනේ. මොනාද සිද්ධ වෙන්නේ?

හැරී වහා තම නිම්බස් දෙදාහට නැග ඉහලට ගියේය. රහසින් නිහඬව මාලිගයට ඉහලින් පියෑඹූ හැරීට ස්නේප් දුවමින් කැලෑවට ඇතුල් වෙනු පෙණුනි. ඔහු පසුපසින් ගියේය.

ගස් බොහෝ ඝණකම් වූයෙන් ස්නේප් ගිය දිහාව හැරීට නොපෙණුනි. ඔහු රවුමට පියාඹමින් පහළට ආවේ ගස්වල ඉහලම අතුවල ගෑවෙන තරමට ලංවිය. අවසානයේ කටහඬක් ඇසිණි. ඔහු ඒ දෙසට ලිස්සා ගොස් නිහඬවම බීච් ගසක් මතට පහත් විය.

ඔහු පරිස්සමින් තම කොස්ස එක් අතකින් අල්ලාගෙන අත්තක් මතට නැග කොළ අතරින් බැලීමට උත්සාහ කළේය. පහළ අඳුරු සෙවණැලි අතර ස්නේප් විය. නමුත් ඔහු සිටියේ තනිවම නොවේ, කුරල්ද එහි විය. හැරීට ඔහුගේ මුහුණේ පෙනුම නොපෙනුනත් ඔහු වෙනදාටත් වඩා ගැහෙන බව පෙණුනි. ඔවුන් කියන දේවල් ඇසීමට හැරී ඒ දෙසට ඇදුනේය.

"අ...අච්චර තැන් ව... වලින් ඔයාට මෙතනම මු.. මුණගැහෙන්න ඕනේ උනේ ඇ.. ඇයිද මන්දා, සෙවරස්...."

"ඔහ්, මම හිතුවේ අපි මේක රහසේ තියාගන්න ඕනේ කියලා," සීතළ කටහඬකින් ස්නේප් කීවේය. "හැමදේටම වඩා, ළමයි මායා පාශාණය ගැන දැනගත යුතු නෑ."

හැරී ඉදිරියට නැවුනේය.. කුරල් යමක් මුමුණයි.. ස්නේප් ඔහුට බාධා කළේය.

Downloaded from sinhalaebooks.com

"තාම අර හැග්‍රිඩ්ගේ මෘගයාව පහුකරන ක්‍රමයක් හොයාගත්තේ නැද්ද?"

"ඒ... ඒත් සෙවරස්, මම - - "

"ඔයා මාව හතුරෙක් කරගන්න ඕනේ නෑ කුරල්," ඔහු දෙසට අඩියක් තබමින් ස්නේප් කීවේය.

"මම..මම දන්නේ නෑ ඔයා මොකද්ද"

"මම අදහස් කරේ මොකද්ද කියල්ලා තමුන් බොහොම හොඳට දන්නවා."

බකමූණෙක් මහ හඬින් හූ කීවෙන් හැරී ගහෙන් වැටෙන්නට ගියේය. ඔහු වහා සමබර වූයෙන් ස්නේප් කියූවක් ඇසිණි. "තමුන්ගේ ඔය පොඩි ඇස් බැන්දුමක් දානවා...මම බලාගෙන ඉන්නම්."

"ඒ - ඒත් මම ද...ද.. දන්නේ - - "

"හරි එහෙනම්," ස්නේප් වහා කීවෙය. "අපි ඉක්මනටම ආයෙත් හම්බවෙලා කතාකරමු, තමුන් හොඳට හිතලා තමුන්ගේ පක්ෂපාතීකම තියෙන්නේ කොහේද කියලා තීරණය කරාට පස්සේ...."

ඔහු තම ලෝගුව හිස මතින් දාගෙන එළිමහන වෙත ගමන් කළේය. බොහෝ අඳුර පැතිරී තිබුණත් කුරල් ගල්වුනා සේ නිහඬව සිටගෙන සිටින අයුරු හැරීට පෙණිනි.

"හැරී, ඔයා කොහේද හිටියේ?" හර්මයිනී කෑගැසුවාය.

"අපි දිනුවා! ඔයා දිනුවා! අපි දිනුවා!" හැරීගේ පිටට තට්ටු කරමින් රොන් කෑගැසුවේය. "මම මැල්ෆොයිගේ ඇහැ කළු වෙන්න ගැහුවා, නෙවිල් ක්‍රේබ් ගොයිල් දෙන්නට තනියම ගහන්න හැදුවා.. එයා තාම ඉස්පිරිතාලේ, ඒත් මැඩම් පොම්ෆ්‍රේ කිව්වා එයාට හොඳවෙයි කියලා. ස්ලිදරින්ලට හැටි පෙන්නන එක ගැන කියනකොට මතක් උනේ! හැමෝම ඔයා එනකන් පොදු කාමරේ බලාගෙන ඉන්නවා. අපි පාටියක් දාන්න යන්නේ. ෆ්‍රෙඩ් ජෝජ් දෙන්නා කුස්සියෙන් කේකුයි තව ජාතියි හොරකම් කරා.."

"දැන් ඒකෙන් වැඩක් නෑ," හැරී හති දමමින් කීවේය. "හිස් කාමරයක් හොයාගමු. ඔයා මේක අහනකන් ඉන්නකෝ...."

Downloaded from sinhalaebooks.com

කාමරයේ දොර වැසීමට පෙර පීව්ස් එහි නැති බව සැක හැරගත් හැරී ඉන්පසු තමා දුටු සහ ඇසූ දෑ ඔවුන්ට කියුවේය.

"එතකොට අපි හරි, ඒක මායා පාශාණය තමයි, එතකොට ස්නේප් කුරල්ට බලකරනවා ඒක අරගන්න උදව් කරන්න කියලා. එයා ඇහුවා ෆ්ලෆීව පහුකරන විදිහක් දන්නවද කියලා - තව කිව්වා කුරල්ගේ 'ඇස් බැන්දුම්' වගේ දෙයක් - මට හිතෙන්නේ ෆ්ලෆී ඇරුනම මායා පාශාණය ආරක්ශා කරන තව දේවල් තියනවා. ගොඩක් මායාවල්, අනිවාර්යයෙන් කුරල් ස්නේප්ට කඩා පනින්න ඕනේ කරන අඳුරු මායාවල් වල විරුද්ධ මන්තර එහෙම කරලා ඇති - - "

"එතකොට ඔයා කියන්නේ කුරල් ස්නේප්ට විරුද්ධව ඉන්නකන් විතරක් පාශාණය ආරක්ශාවෙනවා කියලද?" හර්මයිනී කල්පණාවෙන් කීවාය.

"ඒක ලබන අඟහරුවාදා වෙනකොට නැති වෙයි," රොන් කීවේය.

දහහතර වෙනි පරිච්ඡේදය

නෝබට් නම් වූ නෝර්වීජියන් රිජ්බැක්

නමුත් කුරල් ඔවුන් සිතුවාට වඩා එඩිතර අයෙක් විය හැක. ඉන්පසු පැමිණි සතිවල දී ඔහු තවත් සුදුමැලි සහ කෙට්ටු වෙමින් සිටියේය. නමුත් ඔහුගේ සිත තාමත් බිඳීගියබවක් පෙණුනේ නැත.

තුන්වෙනි තට්ටුවේ කොරිඩෝව පසු කරන සෑම විටම හැරී,රොන් සහ හර්මයිනී දොරට කණ තබා ෆ්ලෆී තවමත් එහි ගොරවමින් ඉන්නවාදැයි බැලූහ. ස්නේප් තවමත් සුපුරුදු ලෙස තරහින් පුපුරමින් හැම තැනම ඇවිද්දේ පාශාණය තවමත් ආරක්ශිත බව තහවුරු කරවමිනි. හැරී මේ දිනවල කුරල්ව පසු කරන සෑම අවස්තාවකම ඔහුව දිරිගන්වන අන්දමේ සිනාවක් පුදකරන්නට අමතක නොකලේය. ඒ අතර රොන් කුරල්ගේ ගොතගැසීම් වළට හිනා නොවෙන ලෙස හැමෝටම කියන්නට පටන් ගත්තේය.

නමුත් හර්මයිනීගේ සිතේ මායා පාශාණයට වඩා දෙයක් විය. ඈ තම පාඩම් කිරීමේ කාළ සටහන් ඇඳින්නටත් තම සටහන් සියල්ල පාට කරන්නටත් පටන් ගත්තාය. හැරී සහ රොන් ගණනකට නොගත්තත් ඈ දිගින් දිගටම ඔවුන්ටත් එයම කරන ලෙස බළපෑම් කළාය.

"හර්මයිනී, විභාග වලට තව කාළාන්තරයක් තියනවා."

Downloaded from sinhalaebooks.com

"සති දහයයි," හර්මයිනී වහා කීවාය. "ඒක කාළාන්තරයක් නෙවෙයි. නිකොලස් ෆ්ලැමල්ට නම් ඒක තප්පරයක් වගේ."

"ඒත් අපි අවුරුදු හයසීයක් වයස නැනේ," රොන් මතක් කළේය. "මොනා උනත්, ඔයා මොකටද පාඩම් කරන්නේ, ඔයා දැනටමත් හැමදේම දන්නවානේ"

"මම මොකටද පාඩම් කරන්නේ? ඔයාට පිස්සුද? අපි මේ විභාගේ පාස් උනේ නැත්තන් දෙවෙනි අවුරුද්දට යන්න බෑ කියලා ඔයා දන්නවද? ඒවා ගොඩක් වැදගත්, මට මාසෙකට කළින් පටන් ගන්න තිබ්බේ. මං දන්නේ නෑ මට මොනා උනාද කියලා...."

අවාසනාවට ගුරුවරුත් හර්මයිනී සිතූ විදිහටම සිතන බවක් පෙනෙන්නට විය. ඔවුන් ගෙදර වැඩ ගොඩක් දුන්නෙන් පාස්කු නිවාඩුව නත්තල් නිවාඩුවේ ලද සතුට අහලකටවත් නොආවේය. මකර ලේ භාවිතා කරන ක්‍රම දොළහ කට පාඩම් කරන හෝ යශ්ඨිය පුහුණු වෙන හර්මයිනී ලඟ සිට විවේකයක් ගැනීම ඉතා අසීරුය. ඔවුන් තම විවේක කාළවල අඳෝනා තියමින් සහ ඇනුම් අරිමින් ඇ සමග පුස්තකාලයට වී අමතර වැඩ ඉවර කිරීමේ යෙදුනෝය.

"මේක නම් මට කවදාවත් මතක තියෙන එකක් නෑ," රොන් තරහෙන් පුපුරමින් තම පිහාටු පෑන විසිකර ආශාවෙන් පුස්තකාල ජනේලයෙන් එලිය බලා සිටියේය. ඒ ඔවුන්ට මාස ගාණකින් ලැබුන හොඳ දවසක් විය. අහස පැහැදිළිය. නිල්පාට ෆොගෙට-මී-නොට් මල් පිපී තිබේ. වසන්තය එන බවට හැඟීමක් සුළඟේ විය.

මායාමය බෙහෙත් පැලැටි දහසක් සහ පුස් වර්ග පොතේ 'ඩිටනි' සොයමින් සිටි හැරී රොන් ගේ කටහඬින් හිස ඔසවා බැලුවේය. "හැග්‍රිඩ්, ඔයා මොනාද පුස්තකාලේ කරන්නේ?"

හැග්‍රිඩ් යමක් පිටුපස සඟවාගෙන ජේන මානයට ආවේය.. ඔහු තම ඌරු මී හමින් කළ පිට කබාය නිසා මෙතනට කිසි සේත්ම නොගැළපෙන බවක් දිස් විය.

"නිකම් බැලුවා'," ඔහුගේ අමුතු වූ කටහඬ ඔවුන්ගේ අවධානය වහා උදුරා ගත්තේය. "ඔයාලා කට්ටිය මොකක් කරන්නද හදන්නේ?" ඔහු හදිසියේ සැකෙන් බලමින් ඇසුවේය. "ඔයාලා නිකලස් ෆ්ලැමල් ගැන හොයනවා නෙවෙයිනේ?" "ඔහ්, අපි එයා කවුද කියලා කාළාන්තරයකට කලින් හොයාගත්තා.," රොන් සිත්ගන්නා සුළු ලෙස කීවේය. "එතකොට අර බල්ලා ආරක්ශා කරන්නේ මොනාද කියලත් අපි දන්නවා. ඒක මායා පාශා - - "

"ශ්ශ්ශ්!" කවුරුන් හෝ අසා සිටීදැයි දැනගැනීමට හැග්‍රිඩ් වටපිට බැලුවේය. "ඒක කිය කිය කෑ ගහන්න යන්න එපා. ඔයාට මොකද වෙලා තියෙන්නේ?"

Downloaded from sinhalaebooks.com

"ඇත්තටම අපිට ඔයාගෙන් අහන්න දේවල් ටිකක් තියනවා," හැරී කීවේය. "ෆ්ලපී ඇරුනම පාශාණය ආරක්ෂා කරන්න තියෙන්නේ මොනාද කියන එක- - "

"ශ්ශ්ශ්ශ්!" "අහන්න - මාව ඇවිල්ලා පස්සේ මුණගැහෙන්න. මොකුත් කියන්නම් කියලා මම පොරොන්දු වෙන්නේ නෑ. මතක තියාගන්න, එක ගැන මෙහේ කසු කුසු ගාන්න යන්න එපා. ළමයි ඒ ගැන දැනගන්න තහනම්. එයාලා හිතයි මම ඔයාලට කිව්වා කියලා - - "

"එහෙනම්, පස්සේ හමුවෙමු," හැරී කීවේය.

හැග්‍රිඩ් වහා පිටවිය.

"එයා මොනාද පිටිපස්සේ හංගගෙන හිටියේ?" හර්මයිනී කල්පණාවෙන් කීවාය.

"ඔයා හිතන්නේ ඒක පාශාණය සම්භන්ධ දෙයක් කියලද?"

"මම එයා හිටියේ මොන කොටසෙද බලන්න යනවා," ඕනෑතරම් වැඩ තිබියදී රොන් කීවේය. ඔහු විනාඩියකට පසු පොත් ගොන්නක් සමග ඇවිත් ඒවා මේසය මත අතහැරියේය.

"මකරු!" ඔහු කෙඳිරුවේය. "හැග්‍රිඩ් මකරු ගැන විස්තර හොයලා තියෙන්නේ! මේවා බලන්න: මහා බ්‍රිතාන්‍යයේ සහ අයර්ලන්තයේ මකර විශේෂ; බිත්තරයේ සිට ගිණි පිඹින තෙක්, මකර භාරකරුගේ මගපෙන්වීම්."

"හැග්‍රිඩ්ට හැම වෙලේම මකරෙක් ඕනේ වෙලා හිටියේ, අපි මුලින්ම හම්බවෙච්ච වෙලාවෙත් කිව්වා " හැරී කීවේය.

"ඒත් ඒක අපේ නීති වළට විරුද්ධයි," රොන් කීවේය. "1709 වර්ලොක් සම්මේලනයේදී මකරු හදන එක නීතිවිරෝධී කරා. හැමෝම ඒක දන්නවා. අපි මකරු ගේ පිටිපස්සේ තියාගත්තොත් මගල්ලා දකින එක වළක්වන්න අමාරුයි.. මොනා උනත්, මකරෙක්ව හීලෑ කරන්න බෑ. ඒක භයානකයි. ඔයා දකින්න තිබ්බේ රොමේනියාවෙදි කැලෑ මකරුන්ගේ ගින්දරින් චාලිගේ පිච්චිලා තිබ්බ හැටි."

"ඒත් බ්‍රිතාන්‍යයේ කැළෑ මකරු නෑ?" හැරී කීවේය.

Downloaded from sinhalaebooks.com

"අපොයි ඉන්නවා," රොන් කීවේය. "කොමන් වෙල්ශ් ග්‍රීන් වලයි හෙබ්‍රිඩීන් බ්ලැක්ස් වළයි ඉන්නවා. මට කියන්න පුළුවන් මායා අමාත්‍යාංශයේ තියනවා උන්ව එළවන රාජකාරියකුත්. උන්ව දැකපු මගල්ලාට ඒක අමතක වෙන්න දිගටම මතුරන්නත් අපේ අයට සිද්ධ වෙනවා. ."

"එතකොට හැග්‍රිඩ් මොන මගුලක්ද කරන්න හදන්නේ?" හර්මයිනී කීවාය.

ඔවුන් පැයකට පසු ක්‍රීඩාතබන්නාගේ දොරට තට්ටු කරන විට, සියලුම තිර රෙදි වසා ඇතිබව දැක ඔවුන් පුදුම විය. දොර ඇරීමට පෙර "කවුද ඔය?" කියා ඇසූ හැග්‍රිඩ් ඔවුන්ව ඇතුළට ගත් ගමන් දොර වැසුවේය.

ඇතුළත දහඩිය දමන තරම් උනුසුම් විය. මෙතරම් උණුසුම් දිනයක් වුවත් ගිණි උඳුනේ මහා ගින්නක් ඇවිළිනි. ඔවුන්ට තේ හැදූ හැග්‍රිඩ් මුගටි මස් සැන්ඩ්විච් ද පිළිගැන්වූවත් ඔව්න් එය ප්‍රතික්ශේප කළහ.

"ඉතිං - ඔයාලට මගෙන් මොනාද අහන්න ඕනේ උනා නේද'?"

"ඔව්" වටේ යාමෙන් පළක් නැති බව දත් හැරී කීවේය. "අපි හිතුවේ ෆ්ලෆී ඇරුනම මායා පාශාණය ආරක්ශාකරන අනිත් දේවල් මොනාද කියලා ඔයාට අපිට කියන්න පුළුවන්ද කියලා."

හැග්‍රිඩ් ඔහුට රැව්වේය.

"අනිවාර්යයෙන් මට බෑ", හැග්‍රිඩ් කීවේය. "අංක එක, මම ඒක දන්නේ නෑ. අංක දෙක , ඔයාලා දැනටමත් ඕනෑවට වඩා දන්නවා, ඉතිං මට පුළුවන් උනත් මම කියන්නේ නෑ. ඒ පාශාණය මෙහේ තියෙන්න හොඳ හේතුවක් තියනවා. ඒක ග්‍රින්ගොට්ස් වලදී හොරකම් කරන එකෙන් යන්තම් බේරුනේ. මම හිතන්නේ ඒ දෙවල් ඔක්කොම ඔයාලා හොයාගන්න ඇති නේ? ඔයාලා ෆ්ලෆී ගැන දැනගත්තේ කොහොමද කියන එකයි මට හිතා ගන්න බැරි."

"ඔහ, මොනාද හැග්‍රිඩ්, ඔයා කියන්න කැමති නැති උනාට ඔයා දන්නවානෙ, මෙහේ වෙන දේවල් හැමදේම ඔයා දන්නවානේ," හර්මයිනී උණුසුම් ලෙස චාටු හඬින් කීවාය . හැග්‍රිඩ්ගේ යටි රැවුල සෙළවුනෙන් ඔහු සෙනාසෙන බව ඔවුන්ට තේරුණි. "අපි ඇත්තටම හොයලා බැලුවා විතරයි කවුද ආරක්ශා කරන්නේ කියලා." "අපි බැලුවේ ඩම්බල්ඩෝ තමන්ට උදවුකරගන්න කාවද විශ්වාස කාරන්නේ කියලා,.... අපි ඇරුනාම"

ඒ අවසන් වචනත් සමඟ හැග්‍රිඩ්ගේ පපුව පිම්බුනේය. හැරී සහ රොන් හැර්මයිනී දෙස කාන්තිමත් බැල්මක් හෙළුවෝය.

"හොඳයි, මම හිතන්නේ ඒක ඔයාලට කිව්වට කමක් නැති වෙයි.... බලමු... එයා ෆ්ලෆීව මගෙන් ඉල්ලගත්තා... ඊට පස්සේ ගුරුවරු කීප දෙනෙක් බන්ධන වගයක් කළා... ප්‍රොෆෙසර් ස්ප්‍රවුට් - ප්‍රොෆෙසර් ෆ්ලිට්වික් - ප්‍රොෆෙසර්

Downloaded from sinhalaebooks.com

මැක්ගොනගල් - - " ඔහු ඇඟිලි වලින් ගණන් කරමින් කීවේය. "ප්‍රොෆෙසර් කුරල්- ඩම්බල්ඩෝර් ඇත්තටම මොනාදෝ කරා. ඉන්න මට කාව හරි අමතක උනා. ආ, ඔව්, ප්‍රොෆෙසර් ස්නේප්."

"ස්නේප්?"

"ඔව් - ඔයාලා තාම අර විදිහට නෙවෙයිනේ හිතන්නේ? බලන්න, ස්නේප් පාශාණය ආරක්ෂා කරන්න උදවු කරා. එයා ඒක හොරකම් කරන්න යන්නේ නෑ."

තමන් සිතන දේම රොන් සහ හර්මයිනී සිතන බව හැරී දත්තේය. ස්නේප් පාශාණය ආරක්ෂා කිරීමට සම්බන්ධ නම් අනෙක් ගුරුවරු එය ආරක්ෂා කළ අයුරු දැනගැනීම පහසු වනු ඇත. ඔහු අනිවාර්යයෙන් හැමදේම දන්නවා ඇති -- ජේන විදිහට ෆ්ලෆී පහු කරන විදිහ සහ කුරල්ගේ මන්තරය හැර හැමදේම ---

"එතකොට ෆ්ලෆීව පහු කරන විදිහ දන්නේ ඔයා විතරයිනේ නේද හැග්‍රිඩ්?" හැරී කුතුහළයෙන් කීවේය. "ඔයා ඒක කාටවත් කියන්නේ නෑ, එහෙමනේ? අඩු තරමින් ගුරුවරයෙකුටවත්?"

"මමයි ඩම්බල්ඩෝයි ඇරෙන්න කිසිම ප්‍රාණයක් දන්නේ නෑ," හැග්‍රිඩ් උජාරුවෙන් කීවේය.

"හොඳයි, ඒක හොඳ දෙයක්," හැරී අනෙක් දෙදෙනාට කොඳුරා කීවේය. "හැග්‍රිඩ්, ජනේලයක් අරිමුකෝ, මාව තැම්බෙනවා."

"බෑ, හැරී, සමවෙන්න," හැග්‍රිඩ් කීවේය. ඔහු ගින්දර දෙසට බැල්මක් හෙලනු හැරී දුටුවේය. හැරීත් එදෙස බැලුවේය.

"හැග්‍රිඩ් - අර මොකද්ද?"

නමුත් ඔහු ඒ කුමක්ද කියා දැන සිටියේය. ගින්දරේ මැදම, කේතලයට යටින්, අති විශාල කළු පැහැ බිත්තරයක් විය.

"අහ්," හැග්‍රිඩ් වහා කළබල වී තම යටි රැවුල හදමින් කීවේය. "ඒක අර්...."

"ඔයා කොහෙන්ද හැග්‍රිඩ් ඒක ගත්තේ?" හොඳින් බලා ගැනීමට ගින්දර මතට නැවෙමින් රොන් ඇසුවේය. "ඒකට නම් ඔයා නිධානයක් තරමට ගෙවන්න ඇති."

Downloaded from sinhalaebooks.com

"අපෝ නෑ," හැග්‍රිඩ් කීවේයa. "ඊයේ රෑ මම පල්ලෙහා ගමට ගියා පොඩි බීමක් ගන්න, ඒ අතරේ අමුත්තෙකුත් එක්ක කාඩ් සෙල්ලමක් කරා. අවංකවම කියනවා නම් මට තේරුනේ එයා මේකෙන් ඇත් වෙන්න කැමැත්තෙන් හිටියා වගේ."

"ඒත් ඌ එලියට ආවම ඔයා ඌට මොකද කරන්න හිතාගෙන ඉන්නේ?" හර්මයිනී ඇසුවාය.

"මේකයි, මම පොඩ්ඩක් ඒ ගැන කියෙව්වා', තම කොට්ටය යටින් විශාල පොතක් එලියට් ගමින් හැග්‍රිඩ් කීවේය. "මේක පුස්තකාලෙන් ගත්තේ - විනෝදය සහ ලාභය තකා මකරු ඇති කිරීම - ඇත්තටම් ඒක පොඩ්ඩක් කල් පැනලා, ඒත් ඒකේ ඔක්කොම දේවල් තියනවා. බිත්තරේ ගින්දරේ තියන්න, 'මන්ද ඔවුන්ගේ මව ඒ මතට හුස්ම හෙළයි' , දැක්කද, බිත්තරය පුපුරා ඌ එළියට ආ පසු සෑම පැය භාගයකට වරක්ම බ්‍රැන්ඩි මිශ්‍ර කුකුල් ලේ බාල්දියක දමා පොවන්න.. එතකොට මෙතන බලන්න.  - වෙනස් බිත්තර හඳුනා ගන්නේ කෙසේද - මට මේ හම්බවෙලා තියෙන්නේ නෝර්වීජියානු රිජ්බැක් වර්ගයේ එකෙක්. උන් හරි දුර්ලභයි."

ඔහු තමා ගැන සතුටු වූයේය. නමුත් හර්මයිනීට එය එසේ නොවීය.

"හැග්‍රිඩ්, ඔයා ජීවත් වෙන්නේ ලී ගෙදරක" ඈ කීවාය.

නමුත් හැග්‍රිඩ් ඇහුම්කන් දුන්නේ නැත. ඔහු සතුටින් සිංදුවක් මුමුණමින් ගින්දරට දර දමා එය අළුත් කෙළේය.

දැන් තිදෙනාටම දුක් වන්නට වෙනත් දෙයක් ලැබුනි. කවුරු හරි දැනගත්තොත් හැග්‍රිඩ් නීතිවිරෝධී මකරෙක් තමන්ගේ කුටියේ හංගගෙන ඉන්නවා කියලා මොනා වෙයිද.

"සාමකාමී ජීවිතයක් තියනඑක මොන වගේද දන්නේ නෑ," හැන්දෑවේ ලැබුනු අමතර ගෙදර වැඩ සමග ඔට්ටු වෙමින් රොන් සුසුම් හෙලන්නට විය. හර්මයිනී දැන් හැරී සහ රොන්ටත් පාඩම් කිරීමට කාළ සටහන් හදන්නට පටන් ගෙන තිබිණි. එය ඔවුන් පිස්සු වට්ටන්නට විය.

ඉන්පසු, එක් උදෑසන් ආහාර ගන්නා මොහොතක, හෙඩ්විග් විසින් හැග්‍රිඩ්ගෙන් තුන්ඩුවක් රැගෙන ආවාය. එහි වූයේ වචන දෙකක් පමණි. ඒක පුපුරනවා.

රොන්ට පැළෑටි විද්‍යාව පාඩම මගහැර කෙලින්ම පහළ කුටිය වෙත යාමට උවමනා විය. හර්මයිනී එය ඇසීමටවත් කැමති නොවීය.

"හර්මයිනී, අපේ ජීවිතේටම කීපාරක් මකරෙක් බිත්තරෙන් එළියට එනවා දකී කියලද ඔයා හිතන්නේ?"

Downloaded from sinhalaebooks.com

"අපිට පාඩම් තියනවා, අපි ප්‍රශ්ණෙක පැටලෙයි, හැබැයි හැග්‍රිඩ් මොනාද කරන්නේ කියලා කවුරුහරි දැනගත්තොත් වෙන දේ එක්ක බැලුවොත් නම් ඒක පොඩි දෙයක් - "

"කටවහනවා!" හැරී කෙඳිරුවේය.

මැල්ෆෝයි සිටියේ අඩි කීපයක් පමණක් එහායිනි. ඔහු කන්දීමට එතැන ගල් වී මෙන් සිටගෙන සිටියේය. ඔහුට කොපමණ ඇසුනාද? ඔහුගේ මුහුණේ වූ පෙනුමට හැරී කිසිසේත්ම කැමති වූයේ නැත.

පැළෑටි විද්‍යා පාඩමට යන අතර දිගටම රොන් සහ හර්මයිනී වාද කළහ. අවසානයේ උදෑසන විවේකයේදී අනෙක් දෙදෙනා සමග හැග්‍රිඩ්ගේ ගෙදරට දිවීමට හර්මයිනී එකඟ වූවාය. පාඩම අවසානයේ මාලිගයේ සීනුව නාද වෙද්දී තිදෙනාම තම තුවා බිම දමා පිට්ටනිය හරහා දිව ගොස් කැළෑව කෙළවරට දිව්වෝය. හැග්‍රිඩ් රතු කරගත් මුහුණින් සහ උද්‍යෝගයෙන් යුතුව ඔවුන්ව පිළිගත්තේය.

"ඌ ගොඩක් දුරට එළියට ඇවිත්." ඔහු ඔවුන්ව ඇතුළට කැඳවාගෙන ගියේය.

බිත්තරය මේසය මත විය. එහි ගැඹුරට පැළුම් දකනට ලැබුණි. ඇතුලේ යමක් සෙළෙවෙයි ඇතුලෙන් විකාර ක්ලික් ශබ්දයක් ඇසෙයි.

ඔවුන් සියල්ලෝම තම පුටු මේසය ළඟටම ඇදගෙන හුස්ම ගන්නත් අමතක කර බලා සිටින්නට වූහ.

එක්වරම හූරන ශබ්දයක් සමග බිත්තරය පුපුරා විවෘත විය. මකර පැටියා මේසය මතට වැටිනි... ඌ ලස්සන වූයේ නැත. හැරීට සිතුනේ ඌ කැඩුණු කළු කුඩයක් වගේ කියායි. උගේ කැහැටු දිගැටි ඇඟත් සමග සසඳන කළ කූරු සහිත පියාපත් විශාල ඒවා විය. ඌට පළල් නාස් සිදුරු සහිත දිග හොම්බක් ද කොට අං සහ පිටතට නෙරූ තැඹිලි පාට ඇස්ද විය.

ඌ කිවිසුමක් ඇරියේය. ගිණි දළු කීපයක් උගේ හොම්බෙන් එළියට විසි විය.

"ඌ ලස්සනයි නේද?" හැග්‍රිඩ් මිමිණුවේය. ඔහු උගේ හිස ඇල්ලීමට අත දිගු කරත් ඌ ඔහුගේ අත දැක උල් දත් විළිස්සා ගෙරෙව්වේය.

"ශා නියමයිනේ, බලන්න, එයා එයාගේ අම්මව අඳුනනවා!" හැග්‍රිඩ් කීවේය.

Downloaded from sinhalaebooks.com

"හැග්‍රිඩ්," හර්මයිනී කීවාය.  "හරියටම කොච්චර වේගෙන් නෝර්වීජියන් රිජ්බැක්ලා ලොකු වෙනවද?"

හැග්‍රිඩ් උත්තර දීමට හදද්දීම ඔහුගේ මුහුණ එක්වරම සුදුමැලි වී ගියේය. ඔහු වහා නැගිට ජනේලය වෙත දිව ගියේය.

"මොකද්ද ප්‍රශ්නේ?"

"කවුරුහරි ජනෙල් රෙදි අතරේ තිබ්බ ඉඩකින් බලාගෙන හිටියා - ඒ ළමයෙක් -- එයා ආපහු ඉස්කෝලෙට දුවනවා."

හැරී වහා දොර වෙත පැන ඔලුව එළියට දැම්මේය. දුරකදී වුවද ඔහුව අඳුනාගැනීම වරදින්නේ නැත.

මැල්ෆෝයි මකරාව දැක තිබේ.

ඊලඟ සතිය පුරාවට මැල්ෆෝයිගේ මුහුනේ වූ ගුප්ත සිනාව විසින් රොන්, හැරී සහ හර්මයිනීව නොසන්සුන් කරවීය. ඔවුන් තම නිවාඩු වෙලාවල් වැඩිපුරම යෙදවූයේ හැග්‍රිඩ්ගේ අඳුරු කළ කුටියේ ඔහු සමග සාකච්ඡා කරමිනි.

"එයාට යන්න අරින්න," හැරී බළ කලේය. "එයාව නිදහස් කරන්න."

"මට බෑ," හැග්‍රිඩ් කීවේය. "එයා පොඩි වැඩී. එයා මැරෙයි."

ඔවුන් මකරා දෙස බැලූහ. ඌ සතියක් ඇතුළත තුන් ගුණයක් දිගින් වැඩී සිටියේය. දිගින් දිගටම උගේ නාස් පුඩු වලින් දුම් පිට විය. මකරා නිසාම කාර්යබහුල වූ හැග්‍රිඩ් තම ක්‍රීඩාපිටි පාලන වැඩ සිදු කර තිබුනේ නැත. පොළොව පුරා හිස් බ්‍රැන්ඩි බෝතල් සහ කුකුල් පිහාටු විය.

"මම තීරණය කරා එයාට නෝබට් කියලා කතා කරන්න" හැග්‍රිඩ් කඳුලු පිරි දෑසින් මකරා දෙස බලා කීවේය. "එයා මාව හොඳටම අඳුනනවා දැන්. මේ බලන්න.  නෝබට්, නෝබට්.. අම්මා කොහේද?"

"එයාගේ ඔලුව නරක් වෙලා," රොන් හැරීගේ කණට කෙඳිරුවේය.

Downloaded from sinhalaebooks.com

"හැග්‍රිඩ්" හැරී ශබ්ද නගා කීවේය. "සති දෙකෙන් ඌ ඔයාගේ ගෙදර තරම් දික් වෙයි. මැල්ෆෝයි කොයිවෙලේ හරි ඩම්බල්ඩෝ ලඟට යන්න පුළුවන්."

හැග්‍රිඩ් තම තොල සපාගත්තේය.

"මම - මම දන්නවා මට එයාව හැමදාම තියාගන්න බෑ කියලා. ඒත් මට එයාව නිකම්ම විසිකරන්න බෑ. මට බෑ."

හැරී එක්වරම රොන් දෙසට හැරී "චාලි" කීවේය.

"ඔයාටත් ඔලුව හොඳ නැති වේගෙන එනවා," රොන් කීවේය. "මම රොන්, මතකද?"

"නෑ - චාලි - ඔයාගේ අයියා, චාලි. රොමේනියාවල ඉන්නේ. මකරු අධ්‍යයනය කරන්නේ. අපිට පුළුවන්නේ නෝබට්ව එයාට යවන්න. චාලිට පුළුවන් එයාව බලාගෙන පස්සේ කැළේට දාන්න!"

"නියමයි!" රොන් කීවේය. "ඒ ගැන හැග්‍රිඩ් මොකද හිතන්නේ?"

අවසානයේදී චාලිගෙන් ඒ ගැන ඇසීමට ඔවුන් බක්මූණෙක් යැවිය යුතු බවට හැග්‍රිඩ් එකඟ විය.

ඊළඟ සතිය බොහෝ දිගු එකක් විය. බදාදා රෑ හර්මයිනී සහ හැරී පොදු කාමරයේ අනෙක් සියල්ලෝම නින්දට ගිය පසුත් තනිවම ඉඳගෙන සිටියහ. පිතුරය පිටුපස විවරය විවෘත වනවිට බිත්ති ඔරලෝසුවේ දොළහ නාද වූවා පමණි. රොන් එක්වරම හැරීගේ අදිසි ලෝගුව ඉවත් කර එළියට මතු විය. ඔහු පහළ හැග්‍රිඩ්ගේ කුටියට ගොස් සිටියේය. දැන් ලී පෙට්ටියක දැමූ මැරුනු මීයන් ආහාරයට ගන්නට පටන් ගත් නෝබට්ට ආහාර දීමට උදව් වීමට රොන් ගියේය.

"ඌ මාව හැපුවා!" ලේ වැකුණ ලේන්සුවකින් වෙලාගත් අත පෙන්වමින් ඔහු කීවේය. "මට සතියක්වත් පෑනක් අල්ලන්න බැරිවෙයි. මම කියන්නේ මට මෙච්චර කාලෙකට හම්බ වෙච්ච භයානකම සතා තමයි ඔය මකරා. ඒත් හැග්‍රිඩ් ඌ ගැන කියන විදිහට කෙනෙක්ට හිතෙයි ඌ පුංචි පුළුන් පිරිච්ච හා පැටියෙක් කියලා. ඌ මාව හැපුවම මම ඌව බයකලා කියලා එලෙව්වා. මම එනකොට එයා ඌට නැළවිලි ගී කියනවා."

අඳුරු ජනේලයට තට්ටු කරන ශබ්දයක් ආවේය.

"ඒ හෙඩ්විග්!" කියූ හැරී වහා ඌට ඇතුල් වීමට ජනේලය විවෘත කළේය. "එයා චාලිගෙන් උත්තරයක් ගෙනල්ලා ඇති.!"

Downloaded from sinhalaebooks.com

තුන් දෙනාම හිස් ලං කරගෙන තුන්ඩුව කියවන්නට පටන් ගත් හ.

ආදරණීය රොන්,

ඔයාට කොහොමද? ලියුමට ස්තූතියි. මම ආසයි නෝර්වීජියන් රිජ්බැක් කෙනෙක්ව ගන්න, ඒත් එයාව මෙහෙට ගේන එක ලේසි වෙන්නේ නෑ. මට හිතෙන්නේ හොඳම දේ ලබන සතියේ මාව බලන්න එන යාලුවෝ කට්ටියක් අතේ එවන එක. ප්‍රශ්ණේ එයාලා නීති විරෝධී මකරෙක්ව අරන් යනවා කවුරුත් දකින්න බෑ.

ඔයාට පුළුවන්ද සෙනසුරාදා රෑ දොළහට රිජ්බැක්ව උසම කුළුණ උඩට ගේන්න? එයාලට ඔයාව එතන මුණගැහිලා ඌවත් අරන් කළුවරේම එන්න පුළුවන්..

පුළුවන් ඉක්මනට මට උත්තරයක් එවන්න.

ආදරය සමගින්,

චාලි.

ඔවුන් එකිනෙකා දෙස බැලූහ.

"අපිට අදිසි ලෝගුව තියනවා" හැරී කීවේය. "ඒක ගොඩාක්ම අමාරු වෙන එකක් නෑ - මම හිතන්නේ ලෝගුවෙන් අපි දෙන්නෙක්වයි නෝබට්වයි වහගන්න පුළුවන්."

අවසන් සතිය කොපමණ නරක් වූයේද තහවුරු කරමින් අනෙක් දෙදෙනා වහා ඔහු හා එකඟ විය. නෝබට් සහ මැල්ෆෝයිගෙන් ගැලවීමට ඕනේ දෙයක්.

පසුදා උදෑසන වන විට රොන්ගේ තුවාල් අත සාමාන්‍ය ප්‍රමාණය මෙන් දෙගුණයකට ඉදිමී තිබුණෙන් සියල්ලට බාධා විය. එය මැඩම් ප්‍රොම්ෆ්‍රේට පෙන්වීම ආරක්ශිතදැයි යන්න ඔහු දැන සිටියේ නැත. ඇය මකර සපාකෑමක් අඳුනා ගනීද? හවස් වන විට ඔහුට වෙන කළ හැක්කක් තිබුනේ නැත. තුවාලය අප්‍රසන්න කොළ පැහැයකට හැරෙමින් තිබිණි. පෙනුන විදිහට නෝබට්ගේ දත් විශ සහිතය.

දවස අවසානයේ ඉසපිරිතාල කාමරයට දිව ගිය හැරී සහ හර්මයිනීට බරපතල තත්වයෙන් ඇඳට වී සිටින රොන් දක්නට ලැබිණි.

Downloaded from sinhalaebooks.com

"මගේ අත විතරක් නෙවෙයි," ඔහු රහසින් කීවේය. "ඒක හැලෙන්න යනවා වගේ දැනෙන්නේ. මැල්ෆෝයි ආවා මැඩම් ප්‍රොම්ෆ්‍රේට කියලා මගෙන් පොතක් ඉල්ලගන්න තියනවා කියලා. ඌට ඇවිත් මෙතන හොඳට හිනා වෙන්න පුවන්නේ. ඌ එයාට දිගටම තර්ජනය කරලා අහලා මාව ඇත්තටම මොකෙද්ද හැපුවේ කියලා.  මම එයාට කිව්වේ බල්ලෙක් කියලා- ඒත් එයා ඒක විශ්වාස කළේ නෑ මම හිතන්නේ. - මම අරුට ක්‍රිඩ්ච් තරගේ දවසේ ගහන්නේ නැතිව ඉන්න තිබ්බේ. ඒකයි ඌ මේවා කරන්නේ."

හැරී සහ හර්මයිනී රොන්ව සන්සුන් කිරීමට උත්සාහ කළෝය.

"ඔක්කොම දේවල් සෙනසුරාදා රෑ දොළහ වෙනකොට ඉවරයිනේ," හර්මයිනී කීවත්  රොන් එයින් කෙසේවත් සැනසුනේ නැත.  ඔහු ඇඳ මත දහඩිය දමමින් ඉද්ද ගසුවාක් මෙන් කෙළින්විය.

"සෙනසුරාදා රෑ දොළහට!" ඔහු බැරන්ඩි හඬකින් කීවෙය. "අයියෝ නෑ අයියෝ - මට දැන් මතක් වුනේ - චාලි එවපු ලියුම මැල්ෆෝයි ගත්ත පොත ඇතුලේ, ඌ දැන්ගනී අපි නෝබට්ව යවන්න හදනවා කියලා."

හැරී සහ හර්මයිනීට උත්තර දීමට කාළයක් ලැබුනේ නැත. මැඩම් ප්‍රොම්ෆ්‍රේ පැමිණ රොන් නිදා ගත යුතු බව පවසමින් ඔවුන්ව පිටතට යැව්වාය.

"හැමදේම වෙනස් කරන්න දැන් හොඳටම කල් මදි," හැරී හර්මයිනීට කීවේය.. "අපිට චාලිට තව බකමූණෙක් යවන්න කාළයක් නෑ, අනික නෝබට්ව යවන්න අපිට ලැබෙන එකම අවස්තාව මේක වෙන්න පුළුවන්. අපිට අවධානමක් ගන්න වෙනවා. අනික අපිට අදිසි ලෝගුව තියනවානේ, මැල්ෆෝයි ඒක ගැන දන්නේ නැනේ."

ඔවුන් හැග්‍රිඩ්ට සියල්ල දැනුම් දීමට යන විට ෆැන්ග්, බෝහවුන්ඩ් බල්ලා, වෙලූ නගුටත් සමග කුටියෙන් එළියේ සිටිනු හමුවිය. හැග්‍රිඩ් ජනේලයක් ඇර ඔවුන් හා කතා කළේය.

"මම ඔයාලට ඇතුලට එන්න දෙන්නේ නෑ," ඔහු කීවේය. "නෝබට් ඉන්නේ අමුතු තත්වෙක - කිසි දේකින් පාළනය කරන්න බෑ."

ඔවුන් චාලිගේ ලියුම ගැන ඔහුට කියූ විට ඔහුගේ ඇස් වල කඳුලු පිරිණි. ඒ නෝබට් ඒ වෙලේ ඔහුගේ කකුල හැපූ නිසා වන්නටත් පුලුවනි.

"ආහ්! ඒකට කමක් නෑ, එයාට මගේ බූට් සපත්තුව විතරයි අහු වුනේ  - සෙල්ලම් කරනවා - මොනා උනත් එයා තාම බබෙක්නේ."

Downloaded from sinhalaebooks.com

බබා තම වළිගයෙන් බිත්තියට පහර දුන්නෙන් ජනෙල් දෙදරුවේය. හැරී සහ හර්මයිනී ආපසු මාලිගයට ගියේ සෙනසුරාදා මීට කළින් එන්න බැරිදැයි සිතමිනි.

තමන්ට කිරීමට තිබූ කායී ගැන බොහෝ කණගාටු වෙමින් නොසිටියේ නම් ඔවුන්ට හැග්‍රිඞ් නෝබර්ට්ගෙන් සමුගත් මොහොතේ බොහෝ දුක සිතෙන්නට ඉඩ තිබිණි. එය ඉතා අඳුරු, වළාකුලින් පිරි රාත්‍රියක් විය. ඇතුල්වීමේ ශාලාවේ බිත්තිය සමග ටෙනිස් ක්‍රීඩා කරමින් සිටි පීව්ස් ඉවත් වෙන තෙක් සිටීමට සිදු වීමෙන් ඔවුන්ට හැග්‍රිඞ්ගේ කුටිය වෙත යාම මදක් පමා විය. හැග්‍රිඞ් නෝබර්ට්ව කූඩුවක දමා සූදානම් කර තිබිණි.

"එයා ගොඩක් මීයො කාලා බ්‍රැන්ඩි ටිකකුත් බීලා ලෑස්තිවෙලා ඉන්නේ ගමනට.," හැග්‍රිඞ් කැඩුනු හඬකින් කීවේය. "මම එයාගේ ටෙඩී බෙයාවත් දැම්මා. එයාට තනි හිතුනොත් කියලා"

කූඩුව ඇතුලෙන් යමක් ඉරෙන ශබ්දයක් ආවෙන් හැරී සිතුවේ ඒ ටෙඩීගේ බෙල්ල විය යුතු බවයි.

"බායි-බායි, නෝබර්ට්!" හැරී සහ හර්මයිනී නෝබර්ට්ව අදිසි ලෝගුවෙන් වසා ඔවුනුත් ඒ තුළට රිංගද්දී හැග්‍රිඞ් ඉකි ගැසුවේය. "අම්මට කවදාවත් ඔයාව අමතක වෙන්නේ නෑ!"

ඔවුන් කූඩුව කෙසේ මාලිගයට ගෙනාවාදැයි ඔවුන් වත් දැන සිටියේ නැත. ඔවුන් ඇතුල්වීමේ ශාලාවේ ගල් පඩිපෙළ නැග අඳුරු කොරිඩෝ දිගේ නෝබර්ට්ව ඔසවාගෙන යද්දී රාත්‍රී දොළහට ලං වෙමින් තිබිණි. තවත් පඩිපෙළක් ඉහළට, ඉන්පසු තව එකක් - හැරීගේ කෙටි මඟවත් ඒ වැඩේ පහසු කළේ නැත.

"දැන් ළඟයි!" උසම කුළුන යට වූ කොරිඩෝවට ලඟාවෙත්ම හැරී හති දමමින් කීවේය.

ඉන්පසු ඉදිරියේ වූ සෙළවීමක් නිසා ඔවුන්ට කූඩුව අත හැරෙන්නටම ගියේය. තමන් දැනටමත් අදිසි බව අමතක වූ ඔවුන් සෙවනැලි අතර සැඟවී ගෙන අඩි දහයක් පමණ ඈතින් එන අඳුරු සෙවණැලි දෙක් දෙස බළා සිටින්නට වූහ. ලාම්පු එළියක් පැතිරිණි.

කොටු සහිත නිදන කබායක් හැඳ හිස නෙට් එකකින් ආවරණය කරගත් ප්‍රොෆෙසර් මැක්ගොනගල් මැල්ෆෝයිගේ කණෙන් ඇදගෙන ආවාය.

"දැඩි දඬුවම්!" ඇය කෑ ගැසුවාය. "ස්ලිදරින් වලින් ලකුණු විස්සක් කපනවා. ඊ මැද හැම තැනම ඇවිදිනවා. මොන හයියක්ද ආ - - "

"ඔයාට තේරෙන්නේ නෑ ප්‍රොෆෙසර්. හැරී පොටර් එනවා - එයා ලඟ මකරෙක් ඉන්නවා!"

Downloaded from sinhalaebooks.com

"මොන පිස්සු විකාරද! තමුන් ඔය වගේ බොරු කියන්නේ මොකද! ඉක්මන් කරනවා - මම තමුන් ගැන ප්‍රොෆෙසර් ස්නේප්ට කියන්න ඕනේ, මැල්ෆෝයි!"

ඉන්පසු කුළුණ උඩට පඩිපෙළ දිගේ නැඟීම ලොව තිබෙන පහසුම දේ ලෙස දැනෙන්නට විය. සීතල රාත්‍රියේ සුළඟ සහිත වටපිටාවට පය තබත්ම ඔවුන් අදිසි ලෝගුව ඉවත් කොට සතුටින් පහසුවෙන් හුස්ම ගත් හ. හර්මයිනී කිංකිනි සිනාවක් දැම්මාය.

"මැල්ෆෝයිට දැඩි දඬුවම්! මට සිංදුවක් කියන්න පුළුවන්!"

"එපා," හැරී උපදෙස් දුන්නේය.

මැල්ෆෝයි ගැන කියමින් සිනා සෙමින් ඔවුන් එහි රැඳී සිටියහ. නෝබට් කූඩුව තුළ දඟලන්නට විය. මිනිත්තු දහයකට පමණ පසු අඳුරේම කොසු හතරක් වේගෙයෙන් පහළට පැමිණියේය.

චාලිගේ යහලුවන් ප්‍රීතිමත් පිරිසකි. ඔවුන් හැරී සහ හර්මයිනීට තමන් ගෙන ආ අශ්ව සන්නාහයක් පෙන්වූහ. එහි අතර නෝබට් රඳවාගෙන යා හැකි විය. ඔවුන් සියලු දෙනා එකතු වී නෝබට්ව එහි රැඳවූ පසු හැරී සහ හර්මයිනී සියල්ලෝගේම අත් අල්ලා ස්තූති කළහ.

අන්තිමේදී නෝබට් යනවා... යනවා... ගියා.

ඔවුන් බොහෝ හිත් සැහැල්ලුවෙන් පඩිපෙළ පල්ලෙහාට බැස්සෝය. දැන් නෝබට් ඔවුන්ගෙන් දුරස් ය. දැන් මකරුන් නෑ - මැල්ෆෝයි දඬුවම් ලැබුවා. - මොකක් ඔවුන්ගේ සතුට විනාශ කරන්නද?

උත්තට පඩිපෙළ කෙළවර බලා සිටියේය. ඔවුන් කොරිඩෝවට පය තබත්ම ෆ්ලිච්ගේ මුහුණ අඳුරින් මැත් විය.

"හොඳයි, හොඳයි" ඔහු රහසින් කීවේය. "අපි අමාරුවේ වැටුනා."

ඔවුන් කුළුණ උඩ අදිසි ලෝගුව දමා ඇවිත් තිබිණි.

පහළොස් වෙනි පරිච්ඡේදය

Downloaded from sinhalaebooks.com

තහනම් කැළෑව

කිසි දෙයක් මීට වඩා නරක් වී තිබුනේ නැත.

ෆ්ලිච් ඔවුන්ව පළමු මහලේ පිහිටි ප්‍රොෆෙසර් මැක්ගොනගල්ගේ අධ්‍යයන කාමරය වෙත ගෙන ගියේය. එහිදී ඔවුන් එකිනෙකා සමග වචනයක්වත් කතා නොකර වාඩි වී සිටියහ. හර්මයිනී ඇතුලතින් කඩා වැටෙමින් සිටියාය. නිදහට කරුණු, තමන් එහි නොසිටි බව, වැරැද්ද වසා ගත හැකි බොරු කතා හැරීගේ හිස තුල දැඟලුවේය. සියල්ල නිශ්ඵල ය. මෙවර ගැලවිය හැකි ක්‍රමයක් ඔහුට නොපෙනේ. ඔවුන් කොටු විය. ඔවුන් ලෝගුව අමතක කිරීමට තරම් මෝඩ වූයේ කෙසේද? කාමරේ නොසිට මහ රෑ ඉස්කෝලේ පුරා ඇවිදින එක ගැන  ප්‍රොෆෙසර් මැක්ගොනගල් පිළිගන්නා කිසිම හේතුවක් මෙලොව නොවීය. ඊටත් වඩා පංතියකට ඇරෙන්නට දුරේක්ෂ සහිත උසම කුළුණට යාම සිසුන්ට තහනම් විය. නෝබට් සහ අදිසි ලෝගුවත් මෙයට එක් වූ විට දැනටමත් ගෙදර යාමට බෑග් ඇසිරීම සුදුසු මෙන් දැණිනි.

මෙය මීට වඩා දරුණු විය හැකි බව හැරී සිතුවාද? ඔහු වැරදිය. ප්‍රොෆෙසර් මැක්ගොනගල් පැමිනෙන විට නෙවිල්ද කැඳවාගෙන ආවාය.

"හැරී!" අනිත් දෙදෙනා දුටු හැටියේම නෙවිල් අඬන්නට පටන් ගත්තේය. "මම ඔයාලව හොයන්න හැදුවේ අනතුරු අඟවන්න. මට ඇහුනා මැල්ෆෝයි ඔයාවා අල්ලගන්නවා කියනවා. එයා කිව්වා ඔයා ලඟ මක - - "

හැරී නෙවිල්ට කටවසාගන්න අඟවමින් පිස්සුවෙන් මෙන් හිස වැනුවේය. නමුත් ප්‍රොෆෙසර් මැක්ගොනගල් එය දුටුවාය. ඇය ඔවුන්ට ළංවත්ම හුස්ම හෙලුවේ නෝබට්ටත් වඩා ගින්දර විදින්නාක් මෙන් දනවමිනි.

"ඔයාලා කිසි කෙනෙක්ගෙන් මම මේක බළාපොරොත්තු උනේ නෑ. ෆ්ලිච් මහත්තයා කියනවා ඔයාලා අභ්‍යාවකාශ විද්‍යා කුළුණේ හිටියා කියලා. දැන් පාන්දර එකයි වෙලාව. ඒ ගැන තමුන්ලට මොනාද කියන්න තියෙන්නේ."

එය හර්මයිනී ගුරුවරයෙකුට උත්තර බැරිවූ පළමු වතාවවිය. ඇය පිළිමයක් මෙන් ඇගේ සෙරෙප්පු දෙසම බලා සිටියාය.

"මම හිතන්නේ මෙතන වෙන්නේ මොකද්ද කියලා මට හිතා ගන්න පුළුවන්.," ප්‍රොෆෙසර් මැක්ගොනගල් කීවාය. "ඒක තේරුම් ගන්න මහ ලොකු බුද්ධිමතෙක් වෙන්න ඕනේ නෑ. තමුන් ඩ්‍රේකෝ මල්ෆෝයිට මකරු ගැන සීනී බෝල කතාවක් කියලා එයාව කාමරෙන් එලියට අරන් කරදරේ දාන්න හැදුවේ. මම එයාව දැනටමත් අල්ලගත්තා. මම හිතන්නේ මෙතන ඉන්න මේ ලොන්ග්බොටමුත් ඔය කතාව අහලා රැවටෙන එක හරි විහිලුවක් කියලා තමුන් හිතාගෙන ඇති නේ?"

Downloaded from sinhalaebooks.com

හැරී නෙවිල්ගේ ඇස් දෙස බලා මේ සියල්ල ඇත්ත නොවන බව ඇඟවීමට උත්සාහ කළේය. මන්ද නෙවිල් බොහෝ සිත රිදවාගෙන පුදුමයෙන් ගල් ගැසී බලා සිටියේය. අසරණ , අතපසුවීම් වෙන නෙවිල් - ඔහුට අඳුරේ ඔවුන් සොයා විත් අනතුරු ඇඟවීමට උත්සාහ කිරීම කොපමණ අපහසු වන්නට ඇත්දැයි හැරී දැන සිටියේය.

"හරිම අප්‍රසන්නයි," ප්‍රොෆෙසර් මැක්ගොනගල් කීවාය. "එක රැයකදී ළමයි හතර දෙනෙක් කාමර වලින් එළියේ! මම මීට කලින් කවදාවත් එහෙම දෙයක් අහලා නෑ! තමුන්, ග්‍රැන්ජර්, මම හිතුවා තමුන්ට මීට වැඩිය මොළේ තියනවා කියලා. එතකොට තමුන්, පොටර්, මම හිතුවේ තමුන්ට ග්‍රිෆින්ඩෝ මීට වඩා වටිනවා ඇති කියලා. ඔය තුන්දෙනාටම දැඩි දඬුවම් නියම කරනවා. ඔව් තමුන්ටත් එක්ක ලොන්ග්බොටම්, ඉස්කෝලේ ඇතුලේ රෑ තිස්සේ ඇවිදින්න කිසි හෙතුවක් වටින්නේ නෑ. විශේෂයෙන් මේ දවස් වල. ඒක බොහොම භයානකයි. ග්‍රිෆින්ඩෝ වලින් ලකුණු පනහක් අඩුකරනවා.."

"පණහක්?" හැරී ගැසුණේය. - ඔවුන් අන්තිම කුඩිච් තරඟයෙන් ඉදිරියට ආ එක නැති වෙන්නට ඉඩ තිබේ.

"හැමෝගෙන්ම ලකුණු පනහ ගානේ," තම දිගු උල් නාසයෙන් තදින් හුස්ම ගනිමින් ප්‍රොෆෙසර් මක්ගොනගල් කීවාය.

"ප්‍රොෆෙසර් අනේ ඔයාට එහෙම කරන්න බෑ?" හැරී කෙඳිරිගෑවේය.

"මට කරන්න පුළුවන් දේවල් බැරි දේවල් කියන්න ඕනේ නෑ, පොටර්. දැන් යනවා නිදාගන්න. ඔක්කොමලම. මම ග්‍රිෆින්ඩෝ ළමයි නිසා මේ තරම් ලැජ්ජා වෙලා නෑ කවදාවත්ම."

ළකුණු එකසිය පණහක් අහිමි විය. මේ නිසා ග්‍රිෆින්ඩෝ එක් රාත්‍රියක් තුළදී අන්තිමයන් බවට පත් කොට තිබිණි. නිවාස කුසලාණය ලබා ගැනීමට ග්‍රිෆින්ඩෝ වෙත තිබූ සියලු අවස්ථා එක් රැයකින් ඔවුන් විනාශ කොට තිබිණි. හැරීට දැනුනේ අමාශයේ පහළ කොටස ගිලී ගියාක් මෙනි. ඔවුන් මේකෙන් කොහොම ගැලවෙන්නද?

හැරී මුලු රාත්‍රිය පුරා නිදාගත්තේ නැත. පැය ගණනාවක් පුරා නෙවිල් තම කොට්ටය බදාගෙන ඉකිගසනු ඔහුට ඇසුණි. ඔහුව සනසන්නට කීමට දෙයක් හැරීට හිතාගන්නට නොහැකි විය. ඔහු නෙවිල් දැන සිටියේය. ඔහු තමා මෙන් ඇතුලතින් කඩා වැටෙනු ඇති. අනිත් ග්‍රිෆින්ඩෝවරු තමන් කළ දේ දැනගත් විට කුමක් සිදුවෙයිද?

පසුදින නිවාස ළකුණු පෙන්නුම් කරන වැලි ඔරලෝසුව පහු කරන ග්‍රිෆින්ඩෝවරු මුලින් සිතුවේ එහි යම් වරදක් සිදු වී ඇති බවය. එක්වරම ඊයේ දිනට වඩා අද ලකුණු එකසිය පණහක් අඩු වූයේ කොහොමද? ඉන්පසු කතාව පැතිරෙන්නට විය: හැරී පොටර්, සුප්‍රසිද්ධ හැරී පොටර්, කුඩිච් තරඟ දෙකක ඔවුන්ගේ වීරයා ඒ සියළුම ලකුණු ඔවුන්ට අහිමි කර තිබේ, ඔහු සහ තව මෝඩ පළමු වසරේ සිසුන් දෙදෙනෙක්..

Downloaded from sinhalaebooks.com

පාසලේ බොහෝ පැසසුම් ලබන් සිසුන්ගෙන් කෙනෙක් බවට පත් වී සිටි හැරී එකවරම බොහෝ වෛරයට ලක් වන සිසුවෙක් බවට පත් විය. රේවන්ක්ලෝ සහ හෆල්පෆ් පවා ඔහුව අප්‍රිය කළහ. මන්ද සියලු දෙනා බලා සිටියේ ස්ලිදරින් නිවාස කුසලාණය පරදින තුරුයි. හැරී ගිය හැම තැනකදීම ඔවුන් ඇඟිල්ල දිගු කර ඔහුව පෙන්වමින් හඬනගා ඔහුට අපහාස කළහ. අනික් අතට ස්ලිදරින්වරු ඔහු ළඟින් යන විට විසිල් ගසා ප්‍රීතිඝෝෂා කොට අත්පුඩි ගැසූහ. "ස්තූතියි පොටර්, අපි ඔයාට ණයගැතියි!"

ඔහුගේ පැත්තට හිටියේ රොන් පමණි.

"එයාලා ඔක්කොම ඕක සති කීපයක් යනකොට අමතක කරයි. ෆ්‍රෙඩ් ජෝජ් දෙන්නා මෙහේ හිටපු මුලු කාලෙම ගොඩක් ලකුණු කපාගෙන තියනවා. ඒත් එයාලට තාම හැමෝම ආදරෙයි."

"එයාලා කවදාවත් එකපාරකින්ම එකසිය පණහක් නැති කරගෙන නැනේ නේද. එහෙම තියනවද ?" හැරී දුකෙන් කීවේය.

"ම්ම් - නෑ," රොන් පිළිගත්තේය.

සිදුවූ හානිය පිළිසකර කිරීමට පමා වූවා වැඩිය. නමුත් මින් පසු තමාට අදාල නැති දේට සම්භන්ධ නොවීමට හැරී තමාටම දිවුරුවේය. රහසින් හැමතැනම ගොස් ඔත්තු බැලීම ඔහුට එපා විය. තමා ගැනම ලජ්ජා වූ හේ වුඩ් වෙත ගොස් ක්‍විඩිච් කණ්ඩායමෙන් ඉල්ලා අස්වීමට අවසර ඉල්ලුවේය.

"අස්වෙන්න?" වුඩ් කෑගැසුවේය. "ඒකෙන් වෙන හොඳේ මොකද්ද? අපි ක්‍විඩිච් වලින් දිනුවේ නැත්තන් ලකුණු කීයක් හරි ආපහු ගන්නේ කොහොමද?"

නමුත් ක්‍විඩිච් වල තිබූ විනෝදයත් නැති වී තිබිණි. කණ්ඩායමේ අනෙක් අය හැරී සමග කතා කලේ නැත. ඔවුන්ට ඔහු ගැන කතා කිරීමට අවශ්‍ය වූ විට ඔහුව "සොයන්නා" ලෙස හඳුන්වමින් කතා කළහ.

හර්මයිනී සහ නෙවිල් ද අමරුවේ වැටී තිබෝණ. ඔවුන්ට හැරීට තරම් නරක කාළයක් නොතිබුණි. මන්ද ඔවුන් හැරී තරම් හොඳින් දන්නා අය නොවීය. නමුත් කිසිවෙක් ඔවුන් සමග කතා කළේත් නැත. පංති වලදී හර්මයිනී තමා වෙත අවධානය ලබා ගැනීම නවතා තිබුනි. ඈ හිස නවාගෙන නිහඬව වැඩ කළාය.

විභාග වලට එතරම් කාළයක් නොමැති වීම ගැන හැරී සතුටු විය. පාඩම් වැඩ විසින් ඔහුගේ හිතේ වූ කණස්සල්ල පළවා හැරියේය. ඔහු රොන් සහ හර්මයිනී රෑ වෙන තෙක් වැඩ කරමින් අමාරු සංයෝජන වල මූල ද්‍රව්‍ය කටපාඩම් කරමින්, වශී සහ මන්තර කට පාඩම් කරමින්, මායා ලොවේ සොයා ගැනීම් වල සහ අභූතු මිට්ටන්ගේ කුමන්ත්‍රණ වල දින වකවානු මතක තබාගනිමින් කල් ගෙවීය.

Downloaded from sinhalaebooks.com

ඉන්පසු, විභාග ආරම්භ වීමට සතියක් තබා හැරීගේ තමන්ට අදාල නැති දේවලට අත නොදැමීමේ බලාපොරොත්තුව පරීක්ශාවට ලක් කෙරිණි. තනිවම පුස්තකාලයේ සිට ආපසු එන අතරේ ඉහල පංති කාමරයක වූ කසු කුසුවක් ඔහුගේ කණ වැකිණි. ඔහු ලං වත්ම ඔහුට කුරල්ගේ කටහඬ ඇසිණි.

"එපා - එපා - කරුණාකරලා, අයේත් එපා- - "

එය ඇසුණේ කවුරුන් හෝ ඔහුට තර්ජනය කරනවා වගේයි. හැරී තව ටිකක් ලං විය.

"හරි - හරි - - " කුරල් ඉකි ගසන ශබ්දය ඔහුට ඇසිණි.

ඊලඟ තප්පරයේදී කුරල් තම තලප්පාව කෙළින් කරමින් ඉක්මන් ගමනින් පංති කාමරයෙන් ඉවතට ආවේය. ඔහු සුදුමැළි වී අඩන්නට ඔන්න මෙන්න මෙන් පෙනිණ. ඔහු නොපෙනී ගියේය. ඔහුට තමාව පෙනුනේවත් නැති බව හැරීට  දැනිණි. කුරල්ගේ අඩි හඬ නැතිවී යන තෙක් හැරී නැවතුනෙය. ඉන්පසු ඔහු පංතිකාමරයට එබී බැලුවේය. එය හිස් වුවත් අනෙක් පස වූ දොර විවෘතව තිබිණි. හැරී දොර වෙත යද්දී තමා තමන්ටම වූ පොරොන්දුව මතක් විය.

ඒ සමග තමන් ස්නේප් එම කාමරයෙන් දැන් පිට වූ බවට මායා පාශාණ දොළහක් ඔට්ටු තියන තරමට විශ්වාස කළේය. තමාට ඇසුණු දේ අනුව ස්නේප් සතුටින් උඩ පනිමින් යනු ඇති බව ඔහුට හැඟිනි. අවසානයේ කුරල් යටත් වී තිබේ.

හැරී පුස්තකාළය වෙත ආපසු යද්දී හර්මයිනී රොන්ගේ අභ්‍යවකාශ විද්‍යා දැනුම පරික්ශා කරමින් සිටියාය. හැරී තමාට ඇසුණු දේ ඔවුන්ට කීවේය.

"ස්නේප් එහෙනං ඒක කරා!" රොන් කීවේය. "කුරල් එයාට කිව්වනම් තමන්ගේ අඳුරු බලවේග වලට එරෙහි මන්තරේ කඩන් විදිහ"

"ඒත් තාම ෆල්ෆී ඉන්නවානේ," හර්මයිනී කීවාය.

"සමහර විට හැග්‍රිඩ්ගෙන් අහන්නේ නැතිව ස්නේප් ඌව පහු කරන විදිහ හොයා ගත්තා වෙන්න පුළුවන්," තමා වටා වූ දහස් ගාණක් පොත් දෙස බලමින් රොන් කීවේය. "ඔට්ටුයි මේ කොහේ හරි පොතක් ඇති යෝධ ඔලු තුනේ බල්ලෙක්ව හීලෑ කරගන්න විදිහ තියෙන. ඉතිං අපි මොකද කරන්නේ හැරී?"

Downloaded from sinhalaebooks.com

වික්‍රමාන්විතයක ආලෝකය රොන්ගේ ඇස් වල නැවත දිළිසුනේය. නමුත් හැරීට පෙර හර්මයිනී උත්තර දුන්නාය.

"ඩම්බල්ඩෝ ළඟට යන්න. ඒක අපිට කරන්න තිබ්බේ කාළෙකට කලින්. අපි තනියම මොනාහරි කරන්න හැදුවොත් අනිවාර්යයෙන් අපිව එළියට දානවා."

" ස්නේප්ට කියන්න තියෙන්නේ හැලෝවීන් දවසේ ට්‍රෝල් ඇතුළට ආපු හැටි දන්නේ නෑ කියන්නයි එයා තුන්වෙනි තට්ටුව පැත්තේවත් හිටියේ නෑ කියන්නයි විතරයි. එයාලා කාව විශ්වාස කරයි කියලද ඔයලා හිතන්නේ, එයාවද අපිවද? අපි එයාට වෛර කරනවා කියන එක රහසක්ම නෙවෙයිනේ. ඩම්බල්ඩෝ හිතයි අපි එයාව අයින් කරවන්න කතාවක් හැදුවා කියලා. ෆ්ලිච් උදව් කරයි ඒක එයාගේ ජීවිතේට ප්‍රශ්ණයක් විතරක් නම්. එයා ස්නේප් එක්ක ගොඩක් යාලුයි, අනික ළමයි වැඩිපුර එළියට දාන තරමට හොඳයි කියලා එයා හිතන්නේ. අනිම අමතක කරන්න එපා අපි පාශාණය ගැනවත් ෆ්ලෆී ගැන වත් දැනගන්න තහනම්. ඒ ගැන ලොකු විස්තරයක් කරන්න වෙයි."

හර්මයිනී එය පිළිගත් බව පෙනුනත් රොන් එසේ නොවීය.

"අපි පොඩ්ඩක් වට පිටාවට එබිලා බැලුවොත්- - "

"බෑ," හැරී ස්ථිරව කීවේය. "අපි වටපිටේ එබිකම් කරා හොඳටම ඇති"

ඔහු බ්‍රහස්පති ග්‍රහයාගේ සිතියමක් එළියට ගෙන එහි චන්ද්‍රයන්ගේ නම් කටපාඩම් කරන්නට පටන් ගත්තේය.

පසුදා උදෑසන කෑම මේසයේදී හැරී, හර්මයිනී සහ නෙවිල් වෙත සටහනක් ලබා දෙන ලදී. ඒවායේ වූයේ එක සමාන සටහනකි.

ඔබගේ දඬුවම අද රාත්‍රී එකොළහට ක්‍රියාත්මක වේ. ෆ්ලිච් මහතාව ඇතුල්වීමේ ශාලාවේදී හමුවන්න.

ප්‍රොෆෙසර් මැක්ගොනගල්

අහිමි වූ ලකුණු වලට අමතරව දඬුවමක් විඳීමට තිබෙන බව හැරීට අමතක වී තිබිණි. පාඩම් කිරීමට තිබෙන සම්පූර්ණ රාත්‍රියක් අපතේ යන බව කියමින් හර්මයිනී මැසිවිලි කියතැයි හැරී බලාපොරොත්තු වූවත් ඈ වචනයක්වත් නොකීවාය. හැරීට මෙන්ම ඇයටත් එය තමන්ට ලැබිය යුත්තක් බව දැනිණි.

Downloaded from sinhalaebooks.com

එදින රාත්‍රී එකොළහට ඔවුන් පොදු කාමරයේදී රොන්ට සමු දී නෙවිල් සමග ඇතුල්වීමේ ශාලාවට ගියහ. ෆ්ලිච් දැනටමත් එහි පැමිණ සිටියේය. මැල්ෆෝයි ද එහි විය. මැල්ෆෝයිටත්ග් දඬුවම් ලැබුණු බව ද හැරීට අමතක වී තිබිණි.

"මගේ පස්සෙන් එන්න," ලාම්පුවක් දල්වා පිටතට යමින් ෆ්ලිච් කීවේය.

"ඔට්ටුයි මීට පස්සේ නම් ඉස්කෝලේ නීතියක් ආපහු කඩන්න කලින් දෙපාරක් හිතයිනේ. හෙහ්?" ඔහු ඔවුන් දෙස බැල්මක් හෙලමින් කීවේය. "ආ ඔව්... මම කියන්නේ බර වැඩයි වේදනාවයි තමයි හොඳම ගුරුවරු.... එයාලා පරණ දඬුවම් ක්‍රම නැති කරලා දාන එක නම් හරිම දුකක්... මැණික් කටුව ළඟින් සිවිලිමේ දවස් කීපයක් එල්ලලා තියන එක වගේ, දම්වැල් ටික තාමත් මගේ කන්තෝරුවේ තියනවා. හොඳට තෙල් දාලා තියන්නේ හදිස්සියේ ඕනේ උනොත් කියලා.... හරි, එහෙනම් අපි යමු, දැන් පැනලා දුවන්න නම් හිතන්නවත් එපා, එහෙම කරොත් තත්වේ තව නරක් වෙයි."

ඔවුන් අඳුරු පිට්ටනිය හරහා ගමන් කළෝය. නෙවිල් එක දිගට නහය ඉහලට ඇද්දේය. තමන්ගේ දඬුවම කුමක් වේ දැයි හැරී සිතමින් සිටියේය. එය මහා භයානක එකක් වෙන්න ඕනේ. නැත්තන් ෆ්ලිච් මේ තරම් සතුටු වෙන්නේ නෑ.

සඳ දීප්තිමත්ව දිළිසුනේය. නමුත් වළාකුළු ඒ මතට පනිමින් ඔවුන්ව අඳුරේ තබන්නට උත්සාහ කළේය. ඉදිරියෙන් ඔවුන්ට හැග්‍රිඩ්ගේ ආලෝකමත් කිටියේ ජනේල හැරීට පෙනේ. ඉන්පසු ඔවුන්ට ඈතින් කෑ ගසන හඬක් ඇසිණි.

"ෆ්ලිච් ඒ ඔයාද? ඉක්මන් කරන්න. මම පටන් ගන්න ඕනේ."

හැරීගේ හදවත සතුටින් උඩ පැන්නේය; ඔවුන් හැග්‍රිඩ් සමග වැඩ කරන්නට යනවානම් එය එතරම් නරක් වන්නට නොහැකිය. ඔහුගේ සැනසීම මුහුණෙන් පෙනුනා වියහැක. මන්ද යත් ෆ්ලිච්, "මම හිතන්නේ ඔයා හිතනවා ඇති අර පිටිසරයා එක්ක වැඩ කරන එකෙන් විනෝද වෙන්න පුළුවන් කියලා නේ? හොඳයි, ආපහු හිතලා බලන්න, කොලුවෝ - ඔයාලා යන්නේ කැළේට, ඔන්න කට්ටියම යහතින් ආවොත් මට හොඳටම වැරදිලා කිව්වහැකි."

මෙහිදී නෙවිල් පොඩි අඳෝනවක් පිට කළේය. මැල්ෆෝයි එතැනම ගල් ගැසී නැවතුනේය.

"කැළේට?" ඔහු කීවේය. "අපිට රෑට ඕකට යන්න බෑ - ඒකේ නානා ප්‍රකාර දේවල් තියනවා -- මම අහලා තියනවා නරවෘකයෝ ඉන්නවලු."

නෙවිල් හැරීගේ කබා අත තදින් අල්ලා ගෙන යමක් හිර වුනාක් වැනි ශබ්දයක් පිට කළේය.

Downloaded from sinhalaebooks.com

"ඒක ඔයාගේ ප්‍රශ්ණයක්. එහෙම නේද?" ෆ්ලිච් සතුටින් කීවේය. "නරවෘකයෝ ගැන හිතන්න තිබ්බා ප්‍රශ්ණ දාගන්න කලින්. නැද්ද මං අහන්නේ?"

හැග්‍රිඩ් අඳුරෙන් එළියට විත් ෆැන්ග් සමගින් ඔවුන් ඉදිරියට ආවේය. ඔහු තම විශාල දුන්න රැගෙන් ආ අතර ඔහුගේ උරහිසේ ඊතල මිටියකින් යුත් රඳවනයක් එල්ලාගෙන සිටියේය.

"වෙලාව තමයි," ඔහු කීවේය. "මම දැනටමත් පැය භාගයක් බලාගෙන හිටියා. හරිද එහෙනම්. හැරී, හර්මයිනී?"

"මම නම් එයාලාට ඕනෑවට වඩා යාලුකම් පෙන්වන්නේ නෑ හැග්‍රිඩ්" ෆ්ලිච් සීතල ලෙස කීවේය. "මොනා උනත් අන්තිමට එයාලා මෙතන ඉන්නේ දඬුවමට."

"ඒකයි ඔයා පරක්කු නේද?" හැග්‍රිඩ් රවමින් කීවේය.  "එයාලට දේශණා දි දී හිටියා නේ? ඒවා ඔයාගේ තැන දි කරගන්න. ඔයා තමන්ගේ කොටස කරානේ, මෙතන ඉඳලා මම කරගන්නම්"

"මම පාන්දරට එන්නම්," ෆ්ලිච් කීවේය. "එයාලගේ මොනා හරි ඉතුරු වෙලා තිබ්බොත්" ඔහු ජරා විදිහට කියා දමා ආපසු හැරී මාළිගය දෙසට ගමන් කළේය. ඔහුගේ ලාම්පුව අඳුර තුළින් පා වෙනු පෙනිණි.

මැල්ෆෝයි හැග්‍රිඩ් වෙත හැරුණේය.

"මම අර කැළේට යන්නේ නෑ" ඔහු කීවේය. ඔහුගේ හඬේ වූ බය ඇසී හැරී සතුටු විය.

"හොග්වර්ට්ස් වල ඉන්න ඕනෙ නම් යයි" හැග්‍රිඩ් තියුණු ලෙස කීවේය. "වැරදි කරානම් දැන් ඒකට ගෙවන්න වෙනවා."

"ඒත් මේව වැඩකාරයෝ කරන දේවල්, ඒවා තියෙන්නේ ළමයින්ට කරන්න නෙවෙයිනේ. මම හිතුවේ අපිට මොනාහරි බලාගෙන ලියන්න වගේ දෙයක් දෙයි කියලා. මගේ තාත්තා දන්නවානම් මම මේවා කරනවා කියලා, එයා.."

"එයා කියයි හොග්වර්ට්ස් වල එහෙම තමයි කියලා" හැග්‍රිඩ් ගෙරෙව්වේය. "බලාගෙන ලියන්න! ඒක කරා කියලා කාටවත් හොඳක් වෙනවද? තමුන් මොනාහරි ප්‍රයෝජනවත් දෙයක් කරයි නැත්තන් එළියට යයි. තාත්තා  කැමති වෙයි කියලා හිතනවානම් ඉස්කෝලෙන් අස්කරනවට, ආපහු මාලිගාවට ගිහින් බඩු අහුරගන්න, යන්න ඉතිං"'

Downloaded from sinhalaebooks.com

මැල්ෆෝයි හෙළවුනේ නැත. ඔහු හැග්‍රිඩ් ලෙස දරුණු ලෙස බලා සිටියේය. නමුත් ඉන්පසු තම විලාශය අතහැර දැම්මේය.

"හරි එහෙනම්" හැග්‍රිඩ් කීවේය. "දැන් හොඳට අහගන්න, මොකද අපි අද රෑට කරන්න යන්නේ භයානක දෙයක්, කවුරුත් අමාරුවේ වැටෙනවා දකින්න මට ඕනේ නෑ. පොඩ්ඩක් මගේ පස්සෙන් මෙහෙට එන්න."

ඔහු කැළෑව පටන් ගන්න තැනට ඔවුන්ව කැඳවාගෙන ගියේය. තම ලාම්පුව ඉහලට ඔසවා ඔහු ඝනකම් කළු පැහැ ගස් අතරින් නොපෙනී යන පටු වංගු සහිත අඩි පාරක් පෙන්නුවේය. ඔවුන් කැළය දෙස බළද්දී පැමිණි මද සුළඟක් විසින් ඔවුන්ගේ කෙස් කෙළින් කරවීය.

"අර බලන්න," හැග්‍රිඩ් කීවේය. "අර බිම දිළිසෙන දේ පේනවද? රිදී පාට දේ? ඒ කඟවේනාගේ ලේ. මෙහේ මොකක් හරි නිසා හොඳටම තුවාල වෙච්ච කඟවේනෙක් ඉන්නවා. මේ එහෙම එක සතියක් ඇතුළත වෙච්ච දෙවෙනි පාර. මට ගිය බදාදා මැරිච්ච එකෙක් හම්බුනා. අපි ඒ අසරණයව හොයන්න උත්සාහකරන්න යන්නේ. අපිට සමහර විට ඌව උගේ දුකෙන් ගලවන්න වෙයි."

"එතකොට කඟවේනාට තුවාල කරපු මොකා හරි ඊට කලින් අපිව හොයාගත්තොත් මොකද කරන්නේ?" තම හඬේ වූ බය පාළනය කර ගත නොහැකිවම මැල්ෆෝයි ඇසුවේය.

"මම හරි ෆැන්ග් හරි ළඟ ඉන්නකන් මේ කැළේ ඔයාට කරදර කරන්න කිසි දෙයක් නෑ" හැග්‍රිඩ් කීවේය. "අනික පාරෙන්ම යන්න. හරිද, දැන්, අපි දෙකට බෙදිලා පාර දිගේ දෙපැත්තෙන් යන්න ඕනේ. ලේ හැමතැනම තියනවා, ඌ අඩුගානේ ඊයේ රෑ ඉඳලා වත් හැමතැනම දඟලන්න ඇති."

"මට ෆැන්ග් ඕනේ," ෆැන්ග් ගේ දිගු දත් දෙස බළමින් මැල්ෆෝයි වහා කීවේය.

"ආ හරි, ඒත් කියන්න ඕනේ, ඕකා කපටියා" හැග්‍රිඩ් කීවේය. " එතකොට මමයි, හැරීයි, හර්මයිනීයි එක පැත්තකට යනවා, ඩ්‍රේකෝ, නෙවිල්, ෆැන්ග් අනික් පැත්තට යනවා, දැන්, අපි කාටහරි කඟවේනාව හම්බුනොත් කොළපාට ගිණි පුපුරු අහසට යවනවා. හරි? කෝ දැන් ඔයාලගේ යෂ්ඨි එළියට අරන් පුරුදු වෙන්න. එහෙම තමයි - එතකොට මොනාහරි ප්‍රශ්ණයක් උනොත් රතු ගිණිපුපුරු යවන්න, එතකොට අපි ඔක්කොමලා ඇවිත් ඔයාලව හොයාගන්නවා - එහෙනම්, පරිස්සම් වෙන්න- යමු."

කැළෑව කළුපාට සහ නිහඬ ය. ඔවුන් මදක් ඇතුළට යත්දී අඩිපාර බෙදුනි. හැරී, හර්මයිනී සහ හැග්‍රිඩ් වම් පැත්තේ පාරේත් මැල්ෆෝයි, නෙවිල් සහ ෆැන්ග් දකුණු පැත්තේ පාරේත් ගමන් කළහ.

ඔවුන් නිහඬවම බිම බලාගෙන ගමන් කළහ. තැනින් තැන අතු අතරින් වැටුනු සඳ එළිය වැදී හැලුණු කොළ වල වූ නිල්වන්- රිදීමය ලේ පැල්ලම් දිළිසිණි.

Downloaded from sinhalaebooks.com

හැග්‍රිඩ් බොහෝ දුක් වෙන බව හැරීට පෙණිනි.

"නරවෘකයෙක් කඟවේනන්ව මරනවා වෙන්න පුළුවන්ද?" හැරී ඇසුවේය.

"වේගේ මදි," හැග්‍රිඩ් කීවේය. "කඟවේනෙක් අල්ලගන්න එක ලේසි නෑ, උන් හරි බළවත් මායා සත්තු, මීට කලින් එකෙක්වත් තුවාල වෙලා හිටියා කියලා මම කවදාවත් අහලා නෑ"

ඔවුන් දියසෙවෙල බැඳුනු ලී කොටයක් පසු කළහ. ඔවුන්ට වතුර ශබ්දය ඇසිණි; ලඟ පාතක දිය පාරක් ඇති. තවමත් වංගු සහිත පාරේ තැන තැන ලේ පැල්ලම් දක්නට ලැබිණි.

"ඔයා හොඳින්ද හර්මයිනී?" හැග්‍රිඩ් රහසින් ඇසුවේය. "බය වෙන්න එපා, ඌ මේ තරම් තුවාල වෙලා නම් ගොඩක් දුර යන්න විදිහක් නෑ. එතකොට අපිට පුළුවන්... අර ගහ පිටිපස්සට යන්න!"

හැග්‍රිඩ් හැරී සහ හර්මයිනීව අල්ලාගෙන ඔවුන්ව පාරෙන් එළියට ගෙන විශාළ ඕක් ගසක් පිටුපසට ගෙන ගියේය. ඔහු ඊතලයක් ගෙන දුන්නට අමුණා විදීමට සූදානම් වූයේය. තිදෙනාම අසා සිටියහ. යමක් ඔවුන්ට ආසන්නයේ මැරුණු කොළ මතින් ගමන් කරයි. එය ඇසුනේ ලෝගුවක් පොළොව මත ඇදී යනවාක් මෙනි. හැග්‍රිඩ් අඳුරු පාර දෙසට ගමන් කළේය. තප්පර කිහිපයකට පසු හඬ ඈතට නෑසී ගියේය.

"මම දැනගෙන හිටියා, " ඔහු මිමිනුවේය. "කැළේ ඉන්න ඕනේ නැති දෙයක් මෙහේ තියනවා."

"නරවෘකයෙක්?" හැරී යෝජනා කළේය.

"ඒ නරවෘකයෙකුත් නෙවෙයි, ඒ කඟවේනෙකුත් නෙවෙයි," හැග්‍රිඩ් අසතුටින් කීවේය. "හරි, මගේ පස්සෙන් එන්න, ඒත් දැන් පරිස්සමින්."

ඔවුන් තවත් හෙමින්, හඬක් ඇසීමට කණ් තියුණු කරගෙන ගමන් කළහ. එක්වරම, කුඩා එළිමහනක් අසල අනිවාර්යයෙන් යමක් සෙළවුනි.

"කවුද ඔතන?" හැග්‍රිඩ් කතා කළේය. "එළියට එන්න - මම ආයුධ අරගෙන ඉන්නේ!"

Downloaded from sinhalaebooks.com

ඒ සමග එළිමහනට ආවේ - ඒ මිනිහෙක්ද, නැත්තන් අශ්වයෙක්ද? ඉණ ලඟට එනතුරු රතු හිසකේ සහ රැවුල ඇති මිනිසෙක් ද, නමුත් පහළ කොටස දුඹුරු පැහැ ඇඟක් සහ දිග රතු වළිගයක් ඇති අශ්වයෙක් ද විය. හැරී සහ හැර්මයිනී කට ඇරගෙන බලා සිටියහ.

"ඔහ්, ඒ ඔයානේ, රෝනන්," හැග්‍රිඩ් සැනසිල්ලෙන් කීවේය. "ඔයාට කොහොමද?"

ඔහු ඉදිරියට ගොස් නරාශ්වයාගේ අතට අත දුන්නේය.

"ඔයාට සුභ සැන්දෑවක් හැග්‍රිඩ්" රෝනන් කීවෙය. ඔහුට ගැඹුරු දුකින් පිරි කටහඬක් විය. "ඔයා මට විදින්නද හැදුවේ?"

"ගොඩක්ම පරිස්සම් වෙන්න ඕනේ රෝනන්," තම දුන්නට තට්ටු කරමින් හැග්‍රිඩ් කීවේය. "මොකෙක් හරි කැළේට කඩා වැදිලා තියනවා. ඒක නෙවේ මේ හැරී පොටර් යි, හර්මයිනී ග්‍රැන්ජර් යි. ඉස්කෝලේ ළමයි. මේ රෝනන්. එයා නරාශ්වයෙක්."

"අපිට පෙනුනා" හැර්මයිනී සිහිනෙන් මෙන් කීවාය.

"සුභ සැන්දෑවක්," රෝනන් කීවේය. "සිසුන් නේ? ඔයාලා එහේ ඉස්කෝලේ ගොඩක් දේවල් ඉගෙන ගන්නවද?"

"අර්ම් - - "

"ටිකක්," හර්මයිනී බයාදු ලෙස කීවාය.

"ටිකක්, හොඳයි. ඒකත් දෙයක්නේ" රෝනන් සුසුමක් හෙලුවේය. ඔහු හිස ඉහලට හරවා තරු දෙස බැළුවේය. "අඟහරු අද ගොඩක් දීප්තිමත්."

"ඔව්," හැග්‍රිඩ් අහස දෙසට බැල්මක් හෙලුවේය. "අහන්න, මට සතුටුයි ඔයාව හම්බවුනු එකට රෝනන්, මොකද මෙහේ කඟවේනෙක් තුවාල වෙලා - ඔයා මොනාහරි දැක්කද?"

රෝනන් එක්වරම පිළිතුරු දුන්නේ නැත. ඔහු ඇසිපිය නොගසා අහස දෙස බලා සිටියේය. ඉන්පසු නැවත සුසුමක් හෙලුවේය.

Downloaded from sinhalaebooks.com

"හැමවෙලේම අභිංසකයෝ තමයි පළවෙනි ගොදුර වෙන්නේ," ඔහු කීවේය. "ඒක කාළයක් තිස්සේ වෙන්නේ එහෙමයි. දැනුත් එහෙමයි"

"ඔව්," හැග්‍රිඩ් කීවේය, "ඒත් ඔයා මොනාහරි දැක්කද රෝනන්? මොනාහරි අසාමාන්‍ය දෙයක්?"

"අද සිකුරු ගොඩක් දීප්තිමත්," හැග්‍රිඩ් නොයිවසිල්ලෙන් බලා සිටියදී ඔහු නැවත කීවේය. "අසාමාන්‍ය විදිහට දීප්තිමත්."

"ඔව්, ඒත් මම අප්හහස් කළේ ගෙදරට කිට්ටුවෙන් අසාමාන්‍ය දෙයක් ගැන" හැග්‍රිඩ් කීවේය. "ඉතිං ඔයා මොකුත් අමුතු දෙයක් දැක්කේ නෑ?"

ආයෙත් රෝනන් උත්තර දීමට ටික වෙලාවක් ගත්තේය. අවසානයේ ඔහු කතා කළේය. "කැළෑව ගොඩක් රහස් හංගගෙන ඉන්නවා."

රෝනන්ගේ පිටුපසින් වූ සෙළවීමක් නිසා හැග්‍රිඩ් නැවත තම දුන්න එසවූයේය. නමුත් ඒ තවත් නරාශ්වයෙක් විය. කළු හිසකේ සහ ඇඟ ඇති ඔහුට රෝනන්ට වඩා කැළෑ පෙනුමක් විය.

"ආ, බේන්," හැග්‍රිඩ් කීවේය. "හොඳින් නේ?"

"සුභ සන්ද්‍යාවක් හැග්‍රිඩ්, ඔයා හොඳින් කියලා හිතනවා?"

"මම හොඳයි, බලන්න. මම මේ රෝනන්ගෙන් ඇහුවේ, මෑතකදි ඔයාලා මොනාහරි අමුතු දේවල් දැක්කද? කඟවේනෙක්ට තුවාල වෙලා තියනවා - ඒ ගැන මොනාහරි දන්නවද?"

බේන් රෝනන්ගේ ලඟට ආවේය. ඔහු අහස දෙස බැළුවේය. "අද සිකුරු ගොඩක් දීප්තිමත්," ඔහු සරල ලෙස කීවේය.

"අපිට කිව්වා," හැග්‍රිඩ් තරහින් කීවේය. "හොඳයි, ඔයාලා කවුරු හරි මොනාහරි දැක්කොත් මට දන්වන්න, කරනවානේ? එහෙනම් අපි යනවා."

හැරී සහ හර්මයිනී හැග්‍රිඩ් පසුපසින් එළිමහනෙන් ඉවතට යද්දී උරහිස් වලට උඩින් රෝනන් සහ බේන් ගස් වලින් වැසී නොපෙනී යනතෙක්ම ඔවුන් දෙස බැලූහ.

Downloaded from sinhalaebooks.com

"කවදාවත්," හැග්‍රිඩ් කම්පාවෙන් කතා කළේය. " කොච්චර උත්සාහ කරත් නරාශ්වයෙක්ගෙන් හරි උත්තරයක් ගන්න බෑ. මහ නපුරු තරුවලම ඇලිච්ච අය. හඳට වඩා ලඟින් තියන කිසි දෙයක් ගැන උවමනාවක් නෑ."

"මෙහේ ඒගොල්ලෝ ගොඩක් ඉන්නවද?" හර්මයිනී ඇසුවාය.

"ඔහ්, සාමන්‍ය ගානක් ඉන්නවා... ගොඩක් වෙලාවට තමන්ටම වෙන්වෙච්ච ලෝකෙක වගේ, ඒත් මට මොනාහරි දැනගන්න ඕනේ උනොත් එනවා. එයාලා ගැඹුරු මනසක් තියන අය, නරාශ්වයෝ ... එයාලා නොයෙක් දේවල් දන්නවා... ඒත් වැඩිය එළියට දාන්නේ නෑ."

"ඔයා හිතන්නේ අපිට මුලින්ම ඇහුනේ නරාශ්වයෙක්ගේ සද්දෙද?" හැරී ඇසුවේය.

"ඔයාට ඒක ඇහුනේ ඒ වගේද? නෑ, ඔයාට කියන්න ඒක තමයි කඟවේනන්ව මරන්නේ - ඒ වගේ දෙයක් කවදාවත් අහලා නෑ."

ඔවුන් ඝන කළුවර ගස් අතරින් ගමන් කළහ. හැරී දිගින් දිගටම අපහසුවෙන් මෙන් තම උරහිසට උඩින් පිටුපස බලමින් ගමන් කළේය. ඔහුට කවුරුන් හෝ බළා සිටිනවා යැයි හැඟෙන්නට විය. ඔවුන් සමඟ හැග්‍රිඩ් සහ ඔහුගේ දුන්න තිබීම ගැන ඔහු සතුටු වූයේය. පාරේ එක් නැම්මක් පසු කරන විටම හර්මයිනී හැග්‍රිඩ්ගේ අත අල්ලා ගත්තාය.

"හැග්‍රිඩ්! අර බලන්න! රතු ගිනි පුපුරු, අනිත් අය කරදරේක වැටිලා!"

"ඔය දෙන්නා මෙතන ඉන්න!" හැග්‍රිඩ් කෑ ගැසුවේය. "පාරෙම ඉන්න, මම ආපහු ඔයාලව ගන්න එන්නම්!"

ඔහු පඳුරු පොඩි කරගෙන යන හඬ ඔවුන්ට ඇසිණි. ඔවුන් බයෙන් ගැහෙමින් ගස්වල කොළ හැලෙන හඬ ඇසෙන තරම් නිහඬව එකිනෙකා දෙස බලා සිටියහ.

"ඔයට හිතෙන්නේ නැද්ද එයාලාට තුවාල වෙලා කියලා. ඈ?" හර්මයිනී මිමිණුවාය.

"මැල්ෆෝයිට මොනා උනත් මට කමක් නෑ, ඒත් මොකෙක් හරි නෙවිල්ව අල්ලගත්තොත්... එයා මෙතන ඉන්න එකත් අපේ වැරැද්දෙන් උනේ."

Downloaded from sinhalaebooks.com

විනාඩියෙන් විනාඩිය ඇදී ගියේය. ඔවුන්ගේ කණ් සාමාන්‍ය ප්‍රමාණයට වඩා තියුණු වී තිබිණි. හැරී හැම හුළං ශබ්දයක්ම, හැම කෝට්ටක් කැඩෙන හඬක්ම ග්‍රහණය කර ගත්තේය. මොනාද සිද්ධවෙන්නේ? අනිත් අය කොහෙද?

අන්තිමේදී කැඩෙන බිඳෙන හඬක් විසින් හැග්‍රිඩ් ආපසු එන බව දන්වන ලදී. මැල්ෆෝයි, නෙවිල් සහ ෆැන්ග් ඔහු සමග විය. හැග්‍රිඩ් තරහෙන් පුපුරමින් සිටියේය. ජේන විදිහට මැල්ෆෝයි විහිලුවට සිතා නෙවිල්ගේ පිටුපසින් හොරෙන් පැමිණ ඔහුව අල්ලාගෙන තිබේ. බය වූ නෙවිල් අහසට ගිණි පුපුරු යවා තිබේ.

"දැන් ඉතිං අපිට මොනාහරි අල්ලගන්න නම් වාසනාව තියෙන්නෙ ඕනේ, ඔය දෙන්නා කරපු නාඩගමත් එක්ක. හරි, අපි කට්ටිය මාරු කරමු.- නෙවිල් ඔයා මමයි හර්මයිනීයි එක්ක ඉන්න. හැරී ඔයා ෆැන්ග්ව අරන් මේ මෝඩයත් එක්ක යන්න. "මට සමාවෙන්න," හැග්‍රිඩ් හැරීට රහසෙන් කීවේය. "එයාට ඔයාව බය කරන එක නම් අමාරු වෙයි. අනික අපි මේ වැඩේ කොහොම හරි කරන්න ඕනේ."

හැරී ෆැන්ග් සහ මැල්ෆෝයි සමග කැළෑව මැදටම යන්නට පිටත් විය. ඔවුන් පැය භාගයක් පමණ වෙලා තව තවත් කැළෑව ඇතුලට, ගස් නිසා තව දුරටත් පාරක් සොයා ගැනීමට අපහසු වෙන තෙක්ම ඇවිද්දෝය. හැරීට සිතුනේ ලේ පැල්ලම් තව තවත් ඝනකම් වෙන බවකි. එක් ගහක් මුල ලේ වැක්කෙරෙමින් තිබුනේ අසරණ සතා අහල පහලක වේදනාවෙන් ඇතිබව දනවමිනි. පෞරාණික ඕක් ගසක අතු අතරින් ඉදිරියේ වූ එළිමහනක් හැරීට දිස්විය.

"බලන්න - - " තම අත දිගු කර මැල්ෆෝයිව නවත්තමින් ඔහු මිමිනුවේය.

යම්කිසි දීපතිමත් සුදුපැහැ දෙයක් පොළොව මත දිළිසුණේය. ඔවුන් අඟලෙන් අඟල ඊට ලං විය.

ඒ කඟවේනාය. ඌ මැරී සිටියේය. ඒ තරම් සුන්දර දුක හිතෙන දෙයක් හැරී කිසිදින දැක තිබුනේ නැත. උගේ දිගු කෙට්ටු කකුල් ඌ වැටුනු විදිහට අමුතු පැත්තකට එළියට විහිදී තිබුණි. උගේ මුතු සුදු පැහැ කේශර අඳුරු කොළ මත විසිරී තිබිණි.

හැරී එක් අඩියක් ඉදිරියට තබන විටම ලිස්සන ශබ්දය ඇසී ඔහු එතැනම ගල් විය. එළිමහන කෙළවර පඳුරක් සෙළවිය.... ඉන්පසු සෙවණැලි වලින් ඉවතට ඔළුව වසාගත් රූපයක් බඩගාන සතෙක් මෙන් බඩගා පැමිණියේය. හැරී, මැල්ෆෝයි සහ ෆැන්ග් නොසෙල්වී සිටියහ. ලෝගුව ඇඳි රූපකාය කඟවේනා අසලට ගොස්, හිස සතාගේ පැත්තේ වූ තුවාළය මතට නවා, උගේ ලේ බොන්නට පටන් ගත්තේය.

"ආආආආආආආහ්!"

Downloaded from sinhalaebooks.com

මැල්ෆෝයි අප්‍රසන්න ලෙස කෑ ගසා දිව්වේය. ෆැන්ග් ද දිව්වේය. ඔලුව වසා සිටි රූපකාය හිස ඔසවා කෙලින්ම හැරී දෙස බැලුවේය. ඔහුගේ කටින් කහවේනා ලේ වැක්කෙරිණි. ඔහු නැගිට හැරී දෙසට ලිස්සා ආවේය. බියටම හැරීට සෙළවීමට නොහැකි විය.

ඉන්පසු කිසිදිනක නොදැනි වේදනාවක් ඔහුගේ හිස සිදුරු කරන්නාක් මෙන් දැණිනි. ඔහුට දැනුනෙ නළලේ වූ කැළල ගිණි ගන්නවාක් මෙනි. අඩක් අන්ධව ඔහු පසු පසට යන්නට දැඟලුවේය. ඔහුට පිටුපසින් කුර හඬක් ඇසිණි. යම් කිසිවක් හැරීට උඩින් පැන රූපකායට විරුද්ධව නැගී සිටියේය.

හැරීගේ හිසේ කැක්කුම දරාගත නොහැකිව ඔහු දණින් වැටුනේය. එය නැති වීමට විනාඩියක් හෝ දෙකක් ගත විය. ඔහු ආපසු බළන විට රූපකාය අතුරුදන් වී සිටියේය. ඔහුට ඉහලින් නරාශ්වයෙක් සිටගෙන සිටියේය. ඔහු රෝනන් හෝ බේන් නොවීය, ඔහු තරුණයෙක් වූ අතර ඔහුට සුදු පැහැ කොණ්ඩයක් ද  රන්පැහැ අශ්ව ඇඟක්ද විය.

"ඔයා හොඳින්ද?" හැරීව නැගිට්ටුවමින් නරාශ්වයා ඇසුවේය.

"ඔව් - ස්තුතියි - මොකද්ද ඒ?"

නරාශ්වයා උත්තර දුන්නෙ නැත. ඔහුට අළංකාර සෆායර් මැණික් මෙන් වූ නිල් ඇස් විය. ඔහු හොඳින් හැරී දෙස බැලුවේය, ඔහුගෙ ඇස් හැරීගේ නළලේ එළියට නෙරා දිළිසෙන කැළල මත නැවතුනේය.

"ඔයා පොටර් ළමයා" ඔහු කීවේය. "ඔයා හැග්‍රිඩ් ලඟට ආපහු ගියොත් හොඳයි. මේ වෙලාවට කැලේ ආරක්ශිත නෑ - විශේෂයෙන් ඔයාට. ඔයාට නගින්න පුළුවන්ද? මේ විදිහට ඉක්මන් වෙයි.

"මගේ නම ෆිරෙන්සේ," හැරීට ඔහුගේ පිට මත නැගීමට පහසු වන සේ තම ඉදිරිපස කකුල් නවමින් ඔහු කීවේය.

එළිමහනේ අනික් පසින් තවත් බොහෝ කුර හඬවල් ඇසෙන්නට විය. ගස් අතරින් රෝනන් සහ බේන් කඩා පැන්නහ. ඔවුන්ගේ පපු වේගයෙන් උස්පහත් වෙමින් දාඩියෙන් පෙඟී තිබිණ.

"ෆිරෙන්සේ" බේන් ගිගුරුවේය. "මොනාද කරන්නේ? ඔයාගේ පිටේ මනුස්සයෙක් ඉන්නවා! ඔයාට ලැජ්ජාවක් නැද්ද? ඔයා සාමාන්‍ය කොටලුවෙක්ද?"

"ඔයා දන්නවද මේ කවුද කියලා?" ෆිරෙන්සෙ ඇසුවේය. "මේ ඉන්නේ පොටර් ළමයා. එයා මේ කැළෙන් ඉක්මනට පිට වෙන තරමට හොඳයි."

Downloaded from sinhalaebooks.com

"ඔයා මොනාද එයාට කිව්වේ?" බේන් ගෙරෙව්වේය. "මතක තියාගන්න පිරෙන්සේ, අපි ස්වර්ගයට එරෙහි නොවෙන්ට දිවුරලා තියනවා. අපි ග්‍රහලෝකවල වෙනස් වීම් වලින් වෙන්න තියෙන දේවල් කියවලා නැද්ද ?"

රෝනන් කම්පණයෙන් මෙන් පොළොවට කකුළෙන් ගැසුවේය. "මට විශ්වාසයි පිරෙන්සේ හිතුවේ එයා ඒක කරන්නේ හොඳකට කියලා වෙන්න ඕනේ, " ඔහු කැඩුනු ස්වරයෙන් කීවේය.

බේන් තරහින් පිටුපස කකුල් වලින් පයින් ගැසුවේය.

"හොඳකට! ඒකේ මොනාද අපිට තියෙන හොඳ? නරාශ්වයන්ට වැදගත් වෙන්නේ අනාගතේ ගැන කළින් කියපු දේවල්. බූරුවෝ වගේ කැලේ ඉන්න මිනිස්සු පස්සේ දුවන එක අපේ වැඩක් නෙවෙයි.!"

පිරෙන්සේ හදිසියේම තරහින් තම ඉදිරි ගාත් එසවූයේය. හැරීට රැඳීසිටීමට ඔහුගේ උරහිස් අල්ලා ගැනීමට සිදු විය.

"ඔයා අර කඟවේනාව දැක්කේ නැද්ද?" පිරෙන්සේ බේන්ගෙන් ඇසුවෙය. "ඌව මැරුවේ ඇයි කියලා ඔයාට තේරෙන්නේ නැද්ද? නැත්තන් ග්‍රහලෝක ඔයාට ඒ රහස හංගනවද? මම මේ කැලේ ඇතුලේ හැංගිලා ඉන්න දේට විරුද්ධයි බේන්, ඔව්, මට ඕනේනම් මිනිස්සුන්වත් මගේ පැත්තෙන් තියාගන්නවා ."

පිරෙන්සේ වටපිට ඉවකර බැලුවේය. රෝනන් සහ බේන්ව පසුකර හැරීවත් අරන් ඔහු පුළුවන් උපරිමයෙන් ගස් අතරට වැදී නොපෙනී ගියේය.

හැරිට සිදුවන්නේ කුමක්ද යන්න ගැන කිසිම අදහසක් නොවීය..

"ඇයි බේන් ගොඩක් තරහින්?" ඔහු ඇසුවේය. "මොනා උනත් ඔයා මොකකින්ද අර මාව බේරගත්තේ?"

පිරෙන්සේ වේගය අඩුකොට ඇවිදින්නට පටන් ගත්තේය. ඔහු හැරීට ගස් වල අතු නොවැදීමට ඔලුව පාත් කරගෙන ඉන්න අවවාද කළ නමුත් හැරීගේ ප්‍රශ්ණයට උත්තර දුන්නේ නැත. ඔවුන් ගස් අතරින් නිහඬවම බොහෝ දුර ගමන් කළ නිසා පිරෙන්සේ තමන් සමග තවත් කතා කිරීමට කැමති නැතැයි හැරී සිතුවේය. ඔවුන් එක්තරා ඝනකම් ගස් ගොන්නක් පසු කරමින් සිටින අතරේ පිරෙන්සේ එක්වරම නැවතුනේය.

"හැරී පොටර් ඔයා දන්නවද කඟවේනාගේ ලේ පාවිච්චි කරන්නේ මොකටද කියලා?"

"නෑ" අමුතු ප්‍රශ්ණයෙන් විශ්මයට පත්ව ඔහු පිළිතුරු දුන්නේය. " අපි සංයෝජන වලට පාවිච්චි කරලා තියෙන්නේ අං, වලිගේ කෙස් දෙක විතරයි."

Downloaded from sinhalaebooks.com

"මොකද කහවේනෙක්ව මරන එක මෘග වැඩක්," ෆිරෙන්සේ කීවේය. "නැතිවෙන්න කිසිදෙයක් නැති, හැමදේම ලබාගන්න ඕනේ කරන කෙනෙක් තමයි ඒ වගේ අපරාධයක් කරන්නේ. කහවේනගේ ලේ වලට පුළුවන් ඔයාව පණපිටින් තියන්න. ඔයා මරණෙට අඟලක් දුරින් හිටියත් බේරෙයි. ඒත් ඒකට ලොකු ගෙවීමක් තියනවා. ඔයා එහෙම උනොත් තමන්ව බේරගන්න නැති කරන්නේ බොහොම ශුද්ධ වූ ආත්මාරක්ශාවක් නැති දෙයක්. ලේ ඔයාගේ තොලේ ගෑවෙන මොහොතේ ඉඳලා ඔයාට ගෙවන්න වෙන්නේ ශාප වුනු අර්ධ ජීවිතයක් විතරයි."

හැරී ෆිරෙන්සේගේ හඳ එළිය වැටී දිළිසෙන රිදී පුල්ලි ඇතිවූ හිස පිටුපසට ඇස් යොමු කළේය.

"ඒත් කවුද ඒ තරම් දුෂ්කර ජීවිතයකට කැමති?" ඔහු ඇසුවේය. "මුළු ජීවිතේටම ශාප වෙලා ඉන්නවට වඩා මැරෙන එක හොඳයි. නේද?"

"ඔව් ඒක ඇත්ත" ෆිරෙන්සේ එකඟ විය. "ඒත් ඒ ඔයා වෙන දෙයක් බොනකන් විතරයි නම් - ඔයාව ආපහු සම්පූර්ණ ශක්තියට බළයට ගේනදෙයක් - ඔයාව අමරණීය වෙන දෙයක් නම්. පොටර් මහත්තයෝ, ඔයා දන්නවද මේ වෙලාවේ ඉස්කෝලේ මොකද්ද හංගලා තියෙන්නේ කියලා?"

"මායා පාශාණය! ඇත්තමයි - අමෘතය! ඒත් මට තේරෙන්නේ නෑ කවුද- - "

"අවුරුදු ගානක් තිස්සේ ආපහු බළයට එන්න බලාගෙන හිටපු කෙනෙක්ව ඔයාට හිතන්න බැරිද, තමන්ගේ අවස්ථාව එනකන් යන්තන් ජීවිතේ එල්ලිලා හිටපු කෙනෙක්ව හිතන්න බැරිද?"

එක්වරම හැරීගේ හදවත යකඩ අතකින් මිරිකන්නාක් මෙන් දැණින. සෙළවෙන ගස් වළට ඉහලින් හැග්‍රිඩ් තමා හමු වූ මුල් දින කියූවක් නැවත ඇසෙන්නාක් මෙන් හැරීට දැණින. "සමහරු කියනවා එයා මැරුනා කියලා. ඒත්, මට හිතන්නේ නම්, එයාගේ මැරෙන්න තරම් මනුස්සයෙක් ඉතුරුවෙලා හිටියද මං දන්නේ නෑ."

"ඔයා කියන්නේ" හැරී ගොත ගැසුවේය. "ඒ හිටියේ වොල් - "

"හැරී! හැරී, ඔයා හොඳින්ද?"

හර්මයිනී අඩි පාර දිගේ ඔවුන් වෙත දුවගෙන ආවාය. හැග්‍රිඩ් ඇ පසුපස හති දමමින් ආවේය.

"මම හොඳින්" තමන් කියන්නේ මොකද්දැයි සිතා හැරී කීවේය. "කහවේනා මැරිලා, හැග්‍රිඩ්. ඌ අර පිටිපස්සේ එළිමහනක ඉන්නවා."

Downloaded from sinhalaebooks.com

"මම මෙතන ඔයාව දාලා යන්නම්," හැග්‍රිඩ් කඟවේනාව පරික්ෂාකිරීමට යන අතරේ ෆිරෙන්සේ මිමිනුවේය. "ඔයා දැන් පරිස්සම්."

හැරී ඔහුගේ පිටෙන් බැස්සේය.

"සුභ පැතුම්, හැරී පොටර්," ෆිරෙන්සේ කීවේය. "මීට කළින් නරාශ්වයෝ පවා ග්‍රහ ලෝක වැරදියට කියවලා තියනවා. මම හිතන්නේ මේ ඒ වගේ වෙලාවක්."

ඔහු ආපසු හැරී කැළෑව ඇතුලට යද්දී හැරී වෙවුළමින් සිටියේය.

රොන් අඳුරු පොදු කාමරයේ ඔවුන් පැමිණෙන තෙක් බළාසිට නින්දට වැටී සිටියේය. හැරී ඔහුව අවදි කිරීමට වේගෙන් සොළවන් විට ඔහු කුඩිච් වල ඉවත්කිරීමක් ගැන කියා කෑ ගැසුවේය. තප්පර කීපයකට පසු හැරී ඔහුට සහ හර්මයිනීට කැළේදී සිදු වූ දේ කියන්න පටන් ගන්නා විට ඔහුගේ ඇස් පළල් වී තිබිණි.

හැරීට වාඩිවිය නොහැකිය. තවමත් වෙවුලන ඔහු ගිණි උඳුන ඉස්සරහින් ඉහළ පහළ ගියේය.

"ස්නේප් ට පාශාණේ ඕනේ වොල්ඩමෝට්ට දෙන්න... වොල්ඩමෝට් කැලේ බලන් ඉන්නවා... මෙච්චර කල් අපි හිතුවේ ස්නේප්ට පෝසත් වෙන්න ඕනේ වෙලා කියලා...."

"නම කියන එක නවත්තන්න" රොන් බයෙන් කෙඳිරුවේය, හරියට ඔවුන්ව වොල්ඩමෝට්ට ඇහෙනවා යැයි ඔහු සිතුවාක් මෙනි.

හැරී ඊට ඇහුම්කන් දුන්නේ නැත.

"ෆිරෙන්සේ මාව බේරගත්තා, ඒත් එයා එහෙම කරන්න ඕනේ නෑ.... බේන් තරහෙන් පිපිරුවා... එයා කිව්වා වෙන්න තියන දේවල් ග්‍රහලෝක වලින් පෙන්නන එකට මැදිහත් වෙන දෙයක්.... ඒවාගෙන් පෙන්නනවා ඇති වොල්ඩමෝට් ආපහු එනවා කියලා.... බේන් හිතන්නේ ෆිර්ච්න්සේට මාව වොල්ඩමෝට්ට මරන්න ඉඩ දෙන්න තිබ්බා කියලා .... මම හිතන්නේ තරු වල එහෙමත් ලියවිලා ඇති."

"ඔයා නම කියන එක නවත්තනවද!" රොන් කේන්තියෙන් කීවේය.

Downloaded from sinhalaebooks.com

"ඉතිං මට දැන් තියෙන්නේ ස්නේප් පාශාණය හොරකම් කරනකන් ඉන්න" හැරී උණ විකාරයෙන් මෙන් කියෙව්වේය. "එතකොට වොල්ඩමෝට්ට පුළුවන් ඇවිත් මාව ඉවරයක් කරලා දාන්න... ඔව්, මම හිතන්නේ එතකොට බේන් සතුටු වෙයි."

හර්මයිනී බොහෝ බය වූ බවක් පෙණිනි. නමුත් ඈ සැනසීමට යමක් කියුවාය.

"හැරී, හැමෝම කියනවා නම නොකියන කෙනා බය වුනේ ඩම්බල්ඩෝට විතරයි කියලා. ඩම්බල්ඩෝ ළඟපාත ඉන්නකොට නම නොකියන කෙනා ඔයාව අල්ලන්නෙවත් නෑ. අනික කවුද කියන්නේ නරාශ්වයෝ හරි කියලා? මට නම් ඒක දැනෙන්නේ සාස්තරයක් වගේ, ප්‍රොෆෙසර් මැක්ගොනගල් කියන්නේ ඒවා කිසි වැදගැම්මක් නැති මායාවල් කියලා."

ඔවුන් සාකච්ඡාව ඉවරවීමට පෙරම ඉර එළිය වැටෙන්නට පටන් ගෙන තිබිණි. ඔවුන් තෙහෙට්ටුවෙන් යුතුව නින්දට ගියහ. ඔවුන්ගේ උගුර වියළීගොස් තිබිණි. නමුත් රාත්‍රියේ පුදුම කිරීම් ඉවර වී තිබුනේ නැත.

තම පොරවනය අදින විට ඊට යටින් පිළිවෙලට නැවූ තම අදිසි ලෝගුව තිබෙනු හැරීට හමුවිය. එයට සටහණක් අමුණා තිබිනි.

"ඕනේ උනොත්"

දහසය වෙනි පරිච්ඡේදය

දොර හරහා පහළට

වොල්ඩමෝට් කොයි මොහොතේ හෝ දොරෙන් ඇතුලට කඩා පනීවියැයි බළාපොරොත්තුවෙන් ඉඳිමින් විභාගය කෙසේ කරගත්තාදැයි හැරීට ඉදිරි වසර වලදී කෙසේවත් මතක නොතිබෙනු ඇත. නමුත් දින ගෙවී ගියේය. අගුළු දැමූ දොර පිටුපස ෆ්ලෆී හොඳින් ජීවත්ව සිටින බවට කිසිම සැකයක් තිබුනේ නැත.

එය ඉතා උණුසුම් කාළගුණයක් විය. විශේෂයෙන් ඔවුන් ලියන ප්‍රශ්ණපත්‍ර කළ විශාල පංතිකාමර වඩා උණුසුම් විය. විභාග සඳහා ඔවුන්ට හොර කිරීමට නොහැකි වන සේ මැතිරූ විශේෂ අලුත් පිහාටු පෑන් ලබා දී තිබිණි.

ඔවුන්ට ප්‍රායෝගික පරීක්ශණ ද පැවත්විණි. ප්‍රොෆෙසර් ෆ්ලිට්වික් එක්කෙනා බැගින් තම පංති කාමරයට කැඳවා ඔවුන්ට මේසයක් මත අන්නාසි ගෙඩියක් නැටවිය හැකි දැයි බැලුවේය. ප්‍රොෆෙසර් මැක්ගොනගල් ඔවුන්ට

Downloaded from sinhalaebooks.com

මීයෙක්ව පවුඩර් පෙට්ටියක් බවට පරිවර්ථනය කිරීමට දුන්නාය. පවුඩර් පෙට්ටිය කොපමණ ලස්සනද යන්නමත ළකුණු දුන්නාය. නමුත් එහි රැවුල් ගස් තිබුනේ නම් ළකුණු අඩු කළාය. ස්නේප් ඔවුන් සියල්ලන්ම අපහසුතාවයට පත් කළේය. අමතක කරවීමේ සංයෝජනය සාදන ක්‍රමය මතක් කරන අතරේ ඔහුගේ හුස්ම ඔවුන්ගේ ගෙළ මුලට දැනිනි.

හැරී තම නලලෙන් එන පිහියකින් ඇන්නාක් වැනි වේදනාව අමතක කිරීමට උත්සාහ කරමින් තමන්ට හැකි උපරිමය කළේය. ඔහු කැළෑවට ගිය දින සිට ඒ වේදනාව ඔහුට බාධා කළේය. හැරීට හරි හැටි නිදා ගැනීමට නොහැකි වූ නිසා නෙවිල් සිතුවේ ඔහුට විභාගය ගැන භීතිකාවක් ඇති වී තිබෙන බවයි. නමුත් ඇත්ත නම් ඔහුගේ පරණ නපුරු සිහිනය විසින් ඔහුව නොනවත්වා අවදි කරවීමය. වෙනසකට තිබුනේ එය කවදාටවත් වඩා දරුණු වී හිස වැසූ කටෙන් ලේ පෙරෙන රූපකායක් ද ඊට ඇතුල් වී තිබීමයි.

රොන් සහ හර්මයිනී හැරී තරම් පාශාණය ගැන වද වුනේ නැත. සමහර විට හැරී කැළයේ දී දුටු දේවල් ඔවුන් නොදුටුව නිසා හෝ ඔවුන්ගේ නළලේ දැවෙන කැළලක් නොමැති නිසා හෝ එසේ වන්නට ඇති. වොල්ඩමෝට් ගැන වූ අදහස ඔවුන්ව බිය වැද්දුවත් ඔහු ඔවුන්ගේ හීන වලට හැමදාම පැමිණියේ නැත. අනික් අතට ඔවුන් පාඩම් වැඩ වලට බොහෝ කාර්‍යබහුල වී සිටි නිසා ස්නේප් හෝ වෙන කිසිවෙක් හෝ කරන්නට යන දෙයක් ගැන කතාකරන්නට තරම් වේලාවක් තිබුනේත් නැත.

ඔවුන්ගේ අවසන් විභාගය වූයේ මායා ඉතිහාසයයි. පැයක් තිස්සේ ඉබේ හැඳිගාන කල්දේරම් හැදූ පරණ මායාකරුවන් ගැන ප්‍රශ්ණ වලට පිළිතුරු දුන් පසු ඔවුන් නිදහස් ය.  සතියකින් විභාග වල ළකුණු ලැබෙන තුරු ඔවුන් නිදහස් ය. ප්‍රොෆෙසර් බින්ස් ගේ අවතාරය තම පිහාටු පෑන් පහත දමා පාච්මන්ට් කඩදාසිය රෝල් කරන්නට කියූ විට අනික් අයත් සමග සතුටින් කෑ නොගසා සිටීමට හැරීට නොහැකි විය.

"ඒක මම හිතුවට වඩා ගොඩක් ලේසියි," පිටත අව්ව වැටුනු පිට්ටනිය වෙත යන අනික් ළමයින් සමග ඔවුන් එක් වෙද්දී හර්මයිනී කීවාය. "මට 1637 නරවෘක සංකේත පවත්වාගැනීමයි  එල්ෆ්‍රික් ලෝලියන්ගේ නැගී සිටීම ගැනයි කියවන්න හම්බුනේ නෑ"

හර්මයිනී හැමවිටම විභාග අවසානයේ ඔවුන්ගේ විභාග ප්‍රශ්ණ පත්‍ර සාකච්ඡා කිරීමට ආශා කළාය. නමුත් රොන් කීවේ එය ඔහුට අසනීප දනවන බවයි. එමනිසා ඔවුන් වැව වෙත පැමිණ ගසක් යට වැතිරුනෝය. වීස්ලි නිවුන්නු සහ ලී ජෝඩන් උණුසුම් ගොහොරුවේ සිටි යෝධ දැල්ලෙකුගේ අඩු කිතිකවමින් සිටියහ. "තව නම් පාඩම් කිරිලි නෑ," රොන් සතුටින් සුසුම් හෙළමින් තණ බිස්සේ දිගා විය. "ඔයා තව ටිකක් සතුටෙන් ඉන්නකෝ හැරී, අපි කොච්චර නරක විදිහට විභාගේ කරලද කියලා දැනගන්න තව සතියක් තියනවා. දැන්මම දුක්වෙන්න ඕනේ නෑ."

හැරී තම නළල අතින් අතුල්ලමින් සිටියේය.

"මේකේ තේරුම මොකද්ද කියලා මම දන්නවානම් කියලා හිතෙනවා!" ඔහු තරහින් පිපිරුනේය. "මගේ කැළල දිගටම රිදෙනවා - කළිනුත් එහෙම වෙලා තියනවා, ඒත් මේ වගේ එකදිගට කවදාවත් වෙලා නෑ."

Downloaded from sinhalaebooks.com

"මැඩම් පොම්ෆ්‍රේ ලඟට යන්නකෝ," හර්මයිනී යෝජනා කළාය.

"මට අසනීපයක් නෑ" හැරී කීවේය. "මම හිතන්නේ ඒක අනතුරු ඇඟවීමක්.. ඒකේ තේරුම භයානක අනතුරක් එනවා...."

රොන්ට නැගිටීමට අපහසු විය. එය ඉතා උණුසුම් දිනයකි.

"හැරී, සන්සුන් වෙන්න, හර්මයිනී හරි, ඩම්බල්ඩෝ ලඟපාත ඉන්නකන් පාශාණය ආරක්ශිතයි. මොනාඋනත්, ස්නේප් ෆ්ලෆීව පහුකරන විදිහ හොයාගත්තා කියන්න අපිට සාක්ශියක් ලැබුනේ නෑනේ. එයා එකපාරක් කකුල නැති කරගන්න එකෙන් යන්තම් බේරුනානේ, එයා ආයෙත් කළබලේට උත්සාහ කරන්න යන්නේ නෑ. අනික හැග්‍රිඩ් ඩම්බල්ඩෝට විරුද්ධ වෙන්න කලින් නෙවිල් එංගලන්ත පිළට කුඩිච් සෙල්ලම් කරයි."

හැරී හිස වැනුවේය. නමුත් තමන්ට වැදගත් යමක් කිරීමට අමතක වුනාක් මෙන් හැඟෙන හැඟීමෙන් මිදෙන්නට ඔහුට නොහැකි විය. ඔහු එය විස්තර කිරීමට උත්සාහ කළ විට, "ඒ විභාග නිසා. මම ඊයේ රෑ ඇහැරුනා, මම මගේ රූපාන්තරණ සටහන් භාගයක් කියවගෙන ගියාම තමයි මතක් උනේ අපි ඒක කරලා ඉවරයි කියලා." හර්මයිනී කීවාය.

තමන්ගේ සිතේ ඇති ඉටුනොවූ හැඟීම වැඩත් සමග බැඳුනක් නොවූ බවට හැරීට විශ්වාසය. තම කටෙන් සටහනක් එල්ලාගත් බකමූණෙක් නිල් අහස හරහා පාසල වෙත පියඹා යනු හැරී බලා සිටියේය. මෙතෙක් කාළයකට ඔහුට ලිපි ලියුවේ හැග්‍රිඩ් පමණි. හැග්‍රිඩ් කිසිදින ඩම්බල්ඩෝට ද්‍රෝහි නොවනු ඇති. ෆල්ෆීව පහු කරන විදිහ හැග්‍රිඩ් කිසි දිනක කාටවත් නොකියනු ඇති... කවමදාවත්.... ඒත්...

හැරී එක්වරම නැගිට්ටේය.

"ඔයා කොහේද යන්නේ?" රොන් නිදිබරව ඇසුවේය.

"මම දෙයක් ගැන හිතුවා," හැරී කීවෙය. ඔහු සුදුමැලි වී සිටියේය. "අපි හැග්‍රිඩ්ව බලන්න යන්න ඕනේ, දැන්ම"

"ඇයි?" ඔහුත් සමගම වේගෙන් යමින් හර්මයිනී හති දැම්මාය.

"ඔයාට හිතෙන්නේ නැද්ද ඒක ටිකක් අමුතුයි කියලා" තණකොල වලින් වැසුණු කන්ද නගිමින් හැරී කීවේය. "හැග්‍රිඩ්ට මොනදේටත් වඩා ඕනේ කරන්නේ මකරෙක්ව, එතකොට නාඳුනන කෙනෙක් හදිස්සියේම එනවා සාක්කුවේ බිත්තරේකුත් අරන්. ඒක නීතිවිරෝධී නම් කී දෙනෙක් මකර බිත්තර අරගෙන ඇවිදින්න යයිද? වාසනාවට එයාලාට හැග්‍රිඩ් හම්බුනා, ඔයාලට හිතෙන්නේ නැද්ද? මම ඒක කළින් දැක්කේ නැත්තේ ඇයි?"

Downloaded from sinhalaebooks.com

"ඔයා මොනා ගැනද කියන්නේ?" රොන් ඇසුවත්, පිට්ටනිය හරහා කැළෑව දෙසට දිව ගිය හැරී පිළිතුරු දුන්නේ නැත.

හැග්‍රිඩ් තම ගෙදරට පිට අත් පුටුවක වාඩි වී සිටියේය. ඔහුගේ කලිසම් කකුල් සහ කමිස අත් ඉහළට නවා තිබිණි. ඔහු විශාල බඳුනකට කවුපි සුද්ධ කරමින් සිටියේය.

"හෙලෝ," සිනාසෙමින් ඔහු කීවේය. "විභාගේ ඉවරද? මොනාහරි බොන්න වෙලාවක් තියනවද?"

"අනේ, ඔව්" රොන් කීවත් හැරී ඔහුව වැළැක්වූයේය.

"නෑ, අපිට හදිස්සියි. හැග්‍රිඩ්, මට ඔයාගෙන් අහන්න දෙයක් තියනවා. අර ඔයා නෝබට්ව දිනපු රෑ මතකද? ඔයා කාඩ් සෙල්ලම් කරපු අමුත්තා මොනවගේ පෙනුම තිබ්බ කෙනෙක්ද?"

"දන්නේ නෑ" හැග්‍රිඩ් සාමාන්‍ය ලෙස කීවේය. "එයා එයාගේ ලෝගුව අහක් කරේ නෑ."

තිදෙනාම පුදුම වී ඇස්බැම් උඩට ඔසවනු ඔහුට පෙණිනි.

"ඒකේ අමුත්තක් නෑ. හොග්ස් හෙඩ් වල ගොඩක් අමුතු මිනිස්සු ඉන්නවා -- ඒ අර පල්ලෙහා ගමේ තියන බීම හල. එයා මකර වෙලෙන්දෙක් වෙන්න ඇති. නේද? මම එයාගේ මූණ දැක්කෙම නෑ. එයා ඔලුව වහගෙනමයි හිටියේ."

හැරී කවුපි බඳුන අසල බිමට නැවුනේය. "ඔයා එයා එක්ක මොනා ගැනද කතා කලේ හැග්‍රිඩ්? ඔයා හොග්වාර්ට්ස් ගැන මොනාම හරි කිව්වද?"

"මතක් වෙයි" මතක් කිරීමට උත්සාහ කරන අතරේ හැග්‍රිඩ් කීවේය. "ඔව්... එයා ඇහුවා මම මොනාද කරන්නේ කියලා, මම කිව්වා මම මෙහේ ක්‍රීඩා පිටි භාරකරු කියලා..... මම බලාගත්ත සත්තු ගැනත් එයා ටිකක් ඇහුවා... ඉතිං මම කිව්වා... මම හැමවෙලේම මකරෙක්ට ආසාවෙන් හිටියා කියලත් කිව්වා.... ඊට පස්සේ... මට හොඳටම මතක නෑ, මොකද එයා දිගටම මට බීම අරන් දුන්නා... බලමු... ඔව්, ඊට පස්සේ එයා කිව්වා එයා ලඟ මකර බිත්තරේ තියනවා මට ඕනෙනම් ඒක ගන්න කාඩ් සෙල්ලමක් කරමු කිව්වා.... ඒත් එයාට විශ්වාස කරන්න ඕනේ උන් මට ඒක පාළනය කරගන්න පුළුවන් වෙයිද කියලා. එයාට ඕනේ උනේ නෑ ඌව පරණ ගෙදරකට යවන්න.... ඉතිං මම එයාට කිව්වා ෆ්ලෆීට පස්සේ මකරෙක් ලේසි වෙයි කියලා..."

Downloaded from sinhalaebooks.com

"එතකොට එයා - එයා ෆ්ලෆී ගැන උනන්දු උනා වගේ පෙනුනද?" තම කටහඬ සන්සුන්ව තබා ගැනීමට උත්සාහ කරමින් හැරී ඇසුවේය.

"ම්ම් - ඔව් - ඔයාට ඔලුතුනේ බල්ලෝ කී දෙනෙක් හම්බ වෙයි කියලද? අඩු ගානේ හොග්වාර්ට්ස් අවටවත්? ඉතිං මම එයාට කිව්වා, ෆ්ලෆී කියන්නේ එයාව සන්සුන් කරන ක්‍රමේ දන්නවානම් පාළනය කරන්න හරිම ලේසි කෙනෙක් කියලා, ඌට පොඩි සංගීතයක් වාදනය කරානම් එයා කෙලින්ම නිදාගනී - "

හැග්‍රිඩ් එක්වරම බිරාන්ත විය.

"මම ඔයාලට ඒක් නොකියා ඉන්න තිබ්බේ!" ඔහු වහා කීවේය. "මම ඒක කිව්වා කියලා අමතක කරන්න! ඒයි -- ඔයා කොහේද යන්නේ?"

හැරී, රොන් සහ හර්මයිනී ඇතුල්වීමේ ශාලාව වෙත පැමිණ නැවෙතෙන තෙක් එකිනෙකා සමග කතා නොකළහ.

"අපි ඩම්බල්ඩෝ ලඟට යන්න ඕනේ," හැරී කීවේය. "හැග්‍රිඩ් අර අමුත්තට ෆ්ලෆීව පහු කරන විදිහ කියලා. එතකොට ඒ ලෝගුව ඇතුලේ හිටියේ ස්නේප් නැත්තන් වොල්ඩමෝට් - හැග්‍රිඩ්ට බොන්න දුන්නට පස්සේ ඒක ලේසි වෙන්න ඇති. ඩම්බල්ඩෝ අපිව විශ්වාස කරයි කියලා මම හිතනවා. බේන් නැවැත්තුවේ නැත්තන් ෆිරෙන්සේ අපේ පැත්තට ඉඳී. ඩම්බල්ඩෝගේ කාමරේ කොහේද ?"

යා යුතු පැත්ත පෙන්වන සංඥාවක් සොයන්නට මෙන් ඔවුන් වටපිට බැලූහ. ඩම්බල්ඩෝ ජීවත්වෙන්නේ කොහේදැයි කිසිවෙක් කිසිදින ඔවුන්ට කියා නොතිබිණි. ඔහුව බැලීමට යැවූ කෙනෙක් ගැනවත් ඔවුන් දැන සිටියේ නැත.

"එහෙනම් අපිට වෙන්නේ - - " හැරී කීමට පටන් ගත්තත් ශාලාව හරහා එක්වරම කටහඬක් ඇසිණි.

"ඔය තුන්දෙනා ඇතුලේ මොනාද කරන්නේ?"

ඒ ප්‍රොෆෙසර් මැක්ගොනගල් විය. ඇ විශාල පොත් මිටියක් අතින් ගෙන සිටියාය.

"අපිට ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝව මුණගැහෙන්න ඕනේ," හර්මයිනී කීවාය.

Downloaded from sinhalaebooks.com

"ප්‍රොෆෙසර් ඩම්බල්ඩව හම්බවෙන්න?" එය ඉතා සැක සහිත බව අඟවමින් ප්‍රොෆෙසර් මැක්ගොනගල් කීවාය.
"ඇයි?"

හැරී කෙළ ගිල්ලේය - දැන් මොකද කරන්නේ?

"ඒක පොඩි රහසක්," ඔහු කීවත්, එසේ නොකිවයුතුව තිබුනු බව ඔහුට සිතුනි. මන්ද ප්‍රොෆෙසර් මැක්ගොනගල්ගේ නාස් සිදුරු පළල් විය.

"ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝ විනාඩි දහයකට කළින් ගියා," ඇය සීතල ලෙස කීවාය. "එයාට මායා අමාත්‍යාංශයෙන් වැදගත් පණිවිඩයක් ලැබිලා ඉක්මනට ලන්ඩන් ගියා."

"එයා ගියා?" හැරී ඝිරාන්තව කීවේය. "දැන්?"

"ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝ කියන්නේ ගොඩක් බලවත් මායාකාරයෙක්, පොටර්, එයාට තමන්ගේ වෙලාව ගොඩක් වටිනවා --"

"ඒත් මේක වැදගත්"

"ඔයාට කියන්න තියන දේ මායා අමාත්‍යාංශයට වඩා වැදගත්ද පොටර්?".

"බලන්න," හැරී පරිස්සම පැත්තකට දමමින් කීවේය. "ප්‍රොෆෙසර්, අපි කියන්න හැදුවේ මායා පාශාණය ගැන - - "

ප්‍රොෆේසර් මැක්ගොනගල් බලාපොරොත්තු වූයේ කුමක් වුවත්, මේ එය නොවීය. ඇගේ අතේ තිබූ පොත් ගොන්න බිමට අත හැරිණි. නමුත් ඈ ඒවා ඇහින්දේ නැත."ඔයා කොහොමද දන්නේ --?" ඈ ගොත ගැසුවාය.

"ප්‍රොෆෙසර්, මම හිතන්නේ - මම දන්නවා - අර ස්නේ- අර කවුරුහරි පාශාණය හොරකම් කරන්නයි යන්නේ. මට ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝ ට කතා කරන්න වෙනවා."

ඇය පුදුමය සහ සැකය මුසු බැල්මක් ඔහු වෙත හෙලුවාය.

Downloaded from sinhalaebooks.com

"ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝ හෙට එයි," ඇය අවසාන වශයෙන් කීවාය. " මම දන්නේ නෑ ඔයා පාශාණය ගැන කොහොමද දැනගත්තේ කියලා, ඒත් ඒක කාටවත් කොහොමවත් හොරකම් කරන්න බෑ. ඒක ගොඩාක් ආරක්ශිතව තියෙන්නේ."

"ඒත් ප්‍රොෆෙසර් - - "

"පොටර්, මම කියන්නේ මොනවද කියලා මම හොඳටම දන්නවා," වහා කියා දැමූ ඈ නැවී වැටුනු පොත් ටික අහුලා ගත්තාය. "මම හිතන්නේ ඔයාලා ඔක්කොම එළියට ගිහින් ඉරඑළියේ විනෝද උනානම් හොඳයි"

නමුත් ඔවුන් එසේ කළේ නැත.

"එහෙනම් අද රෑට" ප්‍රොෆෙසර් මැක්ගොනගල් ඈතටම ගිය පසු හැරී කීවේය.. "ස්නේප් අද රෑට දොර ඇරගෙන යයි. එයාට ඕනේ කරන හැමදේම දැනගෙන තියෙන්නේ. දැන් එයා ඩම්බල්ඩෝවත් පාරෙන් අයින් කරානේ. එයා තමයි අර ලියුම එවුවේ, ඔට්ටුයි ඩම්බල්ඩෝව දැකලා මායා අමාත්‍යාංශය පුදුම වෙයි."

"ඒත් අපිට මොනවද කරන්න - - "

හර්මයිනී ගැස්සුනාය. හැරී සහ රොන් හැරී බැලූහ.

ස්නේප් එහි සිටගෙන සිටියේය.

"සුභ සැන්දෑවක්," ඔහු සියුම් ලෙස කීවේය.

ඔවුන් ඔහු දෙස බලා සිටියහ.

"මේ වගේ දවසක ඔයාලා ඇතුලේ ඉන්න ඕනේ නෑ," අමුතු විදිහේ පැටලිලි සහගත සිනාවක් සමග ඔහු කීවේය.

"අපි මේ - - " කියන්නේ කුමක්දැයි නොදැන හැරී කතා කරන්නට පටන් ගත්තේය.

Downloaded from sinhalaebooks.com

"ඔයාලා මීට වඩා පරිස්සම් වෙන්න ඕනේ," ස්නේප් කීවේය. "මේ වගේ එහේ මෙහේ ඇවිදිද්දි, මිනිස්සු හිතයි ඔයාලා මොනාහරි කරන්න ලෑස්ති වෙනවා කියලා, අනික ග්‍රිෆින්ඩෝ වලට තවත් ළකුණු අඩු කරගන්න බෑනේ. නේද?"

හැරී රතු විය. ඔවුන් එළියට යාමට හැරුණත් ස්නේප් ඔවුන්ට ආපසු කතා කළේය.

"අනතුරු අඟවලා තියෙන්නේ පොටර් - තවත් රෑ තිස්සේ ඇවිදින්න හැදුවොත් මම පුද්ගලිකවම තමුන්ව ඉස්කෝලෙන් අස්කරන තැනට වග බලාගන්නම්. සුභ දවසක් එහෙනම්."

ඔහු ගුරු කාමරය දෙසට ගියේය.

ගල් පඩිපෙළ බැස්ස පසු හැරී අනෙක් දෙදෙනා දෙසට හැරුණේය.

"හරි, මේකයි අපිට කරන්න තියෙන්නේ," ඔහු කළබලෙන් කෙඳිරුවේය. "අපි එක්කෙනෙක්ට සිද්ධ වෙනවා ස්නේප් දිහා ඇහැ ගහගෙන ඉන්න - ගුරු කාමරේ එළියේ ඉඳලා, එයා කොහේ හරි යනවානම් පස්සෙන් යන්න ඕනේ. හර්මයිනී, ඔයා ඒක ඔයා කරොත් හොඳයි."

"ඇයි මම?"

"ඒක සාමාන්‍යයිනේ," රොන් කීවේය. "ඔයාට ප්‍රොෆෙසර් ෆ්ලිට්වික් එනකන් ඉන්නවා වගේ රඟපාන්න පුළුවන්නේ, දන්නවනේ." ඔහු බැරෑරුම් හඬකට මාරු විය. "'අනේ ප්‍රොෆෙසර් ෆ්ලිට්වික්, මට හරි දුකයි, මට හිතෙන්නේ මම ප්‍රශ්ණ අංක දාහතර බී වැරදියට කරලා....'"

"ආහ්, කටවහනවා" කියූ හර්මයිනී ස්නේප් ගැන බැලීමට යාමට එකඟ වූවාය.

"එතකොට අපි තුන්වෙනි තට්ටුවේ කොරිඩෝවට එළියෙන් හිටියොත් හොඳයි," හැරී රොන්ට කීවේය. "එන්න."

ඒත් සැළැස්මේ ඒ කොටස වැඩ කළේ නැත. ඔවුන් ෆ්ලෆී ඉන්නා තැන ඇති දොර වෙත ආ වහාම ප්‍රොෆෙසර් මැක්ගොනගල් එහි ආවාය. මෙවර ඈ තරහින් පිපිරුවාය.

"මට පේන්නේ තමුන් හිතාගෙන ඉන්නේ තමුන්ව අල්ලගන්න එක මායාවල් තොගයක් පහුකරනවට වඩා අමාරුයි කියලා වගේ නේ!" ඈ කඩා වැදුනාය. "හොඳටම ඇති මේ විකාර! තමුන් ආපහු මේ කිට්ටුවට ඇවිත් තියනවා

Downloaded from sinhalaebooks.com

කියලා මට ආරංචි උනොත්, මම ග්‍රිෆින්ඩෝ වලින් තව ළකුණු පණහක් කපනවා! ඔව්, වීස්ලී මගේම නිවාසෙන්!" හැරී සහ රොන් ආපසු පොදු කාමරයට ගියෝය. "අඩු ගානේ හර්මයිනී ස්නේප්ගේ පස්සෙන් ඉන්නවානේ" හැරී කියන විටම මහත කාන්තාවගේ පිංතූරය විවෘත වී හර්මයිනී ඇතුළට ආවාය.

"මට සමාවෙන්න හැරී!" ඈ ළතැවුනාය. "ස්නේප් එළියට ඇවිත් ඇහුවා මම මොකද කරන්නේ කියලා, ඉතිං මම කිව්වා මම ෆ්ලිට්වික් එනකන් ඉන්නවා කියලා, එතකොට ස්නේප් ගියා එයාව එක්කන් එන්න, දැනුයි මට එන්න හම්බුනේ, ස්නේප් කොහෙද ගියේ කියලා මම දන්නේ නෑ."

"එහෙනම්, ඒකත් ඉවරයි. නේද?" හැරී කීවේය.

අනිත් දෙදෙනා ඔහු දෙස බළා සිටියහ. ඔහු සුදුමැළි වී ඇස් දිළිසුණේය.

"මම අද රෑට මෙහෙන් යනවා. මම කලින්ම පාශාණය ගන්න උත්සාහ කරනවා."

"ඔයාට පිස්සු!" රොන් කීවේය.

"ඔයාට බෑ!" හර්මයිනී කීවාය. "මැක්ගොනගලුයි ස්නේපුයි කියපු දේවල් වලට පස්සේ එහෙම ගියොත්, ඔයාව අස්කරයි!"

"ඉතිං මොකද" හැරී කෑගැසුවේය්. "ඔයාලට තේරෙන්නේ නැද්ද? ස්නේප් පාශාණය ගත්තොත්, වොල්ඩමෝට් ආයෙත් එනවා! ඔයාලා අහලා නැද්ද එයා හැමදේම අල්ලගන්න හදනකොට මොනවගේද කියලා? අස්කරන්න හොග්වර්ට්ස් එකක් ඉතුරු වෙන එකක් නෑ! එයා මේක සමතලා කරයි, නැත්තන් අඳුරු මායාවන් උගන්නන ඉස්කෝලයක් කරයි! ළකුණු නැතිවෙන එක දැන් වැදගත් නෑ, ඔයාලට පේන්නේ නැද්ද ඔයාලා හිතන්නේ ග්‍රිෆින්ඩෝ නිවාස කුසලානේ දිනුවොත් එයා ඔයාලවයි ඔයාලගේ පවුල් වල අයවයි අතහරියි කියලද? මාව පාශාණය ගන්න කලින් අහු වුනොත්, මිම්, මට වෙන්නේ ඩර්ස්ලිලා ළඟට ගිහින් වොල්ඩමෝට් ඇවිත් මාව එහෙන් හොයාගන්නකන් ඉන්න, එක නිකම් මැරන්න තිබ්බ වෙලාවට වඩා ටිකක් පරක්කු වෙලා මැරෙනවා විතරයි, මොකද මම කවදාවත් අඳුරු පැත්තට යන්නේ නෑ! මම අද අර පල්ලෙහාට තියන දොරෙන් ඇතිලට යනවා, ඔයාලා කියන කිසි දේකින් මාව නවත්තන්න බෑ! වොල්ඩමෝට් මගේ අම්මවයි තාත්තවයි මැරුවා, මතකද ඒක?"

ඔහු ඔවුන් දෙස බැල්මක් හෙලුවේය.

"හැරී ඔයා හරි," හර්මයිනී සෙමින් කීවාය.

Downloaded from sinhalaebooks.com

"මම අදිසි ලෝගුව දාගෙන යන්නම්," හැරී කීවේය. "ඒක ආපහු හම්බවුනු එකත් වාසනාවක්."

"ඒත් ඒකෙන් අපි තුන්දෙනාවම වහන්න පුළුවන්ද?" රොන් කීවේය.

"අපි - අපි තුන්දෙනාම?"

"ඔහ්, නිකා ඉන්න, ඔයා හිතුවද අපි ඔයාට තනියම යන්න දෙයි කියලා?"

"ඇත්තටම නෑ," හර්මයිනී ද ඊට එකතු වූවාය. "ඔයා හිතුවද අපි නැතුව පාශාණය ගන්න පුළුවන් කියලා? මම ගිහිල්ලා මගේ පොත් ටික පොඩ්ඩක් බැලුවනම් හොඳයි. මොනාහරි වැදගත් දෙයක් තියෙන්නෙ පුළුවන්..."

"ඒත් අපිව අහු උනොත්, ඔය දෙන්නවත් අස්කරලා දායි."

"මට ඒකට කරන්න දෙයක් නැත්තන් විතරයි," හර්මයිනී කපටි ලෙස කීවාය. "ෆ්ලිට්වික් මට රහසින් කිව්වා එයාගේ විභාගෙට මට සීයට එකසිය දොළහක් ළකුණු තියනවා කියලා. ඒකට පස්සේ එයාලා මාව එළියට දාන්නේ නෑ."

රාත්‍රී ආහාරයෙන් පසු තුන්දෙනා පොදු කාමරයේ වෙනම වාඩි වී සිටියහ. කවුරුත් ඔවුන්ට කරදර කළේ නැත; කාටවත් හැරීට කීමට කිසිවක් තිබුනේ නැත. මේ හැරී ඒ ගැන දුක් නොවූ පළමු රාත්‍රියයි. හර්මයිනී තම සටහන් පිරික්සමින්, කැඩීමට නියමිත මායවල් සහ වශී ගැන යමක් වේදැයි සෙව්වාය. හැරී සහ රොන් වැඩිය කතා කළේත් නැත. දෙදෙනාම කරන්නට යන දේ ගැන සිතමින් උන්හ.

සිසුන් එකා දෙන්නා නින්දට යාම නිසා කාමරය සෙමින් හිස් විය.

"ලෝගුව ගත්තානම් හොඳයි.," අවසානයේ ලී ජෝඩාන් ඇනුම් අරිමින් පිටව යද්දී රොන් මිමිනුවේය. හැරී උඩ තට්ටුවේ වූ ඔවුන්ගේ අඳුරු කාමරය වෙත දිව ගියේය. ඔහු ලෝගුව එළියට ගද්දී හැග්‍රිඩ් නත්තලට දුන් බට නළාව ඇස ගැටිණි. ඔහු එය ෆ්ලෆීට පාවිච්චි කිරීමට සාක්කුවේ දා ගත්තේය. සිංදු කියන්නට ඔහු ආශා කළේ නැත.

ඔහු පහල පොදු කාමරයට ආපසු දිව ගියේය.

"අපි මෙහෙදිම ලෝගුව දාගත්තානම් හොඳයි, බලන්න ඒක අපි තුන්දෙනාම වහගන්න ඇතිද කියලා - ෆ්ලිච් දැක්කොත් අපේ කකුලක් තනියම ඇවිදිනවා - - "

Downloaded from sinhalaebooks.com

"මොනාද ඔයාලා කරන්නේ?" කාමරයේ අනික් කොනෙන් කටහඬක් ඇසිණි. ට්‍රෙවර් නම් වූ ගෙම්බාවත් අතින් ගෙන නෙවිල් අත් පුටුවක් ලඟින් මෑත් විය.

"මොකුත් නෑ, නෙවිල්, මොකුත් නෑ," ලෝගුව වහාම තම පිටුපස හඟමින් හැරී කීවේය.

නෙවිල් ඔවුන්ගේ වරදකාරී මුහුණු දෙස බළා සිටියේය.

"ඔයාලා ආයෙත් එළියට යනවා," ඔහු කීවේය.

"නෑ, නෑ,නෑ" හර්මයිනි කීවාය "නෑ, අපි යන්නේ නෑ. ඔයා නිදාගන්න යන්නේ නැද්ද නෙවිල්?"

හැරී දොර ලඟ වූ විශාල ඔරලෝසුව දෙස බැලුවේය. ඔවුන්ට තවත් නම් වෙලාව නාස්ති කළ නොහැකිය. ස්නේප් දැනටමත් ෆ්ලෆීට නින්ද යන්නට වාදනයක් කරනවා ඇති.

"ඔයාලට එළියට යන්න බෑ" නෙවිල් කීවේය, "ඔයාලා ආපහු අහුවෙයි, ග්‍රිෆින්ඩෝ තවත් අමාරුවේ වැටෙයි."

"ඔයාට තේරෙන්නේ නෑ," හැරී කීවේය. "මේක වැදගත්"

නමුත් නෙවිල් යමක් කිරීමට උත්සාහ කරන බව පැහැදිලිවම පෙණිනි.

"මම ඔයාලට ඒක කරන්න දෙන්නේ නෑ," පිංතූරය පිටුපස ගුල ඉදිරිපිට වහා සිටගනිමින් ඔහු කීවේය. "මම - මම ඔයාලට ගහනවා!"

"නෙවිල්, "රොන් කඩා පැන්නේය. "ගුල ලඟින් අයින් වෙන්න මෝඩයෙක් වෙන්නේ නැතිව - - "

"ඔයා මට මෝඩයා කියන්න එන්න එපා!" නෙවිල් කීවේය. "ඔයාලා තවත් නීතී කඩන්න ඕනේ කියලා මම හිතන්නේ නෑ! ඔයාලම තමයි මට මිනිස්සුන්ට විරුද්ධ වෙන්න කියලා දුන්නේ!"

"ඔව්, ඒත් අපිට නෙවෙයි," රොන් බැගෑපත්ව කීවේය. "නෙවිල් ඔයා මොනාද කරන්නේ කියලා ඔයාම දන්නේ නෑ."

Downloaded from sinhalaebooks.com

ඔහු අඩියක් ඉදිරියට තබත්ම නෙවිල් ට්‍රෙවර් ගෙම්බාව අතහැරියෙන් ඌ ඉවතට පැන සැඟවුනේය.

"හරි එහෙනම්, එන්න, මට ගහන්න!" තම අත් මිට මොළවමින් නෙවිල් කීවේය. "මම ලෑස්ති!"

හැරී හර්මයිනී දෙසට හැරුණේය.

"මොනාහරි කරන්න" ඔහු නොයිවසිල්ලෙන් කීවේය.

හර්මයිනී ඉදිරියට ගියාය.

"නෙවිල්" ඈ කීවාය. "මේ ගැන මට හරිම කැණගාටුයි."

ඈ තම යෂ්ඨිය එසවූවාය.

"පෙට්‍රිෆිකස් ටොටලස්!" ඈ නෙවිල් වෙත යෂ්ඨිය දිගු කර කීවාය.

නෙවිල්ගේ අත දෙපසට වැටුනි. ඔහුගේ කකුල් එකට ඇළිණි. සම්පූර්ණ ඇඟම ගල් වී ඔහු දෙපසට වැනුනේය. ඉන්පසු ලී කොටයක් වැටෙන්නාක් මෙන් මුණින් අතට කඩා වැටුණේය.

හර්මයිනී දිවගොස් ඔහුව හැරවූවාය. නෙවිල්ගේ හකු එකට තද වී තිබුනෙන් ඔහුට  කතා කිරීමට නොහැකි විය. ඔහුගේ සෙළවුණු ඇස් විතරක් භීරාන්තව ඔවුන් දෙස බැලුවේය.

"ඔයා එයාට මොකද කරේ?" හැරී රහසින් ඇසුවේය.

"එක සම්පූර්ණ ඇඟම බඳින එක," හර්මයිනී කණගාටුවෙන් කීවාය. "අයියෝ, නෙවිල්, මට සමාවෙන්න."

"අපිට කරන්න උනා, නෙවිල්, විස්තර කරන්න වෙලාවක් නෑ," හැරී කීවේය.

Downloaded from sinhalaebooks.com

"ඔයා පස්සේ තේරුම් ගනී නෙවිල්," ඔවුන් ඔහුට ඉහලින් එහා පැත්තට පනිමින් අදිසි කබාය ඇඟලාගද්දී රොන් කීවේය.

නමුත් නෙවිල්ව හෙළවෙන්නවත් බැරි විදිහට එහෙම බිම දම යාම හොඳ වැඩක් ලෙස ඔවුන්ට සිතුනේ නැත. ඔවුන්ගේ බයටම සියලුම පිළිම වල සෙවණැලි ෆ්ලිච් මෙන් දිස්වන්නට විය. ඈතින් ඇසුණු හැම සුළං ශබ්දයක්ම පීව්ස් ඔවුන් මතට පාත් වෙනවාක් මෙන් ඇසෙන්නට විය. පළමු පඩිපෙළ නැගීමට පෙර නොරිස් මහත්මිය පඩිපෙල ඉහල කෙළවරක හැංගී සිටිනු ඔවුන්ට දැකගත හැකි විය.

"ඔහ්, ඌට පයින් ගහමු, මේ පාර විතරක්" රොන් හැරීගේ කණට කෙඳිරුවත් හැරී හිස වැනුවේය. ඔවුන් පරිස්සමින් ඇ වටා ඉහළට නගිද්දී නොරිස් මහත්මිය තම ලාම්පු ඇස් ඔවුන් වෙතට හැර වූවත් කිසිවක් නොකළාය.

තුන්වන මහලේ පඩිපෙළ වෙත එන තෙක් ඔවුන්ට වෙන කිසිවෙක් හමු වූයේ නැත. පීව්ස් කවුරුන්හෝ ආවොත් වැටෙන්නට එහි වූ බුමුතුරුණු ලිහිල් කරමින් සිටියේය.

"කවුද ඔතන?" ඔහු වෙත පඩි නගිද්දී ඔහු එක්වරම ඇසුවේය. ඔහු තම නපුරු කළු ඇස් හීනි කර බැලිවේය්. "මට පේන්නේ නැති උනාට මම දන්නවා ඔතන ඉන්නවා කියලා.. ඔය ගෝවුලිද නැත්තන් අවතාර කෙල්ලද එහෙමත් නැත්තන් කැළෑ මෑස ළමයද?"

ඔහු ඉහලට ගොස් ඔවුන් වෙත පාවී ආවේය.

"ෆ්ලිච්ට කියන්න ඕනේ, පේන්නේ නැති දෙයක් හැම තැනම හොල්මන් කරනවානම් මම කියන්න ඕනේ."

හැරීට එක්වරම අදහසක් ආවේය.

"පීව්ස්," ඔහු ගොරෝසු ලෙස රහසින් කතා කළේය. "ලේ ගලන බාරොන්ට පේන්නේ නැතිව ඉන්න එයාගේ හේතු තියනවා."

පීව්ස් බයටම බිම වැටෙන්නට ගියේය. ඔහු වහා තමාව පාළනය කරගෙන අඩියක් පමණ උඩට පා වුනේය.

"සමාවෙන්න, උත්තමයානෙනි, බාරොන් උතුමානෙනි," ඔහු වහා කීවේය. "මගේ වැරැද්ද, මගේ වැරැද්ද - මම ඔබතුමාව දැක්කේ නෑ -ඇත්තටම මම දැක්කේ නෑ, ඔබතුමා අදිසියිනේ - මේ නාකි පීව්ස්ටයි එයාගේ විහිළු වලටයි සමාවෙන්න උතුමාණෙනි."

Downloaded from sinhalaebooks.com

"මට මෙහේ වැඩ තියනවා පීව්ස් ," හැරී අණ කළේය. "අද රෑට මෙතනින් ඈත් වෙලා ඉන්න."

"මම එහෙම කරන්නම් උතුමාණෙනි, අනිවාර්යයෙන්ම" ආපසු ඉහලට පා වෙමින් පීව්ස් කීවේය. "ඔයාගේ වැඩේ හොඳට වෙයි කියලා හිතනවා, බාරොන්, මම බාධා කරන්නේ නෑ."

ඉන්පසු ඔහු වහා ඉවත් විය.

"අතිවිශිෂ්ඨයි, හැරී!" රොන් රහසින් කීවේය.

තප්පර කිහිපයකට පසු ඔවුන් එහි ලඟා විය. තුන්වෙනි තට්ටුවේ කොරිඩෝවෙන් ඉවත.... දොර දැනටමත් විවෘත කර තිබිණි.

"ඔන්න අපි ආවා" හැරී සෙමින් කීවේය. "ස්නේප් දැනටමත් ෆ්ලෆීව පහු කරලා ගිහින්."

විවෘත වූ දොර තුළින් පේන දේ බැලීමට තිදෙනාටම අවශ්‍ය විය. අදිසි ලෝගුව තුළම හැරී අනෙක් දෙදෙනා වෙත හැරුණේය.

"ඔයාලාට ආපහු යන්න ඕනේනම්, මම කිසි වැරද්දක් කියන්නේ නෑ" ඔහු කීවේය. "ඔයාලට ලෝගුව අරන් යන්න පුළුවන්, මට දැන් ඒක ඕනේ වෙන්නේ නෑ"

"මෝඩ වෙන්න එපා," රොන් කීවේය.

"අපි එනවා," හර්මයිනී කීවාය.

හැරී දොර තල්ලු කර විවෘත කළේය.

දොර සෙමින් විවෘත වෙද්දීම තාලෙට සෙමින් ගොරවන් හඬක් ඔවුන්ට ඇසිණි. ඌට ඔවුන්ව නොපෙනුනත් බලු හොම්බ තුනම පිස්සුවෙන් මෙන් ඔවුන් සිටි පැත්ත ඉව කළේය.

"මොකද්ද අර උගේ කකුල් ලඟ තියෙන්නේ" හර්මයිනී රහසින් ඇසුවාය.

Downloaded from sinhalaebooks.com

"වීනාවක් වගේ" රොන් කීවේය. "ස්නේප් ඒක එතන දාලා යන්න ඇති."

"වාදනය කරන එක නවත්තපු ගමන් ඌ නැගිටිනවා," හැරී කීවේය.. "මේ, ඔන්න..."

ඔහු හැග්‍රිඩ් දුන් බට නළාව ගෙන එය පිම්බේය. එය තාළයක් නොවුනත් පටන් ගත්දීම මෘඝයාගේ ඇස් පියවෙන්නට පටන් ගත්තේය. හැරී හුස්ම ගත්තේ අමාරුවෙනි. සෙමින් සෙමින් බල්ලාගේ ගෙරවිලි නැවතිණි. උගේ පතුල් පණ නැති වී ඌ දණින් වැටුනේය. ඉන්පසු ඌ බිම වැතිරී නිදා ගත්තේය.

"දිගටම වාදනය කරන්න," ඔවුන් ලෝගුවෙන් ඉවතට විත් පහළට බහින දොර වෙත ගමන් කරද්දී රොන් කීවේය. ඔවුන් බල්ලාගේ ඔලු වලට ලං වෙත්දී උගේ ගඳගහණ උණුසුම් හුස්ම තදින් වැදිනි. "මම හිතන්නේ අපිට දොර උඩට අදින්න පුළුවන් වෙයි," බල්ලාගේ පිටුපසට ඉහලින් එබී බලමින් රොන් කීවේය. "හර්මයිනි, මුලින්ම යන්න ඕනෙද?"

"නෑ, මට ඕනේ නෑ!"

"හරි එහෙනම්." රොන් දත්මිටි කාගෙන බල්ලාගේ කකුල් උඩින් පරිස්සමින් පැන්නේය. ඔහු නැවී දොරේ ඇති මුදුවෙන් ඇද එය විවෘත කළේය.

"මොනාද ඔයාට පේන්නේ?" හර්මයිනී නොයිවසිල්ලෙන් ඇසුවාය.

"මොකුත් නෑ - කළු විතරයි - පල්ලෙහාට බහින්න පාරක් නෑ, අපිට පනින්න වෙන්නේ."

තවමත් බට නළාව පිඹින හැරී අතවනා තමා වෙත අවධානය ගත්තේ ඇඟිල්ල දිගුන්කර තමාව පෙන්වීය.

"ඔයාට මුලින්ම යන්න ඕනෙද? ඔයාට විශ්වාසද?" රොන් ඇසුවේය. "මම දන්නේ නෑ මේක කොච්චර යටද කියලා. බට නලාව හර්මයිනීට දෙන්න. එයා බල්ලව නිදි කරලා තියාගනී."

හැරී බට නළාව දුන්නේය. ඒ තප්පරේට බල්ලා ගොරවා දිග ඇදුනේය. නමුත් හර්මයිනී වාදනය පටන්ගත් වහා ඌ තද නින්දට වැටුනේය.

හැරී දොර වෙත පැමිණ පහළ බැලුවේය. පතුලක සේයාවක්වත් නැත.

Downloaded from sinhalaebooks.com

ඔහු තම ඇඟිලි වලින් එල්ලී පහලට ගියේය. ඉන්පසු ඔහු රොන් දෙස බැලුවේය. "මට මොනාහරි උනොත්, පස්සෙන් එන්න එපා, කෙලින්ම බකමූණු කූඩුවට ගිහින් හෙඩ්විග්ව ඩම්බල්ඩෝට යවන්න. හරිද?"

"හරි" රොන් කීවේය.

"විනාඩියකින් හමුවෙමු එහෙනං, මම හිතන්නේ..."

ඉන්පසු හැරී අත නිදහස් කළේය. ඔහු පහළට වැටෙත්ම සීතළ, ගඳගහන සුළඟ ඔහු පසු කර ගියේය. ඔහු පහළට, පහළට, පහළට වැටී නතර විය. විකාර වැටිල්ලකින් ඔහු යම් මෘදු දෙයක් මත වැටී වෙලී ගියේය. ඔහු නැගිට අතපත ගා බැළුවේය. ඔහුගේ ඇස් අඳුරට හුරු නැත. එය දැනුනේ ඔහු යම්කිසි ආකාරයේ ශාකයක් මත සිටිනවා මෙනි.

"එක හරි!" ඔහු ඉහලින් පේන මුද්දරයක් ප්‍රමාණයේ ආලෝක කොටුව වෙත කීවේය. සිනිඳු තැනකට වැටෙන්නේ. ඔයාට පනින්න පුළුවන්!"

රොන් වහා පැන්නෙන් අතපය විහිදාගෙන හැරී අසලට පතිත විය.

"මේ මොනාද?" ඔහු මුලින්ම ඇසුවේය.

"දන්නේ නෑ, මොනාහරි පැළ ජාතියක් වගේ. මම හිතන්නේ ඒක තියෙන්නේ වැටෙන එක නවත්තන්න. හර්මයිනී ඉක්මනට එන්න!"

ඈතින් ඇසුණු සංගීතය නැවතුනේය. බල්ලා මහ හයියෙන් බුරනු ඇසුණත් හර්මයිනී ඒ වන විටත් ඇතුලට පැන සිටියාය. ඈ හැරීගේ අනික් පැත්තට පතිත වූවාය.

"අපි ඉස්කෝලෙන් හැතැක්ම ගානක් යට වෙන්න ඇති" ඈ කීවාය.

"ඇත්තටම මේ පැළෑටි ජාතිය තියන එක වාසනාව," රොන් කීවේය.

"වාසනාව" හර්මයිනී වෙවුලුවාය. "ඔය දෙන්නා දිහා බළන්න!"

Downloaded from sinhalaebooks.com

ඈ ඉහළට එසවී බිත්තියක් වෙත යාමට දැඟලුවාය. ඇයට දඟලන්නට සිදු වූයේ ඇය පතිත වූ මොහොතේම පැළෑටිය විසින් සර්පයන් මෙන් වූ පහුරු වලින් ඇගේ කකුල් වෙලාගන්නට පටන් ගත් නිසායි. හැරී සහ රොන් දකින්නටත් පෙර ඒවා භයානක ලෙස ඔවුන්ගේ කකුල් තදින් වෙලාගෙන තිබිණි.

පැළෑටිය හොඳින් අල්ලා ගැනීමට පෙර හර්මයිනී තමාව නිදහස් කර ගැනීමට සමත් වූවාය. ඉන්පසු ඈ පිරිමි ළමුන් දෙදෙනා පැලෑටිය තමන්ගෙන් ඉවත් කිරීමට පොරබදින දෙස භිරාන්ත වී බලා සිටියාය. ඔවුන් ඊට එරෙහිව දඟලන තරම වැඩි වෙත්ම පැළෑටිය ඔවුන්ව ග්‍රහණයට ගන්නා වේගය වැඩි විය.

"හෙල්ලෙන්න එපා!" හර්මයිනී ඔවුන්ට අණ කළාය. "මම දන්නවා මේ මොනාද කියලා - ඒ යක්ශයාගේ උගුල!"

"ඔහ්, ඒකට කියන නම දැනගත්තට හරිම සතුටුයි, ලොකු උදව්වක්," තම ගෙළ වටා පැළෑටිය එතීම වළක්වන්නට පොර බදිමින් රොන් කෑගැසුවේය. "කෑ ගහන්න එපා. මම ඒක මරන හැටි මතක් කරන්න උත්සාහ කරනවා!" හර්මයිනී කීවාය.

"හොඳයි, ඉක්මන් කරන්න, මට හුස්ම ගන්න බෑ" හැරී තම පපුව වටා එතුනු වැල අදිමින් කීවේය.

"යක්ශයාගේ උගුල, යක්ශයාගේ උගුල ... ප්‍රොෆෙසර් ස්ප්‍රෞට් මොකද්ද කීවේ? - ඒක අඳුරටයි කුණු වළටයි කැමතියි. "

"එහෙනම් ගිණි ගොඩක් ගහන්න!" හැරී හුස්ම හිරවෙමින් කීවේය.

"ඔව් - ඇත්තටම - ඒත් මෙතන දර නෑනේ!" හර්මයිනී තම අත් තදින් මිරිකමින් කීවාය.

"ඔයාට පිස්සු හැදිලද?" රොන් බෙරිහන් දුන්නේය. "ඔයා මායාකාරියක්ද නැද්ද?"

"ඔහ්, හරි !" කියූ හර්මයිනී තම යශ්ඨිය ඉවතට ඇදගත්තාය. ඈ යමක් මුමුණමින් එය වැනුවාය. නිල්පාට ගිණිදළු ඉන් ඉවතට විහිදිණි. තත්පර කිහිපයකට පසු පැළෑටිය ආළෝකයෙන් සහ රස්නෙන් ඉවතට ඇදෙද්දී තමන් වටා වූ වැල් ලිහිල් වෙනු රොන්ට සහ හැරීට දැණුනි. නළියමින් ගැස්සෙමින් එය ඔවුන්ගේ සිරුරු වලින් ඉවත් වූයෙන් ඔවුන් නිදහස් විය.

"වාසනාවට ඔයා ඖෂධ විද්‍යාව හොඳට අහගෙන ඉන්නේ හර්මයිනී" හර්මයිනි සිටි බිත්තිය අසළට එමින් මුහුණේ දහඩිය පිසිමින් හැරී කීවේය.

Downloaded from sinhalaebooks.com

"ඔව්" රොන් කීවේය.  "හැරී මෙතන විනාශයක් කරගෙන ඔලුව නැති කරගත්තේ නැති එකත් වාසනාව --
'මෙතන දර නැනේ, ඇත්තටම??."

"මේ පැත්තට," හැරී ගලින් සෑදූ පටු මගක් පෙන්වමින් කීවේය. ඉදිරියට යාමට තිබුනේ ඒ මග පමණයි.

ඔවුන්ට තමන්ගේ අඩි හඬට අමතරව ඇසුණේ බිත්ති වලින් වතුර වැටෙන හඬ පමණි. පටු මාර්ගය පහළ අතට දිවෙන් එකක් වූයෙන් හැරීට ග්‍රින්ගොට්ස් සිහි විය. හදවතේ වූ අප්‍රසන්න වේදනාවක් සමග, මායා බැංකුවේ සේප්පු ආරක්ශා කරමින් ඉන්න බව කියූ මකරාව ඔහුට මතක් විය. ඔවුන්ට මකරෙක් මුණ ගැහුණොත්, සම්පූර්ණයෙන්ම වැඩුණු එකෙක්, - නෝබට් දැනටමත් නරක අත්දැකීමක් වී තිබිණි.

"ඔයාට මොනාහරි ඇහෙනවද?" රොන් රහසින් කීවේය.

හැරී ඇහුම්කන් දුන්නේය. ඉහළින් සියුම් සර සර හඬක් සහ  සියුම් ගැටෙන හඬක් ඇසේ.

"ඔයා හිතනවද ඒ අවතාරයක් කියලා?"

"මම දන්නේ නෑ... මට ඇහෙන්නේ පිහාටු සද්දයක් වගේ."

"අන්න ඉස්සරහ එළියක් තියෙනවා - මොනාහරි හෙළවෙනවා මට පේනවා."

ඔවුන් පටු මග කෙළවරට පැමිණි විට හොඳින් ආලෝකමත් කළ කුටියක් දක්නට ලැබිණි. එහි සිවිළිම ඔවුන්ට ඉහලින් රවුම් හැඩයකට පිහිටා තිබිණි. කුටිය මැණික් කැට මෙන් දිළිසෙන සැළෙන දහලන කුරුල්ලන්ගෙන් පිරී පැවතිනි. කුටියේ විරුද්ධ පැත්තේ විශාළ ලී දොරක් විය.

"අපි කාමරේ හරහා ගියොත් උන් අපිට පහර දෙයි කියලා ඔයාලා හිතනවද?" රොන් කීවේය.

"බොහෝ විට," හැරී කීවේය.  "උන් දරුණු විදිහට පේන්නේ නෑ, ඒත් මට හිතෙන්නේ උන් ඔක්කොම එකවර පල්ලෙහාට කඩාගෙන ආවොත් ... ඒත්, වෙන ක්‍රමයක් නෑ... මම දුවන්නම්"

හැරී හොඳ හුස්මක් ගෙන, අත්වලින් මූණ වසාගෙන කාමරය හරහා පිම්මේ දිව ගියේය. මොන තප්පරේ හරි උල් හොටවල් සහ නියපොතු පිටේ වදී යැයි ඔහු  බලාපොරොත්තු උවත් කිසිවක් සිදු වූයේ නැත. ඔහු පරිස්සමින් අනෙක් පසට ගියේය. ඔහු දොරේ තිබු අල්ලුවෙන් අල්ලා ඇද්දත් එය අගුළු දා තිබිණි.

Downloaded from sinhalaebooks.com

අනෙක් දෙදෙනාත් ඔහු පසුපස ආවෝය. ඔවුන් දොර ඇද්දත්, එසවීමට උත්සාහ කළත් එය සෙළවුනේවත් නැත. හර්මයිනීගේ ඇලොහොමෝරා මන්තරය වැඩ කළේත් නැත.

"දැන් මොකද කරන්නේ?" රොන් කීවේය.

"මේ කුරුල්ලෝ ... උන් නිකන් ලස්සනට විතරක් මෙතන ඉන්නවා වෙන්න බෑ" හර්මයිනී කීවාය.

ඔවුන් කුරුල්ලන් දිළිසෙමින් පියාඹන අයුරු බළා සිටියෝය. දිළිසෙමින්??

"උන් කුරුල්ලෝ නෙවෙයි!" හැරී එක්වරම කීවේය. "ඒවා යතුරු! පිහාටු තියන යතුරු -- හොඳට බලන්න. ඒ කියන්නේ ..." අනික් දෙදෙනා යතුරු දෙස බළා සිටින අතරේ ඔහු වට පිට බැලුවේය. "... ඔව් - අර බලන්න! කොසු! අපිට තියෙන්නේ දොරේ යතුර අල්ලගන්න.!"

"ඒත් එතන ඒවා සියගාණක් තියනවා!"

රොන් දොරේ අගුල පරික්ශා කර බැළුවේය.

"අපි හොයන්න ඕනේ, ලොකු පරණ තාලේ යතුරක් - බොහෝවිට අගුල වගේම රිදී එකක්."

ඔවුන් තිදෙනාම කොසු තුනක් ගෙන ඉහළ ශබ්ද කරන යතුරු පොදිය තුළට ගියෝය. ඔවුන් ඉදිරියට පැන අල්ලන්න්ට තැත් කළත් ඒවා වේගයෙන් යමින් විසිරෙමින් ඇල්ලීම කළ නොහැක්කක් මෙන් පෙන්වීය.

හැරී රටේ දක්ෂ ලාබාලම සොයන්නා  වූයේ නිකම් නෙවෙයි. ඔහුට දේවල් සොයා ගන්න අනිත් අයට නැති දස්කමක් තිබිණි. දේදුනු පාට පිහාටු අතරේ විනාඩියක් පමණ පියෑඹු හැරී නැමුණු තටුවක් ඇති විශාල රිදී යතුරක් දුටුවේය. එය දිස්වූයේ දැනටමත් වරක් අල්ලාගෙන රළුවට යතුරු සිදුරේ ඔබන ලද්දක් මෙනි.

"අරක!" ඔහු අනෙක් දෙදෙනාට කතා කළේය. "අර ලොකු එක - අතන - නෑ, අතන -- අර දිළිසෙන නිල්පාට පිහාටු තියෙන්නේ  - එක පැත්තක පිහාටු ඔක්කොම පොඩි වෙලා."

හැරී පෙන්නූ දෙසට රොන් වේගයෙන් ගියේය. ඔහු සිවිලිමේ හැප්පී වැටෙන්නට ගියේය.

Downloaded from sinhalaebooks.com

"අපි ඒකට ලංවෙන්න ඕනේ!" පොඩි වුනු තටු ඇති යතුරෙන් ඇස් ඉවතට නොගෙන හැරී කීවේය. "රොන්, ඔයා උඩින් ඒක ලඟට එන්න - හර්මයිනී යට ඉඳලා ඒක පල්ලෙහාට යන්න නොදී තියාගන්න. මම ඒක අල්ලගන්න බලන්නම්. හරිනේ. දැන්!"

රොන් පහළට ආවේය, හර්මයිනී ඉහලට ආවාය. යතුර ඔවුන් දෙදෙනාවම මග හැරියේය. නමුත් හැරී එය පසුපස පැන්නුවේය. එය බිත්තිය දෙසට වේගයෙන් යන්නට පටන් ගත්තේය. හැරී ඉදිරියට නැවී ජරා පොඩිවෙන ශබ්දයක් ඇතිව යතුර එක් අතකින් ගලට තද කරගත්තේය. රොන් සහ හර්මයිනීගේ ප්‍රීතිඝෝශාව උස් කුටියේ දෝංකාර දුන්නේය.

ඔවුන් වහා බිමට ආ පසු යතුර අතේ දඟලන හෙයින් හැරී දොර වෙත දිව්වේය. ඔහු වහා එය අගුලට රිංගවා කැරකුවේය. එය විවෘත විය. අඟුල ඇරුණු වහා යතුර නැවතත් පියෑඹීමට පටන් ගත්තේය. එය දැන් දෙවතාවක්ම අල්ලාගෙන ඇති නිසා පියෑඹුවේ ඉතා අපහසුවෙනි.

"ලෑස්තිද?" දොරේ අල්ලුව මත අත තබමින් හැරී අනෙක් දෙදෙනාගෙන් ඇසුවේය. ඔවුන් හිස වැනුවෙන් ඔහු දොර තල්ලු කර විවෘත කළේය.

ඊලඟ කුටිය බොහෝ කළුවර වූයෙන් ඔවුන්ට කිසිවක් පෙණුනේ නැත. නමුත් ඔවුන් ඇතුලට පය තබත්ම එය ආලෝකමත් වී අළංකාර දර්ශණයක් පෙන්වීය.

ඔවුන් සිටගෙන සිටියේ විශාල චෙස් ලෑල්ලක කෙළවර පිටුපසම පේළියේ චෙස් මිනිසුන්ට පිටිපස්සෙනි. ඒ සියල්ල ඔවුන්ට වඩා උස් වූ අතර කළුගලෙන් නෙලා ඇතිවාක් මෙන් පෙණිනි. කුටියේ අනෙක් කෙළවරේ ඔවුන්ට මුහුණලා සුදු ඉත්තන් තිබිණි. හැරී, රොන් සහ හර්මයිනී යන්තම් වෙවුලුවෝය. සුදු චෙස් මිනිස් කුළුණු වලට මුහුණු තිබුනේ නැත.

"දැන් අපි මොකද කරන්නේ?" හැරී කෙඳිරුවේය.

"වෙන මොනා කරන්නද?" රොන් කීවේය. "අපි කාමරේ එහා පැත්තට යන්න චෙස් සෙල්ලම් කරන්න ඕනේ."

සුදු ඉත්තන්ට පිටුපසින් ඔවුන්ට තවත් දොරක් පෙනෙන්නට තිබිණි.

"කොහොමද?" හර්මයිනී කණස්සල්ලෙන් ඇසුවාය.

"මම හිතන්නේ, අපිට චෙස් මිනිස්සු වෙන්න සිද්ධවෙනවා."

Downloaded from sinhalaebooks.com

රොන් කළු නයිට්වරයා වෙත ගොස් නයිට්වරයාගේ අශ්වයාව ඇල්ලුවේය. එක්වරම කළුගලට පණ ආවෙන් අශ්වයා කකුල් බිම වැද්දූ අතර, නයිට්වරයා හිස්වැස්ම ලූ හිස හරවා පහළ සිටි රොන් දෙස බැලුවේය.

"අපිට එහා පැත්තට යන්න - අර් - ඔයාලාට එකතු වෙන්න ඕනෙද?" කළු නයිට්වරයා හිස සැලුවේය. රොන් අනෙක් දෙදෙනා වෙත හැරුණේය.

"මේකට හිතන්න ඕනේ" ඔහු කීවේය. "මම හිතන්නේ අපි කළු ඉත්තෝ තුන්දෙනෙක්ගේ තැන් ගන්න ඕනේ....."

හැරී සහ හර්මයිනී රොන් හිතන තෙක් නිහඬව සිටියහ. අන්තිමේ ඔහු කතා කළේය. "දැන්, ඔය දෙන්නා වැරදියට හිතන්න එපා, අවුල් වෙන්නත් එපා, ඒත් ඔය දෙන්නම චෙස් වලට එච්චර දක්ශ නෑනේ - - "

"අපි අවුල් යන්නේ නෑ" හැරී වහා කීවේය. "අපි කරන්න ඕනේ දේ කියන්නකෝ."

"හොඳයි, හැරී, ඔයා බිශොප්ගේ තැන ගන්න, හර්මයිනී ඔයා එයාගේ එහා පැත්තට යන්න, අර මාලිගාව වෙනුවට ."

"එතකොට ඔයා?"

"මම නයිට් කෙනෙක් වෙන්න යන්නේ," රොන් කීවේය.

චෙස් මිනිසුන් ඇහුම්කන් දෙන බවක් පෙණෙන්නට තිබිණි. මන්ද එක් බිශොප් කෙනෙකුත්, නයිට්වරයෙකුත්, මාළිගයත් සුදු ඉත්තන්ට පිටුපස හරවා ලෑල්ලෙන් ඉවත් වූහ. හැරී, රොන් සහ හර්මයිනීට සිටගැනීමට හිස් කොටු තුනක් ඉතිරිවිය.

"හැමවෙලේම චෙස් වල මුලින්ම පටන්ගන්නේ සුදු," රොන් ලෑල්ලේ අනෙක් පස බළමින් කිවේය. "ඔව්... අර.."

සුදු කුඩා ඉත්තෙක් කොටු දෙකක් ඉදිරියට ආවේය.

රොන් කළු ඉත්තන් මෙහෙයවීමට පටන් ගත්තේය. ඔහු යවන තැනට ඒවා නිහඬවම ගමන් කළේය. හැරීගේ දණහිස් වෙවුළන්නට විය. ඔවුන් පැරදුනොත් මොනා වෙයිද?

Downloaded from sinhalaebooks.com

"හැරී ඇදේට කොටු හතරක් දකුණට යන්න."

මුල්ම කම්පණය ඇති වූයේ ඔවුන්ගේ අනෙක් නයිටවරයාව අල්ලාගත් මොහොතේය. සුදු රැජිණ ඔහුව කුඩුවී බිමට වැටෙන්නට ගසා ලෑල්ලෙන් ඉවතට ඇදගෙන ගියාය. ඔහු එහි නිහඬව මුනින්තලා වැටී සිටියේය.

"ඒක වෙන්න දෙන්න සිද්ධ උනා," රොන් වෙවුළමින් කීවේය. "ඒකෙන් ඔයාට පුළුවන් අර බිශොප්ව අල්ලගන්න හර්මයිනී, යන්න."

ඔවුන්ගේ ඉත්තෙක් අල්ලාගන්නා හැම විටම සුදු ඉත්තන් කිසිම අනුකම්පාවක් පෙන්වූයේ නැත. ඉක්මනින්ම කළු ඉත්තන්ගේ සුන්බුන් ගොඩක් බිත්තිය අයිනේ ගොඩ ගැසුණි. හැරී සහ හර්මයිනී අනතුරේ වැටී ඇතිබව රොන් දුටුවේය. ඉන්පසු ඔහු ලෑල්ලවටා යමින් කළු ඉත්තන් විනාශ වෙන අතර පුලුවන් තරම් සුදු ඉත්තන් අල්ලා ගත්තේය.

"අපි ළඟට ඇවිත්," ඔහු එක්වරම මිමිනුවේය. "ඉන්න මම හිතන්න. මම හිතන්නම්..."

සුදු රැජිණ තම හිස් මුහුණ ඔහුවෙත හැරවූවාය.

"ඔව්..." රොන් සිහින් හඬින් කීවේය."ඒක තමයි එකම ක්‍රමේ... මාව අල්ලගන්න දෙන්න ඕනේ."

"නෑ" හැරී සහ හර්මයිනී කෑ ගැසුවෝය.

"මේ චෙස්!" රොන් වහා කීවේය. "ඔයාට සිද්ධවෙනවා කැපවීම් කරන්න! මම අඩියක් ඉස්සරහට තියනවා එතකොට රැජිණ මාව අල්ලගනී - ඒකෙන් ඔයාට රජාව චෙක්මේට් කරන්න පුළුවන් හැරී!"

"ඒත්- - "

"ඔයාට ස්නේප්ව නවත්තන්න ඕනෙද නැද්ද?"

"රොන්- - "

Downloaded from sinhalaebooks.com

"බලන්න, ඔයා ඉක්මන් කරේ නැත්තන්, එයා පාශාණය ගනී!"

වෙන කරන්නට දෙයක් නොවීය.

"ලෑස්තිද" රොන් සුදුමැළි මුහුණෙන් නමුත් නිර්භීතව ඇසුවේය. "ඔන්න මම යනවා - මේ, දිනුවට පස්සේ මෙතන ඉන්න එපා."

ඔහු අඩියක් ඉදිරියට තැබුවේය. සුදු රැජිණ කඩා පැන්නාය. ඈ තම ගල් අතින් රොන්ගේ හිස මැදට වැරෙන් පහර දුන්නාය. ඔහු බිම පතිත විය. හර්මයිනී හූ තිබ්බත් තම කොටුවේම සිටියාය. සුදු රැජිණ රොන්ව පැත්තකට ඇදගෙන ගියාය. රොන් සිහි නැතිවී ගිය බවක් පෙණෙන්නට තිබිණි.

වෙවුළමින්, හැරී වම් පැත්තට කොටු තුනක් ගියේය.

සුදු රජු තම ඔටුන්න ගළවා හැරීගේ කකුල් දෙක ළඟට විසි කළේය. ඔවුන් දිනුවෝය.  වෙස් මිනිසුන් දෙපසට වී හිසනමා ආචාර කරමින් ඉදිරිපස වූ දොර වෙත යාමට මග පාදා දුන්නෝය. අවසන් වතාවට බළාපොරොත්තු සුන් වූ බැල්මක් රොන් වෙත හෙලූ හැරී සහ හර්මයිනී දොර හරහා වහා අනෙක් පටු පාර වෙත දිව ගියෝය.

"එතකොට එයා --?"

"එයාට මොකුත් වෙන්නේ නෑ" තමාවම සනසවමින් හැරී කීවේය. "ඔයා හිතන්නේ ඊලඟට මොනවගේ දෙයක් තියෙයිද?"

"අපිට ස්ප්‍රෞට්ගෙන් තිබ්බා, යක්ශයාගේ උගුල; යතුරු වලට මතුරන්න ඇත්තේ ෆ්ලිට්වික්; මැක්ගොනගල් තමයි වෙස් මිනිස්සුන්ට පණ දෙන්න ඇත්තේ; එතකොට කුරල්ගේ මන්තරේ ඇරුණම, ස්නේප්ගේ"

ඔවුන් තවත් දොරක් වෙත පැමිණ තිබිණ.

"හරිද එහෙනම්?" හැරී රහසින් කීවේය.

"යමු."

Downloaded from sinhalaebooks.com

හැරී දොර තල්ලු කර විවෘත කළේය.

අප්‍රසන්න සන්ධයක් ඔවුන්ගේ නහ පුඩු වසා ගත්තේය. දෙදෙනාම තම කබා ඉහළට ඔසවා නහය වසා ගත් හ. ඇස් වල කඳුලු පුරවාගත්, ඔවුන් දුටුවේ තමන් ඉදිරිපිට පොළොවේ ඔවුන් අල්ලාගත් ට්‍රෝල්ට වඩා විශාල ට්‍රෝල් කෙනෙක් හිසේ විශාල ගෙඩියකුත් සමග සිහි නැති වී වැටී සිටින අයුරුයි.

"ඌ එක්ක සටන් කරන්න උනේ නැති එකට මට සතුටුයි," උගෙ විශාල කකුළක් උඩින් පනින අතරේ හැරී සතුටින් කීවේය. "ඉක්මන් කරන්න, මට හුස්මගන්න බෑ."

ඔහු ඊලඟ දොර විවෘත කරද්දී ඊලඟට ඇති දේ දැනගැනීමට දෙදෙනාම ඇතුළත බැලීමට බිය වූහ. නමුත් එහි බය වීමට කිසිවක් නොවීය. එහි වූයේ මේසයක් මත එක පෙළට තැබූ වෙනස් හැඩවල බෝතල් හතක් පමණි.

"ස්නේප්ගේ" හැරී කීවේය. "අපිට මොනාද කරන්න තියෙන්නේ?"

ඔවුන් ඇතුළට අඩිය තබත්ම, පිටුපස දොර පෙදෙස හරහා වහා ගින්නක් ඇවිලුනේය. එය සාමාන්‍ය ගින්නක් නොවීය. එය දම්පැහැ ගින්නකි. ඒ මොහොතේම ඉදිරිපස දොර හරහා කළු ගිණිදලු මතු විය. ඔවුන් එහි සිරවිය.

"බලන්න!" බෝතල් අසල වූ රෝල් කළ කඩදාසියක් හර්මයිනී අතට ගත්තාය. හැරී ඇගේ උරහිසට උඩින් එබී එය කියවන්නට විය.

ඔබ ඉදිරියෙන් ඇත්තේ අනතුරයි, පිටුපසින් ආරක්ශාවයි.

අපි දෙදෙනෙක් ඔබට උදව් කරයි, ඔයා හොයාගන්න එක.

අපි හත්දෙනා අතරින් එකක් ඔබව ඉදිරියට ගෙන යයි.

තව එකක් බොන කෙනාව ආපසු යවයි.

අපේ නොම්මර අතරින් දෙකක් නෙටල් වයින් පමණි.

පොළිමේ ඇති අපි තුනක් මිනීමරුවෝය.

සදහටම මෙහි ඉන්නට අවශ්‍ය නැත්තන් තෝරාගන්න.

ඔයාගේ තෝරාගැනීම වෙනුවෙන් අපි මේ උදව් හතර කරනවා,

එක, කපටිම සංයෝජනය හැංගෙන කෙනාය.

ඔබ හැමවිටම නෙට්ල් වයින් වල පැත්තකින් තැබූවක් සොයාගනීවි.

දෙක, කෙළවරවල් දෙකේ ඇතිදෙක එකිනෙකට වෙනස් ය.

Downloaded from sinhalaebooks.com

නමුත් ඉදිරියට ආවොත්, එක්කෙනෙක්වත් ඔබේ මිතුරන් නොවේ

තුන, ඔබට පේන පරිදි සියල්ල වෙනස් ප්‍රමාණ වේ.

අඟුටුමිට්ටන් වත් යෝධයන්වත් තමන් තුළ මරණය තබාගන්නේ නැත.

හතර, වමේ දෙවෙනියා සහ දකුණේ දෙවෙනියා

වෙනස්වට පෙනුනත් ඔබ පානය කළොත් නිවුන්නුය.

හර්මයිනී තදින් සුසුමක් හෙළුවාය. හැරීගේ පුදුමයට ඈ නොසිතූ ලෙස සිනා සුනාය.

"නියමයි," හර්මයිනී කීවාය. "මේක මායාවක් නෙවෙයි - තර්කයක් - ප්‍රෙහෙලිකාවක්. බළවත් මායාකාරයෝ ගොඩකට තර්ක ශාස්ත්‍රය බිංදුවක්වත් ඔලුවේ නෑ. එයාලා මෙතන හැමදාටම හිරවෙයි."

"ඒත්, අපිවත් එහෙම වෙයි, නැද්ද?" "අපෝ නෑ" හර්මයිනී කීවාය. "අපිට ඕනේ හැමදේම මේ කොළේ තියනවා. බෝතල් හතයි: තුනක් වස; දෙකක් වයින්; එකක් අපිව ආරක්ශිතව කළු ගින්දර හරහා ගෙනියයි, එකක් දම්පාට ගින්දර හරහා ගෙනියයි"

"ඒත් අපි කොහොමද දන්නේ කෝකද බොන්න ඕනේ කියලා?"

"මට විනාඩියක් දෙන්න."

හර්මයිනී කඩදාසිය කීපවරක් කියෙව්වාය. ඉන්පසු බෝතල් පේළිය අසල මුමුණමින් ඒවාට ඇඟිල්ල දිගු කරමින් ඉහළ පහළ ගියාය. අවසානයේ ඈ අත්පුඩි ගැසුවාය.

"ඒක හරි," ඈ කීවාය. "පුංචිම බෝතලේ අපිව කළු ගින්දර හරහා පාශාණය පැත්තට ගෙනියයි."

හැරී කුඩා බෝතලය දෙස බැලුවේය.

"ඒකේ අපි එක්කෙනෙකුට ඇති වෙන්න තියෙන්නේ," ඔහු කීවේය. "එක උගුරක් තරම්වත් නෑ."

ඔවුන් එකිනෙකා දෙස බැලූහ.

Downloaded from sinhalaebooks.com

"කෝකද එතකොට දම්පාට ගින්දර හරහා ආපහු ගෙනියන්නේ?"

හර්මයිනී පේළියේ දකුණු කෙළවරේ වූ රවුම් බෝතලය පෙන්වූවාය.

"ඔයා ඒක බොන්න," හැරී කීවේය. "එපා, අහන්න, ආපහු ගිහින් රොන්ව ගන්න. ඉගිලෙන යතුරු කාමරෙන් කොසු අරන් එළියට යන්න. ඒකෙන් දොරෙන් එළියට ගිහින් ෆ්ලෆීව පහු කරන්න පුළුවන්. කෙළින්ම බකමූණු කූඩුවට ගිහින් හෙඩ්විග්ව යවන්න ඩම්බල්ඩෝට. අපිට එයාව ඕනේ. මට ඕන්නම් ස්නේප්ව ටික වෙලාවක් අල්ලගෙන ඉන්න පුළුවන් වෙයි, ඒත් එයාට මාව ඒ තරම් දෙයක් නෙවෙයි, ඇත්තටම."

"ඒත් හැරී - නම නොකියන කෙනා එයා එක්ක හිටියොත්?"

"හ්ම්ම් - මම එකපාරක් වාසනාවන්ත උනා, එහෙම නේද?" තම කැළල පෙන්වමින් හැරී කීවේය. "සමහර විට මම ආයෙත් වාසනාවන්ත වෙයි."

හර්මයිනී තොල් තද කරගත්තාය. ඇ එක්වරම දැත් විහිදා ඔහුව බදා ගත්තාය.

"හර්මයිනී!"

"හැරී - ඔයා හොඳම මායාකාරයෙක්, දන්නවද."

"මම ඔයාතරම් හොඳ නෑ," ඇය අතහරිත්ම ලැජ්ජාවෙන් හැරී කීවේය.

"මම!" හර්මයිනී කීවාය. "පොතුයි බුද්ධියයි. ඊටවඩා ගොඩක් වැදගත් දේවල් තියනවා - යාලුකමයි නිර්භීතකමයි - අනේ හැරී - පරිස්සම් වෙන්න!"

"ඔයා මුලින්ම බොන්න," හැරී කීවේය. "කොයි එක කෝකද කියලා ඔයාට විශ්වාසයි නේ?"

"ඔව්," හර්මයිනී කීවාය. අවසානයේ ඇ රවුම් බෝතලයෙන් ලොකු උගුරක් බී වෙවුලුවාය.

"ඒක වහ නෙවේනේ?" හැරී නොඉවසිල්ලෙන් ඇසුවේය.

Downloaded from sinhalaebooks.com

"නෑ - ඒත් ඒක අයිස් වගේ."

"ඉක්මන් කරන්න, ඒක මැකෙන්න කළින් යන්න."

"පරිස්සම් වෙන්න, ජයම වේවා."

"යන්න!"

හර්මයිනී ආපසුහැරී කෙළින්ම දම්පැහැ ගිණිදලු හරහා ගියාය.

හැරී ලොකු හුස්මක් ගෙන කුඩාම බෝතලය අතට ගත්තේය. ඔහු කළු ගිණිදළු වෙත හැරුණේය.

"ඔන්න මම එනවා," කියූ ඔහු කුඩා බෝතලයේ වූ දේ එක උගුරට බිව්වේය.

එය ඇත්තටම දැනුනේ ඇඟ අයිස් වලින් වැහෙන්නාක් මෙනි. ඔහු බෝතලය බිම දමා ඉදිරියට ගියේය. ඔහු තමාව තදකර අල්ලා ගත්තේය. ගිණිදළු ඔහුගේ සිරුරට ආසා කරන බව පෙනුනත්, ඒවා ඔහුට දැනුනේ නැත. මොහොතකට ඔහුට කළු ගින්දර හැර කිසිවක් පෙනුනේ නැත. ඉන්පසු ඔහු අනෙක් කුටියට පය තැබුවේය. එය අවසාන කුටිය විය.

එහි දැනටමත් කෙනෙක් පැමිණ සිටියේය. නමුත් ඒ ස්නේප් නොවීය. ඒ වොල්ඩමෝට් ද නොවීය.

## දහහත් වෙනි පරිච්ඡේදය

## මුහුණු දෙකක් ඇති මිනිසා

ඒ කුරල් ය.

"ඔයා!" හැරී ගැස්සුණේය..

Downloaded from sinhalaebooks.com

කුරල් සිනාසුනේය. ඔහුගේ මුහුණ කෙසේවත් ඇඹරුනේ නැත.

"ඔව් මම" ඔහු ශාන්තව කීවේය. " ඔයාව මෙතනදි හම්බවෙයි කියලා මම හිතුවා පොටර්."

"ඒත මම හිතුවේ - ස්නේප් - - "

"සෙවරස්?" කුරල් මහ හයියෙන් සිනාසුනේය. එය ඔහුගේ සාමාන්‍ය වෙවුලන ස්වරය ද නොවීය. නමුත් තියුණු සීතල ස්වරයකි. "ඔව්, සෙවරස් ඒ වර්ගේ වගේ තමා පේන්නේ, නේද? එයා ඕනාවටවඩා ලොකු වෙච්ච වවුලෙක් වගේ හැමතැනම ඇවිදින එක හරි ප්‍රයෝජනවත්. එයා ඉන්නකොට කවුද අ - අ - අසරණ, ගොත් -ගොතගහන ප්‍රො - ප්‍රොෆෙසර් කුරල්ව සැක කරන්නේ?"

හැරීට එය විශ්වාස කළ නොහැකිය. මෙය ඇත්තක් විය නොහැකිය. නෑ

"ඒත් ස්නේප් මාව මරන්න හැදුවා!"

"නෑ, නෑ, නෑ, මම ඔයාව මරන්න හැදුවා. කුඩිච් තරගේ දවසේ ඔයාගේ යාලුවා ග්‍රේන්ජර් ස්නේප්ට ගිණි තියන්න දුවන ගමන් වැරදිලා මගේ ඇගේ හැප්පුනා. මම ඔයාට ඇහැ ගහගෙන හිටපු එක එයා කැඩුවා. තව තප්පර කීපයක් තිබ්බානම් මම ඔයාව අර කොස්සෙන් වට්ටනවා. ස්නේප් ඔයාව බේරගන්න ප්‍රතිශාපයක් මතුරන්න ගත්තේ නැත්තන් මම ඒක කළින්ම කරලා."

"ස්නේප් හැදුවේ මාව බේරගන්න?"

"ඔව් ඇත්තටම," කුරල් නොසැළකිලිමත් ලෙස කීවේය. "ඔයා හිතන්නේ ඒයාට ඔයාගේ ඊලඟ තරගේ විනිශ්චය කරන්න ඕනේ උනේ මොකක් නිසා කියලද? එයාට ඕනේ උනේ මම ආයෙත් ඒක කරන්නේ නැතිවෙන්න වැඩ කරන්න. ඒකනම් විහිලුවක්, ඇත්තටම... එයාට කරදර නොවී ඉන්න තිබ්බේ. ඩම්බල්ඩෝ බලන් ඉද්දි මට මොකුත් කරන්න බෑනේ. අනිත් ගුරුවරු ඔක්කොම හිතුවේ ග්‍රිෆින්ඩෝ දිනන එක ස්නේප් නවත්තන්න හදනවා කියලා, එයා තමන්ව අප්‍රසන්න කෙනෙක් කරගත්තා... මොන තරම් කාළයක් නාස්ති කරගත්තද, ඒ හැමදේටම පස්සේ, මම අද රෑට ඔයාව මරන්න යනවානේ."

ඔහු අසුරක් ගැසුවෙන් ලණු කීපයක් මැවී ඒවා හැරී  වටා තදින් එතුනේය.

"ජීවත් වෙන්න ඕනේ නැතිතරම් ඔයා අනිත් දේවල් වලට අත දානවා වැඩී පොටර්. හැලෝවීන් දවසේ අර විදිහට ඉස්කෝලේ පුරා දඩ්බිඩියේ දුවපු එක වැරදියි, මම හිතුවේ... පාශාණය රකින්නේ කවුද කියලා බලන්න මම ආපු එක ඔයා දැක්කා කියලා විතරයි."

Downloaded from sinhalaebooks.com

"ට්‍රෝල්ට ඇතුලට එන්නදුන්නේ ඔයා?"

"අනිවාර්යයෙන්. මට ට්‍රෝල්ලා සම්බන්ධ විශේෂ දක්ශකමක් තියනවා - කලින් කාමරේ හිටපු එකාට මම කරලා තිබ්බ දේ ඔයා දකින්න ඇතිනේ? අවාසනාවට, අනිත් හැමෝම ඌව හොයන්න හැමතනම දුවන අතරේ, මාව කලින් සැක කරපු ස්නේප්, කෙළින්ම තුන්වෙනි තට්ටුවට ගියා මාව අල්ලගන්න - මගේ ට්‍රෝල්ට ඔයාව මරලා දාන්නත් බැරිඋනා, ඔලු තුනේ බල්ලාට ස්නේප්ගේ කකුල හරියට හපලා කඩාගන්නත් බැරිඋනා.

"දැන්, සද්ද නැතිව ඉන්න පොටර්, මට මේ සිතගන්නා සුලු කණ්නාඩිය පරීක්ශා කරන්න තියනවා.

කුරල්ගේ පිටුපස තිබූ දේ හැරී දුටුවේ එවිටයි. ඒ 'වශාආ' කණ්නාඩිය විය.

"පාශාණය හොයාගන්න යතුර තමයි කණ්නාඩිය," කුරල් මුමුණමින් කණනාඩියේ රාමුවට තට්ටු කළේය. "ඩම්බල්ඩෝ මේවගේ දෙයක් කරයි කියලා මට හිතුනා... ඒත් එයා ලන්ඩන්වලනේ... එයා ආපහු එනකොට මම,ගොඩක් දුර ගිහිල්ලා තියෙයි...."

හැරීට සිතන්නට පුළුවන් එකම දේ වූයේ කුරල්ව කතාවට අල්ලාගෙන ඔහු කණ්නාඩිය පිරික්සන එකට බාධා කිරීමයි.

"මම ඔයාවයි ස්නේප්වයි කැළේ ඉන්නවා දැක්කා - - " ඔහු කීවේය.

"ඔව්," කණ්නාඩිය පිටුපසින් ගමන් කරමින් ඔහු කීවේය. "එයා ඒ වෙලාවේ මට විරුද්ධව ආවා. මම කොච්චර දුර ගිහින්ද  කියලා දැනගන්න. එයා හැමවෙලේම මාව සැක කළා. මාව බයකරන්න හැදුවා - හරියට එයාට පුළුවන් වගේ, වොල්ඩමෝට් උතුමාණන් මගේ පැත්තට ඉන්නකොට...."

කුරල් කණ්නාඩිය ඉදිරිපසට පැමිණ නොඉවසිල්ලෙන් ඒ දෙස බලා සිටියේය.

"මට පේනවා පාශාණය... මම ඒක මගේ ස්වාමියාට දෙනවා... ඒත් ඒක කොහේද?"

හැරී තමාව තද කරගෙන සිටින ළණු බුරුල් කරගැනීමට දැඟලුවේය. නමුත් ඒවා බුරුල් වූයේ නැත. ඔහු කුරල් තම සම්පූර්ණ අවධානය කණ්නාඩියට දීමෙන් වැලැක්විය යුතුය.

Downloaded from sinhalaebooks.com

"ඒත් ස්නේප් හැම වෙලේම මට ගොඩක් වෛර කරාවගේ පෙනුනේ."

"අහ් , ඔව් එයා වෛර කරනවා," කුරල් සාමාන්‍ය ලෙස කීවේය. "දෙයියනේ, ඔව්. එයා හොග්වර්ට්ස් වල හිටියේ ඔයාගේ තාත්තාත් එක්ක, ඔයා දන්නේ නැද්ද? ඒ දෙන්නට දෙන්නා පිළිකුල් කරා. ඒත් එයා කවදාවත් ඔයා මැරෙනවාට කැමති වුනේ නෑ."

"ඒත් මට දවස් කීපෙකට කලින් ඔයා අඬනවා ඇහුනා - මම හිතුවේ ස්නේප් ඔයාට තර්ජනය කරනවා කියලා...."

පළමු වතාවට, කුරල්ගේ මුහුණ බයෙන් ගැස්සුනේය.

"සමහර වෙලාවට, මට මගේ ස්වාමියාගේ උපදෙස් පිළිපදින්න අමාරුයි වගේ -- එයා බලගතු මායාකාරයෙක්, එතකොට මම දුර්වල - - "

"ඔයා කියන්නෙ එයා එතන පංතිකාමරේ ඔයත් එක්ක හිටියා කියලද?" හැරී ගැස්සුනේය.

"මම කොහේ ගියත් එයා මගෙත් එක්ක ඉන්නේ," කුරල් සෙමින් කීවේය. "මට එයාව මුණ ගැහුනේ ලෝකේ වටේ යනකොට. මම එතකොට මෝඩ කොල්ලෙක්, හොඳයි නරකයි දෙක ගැන විකාර අදහස් ගොඩක් තිබ්බෙ. වොල්ඩමෝට් උතුමානෝ පෙන්නලා දුන්නා මම කොච්චර වැරදිද කියලා. තියෙන්නේ බළයයි ඒක ලබාගන්න බැරි දුර්වලකමයි විතරයි..... කීප සැරයක් එයාව අමාරුවේ දැම්මත් එදා ඉඳලා මම එයාට අවංකව වැඩ කරා., එයාට සිද්ධ වුනා මට තදින් ඉන්න." කුරල් එක්වරම වෙවුලුවේය. "එයා ලේසියෙන් වැරදි වලට සමාව දෙන්නේ නෑ. මට ග්‍රින්ගොට්ස් වලින් පාශාණය හොරකම් කරන්න බැරි උනාම, එයාට ගොඩාක තරහ ගියා. එයා මට දඬුවම් කරා... මගේ දිහා ඇහැගහගෙනම ඉන්න එයා තීරණය කරා...."

කුරල්ගේ කටහඬ බිඳී ගියේය. ඩයගන් ඇලී වලට තමන් ගිය ගමන හැරීට මතක් විය. ඔහු එතරම් මෝඩ වූයේ කෙසේද? ඔහු ඒ දවසේම කුරල් එහි සිටිනු දුටුවේය. කාන්දුවෙන කල්දේරමේදී ඔහුට අතට අත දුන්නේය.

කුරල් සිහින් හඬින් ශාප කළේය.

"මට තේරෙන්නේ නෑ... පාශාණය තියෙන්නේ කණ්නාඩිය ඇතුලේද? මම ඒක කඩන්න ඕනේද?"

හැරීගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය.

Downloaded from sinhalaebooks.com

මේ වෙලාවේ ලෝකේ මොන දේටත් වඩා මට ඕනේ කරන්නේ.... ඔහු සිතුවේය.... කුරල්ට කලින් පාශාණය හොයාගන්න එක... එතකොය මම කණ්නාඩිය දිහා බැලුවොත්, මට පෙනෙයි මම ඒක හොයාගන්නවා - ඒ කියන්නේ ඒක හංගලා තියන තැන මට පෙනෙයි! ඒත් මම මොකද්ද කරන්න යන්නේ කියලා කුරල්ට තේරෙන්නේ නැතිවෙන්න බලන්නේ කොහොමද?

ඔහු වම් පැත්තට හැරී කුරල්ට නොපෙනෙන්නට කණ්නාඩිය ඉදිරිපසට යාමට උත්සාහ කළේය. නමුත් ඔහුගේ කකුල් වටා වූ ලණු ඉතා තද වූයෙන් ඔහු පැටලී ඇද වැටුනේය. කුරල් ඔහුව නොසළකා හැර නැවත තමා සමග කතාව පටන් ගත්තේය. "මේ කණ්නාඩියෙන් මොනාද වෙන්නේ? කොහොමද ඒක වැඩ කරන්නේ? මට උදවු කරන්න ස්වාමීනී!"

හැරීව භීතියට පත් කරමින් කටහඬක් පිළිතුරු දුන්නේය. කටහඬ එන්නේ කුරල් තුලින්ම බව පෙණෙන්නට තිබිණි.

"කොල්ලව පාවිච්චි කරන්න... කොල්ලව ගන්න..."

කුරල් හැරී දෙසට හැරුණේය.

"ඔව්, පොටර් - මෙහෙට එන්න."

ඔහු වරක් අප්පුඩි ගැසුවේය. හැරීවටා එතී තිබූ ලණු බිමට වැටිණි. හැරී සෙමින් සිට ගත්තේය.

"මෙහේ එන්න" කුරල් නැවත කීවේය. "කණ්නාඩිය දිහා බලලා ඔයාට පේන්නේ මොනාද කියලා කියන්න."

හැරී එය ඉදිරියට ඇවිද ගියේය.

මම බොරු කියන්න ඕනේ, ඔහු නොයිවසිල්ලෙන් සිතුවේය. මම බලලා බොරුවක් කියන්න ඕනේ. එතකොට හරි.

කුරල් ඔහු පිටුපසින් ළං වුනේය. කුරල්ගේ තලප්පාවෙන් එන විකාර ගඳ හැරීට දැනුනි. ඔහු ඇස් වසා කණ්නාඩිය ඉදිරිපිටට ගොස් ඇස් ඇරියේය.

ඔහු මුලින්ම තම බය වූ සුදුමැලි ප්‍රතිබිම්භය දුටුවේය. නමුත් මොහොතකට පසු ප්‍රතිබිම්භය ඔහු හා සිනාසුනේය. එය සාක්කුවට අත දමා ලේ රතු පැහැ ගලක් එළියට ගත්තේය. එය ඔහුට ඇසක් ගසා පාශාණය නැවත සාක්කුවේ දා ගත්තේය. එය එසේ කරත්ම තම සාක්කුවට යම් බරති දෙයක් වැටෙනු හැරීට දැණිනි. කෙසේ හෝ - විශ්වාස කළ නොහැකි ලෙස - ඔහුට පාශාණය ලැබුනේය.

Downloaded from sinhalaebooks.com

"හොඳයි?" කුරල් නොයිවසිලිමත්ව කීවේය. "ඔයාට මොනාද පේන්නේ?"

හැරීගේ ධෛර්‍යය මදක් පසුබැවේය.

"මට පේනවා මම ඩම්බල්ඩෝට අතට අත දෙනවා," ඔහු කතාවක් හැදූවේය. "මම - මම ග්‍රිෆින්ඩෝ නිවාස කුසලානේ දිනලා."

කුරල් නැවත සාප කළේය.

"යනවා යන්න අහකට" ඔහු කීවේය. හැරී අයින් වෙද්දී තම කකුලේ මායා පාශණය වදිනු ඔහුට දැනුනේය. එය ඇල්ලීමට ඔහු තරම් ඔහු නිර්භීත වූයේ නැත.

නමුත් ඔහු අඩියක්වත් යාමට පෙර, කුරල් තම තොල් සෙළෙව්වේ නැතත් උස් කටහඬ කතා කළේය.

"උඵ බොරු කියන්නේ... බොරු කියන්නේ..."

"පොටර්, ආපහු මෙහෙ එනවා!" කුරල් කෑ ගැසුවේය. "මට ඇත්ත කියනවා. තමුන් මොනවද දැන් දැක්කේ?"

උස් කටහඬ නැවත කතා කළේය.

"මට එයාට කතා කරන්න දෙන්න... මූණට-මූණ..."

"ස්වාමිනී, ඔබතුමා තාම එච්චර ශක්තිමත් නෑ!"

"මට ඇතිවෙන්න ශක්තිය තියනවා ..මේකට...."

හැරීට දැනුනේ යක්ශයාගේ උගුල තමන්ව අල්ලාගත්තාක් මෙනි. ඔහුට එක මස්පිඩුවක් වත් සෙළවීමට නොහැකිය. ඔහු ගල්ගැසී, කුරල් අත් ඉහලට ඔසවා තම තලප්පාව ගලවන දෙස බලා සිටියේය. සිදුවන්නේ කුමක්ද? තලප්පාව පසෙකට වැටුනේය. එය නැතිව කුරල්ගේ හිස අසාමාන්‍ය ලෙස කුඩාවට පෙණිනි. ඉන්පසු ඔහු එතැනම අනෙක් පස හැරුණේය.

Downloaded from sinhalaebooks.com

හැරී කෑගසන්නට ඉඩ තිබිණි, නමුත් ඔහුට කිසිම ශබ්දයක් කිරීමට නොහැකි විය. කුරල්ගේ ඔලුවේ පිටුපස තිබිය යුතු තැන වූයේ මුහුණකි, හැරී ජීවිතේටම දැක තිබූ භයානකම මුහුණයි. එය හුණු මෙන් සුදු, දිළිසෙන රතු ඇස් ඇති සර්පයෙකුගේ මෙන් නාස් සිදුරු ඇති මුහුණකි.

"හැරී පොටර්..." එය රහසින් කෙඳිරුවේය.

හැරී අඩියක් පස්සට යන්නට හැදුවත් ඔහුගේ කකුල් සෙළවුනේ නැත.

"බලනවා මට මොකද වෙලා තියෙන්නේ කියලා?" මුහුණ කීවේය. "නිකම්ම නිකං හෙවණැල්ලකුයි දුමකුයි විතරයි.... මට වෙනකෙනෙක්ගේ ඇඟක ඉන්න පුළුවන් වෙලාවට විතරයි හැඩයක් ගන්න පුළුවන්.... ඒත් මාව හදවතට හිතට ඇතුල් කරගන්න කට්ටිය හරියට හිටියා..... පහුගිය සතිවල කඟවේන ලේ මාව ශක්තිමත් කරා.... තමුන් දැක්කනේ විශ්වාසවන්ත කුරල් කළෑවේදී මං වෙනුවෙන් ඒවා බොනවා.... මට අමෘතය හම්බවුනු ගමන්, මගේම කියලා ඇඟක් හදාගන්න පුළුවන් වෙයි..... දැන්...තමුන්ගේ සාක්කුවේ තියන පාශාණය මට දුන්නොත් හොඳයි නේද?"

ඒ කියන්නේ එයා දැනගෙන හිටියා. ඒ හැඟීම එක්වරම හැරීගේ කකුල් වලට පණ දුන්නේය. ඔහු පිටුපසට වැටුණේය.

"මෝඩයෙක් වෙන්න එපා," මුහුණ රවමින් කීවේය. "තමන්ගේ පණ බේරගෙන මගෙත් එක්ක එකතුවුනොත් හොඳයි... නැත්තන් තමුන්ගේ අම්මා තාත්තාට වුන දේම තමයි වෙන්නේ.... එයාලා මගෙන් අනුකම්පාව ඉල්ලමින් තමයි මැරුනේ..."

"බොරු කාරයා!" හැරී එක්වරම කෑ ගැසුවේය.

කුරල් වොල්ඩමෝට්ට හැරීව පේන ලෙස පස්සෙන් පස්සට ආවේය. රාක්ශ මුහුණ සිනාසෙන්නට විය.

"කොච්චර දුකක්ද..." එය පිම්බේය. "මම හැමවෙලේම නිර්භීතකම අගේ කරා... ඔව්, කොළුවෝ, තමුන්ගේ අම්මයි තාත්තයි නිර්භීතයි.....මම මුලින්ම ඔයාගේ තාත්තව මැරුවා, එයා බොහොම උනන්දුවෙන් සටන් කරා.. ඒත් ඔයාගේ අම්මා මැරෙන්නේ නැතිව ඉන්න තිබ්බේ... එයා ඔයාව ආරක්ශා කරන්නයි හැදුවේ..... දැන් එයා මැරුණ එක වැඩක්ට නැති දෙයක් වෙන්න ඕනේ නැත්තන් මට පාශාණය දෙන්න."

"කවදාවත් නෑ!"

Downloaded from sinhalaebooks.com

හැරී ගිණිගන්නා දොර දෙසට පැන්නේය. නමුත් වොල්ඩමෝට් කෑගැසුවේය. "අල්ලගන්න එයාව!". ඊලඟ තප්පරයේ හැරීගේ මැණික්කටුව කුරල්ගේ අතට තද විය. එක්වරම හැරීගේ නළලේ කැළලට ඉඳිකටුවකින් අනින්නාක් මෙන් වේදනාවක් විහිදී ගියේය. ඔහුගේ හිස දෙකට පැලෙන්නට යන්නාක් මෙන් එය දරුණු විය. ඔහු මහ හඬින් හූ තිබ්බේය. ඔහු උපරිමයට දැඟලුවේය. ඔහුගේ පුදුමයට කුරල් ඔහුව අත හැරියේය. ඔලුවේ වූ වේදනාව අඩු වූයෙන් ඔහු කුරල් කොහේ ගියේදැයි බැලීමට වටපිට බැලුවේය. කුරල් වේදනාවෙන් නැවී තම ඇඟිලි දෙස බලා සිටිනු ඔහු දුටුවේය. ඔහු බලාසිටියදීම ඒවායින් බුබුලු දමන්නට විය.

"අල්ලගනිං! ඌව අල්ලගනිං!" වොල්ඩමෝට් නැවත කෑ ගැසුවේය. කුරල් හැරී මතට පැන්නෙන් ඔහුගේ ඇඟට හැරී යට විය. ඔහු අත් දෙකෙන්ම හැරීගේ බෙල්ල මිරිකුවේය. හැරීගේ කැළලේ වෙදනාවෙන් ඔහු අන්ධ වූවාක් මෙන් විය. නමුත් කුරල් මාරාන්තික වේදනාවකින් හූ තිබ්බේය.

"ස්වාමීනී, මට එයාව අල්ලගන්න බෑ - මගේ අත් - මගේ අත්!"

කුරල් වේදනාවෙන්ම තම දණිස් වලින් හැරීව බිමට තබා තද කළේය. ඔහු හැරීගේ බෙල්ල අතහැර භිරාන්තව තම අත් දෙස බලා සිටියේය. ඒවා ගිණිගන්නවාක් මෙන් හැරීට පෙණිනි. මස් රතු වී දිළිසෙන්නට විය.

"එහෙනම් ඌව මරපන්, මෝඩයෝ. ඉවරයක් කරපන් !" වොල්ඩමෝට් යටිගිරියෙන් කෑගැසුවේය.

කුරල් මරණ ශාපයක් කිරීමට අත් එසවූයේය. නමුත් හැරී ක්ශණයකින් එසවී කුරල්ගේ මුහුණ අල්ලාගත්තේය...

"ආආආආආආහ්හ්හ්!"

කුරල් ඔහුගෙන් ඉවතට පෙරලුනේය. ඔහුගේ මුහුණත් බුබුලු දමන්නට විය. එවිට හැරීට යමක් තේරුණි. කුරල්ට තමන්ගේ නිරාවරණය වූ සම ඇලීමට නොහැක. උග්‍ර වේදනාවකින් පීඩා නොවිඳ ඇල්ලිය නොහැකිය. ඔහුගේ එකම වාසිය වූයේ කුරල්ව අල්ලාගෙන සිටීමයි. ඔහුට ශාපයක් කිරීමට නොහැකි වෙන තරමේ වේදනාවක තබාගැනීමයි.

හැරී කුරල්ගේ බාහුව අල්ලාගෙනම සිට ගෙන තමාට හැකි උපරිම තදින් එය අල්ලාගෙන සිටියේය. කුරල් හැරීව විසි කිරීමට දඟලමින් හූ තිබ්බේය. හැරීගේ හිසේ වූ වේදනාව තවත් දරුණු වූයෙන් ඔහුගේ ඇස් නොපෙනී ගියේය. කුරල් වේදනවෙන් කෑගසන අයුරු ඔහුට ඇසුනි. "මරපන් ඌව, මරපන් ඌව!" වොල්ඩමෝට් කෑගසන හඬ සමග තවත් කටහඬවල් ඇසුණි. සමහර විට එය තම හිතේ ඇති වූවක් වෙන්නට පුළුවනි. නමුත් කවුරුන් හෝ අඬනු ඇසිණි. "හැරී, හැරී!"

කුරල්ගේ අත තම ග්‍රහණයෙන් ඇදී ගැලවී යනු ඔහුට දැනුනි. සියල්ල අහිමි වූ බව ඔහුට තේරුණි. ඉන්පසු ඔහු අඳුරට ඇදී ගියේය. පහළට....පහළට.... පහළට

Downloaded from sinhalaebooks.com

ඔහුට ඉහලින් යම්කිසි රන්පැහැ දෙයක් දිළිසෙන්නට විය. ස්නිච් පන්දුව! ඔහු එය අල්ලාගැනීමට උත්සාහ කළේය. නමුත් ඔහුගේ අත් ඉතා බර විය.

ඔහු ඇසිපිය ගැසුවේය. එය ස්නිච් පන්දුව නොවේ. ඒ ඇස් කණ්නාඩි කුට්ටමකි. කොච්චර අමුතුද.

ඔහු නැවත ඇසිපිය ගැසුවේය. ඔහුගේ දර්ශණ පථයට සිනාවෙන ඇල්බස් ඩම්බල්ඩෝගේ මුහුණ පහත් විය.

"සුභ සන්ධ්‍යාවක්, හැරී," ඩම්බල්ඩෝ කීවේය.  හැරී ඔහු දෙස බලා සිටියේය. ඉන්පසු ඔහුට මතක් විය: "සර්! පාශාණය! ඒ කුරල්! එයා පාශාණය ගත්තා සර්, ඉක්මන් කරන්න - - "

"කළබල වෙන්න එපා, දරුවෝ, ඔයා හිතනවට වඩා වෙලා ගිහින් තියෙන්නේ " ඩම්බල්ඩෝ කීවේය. "කුරල් ළඟ පාශාණය නෑ."

"එහෙනම් කා ළඟද සර්? මම - - "

"හැරී අනේ, කළබල වෙන්න එපා. මැඩම් ප්‍රොම්ෆ්‍රේ මාව එළියට දායි"

හැරී තම වට පිටාව දෙස බැලුවේය. තමන් ඉස්පිරිතාල කාමරයේ ඉන්නා බව ඔහුට වැටහිණි. ඔහු වැතිරී සිටින්නේ සුදු ලිනන් රෙද්දක් දැමූ ඇඳකයි. ඔහු අසල වූ මේසයක රස කැවිලි කඩෙන් භාගයක් පමණ ගොඩ ගසා තිබිණි.

"ඔයාගේ යාලුවන්ගෙනුයි ඔයාව අගේ කරන අයගෙනුයි තෑගි ," ඩම්බල්ඩෝ එදෙස බලමින් කීවේය. "පල්ලෙහාදී ඔයයි  ප්‍රොෆෙසර් කුරල් ලුයි අතර වෙච්ච දේ සම්පූර්ණ රහසක්. ඉතිං සාමාන්‍ය විදිහට මුළු ඉස්කෝලෙම ඒක දන්නවා. මම හිතන්නේ ඔයාට වැසිකිළි පෝච්චියක් එවන්න උත්සාහ කරේ ෆ්‍රෙඩ් වීස්ලි ජෝජ් වීස්ලි දෙන්නා. සැකයක් නෑ එයාලා හිතන්න ඇති ඒකෙන් ඔයා විනෝද වෙයි කියලා. මොනා උනත් මැඩම් පොම්ෆ්‍රෙර් හිතුවා එක එච්චර සනීපාරක්ශක නෑ කියලා, ඉතිං ඒක රාජසන්තක කරා."

"මම කොච්චර කල් මෙහේ හිටියද?"

"දවස් තුනක්. රොනල්ඩ් වීස්ලියි ග්‍රේන්ජයි ගොඩක් සතුටු වෙයි ඔයාට සිහිය ආපු එකට. එයාලා හරියට දුක් වුනා."

"ඒත් සර්, පාශාණය...

Downloaded from sinhalaebooks.com

"මට පේන්නේ ඔයා තාමත් හිතවෙනස් කරගෙන නෑ. හොඳයි, පාශාණය, ප්‍රොෆෙසර් කුරල්ට ඒක ඔයාගෙන් ගන්න බැරි වුනා. මම වෙලාවට ආවා ඒක වලක්වන්න. ඔයා තනියම ඒක හොඳට කරා, මම ඒකත් කියන්නම ඕනේ.

"ඔයා එහෙට ආවා? ඔයාට හර්මයිනී එවපු බකමූණා හම්බුනාද?"

"අපි අහසෙදි මාරුවෙන්න ඇත්තේ. මම ලන්ඩන් ගිය ගමන් තේරුනා මම ඉන්නම ඕනේ තැනින් තමයි එළියට ආවේ කියලා. මම කුරල්ව ඔයාගෙන් අයින් කරන්න වෙලාවට ආවා."

"ඒ ඔයා."

"මම බය වුනා මම පරක්කු වැඩි වෙයි කියලා."

"තව ටිකක් පහුඋනා නම් එහෙම වෙයි. මට එයාව ගොඩක් වෙලා පාශාණයෙන් ඈත්කරලා තියාගන්න බැරි වුනා -- "

"පාශාණය නෙවෙයි, දරුවෝ, ඔයා - ඔයාව මැරෙන්නම ගියානේ. එක මොහොතකට එතනදි මම බයවුනා එහෙම වෙලා කියලා. එතකොට පාශාණය ගැන කිව්වොත්, ඒක විනාශ කරලා දැම්මා."

"විනාශ කරා?" හැරී ඇසිපිය ගසමින් ඇසුවේය. "ඒත් ඔයාගේ යාලුවා - නිකොලස් ෆ්ලැමල්- "

"ඕ, ඔයා නිකොලස් ගැනත් දන්නවා ද?" උද්‍යෝගයෙන් යුතුව ඩම්බල්ඩෝ ඇසුවේය. "ඔයා වැඩේ හරියටම කලා. නේද? මිම්, මම නිකොලස් එක්ක පොඩ්ඩක් කතා කරලා එකඟ වුනා,... ඒකෙන් යහපතක්ම වෙයි."

"ඒත් ඒකේ තේරුම එයයි එයාගේ නෝනයි මැරෙයි. නැද්ද?"

"එයාලා ළඟ හැම ගණුදෙණුවක්ම පියවන්න ඕනේ වෙන තරම් කාලෙකට ඇති තරම් අමෘතය ගබඩා කරලා තියනවා, ඊට පස්සේ,... ඔව් එයාලා මැරෙයි."

හැරීගේ මුහුණේ වූ විමතිය දැක ඩම්බල්ඩෝ සිනාසුනේය.

Downloaded from sinhalaebooks.com

"ඔයා වගේ පොඩි ළමයෙකුට, මට විශ්වාසයි ඒක හරි පුදුමයක් කියලා. ඒත් නිකොලස්ටයි ප්‍රෙනෙල්ලේටයි, ඒක නිකන් මහන්සි වෙච්ච දිග දවසකට පස්සේ නිදාගන්න යනවා වගේ. ඒක ඇත්තටම දිගම දිගම දිග දවසකට පස්සේ නින්දට යාමක් තමයි. මොනා උනත්, හොඳට සංවිධානය උන මනසකට මරණය කියන්නේ තමන්ගේ ඊලඟ මහා වික්‍රමය. දන්නවද, පාශාණය ඒ තරම් හොඳ දෙයක් නෙවෙයි. තමන්ට ඕනේ තරම් ජීවිතයයි සල්ලියි තියන එක! ගොඩක් මිනිස්සු වෙන ඕනේම දේකට වඩා ආශාකරන්නේ ඒ දෙකට - ප්‍රශ්ණේ තමයි, මිනිස්සු ඒවා තෝරගන්නේ තමන්ට ඒවා හොඳම නෑ කියලා නොදැන." හැරී වචන රහිතව එහි වැතිරී සිටියේය. ඩම්බල්ඩෝ යම් සංගීතයක් මුමුණා සිවිලිම දෙසට සිනාසුනේය.

"සර්" හැරී කතා කළේය. "මම හිතුවේ... සර් - පාශාණය නැති වුනත්, වොල් -, මම කිව්වේ, නම නොකියන කෙනා - - "

"එයාට වොල්ඩමෝට් කියන්න හැරී. හැමවෙලේම හැමදේටම නියම නම පාවිච්චි කරන්න. නමකට බය උනාම ඒ දේට තියන බය තවත් වැඩි වෙනවා."

"ඔව්, සර්, මේ, වොල්ඩමෝට් ආපහු එන්න වෙන ක්‍රම උත්සාහ කරයි නේද? මම කිව්වේ, එයා යන්නම ගිහිල්ලා නැනේ. නේද?"

"නෑ, හැරී, එයා ගිහින් නෑ, එයා තාම කොහේ හරි ඉන්නවා. සමහර විට හවුලේ පාවිච්චි කරන්න ශරීරයක් හොයනවා ඇති... ඇත්තටම ජීවත් වෙනවත් නෙවෙයි. එයාව මරන්න බෑ, එයා කුරල්ව මැරෙන්න ඇරියා. එයා තමන්ගේ හතුරන්ට පෙන්වන තරමේ කරුණාවම තමයි තමන්ගේ ගෝලයන්ටත් පෙන්වන්නේ. ඒවාගෙන් වැඩක් නෑ, හැරී, ඔයා එයා බලයට එන එක පොඩ්ඩක් පරක්කු කරා විතරක් වෙන්න ඇති, එයා වෙන් කාවහරි හොයාගනී එයාගේ පැරදෙන යුද්ධෙට සටන් කරන්න. එතකොට ආයෙත් සැරයක් පරක්කු කරොත්, ආයෙත් ආයෙත් ඒකම කරොත්, එයා කවදාවත් ආපහු බළයට එන්නේ නැති වෙයි."

හැරී හිස වැනුවේය. නමුත් වහා නවතා දැමුවේය. මන්ද ඉන් ඔහුගේ හිස රිදෙන්නට පටන් ගත්තේය. ඉන්පසු ඔහු නැවත කතා කළේය. "සර්, කියන්න කැමති නම්, මට දැනගන්න වෙනත් දේවල් තියනවා...මට ඇත්ත දැනගන්න ඕනේ ඒවා...."

"ඇත්ත" ඩම්බල්ඩෝ සුසුමක් හෙළුවේය. "ඒක ලස්සන වගේම භයානක දෙයක්, ඒ නිසා බොහෝම පරිස්සමින් පාවිච්චි කරන්න ඕනේ. මොනා උනත් මට නොකියන්න හොඳ හේතුවක් නැත්තන් මම ඔයාගේ ප්‍රශ්ණ වලට උත්තර දෙන්නම්. බැරි වුනොත්, මම හිතනවා ඔයා මට සමාව දෙයි කියලා. මම ඇත්තටම, බොරු කියන්න හොඳ නෑ"

"ම්ම්ම්... වොල්ඩමෝට් කිව්වා එයා මගේ අම්මව මැරුවේ එයා මාව මරන එක වලක්වන්න හදපු නිසා කියලා. ඒත් ඔක්කෝටම කලින් එයාට මාව මරන්න ඕනේ වුනේ ඇයි?"

Downloaded from sinhalaebooks.com

මෙවර ඩම්බල්ඩෝ ගැඹුරින්ම සුසුමක් හෙලුවේය.

"අප්පෝ, ඔයා මගෙන් අහපු පළවෙනිම දේ, ඒක මට කියන්න බෑ. අද නෙවෙයි. දැන් නෙවෙයි. ඔයා දැනගනී, දවසක... දැනට ඒක ඔයාගේ ඔලුවෙන් අයින් කරන්න හැරී. ඔයා ලොකු උනාම... මම දන්නවා ඔයා මේක අහන්න කැමතිම නෑ... ඔයා ඒකට ලෑස්ති වෙච්ච දවසට, ඔයාට දැනගන්න ලැබෙයි."

වාද කිරීමෙන් පළක් නැති බව හැරී දත්තේය.

"ඒත් කුරල්ට මාව අල්ලන්න බැරි වුනේ ඇයි?"

"ඔයාගේ අම්මා මැරුනේ ඔයාව ආරක්ශා කරන්න. වොල්ඩමෝට්ට තේරෙන්නේ නැති එක දෙයක් තියනවානම්, ඒ තමයි ආදරය. එයාට තේරුනේ නෑ ඔයාගේ අම්මා ඔයාට කරාවගේ බලවත් ආදරයක් ඒකේ සළකුණක් ඉතිරි කරනවාමයි කියලා. කැළලක් නෙවෙයි, පේන සළකුණකුත් නෙවෙයි... ගැඹුරු ආදරයක් ලබද්දී, අපිට ආදරය කරපු කෙනා නැති උනත්, අපිට සදහටම ආරක්ශාවක් දෙනවා. ඒක ඔයාගෙම හමේ තියනවා. කුරල්, වෛරයෙන් පිරිලා, ලෝභකමින්, බළාපොරොත්තු වලින් තමයි වොල්ඩමෝට් එක්ක තමන්ගේ ආත්මය බෙදාගත්තේ. ඒකයි එයාට ඔයාව අල්ලන්න බැරි වුනේ. ගොඩාක් හොඳ දේකින් සළකුණක් ලබපු කෙනෙක්ව අල්ලන එක එයාට කටුක වේදනාවක් වුනා."

ඩම්බල්ඩෝ ජනේලයෙන් පිටත ඉන්න කුරුල්ලෙක් ගැන බොහෝ උනන්දු වූයේය.  ඉන් හැරීට පොරවනයෙන් ඇස් පිස ගැනීමට වෙලාවක් ලැබුණි. ඔහු යථාතත්වයට පත් වූ වහාම කතා කළේය.  "එතකොට අදිසි ලෝගුව - ඔයා දන්නවද මට ඒක කවුද එව්වේ කියලා?"

"ආආ - ඔයාගේ තාත්තා ඒක මගේ භාරයේ තියලා තිබුනේ, ඉතිං මට හිතුනා ඔයා ඒකට කැමති වෙයි කියලා" ඩම්බල්ඩෝගේ ඇස් දිළිසුණේය. "ප්‍රයෝජනවත් දේවල්... ඔයාගේ තාත්තා මෙහේදි වැඩිපුරම ඒක පාවිච්චි කරේ කුස්සියට හොරෙන් රිංගලා කෑම හොරකම් කරන්න."

"එතකොට තව දෙයක් තියනවා..."

"කියන්නකෝ."

"කුරල් කිව්වා ස්නේප් - - "

Downloaded from sinhalaebooks.com

"ප්‍රොෆෙසර් ස්නේප්, හැරී."

"ඔව්, එයා - කුරල් කිව්වා එයා මට වෛර කරන්නේ එයා මගේ තාත්තට වෛර කරපු නිසා කියලා. ඒක ඇත්තද?"

"හ්ම්ම්, එයාලා එකිනෙකාව පිළිකුල් කරා. ඔයයි මැල්ෆෝයි වගේ නම් නෙවෙයි. ඊට පස්සේ ඔයාගේ තාත්තා ස්නේප්ට කවදාවත් සමාව දෙන්න බැරි දෙයක් කරා"

"මොකද්ද?"

"එයා එයාගේ ජීවිතේ බේරුවා."

"මොකක්?"

"ඔව්..." ඩම්බල්ඩෝ සිහිනෙන් මෙන් කීවේය. "මිනිස්සුන්ගේ හිත් වැඩ කරන විදිහ හරිම විකාරයි. නේද? ප්‍රොෆෙසර් ස්නේප්ට ඔයාගේ තාත්තට ණය වෙච්ච එක දරාගන්න බැරි වුනා.... මම විශ්වාස කරනවා එයා ඔයාව ආරක්ශා කරන්න මේ අවුරුද්දේ ගොඩාක් වැඩ කළා. ඒකෙන් එයාට දැනෙනවා ඇති එයයි ඔයාගේ තාත්තයි සම වුනා කියලා. ඊට පස්සේ එයාට නිදහසේ ඔයාගේ තාත්තගේ මතකයන්ට වෛර කරන්න පුළුවන්නේ...."

හැරී එය තේරුම් ගන්නට උත්සාහ කළත් ඔහුගේ හිස වේදනා දුන්නේය. ඉතිං ඔහු එය අතහැර දැමුවේය.

"සර්, තව එක දෙයක් තියනවා..."

"එකයිද?"

"මට කොහොමද කණ්නාඩියෙන් එළියට පාශාණය ලැබුනේ?"

"ආහ්, අන්න, ඔයා ඒක අහපු එක ගැන මට සතුටුයි. ඒක මගේ නියමම අදහසක්, මගෙයි ඔයාගෙයි අතරේ, ඒකෙන් දෙයක් කියවෙනවා. මෙහෙමනේ, පාශාණය හොයාගන්න උවමනාව විතරක් තියන කෙනා ඒක හොයාගනී, හැබැයි එයා ඒක පාවිච්චි කරන්නේ නෑ. එහෙම කෙනාට විතරයි ඒක ලැබෙන්නේ, එහෙම නැත්තන් ඒගොල්ලෝ කණ්නාඩියෙන් එයාලා රත්තරන් හදනවා හරි අමෘතය බොනවා හරි දකී. මගේ මොළේ වෙලාවකට මාවත් පුදුම කරවනවා... දැන්, ප්‍රශ්ණ ඇහුවා ඇති. මම කියන්නේ දැන් මේ රස කැවිලි කන්න පටන් ගත්තොත් හොඳයි. අහ්!

Downloaded from sinhalaebooks.com

බෙටී බොට්ගේ හැම රසයේම බෝංචි! මම පුංචි කාලේ වමනේ රස එකක් කන්න තරම් අවාසනාවන්ත වුනා, එදා ඉඳලා මම ඒවට තියන කැමැත්ත නැතිවෙයි කියලා බයයි. ඒත් මම හිතන්නේ මම හොඳ එකක් කැවට කමක් නෑ. නේ?"

ඔහු සිනාසී රන්වන් දුඹුරු පැහැ බෝංචි ඇටයක් කටේ දමා ගත්තේය. ඉන්පසු ඔහු එය ඉවතය දැමුවේය. "අපොයි! කන් කලාඳුරු!"

මැඩම් පොම්ෆ්‍රේ ඉතා ප්‍රසන්න සාත්තු සේවිකාවකි. නමුත් ඈ හරිම නීතිගරුකයි.

"විනාඩි පහක් විතරක්," හැරී ඇයැද සිටියේය.

"කොහෙත්ම බෑ."

"ඔයා ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝට එන්න දුන්නානේ..."

"ඔව්, ඇත්තටම, ඒ විදුහල්පති තුමානේ, ඒක වෙනස්. ඔයා විවේක ගන්න ඕනේ."

"මම විවේක ගන්නවානේ, බලන්නකෝ නිදාගෙන එහෙම. අනේ, අනේ, මැඩම් පොම්ෆ්‍රේ..."

"ඔහ්, හරි එහෙනම්" ඈ කීවාය. "හැබැයි විනාඩි පහක් විතරයි."

ඉන්පසු ඈ රොන් සහ හර්මයිනීට ඇතුල් වීමට ඉඩ දුන්නාය.

"හැරී!"

හර්මයිනී පියඹාගෙන මෙන් ආවේ නැවතත් තම අත් ඔහු වටා දාන්නට මෙනි, නමුත් තම හිස කරකවිල්ල නිසා ඈ එසේ නොකල එක ගැන හැරී සතුටු වූයේය.

"ඔහ්, හැරී, අපිට හිතුනෙම ඔයාව... - ඩම්බල්ඩෝ ගොඩාක් දුක් වුනා - - "

Downloaded from sinhalaebooks.com

"මුළු ඉස්කෝලෙම ඒක ගැන කතා වෙනවා," රොන් කීවේය. "ඇත්තටම මොකද වුනේ?"

ඒ ඇත්ත කතාව කට කතා වලත් වඩා සිත්ගන්නා සුලු සහ අමුතු වූ එක් දුර්ලභ අවස්ථාවක් විය. හැරී ඔවුන්ට සියල්ලම කීවේය: කුරල්; කණ්නාඩිය; පාශාණය; වොල්ඩමෝට්. රොන් සහ හර්මයිනී ඉතා හොඳ අසන්නන් විය. ඔවුන් සියලුම නිවැරදි තැන් වලදී ගැස්සුනෝය, කුරල්ගේ තලප්පාව යට වූයේ කුමක්දැයි හැරී කියන විට හර්මයිනී හයියෙන් කෑ ගැසුවාය.

"එතකොට පාශාණය විනාශයි?" රොන් අවසානයට කීවේය. "ෆ්ලැමල් මැරෙන්නයි යන්නේ?"

"මමත් ඒකයි කිව්වේ, ඒත් ඩම්බල්ඩෝ හිතන්නේ නම් - මොකද්ද ඒක? - 'හොඳින් සංවිධානය වූ මනසකට, මරණය කියන්නේ ඊලඟ මහා වික්‍රමය විතරයි' කියලා."

"මම හැමෙවෙලේම කිව්වේ එයා වැඩකරන්නේ වයසට නෙවෙයි කියලා" තමන්ගේ වීරයා ගැන සතුටු වෙමින් රොන් කීවේය.

"ඉතිං ඔය දෙන්නට මොකද වුනේ?" හැරී ඇසුවේය.

"ම්ම්ම්, මම පරිස්සමින් ආපහු ආවා," හර්මයිනී කීවාය. "මම රොන්වත් අරන් ආවා -- ඒකට ටික වෙලාවක් ගියා - ඊට පස්සේ අපි ඩම්බල්ඩෝට දන්වන්න බකමූණු කූඩුවට දුවනකොට තමයි එයාව ඇතුල්වීමේ ශාලාවෙදි මූණ ගැහුනේ - එයා දැනගෙන හිටියේ - එයා කිව්වා, 'හැරී එයාගේ පස්සෙන් ගියා. එහෙම නේද?' කියලා. ඊට පස්සේ තුන්වෙනි තට්ටුවට දිව්වා."

"ඔයාට හිතෙන්නේ නැද්ද එයාට ඕනේ වුනේ ඔයා එහෙම කරන එක කියලා?" රොන් කීවේය. "ඔයාට ඔයාගේ තාත්තගේ ලෝගුව එහෙම එවලා."

"ඇඇ, " හර්මයිනී තරහෙන් පිපිරුවාය. "එයා එහෙම කරානම් - මම කියන්නේ ඒක හරිම අප්‍රසන්නයි -- ඔයාව මැරෙන්නත් ඉඩ තිබ්බා."

"නෑ, එහෙම නෑ," හැරී කලපනා කරමින් කීවේය. "එයා හරි විහිළු මනුස්සයෙක් තමයි, ඩම්බල්ඩෝ. මම හිතන්නේ එයාට ඕනේ වුනේ මට අවස්ථාවක් දෙන්න. මම හිතන්නේ එක්කෝ මෙහේ වෙන හැමදේම එයා හොඳට දන්නවා. ඔට්ටුයි එයාට අදහසක් තියෙන්න ඇති අපි උත්සාහ කරයි කියලා. ඉතිං අපිව නතර කරනවා වෙනුවට, එයා අපිට අවශ්‍ය දේවල් ඉගැන්නුවා. කණ්නාඩිය වැඩ කරන විදිහ මට හොයාගන්න ඉඩ ඇරපු එකත් මට හිතෙන්නේ අහම්බයක් නෙවෙයි කියලා. ඒක හරියට.. මට පුළුවන්නම් වොල්ඩමෝට්ට මූණදෙන්න ඒකට මට අයිතියක් තියෙනවා කියලා එයා හිතුවා වගේ...."

Downloaded from sinhalaebooks.com

"ඔව්, ඩම්බල්ඩෝ නම් වයසට නෙවෙයි වැඩකරන්නේ, හරි," රොන් ආඩම්බරයෙන් කීවේය. "අහන්න, ඔයා හෙට වර්ෂ අවසාන උත්සවේට එන්න ඕනේ. ළකුණු ඔක්කොම දීලා ඉවරයි. ඇත්තටම... ස්ලිදරින් දිනුම්. ඔයාට අන්තිම කුඩිච් තරගේ මගඇරුනා, ඔයා නැති නිසා රේවන්ක්ලෝ අපිව අතුගාලම දැම්මා. ඒත් කෑම හොඳට තියෙයි."

ඒ මොහොතේම මැඩම් පොම්ෆ්‍රේ පැමිණියාය.

"ඔයාලා විනාඩි පහළොවක් විතර හිටියා. දැන් එළියට යන්න" ඈ ස්ථිර ලෙස කීවාය.

හොඳ නින්දකට පසු හැරීට සාමාන්‍ය තත්වයට බොහෝ ලංවූ බවක් දැණිනි.

"මට උත්සවේට යන්න ඕනේ," මැඩම් පොම්ෆ්‍රේ හැරීගේ රසකැවිලි පෙට්ටි කෙළින් කරන අතරේ හැරී කීවේය. "මට පුළුවන්, නේද?"

"ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝ කියන්නේ ඔයාට යන්න පුළුවන් කියලා," ඈ දැඩි ලෙස කීවාය. උත්සවයට යාම හැරීට අවධානම් බව ප්‍රොෆෙසර් ඩම්බල්ඩෝ වටහාගෙන නැතිබව ඈ සිතන බව ඉන් හැඟවිනි. "ආ, ඔයාව බලන්න තව කෙනෙක් ඇවිත්."

"ශා, හොඳයිනේ," හැරී කීවේය. "කවුද ඒ?"

හිස නවන ගමන්ම හැග්‍රිඩ් දොරෙන් ඇතුළට රිංගුවේය. හැමවෙලාවේම මෙන් ඇතුළත සිටින විට ඔහු ඇතුලේ සිටීමට විශාල වැඩි මෙන් පෙණිනි. ඔහු හැරී ලඟ වාඩි වුනේය, එක්වරක් ඔහු දෙස බැලුවේය, ඉන්පසු හඬන්නට පටන් ගත්තේය.

"ඒක - සම්පූර්ණයෙන්ම - මගේ - මෝඩ - වැරැද්ද!" ඔහු මුහුණ අත්වලින් වසාගෙන ඉකිබින්දේය. මම අර යක්ශ මිනිහට ෆ්ලෆීව පහුකරන විදිහ කිව්වා! මමයි කිව්වේ! ඒක විතරයි එයා දැනගෙන හිටියේ නැත්තේ, ඉතිං මම කිව්වා! ඔයා මැරෙන්නත් තිබ්බා! හැමදේම මකර බිත්තරයක් වෙනුවෙන්! මම ආය කවදාවත් බොන්නේ නෑ! මාව එළියට ඇදලා දාලා මගල් කෙනෙක් වගේ ජීවත්වෙන්න ඉඩහරින්න ඕනේ!"

"හැග්‍රිඩ්!" හැග්‍රිඩ් අඬනු අසා පුදුමයෙන් හැරී කතා කළේය. හැග්‍රිඩ් කණගාටුවෙන් ගැහෙමින් හැඩුවේය. විශාල කඳුලු බිංදු ඔහුගේ යටි රැවුළට බේරුණි. "හැග්‍රිඩ්, එයා ඒක කොහොම හරි හොයාගනී. අපි මේ කතා කරන්නේ වොල්ඩමෝට් ගැන. ඔයා කිව්වේ නැතත් එයා හොයාගන්නවා ඒක."

Downloaded from sinhalaebooks.com

"ඔයා මැරෙන්නත් ඉඩ තිබ්බා!" හැග්‍රිඩ් ඉකිබින්දේය. "අනික නම කියන්න එපා!"

"වොල්ඩමෝට්!" හැරී ගිගිරුවේය. හැග්‍රිඩ් කම්පනයට පත් වූයෙන් ඇඬිල්ල නැවැත්වූයේය. "මට එයාව හම්බවුනා, ඉතිං මම එයාට එයාගේ නමින් කතා කරන්නේ. කරුණාකරලා සතුටු වෙන්නකෝ, හැග්‍රිඩ්, අපි පාශාණය බේරගත්තා, දැන් ඒක නෑ, ඉතිං එයාට ඒක පාවිච්චි කරන්නත් බෑ. මේ චොකලට් ගෙම්බෙක් ගන්නකෝ. මට ගොඩාක් හම්බවුනා..."

හැග්‍රිඩ් තම පිටි අල්ලෙන් නහය පිසදා කතා කළේය. "ඒකෙන් මට මතක් වුනේ. මම ඔයාට තෑග්ගක් ගෙනාවා."

"ඒ මුගටි මස් සැන්ඩ්විච් නෙවෙයිනේ?" හැරී කළබලෙන් කීවේය. අන්තිමේදී හැග්‍රිඩ් දුර්වල ලෙස සිනාසුණේය. "නෑ. ඩම්බල්ඩෝ ඊයේ මට ඒක හදන්න නිවාඩුත් දුන්නා. 'ඇත්තටම, එයාට ඒ වෙනුවට තිබ්බේ මාව එළවලා දාන්න - මොනා උනත්, ඔයාට මේක ..."

එය අලංකාර හම් කවරයක් සහිත පොතකි. හැරී කුතුහළයෙන් එය විවෘත කළේය. එය මායාකරුවන්ගේ පිංතූර වලින් පිරී පැවතින. හැම පිටුවේම සිනාසෙන සහ අතවනන අය අතර ඔහුගේ මව සහ පියා ද වූහ.

"මම පිංතූර ඉල්ලලා බකමූණෝ යැව්වා ඔයාගේ අම්මගෙයි තාත්තගෙයි ඉස්කෝලේ යාලුවෝ ඔක්කෝටම. ඔයා ළඟ එකක්වත් නෑ කියලා දන්නවානේ... ඔයා ඒකට කැමතිද?"

හැරීට කතාකරගත නොහැකි විය. නමුත් හැග්‍රිඩ් තේරුම් ගත්තේය.

එදින රාත්‍රියේ හැරී වර්ෂ අවසාන උත්සවය සඳහා තනියම පහළට ගියේය. මැඩම් පොම්ෆ්‍රේ ඔහුව අවසන් වතාවටත් පරීක්ශා කිරීමට අවශ්‍ය බව කියමින් වද වූ නිසා හැරීට රැඳී සිටීමට සිදු විය. ප්‍රධාන ශාලාව ඒ වන විටත් පිරී තිබිණි. එය ස්ලිදරින් නිවාසය එක දිගට හත්වන වරටත් නිවාස කුසළානය දිනීම නිමිත්තෙන් ඔවුන්ගේ වර්ණ වූ කොළ සහ රිදී වර්ණයන්ගෙන් සරසා තිබිණි. ප්‍රධාන මේසය පිටුපස වූ බිත්තිය ස්ලිදරින් සර්පයාගේ පිංතූරය සහිත විශාල බැනරයකින් වැසී තිබිණි.

හැරී ඇතුල්වත්ම එහි එක්වරම නිහඬතාවයක් ඇති විය. ඉන්පසු සියල්ලන්ම එක්වරම මහ හඬින් කතා කරන්නට පටන් ගත් හ. ඔහු ග්‍රිෆින්ඩෝ මේසයේ රොන් සහ හර්මයිනී අතර පුටුවක ඉඳගත්තේය. සිසුන් ඔහුදෙස බැලීමට නැගිට සිටීම ඔහු නොසළකා හැරියේය.

වාසනාවට, මොහොතකින් ඩම්බල්ඩෝ පැමිණියේය. කතාබහ නැවතී ගියේය.

Downloaded from sinhalaebooks.com

"තව අවුරුද්දක් අවසන් වුනා!" ඩම්බල්ඩෝ සතුටින් කීවේය. "අපි අපේ රසවත් කෑම වලට දත ගහන්න කළින්, මම ඔයාලට නාකි මනුස්සයෙක්ගේ බොරු දෙඩවිල්ලකින් පොඩ්ඩක් කරදර කරන්න ඕනේ. කොහොම අවුරුද්දක්ද ඒක! බොහෝවිට ඔයාලගේ ඔලු ඕනෙවට වඩා ටිකක් පිරිලා ඇති... ඔයාලට ඉස්සරහට මුළු ග්‍රීෂ්ම ඍතුවම තියනවා ඊලඟ අවුරුද්ද පටන් ගන්න කලින් ඒක හොඳට හිස් කරගන්න....

"දැන්, මට තේරෙන විදිහට, මේ නිවාස කුසලානේ පිරිනමන්න තියනවානේ, ළකුණු තියෙන්නේ මෙහෙමයි: හතරවෙනි ස්ථානය, ග්‍රිෆින්ඩෝ, ළකුණු තුන්සිය දොළහයි; තුන්වෙනියට, හෆල්පෆ්, ළකුණු තුන්සිය පනස් දෙකයි; රේවන්ක්ලෝ ළකුණු හාරසිය විසිහයක් අරගෙන තියනවා, එතකොට ස්ලිදරින් හාරසිය හැත්තෑ දෙකයි."

ස්ලිදරින් මේසයෙන් ජයඝෝෂා කුණාටුවක් සහ මේසයට තට්ටු කිරීම් හඬ පැන නැංගේය. ඩ්‍රෙකෝ මැල්ෆෝයි තම කුසලානයෙන් මේසයට තඩිබානු හැරී දුටුවේය. එය අසනීප දනවන දසුනකි.

"ඔව්, ඔව්, බොහොම හොඳයි, ස්ලිදරින්" ඩම්බල්ඩෝ කීවේය. "කොහොම උනත්, අළුත්ම සිද්ධීත් මේකට එකතු වෙන්න ඕනේ."

මුළු ශාලාවම නිහඬ විය. ස්ලිදරින් වරුන්ගේ සිනා මදක් මැකී ගියේය.

"අහ්ම්,". "මට මේ අන්තිම මොහොතේ ළකුණු ටිකක් දෙන්න තියනවා. ඉන්න බළන්න. ඔව්...

"මුළින්ම - රොනල්ඩ් වීස්ලිට..."

රොන්ගේ මුහුණ දම්පාටට හැරුණේය. ඔහු ඉර අව්වට පිච්චුන රාබු ගෙඩියක් මෙන් පෙණිනි.

"... අවුරුදු ගණනාවකින් හොග්වර්ට්ස් දැකපු හොඳම චෙස් ක්‍රීඩා තරඟෙ වෙනුවෙන්, මම ග්‍රිෆින්ඩෝ වළට ළකුණු පනහක් ප්‍රධානය කරනවා."

ග්‍රිෆින්ඩෝ ජය ගෝශාව, මතුරපු සිවිළිම උඩ විසිවෙන තරමට විය. ඔවුන්ට ඉහළින් වූ තරු නළියන්නට විය. "මගේ මල්ලි, මගේ බාළම මල්ලි, මැක්ගොනගල්ගේ යෝධ චෙස් ඉත්තන්ව පහු කළේ!" පර්සි අනෙක් ශිෂ්‍ය නායකයන්ට කියනු ඇසිණි.

අවසානයේ නැවතත් නිහඬතාවයක් ඇති විය.

Downloaded from sinhalaebooks.com

"දෙවනියට - හර්මයිනී ග්‍රේන්ජර්ට... ගින්නේදී හොඳම තර්ක පාවිච්චි කිරීම වෙනුවෙන්, මම ළකුණු පනහක් ප්‍රධානය කරනවා."

හර්මයිනී තම දෑතෙන් මුහුණ වසා ගත්තාය; හැරී තදින්ම සැක කළේ ඇ කඳුළු සලන්නට පටන් ගත් බවයි. ඔවුන් වටා වූ ග්‍රිෆින්ඩෝර් වරු උඩ පැන්නෝය. ඔවුන් ළකුණු සියයකින් ඉහළට ආවෝය. "තුන්වෙනියට - හැරී පොටර්ට..." ඩම්බල්ඩෝර් කියත්ම ශාලාව සම්පූර්ණයෙන්ම නිහඬ වූයේ ය. "පිරිසිදු හපන්කමට සහ අතිවිශිෂ්ඨ නිර්භීතකමට, මම ග්‍රිෆින්ඩෝර් නිවාසයට ළකුණු හැටක් ප්‍රධානය කරනවා."

හඬ බිහිරි කරවන සුළු විය. ගණන් සෑදිය හැකි අය මහ හඬින් කෑගහන අතරේ ග්‍රිෆින්ඩෝර් දැන් ළකුණු හාරසිය හැත්තෑ දෙකක් ලබා සිටින බව දැන සිටියහ. ස්ලිදරින් ළකුණු ප්‍රමාණයම අරගෙන ඔවුන් නිවාස කුසළානයට කරට කර ඇවිත් තිබේ. ඩම්බල්ඩෝර් හැරීට තව එක ළකුණක් දුන්නානම්...

ඩම්බල්ඩෝර් තම අත එසවූයේය. ශාලාව නිහඬ විය.

"නොයේකුත් වර්ගයේ නිර්භීතකම් තියනවා," ඩම්බල්ඩෝර් සිනාසෙමින් කීවේය. "අපේ හතුරන්ට විරුද්ධව නැගී සිටින්න අපිට ලොකු නිර්භීතකමක් ඕනේ, හැබැයි යාලුවොන්ට විරුද්ධව නැගී සිටින්න ඊටත් වඩා ඕනේ. ඒ නිසා මම ළකුණු දහයක් ප්‍රධානය කරනවා නෙවිල් ලොන්ග්බොටම්ට."

ප්‍රධාන ශාලාවෙන් පිට සිටින්නෙක් එහි පිපිරීමක් ඇති වූවා යැයි සිතනු ඇත., ග්‍රිෆින්ඩෝර් මේසයෙන් නැගුන හඬ ඉතා විශාලව දෙදරුවේය. වැළඳගන්නා සිසුන් රොත්තක් අතරේ කම්පනයෙන් සුදුමැලි වූ නෙවිල් නොපෙනී යද්දී හැරී, රොන් සහ හර්මයිනී ප්‍රීතිඝෝෂා කිරීමට නැගිට සිටියහ. නෙවිල් කිසිදින එතරම් ළකුණු ප්‍රමාණයක් ග්‍රිෆින්ඩෝර් වෙත දිනා නැත. හැරී, ප්‍රීතිඝෝෂා කරමින්ම රොන්ගේ ඉළඇට වලට ඇන ඔහුට මැල්ෆෝයිව පෙන්නුවේය. මැල්ෆෝයි හිරාන්තව ගල් ගැසී සිටියේ ඇඟ බඳින ශාපයට ලක් වූවාක් මෙනි.

"ඒ කියන්නේ", අත්පොළසන් කුණාටුව මැදින් ඩම්බල්ඩෝර් කතා කලේය. රේවන්ක්ලෝ සහ හෆල්පෆ් ද ස්ලිදරින් පරාජය සමරමින් සිටියහ. "අපිට සැරසිලි පොඩ්ඩක් වෙනස් කරන්න වෙයි."

ඔහු අත්පුඩියක් ගැසුවේය. ක්ෂණයකින්. එල්ලා තිබූ කොළ පැහැ සැරසිලි දම්පැහැයටද රිදී පැහැ සැරසිළි රන්පැහැයටද හැරිණි; විශාල ස්ලිදරින් සර්පයා අතුරුදන්ව ගොස් ග්‍රිෆින්ඩෝර් සිංහයා එතැන ගත්තේය. ස්නේප් බය වී, මවාගත් සිනාවකින් ප්‍රොෆෙසර් මැක්ගොනගල් ට අතට අත දුන්නේය. ඔහු හැරී දෙස බැලුවෙන්, තමා වෙත ඔහුගේ ඇති හැඟීම අබමල් රේණුවකින් වත් වෙනස් වී නොමති බව හැරීට එක්වරම තේරුණි. එයින් හැරී දුකට පත් වූයේ නැත. එයින් ලබන අවුරුද්දේ ජීවිතය ආපසු සාමන්‍ය අතට පත් වෙනු ඇති බව තේරිණි. නැත්නම් හොග්වාර්ට්ස් වල ජීවිතය හැමදාම තිබුනාක් මෙන් සාමාන්‍ය වෙනු ඇත.

එය හැරීගේ ජීවිතයේ හොඳම හැන්දෑව විය. කුඩිච් තරඟය දිනුවාටත් වඩා, නත්තලටත් වඩා, කඳුකර ට්‍රෝල්ව බිම හෙළුවාටත් වඩා... ඔහු කවමදාකවත් අද රාත්‍රිය අමතක නොකරනු ඇති.

Downloaded from sinhalaebooks.com

විභාග ප්‍රතිඵල තවමත් ඉතිරිවී ඇති බව හැරීට අමතකම වී ගියේය. නමුත් ප්‍රතිඵල පැමිණි විට ඔවුන් පුදුමයට පත් කරමින් ඔහු සහ රොන් හොඳ ළකුණු සහිතව සමත් වී තිබිණි.; හර්මයිනී, අනිවාර්යයෙන් පළමු වසරේ හොඳම සාමර්ථ ලැබූ සිසුවා විය. නෙවිල් පවා තම දුර්වල සංයෝජන ළකුණු හොඳ ඖෂධවිද්‍යා ළකුණු වලින් වසාගෙන නැගී සිටියේය. තම නපුරුකමේ තරමටම මෝඩ වූ ගොයිල් ඉවතට විසි වේයැයි ඔවුන් සිතුවත් ඔහුත් සමත් වී සිටියේය. එය ලැජ්ජාවක් වුවත්, රොන් කිව්වා වගේ, අපිට ජීවිතේ දී කැමති හැමදෙයක් ලබාගන්න බෑ.

එක්වරම ඔවුන්ගේ අල්මාරි හිස්වී යකඩ පෙට්ටි සූදානම් වී තිබිණි. නෙවිල්ගේ ගෙම්බා වැසිකිළියක කෙළවරේ හැංගී සිට හමුවිය. සියළුම සිසුන් අතරේ නිවාඩු කාළය තුළ මායාවන් භාවිතා නොකරන ලෙස දැන්වූ සටහනක් බෙදා දෙනු ලැබිණි. ("මම හැමවෙලේම හිතනවා එයාලට මේක දෙන්න අමතක වෙයි කියලා," ෆ්‍රෙඩ් වීස්ලි දුකෙන් කීවේය.); වැව හරහා බෝට්ටු පොදිය පදවාගෙන යාමට හැග්‍රිඩ් පැමිණ සිටියේය. ඔවුන් කතා කරමින් සහ හිනාවෙමින් හොග්වාර්ට්ස් සීග්‍රගාමී දුම්රියට බඩු පැටවූවෝය. ... ගම් පියස කොළ පාට සහ පිළිවෙල බිම් කඩ බවට පත් විය; බෙටී බොට්ගේ සියළු රස බොංචි කමින් ඔවුන් මගල් නගර පසු කළෝය. මායාකාර ලෝගු ඉවත්කර ජැකට් සහ කබා වලට මාරු වූ ඔවුන් කින්ග්ස් ක්‍රොස් දුම්රිය ස්ථානයේ නවයයි තුන්කාළ වේදිකාවට පැමිණියහ.

ඔවුන් සියල්ලන්ටම වේදිකාවෙන් ඉවත් වීමට ටික වෙලාවක් ගත විය. අපිරිසිදු වයසක ආරක්ශකයෙක් ප්‍රවේශපත්‍ර පරික්ශා කරමින්, දොරටුවෙන් දෙදෙනා සහ තුන්දෙනා බැගින් යැව්වේ සියල්ලෝම එකවර බිත්තියකින් මතු වුවහොත් මගල් අවධානය ඊට යොමු වීම වැළක්වීමටයි.

"ඔයා මේ ග්‍රීෂ්ම ඍතුවේ ඇවිත් අපේ දිහා ඉන්න" රොන් කීවේය. "ඔය දෙන්නම - මම ඔයාට බකමූණෙක් එවන්නම්."

"ස්තූතියි," හැරී කීවේය., "මට කල්ගෙවන්නත් දෙයක් ඕනේ වෙයි" මගල් ලෝකෙට යන දොරටුව වෙත යාමට සිසුන් පොරකෑහ. ඉන් සමහරක් ඔවුන් හා කතා කළහ.

"බායි, හැරී!"

"ආය හම්බවෙමු, පොටර්!"

"තාම ජනප්‍රියයි," රොන් ඔහු වෙත සිනාවක් පාමින් කීවේය.

"මම යන දිහා නම් නෙවෙයි, ඒක ඔයාට මම පොරොන්දු වෙන්නම්," හැරී කීවේය.

Downloaded from sinhalaebooks.com

ඔහු, රොන් සහ හර්මයිනී එක්වර දොරටුවෙන් එළියට ගියහ. "අර ඉන්නේ එයා, අම්මේ, අර ඉන්නේ එයා, බලන්න!"

ඒ ජිනී වීස්ලිය. රොන්ගේ චූටි නංගී.. නමුත් ඈ පෙන්වූයේ රොන්ව නොවෙයි.

"හැරී පොටර්!" ඈ බියෙන් මෙන් කීවාය. "බලන්න, අම්මේ! මට පේනවා"

"කෑ ගහන්න එපා, ජිනී. එහෙම ඇඟිල්ල දික්කරලා පෙන්වන එක නපුරු කමක්."

වීස්ලි මහත්මිය ඔවුන් වෙත සිනාවක් පෑවාය.

"කාර්‍යබහුල අවුරුද්දක් ද?" ඈ කීවාය.

"ගොඩාක්," හැරී කීවේය. "ෆජ් වලටයි ජර්සියටයි ස්තුතියි වීස්ලි මහත්මිය."

"අයියෝ, ඒක මොකක්ද, පැටියෝ."

"ලෑස්තිද? ඔයා ?"

ඒ වර්නන් මාමාය. තවමත් දම්පැහැ මුහුණින්, තවමත් උඩු රැවුල ඇතිව, සාමාන්‍ය මිනිසුන් පිරි දුම්රිය දුම්රිය ස්ථානයක බකමූණෙක් සහිත කූඩුවක් අතින් ගෙන සිටීමට තරම් නිර්භීත වීම ගැන හැරී සමග කේන්තියෙන් සිටී. ඔහු පිටුපසින් පෙටූනියා නැන්දා සහ ඩඩ්ලි ඔහු දැකීමෙන්ම බියට පත්ව සිටගෙන සිටියහ.

"ඔයාලා හැරීගේ පවුලේ අය වෙන්න ඇති!" වීස්ලි මහත්මිය කීවාය.

"එහෙම තමයි කියන්නේ," වර්නන් මාමා කීවෙය. "ඉක්මන් කරන්න, කොළුවෝ, අපිට මුළු දවසක්ම නෑ." ඔහු ඉවතට ගියේය.


හැරී රොන් සහ හර්මයිනී සමග අවසාන වශයෙන් වචනයක් කතා කිරීමට මදක් නැවතුනේය.

Downloaded from sinhalaebooks.com

"එහෙනම් ග්‍රීෂ්මයේදී හමුවෙමු."

"එහෙනම් ඔයාට - අර් - සුභ නිවාඩුවක් වේවා," වර්නන් මාමා, තමා වැනි අප්‍රසන්න අයෙක් තවත් සිටිය නොහැකි බව පෙන්වීම නිසා කම්පනයෙන් අවිනිශ්චිත වූ හර්මයිනී කීවාය.

"අපොයි, ඔව්" හැරී කීවෙන්, ඔහුගේ මුහුණේ ඇඳුනු හිනාව දැක ඔවුන් පුදුම වූහ. "එයාලා දන්නේ නෑනේ අපිට ගෙදරදී මන්තර කරන්න තහනම් කියලා. මේ පාර ග්‍රීෂ්ම ඍතුවේදී මම ඩඩ්ලිත් එක්ක හොඳට විනෝද වෙනවා...."




Downloaded from sinhalaebooks.com